ඉන්දීය සාහිත්‍ය ඉතිහාසය

I වන වෙළුම, II වන කොටස

(මහා භාරතය හා රාමායණය)

වින්ටර්නිට්ස්

2——සි පී 2895—1004 (68/3)

ඉන්දීය සාහිත්‍ය ඉතිහාසය

(සැකොස්ලොවැකියාවේ) ප්‍රාග් නුවර ජර්මන් විශ්ව විද්‍යාලයයෙහි
ඉන්දු වේදය හා මානව විද්‍යාව ද පිළිබඳ මහාචාර්ය පදවිය දරූ

ආචාර්ය මොරිස් වින්ටර්නිට්ස්

විසිනි

I වන කාණ්ඩය

II වන කොටස

ජන කාන්ත වීර කාව්‍ය සහ පුරාණයෝ

ශ්‍රී ලංකා බෞද්ධ හා පාළි විශ්වවිද්‍යාලය
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ - 07.

BPUSL
00085

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත ය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රිත ය.

BPU085

පළමු වන මුද්‍රණය, 1968

සියලු හිමිකම් ඇවිරිණි

THIS SINHALA TRANSLATION

of

A HISTORY OF INDIAN LITERATURE

(Volume I, Section II)

by

Prof. M. WINTERNITZ, PH.D

has been published by

THE DEPARTMENT OF EDUCATIONAL PUBLICAIONS OF CEYLON

by arrangement with

DR. JIRI VIT., Strojnicka, 3, Prague. 7, Czechoslovakia

First Edition 1969

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සිංහලයට අනුවාදිත ය

සිංහලානුවාදයේ පෙරවදන

අප විසින් ප්‍රකාශයට පත් කරනු ලබන මේ ග්‍රන්ථය මහාචාර්ය එම්. වින්ටර්නිට්ස් ගේ "A HISTORY OF INDIAN LITERATURE' නැමති පොතේ පළමු වන කාණ්ඩයේ දෙ වන කොටසේ, එ නම්— "THE POPULAR EPICS AND THE PURANAS" නමැති කොටසේ සිංහල පරිවර්තනයයි. වෛදික සාහිත්‍යය පිළිබඳ කරුණු අන්තර්ගත, මෙහි පළමු වන කොටස මීට කලින් අප දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පමුණුවන ලදි.

ජන කාන්ත වීර කාව්‍ය හා පුරාණ යන නමින් සිංහලයෙන් ඉදිරිපත් කෙරෙන මේ කොටසෙහි මහා භාරතය, රාමායණය ආදි පැරැණි සංස්කෘත වීර කාව්‍ය හා පුරාණ සාහිත්‍යය හා තන්ත්‍ර සාහිත්‍යය ද පිළිබඳ ව කරුණු ඇතුළත් වෙයි.

මෙය සිංහලයට පරිවර්තනය කරන ලද්දේ මේ දෙපාර්තමේන්තුවේ නිලධරයන් විසිනි. මුල් ඉංගිරිසි පෙළෙහි ඇතුළත් වන ඉංගිරිසි පද්‍ය පාඨ සිංහලයෙන් ඉදිරිපත් කිරීමේ දී, ඒවායේ මුල් සංස්කෘත පාඨ දැනගැනීම ශාස්ත්‍රාභිලාෂීනට ප්‍රයෝජනවත් වෙතැයි සැලකූ හෙයින්, හැකි තාක් දුරට ඒවා ද සොයා සිංහලානුවාදයෙහි ඇතුළත් කිරීමට විශේෂ පරිශ්‍රමයක් දැරිණ.

ව. ආනන්ද ජයවර්ධන,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්.

1970 ඔක්තෝබර 21 වන දා,
කොළඹ 3,
ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවතේ,
"සිරිමතී පායේ"
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ දී ය.

ශ්‍රී ලංකා අධිගණන හා පරිපාලන විශ්වවිද්‍යාලය
214, බෞද්ධාලෝක මාවත,
කොළඹ - 07.

000000

අඩෝලිපිවල දැක්වෙන සංක්ෂිප්තවල ලේඛනය

ABA=Abhandlungen der Berliner Akademie der Wissencshaften Philol—histor. Klasse.

A Bay A=Abhandlungen der Bayerischen Akademie der Wissenschaften Phil. Klasse.

AGGW=Abhan lungen er Konigl. Gesellschaft er Wissenschaften zu Gottingen, Philol—histor. Klasse.

AKM=Abhandlungen fur die Kunde des Morgenlandes, heransg, von der Deutschen Morgenlandischen Gesellschaft. Album Kern=Alburm Keru: Opstellen geschreven fer eere von Dr. H. Kern op ziju zeventigsten verjaardag. Lieden. 1903

AMG=Annales due Musee Guimet (Paris).

Ann. Bh. inst=Annals of the Bhandarker Institute, Poona.

AnSS=Anandasrama Sanskrit Series. (Poona)

AR=Archiv. fur Religiousgeschichte.

ASGW=Abhandlungen der philohistor. Klasse der Konigal. Sachs. Gesellschaft de Wissenschaften.

Aufrecht, Bode. Cat=Th Aufrecht, Catalogus Codicum.

MSS. Sanscriticorum Bibiliothecase Bodleiauae, Oxonii 1859-64 Aufrecht CC-Th. Aufrecht: Catalogus Catalogoroum. Leipzing 1891; II, 1896; III, 1903. Aufrecht, Leipzig-Katalog der Sanskrit—Handschriften der Universitatsbibiliothk zu Leipzig, 1901.

BEFEO=Bulletin de lecole francaise d'Extreme Orient.

Ben SS=Benares Sanskrit Series.

Bezz. Beitr—Beitrage zur Kunde der indogermanischen. Sprachen, herausg. von A. Bezzenberger. Bhandarkar, Report 1882-83—R. G. Bhandarkar, Report on the search for Sanskrit Manuscripts in the Bombay Presidency during the year 1882-83. Bombay, 1884 Bhandarkar, Report 1883-84=R. G. Bhandarkar, Report etc, during the year 1883-84, Bombay 1887.

Bhandarkar Comm. Vol.=Commemorative Essays presented to Sir Rama Krishna Gopay Bhandarkar, Poona, 1917.

Bhandarkar, Vaispavism etc.=R. G. Bhandarkar, Vaisnavism. Saivism, and Minor Religious systems (Grandriss III, 6, 1913).
Bibli, Ind.=Bibliotheca Indica.

BSGW=Berichte uber die Verhandlungen der Konigl. Sachischen Gesseleshaft der Wissenchaften Philol-histor, Klasse.

BSOS=Bulletin of the School of Oriental studies. London Institution.

BSS=Bombay Sanskrit Series.

Buhler, Report= G. Buhler, Detailed Report of a Tour in search of Sanskrit MSS, made in Kashmir, Rajaputana and Central India.
(Extra Number of the JBRAS 1877).
Burnell, Tanjore=A. C. Burnell, A Classified Index to the Sanskrit 1755. in the palace at Tanjore, London, 1880
Cambridge History—
The Cambridge History of India,
Vol. I. Ancient India. Ed. by E. J. Rapson Cambridge. 1922.
Deussen, A GPh=P. Deussen. Allegemeine Geschichte der Philosophie I, 1-3.
Leipzig, 1894 (2nd ed. 1906)-1908.

DLZ=Deutsche Literaturzeitung.
Ep. ind=Ephigraphia Indica.

ERE=Encyclopaedia of Religion and Ethics, edited by James Hastings.

Farquhar, Outline=J. N. Farqutiar: an Outline of the Religious Literature of India, London 1920.

Festschrift Kuhn=Aufatze zur Kultur—und Sprachgeschichte vorneh mlich des Orients Ernst Kuhn ..... gewidmet ..... Munchen 1916

Fetschrift Wackernagel=Antidoron, festschrift Jacob Wackernagel, zur Vollendung des 70. Lebensjahres, Gottgen, 1924.

Festchrift Windisch=Festschrift Ernst Windisch zum, 70, Geburtstag der gebracht ..... Leipzig 1914.

GGA=Gottinger Gelehrte Auzeigen

GOS=Gaekwad's Oriental Series, Baroda

Grundriss=Grundriss der indo-arischen Philologie und Alter-tumskunde

GSAI=Giornale della societa Asiatica Italiana

Gurupujakumndi=Gurupujakumndee. Festgabe zum fulfzigjah-rigen Doctorjubilaum Albercht Weber dargeb-racht von seinen Freunden und Schuleru. Leipzig 1896.

Haraprasad, Report i, II=Haraprasad Sastri, Report on the search of Sanskrit MSS (1895-1900), Culcutta 1901 and (1901-02 to 1905-06), Calcutta 1905.

HOS=Harvard Oriental Series, ed. by Ch. R. Lanman.

Ind. Hist. Qu=The Indian Historical Quaterly, edited by Narendra Nath Law.

Ind. Ant.=Indian Autiquary.

Ind. Off, Cat=Catalogue of the Sanskrit Manuscripts in the Library of the India office, London 1887 ff.

Ind. Stud=Indische Studien, herausge—geben von A. Weber.

JA=Journal Asiatique.

JAOS=Journal of the American Oriental Society.

JASB=Journal of the Bombay Branch of the Royal Asaitic Society.

JRAS=Journal of the Royal Asiatic Society of Great Britain and Ireland.

LBZ=Literarisches Zental blatt.

Melanges Levi=Melanges d'Indianis-me offerts par ses eleves a.M. Sylvain Levi ..... Paris 1911.

NGGW=Nachrichten von der Kgl. Gesellschaft der Wissenschaf-ten Gottmgen, Philolog-histor Klasse.

NSP=Nirnaya Sagara Press (Bombay).

OC=Transactions (Verhandlungen, Actes) of Congresses of Orientalists.

OTF=Oriental Translation Fund.

Pischel, K. G.=R. Pischel, Die indische Literature, in Kultur der Gegen wart I, 7, 1906.

Proc. I (II, III) OC=Proceedings and Transactions of the First (Second, Third) Oriental Conference.

RHR=Revue de l'histoine des Religiors. Paris.

RSO=Rivista degli studi orientali, Rome.

S Bay A=Sitzungs berichte der Bayerischen Akademic der Wiss., Philhistor. Kl.

SBA=Sitzungsberichte der Berliner Akademic der Wissenschaften.

SBE=Sacred Books of the Hindus. published by the Panini office. Allahabad.

Schroeder, ILC=L. Von Scheroeder, Indiens Literatur and Cultur, Leipzig, 1887.

SLFT=Studi Italiani di Filologia Indo-Iranica.

Smith, Early History=Vincent A Smith, The Early History of India, Fourth Edition, revised by S. M. Edwardes, Oxford 1924.

SWA=Sitzungsberichte der Wiener Akademic der Wissenschaften.

TSS=Trivandrum Sanskrit Series.

Weber, HSS. Viez=A. Weber, Verzeichnis der Sanskrit and Prakrit-Handschiften der K. Bibliothk zu Berlin.

Weber, HIL=A. Weber, History of Indian Literature, Fourth Edition, 1904, Popular Re-issue, 1914.

Winternitz=Keith, Bodl. Cat-Catalogue of Sanskrit Manuscripts in the Bodleian Library, Vol. II begun by M. Winterniz, continued and completed by A. B. Keith, Oxford, 1905.

WZKM=Weiner Zeitschrift fur die kunde des Mor Morgenlandes.

ZB=Zeitschrift fur Buddhismus (Oskar Scholss, Munichan).

ZDMG=Zeitschrift der Deutschen Morgenlandischen Gesellschatt. chen Morgenlandischen Gesellschaft.

ZVV=Zeitschrift des Vereins fur Volkskunde in Berlin.

පටුන

පිටු

සිංහලානුවාදයේ පෙරවදන v

අඩෝලිපිවල දැක්වෙන සංක්ෂිප්තවල ලේඛනය . . . . . vii-x

11 වන කාණ්ඩය—ජනකාන්ත වීර කාව්‍ය සහ පුරාණයෝ

ඉන්දියාවෙහි වීර කාව්‍යයන් ගේ ආරම්භය 1

මහා භාරතය යනු කිමෙක් ද? 4

මහා භාරතයේ ප්‍රධාන වෘත්තාන්තය 11

මහා භාරතයෙහි පළ වන පෞරාණික වීර කාව්‍යය 48

මහා භාරතයෙහි දක්වෙන බ්‍රාහ්මණ දේව කථා හා පුරාවෘත්ත 57

මහා භාරතයෙහි දක්වෙන උපමා කථා, දෘෂ්ටාන්ත සහ සදෘෂාත්මක කථා . . . 68

මහා භාරතයෙහි උපදේශාත්මක කොටස් 82

හරි වංශය—මහා භාරතයට උපග්‍රන්ථයක් 97

මහා භාරතය ලියැවුණු වකවනුව සහ එහි ඉතිහාසය 105

ජන කාන්ත වීර කාව්‍යයක් හා අලංකාර කාව්‍යයක් ද වූ රාමායණය 117

රාමායණයෙහි වස්තු විෂය 120

රාමායණයෙහි සැබෑ කොටස් සහ ව්‍යාජ කොටස් 132

රාමායණය ලියැවුණු වකවනුව 135

පුරාණ සහ ඉන්දීය සාහිත්‍යයෙහි ඒවාට හිමි වන තැන 145

පුරාණ සාහිත්‍යය පිළිබඳ සමීක්ෂණයක් 153

තන්ත්‍ර සාහිත්‍යය (සංහිතා, ආගම්, තන්ත්‍ර) 190

B&P

දෙවන කොටස

ජනකාන්ත වීරකාව්‍ය සහ පුරාණයෝ

ඉන්දියාවෙහි වීරකාව්‍යයන් ගේ ආරම්භය

වෛදික සාහිත්‍යයෙහි—එ නම්, ඍග්වේදයේ සංවාද සූක්තයන්හි මෙන් ම බ්‍රාහ්මණයන්හි ද ඇතුළත් ආඛ්‍යාන, ඉතිහාස, පුරාණ යන මේ කෘතීන්හි ඉන්දියාවේ වීරකාව්‍යයන් පිළිබඳ මුල් ම හෝඩුවාවන් අපි දැන් දැක ඇත්තෙමු.[1] තව ද, යාගෝත්සවවල දී හා නේවාසික උත්සවවල දී මේ වෘත්තාන්ත කාව්‍යයන් සජ්ඣායනය කිරීම ආගමික චාරිත්‍ර විධීන් ගේ කොටසක් ලෙස පැවැති බව බ්‍රාහ්මණයන් ගෙන් සහ කර්ම විධි සාහිත්‍යයෙන් ද අපි උගතුමු.

මෙ සේ දෙවියන් හා වීරයන් ද පිළිබඳ වෘත්තාන්ත දින පතා සජ්ඣායනය කිරීම පුරා අවුරුද්දක කාලයක් මුළුල්ලෙහි පවත්වනු ලැබූ මහා අශ්වමේධ යාගය පිළිබඳ ප්‍රාථමික උත්සවයට අයත් කටයුත්තක් විය. දස දිනකට වරක් නො කඩවා නැවත නැවතත් පවත්වනු ලැබූ මේ කාර්යයෙහි දී ඇතැම් දෙවිවරුන් හා වීරයන් ද පිළිබඳ කථා කීම සිරිතක් විය. යාගෝත්සවය පැවැත්වූ රජු ගේ දාක්ෂිණ්‍ය ගුණය හා සංග්‍රාම ශූරත්වය සියතින් ම රචිත වූ ගාථාවන් මඟින් කීර්තනය කෙරෙමින් වීණා වාදකයෝ දෙ දෙනෙක්—එ නම්, බමුණෙක් හා ක්ෂත්‍රියයෙක් ද එහි පෙනී සිටියහ. සැබෑ රජකු පිළිබඳ වූ හෝ බමුණන් ගේ රජු ලෙස සෝම පිළිබඳ වූ හෝ ප්‍රශස්තීන් වීණා නාදයට අනුව ගැයූ වීණා වාදකයන් ගර්භනී මාතාවක ගේ ගර්භයට සිවු මසක් පිරුණු තැන ගර්භයේ ආරක්ෂාව පිණිස යාගයක් ද සහිත ව පැවැත්වුණු සීමාන්ත චාරිත්‍රවිධි යෙහි ද පෙනී සිටිය යුතු විය. අවමංගලයෙකින් පසු ව ද දුකට පත් වූවන් තම ගෘහයෙන් පිටතැ ආවරණය සහිත තැනෙක හිඳගෙන පැරණි ඉතිහාසයන් හා පුරාණයන් පිළිබඳ සජ්ඣායනයට සවන් දෙමින් සිත වන'තෙක රඳවා දුක නිවාගැනීම පැරණි සිරිතක් විය. කිතු වසින් 7 වන සියවසෙහි පවා මේ සිරිත පැවැති බවට බාණ කවියා දෙස් දෙයි. මරණ යක්, වෙනත් බරපතළ හානියක් හෝ පවුලට සිදු වූ විට තව දුරටත් ඇති විය හැකි විපතින් බේරීම පිණිස උදුනෙහි තුබූ ගින්දර ගෙදරින් බැහැර කිරීමත් ඇතිල්ලුම් කෝටු දෙකක ආධාරයෙන් අලුත් ගින්නක් අවුලුවා ගැනීමත් කැරිණ. ඉක්බිති පවුලේ සාමාජිකයෝ එක් ව රාත්‍රී කාලයේ බොහෝ වේලාවක් යන තෙක් ගින්න දැල්ලෙන්නට සලස් වමින් එහි වටා හිඳ වෘද්ධ වයසෙහි සිටියවුන් ගේ කථාවලටත් අනා ගතය සඳහා වැඩ පසස්නා ඉතිහාසයනට හා පුරාණයනටත් සවන් දුන්හ.[2]

තනි ආඛ්‍යාන පමණක් නොව, ආඛ්‍යාන චක්‍ර ද ඒ කලැ විය. යටත් පිරිසෙයින් මේ වර්ගයට අයත් එක් ආඛ්‍යාත චක්‍රයක් "සුපර්ණාඛ්‍යාය" නොහොත් "සුපර්ණ" යන නාමයන් ගෙනුදු හැඳින්වෙන සුපර්ණාඛ්‍යානයෙන් අපට ලැබී ඇත.[3] මේ වූ කලි පශ්චිමකාලීන වෛදික සාහිත්‍යයට අයත් ව්‍යාජ කෘතියෙකි. මෙහි කතුවරයා තම කෘතිය සෘග්වේදයට අයත් වූවක් ලෙස පෙනීම පිණිස භාෂාව, උච්චාරණවිශේෂීකරණය හා බාහිර ආකෘතිය ද අතින් සෘග්වේදයේ සූක්ත්යන් අනුකරණය කිරීමට හැකි හැම ප්‍රයත්නයක් ම දරයි. මේ කෘතියේ වකවනුව අවිනිශ්චිත ය. එහෙත් එහි යෙදී ඇති වෘත්තයනට අනුව මේ කෘතිය කඹ උපනිෂද් වැනි පද්‍යමය උපනිෂද් පහළ වූ වකවනුවට දළ වශයෙන් අයත් කළ හැකි වේ.[4] මේ වූ කලි නාග මාතාව වූ කද්‍රූ හා ගරුඬ මාතාව වූ විනතාවන් ගරුඬයන් හා නාගයනුත් අතරෙහි පැවැති වෛරයන් පිළිබඳ ව කියැවෙන වෘත්තාන්තය ඇතුළත් ආඛ්‍යාන චක්‍රයෙකි. මේ වෘත්තාන්තය වෛදික කාලය තරම් පැරණි වන අතර එය මහාභාරතයේ ආස්තිකපර්ව යෙහි වීරකාව්‍ය ස්වරූපයෙන් පෙනී සිටින්නකි.

වේදයනට හා අවශේෂ අධ්‍යයන ශාඛාවනට ද අමතර ව ඉතිහාස හා පුරාණ ද නිරතුරු ව ම පාහේ පශ්චිමකාලීන වෛදික ග්‍රන්ථයන්හි සඳහන් කරනු ලැබ ඇත. මේ කෘතීන් හැදෑරීම දෙවියනට ප්‍රසාද උපද වන කාර්යයක් ලෙස සැලැකිණ. "ඉතිහාස පුරාණය" සැබැවින් ම හැඳින්වුණේ පස් වන වේදය[5] ලෙස ය. සාමාන්‍යයෙන් ම ඒ සඳහන් කරන ලද්දේ ඒ හා ඉතා ළඟ සබඳකමක් ඇති ලෙස සැලැකුණු අථර්ව වේදයට අනතුරු ව ය.[7] වෛදික සංහිතාවට සමාන වූ දේවකථාවන් ගෙන් හා පුරාවෘත්තයන් ගෙන් ද, දෙවියන් පිළිබඳ පුරාවෘත්තයන් ගෙන් හා පුරාණ කාලයට අයත් රජුන්, ඍෂීන්, දෙවියන්, නාගයන් හා යක්ෂයන් ද පිළිබඳ කථාවන් ගෙන් ද තැනුණු ඉතිහාස හා පුරාණ කෘති සංග්‍රහ එකක් හෝ කිහිපයක් එවකට පැවැතිණැයි නිගමනය කිරීමට මේ කරුණු හේතු විය. කෙසේ වුව ද, මෙ වැනි සංග්‍රහයන් වෛදික යුගය තුළ දී සැබෑ "ග්‍රන්ථ ස්වරූපයෙන්" පැවතියහයි සිතීමට තුඩු දෙන සාක්ෂ්‍ය නො ලැබේ.[8] මේ ගැන අප දරන්නේ ඉතා පුරාණ කාලයෙහි වෘත්තියක් වශයෙන් කථා කීමෙහි යෙදුණවුන් (ඓතිහාසිකයන්, පෞරාණිකයන්) සිටි බව පමණෙකි. තව ද, ගද්‍යයෙන් මෙන් ම පද්‍යයෙන් ද සකස් වූ ආඛ්‍යාන—ඉතිහාස—පුරාණ—ගාථා යන නමින් හැඳින් වුණු කථා මහා සම්භාරයක් බුද්ධකාලය තරම් පැරණි කාලයෙක ඉන්දියාවෙහි පැවැති බව නිසැක ය. "ජනතාව ගේ සාහිත්‍යමය පොදු වස්තුවක්" ලෙස පැවැති මේ සම්භාරයෙන් බෞද්ධයන් මෙන් ම ජෛනයෝත් වීරකාව්‍ය රචකයෝත් කථාවන් උපුටා ගත්හ.

දෙවියනට ප්‍රසාදකර ග්‍රන්ථයන් අතුරෙහි ඉතිහාසයන් හා පුරාණයන් ද හැරෙන්නට බොහෝ විට සඳහන් ලබන තවත් කෘතීහු නම් "ජනප්‍රශංසන ගීත" (ගාථා නාරාශංසී) සි.[9] එක් අතෙකින් මේ ගීත

සෘග්වේදයේ **දානස්තුති** සූක්තයනටත් අථර්වවේදයේ **කුන්තාප** සූක්තයනටත් සබඳකම් ඇතත් තවත් අතෙකින් ඒවා නියම වීරකාව්‍යයේ ඒකාන්ත පූර්වගතයෝ වූ හ. එයට හේතුව මේ ගීතයන්හි ඇතුළත් ව පවත්නේ රණවීරයන් ගේ හා රජුන් ගේ ද වික්‍රම ක්‍රියා පිළිබඳ විස්තර වීම ය. මේ "නාරාශංසී ගාථා" නොබෝ කලෙකින් ම සෑහෙන තරම් දිගින් යුත් **වීර ගීතයනට** සහ **එක්** වීරයකු හෝ **එක්** ශ්‍රේෂ්ඨ සිද්ධියක් වටා ගෙතුණු වීර ගීතිකා **මාලාවන්** බවට ද වැඩී යන්නට ඇත. එ සේ කියනුයේ අප අතට පත් ව ඇති මහාභාරතය හා රාමායණය ද ඉතා ඈත අතීතයකට අයත් වීර කාව්‍ය යුගයෙක අන්තිම නෂ්ටාවශිෂ්ටයන් පිළිබිඹු කරන බැවිනි. මහාභාරතයට මාධ්‍යය වූ ජාතීන් ගේ මහා සංග්‍රාමයන් හා රාමායණයේ වීරයා වූ රාම ගේ වීර ක්‍රියා වනුත් පිළිබඳ ව ගෙතුණු ගීතයන් මේ **වීර** කාව්‍යයන් දෙක දැනට පවත්නා ස්වරූපයෙන් පැවැතීමට බොහෝ කලකට ඉහතැ දී ගායනය කරනු ලබන්නට ඇත. තව ද, **කෞරවයන්** හා **පාණ්ඩවයන්** ද අතර පැවැති යුද්ධ හා රාම ගේ වීර ක්‍රියාවනුත් පමණක් කාව්‍යයේ විෂයය ව පැවතියේ යැයි සිතිය නොහැකි ය. වෙනත් වීරවරයන් හා රාජවංශ යන් ද පිළිබඳ ශ්‍රේෂ්ඨ සිද්ධීන් ගැන ද කරුණු එ වකට ගීතයට නංවනු ලබන්නට ඇත. මෙ වැනි ගීතිකා එ කලැ පැවැති බව අප විසින් පිළිගත යුතු අතර ඒවා මුළුමනින් ම අතුරුදන් වූයේ නො වේ. සුන්බුන් හා කැබැලි ද වශයෙන් මින් සමහරක් අපේ **වීර** කාව්‍යයන් දෙකෙහි සුරැකි ව පවතී.[10]

රජවරුන් ගේ මාළිගවල වෙසෙමින් රජුන් ගේ **යශෝඝෝෂය** ප්‍රකාශ කරනු පිණිස මහෝත්සවවල දී ගීතිකා ගැයූ "**සූත**" යන නමින් සාමාන්‍යයෙන් හැඳින්වුණු කවියෝ මේ වීරකාව්‍යයේ කතුවරයෝත් ගායකයෝත් ආරක්ෂකයෝත් වූ හ. ක්ෂත්‍රියයන් ගේ වීර ක්‍රියාවන් තමන් ම බලා ඒ පිළිබඳ ප්‍රශස්තීන් තනා ගැයීමට හැකි වනු පිණිස මොහු ද සටන් බිමට ගියහ. මේ සේ මහා භාරතයෙහි සටන් බිමෙහි සිටු වූ දෑ පිළිබඳ ව **ධෘතරාෂ්ට** රජුට විස්තර කරනුයේ **සූත සඤ්ජය** ය. මේ රාජසභා ගායකයෝ පරපුරින් පරපුරට වීරකාව්‍ය ගීතිකාවන් රැකගෙන ආ විශේෂ කුලයකට[11] අයත් වූ හ. වීරකාව්‍ය පහළ වන්නට ඇත්තේ **ක්ෂත්‍රිය කුලය** හා නිත්‍යයෙන් ම ඉතා ළඟ සබඳකම් ඇති ව සිටි මෙ බඳු කවීන් ගේ කට්ටි අතරෙහි විය හැකි ය. මොවුන් හැරෙන්නට ගීතිකාවන් වන පොත් කොට වීණාවට අනුව ප්‍රසිද්ධියේ ගැයූ **කුශීලව** නමින් හැඳින් වුණු සංචාරක ගායක පිරිසක් ද වූ හ. **මහා ජනතාව** අතරෙහි වීර කාව්‍ය ගීතිකාවන් පැතිරෙන්නට වූයේ මොවුන් හේතු කොට ගෙන ය. මෙ සේ රාමායණයට පශ්චිම කාලයෙහි ඇතුළු කරන ලදැයි සිතිය හැකි ගීතිකා වෙක[13] රාම ගේ දෙ පුතණුවන් වූ **කුශ** සහ **ලව** යන දෙ දෙන **වාල්මීකි** ගෙන් උගත් කාව්‍යය ප්‍රසිද්ධ රැස්වීම් පොළවල **ගයමින් සංචාරක ගායකයන්** වශයෙන් ගමන් කළ සැටි විස්තර වෙයි.

එහෙත් ඉන්දියයන් ගේ ජනකාන්ත වීරකාව්‍යයන් වූ මහා භාරතය හා රාමායණය ද ලෙස අප දැන සිටින කෘතීහු ඒ රාජසභා ගායකයන් හා පුරාණ ඉන්දියාවේ සංචාරක ගායකයන් ද ගැයූ පැරණි වීර ගීතිකාවන් එක් රැස් කිරීමෙන් මහා කවීන් විසින් හෝ කාව්‍යකරණයෙහි කිසි යම් නිපුණත්වයක් ඇති ව සිටි දක්ෂ සංග්‍රාහකයන් විසින් හෝ සම්පාදිත වූවෝ නො වෙති. ඔහු වූ කලි සියවස් කිහිපයක් තුළ නිරතුරු ව කරන ලද ඇතුළු කිරීම් හා වෙනස් කිරීම් ද නිසා පහළ වූත් එක සමාන අගයක් නැත්තා වූත් අනේකප්‍රකාර කාව්‍යයන් එක් තැන් කිරීමෙන් සම්පාදිත වූත් කෘතීහු ය. පැරණි වීර ගීතිකාවන් මේ කෘතීන් දෙකෙහි ම මාධ්‍යය වශයෙන් පැවැතිය ද භක්තිපූර්වක ඉතිහාස සාහිත්‍යයත් ධර්මනීති ස්වභාවයේ දීර්ඝ පද්‍යමාලාත් මේ කෘතීන් තුළට කොතරම් දුරට පිවිසවන ලද ද යත්,, ඔවුන් ගේ—විශේෂයෙන් ම, මහා භාරතයේ—වීර කාව්‍යයෙක නිබිය යුතු ලක්ෂණය සම්පූර්ණයෙන් ම අතුරුදන් ව ඇත.

මහාභාරතය යනු කිමෙක් ද[1]?

"වීරකාව්‍යයක්" හෝ "කාව්‍යයක්" ලෙස මහාභාරතය අප හඳුන් වනුයේ ඉතා සීමා සහිත අර්ථයක් ඇති ව ය. එක්තරා අතෙකින් මහා භාරතය එක් කාව්‍යමය නිෂ්පාදිතයක් නො වේ. ඒ වූ කලි සම්පූර්ණ සාහිත්‍යයෙකි.

'මහාභාරත' යන්නෙන් අදහස් කැරෙනුයේ "භාරතයන් ගේ සංග්‍රාමය පිළිබඳ මහා කථාව" යනුයි. රණකාමී ගෝත්‍රයක් ලෙස භරත යන් ගැන සෘග්වේදයෙහි කලින් ම සඳහන් ව ඇත. දුශ්‍යන්ත ගේ හා ශකුන්තලාව ගේ පුත්‍ර වූත් භාරත රාජවංශයේ ආදිමයා ලෙස සැලකෙන් නාවූත් භරත ගැන බ්‍රාහ්මණවල අපට කියැවීමට ලැබේ. මේ භරතයන් ගේ හෙවත් භාරතයන් ගේ නිජ භූමිය ගංගා හා යමුනා යන නදීන් ගේ ඉහළ ප්‍රදේශය අයත් වන රටෙහි විය. භාරතයන් ගෙන් පැවැතෙන්න වුන් අතරෙහි 'කුරු' නමින් හැඳින්වෙන පාලකයෙක් විශේෂ ප්‍රමුඛ ස්ථානයක් දැරුවෙක් විය. ඔහු ගෙන් පැවැතෙන්නන් වූ කෞරවයෝ කෙතරම් දීර්ඝ කාලයක් භාරතයන් ගේ රාජවංශයට අයත් ව සිටියෝ ද යත් කුරු හෙවත් කෞරව යන නම කාලයා ගේ ඇවෑමෙන් භාරතයන් ගේ ගෝත්‍ර නාමයෙක ලක්ෂණය දක්වමින් සිටියේ ය. ඔවුන් ගේ රට යජුර්වේදයෙන් හා බ්‍රාහ්මණවලින් ද අපට දැනගන්නට ලැබුණු කුරුක්ෂේත්‍ර හෙවත් "කුරු රට" විය.[2] කෞරව රාජවංශය තුළ ඇති වූ අභ්‍යන්තර භේදයක් බිහිසුණු සටනකට පෙරැළී යයි. සැබෑ මාරාන්තික සංග්‍රාමයක් වන මෙහි දී කුරූන් ගේ පෞරාණික වංශයත් භාරතයන් ගේ වංශයත් යන දෙක ම සම්පූර්ණයෙන් ම විනාශයට පත් වේ. මහාභාරතයෙහි දී පමණක් අපට කියවන්නට ලැබෙතත් සැබෑ ඓතිහාසික සිද්ධියක් ලෙස සැලකිය හැකි මේ බිහිසුණු යුද්ධයේ ඉතිහාසය කියැවුණේ

ගීතිකාවන් ගෙනි. අප අතට නම් නොපත් වූ කිසි යම් ශ්‍රේෂ්ඨ කව්යකු විසින් මේ ගීතිකා එකතු කොට කුරුක්ෂේත්‍රයෙහි දී සිදු වූ මහා සංග්‍රාමය පිළිබඳ කථාව වීර කාව්‍යකට නංවන ලදි. මෙ සේ **ඉලියඩ්** කාව්‍යයෙහි හා **නිබෙලුංගෙන්** ගීතයෙහි දී මෙන් සමූලඝාතනයෙන් කෙළවර වූ බිහිසුණු සංග්‍රාමයක් පිළිබඳ ඛේදවාචකය වීරකාව්‍යයේ සැබෑ වස්තුව බවට පත් ව ඇත. මහා භාරතයේ **කේන්ද්‍රය** තැනී ඇත්තේ මේ පැරණි වීර කාව්‍යයෙනි.

කෙසේ වුව ද, සියවස් කිහිපයක් ඉකුත් වීමෙන් පසු මේ **කේන්ද්‍රය වටා විවිධත්වයෙන් යුත් කාව්‍ය සම්භාරයක් එකතු විය. පැරණි කාව්‍ය හා** පළමුවෙන් ම බැඳිගිය වෘත්තාන්ත සමූහය වූ කලි මහා සංග්‍රාමය හා කිසි දු සම්බන්ධයක් නැති ව එකතු කරන ලද වීරයන් ගේ මුල් කාලය පිළිබඳ ඉතිහාසය හෝ ඔවුන් ගේ විවිධ වීර වික්‍රමයන් පිළිබඳ වාර්තා ය. **ඉන් පසු** ව ආදි යුගයට අයත් **ප්‍රසිද්ධ රජවරුන් හා වීරයන් ද පිළිබඳ අන්‍ය වීර** කථාවල හා වෘත්තාන්ත මාලාවල ද කොටස් මහා කුරු සංග්‍රාම යිතාවට කිසි දු සබඳකමක් නැති ව ද එහි කාව්‍යයට වැදගත් තේ ය. මේ පැරණි වන්දි කාව්‍යයෙන් කොතරම් ප්‍රමාණයක් මුල් කාව්‍යයට අයත් අතිරේක **කථා (උපකථා)** වශයෙන් පැවතියේ ද, **කොපමණ තරමක් ඉන් පසු** එකතු කරන ලද්දේ ද යනු කිසි කලෙකත් තීරණය කළ නොහැකි වනු ඇත. අතීත කාලයෙහි මෙ බඳු කථා රාශියක් ම නිදහස් කාව්‍යයන් වශයෙන් වන්දීන් විසින් ගායනය කරනු ලබන්නට ඇතැයි ඇදහීමට තුඩු දෙන හේතු අපට තිබේ.[4] කෙසේ වුව ද අපේ මහභාරතය භාරතයන් ගේ සංග්‍රාමය පිළිබඳ කාව්‍යය වූවා පමණක් නො වේ; **මුළු මහත් පැරණි වන්දි කාව්‍යයේ කෝෂ්ඨාගාරය ද එය වෙයි.**

කෙසේ වුව ද, එහි තව බොහෝ දෑ වෙයි. පුරාණ ඉන්දියාවේ සාහිත්‍ය යට අයත් කාර්යයන් ගෙන් වැඩි කොටසක් ම එහි පූජකයන් වූ බමුණන් අතෙහි පැවැති බව අපි දනිමු. අථර්ව වේදයට අයත් පැරණි භූතවිද්‍යා ගීතයනට බ්‍රාහ්මණ ස්වරූපයක් දුන් අයුරු ද බ්‍රාහ්මණ වාදයට සැබෑවින් ම ආගන්තුක වූත් පටහැණි ව පවා සිටියා වූත් උපනිෂද් දර්ශනයට බ්‍රාහ්මණයන් ඔවුන් ගේ පූජක බුද්ධිය මිශ්‍ර කළ අයුරු ද අපි දුටුවමු. වීර ගීතිකාවන් වඩ වඩා ජනප්‍රසාදයට පත් වන්නට වන්නට වීර කාව්‍යය ද තමා සතු කොට ගැන්මට බ්‍රාහ්මණයන් තුළ පැවැති උනන්දුව ද අධික වන්නට විය. මුල දී අවශ්‍යයෙන් ම මත් පැහැදිලි ව ම **ලෞකික** ස්වරූප යෙන් පැවැති මේ කාව්‍යය ඔවුන් ගේ ම **ආගමික** කාව්‍යයන් හා ඔවුන් සතු ව පැවැති සියලු දේවවේදාත්මක හා පූජක ධර්මයන් සමඟ සංයෝග කිරීමේ ක්‍රමය ඔහු දැන සිටියහ. මෙ සේ දේවකථාවන් හෙවත් **බ්‍රාහ්මණයන් අතින් පහළ වූ පුරාණවේදමය කථාවනුත් බොහෝ දුරට බ්‍රාහ්මණික දර්ශනය, සාධුශීලය හා බ්‍රාහ්මණ නීතිය ගැන ද කියැවෙන**

උපදේශාත්මක කොටස් ද පවා මහාභාරතය තුළට පිවිසවා ලද බව පෙනී යයි. තමන් ගේ ධර්මය ව්‍යාප්ත කිරීමේ හා එ මඟින් ඔවුන් ගේ ම බලය තර කොටගැනීමේ ද එක ම මාධ්‍යය ලෙස ජනකාන්ත වීරකාව්‍යය පූජක පක්ෂය විසින් පිළිගැනිණ. බමුණන් ගේ පුරාතනයන් වූ, පුරාණයෙහි වුසූ සුප්‍රකට ඍෂිවරයන් ගේ අද්භූතජනක වික්‍රමයන් පිළිබඳ වත් යාගයේ හා තපසේ බලයෙන් මිනිසුන් පමණක් නොව දෙවියනුදු අබිබවා මහා බලයක් අත්පත් කොට ගත් අයුරු පිළිබඳ වත් ඔවුන් කෝපයට පත් කරනු ලැබූ කල්හි කරන ලද ශාපයෙන් රජුන්, මහා බලවතුන් පමණක් නොව දේවේශ්වරයන් ද පවා පරිහානියට පත් වූ අයුරු පිළිබඳ වත් ගෙතුණු නානාවිධ පුරාණ කථාවන් හා වෘත්තාන්තයන් (ඉතිහාස[6]) ද වීර කාව්‍යය තුළ පිවිසවූවෝ ඔහු ය.

එතෙකුදු වුවත් මහාභාරතය නියම බ්‍රාහ්මණික කෘතියක් හෝ කිසි යම් වෛදික ගුරුකුලයකට අයත් කෘතියක් හෝ බවට පත් විය නොහැකි වූයේ එහි ඇති ජනකාන්ත ස්වභාවයත් බොහෝ ජන කොට්ඨාශයන් ගේ, විශේෂයෙන් ම ක්ෂත්‍රිය වංශයේ දේපලක් වීමත් නිසා ය. බොහෝ කොට ම, මහාභාරතය වර්ධනය කිරීමේ කාර්යයට අත දුන්නෝ වේදය දැන සිටි හෝ උගත් ගණයට වැටුණු හෝ බමුණෝ නො වෙති. එ හෙයින් වීර කාව්‍යයෙහි බ්‍රාහ්මණ ආභාසය නිසැක ව ම දැකිය හැකි කොටස්වල පවා නියම බ්‍රාහ්මණික දේව විද්‍යාව හෝ යාග විද්‍යාව පිළිබඳ ව උගත හැකි කරුණු ඉතා ස්වල්පයෙකි. සූතයන් (=ගායකයන්) මෙන් ම රජුන් ගේ සේවාවෙහි නියුක්ත ව සිටියෝ පුරෝහිත නම් වූ රාජසභා පූජකයෝ ය. එ හෙයින් වීරකාව්‍යය පිළිබඳ ව වැඩිපුර ඇසුරකට පත් වීමට ඔහු සමත් වූහ. ඉතා බෙහෙවින් ම විෂ්ණු සහ ශිව දෙවියනට පිදුණා වූත් ස්වකීය ස්ථානයනට සම්බන්ධ දේශීය පුරාණ කථාවන් ගෙන් හා විෂ්ණු ශිව යන දෙවිවරුන් වටා ගෙතුණු වෘත්තාන්තයන් ගෙන් ද සමන්විත සාහිත්‍ය සංවර්ධනයට කැප වූත් සුප්‍රසිද්ධ සිද්ධාන්තයන්හි හා වන්ද නියස්ථානයන්හි ද වූසූ පූජකයනට වීර කාව්‍යය සපයන ලද්දේ උගත් කමින් අඩු මේ පූජක පන්තිය විසිනි. අපට පෙනීයන ලෙස මෙය ප්‍රධාන වශයෙන් ම කැරුණේ පුරාණවල වුව ද නියම පුරාණ ශෛලියෙන් ලියැවුණු දේශීය පුරාණ කථා විශාල සංඛ්‍යාවකුත් පුරාණ ස්වරූපය ගත් විශ්වසම්භව කථාවනුත් භූ විද්‍යාත්මක ලේඛන හා වංශ ඉතිහාස ලේඛනත් ඇතුළු ව සිටි මහාභාරතයෙහි ද එය සිදු විය.

එහෙත් වීරකාව්‍යය බොහෝ කොට ම වැඩී ගියේ අත්‍යුත්තම දේවයා ලෙස විෂ්ණු පුදනු ලැබූ ඉන්දීය ප්‍රදේශවල ය. මහා භාරතයේ ධර්මෝපදේශ පරිච්ඡේදවල පෙරමුණෙහි මේ දෙවියා කොතරම් කැපී පෙනේ ද යත් මේ කෘතිය විෂ්ණු පූජාව සඳහා කරන ලද ආගමික කෘතියෙකැයි යන හැඟීමක් ඇතැම් විටෙක පහළ වීමට හේතුව මෙයයි. ශිව වෘත්තාන්ත හා ශිව ලබ්ධිය ගැන කියැවෙන පාඨයන් ද මේ පොතෙහි හමු වන බව සැබෑ ය. එහෙත්

ඒ හැම එකක් ම පසු ව එකතු කරන ලද කොටස් බව හැඳිනගත හැකි ය. ඒ කොටස් ඇතුළු කරන ලද්දේ ශිව ලඬ්ඩිය නිජ බිම කොට පැවැති පෙදෙස්වල ද වීරකාව්‍යය ප්‍රචාරයට පත් වූ බැවිනි.[7]

එහෙත් පුරාණයෙහි සාහිත්‍ය කාර්යවල නියැලුණා වූත් එක් අතෙකින් බ්‍රාහ්මණයනට ද වඩා මහාජනයා ගේ ප්‍රසාදය තම පක්ෂයට නම්මා ගැනීමට පරිශ්‍රමයක් දැරුවා වූත් වෙනත් ආගමික කණ්ඩායම් ද ඉන්දියා වෙහි වූ හ. මොහු නම් බුද්ධ කාලයෙහි ඉන්දියාවේ ඉතා බෙහෙවින් පැවැති නානා නිකායයන් ගේ හා ආශ්‍රමික ආයතනයන් ගේ ද ආරම්භක යන් වූ ඍෂිවරු, තාපසවරු හා ශ්‍රමණවරු ද වෙති. මොවුනට ද මොවුන් ගේ ම කාව්‍යයක් බැගින් තිබිණ. අභිනිෂ්ක්‍රමණය හා ලෞකික සම්පත් හෙළා දැකීමත් ආත්ම පරිත්‍යාගය හා සව් සතුන් කෙරෙහි මෛත්‍රියත් පිළිබඳ දෘෂ්ටීන් දේශනා කිරීම සඳහා යොදාගනු ලැබූ ඝාඩු චරිත කථා හා සිද්ධාන්තත් මුනිවරයන් ගේ දර්ශනයන් හා සාධු ශීලයන් ද නිදසුන් මඟින් පැහැදිලි කිරීමට අවශ්‍ය වූ උපමා කථා, දෘෂ්ටාන්ත හා ඝාධුශීල කථාත් මේ කාව්‍යයෙන් කියැවිණ. මේ ඍෂි කාව්‍යය ද සෑහෙන තරම් දුරට මහා භාරතයට ඇතුළු කරනු ලැබ ඇත.

කොතෙක් දුරට වීරකාව්‍යයකට වඩා නන්වැදෑරුම් කථාවන් ගේ සර්ව සංග්‍රහයක් බවට මහාභාරතය පත් වූයේ ද යත් ඇතැම් තන්හි සම්පූර්ණයෙන් ම ගද්‍යයෙන් රචිත වූත් තවත් තන්හි පද්‍යයෙන් හා ගද්‍යයෙන් ද රචිත වූත් ගද්‍ය ඛණ්ඩ පවා වීරකාව්‍යයට බද්ධ කරන ලදි.

කරුණු මෙසේ හෙයින් සියලු සාහිත්‍ය නිෂ්පාදිතයන් අතුරෙහි විශිෂ්ට තම වූ මේ කාව්‍යයෙහි බිහිසුණු සංග්‍රාම දර්ශනයන් පිළිබඳ චමත්කාර ජනක වර්ණනයන් හා රණශීලි වීරගීතිකාවන් ද සමඟ මිශ්‍ර වත් හරිහැරියටත් දර්ශනය, ආගම හා නීතිය ද පිළිබඳ ව රචිත වූ-බොහෝ විට වෙහෙස දනවන්නා වූ විස්තරයන් ගෙන් යුත් පූජක භක්තිගීත හා ඥානාභිවෘද්ධි යට අදාළ කරුණින් ද මිනිසා මෙන් තිරිසනා ද කෙරෙහි පැතිර ඉතිරී ගිය මෛත්‍රී ලක්ෂණයෙන් ද පිරී පවත්නා සරල ඍෂි කාව්‍යයක් ද අපට දක්නට ලැබේ.

කරුණු මෙසේ හෙයින් මහාභාරතය නියතයෙන් ම වීරකාව්‍යයක් වුව ද එය කාව්‍ය කෘතියක් ලෙසත් පැරණිතම ස්මෘතියේ ප්‍රතිෂ්ඨාව ලද සාධු ශීලය, නීතිය හා දර්ශනය ද පිළිබඳ ශාස්ත්‍රයක් ලෙසත්, එ හෙයින් ම අප්‍රතිහත ප්‍රාමාණයෙකින් යුත් කෘතියක් ලෙසත් සැලැකේ. අවුරුදු 1500කට වැඩි කාලයක් එය භාරතීය ජනතාවට විනෝදාස්වාදය මෙන් ම ඥානාභිවෘද්ධිය පිළිබඳ ශික්ෂණය ද ලබා දී ඇත.

යටත්පිරිසෙයින් මෙයට අවුරුදු 1500කට ඉහත දී මේ මහාභාරතය පැවැතියේ අත් ලියවිලිවලින් හා සංස්කරණයන් ගෙන් ද අද අප සතු ව ඇති තත්ත්වයෙන් ම හෝ යටත් පිරිසෙයින් එයට බෙහෙවින් සමාන ව අද අප හමුයෙහි ඇති වීරකාව්‍යයේ ප්‍රමාණයෙන් ම එක කෘතියක් ලෙස ය.

පසු ව කියනලද්ද මෙන් ම එයට, සැකිල්ලකින් යුත් **දීර්ඝ ප්‍රස්තාවනාවක්** ද කාව්‍යයේ ප්‍රභවය පිළිබඳ වෘත්තාන්තවල එන කතා පුවත ද සමය හා සාධුශීලයන් පිළිබඳ පාඨ ග්‍රන්ථයක් ලෙස කාව්‍යය පිළිබඳ කීර්තනයක් ද ඇතුළත් විය. එය **"පර්වන්"** නමින් හැඳින්වුණු **කාණ්ඩ දහ** අටකට බෙදී පැවතිණ. මේ ගණයට අතිරේකයක් (**"ඛිල"**) වශයෙන් දහ නව වැනි කාණ්ඩය වූ **හරිවංශය** ද එක් කැරිණ. මෙ සේ කිරීමෙන් එය **ශ්ලෝක** 100,000ක ප්‍රමාණයකට පත් විය. අද දක්වාත් මේ ශෝධ කෘතිය එහි විවිධ මූලවස්තූන් ඇතුළත් ව පවතිද්දීත් සම්පූර්ණත්වයෙන් යුත් එක ම සංහිතා කෘතියක් ලෙස ඉන්දියයන් විසින් සලකනු ලැබේ.[10] මෙහි කතුවරයා **ව්‍යාස** නමිනුදු හැඳින්වෙන අතිමාන්‍ය **කෘෂ්ණ ද්වෛපායන ඍෂිවරයා** ය. මේ ඍෂිවරයා ම චතුර්වේදයේ සංස්කාරකයා බවත් පුරාණයන් ගේ කර්තෘවරයා බවත් කියනු ලැබේ. ඔහු මහාභාරතයෙහි සඳහන් වන වීරයන් ගේ සමකාලීනයකු පමණක් නො ව, ඉතා ළඟ නෑයකු බව ද වෘත්තාන්තයෙහි කියැවේ. ඉදහිට ඔහු ගේ නම කාව්‍ය යෙහි විස්තර වන සිද්ධිවල දී කියවන්නට ලැබේ. ඔහු ගේ ඉතිහාසය මහාභාරතයෙහි සවිස්තර ව කියැවේ.

ගේ සුප්‍රකට ඍෂිවරයකු වූ **පරාශර** ගේ පුත්‍රයා ය. මේ මහා ඍෂිවරයා දිනෙක මත්ස්‍යයකු තුළට පිවිස මිනිස් ලොවට පැමිණ කෙවුළන් විසින් තමා වෙතට පමුණුවනු ලැබූ **සත්‍යවතිය** දැක ඇගේ රූපලාවණ්‍යයෙන් මත් ව ඇය කෙරෙහි පිළිබඳ සිතක් ඇති කළේ ය. එහෙත් ඇය ඔහු ගේ කැමැත්තට අවනත වන්නට නම් ඔහුට දා ව දරුවකු ලද පසු ඇය යළිත් කන්‍යාභාවයට පැමිණිය යුතු ය යන වරයට ඔහු එකඟ විය යුතු විය. මහර්ෂි තෙමේ ඈට ඇගේ වරය දී ඇගේ ශරීරයෙහි තුබූ පිලී ගඳ ඉවත් ව ගොස් පුදුම උපදවන සුවඳක් ඉන් වහනය වන ලෙසට ද වරයක් දුන්නේ ය. ඇය ඔහු හා සංවාසයට පැමිණි වහා ම ඕ තොමෝ **යමුනා** නදියේ දූපතෙක දී **ද්වෛපායන**—**"දිවයිනෙහි උපන්"** නම් පුත්‍රයකු ප්‍රසූත කරයි. කුමරුවා වැඩි විය පත් කල්හී තපසට යනු කැමැති වෙයි. ඔහු මව හැර යද්දී ඇයට ඔහු උවමනා හෝ ඔහු ගැන සිහි කරන හෝ කවර නමුත් අවස්ථාවෙක දී ඇය ඉදිරියෙහි පෙනී සිටින බව කියයි. සත්‍යවතිය ද යළිත් කන්‍යාවක බවට පත්වූවා, පසු කලෙක **සාන්තනූ** නම් කුරු රජු ගේ බිරිය බවට පැමිණ ඔහු නිසා **චිත්‍රාංග විචිත්‍රවීර්ය** නම් **පුතුන් දෙ දෙනකුන්** ලබයි. සාන්තනූ ගේ සහ චිත්‍රාංග ගේ ද ඇවැමෙන් පසු විචිත්‍රවීර්ය තෙමේ රජ බවට පත් වෙයි. තුරුණු වියෙහි දී ම ඔහු අපුත්‍රක ව මිය ගිය ද ඔහු ගේ බිරියෝ දෙ දෙන ජීවත් ව සිටියහ. ස්වවංශය අභාවයට යා නොදෙනු පිණිස සත්‍යවතී තොමෝ තම අවජාත පුත්‍රයා වූ ද්වෛපායන කැඳවීමට තීරණය කෙරෙයි. එ සේ කිරීමෙන් **'ලෙවිරාට'** නීති චාරිත්‍රයට අනුව ඔහු ගේ නෑනාවරුන් ගෙන් දරුවන් ලැබිය හැකි වෙයි. ද්වෛපායන මහෂියකු හා තාපසයකු වුව ද හෙතෙමේ දළ කෙස්සෙන් හා රවුළින් ද කළුවට පෙරැළෙන දැසින් ද (කෘෂ්ණ—**'කළු පැහැ ඇත්තා' යන නම**

ඔහුට ලැබී ඇත්තේ එ හෙයින් විය යුතු ය.)යුත් ඉතා අවලස්සණ පුද්ගල යෙකි. ඔහු ගේ ශරීරය දුගඳ නික්මවන්නක් විය. එ හෙයින් ඔහු එක් කුමරියක වෙත එලැඹෙන කලැ ඇයට ඔහු ගේ පෙනුම ඉවසිය නො හෙන හෙයින් ඕ තම ඇස් පියාගනී. මෙහි විපාකය වූයේ ඇගේ පුත්‍රයා අන්ධ යකු ව ඉපදීම ය. පසු කලෙක ධෘතරාෂ්ට්‍ර නම් රජු වූයේ හෙතෙමේ ය. ඉක්බිති, සෘෂිවරයා දෙවන කාන්තාව වෙත ළං වන විට ඕ ඔහු දැකුමෙන් සුදුමැලි බවට පත් වෙයි. මෙහි විපාක වශයෙන් ඇය ලද පුත්‍රයා පඬු පැහැ ඇත්තේ පාණ්ඩු—"පඬු පැහැ ඇත්තා" යන නමින් හැඳින්විණ. මහාභාරතයෙහි දැක්වෙන ප්‍රධාන වීරයන් පස් දෙනා ගේ පියා වූයේ හෙතෙමේ ය. යළිත් වරක් ද්වෛපායන තෙමේ පළමු කාන්තාව වෙත එළඹේ. එහෙත් මේවර ප්‍රඥාසම්පන්න වන ඕ තොමෝ ඇගේ පරිවාර ස්ත්‍රිය ඔහු වෙත යවයි. ද්වෛපායන මේ වූ වෙනස නොදත්තේ ඇය හා සහවාසයට පැමිණෙයි. මේ සංගමයෙන් බිහි වන විදුර ධ්‍රෘතරාෂ්ට්‍ර හටත් පාණ්ඩු පුත්‍රයනටත් හිතකාමී වූ බුද්ධිසම්පන්න මිත්‍රයකු ලෙස මහාභාරත යෙහි දැක්වේ.[12]

වීරකාව්‍යයෙහි එන වීරයන් ගේ මුත්තණු[13] කෙනකුන් ගේ තත්ත්වයට වෘත්තාන්තයෙන් පමුණුවනු ලැබූ කෘෂ්ණ ද්වෛපායන ව්‍යාස නමැති සෘෂිවරයා මුළු මහාභාරතයේ ම කර්තෘවරයා ලෙස සැලැකේ. මහාභාරතයේ සංඥපනයෙන්[14] කියැවෙන පරිදි ව්‍යාස තමා විසින් රචිත කාව්‍යය මහාජනයා අතර ප්‍රකාශයට පැමිණවූයේ තම "පුතුන්" ති දෙන ගේ අභාවයෙන් පසු ව ය. හෙතෙමේ එය තමා ගේ ශිෂ්‍යයා වූ වෛශම්පායන හට ප්‍රකාශ කළේ ය. වෛශම්පායන ද ජනමේජය රජු විසින් පවත්වනු ලැබූ මහා නාග යාගයේ අතරතුර කාලයන්හි දී මුළු මහත් කාව්‍යය ම සජ්ඣායනය කළේ ය. මේ අවස්ථාවෙහි දී එය ලෝමහර්ෂණ ගේ පුත්‍රයා වූ උග්‍රශ්‍රවස් නමැති සූතයා හට අසන්නට ලැබිණ. අපේ මහාභාරතය අරඹෙනුයේ ශෞනක විසින් නෛමිෂ වනයෙහි පවත්වන ලද දොළොස් හවුරුදු යාගය සඳහා රැස් වූ සෘෂීන් වෛශම්පායන ගෙන් මහාභාරතයේ කථාව ඇසූ අයුරින් තමන් හට එය කියන ලෙස සූත උග්‍රශ්‍රවස් හට ඇවිටිලි කරන තැන සිට ය. එයට කැමැත්ත දක්වන සූත තෙමේ වෛශම්පායන ගේ කථාව කීමට පෙර ජනමේජය ගේ නාග යාග පූජාව පිළිබඳ කථාව කියයි.

'මහාභාරතය මුළුමනින් ම සම්භාෂණයෙන් යුක්ත වීමෙන් පැහැදිලි වනුයේ එහි ඒකාන්ත පෞරාණිකත්වයයි.[15] කථාවේ ආකෘතිය කියන්නේ උග්‍රශ්‍රවස් ය. කථාව කියන්නා වෛශම්පායන බව කාව්‍යයෙහි ම දැක්වේ. වෛශම්පායන ගේ කථාව තුළ ම නානාවිධ පුද්ගලයන් ලවා කියවනු ලබන අප්‍රමාණ කථා සංඛ්‍යාවක් ඇතුළු කරනු ලැබ ඇත. කථාවක් තුළ කථාවක් ඇතුළු කිරීමක් ඉන්දීය සාහිත්‍යයෙහි දී අනුගමනය කරන ලද ඉතා ජනප්‍රිය උපක්‍රමයෙකි. බොහෝ අවස්ථාවල දී කථාවනට මෙන් ම

ඉදිරිපත් වන පුද්ගලයන් ගේ කථාවනට ද හැඳින්වීමක් නැත. එහෙත් ඒ වෙනුවට, "වෛශම්පායන කථා කලේ ය." "මේ යුධිෂ්ඨිර ය." "ද්‍රෞපදී කීවා ය" යන ආදී ගද්‍ය පාඨ දක්නට ලැබේ.

මහාභාරතයෙහි අපට සැපයෙන සියලු තොරතුරු මෙන් ම එහි කතු වරයා යැයි සැලකෙන පුද්ගලයා ගැන ද දැනගන්නට ලැබෙන තොරතුරු අද්භූතජනක ය. එ සේ වුව ද එහි වැදගත් ප්‍රකාශ කිහිපයක් ඇතුළත් ව පවතී. මෙසේ, ව්‍යාස ඍෂිවරයා තම කථාව සංක්ෂිප්ත සම්පිණ්ඩනයක් වශයෙන් මෙන් ම සවිස්තර කථාවක් ලෙස ද ඉදිරිපත් කළ බව අප අසා ඇත. තව ද, ඒ ඒ ගායකයන් කාව්‍යයට මුල පුරනුයේ එකි නෙකට වෙනස් තුන් තැනෙකිනි. ඒ එක එකෙහි දිග ද හැම විට ම එක හා සමාන නො වේ. කාව්‍යය පද්‍ය 8,800කින් යුක්ත යැයි උග්‍රශ්‍රවස් කියයි. එහෙත් තමා භාරත කාව්‍යය පද්‍ය 24,000 කින් රචනය කළ බවත් "අතිරේක කථාවලින් තොර ව විශාරදයන් විසින් භාරතය මේ ප්‍රමාණයෙන් සඞ්ඛ්‍යායනය කරන ලද බවත්" ව්‍යාස පවසයි. එහෙත් පුදුමයකට මෙන් ඉනික්බිති ව කියැවෙනුයේ පද්‍ය හැටලක්ෂයෙකින්— එ නම්, 'දෙවියන් සඳහා තිස් ලක්ෂයකුත් පිතෘන් සඳහා පහළොස් ලක්ෂයකුත් ගන්ධර්වයන් වෙනුවෙන් දහ හතර ලක්ෂයකුත් මිනිසුන් සඳහා එක් ලක්ෂයකුත්' යනුවෙන්[16] ව්‍යාස විසින් වීර කාව්‍යය රචනය කරන ලද බව ය. මින් හැඟවෙන එක ම දෙය නම් "පද්‍ය ලක්ෂයකින් සමන්විත ය" යන අරුත් ඇති **ශතසහස්‍රී සංහිතා** යන අභිධානයෙකින් යුක්ත වූ මහාභාරතයේ වර්තමාන ප්‍රමාණයයි. මේ ප්‍රකාශයන් හෙන් යමකුට පැහැදිලි වනුයේ මහාභාරතයේ ඒකීයත්වය පිළිබඳ ව **භාරතීයයන්** තුළ දෘඪ විශ්වාසයක් පැවැති බව හැරෙන්නට, යටත් පිරිසෙසින් එය මුල දී කුඩා කාව්‍යයෙකින් ඇරඹී පසු ව එහි දැන් පවත්නා වර්තමාන තත්ත්වයට වැඩී ආ බව පිළිබඳ මතයක් ඇති ව සිටි බවත් ය.

මහාභාරතය **භාරතීයයනට** කෙබඳු ග්‍රන්ථයක් ද යන්න මේ කෘතියේ සංඥාපනයෙහි මහත් අතිශයෝක්තියෙන් අපට කියා දෙනු ලැබේ. නිදසුනක් ලෙස එහි එන මේ කියමන් දැක්විය හැකි ය:

"දී කිරි අතුරින් ගිතෙල යම් සේ ශ්‍රේෂ්ඨ ද, **ඇරියයන්** අතුරින් යම් සේ **බ්‍රාහ්මණයා** ශ්‍රේෂ්ඨ ද **වේදයන්** අතුරින් **ආරණ්‍යකයෝ** යම් සේ ශ්‍රේෂ්ඨ වෙත් ද **ඖෂධයන්** අතුරින් අමෘත පානය යම් සේ ශ්‍රේෂ්ඨ ද සියලු ජලාශයන් අතුරින් සාගරය යම් සේ **ශ්‍රේෂ්ඨ** ද සිවුපා සතුන් අතරින් ගව දෙන යම් සේ ශ්‍රේෂ්ඨ ද එ සේ ම මහාභාරතය ද **සියලු** ඉතිහාසයන් අතුරින් ශ්‍රේෂ්ඨතමය වෙයි."

"මේ කථාව ඇසූ කවරකු ගේ නමුත් කෝ තරම් ශ්‍රවනප්‍රිය වූ ද වෙනත් කථාවෙක නම් නො අලවයි. යම් සේ කෝකිල[17] ගීතයක් ඇසූවකු සිත කවුඩා ගේ **රළු** හඬෙහි නො ඇලේ ද එ ලෙසිනි."

"විශ්වයට අයත් තුන් ලෝකය යම් සේ පංච මහා භූතයන් හෙන් පහළ වේ ද එ සේ **ඉ** කවීන් ගේ චිත්තාවෝ ද මේ අතිප්‍රශස්ත ඉතිහාසයෙන් පහළ වෙති."

කවරෙක් නමුත් "වේදය දන්නා වූ විවක්ෂණ බ්‍රාහ්මණයකුට රන් අලෙවී දුන් අං ඇති ගව දෙනුන් සියයක් පිරිනමා ද, යමෙක් දිනපතා භාරත කාව්‍යයේ පුණ්‍ය කථාවලට සවන් දේ ද මේ දෙ දෙන ම එක් බඳු පින් ලබති."

"මේ ඉතිහාස කථාව ඒකාන්තයෙන් ම ජයගීතයෙකි. ජයග්‍රහණය අපේක්ෂා කරන රජකු මේ ඇසිය යුතු ය. හෙතෙමේ පෘථිවිය අත්පත් කොටගෙන සතුරන් පරදවන්නේ ය.

"මේ පුණ්‍ය ධර්මසූත්‍රයෙකි. ඒ ම විශිෂ්ටතම අර්ථසූත්‍රයයි. අසීම ප්‍රඥාවෙන් යුක්ත වූ ව්‍යාස තෙමේ මෙය මෝක්ෂ සූත්‍රයක් ලෙස සඵල්කීර්තනය කළේ ය.[18]

"මේ කාව්‍යය ඇසූ පුද්ගලයා ගේ සිත, කය හෝ වචනය යන තුනින් සිදු වූ සියලු අකුසල් වහා ම දුරු ව යෙයි."

"(තම භක්ති පූජාවන් හා යෝගාචාරයන් පැවැත්වීමට) දිනපතා නැඟී සිටින කෘෂ්ණ ද්වෛපායන ඍෂි තෙමේ මහාභාරතය නම් වූ මේ විශ්මයජනක කථාව තුන් අවුරුද්දක් තුළ සොයා නිමැවී ය. ධර්මයත් අර්ථයත් කාමයත් මෝක්ෂයත් පිළිබඳ ව මේ ග්‍රන්ථයෙහි යමක් අපට දක්නට ලැබේ ද ඒ කරුණු වෙනත් තන්හි දී ද දැකිය හැකි ය. එහෙත් එහි ලියැවී නැති දෙය ලොවේ වෙන කොතැනෙක වත්[19] දැකිය නොහැකි ය."

කෙසේ වුව ද භක්තිමත් හින්දූන් ගේ ඇසින් නොව, විචාරශීලී සාහිත්‍ය ඉතිහාසඥයන් ලෙස මහාභාරතය දෙස බලන අපට එය අන් කවරක් ලෙස පිළිගත හැකි වුවත් එය කලාත්මක කෘතියක් ලෙස නම් නො පෙනේ. කෙසේ හෝ එය එක් කතුවරයකු ගේ කෘතියක් හෝ දක්ෂ සංග්‍රාහකයකු ගේ හෝ සංස්කාරකයකු ගේ හෝ කෘතියක් ලෙස වත් සැලකිය නොහැකි ය. සමස්තයක් ලෙස ගෙන බලන් ම මහාභාරතය සාහිත්‍ය යෝධයෙකි. කලාකාරයකු කිසි කලෙකත් මේ පරස්පරවිරෝධී මූලයන් එක ම සංගත කාව්‍යයක් බවට පත් වන සේ එකතු කිරීමේ දුෂ්කර කාර්යය සඳහා අත ගැසීමට ප්‍රයත්නයක් දරා නැත. සැබැවින් ම එකිනෙකට නොසීහෙන්නා වූත් විවිධ ශතවර්ෂයනට අයත් වූත් කොටස් විෂමත්වයෙන් යුත් ස්කන්ධයකට පෙරළීමට සමත් වූවෝ කවිත්වයෙන් තොර දේව විද්‍යාඥයෝත් ව්‍යාඛ්‍යානකාරයෝත් අදක්ෂ ලිපිකාරයෝත් ය. උගතුන් විසින් හෙළිපෙහෙළි කිරීමට අරඹා ඇති මේ කාව්‍ය වනාන්තරයේ වල්පඳුරුවල සැඟවී ඉතා සැබෑ වූ නියම කවියේ පැළෑටි මතු ව පවතිනු අපට දැකිය හැකි ය. හැඩයෙන් තොර මේ ස්කන්ධයෙන් අමරණීය කවිත්වය හා ගැඹුරු බුද්ධිය ද පිළිබඳ මැනැවි පුෂ්පයෝ පිපී බැබළෙති. මහාභාරතය එක් තනි සංගත කෘතියකට වඩා සමස්ත සාහිත්‍යයක් ඉදිරිපත් කිරීමත් එහි විවිධ වූත් බොහෝ වූත් කරුණු ඇතුළත් ව තිබීමත් යන මේ කරුණ ම එය සෙසු හැම කෘතියකට ම වඩා භාරතීය ජනතාව ගේ ආත්මයෙහි ගැඹුරට ම කිමිද බැලීමට අපට ඉඩ සලසා ලයි.

මහාභාරතයෙහි ඇතුළත් කරුණු හා එහි විවිධ අවයවයන් ද පිළිබඳ ව පහතැ කෙරෙන විමර්ශනයෙන් මේ කරුණු පැහැදිලි වේ:[20]—

මහාභාරතයේ ප්‍රධාන වෘත්තාන්ත

අවුරුදු ගණනකට ඉහත ඇඩොල්ෆ් හොල්ෂ්මාන් (ජර්මන්) පැරණි භාරතීය ජාතික කාව්‍යය වූ මහාභාරතයේ සාරය "ජර්මන් කාව්‍යකලාකාමීන් සඳහා පළමු වන වරට විවෘත කිරීම සඳහා බලවත් ප්‍රයත්නයෙක

යෙදුණේ ය.[1] මහාභාරතය වූ කලි "ඉන්දීය වීරකාව්‍යය" නොවේ. එහි ඇතුළත් ව පවත්නේ බොහෝ දුරට ප්‍රතිසංස්කරණය කිරීමෙනුත් විස්තාරයට පැමිණවීමෙනුත් විකෘතියට පැමිණවීමෙනුත් පසු ව ඉතිරි වූ පැරණි භාරතීය වීර ගීතිකාවන් ගේ ..... නෂ්ටාවශිෂ්ට ය යන නිසැක යෙන් ම නිවැරැදි වූ මතිය ඇති ව හෙතෙමේ තම කාර්යය ඇරඹී ය. එහෙත් මෙ සේ ප්‍රතිසංස්කෘත වූත් විකෘතියට පමුණුවන ලද්දා වූත් "නෂ්ටාවශිෂ්ටයන්" ගෙන් පැරණි මූල වීරකාව්‍යය ප්‍රතිනිර්මාණය කිරීමට අවශ්‍ය ශක්තිය තමා වෙත ඇතැයි හෙතෙමේ අපූර්ව ආත්මවිශ්වාසයෙකින් යුක්ත ව ඇදහී ය. ඇතැම් කොටස් අත්හැරීමෙනුත් තවත් කොටස් හකුළුවා ලීමෙනුත් සමහර කොටස් වෙනස් කිරීමෙනුත් ජර්මන් පද්‍යයට නංවා ඔහු නිර්මාණය කළ ඉන්දීය වීරකාව්‍යයෙන් දැන් පවත්නා මුල් පෙළ පිළිබඳ පදගත අනුවාදයෙකින් දිය හැකි පමණට වඩා පැරැණි ඉන්දීය කවීන් විසින් ගැයුණු සැබෑ මහාභාරතය පිළිබඳ ව හොඳ හැඟීමක් දිය හැකි වෙතැයි හේ සිතී ය. ඉක්බිති, අපූර්ව ප්‍රතිභාවයෙකින් හා ගැඹුරු කවි හැඟුමෙකින් ද යුතු ව හොල්ෂ්මාන් බොහෝ තන්හි නිසැකයෙන් ම සුදුසු පරිදි ම කාර්යය ඉටු කළේ ය. එහෙත් හේ කොතරම් දුරට මුල් සකු පෙළෙන් ඉවත් වූයේ ද යත් ඔහු ගේ කෘතිය සැලකිය හැක්කේ පැරැණි මහාභාරතයේ සැබෑ අනුවාදයක් සැටියට නොව, ඉතා ස්වාධීන ලෙස සකස් වූ අනුවර්තනයක් ලෙස පමණකි. සත්‍ය වශයෙන් ම හොල්ෂ්මාන් තැත් කළේ ඉතා දුෂ්කර කාර්යයක් කිරීමට ය. "පැරණි ඉන්දීය ජාතික මහා කාව්‍යය" එහි මුල් ආකෘතියට අනුව ප්‍රතිසංස්කරණය කිරීමට දරන සෑම ප්‍රයත්නයෙක දී ම ස්වාභිමතයට අනුව ක්‍රියා කිරීමට කොතරම් විශාල ලෙස සිදු වේ ද යත් එයට ලැබිය හැක්කේ ඒකදෘෂ්ටිකෝණීය වටිනා කමක් පමණකි.

අනෙක් අතට, මහ භාරතයෙහි එන ගීතිකා සමූහයෙන් එහි හරය-එ නම්, සැබෑ වීර කාව්‍යයේ වස්තු බීජය වූ—කෞරවයන් හා පාණ්ඩවයන් ගේ ද යුද්ධය පිළිබඳ කථාව උපුටාගැනීම වඩා පහසු ය. පහතැ දැක්වෙන අවශ්‍යයෙන් ම සංක්ෂිප්ත වූ ආකෘතියට අනුව මෙය කරනු ලැබේ. හැකි තාක් දුරට ප්‍රධාන වීරයන් සම්බන්ධ වැදගත් ද්විතීයික කථාවන් ද සැලකිල්ලට ගනිමින් මහා සංග්‍රාමය පිළිබඳ කථාව ඇද දක්වන්නට අපි බලමු. මෙහි ලා "මුල්" වීර කාව්‍යය පිළිබඳ සැක සහිත වූ මනඃකල්පිත කරුණු ඇද දක්වමින් ප්‍රපඤ්ච වන්නට අපි අදහස් නොකරමු. එහෙත්, ප්‍රධාන කථා ප්‍රවෘත්තියට අදාළ නොවන සියල්ල ම දැනට ඉවත ලා අප ඉදිරියෙහි ඇති පරිදි මහාභාරතය විශ්වසනීය ලෙස ඉදිරිපත් කරමු.

කෞරව—පාණ්ඩව වංශය

එක් කලෙක කුරු වංශයට අයත් ශාන්තනු නම් රජෙක් භාරත දේශයෙහි රාජ්‍යය කළේ ය. මිනිස් දුවක බවට පත් වූ ගංගා දේවිය ගෙන් උපන් භීෂ්ම නම් පුතෙක් මේ රජ හට විය. රජ, තමා ගේ ඇවැමෙන් රාජ්‍ය භාරය ඉසිලීමට තම පුතු පත් කළේ ය. සංග්‍රාම කාර්යයට අවශ්‍ය සියලු ගුණාංගයන් ගෙන් සමන්විත ව කුමරා ශ්‍රේෂ්ඨ රණ

වීරයකු බවට පත් ව සිටි කාලයෙහි දිනෙක ශාන්තනු රජ සත්‍යවතී නම් රූමත් ධීවර යුවතිය දැක ඇය කෙරෙහි පෙම් බැඳ ඇය තමා ගේ බිරියෙකක ලෙස පැවැත්වීමට උත්සුක විය. ධීවර ස්ත්‍රියගේ රජු වූ ඇගේ පියා ඇය රජ හට පැවා දීමට නම් ඇය ලැබෙන පුත් කුමරුවාට සිංහාසනය පැවැරීමට රජු එකඟ විය යුතු බව කියා සිටියේ ය. සිය පෙම්වතිය අත් හැරීමට ඉතා දුෂ්කර වුව ද මේ යෝජනාවට එකඟ වීමට ශාන්තනු හට නොහැකි විය. සිය පියා මහත් දොම්නසින් පසු වන බව හිෂ්ම දැනී. එයට හේතුව ඔහු දන් පසු සත්‍යවතිය ලබාගැනීම පිණිස සිය පියා වෙනුවෙන් තෙමේ ම ධීවර රජු වෙත යෙයි. හෙතෙමේ සිංහාසනයට තමාට ඇති අයිතිය අත් හැරීමට පමණක් නොව, තම කිසි දු පුත්‍රයකු සිංහාසනයට අයිතිවාසිකම් කීමට නොහැකි වනු පිණිස බ්‍රහ්මචාරී ව සිටීමට ද තමා තුළ පවත්නා අභිප්‍රාය ඔහුට ප්‍රකාශ කරයි. මේ අනුව ධීවර රජු සතුටින් ම සිය දුවණියන් ශාන්තනු රජු හට පැවා දෙයි. මෙ ගේ සත්‍යවතිය පැවාගන්නා ශාන්තනු රජ චිත්‍රාංගද, විචිත්‍රවීර්ය නම් දෙ පුතුණු කෙනකුන් ලබයි. මෙය සිදු වූ වහා ම ශාන්තනු මිය යෙයි. තරුණ චිත්‍රාංගද තෙමේ යුද්ධයෙක දී ගන්ධර්වයකු අතින් මැරුම් කයි. ඉක්බිති, පවුලේ වැඩිමහල්ලා වූ හිෂ්ම තෙමේ රජු ලෙස විචිත්‍රවීර්ය අභිෂේකයට පමුණුවයි. එහෙත් හෙතෙමේ බිරියන් දෙ දෙනකුන් ඇති ව ද එක දරුවකුත් නො ලබා තරුණ වයසෙහි දී ම මිය යෙයි. ස්ව වංශය නො නැසිය දී රක්නා කැමැති සත්‍යවතී තොමෝ භ්‍රාතෘ-විධවාවන් පැවාගැනිමේ පුරාණ චාරිත්‍රයට අනුව, විචිත්‍රවීර්ය ගේ වැන්දඹු බිරියන් දෙ දෙන පැවාගෙන දරුවන් ලබාගන්නා ලෙස හිෂ්ම යදී. එහෙත් බ්‍රහ්මචාරී ව දිවි ගෙවීමට තමා වූ පොරොන්දුව සිහි කළ හිෂ්ම තෙමේ සූර්යයා තම දීප්තියත් අග්නි තම උෂ්ණයත් චන්ද්‍රයා තම රශ්මියෙහි සිසිල් ගුණයත්, ඉන්ද්‍ර දෙවියා සිය වික්‍රමයත් ධර්ම දේවයා තම යුක්තිධර්මයත් අත් හළ ද තමා වූ පොරොන්දුව නම් තමාට කිසි දිනෙක සිදිය නොහැකි බව කියා සිටියි. ඉක්බිති සත්‍යවතී තොමෝ ස්වකීය අවජාත පුත්‍රයා වූ ව්‍යාස සිහි කොට හිෂ්ම ගේ ද කැමැත්ත සහිත ව වංශස්ථාපනය පිණිස ඔහුට ආරාධනය කරයි. අප කලින් දත් පරිදි, මේ සම්බන්ධයෙන් ව්‍යාස ඍෂි තෙමේ ධෘතරාෂ්ට්‍ර, පාණ්ඩු සහ විදුර යන පුත්‍රයන් ලබයි. ධෘතරාෂ්ට්‍ර ජාත්‍යන්ධයකු වූ හෙයින් ඔහු කනිටු සොහොවුරු පාණ්ඩ තෙමේ සිහසුනට පත් වෙයි. ධෘතරාෂ්ට්‍ර තෙමේ ගන්ධාර රජු ගේ දූ කුමරිය වූ ගාන්ධාරිය සරණ පාවා ගනී. ගේ ඇගෙන් පුතුන් සිය දෙනකු ලබයි. ඔවුනතුරෙහි හැමට වැඩ මහලු වූයේ දුර්යෝධන ය. යාදව රජු ගේ දූ වූ පෘථා හෙවත් කුන්ති යැ, ශල්‍ය නම් මද්‍ර රජු ගේ සොහොයුරිය වූ මාද්‍රී යැ, යන බිරියෝ දෙ දෙනෙක් පාණ්ඩු රජුට වෙති. කුන්ති තොමෝ ඔහු නියා, වැඩිමහලු යුධිෂ්ඨිර යැ, අර්ජුන යැ දුර්යෝධන හා එක දිනෙහි උපන් භීම යැ යන පුතුන් ති දෙනකුන් ලබයි. මාද්‍රී තොමෝ නකුල සහ සහදේව යන නිවුන් පුතුන් ලබයි.

මහා විර කාව්‍යයෙහි කථානායකයන් වූ මොවුන් පස් දෙන උත්පාද කරන ලද්දේ පාණ්ඩු විසින් නො ව, ඔහු මෙනුමෙන් (වෙන අය විසින්) ය යන අදහස දෙන ඉතා අද්භූත කථාවක් කාව්‍යයෙහි විස්තර කෙරෙනුයේ මෙහි දී ය. මෙථුන සමයෙහි පාණ්ඩු තෙමේ මුව යුවළක් මරයි. සැබැවින් ම මේ වූ කලි මෛථුනයෙහි යෙදීම පිණිස මුවකු ගේ වෙස් ගත් ඍෂිවරයෙකි. මෛථුන ක්‍රීඩාවෙහි යෙදෙන පාණ්ඩු මියේ වා සි මෙහි දී ඍෂිවරයා ඔහුට ශාප කරයි. ඒ හෙයින් සම්භෝගාස්වාදය අත් හැර තාපස ජීවිතයක් ගෙවීමට පාණ්ඩු අදිටන් කෙරෙයි. කෙසේ වුව ද කුන්ති තොමෝ වංශස්ථිතිය සඳහා තමාට දරුවන් ලබා දෙන සේ දෙවියන් යදී. යුක්තියේ දෙවියා වූ ධර්ම ඇය හා සහවාසයට පැමිණ යුධිෂ්ඨිරත්, වාත දේවයා වූ වායු ඇගෙන් ම ශක්ති සම්පන්න වූ භීමත්, දෙවියන් ගේ රජු වූ ඉන්ද්‍ර ඇගෙන් ම අර්ජුනත් ලබා දෙයි. කුන්තිය ගේ අයැදුම පරිදි අශ්වින් දෙ දෙන මාද්‍රිය හා සහවාසයට පැමිණ ඇයට නකුල සහ සහදේව යන නිවුන් දරුවන් යුවළ ලබා දෙති.

ධෘතරාෂ්ට්‍ර ගේ රාජ සභාවෙහි පසු වන පාණ්ඩවයන් සහ කෞරවයෝ

පාණ්ඩු (රජු) කළුරිය කළ නොබෝ දිනෙකින් ම අන්ධ ධෘතරාෂ්ට්‍ර තෙමේ රාජ්‍ය පාලනයට පත් වෙයි. පාණ්ඩු (රජු) ගේ පුත්‍රයෝ පස් දෙන ඔවුන් ගේ මවු වූ **කුන්තී** (දේවිය) සමඟ **හස්තිනාපුරයෙහි** වූ ධෘතරාෂ්ට්‍ර (රජු) ගේ රාජ සභාවට යෙති. **එහි දී** ඔහු තම ඥති සහෝදරයන් වූ කුමරුවන් සමඟ අධ්‍යයනය ලබති. පාණ්ඩු ගේ දෙ වන භිරිය වූ මාද්‍රී නොමෝ සිය සැමියා ගේ ආදහන චිතකයට පැන මැරෙයි.

පාණ්ඩු පුත්‍රයෝ තම කුමාර ක්‍රීඩාවන්හි දී පවා ධෘතරාෂ්ට්‍ර පුත්‍රයන් ගේ **ඊර්ෂ්‍යාවට හේතු** වමින් දක්ෂතාවෙන් ඔවුන් ඉක්මවා සිටිති. විශේෂයෙන් ම, භීම තෙමේ තම **අසහාය** ජවබලබාහුල්‍යය ප්‍රකට කොට ධෘතරාෂ්ට්‍ර පුත්‍රයන් තුළ මහත් දොම්නස දනවමින් **ස්වකීය** ප්‍රචණ්ඩ ශක්තිය බොහෝ වාරයන්හි ප්‍රදර්ශනය කරවයි. ඉදින් දරුවන් ගසකට නැඟුණ හොත් ගෙඩිත් සමඟ තම ඥති සහෝදරයනුදු වැටෙන සේ භීම **එ ගස සොලවා ලයි.** මේ හේතුවෙන් භීම කෙරෙහි බෙහෙවින් **කිපීගත්** දුර්යෝධන (රජ) ඔහු ගේ දිවි නොර කිරීමට කිහිප වරක් ම තැත් කරයි. එහෙත් ඔහුට කිසි දු උපද්‍රවයක් **කිරීමට** රජ අසමත් වෙයි. කුමරුවන් ක්‍රමයෙන් වැඩි යත් ම ක්ෂත්‍ර ශිල්පයෙහි කෝවිද වූ **කෘප** සහ **ද්‍රෝණ** නමැති සුප්‍රසිද්ධ බ්‍රාහ්මණයෝ දෙ දෙනෙක් ඔවුන් ගේ ආචාර්යත්වයට පත් වෙති. ධෘතරාෂ්ට්‍ර, පාණ්ඩු යන රජුන් දෙ දෙන ගේ පුතුන් හැරෙන්නට ඔවුන් ගේ ශිෂ්‍ය ගණයා අතරෙහි ද්‍රෝණ ගේ පුත්‍රයකු වූ **අශ්වත්ථාමන්** ද සූතපුත්‍රයකු හෙවත් **රථාචාර්යපුත්‍රයකු** වූ **කර්ණ** ද වෙති. නොබෝ කලෙකින් ම දුර්යෝධන හා භීම යන දෙ දෙන ද්‍රෝණ ගේ මුගුරු ශිල්පය හසළ ශිෂ්‍යයන් අතරෙහි දක්ෂතමයන් බවට පත් වන අතර අශ්වත්ථාමන් **භූතවිද්‍යා ශිල්පයෙහිත් නකුල සහ සහදේව ඛඩ්ග ශිල්පයෙහිත් යුධිෂ්ඨිර රථයුද්ධයෙහිත්** සමර්ථතමයන් බවට පත් වෙති. එහෙත් අර්ජුන අග්‍රතම ධනුර්ධරයා වූවා පමණක් නො ව, හැම කරුණෙකින් ම සෙසු සියල්ලන් පසු බස්වා සිටී. මේ හේතුවෙන් ධෘතරාෂ්ට්‍ර පුත්‍රයෝ ඔහු කෙරෙහි මහත් ඊර්ෂ්‍යාවෙන් පසු වෙති.

කුමාරවරුන් තම අධ්‍යයනය සම්පූර්ණ කළ පසු ද්‍රෝණ ස්වකීය ශිෂ්‍යයන් තම තමන් ගේ දක්ෂතාවන් ප්‍රදර්ශනය කළ හැකි වනු පිණිස රණ කෙළි තරඟයක් සංවිධානය කරයි. ඒ වූ කලි රජුන්, බිසෝවරුන් හා නානාවිධ රණවීරයන් ද පැමිණ සිටි විරාජමාන උත්සව සන්නිපාතයක් විය. මුද්ගර ශිල්පය පිළිබඳ ව භීම සහ දුර්ශෝධන අතර ඇති වූ තරඟය කොතරම් බිහිසුණු වේ ද කියතොත් තරඟකරුවන් දෙ දෙනා වෙන් කොට ලීමට සිදු වෙයි. ධනුශ්ශිල්පයෙහි ලා දැක්වූ දක්ෂතාව පිළිබඳ ව අර්ජුනට හැම අතින් ම පැසැසුම් ගලා එන්නට වෙයි. එහෙත් කර්ණ ද තරඟයට බැස අර්ජුන දැක්වූවා සේ ම දස්කම් පාන්නට වෙයි. මින් අර්ජුන මහත් කෝපයට පැමිණියේ ද දුර්යෝධන තෙමේ මහත් ප්‍රීතියෙන් ඔහු වැලඳගෙන ඔහු හා සදා මිත්‍රත්වයට පත් වන බවට හිවිසියි. කර්ණ තමා සමඟ තරඟයට බසින සේ අර්ජුනට අභියෝග කෙරෙයි. එහෙත් කර්ණයා සූතපුත්‍රයකු හෙයින් පාණ්ඩවයෝ සිනා සෙමින් ඔහුට අවඥ කෙරෙති.

යුධිෂ්ඨිර යුවරජ පදවියට පැමිණේ. ඔහුට හා ඔහු ගේ සොහොවුරනට ද විරුද්ධ ව කුමන්ත්‍රණයක් (ලාක්ෂාගෘහය) ඇති වේ.

අවුරුද්දක් ඉක්ම ගිය පසු යුධිෂ්ඨිර තෙමේ ධෘතරාෂ්ට්‍ර විසින් යුවරජ පදවියට පත් කරන ලදි. කුරු වංශයෙහි උපන් පළමු වැන්නා වූ හෙතෙමේ වීරපරාක්‍රමයෙන් හා සෙසු සියලු ගුණාංගයන් ගෙන් ද විශිෂ්ටත්වයට පත් ව සිටියේ ය. සෙසු පාණ්ඩව කුමාරවරු යුද්ධ ශිල්පයෙහි තව දුරටත් පුහුණුව ලැබුවහු තම තමා ගේ අභිමතය පරිදි විජයග්‍රාහී ව දික්විජය ව්‍යාපාරයන්හි පවා යෙදුණහ. දිනෙන් දින ශක්තියෙන් වඩ වඩා තර වන්නට වූ පාණ්ඩවයන් ගේ මේ ජයග්‍රහණයන් පිළිබඳ ව ධෘතරාෂ්ට්‍ර දැනගත් කල්හි හෙතෙමේ තමා ගේ අනාගත වැඩ පිළිවෙළ ගැන උත්සුක වන්නට විය. ඒ හෙයින් දුර්යෝධන, ඔහු ගේ බාල සොහොවුරු **දුශ්ශාසන,** ඔහු ගේ යහළු **කර්ණ,** ඔහු ගේ මවුපස මාමා වූ **ශකුනි**

යන අය එක ම පාණ්ඩව සොහොයුරු හට විරුද්ධ ව කුමන්ත්‍රණයක් මැනූ කල්හි මහලු රජු ද සිය කැමැත්තෙන් ම තමනට සහාය වීමට ඉදිරිපත් වූ බව ඔවුනට පෙනී ගියේ ය. ඔහු කිසි යම් කරුණක් සඳහා පාණ්ඩවයන් වාරණා වනයට යවන ලෙස ධෘතරාෂ්ට්‍ර රජු පෙළඹවූහ. පාණ්ඩවයන් ගේ විසීම පිණිස, වාරණා වනයෙහි ලාක්ෂාවෙන් හා මහත් සේ ගිනිගන්නා වෙනත් ද්‍රව්‍යයන් ගෙන් ද ගෙයක් ඉදි කිරීමට දුර්යෝධන දක්ෂ වඩුවකු යෙදවී ය. රාත්‍රියෙහි පාණ්ඩවයන් සියලු දෙන ම නිදිගත් කල්හි ඔවුන් ගේ ජීවිත විනාශය සිදු වන සේ මේ ගෙයට ගිනි තැබිය යුතු විය. එහෙත් මේ දුෂ්ට උපායය ගැන විදුර තෙමේ යුධිෂ්ඨිර හට රහසින් දන්වයි. ඒ සඳහා ඔහු යොදා ගනුයේ සෙස්සනට නොවැටහෙන-විජාතික ගෝත්‍රයකට අයත් ම්ලේච්ඡ භාෂාවකි. දුර්යෝධන ඝාතකයන් යොදවා වෙනත් අයුරෙකින් ඔවුන් නසතැ'යි යන බියෙන් ඔහුට සැකයක් පහළ නොවනු පිණිස උපය්‍යයට අසු වූවන් සේ ක්‍රියා කරමින් වාරණා වනයට ගොස් ලාක්ෂා ගෘහයෙහි පදිංචි වීමට පිටත් වෙයි. එ සේ වුව ද, ගෙට ගිනි තබනු ලැබූ පසු, එයට කලින් කරවන ලද උමඟක් ඔස්සේ ඔහු වනයට පලා යෙති. ගෙහි රැඳී සිටියේ එය තැනූ වඩුවා හැරෙන්නට තම පුතුන් පස් දෙන හා සමග බීමත් කමින් නිදා සිටි ක්ෂුද්‍ර ස්ත්‍රියකි. පාණ්ඩවයන් සියලු දෙන ම ඔවුන් ගේ මෑණියන් වූ කුන්තිය සමඟ පිළිස්සී මිය ගියහ'යි සියල්ලෝ විශ්වාස කෙරෙති. ඔවුන් පිළිබඳ ආදහන චාරිත්‍ර විධිහු ධෘතරාෂ්ට්‍ර ගේ මාළිගයෙහි පැවැත්වෙති. මේ අතර පස් සොහොවුරෝ සිය මෑණියන් කැටි ව ගංගා නදියේ එ පිට ඉවුරෙහි වූ වනයෙහි සැරි සරති. මහ රෑ ඔහු ඝන වනාන්තර මැද වෙහෙසින්, සයින් හා පවසින් ද මිරිකෙමින් පසු වෙති. කුන්තී තොමෝ තමා බලවත් පිපාසයෙන් පෙළෙන බව කියයි. භීම තෙමේ සිය මෑණියනුත් සොහොවුරනුත් විඩා හැරීම පිණිස නුඟ රුකක් මුලට කැඳවාගෙන ගොස් ඔවුන් එහි රඳවා දිය සොයනු සඳහා තෙමේ පිටත් ව යෙයි. විල් ලිහිණියන් අනුව ගොස් විලක් වෙත එලඹෙන හේ බැස දිය බී, නා, සෙස්සනට දිය ගෙන යෑම පිණිස සිය උඩු ඇඳුම දියෙහි ඔබා තෙමා ගනී. වහා පෙරළා එන ඔහු දකිනුයේ ගස යට නින්දෙහි පසු වන ස්වකීයයන් ය. මෙ සේ නිදන සිය මෑණියනුත් සොහොවුරුනුත් දක්නා භීම ඔවුන් ලද දුක්මුසු ඉරණම පිළිබඳ ව ඉතා කවුක ලෙසින් වැලැපෙයි.

හිඩිම්බ රකුසා සහ ඔහු ගේ සොහොවුරිය

මේ නුඟ රුක අසල ඉතා බිහිසුණු, මිනීමස් බුදින හිඩිම්බ නම් රකුසෙක් සැඟවී සිටියි. මිනී මසෙහි ඉව දැනුණු හෙතෙමේ නින්දෙහි හෝනා මිනිස් රූ දෙස උස ගසෙක සිට බලයි. බොහෝ කලෙකින් තමාට නොලැබුණු රස බොජුනෙක මිහිරියාවෙන් ඔහු ගේ කට තෙත් වෙයි. එ හෙයින් හෙතෙමේ තම සොහොවුරිය වූ හිඩිම්බා රකුසියට ඔවුන් කවර අය දැයි එහි ගොස් සොයා බලන ලෙස කියයි. එ සේ කළ පසු මිනීමස් හා ලේ සහිත ව අග්‍රභෝජන යේ රස විඳ සෙම්නසින් ඉපිල නැටුම්, ගැයුම් පැවැත්වීම ඔහු ගේ බලාපොරොත්තුව විය. රකුසිය ඔවුන් කරා එලඹෙයි. එහෙත් භීම ගේ දර්ශනය තෙතැ වන් කෙණෙහි ම ඒ ශක්තිමත් තරුණ වීරයා කෙරෙහි හද තුළ හට ගන්නා ප්‍රචණ්ඩ කාමයෙන් ඕ වෙළී යෙයි. එ හෙයින් ඕ ඉතා රූමත් කතක ගේ වෙසක් මවාගෙන සිනා පාමින් භීම වෙතට පැමිණ එ ම වනය මිනී කන රකුසකු වූ සිය සොහොයුරු විසින් අරක් ගන්නාලද්දක් බවත් තමා එහි එවනලද්දේ ඔහු විසින් බවත් එහෙත් ඇය භීම හට ආලය කරන බවත් ඔහු හැර සෙසු කිසිවකුත් ඇගේ පති බවට ඇය නොපතන බවත්, එ හෙයින් ඇයට ඇලුම් කරන ලෙසත් එ සේ කළොත් ඇය ඔහු ගලවාගන්නා බවත් පවසයි. එහෙත් භීම ඇයට පිළිතුරු දෙමින් තම මවු සහ සොහොයුරන් විපතෙහි වැටී සිටිය දී ඔවුන් හැර දමා කාමරසාස්වාදයෙහි යෙදීම පිළිබඳ අදහසක් ඔහු හිසට නොනැඟෙන බව පවසයි. හිඩිම්බා පිළිතුරු දෙමින් ඔහු ගේ නැයන් සියලු දෙන පුබුදුවාලන ලෙසත් එ විට ඇය ඒ සියලු දෙන ම රැක ගන්නා බවත් භීමට පවසයි. එ සේ වුව ද, සිය මෑණියන් හා සොහොවුරන් ද ඔවුන් වැටී සිටින සුව නින්දෙන් පිබිදවීමට සිතිනෙනුදු අදහස් නොකරන බව භීම පෙරළා

ඇයට පවසයි. රාක්ෂසයන් හෝ යක්ෂයන් හෝ ගන්ධර්වයන් හෝ වෙන එ බඳු භූත පිශාචයන් ඔහුට මදකුදු බියක් ගෙන දීමෙහි අපොහොසත් බවත් මීනී කන රකුසාට කටයුතු කිරීමට තමා ම මඟක් සොයාගන්නා බව ද හේ ඇයට පවසයි. මේ අවස්ථාවෙහි හිඩිම්බ රාක්ෂසයා සිය සොහොවුරිය බොහෝ පමා වූ බව සිහි කොට තෙමේ ම එහි පැමිණ කාමාතුර ව සිටි ඇය කෝපයෙන් මරා දමන්නට සූදානම් වෙයි. එහෙත් භීම ඔහු ඉදිරියට පැන තමා හා සටනට පැමිණෙන ලෙස අභියෝග කෙරෙයි. දෙ දෙන අතර ඉතා බිහිසුණු සටනක් සිදු වේ. මේ අතරතුරෙහි සොහොවුරෝ ද නින්දෙන් පිබිදෙති. හිම සටනෙහි ලා රකුසා නසයි. මෙ ලෙසින් ම, ඔහු හිඩිම්බාව ද නසන්නට සැරසෙන් ම ස්ත්‍රියක නොනසන ලෙස යුධිෂ්ඨිර ඔහුට අවවාද කරයි. අන්තිමේ දී ඈ බලවත් ලෙස යදින්නට වූ කල්හි ඇයට පුත්‍රයකු ලැබෙන තෙක් ඈ හා සංගමයට පැමිණීමට භීම එකඟ වෙයි. දිවා කාලය, මුළුල්ලේ ම භීම රකුසිය වෙතැ රැඳී සිටීමටත් හැම දිනෙක ම ඉර බැසීමට පෙර පෙරළා ඔවුන් වෙත පැමිණීමටත් යුධිෂ්ඨිර කටයුතු සලස්වයි. මෙ සේ හිඩිම්බා භීම ද කැටි ව අලංකාර කඳු මුදුන් කරා අහසින් ගොස් ඔහු හා සම්භෝග රසාස්වාදයෙන් කල් ගෙවයි. නොබෝ දිනෙකින් ගබ් ගන්නා ඕ පුතකු වදයි. වැඩි වියපත් වන හෙතෙමේ මහා බල සම්පන්න රාක්ෂසයකු බවට පත් වේ. ඔහු ඔහුට **"ඝටෝත්කච"** යන නම තබති. මහා සංග්‍රාමයෙහි දී පාණ්ඩවයනට මොහු ගෙන් සැලැසෙනුයේ විශාල සේවයෙකි.

බක රකුසා සහ බමුණු පවුල

තාපසයන් ලෙස වෙස් වලාගත් පාණ්ඩවයේ නොයෙක් නිර්ඝීත ක්‍රියාවන් කි යෙදෙමින් වනයෙන් වනයට යෙමින් අන්තිමේ දී **ඒකචක්‍රා** නගරයට පැමිණ හැඳින ගැනීමක් නැති ව බ්‍රාහ්මණ ගෘහයෙක රැඳී සිටිති. දවල් කාලයෙහි සිඟමනේ ගොස් සපයා ගන්නා අහර ඔහු සන්ධ්‍යා සමයෙහි ගෙදරට ගෙන එති. කුන්තී තොමෝ ඒ සියලු අහර දෙ කොටසකට බෙදා ඉන් එක කොටසක් භීම හටත් අනෙක් කොටස සෙසු සියල්ලනුත් අතර බෙදා දෙයි. දිනෙක කුන්තී සිය පුතු භීම සමඟ තනි ව ම ගෙහි රැඳි සිටියා ය. මෙ සේ සිටිද්දී තම පිරිසට අතිවී සත්කාරයෙන් සංග්‍රහ කළ බමුණා ගේ ගෙතුළින් විලාප හඬ හා මහ හඬින් කළ අඳෝනා ද ඇසෙන්නට විය. මුලින් ම ඔවුනට ඇසුණේ සාමාන්‍යයෙන් මිනිසත් බව ලැබීම නිසා විඳීමට සිදු ව ඇති දුක ගැන බමුණා කරන ශෝකාලාපයෙකි. තම දයාබර බිරින්දෑ හෝ පෙම්බර දුහිතෘව හෝ ආදරණීය කුඩා පුත්‍රයා හෝ බිලි දීමට තරම් සිතක් තමාට කිසි කලෙකත් ඇති නොවන හෙයින් තම පවුල ම සමඟ විනාශයට පැමිණීමට වඩා සුදුසු බවත් යම් හෙයකින් තමා පමණක් මිය ගිය හොත් තම දයාබර අඹුදරුවන් විපතට වැටීම සහතික බවත් බමුණා පවසයි. ඉක්බිති බමුණා ගේ බිරිය කතා කරමින් තම දරුවන් නඩත්තු කිරීම සඳහාත් කුලවංශය රක්ෂා කිරීම සඳහාත් තම හිමියා ජීවත් විය යුතු බවත් පුතණු කෙනකුන් හා දියණී කෙනකුන් ද ඔහුට ලබාදීමෙන් ජීවිතයේ පරමාර්ථය සපුරා ලූ ඇයට සැනසිල්ලේ මිය යා හැකි බවත් පවසයි. ඉදින් ඔහු මිය ගිය හොත් තනි ව ම තම දරුවන් දෙ දෙන පෝෂණය කිරීම හෝ සිය දියණියන් අශික්ෂිත පුද්ගලයන් ගෙන් ආරක්ෂා කොට ගැනීම හෝ තම පුත්‍රයාට බ්‍රාහ්මණයකුට සරි ලන අධ්‍යාපනයක් ලබාදීම හෝ නොකළ හැකි බවත් තම හිමියාට නම් දෙ වන බිරියක පාවාගත හැකි බවත්, එහෙත් වැන්දඹුවක බවට පත් වන ඇයට අසරණ ව ජීවත් වන්නට සිදු වන බවත් පවසයි. "යම් සේ ඉවතට දමන ලද මස් කැල්ලකට හිජු ව එය ඩැහැගැනීමට පක්ෂීහු වහා ඉගිල එන් ද ඒ මෙන් ම සිය හිමියා ගෙන් වියෝ වූ ස්ත්‍රියට මිනිස්සු අතවර කෙරෙති." ඒ බැවින් ඕ සිය දිවි පුදන්නී ය. දෙමාපියන් ගේ මේ කථාවට සවන් දුන් බමුණු දූ තොමෝ ම පමණක් පවුල වෙනුවෙන් දිවි පිදීමට සුදුසු බව කියා සිටියි. 'පුත්‍රයා වූ කලි යමකු ගේ ආත්මය ය. භාර්යාව යෙහෙළියකි. එහෙත් දුහිතෘව අභාග්‍යයකි"— යනුවෙන් කියමනක් ඇති නෑ වේ ද? මේ අභාග්‍යයෙන් ඔබ මිදීගනු මැනැවි. ඒ හෙයින් මට මගේ යුතුකම ඉටු කිරීමට ඉඩ දුන මැනවි.' මොවුන් නි දෙන මෙ සේ කථා කරමින් සිට අන්තිමේ දී කඳුළු සලමින් හඬන්නට වන්හ. ඒ විට ඔවුන් ගේ කුඩ

පුත්‍රයා දැස මහත් කොට ඔවුන් දෙස බලමින් මද සිනා පසා එක් එක් කෙනකුන් ළඟට යෙමින් මිහිරි සුරතල් බසින් මෙ සේ කියන්නට විය: 'අඹන්න එපා, තාත්තේ, අඹන්න එපා, අම්මේ, අඹන්න එපා, අක්කේ' මේ සේ කියා බිමින් තණ පතක් අවුලා ගන්නා මේ සිඟිත්තා ප්‍රියෙන් ඉපිලෙමින් "ඔය මිනීකන රකුසා මා මරන්නෙ මෙන්න මෙයිනුයි" යනුයෙන් පවසයි. ඔවුන් විපතෙහි වැටී සිටි අතරතුරෙහි දී අසන්නට ලැබුණු කුඩා ළමයා ගේ සුරතල් බසින් ඔවුන් හද සොම්නසින් ඉපිල යෙයි. මේ අවස්ථාවෙහි දී පාණ්ඩව මාතාව වූ කුන්තී තොමෝ ඔවුනට පැමිණ ඇති කරදරය කුමක් දැයි විමසීම පිණිස එහි පිවිසෙයි. බක නමින් හැඳින්වෙන මිනී කන රකුසකු නගරය සමීපයෙහි සැඟවී සිටින බවත් කිසි යම් නියමිත වාරයක් පාසා ගැලක් පුරා බතුත් මි හරකුන් දෙ දෙනකුත් මිනිසකුත් බලි පූජාවක් වශයෙන් ඔහුට සැපයීමට නුවරවැසියන් බැඳී සිටින බවත් ඇයට අසන්නට ලැබේ. මේ සඳහා පවුල් තෝරාගනු ලබන්නේ වාරයෙන් වාරයට ය. දැනට වාරය පැමිණ ඇත්තේ එ කී පවුලට ය. ඉක්බිති කුන්තී තොමෝ බමුණා සනසමින් ඇගේ පුතුන් පස් දෙන අතරින් එකකු රකුසාට අවශ්‍ය බලි පූජාව පවත්වන බව කියා සිටියි. එහෙත් බමුණා තම දිවි ගලවා ගැනීම පිණිස දිවි පුදන බමුණකු පිළිබඳ ව නො අසයි. ඒ විට කුන්තී, තම පුත්‍රයා මහා වීරයකු බවත් ඒ බව එළිදරවු නො කළ යුතු බවත් එ සේ වුව, නිසැකයෙන් ම ඔහු රකුසා වනසා දමන බවත් පවසයි. මෑණියන් ගේ යෝජනාව ක්‍රියාත්මක කිරීමට භීම වහා ඉදිරිපත් වෙයි. පසු දින උදැසන භීම තෙමේ භූතයා අරක්ගෙන සිටින වනය තුළට අහර පිරූ ගැල ද පදවාගෙන පිවිසෙයි. වනයට ළඟා වත් ම හේ තෙමේ ම අහර බුදින්නට පටන් ගනියි. (මෙය ඉතා හාස්‍යජනක ලෙස විස්තර කරනු ලැබේ.) ඉතා භයඞකර විලාසයෙකින් රාක්ෂසයා ඔහු වෙත ළං වෙතත් හේ ඉන් මදකුදු නො සැලෙයි. කෝපාවිෂ්ට වූ රාක්ෂසයා දැතින් ම ඔහුට පහර දෙද්දී පවා හේ නිසන්සල ව ම අහර බිඳීම නො නවත්වා කරයි. ගැලෙහි වූ අහර සියල්ල කා නිමවන තුරු හේ රකුසා හා සටනට නො බසී. ඉක්බිති ඔහු වනයෙහි ඇති මහ ගස් උදුරා එකිනෙකාට පහර දෙන්නට වෙති. ඉක්බිති ඇති වනුයේ ඉතා බිහිසුණු සටනෙකි. එය අවසන් වනුයේ භීම විසින් රකුසා ගේ දෙ දණ ළඟින් බඳ දෙකට කඩා දැමීමෙනි. මිනිසුන් නොමරන ලෙසට එහි සිටි සෙසු රකුසන් හා බක රකුසා ගේ නෑදෑයන් හා දැසිදස්සන් ද පොරොන්දු කරවා ගන්නා භීම තෙමේ සිය සොහොවුරන් වෙත පෙරළා පැමිණෙයි. නගරය පුරා මහත් ප්‍රීත්‍යුත්සව පැවැත්වෙයි. එහෙත් පාණ්ඩවයෝ තුමූ කවුරු දැයි අනාවරණය නො කෙරෙති.

ස්වයංවරය හා ද්‍රෞපදිය ගේ පාණිග්‍රහණය

කලකට පසු පාණ්ඩවයෝ ඒකචක්‍රාව අත්හැර පඤ්චාල රට බලා යෑමට තීරණය කෙරෙති. ඔවුන් යන අතර මග පඤ්චාල දේශයේ ද්‍රෞපද රජු තම දූ කුමරිය සඳහා "ස්වයංවරයක්" පවත්වන්නට යන බව ඔවුනට සැළ වෙයි. පාණ්ඩව සොහොවුරෝ ද මේ උත්සවයට සහභාගි වන්නට තීරණය කෙරෙති. බමුණන් ලෙස වෙස් වලාගන්නා ඔහු ද්‍රෞපද රජු ගේ නේවාසික රාජධානියට ගොස් කුම්භකාරයකු ගේ ගෘහයෙහි අප්‍රසිද්ධ ව වෙසෙමින් බමුණන් ලෙස භික්ෂා යාචනයෙහි යෙදෙති. ද්‍රෞපද රජුට වනාහී ඉතා දැඩි කොට තහනම් කළ වූත් යන්ත්‍රයෙක මාර්ගයෙන් අහසේ ඉතා ඉහළට ඉලක්ක විදිය හැක්කා වූත් දුන්නක් ඇත. මේ දුන්න ඇද ඉලක්කයට විදීමෙහි සමත් වන ශූරයකු වතොත් ඔහු පමණක් ස්වයංවරයෙහි දී සිය දූ කුමරිය වූ කෘෂ්ණාව ලබාගැනීමට සුදුසු වන බවට ද්‍රෞපද රජ ප්‍රකාශයක් කරයි. දුර්යෝධන සහ ඔහු ගේ සොහොවුරන් ද කර්ණ ද ඇතුළු සියලු රටවල රජවරු ද ද්‍රෞපද රජු ගේ ආරාධනය පිළිගෙන පතියකු තෝරා ගැනීම සඳහා ස්වයංවරය පැවැත්වෙන විචිත්‍ර ශාලාවට රැස් වෙති. ශිෂ්‍ය නොහැකි තරම් බ්‍රාහ්මණයෝ ද මේ සිද්ධිය නැරඹීම සඳහා පැමිණෙති. ඔවුන් අතුරෙහි පාණ්ඩවයෝ ද වෙති. උත්කර්ෂවත් උත්සවයේ දින ගණනක් පුරා පැවැත්වෙති. විදේශයන්හි රජවරු හා බ්‍රාහ්මණයෝ ද ආගන්තුකයන් ලෙස අතිවිශිෂ්ට සත්කාර විඳිති. අන්තිමේ දී

මසොළොස් වන දිනයෙහි සාමාන්‍ය චරිත්‍ර විධි පවත්වනු ලැබීමෙන් පසු **අලංකාර වස්ත්‍ර** භරණයෙන් සැරසුණු කාන්තිමත් **කෘෂ්ණා** තොමෝ මල් දමක් ගත් අතැති ව ශාලාවට පිවිසෙයි. එ විට ඇගේ සොහොවුරු **දෘෂ්ටද්‍යුම්න** තෙමේ මහ හඬින් මෙ සේ පවසයි:

රැස් ව සිටින නිරිඳුනි, මෙ ම දුන්න රැගෙන විදිනු ඉහළ ඉලක්කය **බලා**
දිලිසෙන ඊ පහ අහසට ඒදලනු කැරකෙන අර පෙනුමට ඇති පළිහය **පලා**
උතුම් කුලෙහි උපනකු අර ඇත පෙනෙන එල්බෙන්න බලා
විදිනොත් හරියට අත් වෙයි දුපදුගෙ ලස්සණ දුව පඬුරට නො **වලා**[6]

ඕන් පසු හෙතෙමේ දුර්යෝධන ගෙන් පටන් ගෙන එහි පැමිණ සිටි සියලු රජුන් ගේ නම් සිය සොහොයුරියට කියයි. මනස්කාන්ත ශෝභාවෙන් සපිරි **කෘෂ්ණාව** ගේ රූපශ්‍රියට සියල්ලෝ සැණෙකින් ම වසඟ වෙති. ඔවුනොවුන් කෙරෙහි ඊර්ෂ්‍යාපරවශ වූ ඔහු හැම කෙනෙක් ම තමාට ම ඇය අත් කොට ගැනීමට බලාපොරොත්තු වෙති. එසේ තැනැත්තකුට පසු ව තවත් තැනැත්තකු ඉදිරිපත් වෙමින් හැම කෙනෙක් ම දුන්න නැමීමට වැර වැඩුව ද කිසිවකුට ද ඒ කළ නොහැකි වෙයි. ඉක්බිති කර්ණ ඉදිරියට පැමිණේ. දුන්න නමා ලන හේ ඉලක්කයට විදීමට සැරසෙයි. එවිට ම කෘෂ්ණා තොමෝ හඬා හඬා මෙසේ කියයි:

"මගේ ස්වයංවරය සූතයකු (=රථාචාර්යයකු) සඳහා නො වේ" අවඥා සහිත වූ ඕනාවෙකින් යුත් කර්ණ හිරු දෙස බැල්මක් හෙළා දුන්න බිමට වීසි කරයි. ඉක්බිති **ශිශුපාල, ජරාසන්ධ, ශල්‍ය** යන බලසම්පන්න රජවරුන් දුන්න නැමීමට ගත් උත්සාහය ව්‍යර්ථ වෙයි. ඉක්බිති බමුණන් අතරෙහි හුන් අර්ජුන නැඟිට ඉදිරියට එයි. ඔහු ගේ මහෝඝ්‍ර තාරුණ්‍යය දැකීමෙන් ප්‍රීතියට පත් වූවන් ගේ ප්‍රීතිඝෝෂා හා ක්ෂත්‍රියයන් හා තරගයට බ්‍රාහ්මණයකු ඉදිරිපත් වීම ගැන විරෝධය දැක්වූවන් ගේ ප්‍රකාශයන් ද මධ්‍යයෙහි දුන්න ඉදිරියට පා තබා ඇසිපිය හෙළන කාලයක් තුළ දුන්න නමා ඉලක්කයට විදියි. දෙව් කුමරකු ගේ බදු වූ තාරුණ්‍යයෙන් බබළන අර්ජුන දුටු කෘෂ්ණා තොමෝ ප්‍රීතියෙන් ඉපිලෙමින් මල් දම ඔහු ගෙලෙහි පලඳවයි. අර්ජුන කුමරිය ද කැටි ව ශාලාවෙන් නික්මෙයි.

එහෙත් එහි රැස් ව සිටි රජවරු ද්‍රුපද රජු සැබෑවින් ම සිය දු කුමරිය බමුණකුට පාවා දීමට අදහස් කරන බව වටහාගත් කෙණෙහි ම එය ඔවුනට කරන අවමානයක් ලෙස සැලකූහ. පතියකු තෝරාගැනීම සඳහා ස්වයංවරයක් පැවැත්විය යුතු වූයේ ක්ෂත්‍රියයන් සඳහා මිස බමුණන් සඳහා නොවන බව ඔවුන් ගේ මතය වෙයි. අන්තිමේ දී ඔහු ද්‍රුපද රජු මැරීමට තැත් කළහ. එහෙත් භීම සහ අර්ජුන ඔහු ගේ ආඛාරයට වහා පැමිණෙති. විශාල ගහක් මුලිනු'දුරා ගන්නා භීම යම රජු ගේ බියකරු විලාසය දක්වමින් එහි නැඟී සිටී. නමාගත් දුන්න ඇති ව අර්ජුන ඔහු පසෙකින් සිටී. කර්ණ අර්ජුන සමඟත් ශල්‍ය භීම සමඟත් සටන් කරයි. දරුණු සටනෙකින් පසු කර්ණ සහ ශල්‍ය යන දෙ දෙන ම තමන් පරාජය වූ බව පිළිගනිති. රජවරු සටන් කිරීමේ අදහස අත් හැර පෙරළා ඔවුන් ගේ රටවලට පැමිණෙති. එහෙත් පාණ්ඩවයෝ කෘෂ්ණාවන් ද කැටි ව කුම්භකාරයා ගේ නිවෙසට පැමිණෙති. කුන්ති දේවිය ඔවුන් ගේ පැමිණීම පතමින් පෙර මහ බලා සිටින්නී ය. මෙහි දී අර්ජුන තමා දිනාගත් ද්‍රුපද දුහිතෘව වූ කෘෂ්ණාව තනි ව ම ආවහ කොට ගැනීමට අදහසක් තමාට නැති බවත්, එහෙත් ඔවුන් ගේ වංශයේ පැරණි සිරිතට අනුව ඇය සොහොවුරන් පස් දෙනාට ම පොදු පත්නිය විය යුතු බවත් ප්‍රකාශ කරයි.

ස්වයංවරය සඳහා පැමිණි රජුන් අතරෙහි යාදව ගෝත්‍රයේ නායකයා වූත් පාණ්ඩවයන් ගේ සුහුරුබඩු වූත් (කෘෂ්ණ ගේ පියා වූ වසුදේව කුන්තී ගේ සොහොවුරා වූ හෙයිනි) කෘෂ්ණ ද විය. පාණ්ඩවයන් වෙස් වලාගෙන සිටිය ද ඔහු කවුරු දැයි හැඳිනගත් එක ම නැනැත්තා හෙතෙමේ ය. එහෙයින් හේ සිය සොහොවුරු **බලදේව** ද කැටි ව පාණ්ඩවයන්

මයාසා කුම්භකාරයා ගේ නිවසට ගොස් තමා ඔවුන් ගේ ඥාතියා බව අනාවරණය කෙරෙයි. මෙය පාණ්ඩවයන් ගේ ඝාතිශය ප්‍රීතියට හේතු වෙයි. එහෙත් ඔවුන් ගේ රහස අනාවරණය නොවනු සඳහා කෘෂ්ණ සහ බලදේව වහා ඔවුන් වෙතින් ඉවත් ව යෙති.

දෘෂ්ටද්‍යුම්න කුමරු ද තම ගොඟොවුරිය සිය පත්නිය වශයෙන් දිනාගත් වීරයා සැබැවින් ම කවරෙක් දැයි දැනගැනීම පිණිස පාණ්ඩවයන් පසු පස රහසින් යෙයි. කුම්භකාරයා ගේ නිවසෙහි හැසිරී සිටින හෙතෙම නිවසට පෙරළා පැමිණි පාණ්ඩවයන් බහුමාන සහිත ව සිය මවට ආහාර කරන හැටින් කුන්තිය ආහාර පිළියෙල කිරීම හා බෙදීම පිළිබඳ ව ද්‍රෞපදියට[7] උපදෙස් දෙන හැටින් සන්ධ්‍යා හෝජනයෙන් පසු ඔවුන් සැම දෙන ම සැතපීමට යන හැටින් බාල ම ගොඟොවුරා කුස තණ ඇතිරියක් බිම එලන හැටින් ගොඟොවුරන් පස් දෙනා අනුපිළිවෙලින් තම තමාගේ අඳුන්දිවි සම ඊ මත අතුරා එහි දිගා වන හැටින් ඒ අතර ඔවුන් ගේ මව ඇඟේ යහන ඔවුන් ගේ හිස් දොරෙහි පනවා ගන්නා අතර ද්‍රෞපදිය ඇඟේ යහන ඔවුන් ගේ පාමුල පනවාගන්නා හැටින් බලා සිටී. නව දැ, නින්දට වැටෙන්නට පෙර ගොඟොවුරන් එකිනෙකා ගුද හරඹ හා විරක්‍රියාවන් ද ගැන නොයෙකුත් කතාබහ කරමින් ප්‍රමෝදයට පත් වූ හැටි ද හේ දකී. ඉක්බිති දෘෂ්ටද්‍යුම්න තෙමේ ඉන් නික්ම වහා පිය රජු වෙතට පැමිණ ඔවුන් කළ කතාබහට අනුව ඔවුන් බමුණන් නො ව, ක්ෂත්‍රියයන් බව සිතිය හැකි යැයි පවසයි. මේ අසා රජ අතිශය ප්‍රමෝදයට පත් වෙයි. පසු දා උදැසන ද්‍රුපද රජ සිය දූ කුමරිය ගේ පාණිග්‍රහණය උත්සවශ්‍රීයෙන් සිදු කරනු පිණිස පාණ්ඩව පුත්‍රයන් සිය මාළිගයට කැඳවයි. මිය ගියහ'යි බොහෝ දෙනකුන් සිතා සිටි පාණ්ඩු පුත්‍රයන් තමන් බව යුධිෂ්ඨිර ප්‍රකාශයට පත් කරනුයේ මෙහි දී ය. මේ අසත් ම ද්‍රුපද රජ පරම ප්‍රීතියට පත් වෙයි. එයට හේතුව වික්‍රමයම්පන්න වූ අර්ජුනයන් තම බෑනණුවන් කොට ගැන්ම රජු ගේ ඒ කාන්ත අභිප්‍රාය වූ හෙයිනි. එහෙත් තම දුහිතෘව හා අර්ජුන ද අතර පාණිග්‍රහණ මංගලය පැවැත්වීමට සැරැහෙත් ම කෘෂ්ණාව ගොහොවුරන් පස් දෙන ගේ ම පොදු පත්නිය විය යුතු බවට යුධිෂ්ඨිර කරන ප්‍රකාශයෙන් රජ විමතියටත් වික්ෂේපයටත් පත් වෙයි. කෙසේ වුව ද, එය පාණ්ඩවයන් ගේ කුල සිරිත බව දත් පසු ඔහු ඉදිරිපත් කළ සැක සියල්ල ම දුරු ව යෙයි. හුතැෂ් ගින්න ඉදිරියෙහි ද්‍රෞපදිය පළමුවෙන් විවාහප්‍රාප්ත වනුයේ දෙවුතම ගොහොවුරා වූ යුධිෂ්ඨිර සමඟ ය. ඉක්බිති සග මහලු පිළිවෙලට අනුව ඕ සෙසු ගොහොවුරන් සිවු දෙනට ද පෑහෑ දෙනු ලබන්නී ය.[8] කුන්තී තොමෝ සිය ලේලියට සෙත් පතයි. කෘෂ්ණ තෙමේ නව යුවතිපතියනට ඉතා මහැඟි පඬුරු හා ප්‍රසාද පිටත් කොට යවයි.

පාණ්ඩවයෝ තම රාජ්‍යය ආපසු ලබා ගනිති

පාණ්ඩවයන් තවමත් ජීවත් ව සිටින බවත් ස්වයංවරයෙහි දී ද්‍රෞපදිය දිනාගත් තේ අර්ජුන බවත් විදේශයන්හි වහා සැළ ව යෙයි. දුර්යෝධන සහ ඔහු ගේ මිත්‍රයෝ ශෝකහරිත ව හස්තිනාපුරයට පෙරළා පැමිණෙති. ද්‍රුපද සහ පඤ්චාල යන රජුනුත් කෘෂ්ණ සහ සාත්‍යකි යන රජුනුත් යන බලසම්පන්න මිත්‍ර පක්ෂ දෙකක් පාණ්ඩවයනට ලැබීම ගැන මහත් දොම්නසට පත් වෙති. පාණ්ඩවයනට විරුද්ධ ව ආරක්ෂා සංවිධාන යෙදිය යුතු බවත් ඔවුන් කිසි යම් දුෂ්ට උපායයෙකින් විනාශ කොට දැමිය යුතු බවත් දුර්යෝධන ගේ මතය වුව ද ඔවුන් හා මුහුණට මුහුණ දී සටන් කළ යුතු බව කර්ණ ගේ මතය වෙයි. එහෙත් විදුර හා භීෂ්ම ගේ ද අනුමතිය ලබන භීම තෙමේ ස්වකීය රාජ්‍යයෙන් අඩක් පාණ්ඩවයනට පවරා දී ඔවුන් හා සමාදානයෙන් වෙසෙන ලෙස ධෘතරාෂ්ට්‍ර හට උපදෙස් දෙයි. මේ යෝජනාවට එකඟ වන ධෘතරාෂ්ට්‍ර තෙමේ තම රාජ්‍යයෙන් අර්ධයක් පාණ්ඩවයනට පවරා දෙන බවටත් එහෙත් ඔවුන් ඛාණ්ඩවප්‍රස්ථ නම් කාන්තාර ප්‍රදේශයෙහි විසුම් ගත යුතු බවටත් එකඟ වෙයි. යුධිෂ්ඨිර මේ යෝජනාව ප්‍රීතියෙන් පිළිගනී. පාණ්ඩවයෝ ද්‍රුපදිය ද කැටි ව ඛාණ්ඩවප්‍රස්ථයට ගොස් (වර්තමාන දිල්ලිය අසල වූ) ඉන්ද්‍රප්‍රස්ථ නම් තම රාජධානිය හා බලකොටුව ද එහි ඉදි කරති.

අර්ජුන පිටුවහල් වීම හා ඔහු ගේ වීර ක්‍රියා

තම පොදු පත්නිය සමඟ පාණ්ඩවයෝ **ඉන්ද්‍රප්‍රස්ථයෙහි** ප්‍රීතියෙන් හා තෘප්තියෙන් ද යුතු ව වෙසෙති. එකිනෙකා අතරෙහි ඊර්ෂ්‍යාව පැනනැඟීම වළක්වනු පිණිස **නාරද** නම් දිව්‍ය ඍෂිවරයා ගේ උපදේශයට අනුව) යම් හෙයකින් කිසි යම් යොහොවුරකු ද්‍රෞපදිය සමඟ රහස්‍ය සමාගමයෙහි සිටිය දී තවත් සොහොවුරෙක් එයට බාධා කෙරේ නම් ඔහු රටින් පිටුවහල් ව දොළොස් වසරක් බ්‍රහ්මචර්යය රැකිය යුතු බවට උනුන් අතරෙහි ඇති කොට ගත් සම්මුතියෙක් වෙයි. මේ අවබෝධය නිසා ඔහු එකිනෙකා සමග සාමයෙන් දවස් යවති.

දිනෙක කිසි යම් සොර මුලක් බමුණුකුට අයත් ගවයන් කිහිප දෙනකු සොරා පැහැර ගනිති. තම යටත් වැසියන් සෑහෙන පමණට රැකබලා නොගන්නා බවට සැඩ පරුස බසින් රජුට අවලාද කියමින් බමුණා මාළිගයට දිව එයි. ඔහුට පිහිට පිණිස වහා ම එහි යෑමට අර්ජුනට ඕනෑ වෙයි. එහෙත් ආයුධ එල්ලා තබා ඇති කාමරයෙහි යුධිෂ්ඨිර ද්‍රෞපදිය ගේ සමාගමයෙහි පසු වෙයි. අර්ජුන උභතෝකෝටික ප්‍රශ්නයකට මුහුණ පායි. තමා ඔවුන් ගේ පොදු ප්‍රතිපත්තිය පිළිබඳ ව ඇති කොටගත් සම්මුතිය සිදිය නො දී බ්‍රාහ්මණයකු කෙරෙහි ක්ෂත්‍රියයකු පැවැත්විය යුතු යුතුකම් පැහැර හළ යුතු ද නොහොත් දෙ වැන්න ඉටු කිරීම සඳහා පළමු වැන්න සිදිය යුතු ද යනු ඒ පැනයයි. අන්තිමේ දී, කාමරයට පිවිසීමට නිරණය කරන හේ එ සේ කොට ආයුධ ගෙන සොරුන් ලුහුබැඳ ගොස් උන් අල්ලා බමුණාට ගවයන් ලබා දෙයි. ඉන් පසු පෙරළා නිවසට පැමිණෙන අර්ජුන තමන් අතරෙහි පවත්නා සම්මුතියට අනුව දොළොස් වසක් යන තෙක් තමා රටින් පිටුහල් ව සිටින බව යුධිෂ්ඨිර හට දන්වයි. එහෙත් තමා කිසි දු අමනාපයකට පත් නො වූ බව කියා ඔහු ගේ ඒ තීරණය වැළැක්වීමට යුධිෂ්ඨිර උත්සාහ කළ ද අර්ජුන ඒ කිසිත් නො තකා කවර හේතුවක් නිසා වුවත් යුක්තිය නම් යුක්තිය ම ය යන ප්‍රතිපත්තිය රකිමින් වනයට පිවිසෙයි.

මෙහි දී ඔහු කරන වීරක්‍රියා කිහිපයෙකි. වරෙක හෙතෙමේ ගංගා නදියෙහි නාමින් සිටියේ ය. පිතෘෘනට පූජා පවත්වා දියෙන් ගොඩ ඒමට ඔහු සැරසෙත් ම නාග රජකු ගේ උලූපී නම් දුහිතෘවක් පැමිණ ඔහු නාග ලෝකයට ඇදගෙන යෙයි. එහි දී තමා ඔහු කෙරෙහි ප්‍රේමයෙන් පසු වන බව ඔහුට පහදා දෙන ඕ නොමෝ තමා ගෙන් රසාස්වාදය ලබන සේ යදින්නට වෙයි. එහෙත් අර්ජුන තමා බ්‍රහ්මචර්යය රැකීමට පොරොන්දුවක් වී ඇති හෙයින් එය නො කළ හැකි බව කියා ඇගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරයි. එහෙත් ඒ කියමන නොපිළිගන්නා නාග මාණවිකාව් ඔහු ගේ පොරොන්දුව බල පෑ හැක්කේ ද්‍රෞපදිය කෙරෙහි පමණක් බවත් අසරණයනට සරණ වීම ක්ෂත්‍රියයකු ලෙස ඔහු ගේ යුතුකම බවත් ඉදින් ඔහු ඇගේ ඉල්ලීම ඉටු නො කළ හොත් ඇය සිය දිවි නොර කොට ගන්නා බවත් ඒ හෙයින් කෙසේ හෝ ඔහු ඇගේ ජීවිතය රැක දිය යුතු බවත් කියා සිටියි. ඇගේ තර්කයනට සෑහෙන පිළිතුරු දීමෙහි අපොහොසත් වන අර්ජුන "තමා ගේ යුතුකම් කෙරෙහි නෙත් යොමා" රුමත් උලූපියගේ ඉල්ලීම ඉටු කෙරෙමින් ඇය හා රාත්‍රියක් ගෙවයි.

වනයෙහි සැරි සරමින් සිටින හෙතෙමේ නවත් අවස්ථාවෙක දී **මණිපූරයේ චිත්‍රවාහන** රජු ඉදිරියට පමුණුවනු ලැබේ. එහි දී එ රජු ගේ රූමත් දූ කුමරිය වූ **චිත්‍රාංගදා** නොමෝ ඔහු දැක කාමාතුර වෙයි. එහෙත් ඕ "පුත්‍රිකාවකි." ඒ හෙයින් පිය රජු ඇය ඔහුට පාවා දෙනුයේ ඇයට ලැබෙන පුත්‍රයා තමා ගේ (චිත්‍රවාහන රජු ගේ) පුත්‍රයා ලෙස සලකනු ලැබීමේ පොරොන්දුව පිට පමණකි. එයට එකඟ වන අර්ජුන ඇය හා තුන් වසරක් කල් මණිපූරයෙහි[10] වෙසෙයි. ඇය පුත්‍රයකු ලද පසු ඇගෙන් සමු ගන්නා අර්ජුන යළිත් තමා ගේ චාරිකාව අරඹයි.

බොහෝ පුණ්‍ය තීර්ථයන් වන්දනා කිරීමෙනුත් අනේකවිධ වීරක්‍රියා කිරීමෙනුත් පසු ව, කෘෂ්ණ හමු වන අර්ජුන ඔහු ගේ අගනුවර වන **ද්වාරකාවට** යයි. එහි දී හෙතෙමේ මහත් උත්සවාකාරයෙන් පිළිගනු ලැබේ. කිහිප දිනකට පසු ව යාදව ගෝත්‍රයට අයත් **වෘෂ්ණීන්**

ගේ හා අන්ධකයන්ගේ ද මහත් ගැණකෙළි උළෙලෙක් රෛවතක පර්වතයෙහි පැවැත්වෙයි. ප්‍රභූවරුන් නාගරිකයෝත් නැටුම්, ගැයුම්, වැයුම් පවත්වමින් ප්‍රීතිඋත්සවයට පැමිණෙති. කෘෂ්ණ ගේ මහොවුරා වූ බලදේව ගිය බිරිය හමඟ මධුපානයෙහි යෙදෙමින් මත් වෙයි. උග්‍රසේන නම් වෘෂ්ණි රාජයා තම අන්තඃපුර ස්ත්‍රීන් දහසක් හා තවත් බොහෝ කුමාරවරුන් හා ඔවුන් ගේ බිරියනුත් පිරිවරාගෙන ගැණකෙළි සඳහා පැමිණෙයි. මේ අවස්ථාවෙහි කෘෂ්ණ ගේ රූමත් මහොවුරිය වූ සුභද්‍රා ගේ දර්ශනය අර්ජුන ගේ මනසෙහි ගැටේ. ඒ මනසෙහි ම ඇගේ රූපශ්‍රීයෙන් හේ වශීකෘත වෙයි. ඇය ලබාගත හැකි අසුරු අර්ජුන කෘෂ්ණ ගෙන් විමසයි. ස්වයංවරය බොහෝ විට අවිනිශ්චිත කාර්යයක් බැවින් ක්ෂත්‍රියාචාරයට අනුව ඇය බලාත්කාරයෙන් පැහැරගෙන යන ලෙස කෘෂ්ණ ඔහුට උපදෙස් දෙයි. ඉක්බිති අර්ජුන යුධිෂ්ඨිර හට හස්නක් යවමින් සුභද්‍රාව පැහැරගෙන යෑම පිණිස අවසර පතයි. යුධිෂ්ඨිර ගෙන් ඒ සඳහා කැමැත්ත ඔහුට ලැබේ. සන්නාහ සන්නද්ධ වූ අර්ජුන තෙමේ යුද රිය අරා සතුරන් ලුහුබඳින්නට මෙන් ඉදිරියට යෙයි. මේ අවස්ථාවෙහි සුභද්‍රා නොමෝ මෛරවතකය දිගේ යෙමින් සිටියා ය. ඇය පෙරළා ද්වාරකාවට පැමිණෙන්නට සැරයෙන් ම අර්ජුන ඇය අල්ලා ගිය යුද රියෙහි තබාගෙන ඉන්ද්‍රප්‍රස්ථය බලා රිය පදවන්නට වෙයි. මේ සමඟ ම ද්වාරකාවෙහි මහත් කැළඹිමක් ඇති වෙයි. බිමතින් සිටි බලදේව තෙමේ ආඟන්තුක චරිත්‍රයන් බිඳලීමෙන් අර්ජුන කළ සාහසික ක්‍රියාව කෙරෙහි කෝපාවිෂ්ට වෙයි. එහෙත් අර්ජුන කිසිවකුටත් වරදක් නොකළ බව පවසමින් කෘෂ්ණ තම සියලු නැයන් යන් සිදුවයි. අනෙක් අතට, යාදවයන් ඔවුන් ගේ යුවනියක පිටුදක්නා කැමැති ව ගවයිගක් විකුණන්නාක් මෙන් ඇය විකිණීමට සැරයෙතැයි අර්ජුන අදහස් නොකළ බවත් අවිනිශ්චිත ස්වයංවරයෙකින් තමාට අවස්ථාවක් ලබාගැනීමට ඔහුට උවමනා නොකළ බවත්, එ හෙයින් ඔහුට කළ හැකි වූ තුබූ එක ම දෙය සුභද්‍රාව පැහැරගෙන යෑම බවත් කෘෂ්ණ ඔවුනට පැහැදිලි කරයි. ඔවුන් අදෙදෙන අතර පාණිග්‍රහණය පැවැත්වීම පිළිබඳ ව විරෝධයක් පැන නො නැඟිණ. එහෙත් අර්ජුන ආපසු කැඳවා ඔවුන් අතර සමාදානයක් ඇති කළ යුතු වෙයි. සැබෑ සැටියෙන් ම මෙය සිදු වන හෙයින් අර්ජුන හා සුභද්‍රාව අතර ද පාණිග්‍රහණය සිදු වෙයි. සුභද්‍රාව ගේ සංගම රසය විඳිමින් හේ තවත් වසරක් ද්වාරකාවෙහි ම රැඳී සිටියි. දොළොස් වසරින් ඉතිරි ව සිටි කාලය පුෂ්කර නම් පුණ්‍යතීර්ථයෙහි ගෙවන අර්ජුන ඉන් පසු ඉන්ද්‍රප්‍රස්ථයට පෙරළා පැමිණෙයි. එහෙත් සුභද්‍රාව පාවාගැනීම ගැන ද්‍රෞපදිය අර්ජුන හට අවලාද කියන්නට වෙයි. එහෙත් සුභද්‍රාව සිය කැමැත්තෙන් ම ද්‍රෞපදිය ගේ පරිචාරිකාවක වීමට ඉදිරිපත් වත් ම ඇගේ කෝපය සන්සිඳෙයි. ඒ තැන් පටන් ද්‍රෞපදී, සුභද්‍රා සහ කුන්තී යන තිදෙන ඉතා ප්‍රීතියෙන් හා සමාදානයෙන් ද එක් ව කල් ගෙවති. අර්ජුන නිසා සුභද්‍රාවට අභිමන්‍යු නම් පුත්‍රයෙක් ලැබෙයි. හෙතෙමේ සිය පියා ගේත් මහපිය— සුළුපියවරුන් ගේත් මහත් ප්‍රසාදය දිනාගනී. ද්‍රෞපදී තොමෝ ද එක් එක් පාණ්ඩව සොහොවුරකු නිසා පුත්‍රයකු බැගින් පුතුන් පස් දෙනකුන් ලබයි.

යුධිෂ්ඨිර පෘථිවීශ්වරත්වයට පත් වෙයි

යුධිෂ්ඨිර රජ ස්වකිය රාජධානියෙහි දැහැමින් සෙමෙන් රාජ්‍යය කෙරෙයි. ඔහු ගේ වැසියෝ ද තම රජු කෙරෙහි භක්තිප්‍රේමයෙන් අවනත වූවාහු සුඛිත මුදිත ව වාසය කෙරෙති. රජු ගේ සොහොවුරෝ ද ප්‍රීතියෙන් දවස් යවති. එහෙත් අර්ජුන කෘෂ්ණ හා සමඟ ඉතා දැඩි සබඳකම් පවත්වයි. වරෙක මේ දෙ මිතුරන් යමුනා නදිය අසලැ වූ වනගොමුවෙක (ද්‍රෞපදිය හා සුභද්‍රාව ද ඇතුළු අභිරූපී ලලනාවන් සමූහයක් සහභාගි වූ මධුපානෝත්සවයෙක) සම්භාෂණයෙහි යෙදී සිටිය දී අග්නි දෙවියා බමුණකු ගේ විලාසයෙන් ඔවුන් සමීපයට පැමිණ ඛාණ්ඩව වනය දැවීමෙහි ලා තමාට සහාය වන ලෙස ඉල්ලා සිටියේ ය. මෙහි සත්‍යය නම් මහා යාගයන් කිහිපයෙක දී පුදන ලද අනේක විධ ප්‍රජාවන් අනුභව කිරීමෙන් මේ දෙවියාට අජීර්ණ රෝගයක් වැලැඳීමත් ඉන් සුවය ලබනු රිසි නම් ඛාණ්ඩව වනය දවා හැරිය යුතු බව බ්‍රහ්මයා ඔහුට කීමත් ය. එහෙත් වනය

දවා හැරීමට තැන් කළ හැම වාරයෙක ම වන සත්තු එය නැවත නැවතත් නිවා දමති. අර්ජුන හා කෘෂ්ණ ගේ ද කාර්යය වූයේ මෙය වළක්වාලීමයි. මේ කාර්යය සඳහා අග්නි තෙමේ දිව්‍යායුධ ඔවුනට ලබාදෙයි. නිමාවට පත් නොවන හියොවුරු දෙකක් සහිත ගාණ්ඩීව නම් බලසම්පන්න දුන්නක් ද රිදී පැහැයෙන් බබළන සුදු අසුන් යෙදූ, ඉතා ඈත සිට ද හැඳිනගත හැකි වානර ධජයක් සවි කළ විශිෂ්ට යුද්ධ රථයක් ද අර්ජුනට ලැබිණ. ඉතා විශ්වාසදායක පළිහක් හා අප්‍රතිහත මුද්ගරයක් කෘෂ්ණට ලැබෙයි. මේ ආයුධවලින් සන්නද්ධ වූ ඔහු අග්නි දෙවියාට සහාය වන්නාහු ගින්නෙන් දැවී යන වනයෙන් පලා යෑමට තැන් කරන සියලු සතුන් මරා දමති. ඔවුන් නො මරා ඉතිරි කරනුයේ දේව ගණය අතරෙහි ශ්‍රේෂ්ඨ කලා ශිල්පියකු ලෙස ගැනෙන මායා රාක්ෂසයා පමණකි.[12]

තම ජීවිතය ගලවාදීමට කෘතගුණ දැක්වීමක් ලෙස මායා රාක්ෂසයා යුධිෂ්ඨිර ගේ වාසය සඳහා නානාවිධ අතිදුර්ලභ උපක්‍රමයන් සහිත විස්මයජනක මාළිගයක් ඉදිරිපත් කරයි. මද කලකට පසු යුධිෂ්ඨිර රජ කෘෂ්ණ ගේ ද අනුමතිය ඇති ව රාජසූය මහා යාගය පැවැත්වීමට අදහස් කරයි. එහෙත් මේ යාගය පැවැත්විය හැක්කේ දික්විජය ඝළ සම්රාට් කෙනකු හට පමණකි. එහෙත් මගධයේ පාලකයා වූ ජරාසන්ධ රජ එවකට දඹදිවැ සිටි බලවත් ම පාලකයා ය. ඒ හෙයින් යාගයට පළමු ඔහු පිටුදැකිය යුතු විය. භීම සමඟ කළ ද්වන්ද්ව යුද්ධයෙක දී ඒ රජ නසනු ලැබෙයි. මින් පසු අර්ජුන, භීම, සහදේව, නකුල යන මොවුහු පිළිවෙලින් උතුරු, නැඟෙනහිරි, දකුණු සහ බටහිරි යන දිශාවන් බලා ජයග්‍රාහී සේනාවන් මෙහෙයවමින් දික්විජය ව්‍යාපාරයෙහි යෙදෙති. මෙහි ආධාරයෙන් සම්රාට් තත්ත්වයට පැමිණීමට යුධිෂ්ඨිරට හැකි වෙයි. මෙසේ රාජසූය යාගය පැවැත්වීමට හැකි හෙයින් එය මහත් ශ්‍රී විභූතියෙන් යුක්ත ව පැවැත්වෙයි. කෞරවයන් ද ඇතුළු ව රජවරු රාශියක් ම මේ සඳහා ආරාධිත වෙති. යාගාවසානයෙහි රැස් ව සිටියවුන් අතරෙහි ප්‍රසාද පූජා බෙදා දෙනු ලැබේ. භීම ගේ යෝජනාව අනුව පළමුවෙන් ම ප්‍රසාද පූජාව ලබන්නේ කෘෂ්ණ ය. එහෙත් චේදී රාජයා වූ ශිශුපාල මෙයට විරෝධය පළ කෙරෙයි. මින් ඇති වන කලහය කෙළවර වනුයේ කෘෂ්ණ අතින් ශිශුපාල මරුමුවට පත් වීමෙනි.

මහා යාගය නිමාවට පත් වූ පසු විදේශ රාජයෝ සමු ගෙන නිකුත් ව යෙති. කෘෂ්ණ ද පෙරළා සිය නිවෙසට පැමිණෙයි. දුර්යෝධන සහ ඔහු ගේ මාමා වූ ශකුණි පමණක් පාණ්ඩවයන් ගේ මාළිගයෙහි මද කලකට නතර වෙති. පාණ්ඩවයන් ගේ අද්භූත මාළිගය නරඹන දුර්යෝධන අකරතැබ්බ කිහිපයකට ම ලක් වෙයි. වරෙක පළිඟු බිම්තලයක් විලෙකැයි වරදවාගන්නා හේ එහි දිය නෑමට සිය ඇඳුම් උනන්නට වෙයි. තවත් වරෙක කෘත්‍රිම තඹාගයක් වියළි බිමෙකැයි වරදවා ගන්නා හෙතෙමේ නොකැමැත්තෙන් ම එහි තුළට වැටී තෙමෙයි. මෙය දක්නා භීම සහ අර්ජුන මහ හඬින් සිනා සෙන්නට වෙති.[13] මේ අවඥාව කලින් ම ඊර්ෂ්‍යාවෙන් මැඩී පැවැති දුර්යෝජන ගේ සිත ඉතා තදින් පැරී යන්නට හේතු වෙයි. ස්වකීය ඥාති සහෝදරයන් ගෙන් සමු ගෙන හස්තිනාපුරයට ඔහු පෙරළා යනුයේ මෙසේ මහත් වූ ඊර්ෂ්‍යාවෙන් හා කෝපයෙන් ද භරිත ව ගිය හැඟීම්වලින් යුක්ත ව ය.

දුඩු ක්‍රීඩාව

දුර්යෝධන තෙමේ තම හද තුළ දැවෙන වේදනාව පිළිබඳ කථාව සිය මයිල් ශකුණි හට දුක්මුසු බසින් පවසයි. තම සතුරන් ඒ බඳු ජයෝත්සවයන් පවත්වනු දැකීමේ නින්දුව තමාට කිසිසේත් ඉවසා දරාගත නොහැකි බවත් ඔහුට පාණ්ඩවයන් පරාජය කළ නොහැකි හෙයින් ගින්නට පැන හෝ වස බී හෝ දියට පැන හෝ සිය පණ නසා ගන්නා බවත් හේ පවසයි. ඉක්බිති, දුඩු ක්‍රීඩාවක් සංවිධාන කිරීමටත් එයට සහභාගි වීම පිණිස යුධිෂ්ඨිර හට ද ආරාධනය කළ යුතු ලෙසටත් ශකුණි යෝජනා කරයි. ඉතා දක්ෂ දුඩු ක්‍රීඩකයකු වූ ශකුණි හට ඉතා පහසුවෙන් ම යුධිෂ්ඨිර පරදවා ඔහු ගේ මුළු රාජ්‍යය ම දිනා ගත හැකි ය. ඉක්බිති මේ උපායයට අනුමතිය ලබාගැනීම සඳහා ඔහු මහලු ධෘතරාෂ්ට්‍ර

රජු කරා යෙති. මුල දී, මේ සියලු කරුණක් ගැන ම සිය බුද්ධිමත් සොහොවුරා වූ විදුර ගෙන් උපදෙස් ලබාගත යුතු බවත් තමා ඒ ගැන කිසිවකුත් කීමට මැලි බවත් රජ පවසයි. එහෙත් විදුර හැම විට ම පාණ්ඩවයන් ගේ පක්ෂය ගන්නා බව දුර්යෝධන පිය රජුට පෙන්වා දෙයි. දුබල මහලු රජ ඔහුට කරුණු කියාදීමට අවසර ද දී දුදු කෙළිය පැවැත්වීමට අණ දෙයි. හෙතෙමේ දුදු කෙළියට සහභාගි වන සේ යුධිෂ්ඨිර හට ආරාධනය කිරීමට විදුර ම එහි යවයි. මේ දාදු ක්‍රීඩාවෙන් ඇති විය හැකි මහත් ව්‍යසනයක් පිළිබඳ ව තමා තුළ ඇති බිය රජුට පළ කිරීමට විදුර නො පැකිළෙයි. ධෘතරාෂ්ට්‍ර රජු තුළ ද මෙ වැනි ම බියක් පහළ ව ඇති නමුත් ඉරණමට ඕනෑ දෙයක් විසඳීමට ඉඩ දිය යුතු බව තෙමේ අදහයි. එ හෙයින් විදුර තෙමේ යුධිෂ්ඨිර රජු ගේ මාළිගයට 'ගොස් දාදු ක්‍රීඩාවට සහභාගි වන සේ ආරාධනය කරයි. යුධිෂ්ඨිර තෙමේ ද නො වැලැක්විය හැකි ඉරණමේ බලය ගැන සඳහන් කෙරෙමින් අකැමැත්තෙන් වුව ද ආරාධනය ඉවසයි. තම සොහොවුරනුත් ද්‍රෞපදියත් සෙසු අන්තඃපුර ස්ත්‍රීනුත් කැටි ව ඔහු හස්තිනාපුරය බලා ගමන්ආරම්භ කෙරෙති. ධෘතරාෂ්ට්‍ර ගේ රාජ භවනයෙහි දී ආගන්තුකයෝ ඔවුන් ගේ ඥාතීන් විසින් ප්‍රිය සම්භාෂණ පූර්වක ව මහත් ගෞරවාදරයෙන් පිළිගනු ලබති.

පසු දා උදැසන යුධිෂ්ඨිර සහ ඔහු ගේ සොහොවුරෝ ද කෞරවයන් කලින් ම රැස් ව සිටි ක්‍රීඩා ශාලාවට ප්‍රවිෂ්ට වෙති. ශකුණි තෙමේ ක්‍රීඩාව සඳහා යුධිෂ්ඨිර හට අභියෝග කෙරෙයි. යම් කිසිවක් පරදුවට තබන යුධිෂ්ඨිර ඉන් පරාජයට පත් වෙයි. එකක් පරදින්නා හා ම අනෙකක් යනුවෙන් තමා ගේ සියලු වස්තුව, සියලු ස්වර්ණ, ධනය, මුතු මැණික්, රාජකීය මංගල රථය, දහි දහසයන්, හස්තීන්, යුද්ධ රථ, අශ්වයන් යන මේ ඈ විසින් ඔහු අල්ලන හැම පරදුවෙකින් ම යුධිෂ්ඨිර පරාජයට පත් වෙයි. ඉක්බිති විදුර ධෘතරාෂ්ට්‍ර දෙසට හැරී ඔහුට ඔවා දෙමින් මුළු මහත් කුලය ම විනාශයට පැමිණවීමට සැරැසෙන තම ඥාතිපුත්‍ර වූ දුර්යෝධන ගෙන් ඈත් වීමටත් ක්‍රීඩාවෙහි නො කඩවා යෙදීමෙන් වැළකෙන ලෙසත් කියයි. දුර්යෝධන තෙමේ මෙහි දී මහත් ආක්‍රෝශ පරිභවයෙන් විදුර හට බැණ වදිමින් ඔහු දුෂ්ට ද්‍රෝහියෙකැයි ද, කෞරවයන් තම ඇකයෙහි හොවා වැඩූ පොළඟෙකැයි ද, කිසි කලෙකත් සිය සතුරන් ගේ වාසිය සඳහා මිස තමා ගේ යහපත සඳහා කිසිවක් නො කියතැයි ද කියමින් චෝදනා කරයි. පරදු ලෙස තැබීමට තවත් කිසිවක් ඇති දැයි ශකුණි අවඥ සහිත ව යුධිෂ්ඨිර ගෙන් අසයි. මේ අවස්ථාවෙහි දුදු ක්‍රීඩාව පිළිබඳ ව වාවාගත නො හැකි ආශාවෙකින් යුධිෂ්ඨිර වෙළී යන හෙයින් තමා සතු සියලු වස්තුව—ඔහු ගේ ගොනුන් සහ ගව දෙනුන්, ඔහු ගේ අඟනුවර සහ ඔහු ගේ මුළු රාජ්‍යය ම පරදු කොට අල්ලයි. එහෙත් ඒ සියල්ලෙන් ම ගේ පරාජයට ම පත් වෙයි. ඉක්බිති තම කුමරුවන් ද නකුල සහ සහදේව යන සොහොවුරන් ද පරදුවට තබයි. එහෙත් ඔහුට පරාජය ම අත් වෙයි. ශකුණි විසින් ආවිෂ්ට වූ හෙතෙමේ තම සොහොවුරු අර්ජුන සහ භීම පවා පරදුවට තබා ඉන් ද පරාජයට පත් වේ. අන්තිමේ දී හේ තමා ම ඔට්ටුවට තබයි. ජය යළිත් ශකුණි හට ම පැමිණෙයි. මෙහි දී ශකුණි යුධිෂ්ඨිර සතු වස්තුවක්—එ නම්, පඤ්චාල දුහිතෘව වූ ද්‍රෞපදිය තවමත් ඔහු වෙතැ ඇති බැවින් තමා ම පරදුවට තැබීමෙන් ඔහු කළේ නුවණැති ක්‍රියාවක් නොවන බව පවසයි. මේ අවස්ථාවෙහි එහි සිටි සියලු වෘද්ධයන්[14] තුළත් භීෂ්ම, ද්‍රෝණ, කෘප සහ විදුර යන මොවුන් තුළත් ශෝකය දැනවමින් රුමත් ද්‍රෞපදිය පරදු කොට තබන බව යුධිෂ්ඨිර ප්‍රකාශ කෙරෙයි. සියල්ලන් මහත් වික්ෂේපයෙන් බලා සිටිය දී දාදු කැට හෙළනු ලැබේ. ඒ වාරයෙහි ද ජයග්‍රහණය ශකුණි කරා පැමිණෙයි.

සිනා හඬ නගන දුර්යෝධන තෙමේ පරිවාරක සේවිකාවක් අතරෙහි තබා ගබඩා ඇමදිමෙහි යෙදවනු පිණිස ද්‍රෞපදිය එහි ගෙනෙන ලෙස විදුර හට නියම කරයි. මෙහි දී විදුර ඔහුට අවවාද කරමින් ඔහු ගේ ක්‍රියාවෙන් කෞරවයනට අත් වනුයේ විනාශය පමණෙකැයි කියමින් අනතුරු හැඟවීමෙන් අවවාද කරයි. තව ද, සැබැවින් ම සලකතොත් යුධිෂ්ඨිර ද්‍රෞපදිය පරදුවට තැබුවේ තමාට තමා අහිමි ව සිටි අවධියෙක හෙයින් ද්‍රෞපදිය කිසි සේත් දාසියක බවට පත් ව නැති බව ද විදුර ඔහුට පහදා දෙයි. ඉක්බිති දුර්යෝධන ද්‍රෞපදිය හෙනෙන ලෙස දූතයකු මෙන් සූතයකු පිටත් කොට යවයි.

ද්‍රෞපදිය ද දූතයා ආපසු එවමින් යුධිෂ්ඨිර පළමුවෙන් පරදු කොට ඇල්ලුවේ ඔහු ද නොමහාන් තමා දැයි විමසයි. මේ ප්‍රශ්නය ද්‍රෞපදිය ම ක්‍රීඩා ශාලාවට පැමිණ ඇය ම ඇයිය යුතු බව කියමින් දුර්යෝධන තෙමේ දූතයා ආපසු ඇය වෙත යවයි. එයට එකඟ නොවන ද්‍රෞපදිය ඔහු ගේ අදහසට ඉඩ නො දී දූතයා ආපසු එවයි. අන්තිමේ දී දුර්යෝධනු ඕය ගෙහොවුරු දුශ්ශාසන කැඳවා බලාත්කාරයෙන් ඇය එහි ගෙනෙන ලෙස පිටත් කොට යවයි. දුශ්ශාසන අන්තඃපුරය තුළට ගොස් නොපැමිණීමට දහලන ද්‍රෞපදිය ගේ කෙස්සෙන් අල්ලා රැස්වීම් ශාලාවට ඇදගෙන එයි. මේ අවස්ථාවෙහි අසනීපයෙන් පසු වන ද්‍රෞපදිය ඇඳ ඔවින්නී අර්ධ වස්ත්‍ර ය. ඉතා දුක්මුසු ලෙස හඬා වැලපෙන ඕ තොමෝ කිඹිවකු දු තමාට පිහිටට නොසිටින බවත් භීෂ්ම හා ද්‍රෝණ පවා එ සේ නොකරන බවත් කියමින් පාණ්ඩවයන් දෙස දුක්ඛිත විලාශයෙන් බලයි. තම වස්තුවෙනුත් රාජ්‍යයෙනුත් පිරිහුණු පාණ්ඩවයන් ඒ සියල්ලට ම වඩා දැරිය නොහැකි වේදනාවක් දුන්නේ ලජ්ජාවෙන් හා කෝපයෙන් ද භරිත වූ ද්‍රෞපදිය ගේ ඒ බැල්ම .. තව දුරටත් ඉවසා සිටිය නොහැකි වූ භීම තෙමේ ද්‍රෞපදිය පරදුවට තැබීම ගැන යුධිෂ්ඨිරට සැඩ පරුස ලෙස අවලාද කියමින් ඔහුට පහර දීමට සැරසෙයි[15] එහෙත් අර්ජුන භීම හට අවවාද කරමින් හැම කල්හි ම යුධිෂ්ඨිර පවුලේ වැඩිමහල්ලා ය යන්න දැන සිටිනු ලැබිය යුතු බවත් ඔහුට හරසර දැක්විය යුතු බවත් කියයි. ඉක්බිති දුර්යෝධන ගේ බාල ම සොහොවුරන් අතරින් එකතු වූ විකර්ණ එහි රැස් ව සිටි සියල්ලන් අමතා ද්‍රෞපදිය ඔට්ටුවකින් පරදවනලද්දේ නිවැරැදි ලෙස ද යන ඇගේ ප්‍රශ්නයට පිළිතුරු සපයන ලෙස ඉල්ලයි. මෙහි දී සියල්ලන් ම මුනිවත රැක සිටින හෙයින් තෙමේ ම පිළිතුරු දෙමින් එය "යුක්ති සහගත නො වේ යැයි පවසයි. එහෙත් කර්ණ එයට ප්‍රත්‍යුත්තර දෙමින් කෞරවයන් සියල්ලන් ම දිනූ හෙයින් පාණ්ඩව පත්නිය ද ඔවුනට ම අයත් බව ද කියයි. තව ද කෞරවයන් පාණ්ඩවයන් ගේ හා ද්‍රෞපදිය ගේ ද වස්ත්‍රයන් පවා දිනාගත් හෙයින් ඔවුන් ගේ (පාණ්ඩවයන් ගේ හා ද්‍රෞපදිය ගේ ද) වස්ත්‍ර ඉවත් කළ යුතු බව ද වැඩිදුරටත් හේ කියයි. පාණ්ඩවයෝ ඔවුන් ගේ අඩු ඇදුම් ඵනා තබති. මෙ විට කර්ණ දෙන සංඥාවක් අනුව දුශ්ශාසන ද්‍රෞපදිය ගේ ඇදුම් ඉරා දැමීමට ඇය ඉදිරියට යයි. එහෙත් ඕ තොමෝ විෂ්ණු අවතාරය වූ කෘෂ්ණ හට කන්නලවු කෙරෙමින් ඔහු ගේ ආධාරයෙන් වාර කිහිපයක් ම ඇගේ වස්ත්‍ර අල්ලා ඇදීමට දුශ්ශාසන තැත් කරද්දීත් තම වස්ත්‍රය රදවා ගෙන ම සිටියි[16] එහෙත් භීම මෙහි දී ඉතා බිහිසුණු පළිගැසීමක් කෙරෙයි :

"සමස්ත ලෝකයෙහි සිටින ක්ෂත්‍රියයෙනි, මගේ පළිගැසීමට කන් දෙවු. මේ වනාහි මින් පෙර කිසි කලෙකත් මිනිසුන් විසින් නොකරනලද්දා වූ මෙන් ම යළිත් කිසි කලෙකත් මිනිසකු විසින් කරනු නොලබන්නාවූත් පළිගැනීමෙකි. සංග්‍රාමයෙහි දී මේ අධම දුෂ්ට චණ්ඩාල භාරතයා ගේ පපුව පළා ඔහු ගේ ලේ නො බී වෙත්, මේ මා කී වචන ඉවු කැර ගැනීමට නො හැකි වුව හොත් පිතෘන් ගේ විශ්‍රාමස්ථානයට පැමිණීමට මට කිසි කලෙකත් නො හැකි වේ වා"

මේ භයානක වචන ඇසීමෙන් එහි සිටි සියලු ක්ෂත්‍රියයෝත් වීරයෝත් සන්ත්‍රාසයට පැමිණෙති. කෞරවයන් විසින් ද්‍රෞපදිය යුක්තිසහගත ලෙස දිනා ගන්නා ලද ද නැති ද යන නීති ප්‍රශ්නය තීරණය කිරීමේ යුතුකම් එහි රැස් ව සිටි සියල්ලන් සතු ව පවත්නා බව සිහිපත් කරවීමට විදුර ගන්නා ප්‍රයත්නය නිෂ්ඵල වෙයි. වැලැපීමෙන් හා අදෝනා කීමෙන් ද තමා ගේ පැනයට පිළිතුරු සැපයීමට තම ඥාතීනට ඇවිටිලි කිරීමෙන් ද ද්‍රෞපදිය ගන්නා වැයම නිෂ්ඵල වෙයි. නීති ශාස්ත්‍රයෙහි නිපුණ වූ සත්ගුණ සම්පන්න භීෂ්ම හට පවා යුක්තිය වූ කලි විනිශ්චය කිරීමට ඉතා දුෂ්කර වූවක් බවත් මේ ලෝකයෙහි ශක්තිය යුක්තිය වී පවත්නා බවත් යුධිෂ්ඨිර යුක්තියේ ප්‍රතිමූර්තියක් හෙයින් මෙය තීරණය කිරීම ඔහු ම සතු කාර්යයක් බවත් යන්නට වඩා වැඩියක් කීමට අපොහොසත් වෙයි. දුර්යෝධන ද තමා ද්‍රෞපදිය දිනාගත්තේ යුක්ති සහගත ව ද නොහොත් එ සේ නො වේ දැයි කියන සේ අවඥා සහිත ව යුධිෂ්ඨිර ගෙන් අසයි. මෙහි දී කාර්යාකාර්ය විනිශ්චයෙහි අපොහොසත් ව කිසි ද පිළිතුරක් නො දී යුධිෂ්ඨිර පසු වත් ම එ තෙක්

කැසූ විධියේ නිග්‍රහයක් පාණ්ඩවයනට කිරීම පිණිස දුර්යෝධන ඉදිරියට යෙයි. හේ ද්‍රෞඳියට පෙනෙන්නට ම තම වම් කලවය නිරුවත් කොට අඟැට දක්වයි. මෙහි දී භීම මෙ බඳු බිහිසුණු ප්‍රකාශයක් කරයි: "යුද්ධයෙහි දී මේ තා ගේ කලවය සුනුවිසුනු කොට ලීමට නො ලැබෙතොත් භීම ඔහු ගේ පිතෘන් හා එක් නො වේ වා."

තව දුරටත් ඔවුනොවුන් අතර කතා හුවමාරු වද්දී ඔවලකු උස් හඬින් කරන කෑගැසීමක් හා නපුරු නිමිති පිළිබඳ තවත් ශබ්ද ධෘතරාෂ්ට්‍ර ගේ මාළිගයෙහි අසන්නට ලැබේ. මින් බිය පත් වූ මහලු ධෘතරාෂ්ට්‍ර රජ අන්තිමේ දී තමා ම මේ අවුල බෙරීම සඳහා ඉදිරිපත් විය යුතු යැයි සිතයි. හේ සැඩපරුස බසින් දුර්යෝධනට දෝෂාරෝපණය කරයි. ඉක්බිති ද්‍රෞපදිය සනසන රජ ඇයට ඇය කැමති කිසිවක් ඉල්ලන ලෙස කියයි. එ විට ඕ ඇගේ හිමියා වූ යුධිෂ්ඨිරට නිදහස දෙන ලෙස අයදියි. රජ ඇයට තවත් වරයක් දීමට කැමති වෙයි. ඉතිරි පාණ්ඩවයන් සිවු දෙන මුදා දෙන ලෙස ඉල්ලීම ඈ කැමති වරය වෙයි. කෙසේ වුව ද රජ, ඇයට තුන් වන වරයක් දීමට ද කැමති වෙයි. එහෙත් පාණ්ඩවයන් නිදහස ලැබූ කෙණෙහි ම ඔවුනට අවශ්‍ය සියල්ල දිනාගැනීමෙහි පෙහොසත් වන හෙයින් ඇයට තවත් වරයක් අවශ්‍ය නොවන බව ඕ රජුට පවසයි. පාණ්ඩවයන් තමන් පත් විපතින් මිදීමට පිටුබල වූ පහුර ද්‍රෞපදිය යැයි කියමින් මෙහි දී කර්ණ බැණ වදින්නට වෙයි. මින් ක්ෝපාවිෂ්ට වූ භීම තෙමේ මෙහි දී ම කෞරවයන් විනාශ කළ යුතු ද නැති ද යන සැකයෙන් පසු වෙයි. එහෙත් අර්ජුන ඔහු සනසන අතර යුධිෂ්ඨිර ඔහු සටන් වැදීමෙන් වළක්වයි. කෙසේ වුව ද ධෘතරාෂ්ට්‍ර රජ යුධිෂ්ඨිර හට ඔහු ගේ රාජ්‍යය ආපසු පවරා දී සිදු වූ සියල්ල අමතක කොට ලන ලෙස ඔවදන් දෙයි. මෙ සේ ඔහු සන්සුන් සිතින් ඉන්ද්‍රප්‍රස්ථයට ම පෙරළා යෙති.

දෙ වන දුදු ක්‍රීඩාව හා පාණ්ඩවයන් රටින් පිටුවහල් කරනු ලැබීම

පාණ්ඩවයන් නික්ම ගිය නොබෝ දිනෙකින් ම දුර්යෝධන, දුශ්ශාසන, ශකුණි යන මොහු මහලු රජ වට කැරගෙන ඉතා දරුණු නිග්‍රහයකට පාත්‍ර කරවනු ලැබූ පාණ්ඩවයන් ගෙන් පැමිණිය හැකි උපද්‍රව ගැන රජුට කරුණු දක්වමින් දෙ වන වරටත් දුදු ක්‍රීඩාවකට ඔවුන් කැඳවීමට කැමැත්ත පළ කරන ලෙස රජුට ඇවිටිලි කෙරෙති. මේ වතාවෙහි පරාජයට පත් වුයේ වනයට පිටුවහල් කරනු ලැබ දොළොස් වසරක් මුළුල්ලේ එහි කල් ගෙවා දහ තුන් වන වසරෙහි ජනයා අතරෙහි කිසිවකු විසිනුදු හැඳිනගනු නො ලැබ කල් ගත කළ යුතු වෙයි. තුදුස් වන වසරෙහි සිය රටට පෙරළා පැමිණිය හැක්කේ එ සේ කල් ගෙවූවකුට පමණකි. යම් හෙයකින් ඔහු දහ තුන් වන හවුරුද්දෙහි දී හැඳිනගනු ලැබුව හොත් තවත් දොළොස් වසක් කල් වනයෙහි පිටුවහල් දිවියක් ගෙවීමට ඔහුට සිදු වේ. කෞරවයන් සියලු දෙන ගේ විනාශය සිදු කිරීමේ අපරාධයෙන් මිදෙනු සඳහා තම දුෂ්ට පුත්‍රයා වූ දුර්යෝධන හා සියලු සබඳකම් අත්හැර දමන ලෙස රජු පෙළඹවීමට ඔහු ගේ මෙහෙසිය වූ ගාන්ධාරී දේවිය ගන්නා සියලු උත්සාහය නිෂ්ඵල වෙයි. මුළාවට පත් කරනු ලබන රජ මේ ක්‍රියාමාර්ගයට සිය අනුමතිය දෙයි. ඒ සඳහා පිටත් කොට යැවෙන දූතයාට තවමත් සිය රටට පෙරළා යමින් සිටි පාණ්ඩවයෝ හමු වෙති. දෙවයෙන් මූඪත්වයට පමුණුවනු ලබන යුධිෂ්ඨිර දෙ වන දුදු ක්‍රීඩාව සඳහා කරන ආරාධනය ද පිළිගනී. ඔහු සියලු දෙනා ම පෙරළා පැමිණෙති. ක්‍රීඩාව යළිත් අමුතුවෙන් ඇරඹේ. එහෙත් යුධිෂ්ඨිර යළිත් පරාජයට පැමිණෙයි. දැන් ඔවුන් සියලු දෙන ම දහ තුන් වසක කාලයක් පුරා රටින් පිටුවහල් ව සිටිය යුතු ය.

පාණ්ඩවයෝ අඳුන්දිවි සම් හැඳ වනයට යෑමට සැරසෙති. දුර්යෝධන හා දුශ්ශාසන ද ස්වකීය ජයග්‍රහණයෙන් ප්‍රමෝදයට පැමිණියහු පාණ්ඩවයනට සරදම් කෙරෙති. එහෙත් භීම ඔවුන් වෙත බිහිසුණු තර්ජනයන් එල්ල කරයි. දුර්යෝධන ඔවුන් ගේ හදවත් තියුණු දරුණු බඹින් විදලන්නා සේ ම ඔහු ගේ හද ද යුද්ධයෙහි දී තමා විදලන බව භීම පවසයි. යළිත් හෙතෙමේ දුශ්ශාසන ගේ ලේ බොන බව දිවුරා කියයි. කර්ණ, සහදේව, ශකුණි, නකුල ඇතුළු ධෘතරාෂ්ට්‍ර ගේ අවශේෂ පුත්‍රයන් සියලු දෙන ම නසන බවට අර්ජුන

පොරොන්දු වෙයි. එහෙත් යුධිෂ්ඨිර ධෘතරාෂ්ට්‍ර, භීෂ්ම සහ සෙසු කෞරවයන් ගෙන් සමු ගන්නා අතර බුද්ධිමත් ගුණවත් විදුර වෙත පැමිණ මහත් සේ ස්නේහභරිත ව ආචාර කෙරෙයි. පාණ්ඩව මාතාව වූ කුන්තී තොමෝ විදුර මාළිගයෙහි රැඳෙයි. එහෙත් ද්‍රෞපදිය සිය ගිමියන් සමඟ පිටුවහල් ව සිටීමට නික්ම යෙයි. ඒ සේ යන අයට තම තැන්දණියන් ගෙන් ලැබෙන ආශීර්වාදය සිතට මහත් අනුවේග දනවයි. කඳුළු වගුරුවමින් වැළැපෙන කුන්තී තොමෝ සිය දරුවන් පිටුවහල් ව යන සැටි බලා සිටී. එහෙත් මෘදු ගුණ ඇති යුධිෂ්ඨිර හැරෙන්නට සෙසු සියලු පාණ්ඩව සොහොවුරෝ තුදුස් වන වසරෙහි කෞරවයන් ගෙන් දරුණු ලෙස පළිගන්නා බව දිවුරා කියති. අසුබ නිමිති පහළ වේ. දේව දූතයා වූ නාරද ධෘතරාෂ්ට්‍ර රජුට ඔහු ගේ වංශය විනාශයට ලක් වන බවට අනාගත වාක්‍යයක් කියයි. දඳු ක්‍රීඩාවට හා පාණ්ඩවයන් පිටුවහල් කිරීමට ද සිය අනුමතිය දීම ගැන ධෘතරාෂ්ට්‍ර රජ මහත් පශ්චාත්තාපයට පත් වෙයි.[17]

පාණ්ඩවයන් දෙලොස් වසක් වනයෙහි කල් ගෙවීම[18]

හස්තිනාපුරයෙහි වැසි නාගරිකයෝ බොහෝ දෙනෙක් පාණ්ඩවයන් සමඟ වනයට යෙති. ඔවුන් පෙරළා නිවෙස් කරා යන ලෙස කැමැති කරවා ගැනීමට යුධිෂ්ඨිර හට ප්‍රමාණවත් ආයාසයක් දැරීමට සිදු වේ. බමුණෝ කිහිප දෙනෙක් සැහෙන කලක් ඔවුන් හා නතර වෙති. ඔවුනට ආහාර සැපැයීම පිණිස තාපස වෘතය රැකි හෙතෙමේ ඒ සඳහා හිරු දෙවියාට යැදුම් කරයි. කැමැත්ත අනුව ඉබේ පිරියන තඹ වලදක් හිරු දෙවි ගෙන් බහට ලැබෙයි. මෙහි පිහිටින් බමුණනට දන් දුන් යුධිෂ්ඨිර උතුරු දෙසට ගමන් අරඹා **කාම්‍යක** වනයට පිවිසෙයි. භීම තෙමේ ඔවුන් විසූ වනය අරක් ගෙන සිටියා වූත් බක ගේ සොහොවුරකු හා හිඩිම්බ ගේ යහළුවකු ද වූත් කිර්මීර නම් මිනිකන රකුසකු නොපමා ව මරා දමයි.

මේ අතරතුරෙහි ධෘතරාෂ්ට්‍ර රජ විදුර සමඟ මන්ත්‍රණයක් පවත්වයි. පාණ්ඩවයන් ආපසු ගෙන්වා ඔවුන් හා සමාදනයක් ඇති කොට ගන්නා ලෙස විදුර තෙමේ රජුට අනුශාසනා කරයි. එහෙත් විදුර හැම විට ම පාණ්ඩවයන් ගේ පක්ෂය ගැනීම ගැන කෝපයට පත් වන ධෘතරාෂ්ට්‍ර රජ ඔහුට තමා කැමැති තැනකට යන ලෙස කියමින් දයා විරහිත ව ඔහු ඒ තැනින් නෙරපයි. විදුර කාම්‍යක වනයෙහි වෙසෙන පාණ්ඩවයන් කරා ගොස් සිදු වූ සියල්ල ඔවුනට පවසයි. කෙසේ නමුත් මහලු රජ තමාට ඇති වූ කෝපය ගැන පසුතැවිල්ලට පත් ව සිය සොහොවුරු විදුර කැඳවාගෙන ඒම පිණිස සඤ්ජය නම් රියැදුරා එහි යවයි. එයට නැමෙන විදුර වහා ම රාජභවනයට පෙරළා පැමිණෙයි. සොහොවුරන් දෙ දෙනා අතර සම්පූර්ණ සාමග්‍රියක් ඉන් ඇති වෙයි.

පාණ්ඩවයන් පිටුවහල් කරනු ලැබීම පිළිබඳ ප්‍රවෘත්තිය ඇසූ ඔවුන් ගේ මිත්‍රයෝත් ඥාතියෝත් ඔවුන් බැලීම පිණිස වනයට යෙති. පළමු වෙන් ම එ හේ යන තැනැත්තෙක් නම් කෘෂ්ණ ය. දඳු ක්‍රීඩාව පැවැති අවස්ථාවෙහි ඔහු යුද්ධයෙක නියුක්ත ව සිටි හෙයින් තම මිත්‍රයන් හට පිහිට වීම පිණිස එහි සිටිය නොහැකි විය. එ විට ඔහු ඔවුන් වෙත සිටියා නම් ඒකාන්තයෙන් ම දඳු ක්‍රීඩාවෙහි යෙදීමෙන් ඔවුන් වළක්වනු නිසැක ය. එහෙත් දුර්යෝධන සමඟ යුද කොට යුධිෂ්ඨිර යළිත් බලයට පත් කරවීමට කෘෂ්ණ යෝජනා කළ කල්හි යුධිෂ්ඨිර එයට එකඟ නො වෙයි. එහෙත් කෞරවයන් තමාට පැමිණවූ බලවත් නිග්‍රහය පිළිබඳ ව ද්‍රෞපදිය දරුණු බසින් චෝදනා නඟයි. ඉන් පසු ව ද, සියලු දෙන ම එක් වී බලය යොදා සිහසුන යළිත් ලබාගන්නා ලෙස ද්‍රෞපදිය හා භීම ද යුධිෂ්ඨිර හට නැවත නැවතත් බල කරති. මේ හැම වාරයෙක දී ම යුධිෂ්ඨිර තමා වූ පොරොන්දුව එ ලෙස ම රැකිය යුතු බවත් එ හෙයින් දොළොස් වසක් වනයෙහි කල් ගෙවිය යුතු බවත් ඔවුනට කියයි. පෞරුෂයක් නැතිකම ගැන යුධිෂ්ඨිර හට අවලාද කියන භීම ක්ෂත්‍රියයකු ගේ ප්‍රධාන ම යුතුකම සටන් කිරීම බවත් දැනට දහතුන් මසක් ඉකුත් ව ඇති බවත් යුධිෂ්ඨිර එය දහතුන් වසරක් ලෙස ගණිතත් පොරොන්දු සුබ කිරීමෙන් සිදු වන වරද පාපශෝධන යාගයක් පැවැත්වීමෙන් මකාගත හැකි බවත්

කියයි. එ විට යුධිෂ්ඨිර ඔවුන් ගේ යෝජනාවට විරුද්ධ වෙමින් දුර්යෝධන හට භීෂ්ම, ද්‍රෝණ, කෘප සහ කර්ණ වැනි ඉතා බලසම්පන්න වූත් අප්‍රතිහත වූත් මිත්‍රයන් සිටින බව කියයි. මේ අවස්ථාවෙහි මහලු ව්‍යාස ඍෂිවරයා යළිත් ඔවුන් ඉදිරියෙහි පෙනී සිට දෙවියන් ගෙන් අර්ජුනට දිව්‍යායුධ ලබාගැනීමට ආධාර වන මන්ත්‍රයක් යුධිෂ්ඨිර අතට දෙයි. මේ දිව්‍ය ආයුධවල ආධාරයෙන් ඔවුනට කෞරවයන් පරාජය කළ හැකි වෙයි. එ හෙයින් වහා ම දිව්‍යායුධ ලබාගැනීම පිණිස යුධිෂ්ඨිර තෙමේ අර්ජුන ඉන්ද්‍ර දෙවියා වෙත යවයි. අර්ජුන හිමවත බලා ගොස් එහි සැරි සරන විට තාපසයකු ගේ වේශයෙන් පෙනී සිටි ඉන්ද්‍ර දෙවියා හමු වෙයි. ඉන්ද්‍ර ඔහු ශිව දෙවියා වෙත යවයි. එ සේ යවනුයේ අර්ජුන හට දිව්‍යායුධ දීමට අනුමනිය ඔහු විසින් දිය යුතු හෙයිනි. ඉක්බිති අර්ජුන උග්‍ර තපස් රක්නට පටන් ගනී. එ විට ශිව තෙමේ **කිරාතයකු** ගේ හෙවත් වැද්දකු ගේ වේශයෙන් අර්ජුන ඉදිරියෙහි පෙනී සිටී. අර්ජුන "කිරාතයා" හා බිහිසුණු සටනකට වදී. අන්තිමේ දී වැදි වෙස් ගෙන සිටි ශිව දෙවියා තමා ගේ නියම වෙසින් පෙනී සිට අර්ජුනට අප්‍රතිහත දිව්‍යායුධ තෑගි කොට දෙයි. **යම, වරුණ, කුබේර** යන ලෝක පාලකයෝ ද ඔහු ඉදිරියෙහි පෙනී සිට අර්ජුනට තම තමන් ගේ ආයුධ තෑගි කොට දෙති. එහෙත් ඉන්ද්‍ර ගේ රියැදුරු වූ **මාතලී** තෙමේ ඔහු ඉන්ද්‍රයා වෙසෙන දිව්‍ය පුරයට කැඳවාගෙන යයි. එහි දී හේ තවත් දිව්‍යායුධ ලබයි. අර්ජුන තෙමේ ඉන්ද්‍ර ගේ දිව්‍ය භවනයෙහි පස් වසක් කල් ඉතා ප්‍රීතියෙන් වෙසෙයි. එහි දී ඉන්ද්‍ර ගේ නියමයෙන් ගාන්ධර්වයෙක් අර්ජුන හට නෘත්‍ය ගීත වාදනයෙහි පුහුණුවක් ලබා දෙයි.

මේ අතරතුරෙහි අවශේෂ පාණ්ඩව සොහොවුරෝ දඩයම් කොට ගත් වන සතුන් ගේ මසින් ද වනමූලඵලාඵලයෙන් ද ඌනපෝෂණය ලබමින් වනයෙහි ජීවත් වෙති. අර්ජුන ඔවුනතුන්ගෙන් වෙන් ව ගොස් බොහෝ කලක් වන හෙයින් ඔහු ඔහු ගැන විමසිලිමත් වෙති. ඉන්ද්‍ර භවනයට ගොස් පෙරළා පැමිණි **ලෝමශ** ඍෂිවරයා අර්ජුන ඉන්ද්‍ර දෙවියා සමඟ ආරක්ෂා සහිත ව සුව සේ වෙසෙන බව කියමින් ඔවුන් සනසතත් ඉන් නෘප්තියට නොපැමිණෙන ඔහු අර්ජුන සෙවීමට යෑම පිණිස සැරසෙති. එ සේ ගොස් ඔහු **ගන්ධමාදන** පර්වතාන්තරයෙහි සැරි සරති. ඔහු එහි දී භයානක කුනාටුවකින්, සන්ත්‍රාසජනක අකුණු හඬින් හා විදුලිය පෙව්ම්වලින් ද මහත් බියට පත් වෙති. ද්‍රෞපදිය භීතියත් විඩාවත් කරණ කොට ගෙන ක්ලාන්ත භාවයට පත් වෙයි. ඉක්බිති භීම තෙමේ තමාට හිඩිම්බා රාක්ෂසිය ගෙන් ලැබුණු පුත්‍රයා වූ **ඝටෝත්කච** ගැන සිහි පත් කරයි. එ කෙණෙහි ම ඝටෝත්කච රාක්ෂසයා සිය පියා ඉදිරියෙහි පෙනී සිට ද්‍රෞපදිය සිය පිට හිඳුවාගෙන යයි. ඔහු විසින් කැඳවනු ලබන තවත් රකුසෝ කිහිපදෙනෙක් පාණ්ඩවයන් සිය පිට හිඳුවාගෙන යෙති. අන්තිමේ දී ඔහු සියල්ලෝ ම **කෛලාස දේවකූටය** අසලැ ගංගා නදියේ පිහිටි තවුස් අසපුවකට ගෙනෙනු ලබති. මෙහි දී ඔහු විශාල **බදරී** වෘක්ෂයක් යටැ විශ්‍රාමයෙන් පසු වෙති.

දිව නෙළුම් මල් දැකීමට බලවත් ආසාවක් ද්‍රෞපදියට ඇති වන බැවින් භීම මලය වනාන්තරයට පිවිසෙයි. ඔහු දැකීමෙන් වන සත්තු තැති ගනිති. හෙතෙමේ එක් ඇතකු ගෙන තවත් ඇතකුටත් එක් සිංහයකු ගෙන තවත් සිංහයකුටත් පහර දී මරා දමයි. ඇතැම් විට ඔහු උන් මරාදමනුයේ හුදු තම මිටින් පහර දීමෙනි. වානරයන් ගේ රජු වූ **හනුමත්** සමඟ ඔහු යුද වදිනුයේ ද මෙහි දී ය. දෙවියනට පමණක් යෑමට අවසර ඇති ඔහු ගේ මාර්ගය අවහිර නොකරන ලෙසත් තව දුරටත් එහි ගමන් නොකරන ලෙසත් **හනුමත්** ඔහුට කියයි. එහෙත් තමා කවරෙක් දැයි ඔහුට හඳුන්වාදෙන භීම තෙමේ මඟින් ඉවත් වීමට ඔහුට අණ කරයි. එ තැනින් ඉවත් නොවන වානර තෙමේ තමා අසනීපයෙන් පසු වන බවක් අඟවා එ තැන පියමං කොට යෑමට භීම කළු යුත්තේ තමා ගේ වලිගය පසෙකට නල්ලු කොට ලීම පමණකැයි කියති. වානරයාගේ වලිගය ඉස්සීමට භීම ගන්නා හැම උත්සාහයක් ම නිෂ්ඵල වෙයි. ඉක්බිති වානර තෙමේ මද සිනා පෑමින් තමා 'රාමායණයෙන් ඉතා හොඳට දන්නා ලැබෙන' හනුමත්[18] බව අනාවරණය කරයි. මෙහි දී තමා ගේ සොහොවුරා දැකගන්නට ලැබීම ගැන හේ අතිශයින් ප්‍රමෝදයට පත් වෙයි. ඔහු දෙ දෙන ම වෘත දිව්‍ය පුත්‍රයාගේ පුත්‍රයෝ ය. එ හෙයින් ඔවුන් දෙ දෙන අතර ප්‍රිය

සංවාදයක් ඇති වෙයි. අන්තිමේ දී භානුමත් තෙමේ කුමඩර ගේ උයනට යන ගමන් ඔහු ඔහුට කියා දී උයනෙහි ඇති කිසි දු මලක් නොකඩන ලෙස අවවාද කරයි. අන්තිමේ දී ඔහු මහත් සෙනෙහසින් එකිනෙකා ගෙන් සමු ගෙන වෙන් ව යෙති. භීම වහා ම කුබේරයා ගේ උයනට හා දිව නෙළුම් පිපෙන විලට පිවිසෙයි. මෙහි දී එය අරක් ගෙන සිටින රකුසේ ඔහු ඉදිරියට පැමිණ එහි මල් නෙළන්නට ඉඩ නො දී වළකති.[1] යම් හෙයකින් ඔහුට ඒ අවශ්‍ය නම් ඔහු ඒ සඳහා කුබේරයා ගෙන් අවසර ගත යුතු බව පවසති. තමාට අවශ්‍ය කිසිවක් ලබාගැනීමට ක්ෂත්‍රියයකු කිසිවකු ගෙනුත් අවසර ලබා නො ගත යුතු බව කියමින් භීම ඔවුනට පිළිතුරු දෙයි. රකුසන් හා සටන් වදින හේ ඔවුන් පලවා හැර නෙළුම් මල් නෙළාගනියි.

රාක්ෂසයන් සමඟ අනේකවිධ වීරවික්‍රම ක්‍රියාවන් හා සටන් පැවැත්වීමෙන් පසු පස් වන වසර උදා වෙයි. අර්ජුන දෙවි ලොව සිට පේරළා පැමිණෙනුයේ මේ වසරෙහි ය. සොහොවුරෝ ඔහු පිළිගැනීම පිණිස "ශ්වේත පර්වතයට" (කෛලාස නම් දිව්‍ය පර්වතයට) යෙති. කුවේර උද්‍යානයෙහි ආරක්ෂකයන් වූ යකුන් හා රකුසන් සමඟ භීම යළිත් වරක් සටන් කරයි. ඔහු අතින් ඔවුන් බොහෝ දෙනකුන් මැරුම් කෑ මේ සටනෙහි දී මරුමුවට පත් රකුසෙක් නම් මණිමන් ය. අගස්ති මහර්ෂිහු ගේ හිස මත මොහු වරක් කෙළ හෙළූ හෙයින් කුබේරයා මහර්ෂිහු ගෙන් ශාප ලද්දේ ය. එ හෙයින් රකුසන් මැද ඔහු පැවැත්වූ මේ සාතන ක්‍රියාව පිළිබඳ ව කුබේරයා උදහසට පත් නො වෙයි. ඒ වෙනුවට හෙතෙමේ භීම සහ ඔහු ගේ සොහොවුරන් මහත් සාදරයෙන් පිළිගනී.

අන්තිමට සුප්‍රසිද්ධ පර්වතයෙහි දී පාණ්ඩව සොහොවුරනට අර්ජුන යළිත් හමු වෙයි. ඔහු එහි සැපත් වනුයේ මාතලී විසින් පදවනු ලැබූ ඉන්ද්‍ර ගේ දිව්‍ය රථයෙහි නැඟි ය. අතිශය හෘදයංගම වූ ස්වස්තිකාරයෙන් පසු අර්ජුන තමා ලද අත්දැකීම් හා තමා කළ වීර වික්‍රමයන් ද පිළිබඳ තොරතුරු සිය සොහොවුරනට විස්තර කරයි. විශේෂයෙන් ම ඔහු විස්තර කරන්නක් නම් මුහුදට අරක් ගෙන විසූ නිවාතකවච නමැති රාක්ෂසයනුත් අහස පුරා සැරි සරන හිරණ්‍යපුර නම් නගරයෙහි වැසියනුත් සමඟ තමා කළ සංග්‍රාමයන් හා ලද ජයග්‍රහණයන් පිළිබඳ තොරතුරු ය.

දැන් පාණ්ඩවයෝ කුබේරා උද්‍යානයෙහි සුව සේ වෙසෙති. එහි සිව් වසක් පුරා ගෙවන කාලය ඔවුනට දැනෙනුයේ එක් රාත්‍රියක් එහි ගත කළ ලෙස ය. කෙසේ නමුත් ඔවුන් ගේ ලෞකික කාර්යයන් හා යුද්ධයන් පවත්වාගෙන යනු පිණිස දිව්‍යලෝකය අත් හැර යෑම පිණිස ඔහු තීරණය කෙරෙති. කෛලාසයෙන් බට ඔහු යමුනා නදි තීරයෙහි වූ මලය වනාන්තරයට පිවිසෙති.

මෙහි දී භීම අප්‍රසන්නජනක සිද්ධියකට ලක් වේ. ඔහු බේරුගනු ලබන්නේ යුධිෂ්ඨිර විසිනි. වනයෙහි සැරි සරන භීම හට හදිසියෙන් ම විශාල නාගයෙක් හමු වේ. ඔහු වෙත බිහිසුණු ලෙස කඩා පනින මේ නාගයා ඔහු වෙළාගන්නේ කොතරම් තදින් ද යත් ඔහුට ඔදී යෑමට නොහැකි වෙයි. ඔහු ගේ සොහොවුරා වූ යුධිෂ්ඨිර ඔහු මේ ව්‍යසනයට පත් ව සිටිනු දකී. මේ නාගයා නම් අගස්ත්‍ය ඍෂිහු ගේ ඍපයක විපාකයක් වශයෙන් දෙව් ලොවින් නෙරපනු ලැබ නාගයකු බවට පෙරළනු ලැබූ නහුෂ නම් සුප්‍රසිද්ධ පුරාණ රජ කෙනෙකි. තමා අසන සියලු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට හැක්කකු හමු වන තෙක් හෙතෙමේ මේ සාපයෙන් මුදන නොලැබේ. ඔහු නඟන සියලු ම දාර්ශනික ප්‍රශ්නවලට යුධිෂ්ඨිර සතුටුදායක පිළිතුරු සපයයි. ඉන් පසු භීම නිදහස් කොට ලන නහුෂ ස්වකීය නාග භාවයෙන් මිදී දෙව් ලොවට පෙරළා පැමිණෙයි.

මේ සිද්ධියට පසු වහා ම ඔහු කාම්‍යක වනයට පෙරළා පැමිණෙති. මෙහි දී කෘෂ්ණ ඔවුන් බැලීමට පැමිණෙයි. හේ ද්‍රෞපදියට ඇය එ තෙක් පුළුපුළා සිටි තොරතුරු—එ නම් ඇගේ දරුවන් පිළිබඳ තොරතුරු සැළ කරයි. එ පමණක් නො ව, කෞරවයනට විරුද්ධ ව කරන සටන සඳහා මිත්‍ර පක්ෂයක් සහතික ලෙස ම ඇති කැර ගන්නා ලෙසටත් යුද්ධයේ අවශ්‍ය සෙසු කටයුතු සූදානම් කැරගන්නා ලෙසටත් යුධිෂ්ඨිර හට ගේ අනුශාසනා කරයි

ශක්තිමත් බ්‍රාහ්මණයෝ ද නිතර නිතර වනයට පැමිණ පාණ්ඩවයන් බැහැ දකිති. මොවුන්තුරින් එක් බ්‍රාහ්මණයෙක් පාණ්ඩවයන් වෙතින් ධෘතරාෂ්ට්‍ර රජු ගේ භවනයට ගොස් පාණ්ඩවයනට—විශේෂයෙන් ම ද්‍රෞපදියට—මහාභූතයන් ගේ බල පෑම නිසා වනයෙහි දී මුහුණ පාන්නට සිදු ව ඇති දුෂ්කරතාවන් ගේ ප්‍රමාණය විස්තර කරයි. මහලු රජ මේ තොරතුරු අසා වැලැපෙමින් පශ්චාත්තාපයට පැමිණෙද්දී ඔහු ගේ පුත්‍ර දුර්යෝධන තෙමේ ඉන් මහත් ප්‍රීතියට පත් වෙයි. ශකුණි සහ කර්ණ විසින් පොළඹවනු ලබන හේ පාණ්ඩවයන් පත් විපත බලා ප්‍රීති වීමට ඔවුන් වෙසෙන වනයට යෑමට තීරණය කරයි. මේ වනය අසලැ පිහිටා ඇති ගොවුදැ නරඹා, එහි වෙසෙන ගව පට්ටි පරීක්ෂා කිරීමටත් ගවයන් ගණන් කොට ළමා වසු පැවියන් තෝරා ගැනීමටත් යන බව ඔහු ධෘතරාෂ්ට්‍ර රජුට හඟවති. විශාල අශ්වාරෝහක සේනාවක් කැටි ව යන ඔහු ගවයන් පරීක්ෂා කොට, අනතුරු ව දඩ කෙළියෙහි යෙදීමෙන් විනෝදය ලබති. එහෙත් ඔවුන් පාණ්ඩවයන් වෙසෙන ස්ථානය අසලට යෑමට සැරසෙන විට ගන්ධර්වයන් විසින් ඔවුන් ගේ ගමන වළක්වනු ලැබේ. මෙහි දී ඔවුන් හා ඇති වන සටනින් පසු ගන්ධර්වයන් විසින් දුර්යෝධන තෙමේ නින්දනීයාකාරයෙන් සිරබාරයට ගනු ලැබේ. කෞරවයෝ පිහිට පතා පාණ්ඩවයන් වෙත යති. උතුම් යුධිෂ්ඨිර තෙමේ ඔවුනට පිහිට වීමට එකඟ වෙයි. බලවත් සටනෙකින් පසු පාණ්ඩවයන් විසින් යුධිෂ්ඨිර තෙමේ ගන්ධර්ව රජු ගේ ඍාහයෙන් මුදාගනු ලැබෙයි. මේ ලැබූ අවමානයෙන් ඇති වූ ලජ්ජාවෙන් හා වේදනාවෙන් ද භරිත වූ දුර්යෝධන සිය දිවි තොර කැරගන්නට බලයි. සිය පණ නසාගන්නට ඔහු ගන්නා තීරණයෙන් ඔහු ගේ යහළුවන් ඔහු වළකාලනුයේ මහත් ආයාසයෙනි.

පාණ්ඩවයන් සංහාරය කිරීමට සුදුසු අලුත් උපායයන් දැන් කර්ණ වෙතැ ඇත. පෘථිවියේ සතර දිශාවන් දිනා සකල ධරණියේ අධිශ්වරත්වයට පැමිණීමෙන් දුර්යෝධන හට ද මහා රාජසූය යාගයක් පැවැත්වීමට හැකි වනු පිණිස මහා දික්විජය ව්‍යාපාරයෙක යෙදීම පිණිස කර්ණ නික්ම යෙයි. විජයග්‍රහණයෙන් මස්තකප්‍රාප්ත වන මේ දික්විජය ව්‍යාපාරයෙන් පසු මහා යාගයක් පැවැත්වේ. එහෙත් එක ම පවුලෙක රාජසූය යාගය පැවැත්විය හැක්කේ එක් වරෙක බැවිනුත් යුධිෂ්ඨිර මේ ගණයේ යාගයක් දැනට ම පවත්වා ඇති බැවිනුත් ඔහු පැවැත්විය යුත්තේ ඉන් වෙනස් යාගයකි. වෛෂ්ණව යන නමින් හැඳින්වෙන මේ යාගය ද පවත්වනලද්දේ විෂ්ණු විසින් ම පමණෙකි. දුර්යෝධන තෙමේ පාණ්ඩවයන් විනාශ කොට දැමීමේ අදහස ඇති ව මේ මහා යාග මහෝත්සවයට පැමිණෙන ලෙස ඔවුනට ආරාධනය කරයි. යුධිෂ්ඨිර මේ ආරාධනය මහාත් ම ලීලාවෙන් ප්‍රතික්ෂේප කෙරෙයි. එහෙත් භීම තෙමේ හසුනක් යවමින් දහතුන් වන වසරින් පසු පැවැත්වෙන යුද්ධ යාගයෙහි දී පාණ්ඩවයන් තම ද්වේෂය නමැති යාගඝෘතය කෞරවයන් මතැ වගුරුවන බව පවසයි.

පාණ්ඩවයන් වනයෙහි නැවතී සිටි අන්තිම අවුරුද්ද තුළ ඔහු මහත් වියෝගයකින් සන්ත්‍රාසයට පත් වෙති. දිනෙක සොහොවුරන් සියලු දෙන ම දඩයම් සඳහා බැහැර ගොස් සිටිය දී හුදෙකලා ව ඔවුන් ගේ නවාතැනෙහි නැවතී සිටි ද්‍රෞපදිය එතැන පසු කොට ගිය ජයද්රථ නමැති සින්ධු රාජයා විසින් සොරා පැහැරගෙන යන ලදී. පාණ්ඩවයෝ වහා ඔහු ලුහුබැඳ ගොස් පරාජය කෙරෙති. හෙතෙමේ අර්ජුන හා භීම විසින් අවමානයටත් දඬුවමටත් භාජන කරනු ලබති. භීම ඔහු මැරීමට තැත් කළ ද ඔහු ධෘතරාෂ්ට්‍ර රජුගේ බෑනා වූ හෙයින් යුධිෂ්ඨිර ඔහුට අභයදානය කරයි.

ද්‍රෞපදිය දූෂණය කිරීම පිළිබඳ ව පාණ්ඩවයෝ මහත් කනස්සල්ලට පත් ව සිටිති. විශේෂයෙන් ම, ඉතා දුක්මුසු ස්වභාවයෙන් පසු වන යුධිෂ්ඨිර තෙමේ තමා නිසා මුහුණ පාන්නට සිදු වූ විපත පිළිබඳ ව පශ්චාත්තාපයට පත් ව ද්‍රෞපදියට පැමිණ ඇති ඉරණම පිළිබඳ ව වැලැපෙයි. දැන් යුධිෂ්ඨිර කර්ණ හට තරම් වෙන කිසි ද කෞරවයකු ගැන මහත් බියකට පත් ව නැත. දැන් කර්ණ ලොවට පැමිණ සිටින්නේ කිසිවකු හට ද අගෝචර වූ සන්නාහයක් සහ කර්ණාභරණ ද පැළඳ ගෙන ය. කර්ණ පිළිබඳ ව යුධිෂ්ඨිර සිත තුළ පවත්නා මේ නිතියෙන් ඔහු මුදාගනු පිණිස ඉන්ද්‍ර බමුණකුගේ වේශයෙන් කර්ණ ඉදිරියෙහි පෙනී සිට තමාට කවචයක් හා කර්ණාභරණ යුගලයක් ද දෙන ලෙස

අයදි. බමුණාකු ඉල්ලූ කිසිවකට නැතැයි නොකියන කර්ණ තෙමේ ඇස පිය හෙළීමකුදු නො කොට තම ඔරුවින් කපා ගත් කවචය හා කර්ණාභරණ යුගලය ද බමුණාට පිරි නමයි. ඉන්ද්‍ර තෙමේ ද ප්‍රත්‍යුපහාරයක් වශයෙන් කිසි විටෙකත් නොවරදින ඉලක්ක යක් ගත හැකි හෙල්ලක් පිරිනමයි. එහෙත් ඔහු මේ හෙල්ල ද පාවිච්චි කළ යුත්තේ ඉතා ම නපුරු අවදානමෙක දී එක් වරක් පමණකි.

ද්‍රෞපදිය පිළිබඳ දුෂණයෙන් දුකට පත් පාණ්ඩවයෝ කාම්‍යක වනය හැර පියා ද්වෛතවන වනය බලා යෙති. ඔවුන් ගේ අන්තිම වික්‍රමය ඔවුන් පවත්වනුයේ මෙහි දී ය. වනය සිසාරා සැරි සරන මුවකු ගේ අංතට්ටුවෙහි බමුණකුට අයත් දර මිටියක් ඇමිණී යෙයි. මුවා එයත් රැගෙන පලා යෙයි. තම යාගය පැවැත්වීමට දර උවමනා කළ හෙයින් බමුණා එය ආපසු ලබා දෙන ලෙස පාණ්ඩවයන් ගෙන් ඉල්ලයි. වේගයෙන් මුවා ලුහුබැඳ ගිය ද ඌ අල්ලා ගැනීමට ඔවුනට නොහැකි වේ. අන්තිමේ දී ඌ ඔවුන් ගේ දර්ශන පථයෙන් ඈත් ව අතුරුදහන් වෙයි. ඔවුන් ගේ අභාග්‍යය ගැන ඔහු වැලැපෙති. පාවහන් රහිත ව කළ ලුහුබැඳීමෙන් වෙහෙසටත් පිපාසයටත් පිඩාවටත් පත් ඔහු ජලය සොයා අවට පිරික්සති. ගසකට නැඟි අවට බලන නකුල හට ඈත පිහිටි විලක් පෙනේ. යුධිෂ්ඨිර ගේ ඉල්ලීම අනුව ගියොවුරෙහි ලා දිය ගෙන ඊමට නකුල එහි යෙයි. බලාකාවන් විසින් පිරිවරන ලද ඉතා මනහර පැහැදිලි ජලයෙන් අලංකාර විලක් වෙතට හේ පැමිණෙයි. එහෙත් ඔහු එහි දිය බොන්නට සැරැසෙන විට ම අදෘශ්‍යමාන ව සිටින කිසියම් යක්ෂයෙක් අහසෙහි සිට මෙ සේ කියන්නට වෙයි. "එම්බා මිත්‍රය, අපරාධ නොකරනු! මේ මගේ වස්තුවයි. පළමු ව මගේ ප්‍රශ්නවලට පිළිතුරු සපයනු. ඉන් පසු දිය බී ඉවතට ද ගෙන යනු.' එහෙත් නකුල මේ බසට කන් නො දී දිය බොන්නට වෙයි. හේ පණ නැති ව බිම වැටෙයි. නකුල ගොස් බොහෝ වේලා ඉකුත් වූ හෙයින් ඔහු සොයා සහදේව නික්ම යෙයි. ඔහුට ද අත් වනුයේ එ ම ඉරණමයි. දැන් යුධිෂ්ඨිර අර්ජුන එහි යවයි. එහෙත් ඔහුට ද අන් කිසිත් කළ හැකි නො වේ. අන්තිමේ දී භීම තෙමේ අදෘශ්‍යමාන ව සිටින යක්ෂයා හා යුද වදින්නට තැත් කරයි. විලෙන් දිය බොන හෙතෙමේ ද පණ නැති ව බිම හෙයි. එහෙත් ඔහුට ද අන් කිසිත් කළ හැකි නො වේ. අන්තිමේ දී භීම තෙමේ ම යෙයි. සිය සොහොවුරනට ඇති වූ ඉරණම දකියි. භීතියට පත් ඔහු සිය සොහොවුරන් මළවුන් ලෙස වැතිරී සිටිනු දැක වැලැපෙමින් අදෝනා කියන්නට වෙයි. ඉක්බිති ඔහු ද විල ළඟට පැමිණෙන් ම තමා අසන ප්‍රශ්නවලට පිළිතුරු නො සපයා දිය නොබොන ලෙස යක්ෂයා කරන තර්ජනයේ හඬ ඇසේ. ඔහු ගේ ප්‍රශ්නවලට පිළිතුරු සැපැයීමට තමා කැමැති බව යුධිෂ්ඨිර පවසයි. ඉක්බිති ඉතා වැදගත් ප්‍රශ්නෝත්තර මාලාවක් අසන්නට ලැබේ. එහි ලා පුරාතන මහෝදධික බ්‍රහ්මෝදය තේරවිලිවල[20] ස්වරූපයේ තේරවිලි කිහිපයක් හැරෙන්නට යෙසු සියල්ලට මුළු මහත් ඉන්දීය සාධුශීල ධර්මය ම පාහේ අසු වී ඇත. පහත දැක්වෙනුයේ ඉන් උපුටා ගත් කිහිපයක් පමණකි:—

යක්ෂ: "මහ පොළොවට වඩා බර කුමක් ද? අහසට වඩා උස කුමක් ද? සුළඟට වඩා ඉක්මන් කුමක් ද? තණවලට වඩා වැඩි කුමක් ද?

යුධිෂ්ඨිර: "මවක් මහ පොළොවට වඩා බර ය. පියා අහසට වඩා උස ය. ජීවය සුළඟට වඩා ඉක්මන් ය. අදහස් තණවලට වඩා වැඩි ය."

යක්ෂ: "යාන්ත්‍රිකයා ගේ යහළුවා කවරෙක් ද? නිවසෙහි රැඳී සිටින්නා ගේ යහළුවා කවරෙක් ද? රෝගාතුරයා ගේ යහළුවා කවරෙක් ද? මියයන්නා ගේ යහළුවා කවරෙක් ද?

යුධිෂ්ඨිර: 'නවලම යාන්ත්‍රිකයා ගේ යහළුවා ය. භාර්යාව නිවසෙහි රැඳී සිටින්නා ගේ යහළුවා වෙයි. වෙදා රෝගාතුරයා ගේ යහළුවා වෙයි. දානය මියයන්නා ගේ යහළුවා ය.

යක්ෂ: ජය ගත නොහැකි සතුරා කවරෙක් ද? කිසි කලෙකත් සුව නොවන අසනීපය කුමක් ද? සත්පුරුෂයා ලෙස සැලැකෙනුයේ කවරෙක් ද? අසත් පුරුෂයා ලෙස සැලැකෙනුයේ කවරෙක් ද?

යුධිෂ්ඨිර: ද්වේෂය ජය ගත නොහැකි සතුරා ය. ලෝභය කිසි කලෙකත් සුව නොවන අසනීපයකි. සියලු සතුන් කෙරෙහි හිතවත් ව සිටින්නා සත්පුරුෂයෙකි. දයා රහිත පුද්ගලයා අසත්පුරුෂයෙකි.

යක්ෂ: මහ රජ, මෝහය යනු කුමක් ද? මානය යනු කුමක් ද? නිෂ්ක්‍රියතාව යනු කුමක් ද? ශෝකය යනු කුමක් ද?

යුධිෂ්ඨිර: ධර්මය පිළිබඳ ව පවත්නා මුළාව[21] මෝහයයි. ආත්මවම්භනය මානයයි. ධර්මය පිළිබඳ අකාර්යශීලිත්වය නිෂ්ක්‍රියතාවයි. අවිද්‍යාව සැබෑ ශෝකයයි.

යක්ෂ: ස්ථිරත්වය යනුවෙන් සෘෂිවරයන් අදහස් කරනුයේ කුමක් ද? නිර්ඝීතතාව යනුයෙන් දන්නා ලැබෙනුයේ කුමක් ද? ඉතා ම යහපත් ඥානය නම් කුමක් ද? දාක්ෂිණ්‍යය යනු කුමක් ද?

යුධිෂ්ඨිර: යමකු ගේ යුතුකම් ඉටුකිරීමෙහි ලා දක්වන ස්ථිරත්වය ස්ථිරත්වයයි. ඉන්ද්‍රියදමනය නිර්ඝීතත්වයයි. දූෂිත සිතිවිලිවලින් දුරු වීම ඉතා ම හොඳ ඥානයයි. දාක්ෂිණ්‍යයට සියලු සතුනට ආරක්ෂාව සැලසීම අයත් වෙයි.

යක්ෂ: කියව, මහ රජ, බ්‍රාහ්මණත්වය සැබෑවින් ම කිමෙකින් යුක්ත ද? පරපුරින් ද? ජීවනචර්යායෙන් ද? වේදාධ්‍යයනයෙන් ද නොහොත් පාණ්ඩිත්‍යයෙන් ද?

යුධිෂ්ඨිර: "අසව, ප්‍රිය යක්ෂය, බ්‍රාහ්මණත්වය පරපුරින් හෝ වේදාධ්‍යයනයෙන් හෝ පාණ්ඩිත්‍යයෙන් හෝ ඇති වන්නක් නො වේ. ඒ වූ කලි හුදෙක් යහපත් ජීවනාචාර්යායෙන් ම ලැබෙන්නකි. ඒ ගැන කිසිදු සැකයක් නැත. බ්‍රාහ්මණයා අන් හැම කරුණකට ම වඩා තමා ගේ අවධානය තම ජීවිතය යහපත් ලෙස සකස් කොට ගැන්මෙහි යොමු කරවිය යුතු වේ. යම් තැක් කල් ඔහු ගේ සාධු ජීවිතය උපද්‍රවයකට නො පැමිණ පවත්නේ ද ඒ තැක් කල් තෙමේ උපද්‍රවයකට නො පැමිණ සිටී. ඔහු ගේ සාධු ජීවිතය විනාශයට පැමිණේ ද එ විට හෙතෙමේ ද විනාශයට පැමිණේ. විද්‍යාව උගන්නෝත් උගන්වන්නෝත් ඉන් බවුන් වඩන්නෝත් කෙලෙස් බර සිත් ඇත්තේ ද ඔහු මෝඩයෝ ය. සකල චතුර්වේදය ම දැන සිටියත් යමෙක් පාපී ජීවිතයක් ගෙවන්නේ ද හෙතෙමේ ශූද්‍රයකුටත් වඩා නරක ය. යමෙක් අග්නියාගය නො පුදා ද, එහෙත් ඉන්ද්‍රිය දමනය කෙරේ ද ඔහු බ්‍රාහ්මණයකු ලෙස හිඳිය හැකි ය."

යුධිෂ්ඨිර ගේ ප්‍රශ්න විසර්ජනය කෙරෙහි යක්ෂයා පැහැද ඔහු ගේ එක් සොහොවුරකු ගේ ප්‍රාණය ආපසු ලබා දීමට කැමැති වෙයි. ප්‍රාණය ලබාදිය යුත්තේ සොහොවුරන් සිවු දෙන ගෙන් කවරකුට දැයි යුධිෂ්ඨිර තීරණය කළ යුතු ය. ඔහු ඒ සඳහා තෝරා ගන්නේ නකුල ය. තම පියාට බිරියන් දෙ දෙනකුන් සිටි හෙයින් දෙ වන භාර්යාව වූ මාද්‍රිය ගේ පුත්‍රයකු ද ජීවත් ව සිටිය යුතු ය යන්න මේ සඳහා ඔහු ඉදිරිපත් කරන හේතුවයි. මේ පිළිතුරින් යක්ෂයා කෙතරම් ප්‍රසාදයට පත් වේ ද යත් හෙතෙමේ ඔහු ගේ සොහොවුරන් සියලු දෙනට ම ප්‍රාණය ආපසු ලබා දෙයි. මේ යක්ෂයා නම් අන් කිසිවකුත් නො ව යුධිෂ්ඨිර ගේ "පියා[22]" වූත් යුත්තිධර්මයේ හා සාධුශීලයේ ද දේවතාවා වූත් ධර්ම දේවයා ම ය. තමා අතුරුදන් වන්නට කලින් දහ නුන් වන වසර තුළ කිසිවකු විසිනුත් හැඳින ගත නොහැකි වන ලෙසට අතිරේක වරයක් හෙතෙමේ පාණ්ඩවයනට දෙයි. දෙලොස් වසරක් කල් ඔවුන් වනයෙහි ගෙවූ ජීවිතය දැන් නිමාවට පැමිණ ඇත. එහෙත් කලින් යොදාගත් නියමයට අනුව මහා ජනයා අතරෙහි හැඳිනගනු නො ලැබ ඔවුන් දහතුන් වසර ගෙවිය යුතු ය.

පාණ්ඩවයෝ විරාට රජු ගේ රාජ සභාවෙහි පසු වෙති[23]

මත්ස්‍ය දේශාධිපති විරාට රජු ගේ මාළිගට හොස් වෙස් වලාගෙන බොරු නම්වලින් පෙනී එහි නැවැති සිටීමට පාණ්ඩවයෝ තීරණය කෙරෙති. නගරයෙන් පිටත පිහිටි සුසානයෙක වූ ගසෙකු ඔහු තම ආයුධ සහවා කිසිවකුත් එහි ළං විය නොදෙනු

පිණිස මළමිනියක් ඒ ගසෙහි එල්ලා තබති. ඔවුන් මේ කටයුත්ත කරනු බලා සිටි ගොපල්ලනට ඒ වූ කලි අවුරුදු එකසිය අසූවක් වයසැති තම මැණියන් බවත් ඇගේ මිනිය තම පුරාතනයන් ගේ චාරිත්‍රයට අනුව ඒ සේ "වළලන" බවත් ඔහු පවසති. ඔවුන් සියල්ලන් අතුරින් පළමු ව විරාට රජු වෙත යන යුධිෂ්ඨිර තමා අතිදක්ෂ දූතඋත්තමයකු ලෙස හඳුන්වා දී රජු ගේ සහායකයා හා පුරෝහිතයා ද බවට පත් වෙයි. ඉන් පසු සෙස්සෝ ද පිළිවෙලින් පැමිණෙති. භීම තෙමේ අරක්කැමි තනතුර ලබයි. බෘහන්නලා නමැති ස්ත්‍රී නාමයෙන් පෙනී සිටින අර්ජුන නපුංසකයකු සේ පෙනී සිට රජු ගේ දූ කුමරිය වූ උත්තරාව ගේ නාට්‍යාචාර්යවරයා බවට පත් වෙයි. අසුන් හීලෑ කරන්නකු ලෙස නකුලන් ගවපාලකයකු ලෙස සහදේවත් සේවයෙහි යෙදෙන අතර ද්‍රෞපදිය බිසව ගේ පරිචාරිකාවක බවට පත් වෙයි.

නොබෝ කලෙකින් ම පාණ්ඩවයෝ විරාට රජු ගේ මාළිගයෙහි මහත් ජනප්‍රියත්වයට පත් වෙති. විශේෂයෙන් ම, භීම තෙමේ බ්‍රහ්ම දෙවියාට උපහාර පිණිස පැවැත්වුණු මල්ලව තරඟයෙක දී ලෝක ප්‍රසිද්ධ මල්ලවයකු වූ ජීමූත පරදවා මරණයට පත් කිරීමෙන් විශිෂ්ට ගෞරවයකට පාත්‍ර වෙයි.

අනෙක් අතට, ද්‍රෞපදිය අවාසනාවන්ත ඉරණමකට ගොදුරු වූවා ය. රජු ගේ මස්සිනා වූත් මහා සේනාපති වූත් කීචක රුමත් පරිචාරිකාව දැක ඇය කෙරෙහි පිළිබඳ සිත් ඇති වෙයි. රජු ගේ මෙහෙසිය විසින් ඇය තම සේවය සඳහා පත් කැරගනු ලැබූ අවස්ථාවෙහි තමා ගන්ධර්වයන් පස් දෙනකුන් ගේ බිරිය බවත් ආපදාපන්න අවස්ථාවෙක දී ඔවුන් පැමිණ තමා රැකගන්නා බවත් ද්‍රෞපදිය හෙළි කළා ය. නියම කොටගත් ස්ථානයට පැමිණෙන බවට සෛනෙවියාට පොරොන්දු වූ ද්‍රෞපදිය තමා වසඟයට පත් ඔහු රෑ ගනදුරෙහි නෘත්‍ය ශාලාවට පමුණුවයි. ඔහු සඳහා එහි රැක සිටින භීම තෙමේ ඔහු හා බලවත් පොරයක යෙදී ඔහු ගෙල මිරිකා මරා දමයි. ඉක්බිති ද්‍රෞපදිය ආරක්ෂක පුරුෂයන් කැඳවා ඇගේ ගන්ධර්ව ස්වාමීන් ගෙන් එකකු පැමිණ තමා හා කාමාපරාධයෙකැ යෙදීමේ වරදට කීචක මරාදැමූ බව පවසයි. කීචක ගේ බලවත් නෑයනට සෛනෙවියා ගේ මිනිය දවන දරසැයෙහි හෙළා පරිචාරිකාව ද පුළුස්සා දැමීමට අවශ්‍ය වෙයි. එහෙත් භීම තෙමේ ඇගේ පිහිට පිණිස ගන්ධර්වයකු ගේ වේශයෙන් එතැනට පැමිණ සූතයන් 105 දෙනකුන් (කීචක ද සූතයෙකි) මරා ද්‍රෞපදිය මුදාගනී. ඉක්බිති නුවර වැසියෝ තැම ගන්ධර්වයන් නිසා බිහිසුණු ස්ත්‍රියක බවට පත් ව ඇති පරිචාරක ස්ත්‍රිය ධුරයෙන් පහ කොට ලන ලෙස රජුට කියා සිටිති. රජ ඒ අනුව පරිචාරිකාව පහ කිරීමට අණ දෙයි. එසේ වුව ද, ද්‍රෞපදිය මෙහෙසිය අයදිමින් දහතුන් දිනකට පසු ගන්ධර්වයන් පැමිණ ඇය ගෙන යන බැවින් එ තෙක් ඇයට එහි රැඳී සිටීමට ඉඩ දෙන සේ ඇගෙන් ඉල්ලයි (දහතුන් වසර ගෙවීමට තව ඇත්තේ දහතුන් දිනක් පමණක් හෙයිනි.)

පාණ්ඩවයන් ගේ වාස—දේස තොරතුරු දැනගැනීම පිණිස දුර්යෝධන විසින් චරපුරුෂයන් යවනු ලැබීම නිරර්ථක කාර්යයක් බවට පත් වෙයි. ඔවුන් ඔහු වෙත ගෙන එන්නේ ගන්ධර්වයන් විසින් කීචක මරණයට පත් කරනු ලැබීමේ ආරංචිය පමණකි. මත්ස්‍ය රාජ්‍යය තමා හට සතුරු රාජ්‍යයක් බැවින් මේ පුවත දුර්යෝධන ගේ ප්‍රසාදයට හේතු වෙයි. තව ද, කීවක බොහෝ අවස්ථාවන්හි ත්‍රිගර්තදේශාධිපති සුශර්මන් රජු පීඩාවට පත් කළ කෙනෙකි. ඉක්බිති ත්‍රිගර්තයෝ කෞරවයන් ද හා එක්සත් ව මත්ස්‍ය දේශය ආක්‍රමණය කිරීමට සේනා සංවිධානය කෙරෙති. පිටුවහල් ව සිටීමේ දහතුන් වන වසර ගෙවී යත් ම ත්‍රිගර්තයන් රට ආක්‍රමණය කොට විරාට රජු ගේ ගවයන් සොරාගෙන ගිය බව පිළිබඳ පුවත සැළ වෙයි. විරාට රජ ද යුදට සැරසෙමින් යුධිෂ්ඨිර, භීම, නකුල සහ සහදේව හට ද යුද අවි සපයා ත්‍රිගර්තයනට විරුද්ධ ව රණබිම බලා ගමන් කරයි. බලවත් සටනක් ඇවිලේ. විරාට රජු සිරබාරයට ගනු ලැබෙතුදු සැණෙකින් ම භීම විසින් මුදා ගනු ලැබෙයි. අන්තිමේ දී පාණ්ඩවයන් ගෙන් ලද සහාය හේතු කොට ත්‍රිගර්තයෝ පරාජයට පැමිණෙති. එහෙත් පාණ්ඩවයෝ අප්‍රසිද්ධ ව ම පසු වෙති.

විරාට රජු ත්‍රිගර්තයන් හා සටනට වැද සිටිද්දී කෞරවයෝ මත්ස්‍ය දේශය තවත් තැනෙකින් ආක්‍රමණය කොට ගවයන් රාශියක් පැහැර ගනිති. ගෞපල්ලෝ නගරයෙහි රැඳී සිටි උත්තර කුමරු වෙත අවුත් කෞරවයනට විරුද්ධ ව සටනට යන ලෙස ඉල්ලති. එහෙත් ඔහුට යැමට යුද රියක් නැත. ඉක්බිති ද්‍රෞපදී තොමෝ කුමරිය යොදවා අර්ජුන ඔහු ගේ සූතයා (රියදුරා) ලෙස පත් කොට ගැනීමට කටයුතු සලස්වයි. අර්ජුනට සන්නාහයක් ලැබේ. ඔහු දෙ දෙන සටනට නික්ම යෙති. කෞරවයන් ගේ මහත් සේනා බලකායය දකින්ම උත්තර භීතියෙන් ඇළලී ගොස් රියෙන් ඉවතට පැන පලායැමට සැරසෙයි. එහෙත් අර්ජුන ඔහු අල්ලා කෙස්සෙන් ඇදගෙන ආපසු යුදරියට ම ගෙනවුත් ඔහුට ධෛර්ය උපදවාගන්නා ලෙස ඔවා දෙයි. ඉක්බිති ඔහු තමන් ගේ ආයුධ සඟවා තැබූ ගස කරා යෙති. අර්ජුන ගොස් ආයුධ රැගෙන එයි. ඉක්බිති ඔහු උත්තර හට තමා බලසම්පන්න අර්ජුන නමැති වීරයා බව පවසන්ම උත්තර යළිත් දිරිමත් වෙයි. උත්තර දැන් අර්ජුන ගේ සූතයා බවට පත් වෙයි. මහා බලවත් යුද්ධයක් මෙහි දී ඇති වේ. අර්ජුන තෙමේ දුර්යෝධන, කර්ණ, භීෂ්ම සහ කෞරව වංශයේ අවශේෂ වීරයන් හා යුද වදි. සටනින් ඔහුට අත් වනුයේ විශිෂ්ට කීර්තියෙකි. තමනට විරුද්ධ ව සටන් කරන්නේ අර්ජුන දැයි කෞරවයන් තුළ සැකයක් ඇති වුව ද ඔහු හැඳින නො ගනිති.

ජයග්‍රහණය ලද පසු අර්ජුන තම ආයුධ යළිත් ගස කරා පමුණුවා බෘහන්නලා නමැති නාට්‍යාචාර්යවරයා ගේ හා උත්තර ගේ රියැදුරු ගේ ද වේශයෙන් නගරයෙන් ආපසු පැමිණෙයි. එ සේ එද්දි තමා කවරෙක් දැයි හෙළි නොකරන ලෙස හෝ උත්තර නිවිස්වාගනී. මේ අතරතුර විරාට හා පාණ්ඩවයෝ ද ත්‍රිගර්තයන් පරදවා පෙරළා පැමිණෙති. තම පුතු කෞරවයනට විරුද්ධ ව සටනට ගිය හෙයින් රජ මහත් නොඉවසිල්ලෙන් පසු වෙයි. එහෙත් ඔහු ගේ ජයග්‍රහණය පිළිබඳ පුවත රජුට වහා සැළ වෙයි. උත්තර කුමරා පිළිගැනෙනුයේ විජයශ්‍රීයෙනි. කෞරවයන් පරාජය කළේ තෑමා නොවන බවත් ඒ සඳහා රූපශෝභාසම්පන්න තරුණයකු ගේ වේශයෙන් පෙනී සිටි දෙවියකු තමාට සහාය වූ බවත් උත්තර පවසයි. තුන් දිනකට පසු දහතුන් වන වසර නිමාවට පැමිණෙයි. රජු ගේ මහත් පුදුමයට මෙන් පඤ්ච පාණ්ඩවයෝ රාජ සභා ශාලාවෙහි ඔවුන් ගේ සැබෑ වේශයෙන් පෙනී සිට තුමූ කවුරු දැයි හෙළි කරති. විරාට රජ අතිශයින් ප්‍රීතියට පැමිණ වහා ම තම දූ කුමරිය පත්තිය සේ පාවා ගන්නා ලෙස අර්ජුනට පවරයි. එහෙත් අර්ජුන ඇය පිළිගනුයේ තෑමා සඳහා නොව තම පුත් අභිමන්‍යු කුමරා සඳහා ය. ඇය තමා ගේ ලේලිය කොට ගන්නා හෙතෙමේ ඇය සමඟ තමා අවුරුද්දක් පුරා ඉතා ළඟින් ඇසුරු කළ ද ඇය තම කුමරි සීලය රැකගෙන සිටි බව සහතික කොට පවසයි. අභිමන්‍යු කුමරා ගේ හා උත්තරා කුමරිය ගේ පාණිග්‍රහණෝත්සවය වහා මහත් ශ්‍රී විභූතියෙන් පැවැත්වේ. උත්සවය සඳහා පැමිණෙන නොයෙක් රජවරුන් අතරෙහි ඉතා අගනා පඹුරු ගෙන ද්‍රුපද හා කෘෂ්ණ ද පෙනී සිටිති.

සාම සාකච්ඡා සහ යුද්ධයට සැරසීම[35]

මේ පාණිග්‍රහණෝත්සවයෙහි දී පාණ්ඩවයෝත් ඔවුන් ගේ මිතුරෝත් එක් ව කෞරවයන් පිළිබඳ ව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය කුමක් දැයි කතිකා කරති. පාණ්ඩවයන් සතු ඔවුන් ගේ අර්ධ රාජ්‍යය ඔවුනට ආපසු පවරා දෙන ලෙස ඉල්ලා දුර්යෝධන වෙත දූතයකු යැවිය යුතු යැයි කෘෂ්ණ යෝජනා කරයි. දීර්ඝ සාකච්ඡාවෙකින් පසු ද්‍රුපද රජු ගේ මහලු පුරෝහිතයා දූතයකු ලෙස කෞරවයන් වෙතට යැවීමට තීරණය වෙයි.

එහෙත් අන්‍යෝන්‍ය සාකච්ඡා ඇරඹීමටත් පවා කලින් පාණ්ඩවයෝත් කෞරවයෝත් තම තමන් ගේ පසට හැකි තරම් දුරට මිතුරන් බඳවා ගැනීමට මං සොයති. බලසම්පන්න රජවරුන් කිහිපදෙනෙකුත් තම තමන් ගේ පසට බඳවා ගැනීමට දෙපස ම එක් වී තැත් කරති. මෙ සේ දුර්යෝධන තෙමේ මෙ තෙක් පාණ්ඩවයන් ගේ ඉතා කුලුපග මිතුරකු ව සිටි කෘෂ්ණ තමා ගේ පක්ෂයට බඳවා ගැනීමට බලයි. එහෙත් දෙවයට අනුව

දුර්යෝධන එහි පැමිණෙනුයේ කෘෂ්ණ නිදා සිටිද්දී ය. ඔහුට අනතුරු ව අර්ජුන එහි පැමිණේ. කෘෂ්ණ නින්දෙන් පිබිදී කෙණෙහි ම ඔහු ඇස ගැසෙනුයේ අර්ජුන ගේ දර්ශනයයි. මේ සේ දුර්යෝධන පළමුවෙන් පැමිණි හෙයිනුත් අර්ජුන පළමුවෙන් ම තමා විසින් දක්නා ලද හෙයිනුත් ආධාර දීම ප්‍රතික්ෂේප කරමින් කිසිවකුටත් පිළිතුරක් නො දිය යුතු යැයි කෘෂ්ණ සිතයි. එ හෙයින් ඉන් එක් තැනැත්තකුට උපදෙස් දීමටත් අනෙක් තැනැත්තාට ගොපල්ලන් ගෙන් සැදි හමුදාවක් දීමටත් කැමැති බව පවසයි. දුර්යෝධන දෙ වැන්න තෝරා ගැනීමට කැමැති වන අතර අර්ජුන පළමු වැන්න තෝරා ගැනීමට කැමැති වෙයි. කරුණු මෙ සේ හෙයින් යුද්ධයට තමා සැබැවින් ම සහභාගි නොවන බවත්, එහෙත් පාණ්ඩවයන් ගේ උපදේශකයා ව අර්ජුන ගේ රියදුරා (සූත) ලෙස තමා කටයුතු කරන බවත් පවසයි. මද්‍ර දේශාධිපති ශල්‍ය රජ ද ක්ෂත්‍රිය යන් සමූහයක් පිරිවරාගෙන යුධිෂ්ඨිර ගේ පාර්ශ්වයට බැඳෙන ලෙස ආරාධිත වෙයි. ශල්‍ය ඔහු ගේ ඉල්ලීමට එකඟ වී යුධිෂ්ඨිර වෙතට ද යයි. සෙසු හැම අවස්ථාවල දී ම ධර්මයේ ප්‍රතිබිම්බයක් ලෙස පෙනී සිටි යුධිෂ්ඨිර ශල්‍ය සමඟ නින්දනීය කුමන්ත්‍රණයට බැඳීමට කැමැත්ත පළ කරයි. ශල්‍ය, කෞරවයන් ගේ පක්ෂයට බැඳී සටන් කිරීමටත් කර්ණ ගේ රියැදුරා ලෙස බැඳී නරකට ඔහු ගේ රිය පැදවීමටත් එ සේ කොට ඉන් පසු ඔහුත් අර්ජුනත් අතර සටනක් සිදු වුව හොත් එ මඟින් කර්ණ ගේ විනාශය සිදු කළ යුතු බවත් ඒ කුමන්ත්‍රණයයි.

මෙ සේ දෙ පක්ෂය ම යුද්ධය ගැන සිතමින් පසු වද්දී ද්‍රුපද ගේ සම්මානනීය පුරෝහිතයා දූතයකු ලෙස ධෘතරාෂ්ට්‍ර රජු ගේ රාජභවනයට පැමිණ පාණ්ඩවයන් ගේ සාම කොන්දේසි රජුට ඉදිරිපත් කරයි. රජු ඔහු ඉතා ආදරයෙන් පිළිගන්නා නමුත් ස්ථිර උත්තරයක් නො දී, තමා ගේ සූතයා වූ සඤ්ජය යුධිෂ්ඨිර වෙත යවන නමුත් ඔහු ගේ සන්දේශයෙහි ඇතුළත් වනුයේ හුදෙක් ධෘතරාෂ්ට්‍ර සාමය පතන බව මිස පාණ්ඩවයනට කිසිත් දෙන බව නො වේ. එ හෙයින් යුධිෂ්ඨිර දූතයා ආපසු එවමින් තමාට ඉන්ද්‍රප්‍රස්ථය ඇතුළු අර්ධ රාජ්‍යය ලැබිය යුතු ය නොහොත් යුද්ධය ආරම්භ වෙතැ'යි කියා සිටියි. ඥාතීන් අතරෙහි ලේ වැගිරීමක් ඇති වීම වළක්වනු පිණිස දුර්යෝධන ගම් පහක් ඔවුනට පවරා දුන හොත් එ පමණෙකින් පවා සාමයකට එකඟ වීමට තමා කැමැති බව යුධිෂ්ඨිර පවසයි. දැන් කෞරවයෝ සඤ්ජය ගෙනෙන මේ පිළිතුර ගැන සාකච්ඡා කරති. ඒ ඉල්ලීමට එකඟ වී සාමය ඇති කොට ගන්නා ලෙස භීෂ්ම, ද්‍රෝණ සහ විදුර එක් ව දුර්යෝධන කැමැති කැරැවීමට ගන්නා ප්‍රයත්නය නිෂ්ඵල වෙයි. තමා සම්පූර්ණයෙන් දුර්වල බවත් බලරහිත බවත් ධෘතරාෂ්ට්‍ර ම පවසත් ම මේ සාකච්ඡාව කිසි දු ප්‍රතිඵලයක් නො ලබා අතරමඟ නතර වෙයි.

පාණ්ඩවයෝ ද සාමය සඳහා යළිත් විවාද කරති. තව වරක් උත්සාහ කොට බලනු පිණිස සාමයේ දූතයකු මෙන් කෞරවයන් වෙතට තමා ම යැමට කෘෂ්ණ කැමැති වෙයි. පාණ්ඩවයෝ මේ යෝජනාවට කෘතඥපූර්වක ව එකඟ වෙති. අක්ෂමසම්පන්න වූ භීම පවා සාමය ඇතිකැරගැනීමට පක්ෂ ව කථා කරයි. ඔහු ගේ මෘදු ගුණය කන්දක් සෑහැල්ලු වූවාක් මෙන් සහ ගින්න සිසිල් වූවාක් වැනි පුදුම උපදවන්නක් හෙයින් කෘෂ්ණ තෙමේ ම ඒ ගැන පුදුමයට පත් වෙයි. අනෙක් අතට වීරයන් ගෙන් සමහරෙකුත්, විශේෂයෙන් ම වීර පත්නිය වූ ද්‍රෞපදියත් කෙ බදු නමුත් සාම සාකච්ඡාවක් පැවැත්වීම නො ඉවසති. ඔහු වහා ම යුදවැදීම කළ යුතු යැයි කියා සිටිති. එහෙත් සාම සන්දේශයක් යැවිය යුතු යැයි යුධිෂ්ඨිර තරයේ කියා සිටියි. ඔහු තම මවු බිසව වූ කුන්තිය මුදු බසින් සිඟි පත් කොට කෞරවයන් ගේ රාජ භවනයෙහි විදුර හා වෙසෙන ඇය බැලීමට යන ලෙසත් ඇගේ සුව දුක් විමසන 'ලෙසත් කෘෂ්ණ ගෙන් ඉල්ලයි.

අතරමඟ සුබ පැතුම් ලබමින් කෘෂ්ණ කෞරවයන් වෙතට යෙයි. හෙතෙමේ ධෘතරාෂ්ට්‍ර විසින් මහත් ශ්‍රී විභූතියෙන් පිළිගනු ලැබේ. එහෙත් ඔහු ලබන්නේ විදුර ගේ ආගන්තුක සත්කාර පමණකි. හේ කුන්තිය හමු වන්නට වහා ගොස් යුධිෂ්ඨිර ගේ ශුභාශිර්වාද සන්දේශය ඇයට ඉදිරිපත් කරයි. වීර මාතාව කවුක බසින් සිය පුත්

ශ්‍රීකෝශය ගැන සඳහන් කරමින් පැහැදෙන්නට වෙයි. එහෙත් ඇය විසින් ම භේදකාරිව පත් ව ඇත්තේ ද්‍රෞපදියට කරන ලද නිග්‍රහය පිළිබඳ ව ය. එ හෙයින් ඕ යුධිෂ්ඨිර ගේ දුර්වලත්වය ගැන ඔහුට දොස් කියයි. ක්ෂත්‍රියයෙක් ලෙස තමා ගේ ශුතුකම් අමතක නො කළ යුතු බව තරයේ බිහි තබාගන්නා ලෙසත් තම ජීවිත පරිත්‍යාගය කිරීමට නො පැකිලිය යුතු බවත් තම පුතුනට දන්වන ලෙස ඕ කෘෂ්ණ ගෙන් ඉල්ලයි.

"ක්ෂත්‍රියයකු ගේ පත්නියක දරුවන් ලොවට බිහි කරන්නේ කවර පරමාර්ථයක් සඳහා ද එය ඉටු කිරීමේ අවස්ථාව දැන් පැමිණ ඇතැ" යි ඕ පවසයි. පසු දා උදාසන උතුම් වස්ත්‍රාභරණයෙන් සැරසුණු කෘෂ්ණ තෙමේ කෞරව රාජ සභාවට ගොස් සාමය පිළිබඳ ව කථාවක් පවත්වයි. තැම ගේ නම් එක ම බලාපොරොත්තුව සාමය ම බවත්, එහෙත් බලයෙන් තොර වූ තමාට තම පුත්‍රයාට විරුද්ධ ව කිසිවක් කළ නොහැකි බවත් ධෘතරාෂ්ට්‍ර පවසයි. ඉක්බිති කෘෂ්ණ දුර්යෝධන දෙසට හැරී සාමය පිළිබඳ ව ඔහුට ඔවා දෙයි. භීෂ්ම, ද්‍රෝණ, සහ විදුර ද තමතමාට හැකි පමණින් දුර්යෝධන ලවා සාම කොන්දේසි පිළිගන්වාලීමට තැත් ගනිති. එහෙත් තමා පාණ්ඩවයනට ඉදිකටු තුඩෙක තරම් වත් බිමක් පවරා නොදෙන බව දුර්යෝධන ප්‍රකාශ කරයි. ඔහු කෝපාවිෂ්ට ව සභා ශාලාවෙන් නික්ම ගිය පසු කෘෂ්ණ සහාම අමතා කෞරවයන් අතරෙහි හොඳ සිහි බුද්ධිය ඇත්තන් එකතු ව දුර්යෝධන සහ ඔහු ගේ සගයන් පාණ්ඩවයනට සිරකරුවන් ලෙස පාවා දිය යුතු යැයි යෝජනා කරයි. එහෙත් ධෘතරාෂ්ට්‍ර එයට එකඟ නො වී තම දේවිය වූ ගාන්ධාරිය කැඳවා ඇගේ මුරණ්ඩු පුත්‍රයා සමාදානය සඳහා කැමති කරවා ගන්නා ලෙස කියයි. ගාන්ධාරිය පැමිණ තම පුත්‍රයා ගේ වාසිය පිණිස සිංහාසනය හැර දැමීම පිළිබඳ වැඩි මහල්ලු රජුට ඉතා කටුක ලෙස දෝෂාරෝපණය කරයි. ඉන් පසු ව, ඇය දුර්යෝධනට කරන අවවාද සෙස්සන් ගේ සේ ම නිෂ්ඵලත්වයට පැමිණෙයි. ඒ වෙනුවට දුර්යෝධනත් ඔහු ගේ සගයෝත් එකතු ව බලසම්පන්න සතුරකු පිටුදැකීමේ අදහසින් කෘෂ්ණ සිරභාරයට ගැනීමට උපායයක් යොදති. එහෙත් මේ උපායය පිළිබඳ රහස අනාවරණය වෙයි. දූත ධර්මය උල්ලංඝණය කිරීමට මෙබඳු උපායයක් යෙදීම පිළිබඳ ව දුර්යෝධන තෙමේ ධෘතරාෂ්ට්‍ර ගේ හා විදුර ගේ ද බලවත් දෝෂාරෝපණයට ලක් වෙයි. සමාදානය සඳහා භීෂ්ම හා ද්‍රෝණ ද කරන සාකච්ඡාවක් ද නිෂ්ඵලත්වයට පැමිණි පසු කෘෂ්ණ ගේ මේ සාම දූත කාර්යය ද නිරර්ථකත්වයට පත් වෙයි.

කෘෂ්ණ නික්ම යෑමට පෙර කර්ණ සමඟ රහස් සාකච්ඡාවෙක යෙදෙයි. මේ නිර්භීත වීරයා සූතයකු ගේ (රියැදුරකු ගේ) පුත්‍රයකු ලෙස සාමාන්‍යයෙන් සැලැකේ. එහෙත් සත්‍ය වශයෙන් ම කුන්තිය කන්‍යාවක ව සිටිය දී සූර්ය දේවයාට දා ව, ඉතා අද්භූත කාරයෙකින් උපන්නකු බවත්, එ හෙයින් කුන්තිය ගේ කන්‍යාභාවයට උපද්‍රවයක් නුවූ බවත් සාමාන්‍යයෙන් සැලැකෙන බව ජනප්‍රවාදයයි. එහෙත් කෘෂ්ණ උපන් පසු මහත් ලජ්ජාවට පත් ඕ තොමෝ දිය කාන්දු නොවන කුඩා පැහැකැ බිළිදා බහා ගඟට දැමුවා ය. සූතයකුට මේ බිළිදා හමු වූයෙන් හේ ඔහු තම පුත්‍රයා ලෙස හදා වඩා ගත්තේ ය. කරුණු මෙ සේ හෙයින් කර්ණ තෙමේ සැබැවින් ම පාණ්ඩවනයට වැඩි මහල්ල සොහොවුරෙකි. මේ කරුණ කර්ණ හට සිහි පත් කරවන කෘෂ්ණ තෙමේ සිහසුන අල්ලා ගෙන රජ වී තම කනිටු සොහොවුරු යුධිෂ්ඨිර යුවරජ පදවියට පත් කැර ගත්නා ලෙස කර්ණ ගෙන් ඉල්ලයි. පාණ්ඩවයනුදු මෙයට එකඟ වන බව ද දන්වයි. එහෙත් තම මිත්‍රයා වූ දුර්යෝධන කෙරෙහි ක්‍රියාත්මක කරන ඒ බඳු දුෂ්ට උපායකට කන් දීමට කර්ණ කැමැති නො වෙයි. පාණ්ඩවයන් ගේ පක්ෂයට යන ලෙස කුන්තිය ද සූර්ය ගේ සහායය ඇති ව ඔහු කැමති කරවා ගැනීමට යත්න දරතත් කර්ණ ඇයට පිළිතුරු දෙනුයේ කටුක බසිනි. තමාට කිසි කලෙකත් යහපත් මවක ලෙස ඇය ක්‍රියා නොකළ බවත් දැන් ඔහුට ඇගේ පුත්‍රයා වීමට උවමනාවක් නැති බවත් කර්ණ පවසයි.

අසාර්ථක වූ දූතකාර්ය ඇති කෘෂ්ණ තෙමේ පාණ්ඩවයන් වෙත පෙරළා ගොස් සාමය තහවුරු කිරීමට තමා දරු උත්සාහය නිෂ්ඵල වූ ආකාරය පිළිබඳ තොරතුරු සැළ කරයි. තමා සිරකරුවකු ලෙස ගැනීමට පවා ප්‍රයත්නයක් දරුණු බව කෘෂ්ණ සැළ කළ කල්හි ප්‍රචණ්ඩ රණඝෝෂ එහි නැගෙයි. දැන් දෙ පක්ෂය ම යුද්ධය සඳහා ක්‍රියාකාරීව ම

සූදානම් වෙති. පාණ්ඩවයෝ ද්‍රුපද රජුගේ පුත්‍ර වූ **දෘෂ්ටද්‍යුම්න** ස්වකීය සේනාපති පදවියට පත් කොට ගනිති. කෞරවයෝ භීෂ්ම ඔවුන් ගේ සේනාපති කෙරෙති. යුද්ධය සඳහා ගැනෙන හට හමුදා තෝරාගෙන සකස් කොට ගනු ලැබෙති. භීෂ්ම තෙමේ රථ යෝධයන් ලෙස සටන් කරන වීරයන් ඔවුනොවුන් ගේ තරාතිරම අනුව තෝරාගෙන දුර්යෝධන හට සැලකරයි. හෙතෙමේ කර්ණ සෙසු සියලු වීරයනට වඩා පහත් ස්ථානයක තබා ඔහුට බලවත් අපහාසයක් කරයි. භීෂ්ම රණ බිමෙහි දී පරාජය වන තෙක් සටනට සහභාගි නොවන බවට කර්ණ දිවුරයි. ඉක්බිති භීෂ්ම, පාණ්ඩවයන් ගේ ප්‍රධාන වීරයන් ගේ නාමමාලාව ඉදිරිපත් කොට **ශිඛණ්ඩින්** හැර ඔවුන් සියලු දෙන ම සමඟ යුද කිරීමට තමා කැමති බව දන්වයි. ශිඛණ්ඩින් මෙ ලොවට පහළ වූයේ ද්‍රුපද ගේ දුහිතෘව වූ කන්‍යාවක ලෙසිනි. පසු කලෙක යක්ෂයකු ඇය සමඟ සංවාසය පැවැත්වූ පසු ඕ නොමෝ පුරුෂයකු බවට පත් වූවා ය. මේ ක්ෂත්‍රියයා තවමත් ස්ත්‍රියක ලෙස සලකන භීෂ්ම තමා ගැහැනියක සමඟ සටන් නොකරන බව පවසයි.

යුද්ධය සඳහා වූ සියලු කළමනා සම්පූර්ණ වූ පසු කෞරවයෝ ධෘතරාෂ්ට්‍රයකු ගේ පුතකු වූ **උලූක** පාණ්ඩවයන් වෙත යවා නිග්‍රහාත්මක භාෂණයේ මාර්ගයෙන් ඔවුන් හා යුද්ධ ප්‍රකාශ කෙරෙති. පාණ්ඩවයන් ඔහු පෙරළා එවනුයේ ඒ බදු ම නිග්‍රහාත්මක භාෂණයන් සහ සාවඥෝක්තීන් තෙපලීමෙනි. ඉක්බිති උභය සේනාව ම **කුරුක්ෂේත්‍රය** බලා ගමන් ගනිති.

අවලෝස් දින මහ හවන

උභය සේනාව ම මහා කුරුක්ෂේත්‍රයෙහි දෙ පසට වී තම තමන් ගේ මිත්‍ර සේනාවන් සමඟ සංවිහිත ව සිටිති. සතුරා ගෙන් මිතුරා වෙන් කොට දැනගැනීමට උදවු වන රහස් වචන සහ සලකුණු තීරණය කරනු ලැබේ. ඉක්බිති යුද්ධ කරන දෙ පක්ෂය අතරෙහි කිසි යම් ප්‍රතිඥා කිහිපයක් ගිවිසගනු ලැබේ. සම ජාති හා සම ආයුධ දරන්නන් පමණක් ඔවුනොවුන් හා සටන් කළ යුතු ය. රථාරෝහකයන් සටන් කළ යුත්තේ රථාරෝහකයන් සමඟ පමණකි. හස්ත්‍යාරෝහක යෝධයන් සටන් කළ යුත්තේ හස්ත්‍යාරෝහක යෝධයන් සමඟ පමණකි. අශ්වාරෝහකයන් අශ්වාරෝහකයන් සමඟත් පදාති භටයන් පදාති භටයන් සමඟත් සටන් කළ යුතු ය. පළමුවෙන් තැමා ගේ ප්‍රතිමල්ලවයා සටනට නො කැඳවා කිසිවකුත් ඔහු හා සටන් නො කළ යුතු ය. යටත් වූවනුත් නොහොත් තුවාල ලද්දවුනුත් අනාථයනුත් නො මැරිය යුතු ය. ප්‍රවාහකයනුත් බඹු අදින සතුනුත් ආයුධ ප්‍රවාහකයනුත් වාදකයනුත් නො මැරිය යුතු ය.

සටන ඇරඹෙන්නට පළමු ව්‍යාස ඍෂිවරයා පෙනී සිට ධෘතරාෂ්ට්‍ර රජු ගේ සූතයා වූ **සඤ්ජය** හට සටන් බිමෙහි සිදු වන සියල්ලක් ම දැකගැනීමට හැකි වීමේ වරප්‍රසාදය පිරිනමයි. තව ද, දිනපතා මහලු, අද රජුට තොරතුරු දැන්වීමට හැකි වනු පිණිස ඔහු ක්ෂනාක්ෂමත්වයට ද හෙතෙමේ පත් කරවයි. මින් පසු ව කෞරෙන යුද්ධ විස්තරය කියැවෙනුයේ එය ඇසින් දුටුවකු වූ සඤ්ජය ලවා ය. එ හෙයින් එ කී තොරතුරුවල අතිශයින් තාත්වික වූ විවිධත්වයක් ගැබ් ව ඇත.[23]

කෞරවයන් ගේත් පාණ්ඩවයන් ගේත් ශ්‍රේෂ්ඨ සුළුපියාණන් වූ සම්මානනීය **භීෂ්ම** තෙමේ මුල් දස දින තුළ යුද බිමේ කෞරව සේනාවනට අණ දීමේ කාර්යය ඉටු කරයි. ඉතා වේගවත් කථාවෙකින් නිර්ඝීත ව සටන් කරන ලෙස හෙතෙමේ තම භටයනට උපදෙස් දෙයි. 'ස්වර්ගයේ මහා පුරද්වාරය තොප සඳහා විවෘත ව ඇත. එම්බා භටයෙනි, මේ දොරටුව ඔස්සේ ඉන්ද්‍රයා ගේත් බ්‍රහ්මයා ගේත් ලෝකයට පිවිසෙවු! රෝග සෙකින් පෙළී සිය නිවසෙහි දී මිය යෑම ක්ෂත්‍රියයකුට තරම් නො වේ. ක්ෂත්‍රියයා ගේ සනාතන ධර්මය වූ කලි සටනෙහි දී දේහත්‍යාගය කිරීමට පැනිමයි[24]" මෙ සේ ධෛර්ය සම්පන්න වන ඔහු දිලිසී බැබළෙන සන්නාහයෙන් හා ආයුධයන් ගෙන් සුතු ව සූර පිණිස යෙති. උභය සේනාවේ ඔවුනොවුනට මුහුණ ලා සිටිති.

හෙන හඬ බඳු ව නැගෙන යුද්ධ ශෝෂයෙන් හා ඔහ ගහින් ගැගෙන ශුද්ධ වාදන ඝෙන් ද සටන ඇරඹීමේ සංඥාව දනු ලැබේ. දුන් කෞරව්‍යයෝත් පාණ්ඩවයෝත් ඔබු නොවුන් ගේ නාකම් ගැන තැකීමක් නො කොට නිගිසුණු සටනෙක යෙදෙති. පියා සූතා නො හඳුනයි. සොහොවුරා සොහොවුරා නො හඳුනයි. මාමා සිය භාගිනේයා ගේ සූතා නො හඳුනයි. සහළුවා සහළුවා නො හඳුනයි. හස්තීහු හයංකර විනාශයක් පමුණුවති. ඉන් ඇති වූ යුද්ධයේ දරුණු මනුෂ්‍ය සංහාරයෙකි. විටෙක ජය කෞරව්‍යයනට ලැබේ. තවත් විටෙක එය පාණ්ඩවයනට ලැබේ. එහෙත් රාත්‍රිය එලඹෙත් ම සියලු ප්‍රතිවාදීහු සටන් නවත්වති. පසු දා උදැසනැ නව සංවිධානයෙකින් යළිත් හමුදාවෝ පෙළ ගැසෙති. සටන යළිත් ඇරඹේ. භීෂ්ම සහ අර්ජුන පුනපුනා තරගයෙහි යෙදෙති. ඔහු දෙ දෙන කෝ තරම් නිර්භීත ලෙස සටන් කරත් ද යත් දෙවියෝත් යක්ෂයෝත් ඔවුන් ගේ සටන දෙස විස්මයෙන් බලා සිටිති. එහෙත් හැම අවශ්‍යථාවෙක ම කෞරවයනට පැමිණෙනුයේ අභාග්‍යයයි. පාණ්ඩවයනට විරුද්ධ ව සටන් කිරීමෙහි දී ඔවුන් කෙරෙහි සැලකිලිමත් වීම ගැන දුර්යෝධන භීෂ්ම හට දෝෂාරෝපණය කරයි. පාණ්ඩවයනට අවාසි පැමිණෙන විට කෙළින් ම භීෂ්ම හට නොවිදීම ගැන කෘෂ්ණ අර්ජුනට දොස් නගයි. දුර්යෝධන ගේ සොහොවුරෝ බොහෝ දෙනෙක් ම යුද්ධයෙන් විනාශයට පැමිණෙති. ඉක්බිති දුර්යෝධන පාණ්ඩවයන් කෙරෙහි උවමනා පමණට වඩා දයාව දැක්වීම ගැන භීෂ්ම හට නැවතත් ඒදාස් නගයි. ඔහු සතුරා පරාජය කළ යුතු ය. නොහොත් කර්ණ සේනාපති පදවියට පත් කරනු ලැබේ. වේදනාවෙන් හා ක්ෝපයෙන් ද හරිත වූ භීෂ්ම තෙමේ පසු දා උදැසන ශිඛණ්ඩින් හැර සෙසු සියල්ලන් ම සමඟ දයාවිරහිත ව සටන් කරන බවට පොරොන්දු වෙයි. ශිඛණ්ඩින් වරෙක ස්ත්‍රියක ව සිටි තැනැත්තෙකි. "එම්බා ගාන්ධාරී පුත්‍රය, සුව සේ සැතැපෙනු. මම හෙට දින ලොව පවත්නා තෙක් දනන් තුඩගැ පවත්නා විශිෂ්ට ජයග්‍රහණයක් අත් කොට ගන්නෙමි". (6, 99, 23) හේ මෙ සේ කියයි. සැබැවින් ම පාණ්ඩවයෝ යුද්ධයේ නව වන දිනයෙහි බලවත් පරාජයක් ලබති. භීෂ්ම තෙමේ සතුරු සමූදාව අතරෙහි යම රජු මෙන් ක්‍රියා කරයි. එහෙත් භීෂ්ම කෙරෙහි තමා ගේ "මුත්තණුවන්[30]" ලෙස තවමත් ගෞරවයක් දක්වන අර්ජුන සටන් කිරීමෙහි දී ඔහු කෙරෙහි බොහෝ සැලකිලි දක්වයි. මෙය දක්නා කෘෂ්ණ තමා අතින් ම භීෂ්ම මැරීම පිණිස ඔහු ඉදිරිපිටට පනියි. එහෙත් ඔහු බලයෙන් නවත්වාලන අර්ජුන සටන් නොකරන බවට ඔහු දුන් ප්‍රතිඥාව ගැන සිහි පත් කරවයි. භීෂ්ම විසින් බිහිසුණු ලෙස ලුහුබඳවනු ලැබූ පාණ්ඩව භටයෝ ඇදිරි වැටෙත් ම තමන් ගේ කඳවුරට පෙරළා වදිති.

පාණ්ඩවයෝ රාත්‍රී කාලය යුද්ධ මන්ත්‍රණයක් පැවැත්වීම සඳහා යොදා ගනිති. භීෂ්ම ශිඛණ්ඩින් හට විරුද්ධ ව සටන් නොකරන බව ඔවුන් දන්නා හෙයින් පසු දින උදැසනැ ඔහු පෙරමුණෙහි තැබීමට ඔහු තීරණය කෙරෙති.[31] එහෙත් අර්ජුන ශිඛණ්ඩින් ගේ පසු පසින් මුවහ වී සිට භීෂ්ම වෙත ඊ විදිය යුතු ය. මේ දුෂ්ට උපක්‍රමයට ඔහු එකඟ වනුයේ අකැමැත්තෙනි. සෑම ළමා කාලයෙහි භීෂ්ම ගේ ඇකයෙහි හිඳිමින් ඔහුට "තාත්තා" යන්නෙන් ඇමැතීමට පුරුදු ව සිටි සැටි දුකින් හා ලජ්ජාවෙන් ද යුතු ව සිහිපත් කරයි. එහෙත්, කෘෂ්ණ ඔහුට කරුණු කියමින් භීෂ්ම පරාජය කළ හැක්කේ ඔහුට පමණක් ඔවත්, ක්ෂත්‍රියයකු ලෙස ඔහු ගේ යුතුකම ඉටු කළ හැක්කේ ද මේ බලසම්පන්න ප්‍රතිවාදියා පරාජය කළ හැක්කේත් ඔහු මැරීමෙන් පමණෙකැයි ද යන්න ඔහුට ඒත්තු ගැන්වීමෙහි සමත් වෙයි.

මෙ සේ යුද්ධයේ දස වැනි දිනය උදා වෙයි. පාණ්ඩවයෝ ශිඛණ්ඩින් පෙරමුණෙහි තබති. කෞරවයෝ භීෂ්ම පෙරමුණෙහි ඇති ව ඉදිරියට ගමන් කෙරෙති. මුළු දවස පුරා ම පාණ්ඩවයන් සහ කෞරවයන් ද අතරෙහි බිහිසුණු සටන් ඇති වනුයේ භීෂ්ම වධ ය. උභය පාර්ශ්වයෙහි ම දහස් ගණන් සෙබලෝ බිමට පතිත වෙති. අන්තිමේ දී අර්ජුන තමා පිටුපසින් මුවහ කොට ගෙන සිටින ශිඛණ්ඩින් තෙමේ භීෂ්ම සමඟ පෙරමුණට ඒමෙහි සමත් වෙයි. භීෂ්ම තෙමේ ශිඛණ්ඩීන් තමා වෙත ඊ සැර එවද්දී ඉන් වැළකීමට තැතක් නො ගෙන සිනා වමින් බලා සිටී. එහෙත් අර්ජුන ඉතා බිහිසුණු ලෙස භීෂ්ම වෙත සැර විදී. ශිඛණ්ඩින් හට මුවහ වී පිටුපසැ හිඳින අර්ජුන සම්මානනීය වීරයා වෙත එක දිට

එක ම සැර වැඩි වස්සන්නට වෙයි. ඉක්බිති භීෂ්ම තමා පසෙකින් හිඳ සටනෙහි යෙදෙන දුශ්ශාසන දෙසට හැරී "යම් දුතයන් මෙන් මගේ ප්‍රාණ ජීවය විනාශ කරමින් විෂයෙන් හරිත සර්පයන් දෂ්ට කරන්නා සේ මගේ ගාත්‍රයන් විදලන මේ ඊ ශිඛණ්ඩීන් ගේ නොවේ. ඒ විදලනු ලබන්නේ අර්ජුන[32] විසිනුයි" නැවත වරක් ඒ සියල්ල උදුරා ගන්නා භීෂ්ම ඉන් එකක් අර්ජුන වෙත විදියි. එහෙත්, ඒ ඊය අල්ලා ගන්නා අර්ජුන එය කැබලි තුනකට කඩාලයි. ඉක්බිති භීෂ්ම තමා ගේ ආරක්ෂාව පිණිස කඩුවත් පළිහත් අතට ගනී. එහෙත්, අර්ජුන භීෂ්ම ගේ පළිහ කැබලි සියයකට සුණු විසුණු කොට ලයි. ඉක්බිති යුධිෂ්ඨිර භීෂ්ම හට පහර දෙන ලෙස සිය සෙබළුනට අණ කරයි. පාණ්ඩවයෝ සියලු වටින් පැමිණ තනි ව ම සිටින රණවීරයා වට කොට ගනිති. එහෙත් භීෂ්ම ගණනක් නැති තුවාල සංඛ්‍යාවෙකින් ගලන රුධිර ධාරාවන් ගෙන් යුක්ත ව යුදරියෙන් වේගවත් ව බිම හෙනුයේ සූර්යාස්තයට මද වේලාවකට පෙර ය. ඔහු ගේ සර්වාංගය වටා කොතරම් ඊ ඇනී පවත්නේ ද යත් ඔහු බිමැ හුණු විට ඔහු ගේ ශරීරය පොළොවෙහි නොගැටී ඊ යහනෙකැ හොවී.

පාණ්ඩවයන් ගේ පිලෙන් මහත් ජයඝෝෂයෙක් නැගෙයි. එහෙත්, කෞරවයන් ගේ කඳවුරෙන් නැගෙන විලාපය සීමා රහිත ය. යුද වැද සිටින දෙ පක්ෂයේ ම ඥාතිවරයකු වූ මිය ගිය වීරයා ගේ නාමයට ගෞරව කිරීමක් වශයෙන් සාම ගිවිසුමක් ඇති කර ගැන්මට එකඟ බවක් ඇති වෙයි. මිය යන වීරයා වටා රැස් ව සිටින පාණ්ඩවයෝත් කෞරවයෝත් ශෝකයෙන් මෙන් මැ සබහුමාන ප්‍රසාදයෙන් ද හරිත ව සිටිති. රණශූරයනට ප්‍රසාදය පිරිනමන හෙතෙමේ ඔවුනට කතා කිරීමට තැත් කරයි. මිය යන්නහු ගේ හිස දුබල ලෙස පහතට එල්ලී පවතී. මොළොක් කොට්ටයෙක් ගෙන ඒ මට ඔහු ඉක්මන් වෙති. එහෙත්, මදහස පාමින් හෙතෙමේ ඔවුන් වළක්වා ලයි. ඉක්බිති අර්ජුන තම හියොවුරින් හී තුනක් ගෙන භීෂ්ම ගේ හිස ඊ මත රඳවයි.

තෘප්තියට පැමිණෙන භීෂ්ම තෙමේ තමාට උවමනා කළේ එය බවත් මිය යන වීරයකුට සුදුසු යහන එය බවත් පවසයි. මිය යන වීරයා සිත් කා වදින බසින් දුර්යෝධන හට සාමයකට එළැඹෙන සේ ඔවා දෙයි. "මාගේ පුත්‍රය, මගේ මරණයෙන් මේ යුද්ධය අවසන් වේ වා! පාණ්ඩවයන් සමඟ සමාදානයකට එළඹෙනු" යි හේ පවසයි. එහෙත් මරණාසන්න ව සිටින රෝගියකු බෙහෙත් පිළිකෙව් කරන්නා සේ දුර්යෝධන ද භීෂ්ම ගේ ඥානාන්විත උපදේශය ඉවත ලයි.

මුරණ්ඩු වූ-එහෙත් උතුම් ගති ගුණ ඇති කර්ණ තෙමේ ද උපහාර පැවැත්වීමට මිය යන වීරයා වෙත ළං වෙයි. නොපහන් නෙතින් යුතු ව මහලු වීරයා ඔහු එක් අතකින වැලඳගෙන පාණ්ඩවයන් සමඟ සමාදානයට එළැඹෙන ලෙසත්, කුන්තිය ගේ පුත්‍රයා ලෙස ඔහු ඔවුන් ගේ සොහොයුරා හෙයින් මෙය වඩා ලාභ ම කළ යුතු බවත්, කියමින් ඔහුට අවවාද කරයි. එහෙත් දුර්යෝධන හට පක්ෂපාත ව සිටිය යුතු බවත්, පාණ්ඩවයනට විරුද්ධ ව කරන සටනෙහි දී ක්ෂත්‍රියයකු ලෙස තමා ගේ යුතුකම ඉටු කළ යුතු බවත් කර්ණ ඔහුට පවසයි. තමාට එයට වෙනස් කිසිවක් කළ නොහැකි බව ද පවසයි. එයට එකඟ වන භීෂ්ම තෙමේ සාමය ඇති කිරීමට ගත් හැම ප්‍රයත්නයක් ම නිෂ්ඵල ව යෑම තමාට සැබෑවින් ම වේදනා ගෙන දෙන්නක් වුව ද සටන් කිරීමට අවසරය අසීත රණශූරයාට දෙයි.[34]

භීෂ්ම සටනින් හුණු හෙයින් දැන් කර්ණ යළිත් යුද්ධයට සහභාගි වෙයි. ඔහු ගේ යෝජනාවට අනුව මහලු ද්‍රෝණ ආචාර්යවරයා සේනාධිනායක පදවියට පත් කරනු ලැබෙයි.[35] එකොළොස් වැනි දිනයෙහි සිට පසළොස් වැනි දිනය දක්වා ඔහු ගේ අණ දීම යටතේ යුද්ධය පැවැත්වෙයි.

යුද්ධයේ දහතුන් වැනි දිනයෙහි පාණ්ඩවයනට ඉතා ශෝක ජනක සිද්ධියකට මුහුණ දෙන්නට වෙයි. තරුණ වූ-එහෙත්, ශූරවීර සම්පන්න වූ අර්ජුන පුතු අභිමන්යු තෙමේ සතුරු සේනාව තුළට කඩා වැදී බොහෝ ඈතට යන්නට ගොස් ජයද්රථ නමැති සින්ධු

රාජයා විසින් ඔහු ගේ ආරක්ෂකයන් ගෙන් වෙන් කරනු ලදුයේ දුශ්ශාසන ගේ පුත්‍රයා විසින් මරනු ලබයි. තම පුත්‍රයා ගේ ඝාතකයා වූ ජයද්රථ ගෙන් බිගිසුණු ලෙස පළි ගන්නා බවට අර්ජුන දිවුරයි. එ හෙයින් යුද්ධයේ තුදුස් වන දිනයෙහි ඇති වන ප්‍රධාන සිද්ධිය නම් අර්ජුන හා ජයද්රථ අතර ඇති වන සටනයි. මුළු දවස පුරා ම සිදු වන මේ සටන කෙළවර වනුයේ ජයද්රථ ගේ මරණයෙනි. අර්ජුන දිවුල ලෙස ම ඉර බැස යන්නට කලින් හෙතෙමේ මරනු ලැබෙයි. මේ වේලාවෙහි ම ධෘතරාෂ්ට්‍ර රජු ගේ පුත්‍රයන් බොහෝ ගණනක් **මරු මුවට පත් කරමින් භීම තෙමේ කෞරව සේනාවට විනාශයක් පමුණුවයි.**

එහෙත් මේ දිනයෙහි ඉර බැස ගිය පසු වෙන දා මෙන් සටන් නැවැත්වීමෙක් සිදු නො වෙයි. දෙ පක්ෂයෙහි ම ප්‍රතිවාදීහු කොතරම් ප්‍රකෝපයට පැමිණ සිටියේ ද යත් රාත්‍රි පැමිණෙද්දීත් ඔහු විවේකයක් නො ගනිති. දඬු වැටවල හා පහන්වල ද ආධාරයෙන් ඔහු සටන් කෙරෙති. එහෙත්, කර්ණ විශේෂයෙන් ම පාණ්ඩවයනට මහත් විනාශයක් පමුණුවයි. එ හෙයින් කෘෂ්ණ ගේ උපදේශය පරිදි කර්ණ හා සටනට **ඝටොත්කච** රාක්ෂසයා යැවේ. කර්ණ වීරයා පුරුෂ වික්‍රමයෙන් යුතු ව රාක්ෂස යෝධයා සමඟ පොරයෙහි යෙදේ. රාක්ෂසයා කෞරව සේනාවට භයානක විනාශයක් පමුණුවයි. එහෙත්, අන්තිමේ දී හෙතෙමේ කර්ණ විසින් මරණයට පත් කරනු ලබයි. එහෙත්, තමා ගේ විනාශයේ දී පවා ඝටෝත්කච යෝධයා කෞරවයන් ගේ මුළු හමුදාවක් ම බිම හෙළා සුණු විසුණු කොට ලයි. භීම ගේ පුත්‍රයා වූ ඝටෝත්කච ගේ මරණය පිළිබඳ ව පාණ්ඩවයෝ අතිශයින් ශෝකප්‍රාප්ත ව සිටිති. එහෙත්, කෘෂ්ණ පමණක් එහි ලා ප්‍රීතියෙන් උදම් වෙයි. එයට හේතුව කර්ණ ඉන්ද්‍ර විසින් ඔහුට දෙන ලද්දා වූත් අර්ජුනට[36] විරුද්ධ ව පාවිච්චි කිරීමට ඔහු විසින් එ තෙක් ඉතිරි කොට තබා ගන්නා ලද්දා වූත් කුන්තායුධය රාක්ෂසයාට පහර දීමට පාවිච්චි කිරීමයි. කෘෂ්ණ හට උවමනා කළේ ද මෙ පමණකි.

උභය පක්ෂයෙහි ම යෝධයන් නිදි බරින් කිරා වැටෙන තෙක් සටන ඇවිලෙමින් පවති. ඔවුනතුරින් ඉතා ම කාර්යපර වූවන් නින්දට නො වැටී සිටිනුයේ අමාරුවෙනි. ඔවුන් ගෙන් බොහෝ දෙනෙක් විඩාවෙන් හා නිදිබරින් ද පෙළෙන්නාහු ඔවුන් නැඟී සිටි ඇතුන්, අසුන් හා රිය පිට වැටී නිදන්නට වෙති. නිද්‍රාවෙන් පියැවී ගිය ඇස් ඇති සෙස්සෝ නමන් ගේ ම යහළුවන් ඝාතනය කෙරෙති. ඉක්බිති අර්ජුන දුකට පැමිණ නිදා ගැනීම සඳහා මද වේලාවක් ගත කිරීම පිණිස තම ප්‍රතිවාදීනට මහ හඬින් අවසර දෙයි. ඔහු ගේ සතුරෝ ද මේ යෝජනාව මහත් සතුටින් පිළිගනිති. දෙවියෝ ද මනුෂ්‍යයෝ ද අර්ජුන මේ වචන ප්‍රකාශ කිරීම පිළිබඳ ව ඔහුට ආසිරි පවත්වති. රණ බිම මැද්දේ අශ්වයෝත් හස්තීහු හා යුද්ධ භටයෝත් නින්දට වැටෙති.

(පද්‍ය කිහිපයෙක පහතැ දැක්වන ගද්‍ය පරිවර්තනයෙන් මෙහි වර්ණිත රාත්‍රි දර්ශනයේ කාව්‍යමය චමත්කාරය පිළිබඳ යම්තම් හැඟීමක් ලබා ගත හැකි ය. මෙහි ශෛලිය ඇතැම් තැනක දී කාලිදාස කෙනකුන් ගේ ගීත ප්‍රබන්ධ සිහියට නංවයි.[37])

'ඉක්බිති නිද්‍රාහරිත වූ සියලු මහා රථාරෝහක යෝධයෝ නිශ්චලත්වයට පැමිණියහ. ඔවුන් ගෙන් ඇතැමෙක් අසුන් පිටත්, සමහරෙක් ඔවුන් ගේ රිය මතත් තවත් සමහරෙක් තම ඇතුන් ගේ ගෙල පිටත් තවත් බොහෝ දෙනෙක් බිමෙහිත් වැතිර ගත්හ. ඔහු තම අවි, මුගුරු, කඩු, පොරෝ, සහ හෙල්ල යන මින් මුළුමනින් ම සන්නද්ධ වූවාහු ඇතැමෙක් නිදීම පිණිස එ තැන, මෙ තැන වැතිර ගනිති.....බිම වැතිර ගෙන තදින් හුස්ම ඉහළ පහළ හෙළන හස්තීහු පිඹිමින් සිටින සර්පයන් මුදුනෙහි ඇති තුඹස් බඳු වූහ.....තද නින්දේ සිත් පිත් නැති ව නිදියන මහ සෙනඟ දකෂ චිත්‍ර ශිල්පියකු විසින් පිළි කඩෙක අඳින ලද අද්භූත චිත්‍රයකට සමාන විය.....එ කෙණෙහි ම රතු පැහැ ගත් රෑ දහර විහිදුවමින් පෙරඹරෙහි සඳු උදා විය..... ඇසි පිය හෙළන තරම් කාලයෙකින් මහ පොළොව සඳ රසින් නෑවෙන්නට විය..... අඟාධ වූ ඝනාන්ධකාරය වහා පහන් වැ ගියේ ය.....එහෙත්, හිරු රස් පහළ කෙණෙහි පිපී ගන්නා සියපත් වනයක් මෙන්

මේ යෝධ සේනාව පීබිද ගත්හ. සඳ බබළන කල්හි සයුරෙහි වඩබා දිය නැඟෙන්නා සේ රාත්‍රි තාරකාව පායත් ම මේ සේනා සමුද්‍රය පිබිදී සිටියේ ය. එහෙත්, මහ රජ, උපරිම ස්වර්ගය පැවූ මේ ජනයා අතරෙහි ලෝක විනාශය සඳහා අලුතින් යුද්ධය ඇරඹිණ.[සෙ]

ඇදිරි වැටෙන තෙක් භයානක යුද්ධය නො නවත්වා ම පැවැත්වෙයි. යුද්ධයේ පසළොස් වැනි දිනය ළං වෙයි. පෙර දිගින් හිරු උදා වේ. උභය සේනාවෙහි ම යෝධයෝ තමන් තමන් නැඟී සිටි ඇතුන්, අසුන් පිටින් හා රියවලින් ද බැස හිරු දෙවියා දෙස බලමින් ඇදිලි බැඳ ගෙන තමන් ගේ ප්‍රභාත වන්දනාය පවත්වති. මොහොතකින් මෙය අවසන් වෙයි. යළිත් යුද්ධය ඇරඹේ. අති විශිෂ්ට වීරයන් දෙ දෙනකුන් වූ දෘපද රජ සහ විරාට ද්‍රෝණ ගේ අතින් මරුමුවට පැමිණෙති. මේ සෙනෙවියා නැසීමට පාණ්ඩව වීරයන් ගන්නා උත්සාහය නිෂ්ඵල වෙයි. ගුරුවරයා වූ ද්‍රෝණ හා ඔහු ගේ ශිෂ්‍යයා වූ අර්ජුන දෙඅතර මුහුණට මුහුණ ලා විස්මය ජනක සටනක් සිදු වෙයි. දෙවියන් පවා මහත් පුදුමයෙන් මේ සටන දෙස බලා සිටිය ද අවි සරඹයෙහි ලා ශිෂ්‍යයා ගුරුවරයාට වඩා කිසි ලෙස කිනුත් සුළු පටු බවක් නොදක්වන හෙයින් කිසි දු ප්‍රතිඵලයක් ඇති නො වේ. නැවතත් මෙහි දී දුෂ්ට උපායයක් යොදනු යේ කෘෂ්ණ ය. ඔහු ගේ බලකිරීමට අනුව, අශ්වත්ථාමන් යනුයෙන් ඇමැතෙන ඇතකු භීම මරා දමයි. එ සේ කොට ද්‍රෝණ සම්ප්‍රයට පැමිණ අශ්වත්ථාමන් (ද්‍රෝණ ගේ පුත්‍රයා ද අශ්වත්ථාමන් නම් වෙයි.) මරා දමනු ලැබූ බව මහ හඬ ගා කියයි. ද්‍රෝණ තැති ගත් නමුත් පුවත තවමත් නො අදහයි. එහෙත්, කෘෂ්ණ එය අදහනුයේ සත්‍යකාමයෙකු ලෙස සුප්‍රසිද්ධ වූ යුධිෂ්ඨිර කෘෂ්ණ ගේ පෙරැත්තය පිට මේ බොරුව පුන පුනා කීමෙන් පසු ව ය. ශෝකයෙන් භරිත වූ ද්‍රෝණ තෙමේ තම අවි ආසෙක හෙළා ගැඹුරු දැහැනකට සම වන් සේ නිසල ව සිටියි. අසූ පස් හැවිරිදි මහලු ද්‍රෝණ ගේ හිස සිඳ ලීමට දෘපද ගේ පුත්‍රයා වූ දෘෂ්ටද්‍යුම්න අවස්ථාව යොදා ගනුයේ මේ අවසරයෙහි ය. සම්මානනීය ආචාර්යවරයා නො මැරිය යුතු යැයි අර්ජුන කරන හඬගැසි නිෂ්ඵල වෙයි. කාර්යය සම්පූර්ණ කළ දෘෂ්ටද්‍යුම්න තෙමේ සේනාධිනායක ගේ හිස කෞරවයන් ගේ මධ්‍යයට විසි කරයි. භීතියෙන් ඇලැලී ගිය කෞරවයෝ පලායන්නට වෙති. සිය පියා ගේ මරණය පිළිබඳ පුවත අශ්වත්ථාමන් හට දැන ගන්නට ලැබෙනුයේ මේ විට ය. හෙතෙමේ පඤ්චාලයන් ගෙන් හා පාණ්ඩවයන් ගෙන් ද මේ ක්‍රියාව පිළිබඳ ව බිහිසුණු ලෙස පළිගන්නා බවට ශපථ කෙරෙයි.

ද්‍රෝණ හුණු පසු කෞරවයන් ගේ සේනාධිනායකත්වයට කර්ණ තෝරා ගනු ලැබෙයි. ඔහු සේනානායකත්වයට පත් වනුයේ දෙ දිනකට පමණකි.[සෝ] යුද්ධයේ සොළොස් වැනි දින යෙහි භීම, අශ්වත්ථාමන්, අර්ජුන සහ කර්ණ යන මොහු අද්භූත වික්‍රමයන් දක්වා ලති. එහෙත්, තීරණාත්මක ප්‍රතිඵලයක් නො ලැබේ. යුද්ධයේ සතළොස් වැනි දින උදා සන මද්‍ර දේශාධිපති වූ ශල්‍ය රජ තමා ගේ සූතයා ලෙස සේවයට ලබා දෙන මෙන් ඉල්ලයි. කෘෂ්ණ වැනි විශිෂ්ට සූතයකු අර්ජුනට සිටින බැවින් ඔහු සමඟ සමානත්වයට පැමිණ සටන් කළ හැක්කේ එ විට පමණකැයි හේතුව වශයෙන් කර්ණ ඉදිරිපත් කරයි. තමාට වඩා පහත් තත්ත්වයෙක සිටින්නකු යටතේ සේවය කිරීමට ශල්‍ය අකැමති වෙනත් කර්ණ ඉදිරියෙහි තමා කැමැති දෙයක් කථා නිරීමට අවසරය තිබීමේ කොන්දේසිය පිට අන්තිමේ දී එයට කැමැති වෙයි. මේ ලැබුණු වරප්‍රසාදයෙන් ශල්‍ය සම්පූර්ණ ප්‍රයෝජනය ලබයි. කර්ණ ගේ රිය පදවමින් ම ශල්‍ය තෙමේ කර්ණ හට මහත් ශෝ නින්දා පරිභව කිරීමෙහි යෙදෙයි. එහෙත්, කර්ණ ඔහුට නොපරදින බව සැබෑ ය. හෙතෙමේ ද ශල්‍ය ගේ ජනයා වූ මද්‍ර දේශවාසීන් මුසාවාදයෙහි ගැලුණා වූත් වංචාකාරීවූත් සුරාපානයෙහි, අනාචාරයෙහි හා ව්‍යභිචාරයෙහි ද තත්පර වූවන් ලෙස විස්තර කරමින් පරිභව වචනයෙන් ඔවුනට බැණ වදියි. අනෙක් අතට ශල්‍ය තෙමේ ද කර්ණ ගේ යටත් වැසියන් වූ අංගයන් තම අඹු දරුවන් අනුනට විකිණීමෙහි යෙදෙන්නන් බව කර්ණට කියයි. අන්තිමේ දී දෙ දෙනා සමඟි කොට යුද්ධය සඳහා පිටත් කිරීමට දුර්යෝධනට සිදු වෙයි.

කර්ණ සටන් කිරීමට අර්ජුන මාස ඔලන අතර ධෘතරාෂ්ට්‍ර ගේ පුත්‍රයන් රාශියක් ම විනාශයට පමුණුවමින් භීම භයානක සංහාරයක් පවත්වයි. ඉක්බිති හෙතෙමේ තම තුවිලී යහදුව දුශ්ශාසන වෙත දමා ගසා ඔහු පියෙන් බිමට හෙළා ඔහු මතට කඩා පැන ඔහු ගේ පපුව පළා ඉන් වැහෙන උණුසුම් රුධිරය තමා කලින් කළ දිවිරිම පරිදි බිගෙන යයි." මේ දර්ශනයෙන් සන්ත්‍රාසයට පත් සතුරු පක්ෂය පසු බසී. මේ අතර අර්ජුන සහ කර්ණ ඔවුනොවුනට ළං වී බිහිසුණු ද්වන්ද්ව යුද්ධයෙක යෙදෙති. දෙවියෝ ද මේ සටනට සහභාගී වෙති. ඉන් දැයා අර්ජුන ගේ පක්ෂය ගන්නා අතර සූර්යයා කර්ණ ගේ පක්ෂය ගනී. තම දළවලින් ඇන ගන්නා වන්‍ය හස්තීන් දෙ දෙනෙකුන් මෙන් වීරයෝ දෙ දෙන ඔවුනොවුන් වෙත ඊ මැසි වස්වති. කර්ණ පොළවට හෙළීමට අර්ජුන ගන්නා උත්සාහය නිෂ්ඵල වෙයි. කර්ණ ගේ පියෙහි එක් රෝදයක් පොළොවෙහි ගැලෙන්නට පටන් ගනී.[42] තම පිය ඉවතට ඇද ගන්නට තැත් කරන කර්ණ සටන් කිරීමේ නීති රීතිවලට අනුව සටන නතර කරන ලෙස අර්ජුන ගෙන් ඉල්ලයි. එහෙත් මේ ඉල්ලීමට තැකීමක් නොකරන ලෙස අර්ජුනට කියන කෘෂ්ණ ඔහු තම බසට නමීමා ගනී. සාමාන්‍යයෙන් ම උත්තම පෙරුෂය ගිලිබඳ ආදර්ශයක් වූ අර්ජුන සිය පිය ඇද ගැනීමට කර්ණ වෙහෙසෙමින් සිටිය දී ම ඔහු දුෂ්ට ලෙස මරා දමයි. මැරී වැටුණු වීරයා ගේ ශරීරයෙන් රශ්මියක් අවට පැතිරෙයි. ඔහු ගේ රූප ශෝභාව මරණයෙහි දී පවා රැකී පවතී.

පාණ්ඩවයන් ගේ කඳවුරෙහි මහත් ජයඝෝෂය නැඟෙයි. එහෙත් කෞරවයෝ බියෙන් පලා යෙති.

තම සේනාව නැවත රැස් කරවා තව දුරටත් සටන් කිරීමට ඔවුන් පොළඹවා ගැනීමට දුර්යෝධනට හැකි වන්නේ මහත් ආයාසයෙනි. යුද්ධයේ දහ අට වැනි දිනයෙහි ශල්‍ය සේනාධිනායකත්වයට පත් වෙයි.[43] ඉතා දීර්ඝ වූත්, භයංකර වූත් සංග්‍රාමයෙකින් පසු මධ්‍යාහ්න සමයෙහි දී යුධිෂ්ඨිර ශල්‍ය ජීවිතක්ෂයට පත් කරයි. කෞරවයෝ පලා යෙති. දුර්යෝධන හා ශකුණි පමණක් සුළු බල සෙනඟක් සමඟ බලාපොරොත්තු රහිත සටනක යෙදෙති. ශකුණි සහදේව අතින් මරුමුවට පැමිණේ. අර්ජුන සහ භීම භයානක සංහාරයෙක ගෙදෙති. මුළු මහත් කෞරව සේනාව ම සමූලඝාතනයට පත් කරනු ලැබේ.

දුර්යෝධන තනිදෙකලා ව පොකුණක් කරා දිව ගොස් එහි සැඟවෙයි. ඔහු හැරෙන්නට ඉතිරි ව සිටින්නේ කෘතවර්මන්, කෘප සහ අශ්වත්ථාමන් යන තිදෙන වෙති. ඉර බැස හමාර ය. කෞරවයන් ගේ කඳවුරු පාළු, අත් හැර දැමුණු ස්වභාවයෙකින් පවතී. දුර්යෝධන සොයා යන පාණ්ඩවයනට අන්තිමේ දී හෙතෙම මුණ ගැසේ. තමා හා තනි ව සටනට පැමිණෙන ලෙස යුධිෂ්ඨිර ඔහුට අභියෝග කරයි. පසු දා උදැසන වන තෙක් තමා සටන් කිරීමට සූදානම් නැති බවත් තමා පොකුණ වෙත පැන ගියේ විඩාව නිසා මිස බිය නිසා නොවන බවත් දුර්යෝධන කියයි. එහෙත්, ද්වන්ද්ව යුද්ධය එ තැන දී ම සිදු කළ යුතු බව කියන යුධිෂ්ඨිර දෙ දෙනා ගෙන් එකකු මරණයට පැමිණෙනතෙක් දුර්යෝධන හට රජු හැටියට ම සිටීමට ඉඩ දෙන බවට පොරොන්දුවක් වෙයි. ද්වන්ද්ව යුද්ධය පැවැත්විය යුත්තේ දුර්යෝධන සහ භීම අතරෙහි ය. මුගුරුවලින් කරන සටන සාමාන්‍යයෙන් ඇරඹෙනුයේ බරින් බිස් වීමෙනි. කෘෂ්ණ ගේ සොහොයුරා වූත්, මෙ තෙක් යුද්ධයට සහභාගි නො වී සිටියා වූත් බලදේව මේ මුගුරු සටන නැරඹීම පිණිස ඉතා ඇතෙක සිට පැමිණෙයි. දෙවියේ ද මේ සටන දෙස මහත් විස්මයෙන් හා ප්‍රසාදයෙන් ද බලා සිටිති. වෘෂභයන් දෙ දෙනකුන් තම අංවලින් එකිනෙකාට ඇන ගන්නේ යම් සේ ද වීරයෝ දෙ දෙන ද ඔවුන් ගේ මුගුරුවලින් එකිනෙකා මත පහර වැසි වස්වති. ලෙයින් නැහැවී ගිය ඔහු සටන නො නවත්වා ම කෙරෙති. මස් කැබැල්ලකට පොර කන බළලුන් දෙ දෙනකුන් මෙන් ඔහු තම මුගුරුවලින් එකිනෙකා සූරා දමති. ඔවුන් දෙ දෙන ම විස්මයජනක වික්‍රමයක් ප්‍රකාශ කරන හෙයින් සටන තීරණයකට නො පැමිණේ. ඉක්බිති කෘෂ්ණ අර්ජුන අමතා, සටනෙහි ලා භීම වඩා ශක්ති සම්පන්න තැනැත්තකු වුවත්, දුර්යෝධන වඩා දක්ෂ ලෙස සටන් කරන්නකු හෙයින් යුක්ති සහගත සටනෙකින් ඔහුට දුර්යෝධන ඇලවිය නොහැකි බව පවසයි. එහෙත්, වරෙක ද්‍රෞපදියට නිහා කරනු ලැබූ අවස්ථාවෙහි දුර්යෝධන ගේ කලවය සුනු විසුනු කොට ලන බවට දිවුරමින් භීම පැවැසූ වචන අර්ජුනට

සිහිපත් කරවයි. ඉක්බිති අර්ජුන භීමට පෙනෙන සේ තමා ගේ වම් කලවයට පහරක් ගසයි. මේ ඉඟිය තේරුම් ගන්නා තම ප්‍රතිවාදියා තමාට පහර දීමට පිනුමක් පනිද්දි ඔහු ගේ කලවයට පහරක් දී එය සුනුවිසුනු කෙරෙයි. ප්‍රචණ්ඩ මාරුතවේගයෙන් මුලිනුදුල ගසක් හෙන්නා සේ දුර්යෝධන බිමට පතිත වේ. එහෙත්, මේ සටන දෙසැ බලා සිටි බල දේව තෙමේ අසාධාරණ ලෙස සටන් කළේ යයි කෝපයෙන් භීමට දෝෂාරෝපණය කෙරෙයි; මුහුරු සටනෙක දී තම ප්‍රතිවාදියා ගේ නැබින් පහළට පහර දීම තහනම් හෙයිනි. භීමට දඬුවම් කිරීමට ඉදිරිපත් වන බලදේව ඉන් වළක්වා ගැනීමට ඔහු ගේ ද සොහොයුරා වූ කෘෂ්ණට හැකි වනුයේ අමාරුවෙනි එහෙත්, භීම ක්‍රියා කෙළේ නිවැරැදි ලෙසට යැයි තම සොහොයුරාට ඒත්තු ගැන්වීමට කෘෂ්ණ යොදන කුට තර්කය නිෂ්ඵල වෙයි. යුක්ති යුක්ත වූ බලදේව තෙමේ ඔහු ගේ රියට නැඟී ලොවේ හැම කල්හි ම භීම කූට යෝධයකු ලෙසත් දුර්යෝධන අවංක යෝධයකු ලෙසත් පළ වන්නාහයි කෝපාවිෂ්ට ස්වරයෙන් කියමින් ඉවත් ව යෙයි.

ඉක්බිති යුධිෂ්ඨිර තෙමේ ධෘතරාෂ්ට්‍ර හා ගාන්ධාරිය ද අස්වසනු පිණිස කෘෂ්ණ හස්තිනා පුරයට යවයි. කෘෂ්ණ තෙමේ ද තම දූත කාර්යය හැකි තරම් හොඳින් ඉටු කෙරෙයි. පාණ්ඩවයෝ ගංගාවෙක ඉවුරෙහි රාත්‍රිය ගත කිරීමට තීරණය කෙරෙති.

දුර්යෝධන ගේ විනාශය පිළිබඳ පුවත සැළ වූ වහා ම අශ්වත්ථාමන් සහ ඔහු ගේ සග යෝ දෙ දෙන සටන් බිමට දිව ගොස් සුනු විසුනු කැරුණු කලවා සහිත ව බිම වැතිර සිටින වීරයා දැක වැලපෙන්නට වෙති. ඉක්බිති අශ්වත්ථාමන් සියලු පාණ්ඩවයන් සමූලඝාත නයට පත් කරන බවට දිවුරයි. ඒ අනුව දුර්යෝධන තෙමේ සේනාවක් ඉතිරි ව ඇති බව පැහැදිලි නුවුවත් අශ්වත්ථාමන් සේනාධිනායකත්වයට පත් කරයි.

රාත්‍රී කාලයෙහි පාණ්ඩව කඳවුරෙහි පැවැත්වුණු සංහාරය[45]

දුර්යෝධන ගෙන් සමු ගත් කෞරව වීරයෝ තිදෙන සටන් බිමට ඇතින් පිහිටි ගසෙක සෙවණ යටට රාත්‍රිය ගත කිරීම පිණිස යෙති. කෘප සහ කෘතවර්මන් නින්දට වැටෙති. පළි ගැනීම පිළිබඳ කෝපයෙන් හා පිපාසයෙන් ද දැවෙමින් සිටි හෙයින් අශ්වත්ථාමන් අවදියෙන් පසු වෙයි. මෙ සේ සිටින ඔහුට තමා විවේකයෙන් පසු වන තැනැ පිහිටි ගසට කවුඩු රැලක් පියඹා අවුත් එහි අතු පතරෙහි ලැගුම් ගත් සැටි දක්නට ලැබෙයි. මධ්‍යම රාත්‍රියෙහි හදිසියෙන් ම එහි පැමිණි බිය්කරු පෙනුමක් ඇති බකමුහුණෙක් නිදා සිටි කවුඩන් සියලු දෙන ම මරා දමයි. මේ දර්ශනය දක්නා ඔහුට සතුරන් නිදා සිටිය දී ඔවුන් වෙත කඩා පැන ඔවුන් මරා දැමිය යුතු ය යන අදහස පහළ වෙයි. නිදමින් සිටි සෙසු වීරයන් දෙ දෙන පිබිදවූ හෙතෙමේ ඔවුනට තම උපාය හෙළි කරයි. නිදා සිටිමින් සටන් කළ නොහැකි තත්ත්වයක පසු වන්නන් වෙත කඩා පැනීම දැරදි බව කියමින් කෘප තෙමේ ඔහු වළක්වන්නට බලයි. එහෙත්, අශ්වත්ථාමන් එයට හරස් කපමින් "යුක්ති ධර්මයේ සේතුව පාණ්ඩවයන් කැබැලි සියයකට සිඳ ලූයේ" බොහෝ කලකට ඉහත ශැසි කියා දැනට අවශ්‍ය ව ඇත්තේ ඔවුන් ගෙන් පළි ගැනීමේ චේතනා වලට ඉඩ දීම පමණක් බවත් ජීවත් වන කිසිවකුටත් ඔහු ගේ ඒ අදහස නොවැලැක්විය හැකි බවත් පවසයි. "විපාකයක් වශයෙන් මා පුණුමකු ව හෝ මෙරුවකු ව හෝ නැවතත් උපදිතත් මගේ පියා මැරූ පඤ්චාලයන් නිදා සිටියදී ම මරන්නෙමි."[47] මේ අදහස තරවා ගන්නා හෙතෙමේ තම රියට නැඟී සතුරු කඳවුරු බලා එය පදවයි. පලා යෑමට තැත් කරන කවරකු හෝ වෙතොත් ඔහු මරනු පිණිස කඳවුරේ දොරටුව අසල ඉතිරි දෙ දෙනා මුර කරමින් සිටිය දී හෙතෙමේ සොරකු මෙන් කඳවුර තුළට පිංගයි. ඉක්බිති තම පියා මැරූ දෘෂ්ටද්‍යුම්න නිදන කුඩාරම තුළට කඩා වදින හෙතෙමේ සෑ පහරක් දීමෙන් ඔහු පුබුදුවා ගවයකු ගේ හිස මෙන් ඔහු ගෙල මිරිකා මරා දමයි. ඉක්බිති යම දේවයා මෙන් කුඩාරම්න් කුඩාරමටත් යහනින් යහනටත් යන හෙතෙමේ ද්‍රෞපදිය ගේ පුතුන් පස් දෙනා හා ශිඛණ්ඩීන් ද ඇතුළු ව නිදි බටින් හා නින්දෙන් ද පසු වන සියලු වීරයන් මරා දමයි. මධ්‍යම රාත්‍රිය වන්නට කලින් සතුරු සේනාවට අයත් සියලු වීරයෝ මළවුන් අතරෙහි වෙති. දහස් ගණන් දෙනා ලේ විල්හි වැතිර සිටිති.

මිනිමස් බුදිමින් රාත්‍රියෙහි සංචාරය කරන රාක්ෂස පිශාචාදීනු හොඳුරු පහන දහස් ගණකින් කඳවුරු තුළට නැඳි මරන ලද්දවුන් ගේ ලේ-මසෙහි රසාස්වාදය ලබති. පසු ව අරුණු පැතිරෙන්ම කඳවුර පුරාත් ඒ අවටත් රජයනුගේ භයානක කිඹුලන්වයෙකි.

එහෙත්, හිරසේ කි දෙන තම් මත් පණ අදිමින් වැතිර සිටින දුර්යෝධන වෙහට දිව හොඳ මුළු මහත් සතුරු බල මුළුම ම සම්පූර්ණතයට පත් කිරීම පිළිබඳ භයානක ප්‍රවෘත්තිය ඔහුට සැල කරති. තමාට අතිශයින් තුම්පිජනක වූ මේ ප්‍රවෘත්තිය අසන දුර්යෝධන තෙමේ කෘතඥතාපූර්වක වත් ප්‍රීතියෙනුත් ස්වකීය ප්‍රාණය පියාලයි.

මේ අතර දෘෂ්ටද්‍යුම්න ගේ සූතයා වූ පාණ්ඩව කඳවුරින් ඉතිරි ව සිටි එක ම තැනැත්තා දෘපද ගේ පුතුන් මරනු ලැබීම හා මුළු මහත් සේනාව සම්පූර්ණතයට පත් කරනු ලැබීම ද පිළිබඳ භයානක ප්‍රවෘත්තිය පාණ්ඩවයනට රහසින් දන්වයි. මේ අසන ශුධිෂ්ඨිර මහඟ වනුයේ සිය සොහොයුරන් විසින් වියාගනු ලබන්නේ තරමක් අමිරුවෙකි. ඉක්බිති නෙතෙමේ ද්‍රෞපදිය ඇතුළු සිය පවුලේ අවශේෂ කාන්තාවන් කැඳවාගෙන ඒ ම පිණිස පණිවුඩ යවයි. කඳවුරට පිවිසෙන ගේ එහි දී තම නෙතට හමු වන දර්ශනයෙන් මුසපත් වන තරම් තත්ත්වයකට පත් වේ. ඉක්බිති එළැඹෙන්නී ද්‍රෞපදියයි. මරන ලද සිය සොහොවුරන් හා පුතුන් නිසා පහළ වූ බලවත් ශෝකයෙන් වෙළී යද්දීත් ඕ නොමේ අතිශයින් ම කටුක වූ දෙපිට කැපෙන බසින් තම හිමියා වූ ශුධිෂ්ඨිර හට ඔහු ලද විෂිෂ්ට ජයග්‍රහණය පිළිබඳ ව තම බලවත් ප්‍රීතිය පළ කරයි. මළවුන් වෙනුවෙන් ඇගේ වැලපිම සීමා රහිත වන්නා සේ ම ඝාතකයා වූ අශ්වත්ථාමන් කෙරෙහි ඇ තුළ දැල්වෙන ද්වේෂය ද සීමා රහිත ය. එ හෙයින් මේ භයානක ක්‍රියාවට ඔහු ගෙන් පළි ගන්නා තෙක් ආහාර පාන වශයෙන් කිසිවක් ගැනීම ප්‍රතික්ෂේප කරයි.

අශ්වත්ථාමන් ගේ ක්‍රියාව පිළිබඳ ව ඔහු ගෙන් පළි ගන්නා ලද්දේ ද එ සේ නම් ඒ කෙසේ ද යන කරුණ මුල් විර කථාවෙහි සඳහන් වූ අයුරු දැන ගැනීමට අපේ මහාභාරතයෙන් කිසි පැහැදිලි සාක්ෂ්‍යයක් නො ලැබේ. එයට හේතුව නොයෙක් කරුණු අමුතුවෙන් ඇතුළත් කරනු ලැබීම ය. දැක්වෙන විස්තර දුරවබෝධ හා ව්‍යාකූල ස්වභාවයෙකින් ද කියැවී ඇත:

කිම් අශ්වත්ථාමන් ලුහුබැඳ ගොස් ඔහු හා සටන් කරයි. එහෙත් සැබෑවින් ම ලබනුයේ පරාජයෙකි. කෙසේ වෙතත් හෙතෙමේ ඔහු නො මරයි. අශ්වත්ථාමන් තම හිස මිදුනෙහි ඇවුණ වූත්, ද්‍රෞපදිය විසින් ප්‍රාර්ථිත වූත් මැණිකක් සිය කැමැත්තෙන්ම ඔහු අතට දෙයි. (මේ අද්භූත ශිරිඹරණය පිළිබඳ ව මින් පෙර කිසි දු අවස්ථාවෙක කථාවෙහි සඳහන් ව නැත.) තව ද, ඔහු සතු ව විස්මයජනක ආයුධයක් වෙයි. අර්ජුන ගේ ලේලිය වූ උත්තරාව ගේ කුසෙහි තවමත් කලල ස්වරූපයෙන් හෝනා කුරු වංශ යෙහි අන්තිමයා මේ ආයුධයෙන් හෙතෙමේ විනාශ කොට දමයි. මේ හේතුවෙන් පසු කලෙකු උත්තරාව බිහි කරනුයේ මළ දරුවෙකි. එහෙත්, කෘෂ්ණ ඒ දරුවා ට පණ උපදවයි. ඒ දරුවා වූ කලි මහාභාරතය පළමු වරට සජ්ඣායනය කරන ලද්දේ යම් කාල යාඥෝත්සවයෙක දී ද එය පැවැත්වූ ජනමේජය ගේ පියා වූ පරීක්ෂිත් ය. එහෙත් කෘෂ්ණ තෙමේ අශ්වත්ථාමන් තුන් දහසක් කල් අවුරුදු ලොවෙහි හුදෙකලා ව සියලු මිනිසුන් විසින් දුරු කරනු ලබමින්, ලේ ගඳ විහිදුවමින් සැරව වගුරුවමින් සියලු රෝගයන් ගෙන් සිරිත වෙමින් අසුර වේශයෙකින් ඉබාගාතේ ඇවිදින ලෙසට ශාපයක් කරයි.

මේ සියල්ල පැරණි කාව්‍යයට අයත් ව පැවැතියේ ද යනු කීම අපහසු ය එහෙත්, මළවුන් සඳහා කළ වැලපීම එයට අයත් ව පැවැති බව නම් ඒකාන්ත ය.

මළවුන් වෙනුවෙන් ස්ත්‍රීන් කැඳෑ විලාපය [48]

කිව නොහැකි තරම් ශෝකයෙකින් පෙළෙන මහලු, අන්ධ, ධෘතරාෂ්ට්‍ර රජු අස්වැසිමට සඤ්ජය හා විදුර ගන්නා උත්සාහය නිෂ්ඵල වෙයි. හෙතෙමේ යළි-යළිත් හඬා වැලපේ. අන්තිමේ දී ඔහු අස්වැසිමට ව්‍යාස ඉදිරිපත් වෙයි. කෙසේ හෝ දැන් මළවුන් වෙනුවෙන් චාරිත්‍ර විධි පැවැත්විය යුතු වෙයි. ඒ හෙයින් රජ තම අග මෙහෙසුන් වූ ගන්ධාරිය හා සෙසු වනිතාවන් කැඳවා යවයි. මහත් විලාප නඟමින් ඔහු නගරයෙන් බැහැර ව යුද බිම බලා යෙති. කෞරව ඝෝනාවෙන් ඉතිරි වූ වීරයෝ තිදෙන අතර මඟ දී ඔවුනට හමු ව ඉකුත් දින රාත්‍රියෙහි සතුරු කඳවුරෙහි තමන් පැවැත්වූ සංහාරය ගැන තොරතුරු ඔවුනට හෙළි කරති. කෙසේ වුව ද, පාණ්ඩවයන් පළි ගනිතැයි යන බියෙන් ඔහු ඒ තැන නො රැඳී පලා යෙති. නොබෝ වේලාවෙකින් පඤ්ච පාණ්ඩව පුත්‍රයෝ පස් දෙන කෘෂ්ණ සමඟ පැමිණ වැලැපෙන්නන් ගේ කණ්ඩායමට එක් වෙති. කිසි යම් දුෂ්කරතාවකින් පසු පාණ්ඩවයනුත් මහලු රජු හා බිසවත් අතර කිසි යම් සමාදානයක් ඇති කිරීමට කෘෂ්ණ සමත් වෙයි. එහෙත්, තම පුතුන් සිය දෙනා ගෙන් එකකු ගේ වත් ජීවිතය ඉතිරි නොකළ බීම හට සමාව දීම ගාන්ධාරියට ඉතා දුෂ්කර වෙයි. එහෙත් ද්‍රෞපදිය ගේ ද සියලු පුතුන් ජීවිතක්ෂයට පත් වූ හෙයින් යෙදෙන ශෝක සමානත්වය සමාදානයක් ඇති කැර ගැන්මට ඉවහල් වෙයි.

ගාන්ධාරී විලාපය කියවන්නාට ලැබෙනුයේ මින් පසු ව ය. මේ වූ කලි මුළු වීර කාව්‍යයේ ම අතිශය කමනීය ඡේදයන් ගෙන් එකක් වූත් ශෝක කාව්‍යයේ විශිෂ්ටතම නිෂ්පාදනයක් වූත් වරෙව්ෂාගින් (Wereschschagin) ගේ චිත්‍රයන් සිහියට නංවන රණබිම පිළිබඳ පැහැදිලි වර්ණනයන් ගෙන් යුත් වූත් කොටසකි. කවියා විසින් ම මෙහි දී කථාව නො කියා වීරයන් ගේ මහලු මාතාව ලවා ඇය යියැසින් කියන්නා සේ කියවන හෙයින් මුළු දර්ශනය ම වඩා සිත් ගන්නා සුලු වේයි.

වැලැපෙන්නෝ පෙළ සැදී රණබිමට පිවිසෙති. සුන්බුන් වූ මළකඳන්වල දර්ශනය භයංකර ය. මළකඳන් වටා ගිජුලිහිණියෝත්, සිවල්ලුත්, මිනීමස් කන රකුසෝත් රැස් කති. ඒ අතර මළා වූ වීරයන් ගේ මවුවරුන් බිරියෝත් විලාප නඟන්නට වෙති. මේ සිගල්ල දක්නා ගාන්ධාරිය කෘෂ්ණ හට තම දුක කියමින් වැලැපෙන්නට පටන් ගනී. දුර්යෝධන ගේ මළ සිරුර හදිසියෙන් ම දක්නා ඕ සටනට යැමට පෙර දින තමා හමුවට පැමිණ ඔහු සමු ගත් සැටි මහත් දුකින් සිහි කරයි. "වරෙක රුමත් අඟනුන් ඊයින් එලවන ලද වල් විදුනා පවනින් සිසිලස ලැබූ හෙතෙමේ දැන් ගිජුලිහිණියන් ගේ පියාපත් වලින් පමණක් විදුනා ලබයි." එහෙත්, තම වීරෝදාර පුත්‍රයා ගේ දර්ශනයටත් ඛූලි අතරෙහි වැද හෝනා—එහෙත් ස්වර්ගෝත්පත්තිය නිසැකයෙන් ම ලබන්නා වූ තම පුතුන් සිය දෙනා ගේ දර්ශනයටත් වඩා ඇයට අනුකම්පාවක් උපදින්නේ ශෝකයෙන් වියරු වැටී, ලිහී විසිරෙන කේශ කලාපයෙන් යුක්ත ව, ස්වකීය ස්වාමීන් ගේ හා පුත්‍රයන් ගේ ද මෘත ශරීරයන් අතරින් එහා මෙහා දුව යන ලේලියන් සමූහය ගැන ය. ඔබ්බෙන් ලද ඇතුන් අතරෙහි සුනුවිසුනු ව ගිය අග පසඟින් යුක්ත ව "හේ මන්ත ආකාශයෙහි කළු වලාකුලින් වට වූ චන්ද්‍රයා මෙන්" හෝනා තම ප්‍රඥා සම්පන්න පුත්‍රයා වූ විකර්ණ ගේ දර්ශනය ඇගේ නෙතට යොමු වෙයි. ඉක්බිති ඕ තොමෝ අර්ජුන ගේ තරුණ පුත්‍රයා වූ අභිමන්‍යු දකී. මරණය පවා ඔහු ගේ රූපශ්‍රීය මුළුමනින් විනාශ කිරීමට පොහොයත් වී නැත. ඔහු ගේ අභාග්‍යසම්පන්න තරුණ භාර්යාව ඔහු වෙතට ඇදී ඔහු ළෙහි පැහැර ඔහු ඇඳ සිටි බර කවචය මුදා ඔහු ගේ ලේ මුසු කෙස් රොද එක් කොට ගැට ගසා ඔහු හිස තම උකුලට ගෙන අතිශයින් ම ලයාන්විත වූ වචනයෙන් මළ වීරයා අමතා දෙව් ලොවෙහි රුසිරි බර දෙවඟනන් හා ප්‍රීති රමණයෙන් කල් ගෙවන අවිලාවෙක දී හෝ තමා සිහිපත් කරන ලෙස ඔහු ගෙන් යදී. ඉක්බිති ඇගේ බැල්ම හෙළනුයේ වරෙක සියල්ලන් ගේ භීතියට හේතු වූ—එහෙත්, දැන් කුණාටුවෙකින් කඩා වැටුණු ගසක් මෙන් හෝනා කර්ණ කෙරෙහි ය. ඉක්බිති ඕ තොමෝ තම බෑනා වූ

ජයද්රථ නමැති සින්ධු රාජයා දකී. හොඳුරු ලොබින් ඔහු ගේ මිනියට වැසූ ගිජුලිහිණියන් පලවා හැරීමට ඔහු ගේ බිසෝවරුන් දරන උත්සාහය නිෂ්ඵල වෙයි. ඒ අතර ඇගේ දූ වූ දුශ්ශලා තොමෝ විලාප නඟමින් සිය සැමියාණන් ගේ හිස වැලඳ ගනී. එහි ම ශල්‍ය නමැති මද්‍ර රාජයා ගේ දිව ගිජුලිහිණියන් ඔසින් කා දමනු ලබද්දී මඩෙහි එරුණු ඇතකු වටා සොවින් මඩිනු ලැබ පසු වන ඇතින් නන් සේ ඔහු ගේ බිරියන් වැලැපෙමින් වටා සිටින සැටි ඔ දකී. "ඊ තල යහනෙක සැතපෙන හිමි ම දක්නා ඔ මේ නර සූර්යයා හිරු අස්තයට යන්නා සේ තම විශ්‍රාමස්ථානයට යති" සි පවසයි. ද්‍රෝණ, ද්‍රුපද හා ජීවිතක්ෂයට පත් සියලු මහා වීරයන් ද වෙනුවෙන් වැලැපුණු ඕ තොමෝ අන්තිමේ දී කෘෂ්ණ දෙසට හැරී ක්ෂීප ස්වරයෙන් ඔහු අමතා පාණ්ඩව හා කෞරව වංශයන් සමූල ඝාතයට පත් වීම නොවැළැක්වීම ගැන ඔහුට අවලාද කියයි. ඔහුට ශාපයක් කරන ඕ තොමෝ සතිස් සවරකට පසු ඔහු තමා ගේ ම වංශය සමූලඝාතයට පත් කරවා තමාත් ඉතා දුඃඛිත ලෙස මහ වනයෙහි දී විනාශයට පත් වන ලෙසට පතයි.

මිය ගිය සියල්ලන් සඳහා අවමංගල චාරිත්‍ර විධීන් පවත්වන ලෙසට යුධිෂ්ඨිර නියෝග කරයි. චිතක ඉදි කොට ගිතෙල් හා තෙල් ඒ මත වත් කැරෙයි. සඳුන් දර, ඉතා අගනා පට වස්ත්‍ර, සුන් බුන් රිය, ආයුධ යන මේ සියල්ල මෘත ශරීරයන් සමඟ දවනු ලැබෙයි. ආගන්තුකයන් හා හිතවතුන් නැත්තන් ද ඇතුළු ව සියලු මළවුන් වෙනුවෙන් චාරිත්‍ර පැවැත්වීමත් වැලපීමත් නිමාවට පැමිණි පසු මළවුන් සඳහා සාමාන්‍යයෙන් පිදෙන පූජාවන් සඳහා ඔහු සියලු දෙන ම ගංගා නදී ඉවුර බලා යෙති.

පැරණි කාව්‍යය නිමාවට පත් වන්නට ඇත්තේ මෙ තැනිනැයි සිතිය හැකි ය. එහෙත්, අපේ මහා භාරතය වීරයන් පිළිබඳ කථාන්තරය තව දුරටත් කියාගෙන යයි.

අශ්වමේධ යාගය[ක]

කර්ණ තමා ගේ පුත්‍රයකු බවත්, එ හෙයින් සිය වැඩිමහලු සොහොවුරා වූ ඔහු සඳහා පූජාවන් පිදිය යුතු බවත් පළමු වරට යුධිෂ්ඨිර හට කුන්තිය පවසනුයේ මළවුන් සඳහා පූජාවන් පැවැත්වෙන අවස්ථාවෙහි ය. තමා ගේ එ තරම් සංඛ්‍යාවක් ඥාතීන් හා මිත්‍රයන් ද විනාශයට පැමිණීමෙන් පමණක් නො ව, කර්ණ ජීවිතක්ෂයට පැමිණීමෙන් කරන ලද භ්‍රාතෘඝාතය පිළිබඳ අපරාධය ද ගැන යුධිෂ්ඨිර දැන් දුකට පත් වෙයි. අස්වැසිල්ලක් නොලබන හෙතෙමේ වනගත ව තාපසයකු විමට තමා තුළ ඇති අදහස හෙළි කරයි. රාජ්‍ය භාරය උසුලන සේ ඔහු ගේ සොහොවුරන් හා කෘෂ්ණ ද කරන සියලු ඇවිටිලි නිෂ්ඵල වෙයි. තමා ගේ අධිෂ්ඨානය ඉෂ්ට කර ගත් යුතු ම බව හේ තරයේ කියන්නට විය. අන්තිමේ දී ව්‍යාස පැමිණ අශ්වමේධ යාගයක් පැවැත්විය යුතු බවත්, ඉන් ඔහු කළ සියලු පාපයන් විනාශයට පැමිණෙන බවත් කියමින් ඔහුට අවවාද කරයි. යුධිෂ්ඨිර ඔහු ගේ අවවාදය පිළිපදී. මහා යාගෝත්සවයක් පැවැත්වීම සඳහා අවශ්‍ය සියල්ල සම්පාදිත වෙයි. යාග විධියට අවශ්‍ය ලෙස යාග අශ්වයා මුදා හැර අවුරුද්දක් මුළුල්ලේ රට පුරා නිදැල්ලේ සැරි සැරීමට සැලැස්වේ. අශ්වයා පසු පස ගොස් ඌ ආරක්ෂා කිරීමේ කාර්යය අර්ජුනට පැවැරේ. හේ රටින් රටට අසු පසු පසැ යෙමින් ලොව පුරා ඇවිදී. මෙ සේ යන චාරිකාවෙහි දී ඔහුට බොහෝ සටන්වල යෙදීමට සිදු වේ. මේ හැම තන්හි දී ම ඔහුට කුරු ක්ෂේත්‍රයෙහි දී පරාජය කළ රණශූරයන් අයත් ව සිටි ගෝත්‍රයන් විරුද්ධ ව නැඟී සිටි හෙයින් ඔවුන් හා සමඟ යුද වැදීමට සිදු වේ. මහා වීර වික්‍රමයන් කිරීමට ඔහුට සිදු වේ. එහෙත් හෙතෙමේ හැකි තාක් දුරට නුවුවමනා ලේ වැගිරීම්වලින් වැළැකෙන්නට බලමින් පරාජයට පත් සියලු රජවරුනට අශ්වමේධ යාගයට සහභාගි වන සේ ආරාධනය කරයි. වර්ෂාවසානයෙහි හෙතෙමේ යාග අශ්වයා සමඟ හස්තිනාපුරයට පෙරළා පැමිණෙනුයේ මහත් ප්‍රීතිඝෝෂා මධ්‍යයෙහි පිළිගනු ලැබෙයි. ඉක්බිති යාගෝත්සවය ඇරඹේ. ආරාධිත සියලු රජවරු එහි රැස් වෙති. සියලු යාග විධීන් යථා ලෙස පවත්වනු ලැබීමෙන් පසු අශ්වයා මරණයට පත් කොට යාග හින්නට හෙළනු ලැබේ. උගේ ඇට

මිදුළු දැවෙන විට නැඟෙන දුමෙහි පාණ්ඩවයෝ ගැලෙමින් ඔවුන් ගේ සියලු පාපයන් මෝචනයට පත් කරවති. යාගය නිමාවට පත් වීමෙන් පසු යුධිෂ්ඨිර තෙමේ ව්‍යාස හා "අඛිල ධරණීය" පූජා කරයි. ව්‍යාස තෙමේ තමාට පිරිනැමුණු න්‍යාගය පෙරළා ඔහුට පරිත්‍යාගශීලිත්වයෙන් යුතු ව පිරිනමා බමුණන් හට රන් බෙහෙවින් පුදන ලෙස ඔහු දෙයි. යුධිෂ්ඨිර ද එ පරිද්දෙන් ම බමුණන් හට මහත් ස්වර්ණ සම්භාරයක් පූජා කරයි. මෙ සේ සියලු පාපයන් ගෙන් මිදුණා වූ හෙතෙමේ එ තැන් පටන් යහපත් දැහැමි රජකු ලෙස තමා ගේ රාජ්‍යය කරවයි.

ධෘතරාෂ්ට්‍ර ගේ අවසානය

ගෝත්‍ර නායකයා ලෙස මහලු ධෘතරාෂ්ට්‍ර රජු ගේ[51] උපදේශය සියලු කරුණෙහි ලා විමසනු ලැබේ. එ රජුත් ඒ රජු ගේ දේවිය වූ ගාන්ධාරියත් ඉතා ගෞරවස්ථානයෙහි ලා සැලකෙති. මෙ සේ මහලු රජ පාණ්ඩවයන් ගේ හොඳ හිත ඉහළින් ම දිනා ගනිමින් ඔවුන් ගේ රාජ භවනයෙහි පසළොස් වසරක් කල් ගෙවයි. එහෙත් මෙය තරමක් දුරට පලුදු වූයේ හිම කෙරෙහි රජු තුළ පැවැති හැඟීම හේතු කොට ගෙන ය. තමා ගේ පුතුන් සියලු දෙන ම විනාශයට පැමිණවූ භීම හට සමාව දීමට ඉඩක් රජු හදෙහි කෙසේ වත් ඇති නො වෙයි. දෝෂී භීම තෙමේ බොහෝ විට අයථා භාෂණයෙන් තම මහලු මයිලණුවන් ගේ හද පාරවයි. කරුණු මෙ සේ හෙයින් මහලු රජ තෙමේ පසළොස් වසරකට පසු තවුසකු ලෙස වනගත වීමට තීරණය කරයි. මේ සඳහා යුධිෂ්ඨිර කැමැත්ත දෙනුයේ නොකැමැත්තෙනි. එහෙත්, තම ජීවිතය රණ බිමෙහි හෝ තවුසකු ලෙසට වනයෙහි හෝ අවසන් කිරීම හැම විට ම ක්ෂත්‍රියයකු සතු ව පැවති චාරිත්‍රය බව කෘෂ්ණ පවසයි. මෙ සේ ධෘතරාෂ්ට්‍ර තෙමේත් ගාන්ධාරි තොමෝත් වනය බලා යෙති. කුන්තී, සඤ්ජය විදුර යන මොවුහු ද ඔවුන් අනුව යෙති. කලකට පසු පාණ්ඩවයෝ අරණ්‍ය ආශ්‍රමයෙහි කල් ගෙවන තම ඥාතීන් බැලීමට යති. මේ අවස්ථාවෙහි ම විදුර ඍෂිවරයා අවසන් හුස්ම හෙළමින් සිටී. අවුරුද්දකට පසු ධෘතරාෂ්ට්‍ර, ගාන්ධාරී සහ කුන්තී ළැව් ගින්නකට අසු ව ජීවිතක්ෂයට පත් වූ බවත් සඤ්ජය හිමවත බලා ගිය බවත් පිළිබඳ පුවත පාණ්ඩවයනට සැළ වේ.

කෘෂ්ණ ගේ සහ ඔහු ගේ වංශයේ විනාශය

කුරුක්ෂේත්‍රයෙහි මහා සංග්‍රාමය සිදු වී ස තිස් වසරකට පසු ගාන්ධාරි ගේ ශාපය[53] සැබෑ වීම පිළිබඳ පුවත පාණ්ඩවයනට සැළ වෙයි. කෘෂ්ණ සහ ඔහු ගේ වංශය ද විනාශයට පත් වෙයි. මධුපානෝත්සවයෙක දී පැන නඟින අර්බුදයෙක විපාකයක් වශයෙන් ගෝත්‍ර දෙකක නායකයන් අතර කලහයෙක් ඇති වේ. මේ විග්‍රහයට සෙස්සෝ ද එක් වෙති. මෙහි දී සාමාන්‍ය මුගුරු සටනෙක් හට ගනී. මෙහි දී කෘෂ්ණ විසින් පන් ගස් මුගුරුවලට පෙරළනු ලබන හෙයින් යදව ගොත්‍රයෙහි වූවෝ උනුන් මරා ගනිති. තම සොහොවුරා වූ බලදේව ගැන සොයන කෘෂ්ණ හට දක්නට ලැබුණේ ඔහු මිය යෙමින් සිටි බව ය. බලදේව ගේ මුවින් නික්මෙන ශ්වේතවර්ණ නාගයෙක් සාගරය[54] බලා ඇදී යනුයේ ප්‍රසිද්ධ නාග රාක්ෂසයන් විසින් පිළිගනු ලබයි. ඉක්බිති කෘෂ්ණ හුදෙකලා වනයෙහි හිඳ ගෙන ගැඹුරු භාවනාවෙක යෙදෙයි. මෙහි දී ජරා (එ නම් 'මහලු විය') නමැති වැද්දකු විසින් මුවෙකැයි වරදවා ගනු ලබන්නේ ඊයෙකින් විදලනු ලබයි. තම යට පතුල පලා ගිය ඊ පහරින් හෙතෙමේ මරුමුවට පත් වෙයි. ඔහු මරුට බිලි ගත හැකි වූයේ ද මෙ තන්හි දී පමණකි.

පාණ්ඩවයන් ගේ අවසන් ගමන

තමන් ගේ විශ්වස්ත මිත්‍රයා ගේ මරණය ගැන පාණ්ඩවයනට ඇති වනුයේ වාවා ගත නොහැකි ශෝකයෙකි. එ හෙයින් මේ සිද්ධියෙන් පසු ඔවුන් ගේ අවසන් ගමන ගැනීමට ඔහු තීරණය කෙරෙති. පරීක්ෂිත් හට සිහසුන පවරන යුධිෂ්ඨිර තෙමේ තම

වැඩියන් ගෙන් සමු ගනී. ඉක්බිති සොහොයුරෝ පස් දෙනත් ඔවුන් ගේ බිරිය වූ ද්‍රෞපදියත් කසාවත් හැඳ බල්ලකු පමණක් පිරිවර කොට ඇති ව හිමාලය බලා යෙති. හිම කුළු නගින ඔහු මේරු නමැති දිව්‍ය පර්වතය කරා පැමිණෙති. දෙව් ලොව බලා යන අතරමඟ දී පළමු ව ද්‍රෞපදියත් ඉක්බිති සහදේවත් ඉක්බිති නකුලත් ඔහුට අනතුරු ව අර්ජුනත් අවසන් වරට භීමත් මැරී වැටෙති. ඉක්බිති ඉන්ද්‍ර තෙමේ තම දිව්‍ය රථය පදවා ගෙන යුධිෂ්ඨිර දෙව් ලොවට කැඳවාගෙන යෑමට පැමිණෙයි.[56] එහෙත් යුධිෂ්ඨිර තම සොහොවුරන් නැති ව දෙව් ලොව විඹීමට අකැමැති වන හෙයින් ඔහු කැපි ව යෑමට කැමැති නො වෙයි. ඉක්බිති ඉන්ද්‍ර තෙමේ ඔහු ගේ සියලු සොහොවුරනුත් ද්‍රෞපදියත් දෙව් ලොවට පැමිණවීමට වග බලා ගන්නා බවට පොරොන්දු වෙයි. එහෙත්, තම බල්ලාත් ස්වර්ගයට පිවිසිය යුතු බව යුධිෂ්ඨිර කියා සිටී. එහෙත් ඉන්ද්‍ර කවර හේතුවක් නිසා වත් ඌ එහි ගෙන යෑමට බැරි බව පවසයි. අන්තිමේ දී මේ සුනඛයා තමා අත් කිසිවකුත් නො ව ධර්ම දේවයා බව නියම වේශය ගෙන ප්‍රකාශ කරයි. ඉන් යුධිෂ්ඨිර තුළ පවත්නා මහත් හිතවත්කම පිළිබඳ ව ඉන්ද්‍ර දේවයා අතිශය තෘප්තියට පත් වෙයි. මෙ සේ ඔහු සියල්ලෝ ම ස්වර්ගය කරා පැමිණෙති. එහෙත්, තම සොහොවුරන් ගේ ද්‍රෞපදිය හෝ එහි නොදක්නා බැවින් ස්වර්ගයෙහි රැඳී සිටීමට යුධිෂ්ඨිර කැමති නො වෙයි. දිව්‍ය සිංහාසනයෙක හිඳිමින් සියලු දෙනා ගෙන් සම්මාන ලබමින් දුර්යෝධන[57] වැජඹෙනු දක්නා ඔහුට දෙව් ලොව එපා වෙයි. ඒ හෙයින් ගේ තමා සිය සොහොරවුන් හා කර්ණ වැනි වීරයන් ද සිටින ලෝකයට පමුණුවන ලෙස ඉල්ලා සිටී. ඉක්බිති දෙවියෝ නිරයට කැපි ව යනු පිණිස ඔහුට දූතයකු දෙති. එහි දී ඔහුට නිරයට නියම වූවන් විඳින මහත් භයානක වධ හිංසා දක්නට ලැබේ. මේ භයංකර දර්ශනයෙන් ඉවත් ව යෑමට ඔහු සැරසෙන විට ම ඔහුට නවතින ලෙස නඟන ශබ්දයක් ඇසේ. ඒ සමඟ ම පරාර්ථචාරී අධ්‍යාශයක් ඔහු තුළ පහළ වේ. අනුකම්පාවෙන් බර ව ඇති හදින් හෙතෙමේ එ සේ වධ හිංසාවට ලක් ව ඇත්තේ කවර ආත්ම දැයි විමසයි. ඔවුන් තම සොහොවුරන් හා මිතුරන් බව ද ඔහුට දන්වනු ලැබේ. ඒ ඇසීමෙන් දෙවයේ අසාධාරණතාව ගැන කෝපයටත් වේදනාවටත් පත් හෙතෙමේ දෙවියන් වෙතට ආපසු දූතයා යවා තමා දෙව් ලොවට නොයන බවත් නිරයෙහි රැඳෙන බවත් කියා යවයි. එහෙත් දෙවියෝ වහා ඔහු වෙත පැමිණෙති. බෙහෙවින් පව් කළවුන් පළමුවෙන් ස්වර්ගයට යවා ඉන් පසු නිරයට යවන බවත් මදක් පව් කළවුන් එහි විපාක නිරයෙහි දී වහා විඳ ඉන් පසු ස්වර්ගයට ගොස් නිත්‍ය සුඛය විඳිය හැකි සේ පළමුවෙන් නිරයට යැවෙන බවත් කියමින් ඉන්ද්‍ර යුධිෂ්ඨිර හට කරුණු පැහැදිලි කොට දෙයි. ඔහු ද්‍රෝණ රවටා ඇති හෙයින් ඔහුට ද පළමුවෙන් නිරයට යෑමට සිදු වන බවත් එ ලෙසට ම ඔහු ගේ සොහොවුරනට හා මිතුරනට ද තම තමා කළ පාපයන් සඳහා නිරයෙහි දී විපාක විඳ අවසන් කළ යුතු ව ඇති බව ද ඔහුට පැහැදිලි කරිණ. කෙසේ හෝ වැඩි කල් නොගොස් ම නිරයේ ගොරබිරම බව අතුරුදහන් ව යෙයි. ඔහු සියලු දෙන ම දෙව්ලොවෙහි පැනී දිව්‍ය ශරීර ලබති.[58]

සංක්ෂේපයෙන් මෙහි දී ඉදිරිපත් කරන ලද මේ ප්‍රධාන කථාවට මහා භාරතයේ පර්ව අටලොසින් බාගයක් තරම් කොටසක් මිඩංගු ව ඇත.[59] ඉතිරි බාගයට අයත් වනුයේ කෞරවයන් හා පාණ්ඩවයන් ද අතර ඇති වූ අරගලයට කිසිත් සබඳකමක් නැති නොහොත් ඉතා මද සබඳකමක් ඇති කථාන්තර හා උපදේශාත්මක කාරණා ය. මේ පිළිබඳ විස්තරයක් පසු ව ලියැවෙන පරිච්ඡේදයන්හි දී ඉදිරිපත් කරනු ලැබේ.

මහාභාරතයෙහි පළ වන පෞරාණික වීර කාව්‍යය

රජුන්ගේ වංශාවලීන් පිළිබඳ තොරතුරු සෙවීම හෝ අවශ්‍ය වුව හොත් වංශාවලීන් නිර්මාණය කිරීම ද පැරණි භාරතීය කවීන් සතු කාර්යයන් හෙන් එකක් විය. ඒ හෙයින් වංශාවලී පද්‍යයෝ (අනුවංශ ශ්ලෝක) පැරණි වීර කාව්‍යයෙහි අවශ්‍ය කොටසකට අයත් වූ හ. දෙවියන් හෙත් පැවතෙන තම ආදි මුත්තාවරුන් දක්නා වීරයන් ගේ පරම්පරාව කියැවෙන 'සම්භව පර්වන්' හෙවින් 'පරපුර පිළිබඳ කොටස' යන නමින් හැඳින් වෙන සම්පූර්ණ කාණ්ඩයක් ම මහා භාරතයේ මුල් පර්වයට ඇතුළත් වේ. පුරාණ කාලයෙහි වුසූ මේ පැරණි රජුන් පිළිබඳ රසවත් වෘත්තාන්ත රාශියක් මේ කොටසෙහි කියවන්නට ලැබේ. භරත වර්ගයාට අයත් කෞරවයන් ගේ හා පාණ්ඩවයන් ගේ ද ආදි මුත්තාවන් අතරෙහි භරත ගැන කියවන්නට නොලැබෙනවා නො වේ. මහාභාරතයට පවා නම ලැබෙනුයේ ඔහු හෙනි. භරත වූ කලි කාලිදාස ගේ නාටකයෙන් ප්‍රසිද්ධි යට පත් දුශ්‍යන්ත රජු ගේ හා ශකුන්තලා ව ගේ ද පුත්‍රයා ය. මේ කථාව ද මෙහි සම්භව පර්වයෙහි දී කියවන්නට ලැබේ.

අභාග්‍යයකට මෙන් මහාභාරතයෙහි ඇති මේ ශකුන්තලා කථාව[1] ම අප අතට පත් ව ඇත්තේ බෙහෙවින් විපිරුණු තත්ත්වයෙකින් හා ඇතැම් විට විපර්යාස වූ ද ස්වරූපයෙනි. පැරණි වීර කාව්‍යයේ ලක්ෂණ ස්වල්පයක් පමණක් අවශිෂ්ට ව ඇති මේ ස්වරූපය කාලිදාස ගේ කාව්‍යයේ මූල බීජය වූයේ යැයි සිතීම අපහසු ය. වනය, දඩ කෙළිය, හා ආශ්‍රම පිළිබඳ වර්ණන යන් වීර කාව්‍යය හා හෙතී ඇති බවක් නො පෙනේ. ඒ වෙනුවට ඒ හැම පශ්චාත්කාලීන අලංකාර කාව්‍යයේ රටාවට අනුව පණ්ඩිත ස්වරූපයේ අතිශයෝක්තියකට නංවනු ලැබ ඇත. මුළු කථාව ද සිත් ගන්නා සුලු බැවින් තොර වන අතර කලාත්මක පදනමක් එයට නැත. කාලිදාස ගේ නාටකයෙහි දී මෙන්, රජ ශකුන්තලාව නොපිළිගන්නේ ශාපයෙක විපාකය හා නැති වූ මුදුව පිළිබඳ කථාව ද නිසා යැයි දක්වන හේතු මෙහි ඉදිරිපත් කොට නැත. ඒ වෙනුවට රජ එ සේ කරනුයේ තම පුත්‍රයා රාජ කුමාරයකු ලෙස උපන් බව සැබැවක් බවට රාජ සභිකයන් තුළ පවත්නා ශියලු සැක දුරු කිරීමට රජුට උවමනා වූ නියා යැයි කියැවේ. එ හෙයින් හෙතෙමේ දෙවියන් ගේ තීන්දුවක් උල්ලංඝනය කරයි. ශකුන්තලා ගැන නොදන්නා බව අහවන රජ ශකුන්තලා පැවසුවේ සැබෑවක් ය. ඇගේ දරුවා සැබෑ ම දුෂ්‍යන්ත රජු ගේ පුත්‍රයෙක් ය යන්න මුළු රාජ සභාවට ඇසෙන සේ දිව්‍යස්වරයකින් ප්‍රකාශ වීම තෙක් තමා ගේ පුත්‍රයා පිළිගැනීමට කැමැති නො වෙයි. ශකුන්තලා කාව්‍යයේ ඉපැරණි ම කොටසට අයත් ලෙස සහතික වශයෙන් අප දන්නා වූත් පැරණි රාජ සභා කාව්‍යයෙන් උපුටා ගැනුණා වූත් පද්‍ය දෙකක් මෙහි දී අපට හමු වේ.[2]

[1] මව වූ කලි (බීජය සුරැකීම සඳහා ඇති) සම් මල්ලක් පමණි. දරුවා අයත් වන්නේ පියාට ය. ඔහුට ද ම උපන් පුත්‍රයා තෙමේ වනු ම ය. එම්බා දුෂ්‍යන්ත, ඔබ ගේ පුත්‍රයා පිළිගෙන වඩන්න." ශකුන්තලාවට අවමන් නොකරන්න.

එම්බා මහ රජ, දරුවන් ලබන පුත්‍රයා යම් ලෝකයෙන් බැහැර කොට (පියවරුන් දෙව් ලොව කරා) පමුණුවයි. මේ බීජයේ නිර්මාතෘ ඔබයි. ශකුන්තලාව සැබෑවක් ම පැවැසුවා ය."

තමා ගේ ද, සිය පුතණුවන් ගේ ද අයිතිවාසිකම් රැක ගැනීම සඳහා ඉදිරිපත් වන ශකුන්තලා සහ ඇය භාර ගැනීමට නොකැමැති රජතුමා ද, අතර සංවාදයෙහි පුරාණ අව්‍යාජ ශ්ලෝක රාශියක් ම නො නැසී පවත්නේ විය හැකි ය. ඒ කෙසේ වුව ද, මෙ බඳු සංවාදයක් පුරාණ කථාන්තරයෙහි මුඛ්‍යාංගයන් ගෙන් එකක් විය යුතු ය. පහත දැක්වෙන රමණීය ශ්ලෝකය වැනි ආප්තෝපදේශ ශකුන්තලා ගේ කථාවෙහි අන්තර්ගත වන්නට ඇත:

මන්‍යතෙ පාපකං කෘත්වා න කශ්චිද්වේත්ති මාමිති
විදන්ති චෛනං දේවාශ්ච යශ්චෛවාන්තර පූරුෂඃ

(I–74–29)

"කවුරුත් නො ම දකිති මා පාපයෙ — බැඳෙන
සිතුවත් මෝඩයා බෝ එසිතර — සිතින
දෙවියොත් දකිති පවිකම් ඔහු සිට — කරන
ඔහු මත් නො දකී ද සැවි ඔහු — ඇතුළතින

පුතකු නිසා පියකු හට අත් වන සැපත හා වාසනාව ගැන ද, ශකුන්තලා මතු දැක්වෙන ශ්ලෝකයන් ගෙන් ප්‍රකාශ වන්නා මෙන් පවසන්නට ඇත:

ආත්මාත්මනෛව ජනිතඃ පුත්‍ර ඉත්‍යුච්‍යතේ බුධෛඃ
තස්මාද් භාර්‍යාං නරඃ පශ්‍යෙත් මාතෘවත් පුත්‍රමාතරම්
ප්‍රතිපද්‍ය යදා සුනුර් ධරණීං රෙණු ගුණ්ඨිතඃ
පිතුරාශ්ලිෂ්‍යතේ'ංගානි කිමස්ත්‍යභ්‍යාධිකං තතඃ
ත්වදංගේභ්‍යඃ ප්‍රසූතෝ'යං පුරුෂාත් පුරුෂෝ පරඃ
සරසීවාමලේත්මානං ද්විතීයං පශ්‍ය වෛ සුතම්

(I–74–48,53,65)

"තෙමේ ම පුතකු ලෙස නැවත ඉපදී ඇතැයි පඬිවරු පවසති.[5] සිය පුතුන් ගේ මැණියන් වන බිරිය තමන් ගේ ම මැණියන් ලෙස ස්වාමියා විසින් සැලකිය යුතු වන්නී ඒ බැවිනි".

"දූලි තැවරුණු බොළඳ පුතු සෙල්ලමෙහි යෙදී සිට දුව අවුත් පියාණන් ගේ දෙපා වැලඳගන්නා අයුරු දැකීමට වඩා තවත් කවර වාසනාවක් ද?"

"හෙතෙමේ ඔබ ඇඟ මසින් උපන්නේ ය; එක ආත්මයෙකින් තවත් ආත්මයක් පහළ විණි. කැටපතක් මෙන් පැහැදිලි තවාකයෙක පැනෙන දෙ වන ආත්මයක් බඳු ඔබ පුත් කුමරා වෙත නෙත් හෙළනු මැනව්."

එහෙත් ශකුන්තලා ගේ මුවට නඟනු ලබන රමණීය කියුම් සියල්ල ම, විවාහ ජීවිතයෙහි ප්‍රීතිය ද අඹුසැමි යුවළ ගේ යුතුකම් ද පියා ගේ යුතුකම් හා සත්‍යවාදී බව ද, පිළිබඳ ව කියැවෙන කියුම් සියල්ල පුරාණ වීර කාව්‍ය යට සැබෑවින් ඇතුළු වූහ'යි සිතිය නොහැකි ය. නීති සාහිත්‍යයෙන් කෙළින් ම උපුටා ගත් වෛවාහික නීති හා උරුමය පිළිබඳ අයිතිවාසිකම් කියා පාන ශ්ලෝකවලින් සමහරක් සදාචාරය හා නීතිය ද පිළිබඳ වැඩි ගණන හැකි තරම් වැඩි කිරීමේ පරමාර්ථයෙන් බ්‍රාහ්මණ පණ්ඩිතයන්

විසින් ශකුන්තලාව ගේ කථා උපයෝගි කොට ගෙන ඇති බව හඟවයි. එහෙත් පහත දැක්වෙන පද්‍ය වැනි ඉන්දීය උපදේශ කාව්‍ය පිළිබඳ විශිෂ්ටතම නිදසුන්වලින් සමහරක් මේ කථාවල මත් දක්නට ලැබෙනු මින් නො වැළැක්වෙයි:

අර්ධං භාර්යා මනුෂ්‍යස්‍ය භාර්යා ශ්‍රෙෂ්ඨතමා සඛා
භාර්යා මූලං ත්‍රිවර්ගස්‍ය භාර්යා මූලං තරිෂ්‍යතඃ
භාර්යාවන්තඃ ක්‍රියාවන්තඃ සභාර්යා ගෘහමේධිනඃ
භාර්යාවන්තඃ ප්‍රමෝදන්තෙ භාර්යාවන්තඃ ශ්‍රියාන්විතාඃ
සඛායඃ ප්‍රවික්තේෂු භවන්තෙ‍්‍යතඃ ප්‍රියංවදාඃ
පිතරෝ ධර්ම කාර්යේෂු භවන්ත්‍යාර්තස්‍ය මාතරඃ
කාන්තාරේෂ්වපි විශ්‍රාමෝ ජනස්‍යාධ්වනිකස්‍ය වෙ
යඃ සදාරරඃ සවිස්වාස්‍යස්ව තස්මාදාරාඃ පරගතිඃ

(I–74–41–44)

" බිරිඳක් අඩක් වෙයි සැමියා ගෙන් ඇය ගේ
වැඩි වෙයි මිතුරනට අන් සැම ඇය ගේ
ගෙන දෙයි මෙ ලොව සම්පත් ඕ සියලු රගේ
ගැලැවුම පවා ලැබෙනුයෙ ඇය ගෙන ඔහු ගේ

" මනහර මෙ අඟනහු ලොව ගෙන දෙති සතුට
පියකර මිතුරො වෙති උන් තනි වූ කලට

උර හා බලන ලද හැකියාවන් තිබෙන
නැණවත් පියවරුන් මෙන් ලොව තුළ අඟන
උපදෙස් අවවාද ගුරුහරුකම් දෙමින
දක්වති යහපතට මඟ සැම් හට නිතින

කරදර දුකක් තැවුලක් අප විඳින වීට
අදරති මවුන් ලෙස සැනසිලි දෙති අපට

ඇවිදින අතර මිනිසා දිවි කතරෙ වැද
පත් වුණු කලට වෙහෙසට ඔහු හට එ සඳ
හමු වන නවාතැන් පොළ වෙයි ඔහු බිරිඳ
හරිමින විඬා හේ එහි සුව විඳියි ඕඳ

මහාභාරත වීරයන් ගේ මුතුන්මිත්තන් අතර යයාති නම් රජකු ගැන සඳහන් වෙයි; මේ රජු ගේ ඉතිහාසය වංශකථා පිළිබඳ වූ සූත කාව්‍ය ඇතුළත් කොටස වූ "සම්භව පර්වයෙහි" ද කියැවෙයි.[6] එහෙත් නීතිය හා සදාචාරය ද පිළිබඳ බ්‍රාහමණ උපදේශ ගෙන හැර දැක්වීමේ පරමාර්ථ යෙන් පුරාණ ශකුන්තලා කාව්‍යය උපයෝගි කොට ගත් අයුරින් ම මුලින් ටයිටන් පුරාවෘත්තය වැනි පුරාවෘත්තයක් වූ බව පෙනෙන යයාති පුරාවෘත්තය ද සදාචාර කථාන්තරයකට පෙරළා ගැනීම හේතු කොට ගෙන සෘෂි කාව්‍ය සඳහා ජනප්‍රිය මාතෘකාවක් බවට පත් විය. එතෙකුදු වුවත්, පුරාණ වීර කාව්‍යයෙහි ලක්ෂණ මුළුමනින් මැකී ගියේ නො වේ; රජ තුමා ගේ භාර්යාවන් දෙ දෙනා පිළිබඳ කතා පුවත විස්තර කිරීමෙහි දී දැක්වෙහෙන රවවත්[7] පරිහාසයෙකින් මෙය විශේෂයෙන් පැහැදිලි වෙයි. යයාතිකථාවට විෂය වූ කරුණු අතරින් උපුටා දැක්විය හැක්කේ පහත දැක්වෙන කොටස පමණකි:

අසුර රජු ගේ ශර්මිෂ්ඨා නම් දුව දිසින් ශුක්‍ර නම් අසුර පූජකයා ගේ දේවයානී නම් දුවට නිග්‍රහ කරන ලදී. මේ හේතු කොට ගෙන පූජක නැන රජු හැර යාමට අදහස් කරයි. එ විට රජු සිය දුව දේවයානිය ගේ දාසියක වශයෙන් පාවා දෙයි. නොබෝ කලකින්ම දේවයානිය යයාති රජු සමඟ විවාහ වන්නී ය. ඇගේ "දාසිය" වූ ශර්මිෂ්ඨා කුමරිය ඇසුරු නොකිරීමට පොරොන්දු වීමට රජුට සිදු වෙයි. එහෙත් සිය ප්‍රතිඥාව කඩ කරන රජු ශර්මිෂ්ඨා හා රහසින් විවාහ වෙයි. ඔහුට දරු ව ඇයට පුත්තු තිදෙනෙක් උපදිති. ඊර්ෂ්‍යා සහගත දේවයානී මෙය දැන ගෙන ශුක්‍ර නම් සිය පියා හට පැමිණිලි කරයි. වහා ම යයාති ගේ තාරුණ්‍යය පහ ව ගොස් ජරපත් මහල්ලකු බවට පත් විය යුතු යයි ශුක්‍ර තෙමේ ශාප කරයි; එ සේ වුව ද, යයාති ගේ ආයාචනය නිසා සිය මහලු බව අන් කිසිවකු හට පවරා දීමට හැකි වන පරිදි හෙතෙම සාපය ලිහිල් කරයි.

ක්ෂණයෙකින් මහලු ව, රැළි වැටී, ජරපත් වූ යයාති සැහෙන පමණ ජීවිතයෙහි සුඛාස්වාදය නො කළ බැවින් සිය පුතුන් ගේ තාරුණ්‍යය තමනට දෙමින්, සිය මහලු විය ඔවුන් වෙත පවරා ගැනීමට පිළිවෙලින් සිය පුත්‍රයන් ගෙන් ඉල්ලා සිටී. වැඩිමහල් පුතුන් එකෙකුදු මේ ඉටුමාරුවට කැමති නොවන කල්හි පියා ඔවුනට ශාප කරයි. සියල්ලනට ඇල පූරු කුමරා ඊට කැමැත්ත ප්‍රකාශ කරයි. මහලු වියෙහි බරින් සිය පියාණන් මුදවා තෙනෙම් සිය තාරුණ්‍යය ඔහු වෙත පවරයි. එ කල්හි තවත් සහස් වසක් නිරෝග තාරුණ්‍යය භුක්ති විඳින යයාති රජ ජීවිතයෙහි සැප සම්පූර්ණයෙන් විඳී. හෙතෙම සිය බිරියන් දෙ දෙන සමඟ රමණය කරනු පමණක් නො ව විශ්වාචී ("සියල්ලනට කරුණාබර") නැමැති සුන්දර අප්සරාවක සමඟ ද රමණය කරයි. එහෙත් කොතෙක් සැප විඳ ද ඒ හේ සම්පූර්ණ තෘප්තියට පත් නො වෙයි. සහස් වස ගෙවී ගිය නැන, පහත දක්වෙන ශ්ලෝකයන් ගෙන් පැවසෙන පරිදි එක්තරා නිගමනයකට හෙතෙමේ එළඹෙයි.

න ජාතු කාමඃ කාමානාමුපභෝගේන ශාම්‍යති
හවිෂා කෘෂ්ණවර්ත්මේව භූය ඒවාභිවර්ධතේ
පෘථිව් රත්න සම්පූර්ණා හිරණ්‍යං පශවඃත්‍රියඃ
නාලමේකස්‍ය තත්සර්වමිති මත්වා ශමං ව්‍රජේත්
යදා න කුරුතේ පාපං සර්වභූතේෂු කර්හිචිත්
කර්මණා මනසා වාචා බ්‍රහ්ම සම්පද්‍යතේ තදා
යදා චායංන බිභේති යදා චාස්මාන්න බිභ්‍යති
යදා නේච්ඡති න ද්වේෂ්ටි බ්‍රහ්ම සම්පද්‍යතේ තදා

(I-75-50-53)

සැබැවින නො ම සිදෙයි ආසා පිනෑවුමෙහා
ඕස බලවත් ව නැඟ එනු ගිනි සෙ ගිතෙලින
නිදහන්වලින් රන් රුවනින් ද අපමණ
ගව සම්පතින් සහ තව නෙක ලඳුන් ගෙන

ලෙ පොළොව පිරී ඇත එක ලෙස සියලු තැන
එ නමුත් එකකුටත් එය නො ම වෙයි පමණ
ඒ ගැන ඉදින් තොප සිත යෙමු කරවමින
සොයනු යෙහෙකි නුවූ වන සැපි ලද දෙයින

කයින් සිතින් වචනෙන් හෝ කිසි කලෙක
නොකළ කෙනෙක් වෙද ලොව සතකුට දෙසෙක
ඔහුට පමණක් ම බ්‍රහ්මන් වෙත නිසැක
බැඳීමට වැසයෙහි වර ලැබිය හැක

නොකරවන සතුන් හට බිය කිසි අසුර
නොමැති බිය සිතෙහි රා දෙස්වලිනි තොර
කෙනෙක් වෙද පමණී ඔහු හට ලෙසින තිර
ලැබිය හැකි බඹහු වෙත වාසයට වර"

අනතුරු ව පූරු නම් සිය පුත් කුමරු හට ඔහු ගේ තාරුණ්‍යය නැවත ලබා දෙන්නේ සිය මහලු වියෙහි බර දරමින්, පූරු කුමරුන් සිංහාසනාරූඪ කොට, අරණ්‍යගත ව උග්‍ර තපස් රකිමින් සහස් වසක් තවුස් දම් පුරයි. ඒ අනුහසින් ස්වර්ප්‍රවිෂ්ට ව, සියලු දෙටුමුනිවරුන් විසින් පූජිත ව දිගු කලක් වාසය කරයි. එ සේ වුව ද දිනක් ඉන්ද්‍ර දෙවියන් සමඟ සල්ලාපයෙන් පසු වන අතර ආත්ම වර්ණනයට වැටීමේ වරද හේතු කොට ගෙන දෙව් ලොවින් නෙරපනු ලබයි. එතෙකුදු වුවත් පසු කාලයෙක හෙතෙමේ සිය සැදෑහැවත් මුනුබුරන් සතර දෙන ද කැටුව පෙරළා දෙව් ලොවට පැමිණෙයි.

මහාභාරතයෙහි කිහිප වරක් කියැවෙන[8] **නහුෂ** නම්, යයාති රජු ගේ පියා පිළිබඳ පුරාවෘත්තය ද ටයිටන් පුරාවෘත්තයට සමාන වන්නකි; එය **දෙව් ලොවින් නෙරපීමකින් අවසන් වෙයි:**

වෛදික සාහිත්‍යයෙහි ප්‍රසිද්ධියට පත් ව සිටි **පුරූරවස්** රජු ගේ මුනුබුරකු වූ නහුෂ **සොර මුළු සංහාරය කළ** (දස්‍යුසංඝාතාන්) **වික්‍රමාන්විත රජෙකි. එහෙත් සෘෂීන් ගෙන්** පවා බදු කර ගත් හෙතෙමේ බර අදින සතුන් පරිද්දෙන් ඔවුනට තමා කර පිටින් උසුලා ගෙන යාමට නියම කළේ ය. දෙවියන් පවා බිය පත් කළ හේ ඉන්ද්‍ර දෙවියන් වෙනුවට දිගු කලක් දෙව් ලොව ද පාලනය කළේ ය. ඉන්ද්‍ර දෙවියන් ගේ ශචී නම් බිරිය සරණ පාවා ගැනීමට අදහස් කළ ඔහු ගේ අහංකාරය කෙ බඳු වී ද යත් හේ දිව්‍ය සෘෂිවරුන් සිය රථයෙහි බැඳගෙන **අශ්වත්‍ය** සෘෂීන් ගේ හිස පැහි ය. මේ වරද ඉවසිය නොහැකි වූ මහා සෘෂිවරයා නහුෂ රජුට සාප කළෙන් දෙව් ලොවින් වැටී දස දහස් වසක් නා වෙසින් මිනිස් ලොව කල් යැවීමට ඔහුට සිදු විය.[10]

මහාභාරතයෙහි අන්තර්ගත වූ ඇතැම් කාව්‍ය කොතරම් විශාල වේ ද, කොතරම් දුරට අංග සම්පූර්ණ කාව්‍යයක් තනන්නේ ද යත්, ඒවා වංශ කථාවක් ඇතුළත ඇති තවත් වංශ කථා ලෙස සැලකිය හැකි වෙයි. උචිත ලෙස ම ප්‍රසිද්ධියට පත් **නල-දමයන්ති** කාව්‍යය විශේෂයෙන් මෙවැන්නකි. පාණ්ඩවයන් පිටුවාසල් ව වනයෙහි වසන කල්හි බෘහදශ්ව නම් සෘෂිවරයා ඔවුන් වෙත පැමිණෙයි. තමන් ගේ ද, තම නෑයන් ගේ ද අභාග්‍යය ගැන කථා කරන යුධිෂ්ඨිර තමාට වඩා අභාග්‍ය සම්පන්න රජෙක් ලොව තවත් වී දැයි ඔහු ගෙන් අසයි. එ කල්හි බෘහදශ්ව සෘෂිවරයා, **පුෂ්කර** නම් **සිය** සොහොයුරා සමඟ දූ කෙළියෙන් පැරදී තමන් සතු සියල්ලත්, තම රාජධානියත් අහිමි වී, රටින් නෙරපනු ලැබ පතිවත රකින **දමයන්ති** නම් සිය රුමත් බිරිය සමඟ වන වැදුණු අභාග්‍ය සම්පන්න **නල** රජු ගේ කථාන්තරය ගෙන හැර දක්වයි; දූ කෙළිය නම් වන කුරිරු යක්ෂයා විසින් ලුහු බඳින ලද, අන්ධ කරන ලද හෙතෙම සිය සෙනෙහෙබර බිරිය වනයෙහි සැරිසැරීමෙන් විඩාපත් ව තද නින්දේ පසු වෙද්දී ඇය මහ වන මැද තනි කොට පලා යයි. නල රජුට හා, සිය සැමියා විසින් අත් හරිනු ලැබ දමයන්තියට ද මුහුණ පෑමට වූ අනතුරු ද, ඔවුනොවුන් ගෙන් වියෝ ව ඔවුන් වනයෙහි තැනින් තැන සැරිසරන අයුරු ද, නොමද දුක් කරදර අනුභව කිරීමෙන් පසු ව දමයන්තිය **චේදි** රට මව් බිසව විසින් ආදරයෙන් පිළිගනු ලබන අයුරු ද **කර්කෝටක** නම් නාග රාජයා විසින් හඳුනා ගත නොහැකි සේ විරූප කරන ලද නල රජු රියැදුරකු හා අරක් කෑමියකු ද වශයෙන් සෘතුපර්ණ රජුට සේවය කරන අයුරු ද, සිත් වේදනා **දෙන** දීර්ඝ වියෝගයකින් පසු ව අවසානයෙහි අඹුසැමි දෙ දෙන එක් ව

ප්‍රේමයෙන් කල් යවන අයුරු ද යන මේ සියල්ල උද්වේග දනවන, සරල, හාස්‍ය රසයෙන් ද අනූන, අතිශය ජනප්‍රිය සුරංගනා කථා ශෛලියෙන් ගෙන හැර දක්වෙයි.

1819 දී fප්‍රාන්ස් බොප් විසින් නල රජු පිළිබඳ මේ කාව්‍යය ලතින් පරිවර්තනයක් ද සමඟ පළමු වරට ප්‍රකාශයට පත් කළ අවස්ථාවෙහි පටන් මෙය ඉන්දීය සාහිත්‍යයෙහි පමණක් නො ව විශ්ව සාහිත්‍යයෙහි ද සාහිත්‍ය රත්නාවලීන් එකක් ලෙස පිළිගනු ලැබේ. මේ කාව්‍යයෙහි බොප් ගේ සංස්කරණය හා පරිවර්තනය ඒ. ඩබ්ලිව්. වොන් ශ්ලීගල්[13] විසින් මතු දක්වෙන වචනවලින් සම්මානයට පත් කරනු ලැබී ය: "කරුණ රසයෙන් හා ශිල්ප ගුණයෙන් ද, හැඟීම් ඉදිරිපත් කොට ඇති සිත් වශී කොට ගන්නා සුවිශෙෂයෙන් හා මෘදු ගුණයෙන් ද මට සිතෙන අන්දමට මේ කාව්‍යය ඉක්මවිය නොහැකි බව පමණක් මම පවසමි. තරුණ, මහලු, කුලීන, රදළ හා ඉවෙන් මෙන් ඒ කරා ඇදී යන්නවුන් යන සියලු දෙනාට ම විශේෂයෙන් ප්‍රිය උපදවන පරිදි මෙය රචිත ව ඇත. එ පමණක් නො ව, මේ සුරංගනා කථාව් ඉන්දියාවෙහි බෙහෙවින් ජනප්‍රිය ව පවතී..... එහි දමයන්තිය ගේ ධෛර්ය සම්පන්න තිර ගුණය හා දෘඪ භක්තිය අප අතර පෙනිලෝප් ගේ එ වන් ගුණ මෙන් ප්‍රසිද්ධ ය; සැම මහාද්වීපයක ම, සැම යුගයෙක ම කෘතීන් එක් රැස් වන ස්ථානය වූ යුරෝපයෙහි ද එය එ සේ ම ප්‍රසිද්ධියට පත් වීම සුදුසු ය." ඇත්ත වශයෙන් ම මෙය සිදු වී ඇත. පරිවර්තනයෙහි හසළ පණ්ඩිතයකු වූ fඋඩ්රිච් රුකව් නම් ජර්මන් ජාතික කවියා 1828 දී[13] සිය අද්විතීය කවිත්වය මෙහෙයවමින් මේ කාව්‍යය ජර්මන් පද්‍යයට නැඟූ කල්හි, එච්. එච්. මිල්මන් ඩීන්වරයා ගේ අනුවාදයෙන්[14] එය එංගලන්තයෙහි ප්‍රසිද්ධියට පත් වූ පරිදි මේ කාව්‍යය ජර්මනියෙහි ද ජනප්‍රිය විය.

මේ ආඛ්‍යානයෙහි කථා නායක නල නෛෂධ වූ කලි ශතපථ බ්‍රහ්මණයෙහි සඳහන් නඩ නෛෂධ බව නිසැක ය; "දිනෙන් දින හෙතෙම රජු දක්ෂිණාවර්තයට ගෙන යතැ" සි ඔහු ගැන එහි කියැවෙයි. එ හෙයින් ඔහු එ වක වාසය කරමින් දකුණු දිග බලා ආක්‍රමණික හමුදා මෙහෙයවන්නට ඇත. මෙ නයින් කථා නායකයා ගේ නාමය ඉතා පුරාණ එකක් බව පෙනෙයි. කාව්‍යය ද මහාභාරතයෙහි පුරාණතම කොටසට අයත් නො වුව ද සැලකිය යුතු තරම් පුරාණ කොටස්වලට අයත් වනු ඇත. ඒ කෙසේ වුව ද පුරාණවල ස්වරූපය පාන ලක්ෂණයන් ගෙන් මෙය මුළුමනින් ම තොර වේ; මෙහි සඳහන් වන්නෝ විෂ්ණු හෝ ශිව හෝ වැනි දෙවිවරුන් නො ව, වරුණ හා ඉන්ද්‍ර ආදි වෛදික දෙව්වරු ය. කාව්‍යයෙහි වර්ණනා කෙරෙන ශිෂ්ටාචාරය ද සමස්තයක් වශයෙන් බෙහෙවින් සරල එකකි; එය පැරණි එකක් බව පෙනේ. අනෙක් අතට පූර්ව—වෛවාහික ප්‍රේමය හා අභිසැමි ප්‍රේමය ද නිරූපණයෙහි දී, විශේෂයෙන් ම නල කාව්‍යයෙහී මුල් සර්ග කිහිපයෙහි දැක්වෙන අන්දමේ රසිකත්වයක් හා මෙතරම් විචිත්‍රත්වයක ද පුරාණතම කාව්‍යයන්හි කොහෙත් ම දක්නට නැති තරම් ය.

ඉතා පුරාණ වකවානුවෙහි දී පවා ප්‍රේම සම්බන්ධ ඉන්දියාවෙහි අරුමයක් නොවූ බව අනුමාන කිරීමට අප පොළඹවනුයේ **පුරූරවස්** හා **උර්වශී** යන දෙ දෙනා ගේ ප්‍රේමය පිළිබඳ ඉපැරණි කාව්‍යය පමණකි. එහෙත් **සංස්කෘතයෙන්** මෙන් ම නූතන ඉන්දීය භාෂාවලින්[15] ද ප්‍රාදේශීය භාෂාවලින් ද කවි රචනා කළ පශ්චිමකාලීන කවීන් විසින් නැවත නැවතත් කරයි. නල කාව්‍යය වැනි යුරෝපීය රුචියට ගැළපෙන ඉන්දීය කාව්‍ය ප්‍රේම සම්බන්ධ සාමාන්‍ය ඉන්දීය ගදවතට කොතරම් රුචි වී දැයි ස්ථූට කරයි. නල කාව්‍යය වැනි යුරෝපීය රුචියට ගැළපෙන ඉන්දීය කාව්‍ය ගණන ද අල්ප ය. එය යුරෝපීය භාෂා සියල්ලකට ම වාගේ පරිවර්තනය කොට ඇත.[16]; **ඒ ද ගුබර්නාටිස්** විසින් සකස් කොට ගත් නාට්‍යමය අනුවාදයක් ද 1869 දී **ෆ්ලොරන්ස්** නුවර දී කරළියට නැගුණේ ය. ඒ සේ ම, අපර දිග විශ්ව විද්‍යාලය සියල්ලෙහි ම වාගේ සංස්කෘතය හැදෑරීම මේ කාව්‍යය කියවීමෙන් ඇරඹීම දිගු කලෙක පටන් පටන් චාරිත්‍රයක් බවට පත් ව ඇත; මේ කටයුත්ත සඳහා භාෂාව අතින් මෙන් ම විෂය අතින් ද එය මැනවින් සැකැසුණේ වෙයි.[17]

රාම[18] පිළිබඳ **උපාඛ්‍යානය** ද වංශ කථාවක් ඇතුළත් වංශ කථාවකි වැන්න. (මහාභාරතයෙහි **සැම** කොටසක ම වාගේ මද වශයෙන් හෝ දක්නට ලැබෙන, කාව්‍යය විකෘති කරමින් එකතු කරන ලද හා ඇතුළු මහාකාව්‍යය සඳහා ගුරු කොට ගත් වීර කාව්‍යයන් හි හෝ එ තරම් කලාත් මක කෘතියක් හා පුරාණ සූත කාව්‍යයන් ගෙන් නො නැසී පැවත ආ අගනා කාව්‍යයක් ද වෙයි; එහෙත් රාමෝපාඛ්‍යානයෙහි පැනෙනුයේ භාරතීයයන් ගේ දෙ වන මහා වීර කාව්‍යය වූ **රාමායණයෙහි** ඉතිහාසය සඳහා හුදෙක් සාහිත්‍යික වැදගත්කමක් පමණි. කුමක් නිසා ද යත්? රාමෝපාඛ්‍යානය, රාමායණයෙහි[19] ම හෝ **වාල්මීකී** කිවියා විසින් ඔහු ගේ මහාකාව්‍යය සඳහා ගුරු කොට ගත් වීර කාව්‍යයන් හි හෝ එ තරම් කලාත් මක බවකින් පිළියෙළ කර නොගත් සංක්ෂිප්ත අනුවාදයක් ලෙස චිනා පැහැර ගැනීම[20] හේතු කොට ගෙන සොවින් තැවෙන යුධිෂ්ඨරයන් අස්වසාලනු වස් **මාර්කණ්ඩෙය** ඍෂීන් විසින් රාමෝපඛ්‍යානය ගෙන හැර දක්වනු ලැබේ.; රාම ගේ බිරිය වූ **සීතාව** ද **රාවණ** නම් යක් රජු විසින් බලාත්කාරයෙන් පැහැරගෙන ගොස්, දිගු කලක් සිර අඩස්සියේ තබා ගත් බැවිනි. රාම පුරාවෘත්තය පිළිබඳ සඳහන් මහාභාරතයෙහි සෙසු කොටස්වල ද විරල නො වේ. භීම කුමරු හට හනුමන්[21] නම් වානරයා මුණ ගැසීම පමණක් මම සඳහන් කරමි.

පුරාණ ඉන්දීය සූත කාව්‍ය සාහිත්‍යයට අයත් වඩාත් අගනා කාව්‍යයක් මහාභාරතයෙහි පස් වන කාණ්ඩයෙහි සුරැකී ඇත; අභාග්‍යයකට මෙන් මෙහි ශ්ලේෂ ව පවත්නේ කාව්‍ය ඛණ්ඩයක් පමණකි. එ නම්, විදුලා නම් **වීරමාතා උපාඛ්‍යානයයි.** රණශූරයන් වශයෙන් ඔවුන් ගේ යුතුකම් ඉටු කරන ලෙස ඉල්ලමින්[22] කුන්තී බිසව සිය පුත්‍ර පාණ්ඩවයන් හට කෘෂ්ණ අත පණිවුඩයක් එවයි; මේ අවස්ථාවේ දී වීරයකු ගේ බිරිය වූ

විදුලා වරෙක සඤ්ජය නම් සිය පුත්‍රයා සටනට පෙළඹවූ අන්දම ද විස්තර කරයි. සින්ධු රාජයා ආතික් ලජ්ජා සහගත ලෙස පරාජයට පත් සඤ්ජය බෙහෙවින් කලකිරීමට පත් ව, සිය බිරිය හා විදුලා නම් සිය මව ද සමඟ දුක සේ කාලය ගත කළේ ය. ඒ කල්හි, විදුලා බිසව අතිශය වේගවත් වදනින් ඔහු ගේ බියසුලු බව හා නිෂ්ක්‍රියත්වය ද හෙළා දකිමින් ප්‍රචණ්ඩ වචනයෙන් තව තවත් වික්‍රමාන්විත ක්‍රියාවනට ඔහු පොළඹවයි. මේ පූරාණ වීර කාව්‍ය ඛණ්ඩයෙහි භාෂාවෙහි ඕජස්වී ප්‍රාණවත් බව පිළිබඳ යම් අදහසක් ගෙන දෙනු සඳහා මේ කථාවෙන් ශ්ලෝක කිහිපයක් මෙහි ඉදිරිපත් කරමි.[24]

උත්තිෂ්ඨ හේ කාපුරුෂ මා ශේෂ්වෛවං පරාජිතඃ
අමිත්‍රාන් නන්දයන් සර්වාන් නිර්මානෝ බන්ධුශෝකදඃ

සුපූරා වෛ කුනදිකා සුපූරෝ මූෂිකාංජලිඃ
සුඅංතෝෂඃ කාපුරුෂඃ ස්වල්පකෙනෛව තුෂ්‍යති

අප්‍යහේරාරුජන් දංෂ්ට්‍රිමාශ්වේව නිඛනං ව්‍රජ
අපි වා සංශයං ප්‍රාප්‍ය ජීවිතේ පි පරාක්‍රමෛඃ

ත්වමේවං ප්‍රේතවච්ඡේෂේ කස්මාද් වජ්‍රහතෝ යථා
උත්තිෂ්ඨ හේ කාපුරුෂ මා ස්වාප්සීඃ ශත්‍රුනිර්ජිතඃ

අලාතං තින්දුකස්‍යෙව මුහූර්තමපි හි ජ්වල
මාතු ෂාග්නිරිවානර්චිර් ධූමායස්ව ජීජීවිෂුඃ

මුහුර්තං ජ්වලිතං ශ්‍රෙයෝ නව ධූමායිතං චිරං
මා භස්ම කස්‍යචිද් ගේහේ ජනි රාෂ්ඨඃ ඛරෝ මෘදුඃ

යස්‍ය වෘත්තං න ජල්පන්ති මානවා මහදද්භූතම්
රාශිවර්ධන මාත්‍රං ස නෛව ස්ත්‍රී න පුනඃ පුමාන්

(V—133—8—10, 12, 14, 15, 22 23)

"නිහඬ පුරුෂය, නැඟී සිටුව, නොප සතුරන්ගේ ප්‍රීතියටත්, නොප මිතුරන් ගේ ශෝකයටත් ඉඩ සලසමින් පරාජයට පත් විට මෙ සේ උකටලී ව වැතිර නො සිටුව."

"නොගැඹුරු දොළ පහර වහා පිරී යේ; මීයා ගේ මිට පහසුවෙන් පිරෙයි. කුපුරිස් තෙමේ වහා තෘප්තියට පැමිණෙයි; ස්වල්පයෙකින් මුත් සෑහීමට පත් වෙයි."

"සර්පයා ගේ දළ ඉදිමට වත් පෙර සුනඛයෙකු මෙහි නො මැරෙව! නොප දිවි යහපත් නිර්ෂිත වෙව"

"මළ මිනිසකු පරිද්දෙන්, විදුලි සැරයෙන් පැහැරුණු අයකු පරිද්දෙන්, තෝ මෙහි කුමක් නිසා වැතිර සිටින්නෙහි ද? බියසුල්ල, නැඟී සිටුව. සතුරු විසින් හා පරාජයට පත් කරන ලද කල්හි නො නිදව"

"තින්දුක දැවයෙන් සාදා ගත් ගිනිහුළක් පරිද්දෙන් මොහොතකට වත් ගිනි ගෙන ඇවිගනුව; හුදෙක් ජීවිතය දිග්ගස්සා ගැනීමේ චේතනාවෙන් දහසියා ගින්නක් මෙන් යටපත් ව නො දිලෙව."

"පැය ගණනක් නිස්සේ යටපත්ව දිලෙනුවට වඩා මොහොතක් සැරෙන් ඇවිලීම ඉතා ය. අහෝ, දුර්වල ගදභයකු රාජ වංශයකට පහළ වී ඇත."

"මිනිසකු ගේ ක්‍රියා අසිරිමත් කථාන්තරයනට වස්තු නො වේ නම් ඒ පුද්ගලයා මහා ජනකාය තර කිරීමට පමණක් උපකාර වෙයි; හේ ගැහැනියක් හෝ මිනිසෙක් හෝ නො වේ."

සිය මව ගේ අවවාදානුශාසනා හා දෝෂාරෝපණ සියල්ලට සකපිමෙන් පිළිතුරු දීම විශේෂ ලක්ෂණයක් කොට ගත් පුත්‍රයා ගේ උත්තරය තම ජයග්‍රාහක සටනක් මෙහෙයවීමේ මාර්ගයක් තමාට නැති නියාවත්, ඒ කෙසේ වුව ද, සිය මරණයෙන් ඇයට අත් වන ප්‍රයෝජනයක් නැති නියාවත් ය :

කෘෂ්ණායසස්යෙව තෙ සංහත්‍ය හෘදයං කෘතම්
මම මාතස්ත්වකරුණෙණ් වීර ප්‍රාණේ හ්‍යමර්ෂණෙ

අහෝ ක්ෂත්‍ර සමාචාරෝ යත්‍ර මාමීතරං ජඨා
නියෝජයසි යුද්ධාය පරමාතේ්ව මාං තඨා

ඊදෘශං වචනං බ්‍රූයාද් භවතී පුත්‍රමේකජම්
කිංනු තේ මාමපශ්‍යන්ත්‍යා ඃ පෘථිව්‍යා අපි සර්වථා

කිමාහරණ කෘත්‍යෙන කිං හෝගෛර් ජීවිතේන වා
මයි වා සංහරතේ් ප්‍රිය පුත්‍රේ විශේෂත ඃ

(1–135–1–4)

දරුණු ඔබ යකඩ මෙන් දැඩි හද — වතෙක
නො මෙසි කිසි ම ලෙසකින් ආදර — මවක
සැබෑ දුවකි ඔබ නම් කැත් — පරපුරෙක
ඔබට තිබෙනු නොකැමෙන රුදු අත් — ඔවෙක

රකිමින් ගති සිරිත් කැත් පරපුරෙහි — සැම
නිසි උන් හටන් ඔබ නොකරන්නෙහි ය — පෙම
ජීවිතයෙහි ඔබේ සම්පත වන — පරම
නො සිතති රකින්නට මා, ඔබ පුතු එක — ම

වැඩකට නැති යළිත් සටනට ලෙස — වදින
නොපමා දයාවක් කිසි සිත — තිරතුරින
ඔබ සිට පොළඹවති මා පිට එකකු — මෙන
කිම පල නසනු මිස දිවි ඒ මහින් — ඉගනෙන

පොළොව සහ රදන එහි යස ඉසුරු — සැමා
කිම ද අහි සම්පත් මන වඩන — පෙමා
පලය ජීවිතයෙ ඔබ හට වෙසි ද කි — මා
අදර මැණියනි, නොලැබූ නම් ඔබ — මා

එහෙත් ඔහු ගේ මව රණශූරයකු බියසුලු නො වෙතැයි ද කෙසේ හෝ වේ වා රණ ශූරයකු ලෙස සිය යුතුකම ඉටු කළ යුතු යයි ද පවසමින් නැව තත් අනුශාසනා කරයි. සිය පුතණුවන් " මන්දබුද්ධියකු වුව ද ඔහු පොළඹවා ගැනීමෙහි ලා අවසානයේදී ඕ සමත් වන්නී ය.

යදග්ව ඉව ස ක්ෂිප්ත ඃ ප්‍රණුන්නෝ වාක්‍ය සායකෙ ඃ
කෘෂ්ණායශස්යෙව තෙ සංහත්‍ය හෘදයං කෘතම්

(1–136–16)

" තරවටු කරනු ලැබූ උතුම් අශ්වයකු පරිද්දෙන් සිය මව ගේ වදන් පහරින් පොළඹවනු ලැබූ පුතණුවෝ ඇය ඉල්ලා සිටි ලෙස ක්‍රියා කළහ.

මේ වීර කාව්‍ය ඛණ්ඩය වූ කලි බ්‍රාහ්මණික බල පෑමට මුළුමනින් ම වාගේ හසු නොවූ මහාභාරත කොටස් කිහිපයෙන් එකකි. රණකාමිත්ව යෙන් පණ ගන්වනු ලැබූ පුරාණ සූත කාව්‍යය බමුණු පඬුවන් ගේ බල පෑමට හසු ව ස්වරූපය අතින් ද, විෂය අතින් ද බෙහෙවින් බාල කරනු ලැබුයේ වරක් දෙ වරක් නොවේ. ඒ සේ මහා භාරතයෙහි දොළොස් වන කාණ්ඩයෙහි "පුරාණ ඉතිහාසයක්" උපුටා දැක්වෙයි—මෙය මේ බඳු අවස්ථා රාශියකින් එකක් පමණි. සෘඤ්ජය ගේ පුතණුවන් ගේ මරණ යෙන් පසු ව ඔහු අස්වසනු වස් **නාරද** සෘෂි මේ පුරාණ ඉතිහාසය ගෙන හැර දක්වයි. පුරාතන රජවරුන් ගේ "වීර ක්‍රියා" කුමකින් සමන්විත වේ ද? මින් මොවුන් සියලු දෙන කීර්තිමත් වීරයන් වුව ද මිය ගිය බව කියැවෙයි. එහෙත් මේ රජවරුන් ගේ "වීර ක්‍රියා" කුමකින් සමන්විත වේ ද? හිඟිය නොහැකි තරම් බිලි පූජා පැවැත්වූ ඔවුන් අති විශාල දක්ෂිණා බමුණන් හට ප්‍රදානය කිරීම ඊටත් වඩා වැදගත් කටයුත්තක් විය. නිදසුන් වශයෙන්, එක් රජෙක් අසුන් අසූ දෙනකු බඳින ලද රියක අසුන් ගත් රන්වන් අබරණ පැළඳි ලඳුන් "දස සුවහස් ගණනක්" දක්ෂිණා වශ යෙන් බමුණනට පිරිනමයි; එක් එක් රියක් පිරිවරා රන්දමින් සැරසූ සියයක් ඇත්තු ගමන් ගනිති; එක් එක් ඇතකු පිරිවරා දහසක් අස්සු ද, අසකු පිරිවරා දහසක් ගවයෝ ද, ගවයකු පිරිවරා දහසක් එළු බැටළුවෝ ද ගමන් ගනිති.[25] මේවා බමුණන් විසින් නැවත සංස්කරණය කිරීමට ගත් උත්සාහය නිසා දූෂිත පුරාණ වීර කාව්‍යයෙකින් ශේෂ වූවක් ද නැත හොත් ස්වාධීන බ්‍රාහ්මණ රචනා දැයි කිව නොහැකි ය.

මහාභාරතයෙහි දැක්වෙන බ්‍රාහ්මණ දේවකථා හා පුරාවෘත්ත

පුරාණ ඉන්දීය සූත කාව්‍ය එහි අකලංක ස්වරූපයෙන් ආරක්ෂා නොවීමට හේතුව මහාභාරතය බමුණු පන්තිය අතට පත් වීමයි. එහෙත් දේව කථා ශාස්ත්‍රය හා පාරම්පර්යය ද අතින් වැදගත් වන දෙවිවරුන් පිළිබඳ නානා මිථ්‍යා කථා හා පුරාවෘත්ත මහාභාරතයෙහි ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් පමණක් නොව, බ්‍රාහ්මණ කාව්‍ය කලාවෙහි විශිෂ්ට නිර්මාණ කිහිපයක් හා බ්‍රාහ්මණ පාණ්ඩිත්‍යයෙහි ද අගනා නිදසුන් කිහිපයක් ආරක්ෂා කර ගැනීම සම්බන්ධයෙන් ද අපි ඉහත සඳහන් ඍද්ධියට මණය ගැති වමු.

පුරාණ දේව කථාවක් වශයෙන් හා පාරම්පර්යය අතින් ද ඍත් ගන්නා සුලු කථා සැකිල්ලක් නම් ජනමේජය රජු ගේ නාග යාගය[1] පිළිබඳ කතා පුවතයි. මේ කතා පුවතට ඈඳා නොයෙකුත් කථාන්තර, නාග පුරාවෘත්ත, ගුරුළු රාජයා හා වෙනත් මිථ්‍යා සතුන් ද පිළිබඳ පුරාණ දේව කථා රාශි යක් ද පෙළ ගස්වා ඇත. එහෙත් මෙහි "**නාග—යාගය**" නම් ලත් යාගය වූ කලි ඇත්ත වශයෙන් ම නාග දූපනයකි; එ නම්, නාග සංහාරය සඳහා මන්ත්‍රයකි. ජනමේජයයන් ගේ පිත් **පරීක්ෂිත්** රජ **තක්ෂක** නම් නාග රාජයා විසින් මාරාන්තික ලෙස දෂ්ට කරනු ලැබී ය. සිය පියාණන් ගේ

මරණයේ පළිය ගනු සඳහා **ජනමේජය** රජ විශාල යාගයක් පිළියෙළ කරයි.[2] පූජකවරුන් ගේ මැතිරීම කරණ කොට ගෙන මෙහි දී ලොව මුළුල් ලෙහි වසන නාගයෝ සියලු දෙන හාත්පසින් පැමිණ ගින්නට පැනීමට සලස්වනු ලැබෙත්. අප වංශ කථාවෙහි මෙය ඉතා චමත්කාරජනක ලෙස වැනෙයි.

"එ කල්හි නාග යාගය සඳහා නිර්දිෂ්ට විධිවිධානයනට අනුකූල ව බලිකර්මය ඇරඹිණ. තම තමන්ට නියමිත කර්තව්‍යයන්හි සතුටින් නියැලුණු පූජකයෝ කඩිසර ගමනින් ඔබ මොබ ගියාහු ය. කාලවර්ණ වස්ත්‍ර දැරුවාහු, දුමාරයෙන් රක්තවර්ණ වූ ඇස් ඇත්තාහු මන්ත්‍ර ජප කරමින් දැල්වෙන ගින්නට පිවිතුරු වෙඩරු වත් කළාහු ය. සියලු නාගයන් ගේ සිත් බියෙන් ඇලළුවාහු උන් සියලු දෙන අග්නිමුඛයට කැඳවුවාහු ය. එ කල්හි නාගයේ දහර ගසමින් ඔවුනොවුන් අතර බියකරු හඬ නඟමින් ගිනිදැල් විහිදුවන ගින්නට ගොදුරු වූ හ. එක් ගැසෙමින්, සු-සූ හඬ නඟමින්, ගිස පවන් වැලඳිය දක්වා ඔවුනොවුන් ගේ සිරුරු වෙළා ගනිමින් අසංඛ්‍ය ගණනින් පැමිණි නාගයේ දිළෙන ගින්නට පිනූ හ. විවිධ වර්ණයෙන් යුත් නාගයේ ද, මුගුරක් මෙන් දෑස් බලයෙන් යුත්, භයානක ලෙස දෂ්ට කරන නාගයේ ද, යන ඇ ලොකු කුඩා සියලු නාගයේ මව ගේ ඍපයෙන් පහරනු ලැබුවාහු ගින්නට ගොදුරු වූ හ.[3]"

වෛදික සාහිත්‍යයෙහි ද දක්නට ලැබෙන **කද්‍රූ** හා **විනතා** ද පිළිබඳ පුරාණ දේව කථාව ද නාග යාගය පිළිබඳ[4] පුරාවෘත්තය හා මෙහි දී සම්බන්ධ කැරෙයි. "තාම්‍ර වර්ණ" කද්රූ වූ කලි නාගයන් ගේ මැණියන් වූ පෘථිවියයි; "නැමුණා වූ" විනතා වූ කලි ගුරුළු නම් මිථ්‍යා පක්ෂියා ගේ මැණියන් වූ අහස් කුසයි. රාමායණයෙහි හා පුරාණයන්හි ද දක්නට ලැබෙන **සයුර කැලඹීම** පිළිබඳ[5] පුරාණ දේව කථාව ද මේ රටාවට ගළපා ඇත; පසු කාලයෙක කවින් විසින් මේවා නැවත නැවතත් ගෙන හැර දක්වා හෝ නිදසුන් වශයෙන් හා සංසන්දනය සඳහා භාවිත කොට හෝ ඇත. සුර—අසුර යන දෙ පක්ෂය ම එකමුතු ව උත්සුක ව වෙහෙසෙමින් **මන්දාර** පර්වතය මන්ථයක් වශයෙන් ද **වාසුකී** නම් නා කුමරු රැහැන් පටක් වශයෙන් ද ගෙන අමෘතය ලබා ගනු වස් සයුර කලඹන ආකාරයත් එ කල්හි පෙන දමන රළ අතරින් චන්ද්‍රයා පහළ වන ආකාරයත්, ඉක් බිති සෞභාග්‍යයටත්, සෞන්දර්යයටත් අධිපති **ලක්ෂ්මී** දේවිය ද, **සුරා** නම් මද්‍ය පානය ද වෙනත් අගනා ද්‍රව්‍ය ද පහළ වන ආකාරයත්, අවසානයේ දී **ධන්වන්තරී** නම් රූමත් දේවතාවා ශ්වේත වර්ණයෙන් බැබැළෙන චෂකයෙක අමෘතය රැගෙන මහ සයුරෙන් නැඟී සිටින ආකාරයත් යන මේ සියල්ල, "තාත්වික" යයි කිව හැකි තරම් සිත් ඇද ගන්නා අයුරින් වර්ණනය කොට ඇත.

ප්‍රධාන කථා සැකිල්ල හා ගළපන ලද තවත් නාග පුරාවෘත්තයක් සඳහන් කිරීම සුදුසු ය; එ නම්, **රුරු** නම් පුද්ගලයා ගේ කතා පුවතයි. ජනමේජය මෙන් **රුරු** ද සියලු නාගයන් සංහාරය කිරීමට සනිටුහන් කරන බැවින් මෙය හුදෙක් තරමක් දුරට නාග යාගය පිළිබඳ පුරාවෘත්තයට සමාන වූවක් වෙයි. මෙය සිදු වන්නේ මෙ සේ ය:

දිනෙක අප්සරාවක ගේ දුහිතෘ වූ ප්‍රමද්වරා නම් රූසිරියෙන් යුත් කන්‍යාව දුටු රුරු නම් බ්‍රාහ්මණ පුත්‍රයා ඇය කෙරෙහි ප්‍රේමයෙන් වෙලෙයි. ඔ තොමෝ ඔහු ගේ ප්‍රියාව්‌බවට පත් වන නමුත් මංගල්‍යයට දින කිහිපයකට පෙර ක්‍රීඩාවේ යෙදී සිටින්නී විසකුරු නාගයකු විසින් දෂ්ට කරනු ලැබුවා ය. ජීවයෙන් තොර ඕ රූසිරියෙන් වෙන කවදා වත් නැති අයුරු දිලෙමින් නිදි ගත් විලාසයෙන් වැතිර සිටී. සිල්වත් තවුසන් සියලු දෙන ඇය වෙත පැමිණ අනුකම්පා පරවශ ව කඳුළු සලන නමුත් සොවින් තැවෙන රුරු මහ වන මැදට නික්මෙයි. හෙතෙමේ විලාප නගමින් සිය තපස හා සිල්වත් ජීවිතය මෙනෙහි කොට සිය ප්‍රියාව ආපසු ලබා දෙන මෙන් දෙවියන් යදියි. එ කල්හි දේව දූත යෙක් පහළ වී, රුරු ගේ ජීවිතයෙන් අඩක් ඇය හට ලබා දීමට එකඟ වන්නේ නම් පමණක් ප්‍රමද්වරාවනට නැවත පණ ලබා දිය හැකි බව පවසයි. රුරු වහා මීට එකඟ වෙයි. එ කල්හි ධර්මරාජයා, එ නම්, යම දෙවි ප්‍රමද්වරාවනට නැවත පණ ලබාදීම අනුදනී. නොබෝ කලෙකින් ම, එක්තරා මඟුල් දිනයෙක දී දෙ දෙන සරණ බන්ධනයට ඇතුළත් වෙති. ඉක්බිති රුරු ලොව මුළුල්ලෙහි වසන සියලු නාගයන් වැනසීමට සන්නිවුහන් කර ගෙන නයකු දුටු වහා ම උගේ දිවි නොර කරයි. එහෙත් දිනක් ඔහු අතට පත් විසක් නැති නාගයෙක් තමාට අභයදානය කරන ලෙස ඔහු ගෙන් ඉල්ලා සිටියේ ය. මේ නාගයා ඇත්ත වශයෙන් සාපයක් නිසා නා වෙසක් ලැබූ සෘෂි කෙනෙක් වූ හ. මෙ සේ රුරු හමු වීමෙන් හේ සාපයෙන් මිදිණී. මිනිස් වෙස් ලබන හෙතෙම පණ ඇති සතුන් මැරීමෙන් වළකින ලෙස රුරු හට අවවාද කරයි.[6]

මේ පුරාවෘත්තයෙහි කථා නායකයා වූ රුරු වූ කලි **ච්‍යවනයන්** ගේ පරපුරින් පැවතෙන්නෙකි; **අශ්වින්** නම් දේවතාවුන් විසින් මේ ච්‍යවන හට නැවත යෞවන භාවය ලබා දුන් බව සෘග්වේදයෙහි[7] කියැවෙයි. යෞවන බව ලැබීම පිළිබඳ මේ කතා පුවත බ්‍රාහ්මණ සාහිත්‍යයෙහි[8] සවිස්තර ව සඳහන් වේ. මේ පුරාවෘත්තය ම මහාභාරතයෙහි ද වෙනස් ස්වරූපයෙකින් ඉදිරිපත් වේ. වෛදික සාහිත්‍යයෙහි දැක්වෙන පුරාවෘත්තයෙහි ස්වරූපය වීර කාව්‍යයෙහි දැක්වෙන ස්වරූපය හා සන්සන්දනය කිරීම ප්‍රයෝජනවත් ය. එ හෙයින් ම විසින් මහාභාරතය අනුව පුරාවෘත්තයෙහි අඩංගු කරුණු මතු ඉදිරිපත් කරමින් බ්‍රාහ්මණ සාහිත්‍යයෙහි පැනෙන කථාන්තරයන්හි දැක්වෙන ඉතා ම වැදගත් වෙනස් කම් කෙරෙහි සටහන් මඟින් අවධානය යොමු කරවනු ලැබේ.

භෘගු නම් තැනැත්තා ගේ පුත් **ච්‍යවන** එක්තරා විල් තෙරක දැඩි තවුස්දම් පිරී ය. හේ කොතරම් දීර්ඝ කාලයක් නිස්සේ කණුවක් මෙන් නො සැලී සිටියේ ද යත් ඔහු වසා ඟෙන පස් ගොඩැල්ලක් නැඟිණ. ඒ මත කුහුඹු කැල එහි මෙහි දුවමින් සිටි අතර ච්‍යවන ද තුඹසක් මෙන් දිස් විය.[10] දිනක් සේවක ගණයා පිරිවරා ගත් **ශර්යාති** රජ මේ විල අසබඩට පිළිපන්නේ ය. **සුකන්‍යා** නම් ඔහු ගේ බොළඳ දුව සිය යෙහෙළියන් කැටු ව වනයෙහි දුවපැන ඇවිදින්නී තුඹස වෙත පැමිණියා ය; තවුසා ගේ දෙනෙත් පමණක් මෙහි කදෝපැණියන් මෙන් දිලෙමින් තිබිණ. ක්‍රීඩාලෝලත්වයෙන් හා කුහුලින් ද යුත් කුමරිය දිලෙන ගේල දෙකට උලකින් අනිමින් තවුසා ගේ දෙ නෙත් උගුලුවා[11] ගත්තී ය. බෙහෙවින් කුපිත වූ සෘෂිවරයා ශර්යාති රජු ගේ හමුදාව මුත්‍ර බාරණ යෙන් හා මල බද්ධයෙන් ද පෙළීමට සැලැස්විය.[12] බොහෝ වේලාවක් නිස්සේ මේ අභාග්‍යයට මුල සෙවූ රජතුමා මේ මහා සෘෂිවරයා කෝපයට පත් ව ඇති බව දැන ගත් කල ඔහු ගෙන් සමාව ලබා ගැනීම පිණිස ඔහු කරා ගියේ ය. රජතුමා ගේ දුව සෘෂිවරයා හට සරණ පාවා දෙන්නේ නම් පමණක් සෘෂිවරයා සමාව දීමට එකඟ වෙයි. මෙ සේ නව යොවුන් කුමරිය දුබල මහල්ලා ගේ බිරිය වන්නී ය. දිනක් නව යොවුන් බිරිය ස්නානය කරමින් සිටිය දී අශ්වින් දේවතාවුන් දෙ දෙනාට දක්නට ලැබී ඇය ගේ ස්වාමියා ලෙස අවලක්ෂණ මහල්ලා වෙනුවට තමන් දෙ දෙනා ගෙන්

කෙනකු තෝරා ගැනීමට ඇය පෙලඹීමට තැත් කරති. එහෙත් ඕ සිය පතිභක්තිය සැල කර සිටී. ඒ කල්හි ඇය ගේ සැමියා තරුණයකු බවට පත් කරන බවත්, අනතුරු ව ඇය තමන් දෙ දෙනා හා සෙවුන් බව ලබා ගත් ව්‍යවන ද අතුරින් කෙනකු තෝරා ගත යුතු බවත් දෙව් වෙදැදුරු දෙ දෙන යෝජනා කරති. ව්‍යවන මීට එකඟ වන බැවින් ඕ තොමෝ ද ඊට කැමති වෙයි. ඉක්බිති අශ්වින් දෙ දෙන මහලු තවුසා ඉලව බිස්වා තමන් ද දියෙහි කිමිදී මතු වන කල්හි තී දෙන ම එක සමාන ව, ඔත් පැහැර ගන්නා යොවුන් රූපයෙන් දිස්වෙති. දැන් සුකන්‍යා මොවුන'තුරින් කෙනකු තෝරා ගත යුතු ය. සියල්ල මැනවින් මෙනෙහි කළ ඕ තොමෝ සිය සැමි ව්‍යවනයන් ම තෝරා ගනියි.[10] ව්‍යවන, යොවුන් බව ලබා දීම වෙනුවෙන් ප්‍රත්‍යුපකාරයක් වශයෙන් අශ්වින් දෙ දෙන **සෝම පානය** කරන්නන් බවට පත් කිරීමට පොරොන්දු වෙයි. ශර්යාති රජු වෙනුවෙන් පවත්වන මහා යාගයෙක දී හෙතෙමේ අශ්වින් දෙ දෙනාට සෝම පානය පිරිනමයි. එතෙකුදු වුවත් වෙදැදුරන් වශයෙන් මෙ ලොව මිනිසුන් අතර සරන අශ්වින් දෙ දෙනා සෝමයට සුදුසු වෙතැයි සැලකීමට ඉන්ද්‍ර නම් දේව රාජයා කැමති නො වෙයි. එහෙත් ඉන්ද්‍ර දේව යන් ගේ විරෝධය නොතකන ව්‍යවන දිගට ම අශ්වින් දෙ දෙනාට යාගය පුදයි. කෝපයට පත් ඉන්ද්‍ර ඔහු වෙත සිය වජ්‍රය එල්ල කරයි. එහෙත් ඒ ක්ෂණයෙහි සෘෂිවරයා දෙවි යන් ගේ බාහුව පණ නැති කරයි; මුළුමනින් ම ඔහු ගේ ඔද බිඳිනු සඳහා[14] හෙතෙම සිය තපසෙහි අනුභාවයෙන් මද (මත්වීම) නම් බිහිසුණු රකුසකු මවයි. සිය දැවැන්ත කට අයා ගත් (යටි හනුව පොළොවෙහි ගැටුණු අතර උඩු හනුව අහසෙහි ගැටෙයි.) රකුසා ඉන්ද්‍ර වෙත පැමිණ ඔහු ගිල දැමීමට සූදානම් වෙයි. බියෙනැලළී යන දේව රාජයා දයාව පෙන්වන මෙන් සෘෂිවරයා ගෙන් අයැද සිටි කල්හි සැහීමට පත් ව, මද නම් රාක්ෂයා අතුරුදහන් කරවයි.[15]

වීර කාව්‍යයෙහි අඩංගු වූ බ්‍රාහ්මණ කාව්‍ය වෛදික සාහිත්‍යයෙහි දක්නට ලැබෙන කාව්‍යයනට වඩා පශ්චාත් කාලීන අවස්ථාවක් නිරූපණය කරන බව වෙනත් බොහෝ අවස්ථාවල දී මෙන් මෙහි දී ද පැහැදිලි ව පෙනෙයි. කෙසේ වුව ද, මේ පශ්චාත් කාලීන බ්‍රාහ්මණ පද්‍ය සාහිත්‍යයෙහි ලක්ෂණයක් නම් අතිශයෝක්තියත්, සාමාන්‍යයෙන් පමණ නොදනුමත්, දෙවියන් අභිභවනය කරමින්—විශේෂයෙන්, සෘෂීන් බමුණන් හා තවුසන් ද, නොසැහෙන පරිදි ප්‍රසංසාවට ලක්කිරීමත් ය. සුර සින් පිළිබඳ වෛදික පුරාවෘත්ත හා සම්බන්ධ වූ **ඉන්ද්‍ර දේව කථාවන්හි** පවා ඉන්ද්‍ර දෙවි සෘග්වේද ස්තෝත්‍රයන්හි දැක්වෙන අයුරු වික්‍රමාන්විත නායකයෙක් හා අසුරයින් ගේ ජයග්‍රාහකයෙක් ද නො වේ.[16] ඉන්ද්‍ර හා වෘත්‍ර අතර සටන පිළිබඳ පුරාණ පුරාවෘත්තය නො නැසී පවතින බව සැබෑ වකි; එය සවිස්තර ව මහාභාරතයෙහි දෙ වරක් ම ගෙන හැර දැක්වෙන[17] නමුත් විශේෂ අවධාරණයට ලක් වන්නේ වෘත්‍ර ඝාතනයෙන් බමුණකු මැරීමේ පාපය ඉන්ද්‍ර දෙවියන් අතින් සිදු වන බවයි. නොයෙක් අවමන් විඳ දරා ගනිමින් පළමු ව මේ බිහිසුණු පාපයෙන් ගැලවීමට සිදු වූ අන් දම ඉතා විස්තර සහිත ව කියැවෙයි. කලකට ඔහු ගේ දිව සිහසුන පවා අභිමි ව නහුෂ විසින් එය අත් පත් කර ගෙන සිටි අන්දම අපි දුටුවමු.[18] සිල්වත් බමුණන් ගේ තපසින් ඉන්ද්‍ර දෙවියන් ගේ ආධිපත්‍යය දුර්වල කළ හැකැයි යන විශ්වාසය නානා පුරාවෘත්ත මාර්ගයෙන් විදහා දැක්වෙයි. තපස කරණ කොට ගෙන ඉන්ද්‍ර දෙවියන් වුව ද යම් ලෝකයට

යැවිය හැකි බව පවා කියනු ලැබේ.[19] දැඩි තවුස් දම් පිරීමෙන් සුරයන් හට අනතුරක් වීමට ඉඩ ඇති ඍෂිවරයකු ගේ බඹසර බිඳිනු සඳහා සාර්ථක උපායක් වූ රූමත් අප්සරාවන් යැවීම ඉන්ද්‍ර දෙවියන් විසින් උපයෝගී කොට ගැනෙනුයේ ඊරක් දෙ වරක්[20] නො වේ.

ඉන්ද්‍ර දෙවියන් ගේ මිත්‍ර අග්නි දෙවියන් ගේ ද පැරණි කිතු යසස මහා භාරතයෙහි පුරාණ දේව කථාවන්හි බොහෝ දුරට ඕන වී ඇත. එහෙත් ඔහු පිළිබඳ ව දැක්වෙන දේව කථා ගින්න සහ ගිනි දෙවියා ද ගැන වෛදික අදහස් හා තව ම සම්බන්ධ වෙයි. ඍග්වේදයෙහි හෙතෙම "කාන්තා ප්‍රියයා" ලෙස ද "කාන්තාවන් ගේ වල්ලභයා" ලෙස ද හැඳින්වේ. එහෙත් මහාභාරතය අග්නි දෙවියන් ගේ විශේෂ ප්‍රේම සම්බන්ධයන් ගැන සඳහන් කරයි. මෙ නයින් වරක් ඔහු නීල රජු ගේ සුරූපි දුහිතෘව පිළිබඳ සිත් ඇති කර ගත් හෙයින් රජමාළිගයෙහි පවිත්‍ර සුරූපි දුහිතෘව පිළිබඳ සිත් ඇති කර ගත් පැහැපත් දෙ තොලෙහි ද, මිහිරි සුසුමෙහි ද පහස ලදෙත් පමණකි. කිසිවක් කර කියා ගත නුහුණු රජුට සිය දුටි අග්නි දෙවියන් හට පාවා දීමට සිදු වෙයි. මීට ප්‍රත්‍යුපකාර වශයෙන් හෙතෙම රජතුමා අපරාජිත වීමටත්, එ ම රාජධානියෙහි අඟ නුනට සම්පූර්ණ නිදහසේ මෛථුනයෙහි යෙදීමටත් වර දුන්නේ ය.[22] අග්නි දෙවියන් ගේ කෑදරකම ද වේදයන්හි ම කියැවෙයි. එ සේ වුව ද, ගෘත්ස නම් ඍෂිවරයා ගේ ඍපය නිසා අග්නි දෙවි "සර්වභක්ෂකයකු වූ" අන්දම මහාභාරත පුරාවෘත්තයන්හි කියැවේ. අග්නි දෙවියන් හට සොහොයුරන් කිහිප දෙනකු ඇති බවත්, ජලයෙහි හෝ ගිනි දල්වන දඬු අතර හෝ ඔහු සැඟවී සිටින බවත්, බ්‍රාහ්මණවල දේව කථා නිර්මාණය සඳහා උපයෝගි කොටගත් වෛදික සංකල්ප ය. එහෙත් අග්නි දෙවියන් සැඟවීමට හේතුව හා සුරයන් ඔහු නැවත සොයා ගත් අයුරු ද සම්බන්ධයෙන් විස්තරාත්මක කථාන්තර දක්නට ලැබෙන්නේ මහාභාරතයෙහි පමණකි.[23]

වේදයන්හි ද නැවත මහාභාරතයෙහි ද දැක්වෙන පුරාවෘත්තයනට මනු හා සම්බන්ධ ජල ගැල්ම පිළිබඳ පුරාවෘත්තය ද ඇතුළත් වේ; ශතපථ බ්‍රාහ්මණයෙහි දැක්වෙන අයුරු මේ ඉහත සඳහන්[24] විය. මහාභාරතයෙහි හැඳින්වෙන පරිදි "මත්ස්‍යෝපාඛ්‍යානය[25] පිළිබඳ මේ කතා පුවත, ඊඩි විස්තර අතින් හා කාව්‍යමය ලෙස ඉදිරිපත් කිරීම ද අතින් බ්‍රාහ්මණයෙහි ගෙන හැර දැක්වුණු පුරාවෘත්තයෙන් වෙනස් වෙයි. නෞකාව "මත් අඟනක" මෙන් ප්‍රචණ්ඩ සාගරයෙහි ඒ අත මේ පැත් දෙන විලාසය වර්ණනය කරන විට මෙන් කවිත්වය දක්වන වැනුම්වලින් එය නොතොර ය. කථාන්තරයෙහි නානා විස්තර අතින්, සෙමිටික් වාර්ගිකයින් ගේ ජල ගැලුම් පිළිබඳ පුරාවෘත්තයන්හි මෙන් මහාභාරතයෙහි ද නැවෙහි (ධාන්‍ය) බීජ රැගෙන යාම සඳහන් වීම වැදගති.[26] ජල ගැල්ම පිළිබඳ ඉන්දීය පුරාවෘත්තය සෙමිටික් ගෝත්‍රිකයන් ගේ පුරාවෘත්තයෙකින්

ණයට ගත්තක් බවට ඉතා ම ප්‍රබල සාධකයක් මට මෙහි පෙනෙයි.[27] මහාභාරත පුරාවෘත්තයෙහි අවසානය බ්‍රාහ්මණවල පෙනෙන අවසානයෙන් වෙනස් වෙයි. වීර කාව්‍යයෙහි පුවත, වැඩි විස්තර අතින් හා කාව්‍යමය ලෙස ඉදිරිපත් කිරීම අතින් තමා **බ්‍රාහ්මයා** බව පවසන මත්ස්‍යයා ලොව නැවත මැවීමට **මනු** රජු හට ආරාධනා කරයි. මොහු දැඩි තවුස් දම් පිරීමෙන් මෙය සපුරාලයි.[28]

මහාභාරතයෙහි දෙ වරක් ම ගෙන හැර දක්වා ඇති **මරණයට අධිපති දේවතාවිය** පිළිබඳ ගැඹුරු රමණීය දේව කථාව එ තරම් ප්‍රසිද්ධ එකක් නො වේ.[29] "මාරයා යනු කවරකු ගේ දරුවෙක් ද? මාරයා කොතැනින් පැමිණේ ද? කුමක් නිසා මාරයා මෙ ලොව සතුන් විනාශ කරන්නේ ද? ආදි වශයෙන්, යුද බිම වැටුණ වීරයන් රාශියක ගේ මරණය ගැන ශෝක වන යුධිෂ්ඨිර අසයි. එ කල්හි, **අනුකම්පක රජු** ගේ පුත්‍රයා කලුරිය කිරීමෙන් වැලපීමෙන් සිටිය දී නාරද ඍෂි ගෙනහැර දක්වූ කථාන්තර භීෂ්ම (තැනෙක ව්‍යාස)[30] මෙහි දී දක්වයි. මේ කතාව සැකෙවින් මෙ සේ ය:

පිතාමහ වූ **මහා බ්‍රහ්මයා** සියලු සතුන් මැවූ පසු ව නිරතුරු ව දෙ ගුණ තෙ ගුණ වූ **සත්ත්වයෝ මිය නොගියහු ය. සියලු ලෝක උතුරා ගියෙන්** මේ බර දරා සිටිය නොහැකි **පෘථිවි** තොමෝ මහා බ්‍රහ්මයාට දන්වා සිටියා ය. එ කල්හි මහා බ්‍රහමයා සතුන් ගණන අඩු කිරීමේ උපායක් කල්පනා කළ නමුත් ඊට පිළියමක් සිතා ගත නොහැකි විය. මෙයින් කෝපාවිෂ්ට වූ ඔහු ගේ සර්වාංගයෙහි සියලු ද්වාරයන් ගෙන් නික්මුණු කෝපාග්නියෙහි ගිනිදැල් සකල ලෝකය ම වෙළා ගෙන සියල්ල වනසා දැමීමට තරම් විය. එහෙත් ලෝ සතුන් කෙරෙහි අනුකම්පා කළ ශිව දෙවියන් ගේ මැදිහත්වීම නිසා සිය කෝපාග්නියෙන් දැල්වුණු ගින්න තමා තුළට ම ඇදගත් මහා බ්‍රහ්මයා සත්ත්වයින් ගේ උපතත්, මරණයත් නියම කළේ ය; එතකුදු වුවත් මෙසේ අනුදන්නා කල්හි ඔහුගේ සිරුරෙහි ද්වාරයන් ගෙන් ලෝහිත සළු පෙරවූ, මනා ව සැරසීගත් ගන නිල් නෙතින් හෙබි **තරුණියක් නික්මුණා ය. ඇය දකුණ** බලා ගමන් කිරීමට සූදානම් වූ නමුත් ඇය කැඳවූ මහා බ්‍රහ්මයා මෙ සේ පැවසී ය: **"මාර දේවිය,** මෙ ලොව සතුන් මරව. ලෝක සංහාරය පිළිබඳ මාගේ චේතනාවෙන් හා මාගේ කෝපයෙන් හා උපන් ති සියලු සතුන්, මෝඩයන් හා ඍෂීන් අවිශේෂයෙන් වනසව." එ කල්හි පියුම් හිස පැළඳ **මරණයට අධිපති දේවතාවිය විලාප** නගමින් හැඬූ නමුත් පශුපති තෙමේ ඇගේ කඳුලු දෝතින් ගත්තේ ය. මේ බිහිසුණු කර්තව්‍යයෙන් තමා මුදවන ලෙස ඕ අයැද සිටියා ය.

"පශුපති වූ ඔබ හට නමස්කාර වේ වා. කුඩා දරුවන් මහල්ලන් හා මනා තරුණියෙන් පසු වන අය ද, සුරතල් දරුවන්, විශ්වාසී මිතුරන්, සොහොයුරන් හා මව්පියන් ද යනාදි සියලු අහිංසක සත්ත්ව ගණයා ම විසින් වනසා නොදමන පරිදි මා හට අනුකම්පා කරත් වා. ඔවුන් මේ අන්දමින් මිය ගියහු නම් මට දොස් පැවැරෙනු ඇත. මෙය මට ඒතියට කරුණු වෙයි. දුකට පත් සතුන් ගේ කඳුළුවලට මම බිය වෙමි; ඒ වැගිරෙන කඳුලින් මා සදා දැවෙනු ඇත."

එහෙත් මහා බ්‍රහ්මයා ගේ තීරණයක් වෙනස් කළ නොහැකි වෙයි. ඇය ඊට එකඟ විය යුතු ය; එහෙත් ලෝභය, කෝපය, ඊර්ෂ්‍යාව, මාත්සර්යය, ද්වේෂය, මෝහය හා නිර්ලජ්ජිතාව නිසා නරයන් විනාශයට පත් වීමටත්, දේවතාවිය විසින් හෙළන ලදු ව, **මහා බ්‍රහ්මයා** දෝතින් ගත් කඳුළු සතුන් මැරීම සඳහා ලෙඩදුක් බවට පත් වීමටත් වරයක් පිතාමහ බ්‍රහ්මයා ඇයට දෙයි. මෙ හෙයින්, ඔවුන් මැරීමේ වරදට ඇය හසු නොවනු ඇත. අනෙක් අතට පාපිෂ්ටයෝ සිය වරදින් ම නසිති. එහෙත් **ප්‍රේමයෙන් හෝ** ද්වේෂයෙන් හෝ තොර ව සියලු සතුන් වනසන මාර දේවිය ධර්ම රාජිනිය[31] වෙයි.

මේ පුරාණ දේව කථාව මෙන් ම මනු සහ ජල ගැල්ම පිළිබඳ දේව කථාව ද බෙහෙවින් පෞරාණික ලෙස සැලකීමට එක් සාධකයක් නම් මේ කථාන්තරයන්හි මහා බ්‍රහ්මයාට ලැබෙන ප්‍රමුඛස්ථානයයි. මාර දේවිය පිළිබඳ පුරාණ දේව කථාවෙහි ශිව දෙවියා මහා බ්‍රහ්මයාට දෙවැනි වූ තැනක් ගනී. මහා බ්‍රහ්මයා ඔහු "කුඩා පුතු" යනුවෙන් අමතයි. ශිව දෙවියන් දේවාතිදේව ලෙස දැක්වෙන පුරාණ දේව කථා මහාභාරතයෙහි වඩා පශ්චිමකාලීන බමුණු පද්‍ය සාහිත්‍ය ස්තරයක් පෙන්නුම් කරයි. විෂ්ණු දෙවිඟනට ප්‍රමුඛස්ථානයක් ලැබෙන පුරාණ දේව කථා සම්බන්ධයෙන් ද මෙය සැබැවි. විෂ්ණු භක්තියට හෝ ශිව භක්තියට හෝ අනුකූල ව ආදි-කාලීන බ්‍රාහ්මණ පුරාණ දේව කථා හා පුරාවෘත්ත බොහෝ විට ප්‍රතිසංශෝධනය කරන ලදි; මෙ සේ වෙනස් කරන ලද කථා හැදින ගැනීම බොහෝ විට දුෂ්කර නො වේ. මෙ බඳු වෙෂ්ණව භක්තික හා විශේෂයෙන් ශිව භක්තික එකතු කිරීම් චිත්‍රයෙක දිස් වන ලප මෙන් වෙයි. ඒවා වෙන් කොට හඳුනා ගැනීම පහසු වන අතර ඒවා ඉවත් කිරීමෙන් එහි කාව්‍යමය අගය වැඩි දියුණු වෙයි. කාව්‍යමය නිර්මාණ වශයෙන් විෂ්ණු හා ශිව දෙවිවරුන් ගේ ගුණ ගායනා කරන කථාන්තරවල අගය බෙහෙවින් හීන වේ.[32]

පුරාණ ඉන්දීය දේව කථාවන්හි අන් කිසි තැනෙක මාර දේවිය ගැන සඳහන් නො වේ.[33] එහෙත් ඉහත සඳහන් පුරාණ දේව කථාවෙහි මරණයට අධිපති දේවිය ධර්ම දේවිය බවට පත් වන පරිද්දෙන්, මරණයට අධිපති යම දෙවි රජ ධර්මයට අධිපති දෙවි රජෙකැයි[34] යන සංකල්පය මහාභාරතය මුළුල්ලෙහි විහිදී පවතී. එහෙත් යම ලොවට අධිපති දෙවි රජ ධර්ම රාජයාට සමාන කිරීම, වීර කාව්‍යයෙහි නො නැසී ආරක්ෂා වී ඇති විශිෂ්ටතම බ්‍රාහ්මණ පද්‍ය කාව්‍යය වූ, පතිභක්තියෙන් යුත් සාවිත්‍රිය පිළිබඳ කාව්‍යයෙහි තරම් උසස් ලෙස අන් කිසි තැනෙක ප්‍රකාශ නො වේ.[35] කාව්‍යයෙහි තරමින් ආගමික ස්වරූපයත්, පුරාණ දේව කථා සමඟ විශේෂයෙන් ම, ශිව හෝ විෂ්ණු යන දෙවිවරු ප්‍රධාන ස්ථානයක් නොගන්නා පිතාමහ වූ මහා බ්‍රහ්මයා මිනිසා ගේ ඉරණම විසඳන පුරාණ බ්‍රාහ්මණ දේව කථා සමඟ සංකලනයත් කතා පුවතෙහි වැඩි කොටසකට පසු තලය වූ තපෝවනයෙහි ස්වාභාවික දර්ශනයත් යන සියල්ල මේ සාවිත්‍ර්‍යුපාඛ්‍යාන බ්‍රාහ්මණ පුරාවෘත්ත කාව්‍ය හා වර්ග කිරීමට මා පොළඹවයි. එහෙත් මෙය පුරාණ සූත්‍ර කාව්‍යයන්හි ඇතුළත් වූ භක්තිය දනවන පුරාවෘත්තයක් නො විය හැකි දැයි මට ඒකාන්ත වශයෙන් කිව නොහැකි ය. සැමියකු සොයමින් නික්මෙන සාවිත්‍රී කුමරිය ගේ ස්වාධීන ක්‍රියාවත්, සෘෂිතුමා ගේත් සිය පියා ගේත් අනතුරු හැඟවීම නො තකා තමා තෝරා ගත් සැමියා කෙරෙහි භක්තියෙන් විසීමත්, ඇය තවුස් දම් පුරමින් යාග පවත්වමින්, ව්‍රත[36] රකින නිවහල් විලාසයත්, ඒ සියල්ලටත් වඩා සිය සැමියා ගේ ජීවිතය සඳහා ධෛර්යවන්ත ලෙස ඉදිරිපත් වීම මෙන් ම යම දෙවියන් පවා විස්මයට පත් කරවන පඬි වදන් පිළිබඳ දැනුමත් යන මේ සියල්ල බ්‍රාහ්මණ කාන්තා රත්නයට[37] වඩා ද්‍රෞපදී, කුන්තී සහ විදුලා බඳු වීර කාව්‍ය

කථා ගායිකාවින් ඔහි පත් කරවයි. එහෙත් සාවිත්‍රී ගේ ගුණ ගායනය කළ තැනැත්තා සූතයකු හෝ බ්‍රාහ්මණයකු හෝ වූව ද කාලාන්තරයෙකින් දක්නට නොලැබෙන අන්දමේ විශිෂ්ට කවියකු වන බවට නම් අනුමානයක් නො වේ. අප ඇස් ඉදිරිපිට මැවී පෙනෙන අයුරු මේ උදාර කාන්තාව ගේ චරිතය ගෙන හැර දැක්වීය හැක්කේ මහා කවියකුට පමණකි. සදාචාරය පිළිබඳ නීරස දේශකයා ගේ ස්වරය මොහොතකට හෝ ආරූඪ කොට නො ගෙන ඉරණම හා මරණය ද අභිභවමින් ප්‍රේමයත්, පතිවතත්, සීලයත්, ඥානයත් ජය ගන්නා අයුරු වර්ණනය කිරීමට සමත් වනුයේ සැබෑ කවියෙක්[38] ම ය. ඉන්ද්‍රජාලිකයකු පරිද්දෙන් අප ඇස් ඉදිරිපිට මෙ බඳු චමත්කාරජනක චිත්‍ර මැවිය හැක්කේ ප්‍රතිභාපූර්ණ කවියකුට පමණි. මරණයට කැප වූ සිය සැමියා පසෙකින් ගමන් කරන සෙවින් තැවෙන ස්ත්‍රිය අපට පෙනෙයි; අසාධ්‍ය ලෙස රෝගාතුර වූ සැමියා සිය බිරිය ගේ උකුළ මත හිස තබා විඩාවෙන් වැතිර ගන්නා අයුරුත්, පුරුෂයා ගේ ආත්මය යදමින් බැඳ එය කැදවා ගෙන යම දෙවියන් ගේ බියකරු විලාසයත්, සිය සැමියා ගේ ජීවිතය සඳහා යම දෙවියන් සමඟ පොර බදන බිරියත්, අවසානයෙහි නැවත එක් වී සඳ පහනේ ඔවුනොවුන් වැළඳ ගෙන සොම්නසින් අසපුව වෙත පිය නඟන අඹුසැමි යුවළත් අපට හමු වෙති. මේ ඕනුවම් සියල්ලට පසු තලය වූ ආදි කල්පීය ඉන්දීය වනය ද අපට පෙනෙයි; මේ අද්විතීය කාව්‍යයෙහි වසඟයට පත් වන අපට මේ වනයෙහි හඬිරු නිසන්සල බව දැනෙන්නා වැන්න; එහි මිහිරි සුවඳ අපට ආඝ්‍රාණය වන්නා සේ ය.

මේ අමරණීය කාව්‍යය හේතු කොට ගෙන හින්දූනට හිමි වූ මහනු භූයාදය ඔවුන් විසින් කොතරම් අගය කරනු ලැබේ ද යනු අප මහාභාරතයෙහි මේ කාව්‍යය කෙළවර එකතු කොට ඇති අවසාන වැකියෙන් ම පෙනෙයි:

"සාවිත්‍රිය ගේ කථා රත්නයට සැදෑහැ සිතින් සවන් දුන් පුද්ගලයා භාග්‍යවන්තයෙකි: ඔහු ගේ කවයුතු වැඩ දියුණු වනු ඇත; ඔහු දුකට පත් නොවනු ඇත."

අද දක්වා හින්දු ස්ත්‍රීහු විවාහ ප්‍රීතිය ලබා ගැනීම සඳහා පතිවත රැකි සාවිත්‍රිය සිහි කරමින් වාර්ෂික උත්සවයක් (**සාවිත්‍රීව්‍රත**) පවත්වති; මහාභාරතයේ මේ කාව්‍යය කියැවීම ඒ උත්සවයෙහි අවශ්‍ය අංගයක් වෙයි.[39]

මේ කාව්‍යය ජර්මන් භාෂාව ද ඇතුළු ව යුරෝපීය භාෂා ගණනකට පරිවර්තනය කරනු ලැබ ඇත.[40] එහෙත් පරිවර්තන, අනුවාද හා අනුකරණ ඉන සියල්ලකින් ම දිය හැකි වන්නේ ඉන්දීය කාව්‍යයෙහි අද්විතීය සෞන්දර්යය පිළිබඳ ලේඛමාත්‍ර හැඟීමක් පමණකි.

බ්‍රාහ්මණ පුරාවෘත්ත සියල්ල සාවිත්‍රිය ගේ පුවත තරම් දැහැමි හා සදාචාරවත් ද නො වේ. ඇත්ත වශයෙන් මහාභාරතයෙහි දැක්වෙන, බ්‍රාහ්මණයින්ට ප්‍රිය වූ ජුගුප්සාජනක, අසභ්‍ය කථාවලින් සම්පූර්ණ පර්වයක් පහසුවෙන් පුරවාලිය හැකි ය. එතෙකුදු වුවත්, මේ පුරාවෘත්තයන් ගෙන් **එකක්** කාව්‍යයක් වශයෙන් උචිතාකාරයෙන් ම ප්‍රසිද්ධියට පත් ව ඇත;

එ පමණක් නො ව මහාභාරතයෙහි විවේචනය සඳහා ද එය ඉතා වැදගති. මේ වූ කලි ස්ත්‍රියක නුදුවු සෘෂිවරයකු වූ සෘෂ්‍යශෘංගයන් ගේ පුරාවෘත්ත යයි.'[41] මේ පුරාණ ඉන්දීය කතා පුවත සැකෙවින් මෙ සේ ය :

ආශ්චර්යවත් ලෙස මුවැත්තියක ගෙන් උපන් සෘෂ්‍යශෘංග[42] වූ කලි සෘෂිවරයකු ගේ පුතෙකි. සිය පියා විනා අන් කිසිවකු නො දැක හෙතෙම වනයෙහි ආශ්‍රමයෙක ඇති දැඩි වෙයි. ඔහු ස්ත්‍රියක් නම් කිසි විටෙක දැක නැත. එ කල්හි ලෝමපාද රජතුමා ගේ රාජධානියෙහි මහා නියං සමයක් ඇති විය. දෙවිවරුන් කුපිතව ඇති හෙයින් සෘෂ්‍යශෘංගයන් සිය රටට ගෙන්වා ගැනීමෙහි සමත් නො වුව හොත් වැසි නො වසිනියි සෘෂිවරු පැවසූ හ. ශාන්තා නම් රාජ දුහිතෘව[43] තරුණ සෘෂිවරයා ඔවුන් ගේ රටට ඒමට පොළඹවා ගැනීමේ කටයුත්ත භාර ගනියි. ගස්වැල් ආදියෙන් පාවෙන කෘත්‍රිම ආශ්‍රමයක් සාදා ගෙන ශාන්තා කුමරිය සෘෂ්‍යශෘංගයන් ගේ වාසස්ථානය කරා යයි. අරණ්‍ය සේනාසනය අසබඩට පැමිණි රජ දුව නදී තීරයෙහි ගොඩ බසිමින් සෘෂ්‍යශෘංගයන් ගේ පියා අසලක නො වූයෙන් අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන තවුස් මානවකයා වෙත එලඹෙයි. ඕ මිහිරි පලතුරු හා මධුර සුරා ද ඔහු හට දෙමින්, භාවභාව ලීලා පෑමින්, පන්දු කෙළිමින්, තරුණයා ප්‍රේමයෙන් වැලඳ ගන්නි ය. තමා වැනි තාපස මානවකවයකු තමා ඉදිරියෙහි වෙතැයි තරුණයා සිතයි. සෘෂ්‍යශෘංගයන් ගේ පියා අසපුව කරා පැමිණෙනු දකින යුවතිය ආපසු යාත්‍රාවට නැඟ ගනියි. සිය පුත්‍රයා ගේ කැළඹුණු විලාසය දකින පියා ඒ ගැන විමසයි. එ කල්හි තරුණයා රුමත් "මානවකයා" පිළිබඳ සිද්ධියත් ඔහු හමු වීමෙන් තමා ලැබූ ආස්වාදයත් උත්කර්ෂවත් අන්දමින් වර්ණනය කොට ඔහු නැවත හමු වීමට ඉතා ආශාවෙන් පසු වන බැවින් එ ම මානවකයා මෙන් "තවුස් දම්" පිරීමට තමා ද ඉතා කැමැත්තෙන් සිටින බව පවසයි. එහෙත් මොවුන් සිල්වතුන් ගේ තපස බිඳනු පිණිස ඒ වෙසින් සැරි සරන රකුසන් බව කියමින් පියා ඔහුට අවවාද කරයි.

එහෙත් පියා නික්ම ගිය වහා ම සෘෂ්‍යශෘංග සිය තරුණ "මිතුරා" සොයා යයි. ඉක්මනින් ම ඔහුට රුමත් ශාන්තා කුමරිය හමු වෙයි. ඇය විසින් හෙතෙම පාවෙන ආශ්‍රමයට ඇතුළු වීමට පොළඹවා ගනු ලැබ, ලෝමපාද රජු ගේ රාජධානියට ගෙන යනු ලබයි. තරුණ සෘෂිවරයා ඒ රටට ඇතුළු වූ සැණෙකින් ධාරානිපාත වැසි වසින්නට වෙයි. මහඟු තුටු පඬුරු තෑගි කොට පියාණන් සමඟි කොට ගත් පසු ව රජ තුමා සිය දියණියන් සෘෂ්‍යශෘංගට සරණ පාවා දෙයි.

වෙනත් ඉන්දීය සාහිත්‍ය කෘතීන්හි, විශේෂයෙන් ම **රාමායණයෙහිත්, පද්මපුරාණයෙහිත්, බෞද්ධ ජාතක පොතෙහිත්** මේ පුරාවෘත්තය නානා අන්දමින් සකස් කොට ගෙන ඇත. මේ ආඛ්‍යානය ආගමික පසුතලයක් මත ගොඩ නැඟුණු පුරාවෘත්තයක් පදනම් කොට ගත්තක් වුව ද, එක්තරා දැඩි හාස්‍ය රසයෙකින් යුක්ත ව එහි මුල් ආකාරයෙන් ඉදිරිපත් කෙරුණු බවත්, නානා සංශෝධකයන් විසින් මේ නොසැබි ගුණ මැකීමට **වෑයම් කරන** ලද බවත් හඳුනා ගැනීම උගහට නො වේ. **ස්ත්‍රියක දැක නැති තවුස් මානවකයාට රුමත් යුවතිය මුණ** ගැසෙන ආකාරයත්, **ඇගේ** භාවභාව ලීලාවෙන් ඔහු ගේ සිත සසල වුව ද ඔහු ඇය තාපසයෙකැයි සිතන ආකාරයත් පිළිබඳ සිද්ධිය, මුල් කතා පුවතෙහි මුඛ්‍යාංගය වූ බව ඉඳුරා කිව හැකි ය; එය විස්තර කිරීමෙහි ලා උපයෝගි කොට ගත් **රළු හාස්‍ය රසය** පිළිබඳ **නිදසුන් කිහිපයක්** බෞද්ධ ජාතකයෙහි මේ දක්වා ද රැකී ඇත. නානා සැකැසුම් මඟින් **තිබ්බතයෙහි** ද, **චීනයෙහි** ද **ජපාන**

යෙහි ද මෙය දක්නට ලැබීමෙන් හා අපර දිග කඟවේනා පිළිබඳ පුරා වෘත්තයෙහි පවා මේ ලක්ෂණ මාත්‍රයක් දැක ගත හැකි වීමෙන් ද මේ හාස්‍ය ජනක කතා පුවත කොතරම් ජනප්‍රිය වී ඇති දැයි පෙනේ.[45]

සෘෂ්‍යශෘංග පුරාවෘත්තය ඊනියා **තීර්ථයාත්‍රා කාණ්ඩයෙහි** අන්තර්ගත වේ.[46] අර්ජුනයන් ගේ සොහොයුරන්[47] අස්වසනු පිණිස පැමිණි **ලෝමශ** ඍෂිවරයා ඔවුන් සමඟ යාත්‍රාවෙක යෙදෙයි. ඔවුන් පැමිණෙන සෑම තීර්ථයෙක දී ම ඒ ස්ථානය පිළිබඳ කථාන්තරයක් ඍෂිවරයා ගෙන හැර දක්වයි. මේ නයින් මේ කාණ්ඩයෙහි බ්‍රාහ්මණ පුරාවෘත්ත රාශියක් එක් රැස් වී ඇත. (මේ කාණ්ඩය මහා භාරතයෙහි පුරාණතම කොටසෙහි ලා නොගැනෙන බවට අනුමානයක් නැත.) නිදසුන් වශයෙන් ඉහත දැක්වුණු ච්‍යවන පුරාවෘත්තය[48] මෙන් ම **අගස්ත්‍ය** නම් සුප්‍රසිද්ධ ඍෂිවරයා පිළිබඳ පුරාවෘත්ත ද අපට දක්නට ලැබෙයි. සාගර පත්ලෙහි වරයා අසුරයන් හා යුද කරනු පිණිස සාගරය සිඳවීමටත්, වෙන යම් යම් දේ කිරීමටත් සුරයෝ මේ මහා ඍෂිවරයා ගෙන් ඉල්ලා සිටියෝ ය. මුළු මහත් සාගරයෙහි ජලස්කන්ධය පානය කිරීමෙන් ඍෂිවරයා මේ ඉල්ලීම ඉටු කරයි. හෙතෙම වෙනත් නොයෙක් බ්‍රාහ්මණ පුරාවෘත්තයන්හි ද කථානායකයා වේ.[49]

දෙව් මිනිසුන් අබිබවා ඍෂිවරයා ගේ ඉමහත් බලය හුවා දැක්වීම මේ අගස්ත්‍ය පුරාවෘත්තයන්හි පරමාර්ථය වූ අතර, **වශිෂ්ඨ** හා **විශ්වාමිත්‍ර**[50] නම් සුප්‍රසිද්ධ ඍෂීන් කථා නායකයන් කොට ගත් පුරාවෘත්ත පන්තියක් ද මහාභාරතයෙහි ඇත. මෙහි දී ද අවසානයෙහි බ්‍රාහ්මණයන් මහත් ප්‍රශංසාවට ලක් වන නමුත් ආධිපත්‍යය සඳහා බ්‍රාහ්මණයන් හා ක්ෂත්‍රියයන් ද අතර සටන පිළිබඳ පැහැදිලි ලක්ෂණ මේ දක්වා දැක ගත හැකි වෙයි. මේ පුරාවෘත්තයන්හි මුල්, වෛදික යුගයේ ද බොහෝ දුරට දිවෙන නමුත් රාමායණයෙහි මෙන් ම පුරාණයන්හි ද නානා අන්දමින් සකස් කොට ගෙන ඇති බව දක්නට ලැබෙයි. මහාභාරතය අනුව මේ පුරාවෘත්තය සැකෙවින් පහත දැක්වේ:

විශ්වාමිත්‍ර වූ කලි **කන්‍යාකුබ්ජයෙහි (කනවුජ්)** ගාධින් රජු ගේ පුත්‍රයාය. දිනක් දඩයමෙහි යෙදුණු හෙතෙමේ වශිෂ්ඨ ඍෂිවරයා ගේ අසපුවට ළඟා විය. මේ ඍෂිවරයා ගේ සියලු මනදෙළ සපුරා ලූ ආශ්චර්යවත් ගව දෙනක් විය. කැමබීම හෝ, ඇඳුම් පැළඳුම් හෝ වෙන යම් කිසිවක් හෝ අවශ්‍ය වූ කල්හි, "දෙව" යි කී පමණින් **නන්දිනී** නම් ගව දෙන එය ඔහුට ලබා දෙයි. මේ ගව දෙන දුටු විශ්වාමිත්‍ර එය ලබා ගැනීමට අදහස් කරමින්, ඒ වෙනුවෙන් සාමාන්‍ය ගවදෙනුන් දස දහසක් වශිෂ්ඨ ඍෂි හට පිළිගැන්වී ය. එහෙත් යාග හෝම කටයුතු උදෙසා අවශ්‍ය සියලු භාණ්ඩ සපයන හව දෙන ගෙන් වෙන් වීමට ඍෂිවරයා කැමති නො වී ය. එ කල්හි විශ්වාමිත්‍ර "ක්ෂත්‍රිය සිරිත" අනුව ගව දෙන සොරා ගැන්මට අදහස් කළේ ය. සාමකාමී වශිෂ්ඨ මීට එරෙහි ව ඉදිරිපත් නොවූ නමුත් මේ ශ්‍රේෂ්ඨ ගව දෙන සිය සිරුරින් බලසම්පන්න යුද්ධ සෙනාවක් නිකුත් කළෙන් ඔවුන් මඟින් විශ්වාමිත්‍රයන් ගේ සේනා පරාජය කොට, පලා යාමට සලස්වන ලද්දේ ය. බමුණන් ගේ බලය ක්ෂත්‍රියයන් ගේ බලය ඉක්මවන බව අහංකාරයෙන් මඬනා ලද රජුට දැන් පෙනෙයි. හෙතෙම රාජ්‍යය අත්හැර බ්‍රහ්මණයකු වීම උදෙසා දැඩි තපස් රැකවරණයට නැඟිය නොහැකි තරම් දැඩි ප්‍රයත්නවලින් පසු ව එ ම අදහස මුරින් පත් කොට ගනියි.

අහැසියුරස් පුරාවෘත්තයෙහි ඇතැම් ලක්ෂණ සිහි කරවන බැවින් මේ පුරාණ දේව කථා පන්තියට අයත් තවත් වැදගත් පුරාවෘත්තයක් දැක්වීමට මම අදහස් කරමි.

විශ්වාමිත්‍ර බමුණකු වූ පසු ව ද වශිෂ්ඨ ඍෂි සමඟ අසමගිය නො සන්සිඳිණ. විශ්වාමිත්‍රයන් විසින් පොළඹවනු ලැබ, රාක්ෂයකු අරක් ගත් **කල්මාෂපාද** විශිෂ්ඨයන් ගේ පුතුන් මරයි. එහෙත් වශිෂ්ඨ ඍෂිවරයා කොතරම් සිල්වත් දැයි කිව හොත් සිය කෝපය පෙන්වීමට වඩා මිය යම යෙහෙකැයි සිතයි. දිවි නසා ගැනීමට සැරසුණු හෙතෙම **මේරු** පර්වතයෙහි සිට පනින නමුත් ලොම් පලසක් මත වැටෙයි. ඔහු ගින්නට පිවිසෙන නමුත් ගින්නෙන් ඔහු නො දැවෙයි. ගෙලෙහි ගලක් එල්ලා ගත් හෙතෙම මුහුදට පනින නමුත් මිය නො යා දී ම ගොඩබිමට ළඟා කරනු ලබයි. මෙ සේ හෙතෙම දුක්බර සිතින් අසපුවට පැමිණෙයි. එහෙත් සිය දරුවන් ගෙන් හිස් වූ පාළු ගෙදර දකින ඔහු ගේ ශෝකය නැවත සිය පණ නසා ගැනීමට සිත යොමු කරවයි. සිය අත් පා රැහැනින් බැඳ ගත් හෙතෙම උතුරමින් ගලා යන කඳුකර දොළ පහරකට පනින නමුත් සැඩ පහර මඟින් ඔහු ගේ බැමි සිදී ගං තෙරකට පත් කරනු ලැබේ. තව දුරටත් සැරි සරන හෙතෙම කිඹුලන් සහ බිහිසුණු රකුසන් ගෙන් පිරුණු ගංගාවකට සැපත් වෙයි; ඔහු ඊට පනින නමුත් චණ්ඩ සත්තු රැළ ඔහු කෙරෙන් ඉවත් වෙති. තමාට සිය පණ හානි කර ගත නොහැකි බව දැන ගන්නා හෙතෙම, කඳුකරයෙහිත් නානා රටවලත් සැරි සරා අසපුවට පෙරළා පැමිණෙයි. අතරමඟ දී **අදෘශ්‍යන්ති** නම් සිය ලේලිය ඔහුට හමු වෙයි; වේද ස්ත්‍රෝත්‍ර ගායනා කරන ඔහු ගේ පුතණුවන් ගේ කට හඬට සමාන කට හඬක් ද ඔහුට ඇසෙයි. මේ කට හඬ වූ කලි මෙතෙක් නූපන් මුනුබුරා ගේ කට හඬයි; මෑණියන් ගේ කුසයෙහි සිටිය දී ම —අදෘශ්‍යන්ති දෙලොස් වසරක පවන් මේ ගැබ දරමින් සිටියා ය— ඔහු සියලු වේදයන්හි පරතෙරට පැමිණ ඇත. සිය පරපුර නොබිඳෙන බව දත් වහා ම ඍෂිවරයා සිය පණ හානි කරගැනීමේ අදහස අත් හරියි.

මෙ බඳු බ්‍රාහ්මණ පුරාවෘත්තයන්හි සාහිත්‍යික අගය සුළු කොට තැකිය නොහැකි නමුත් හුදෙක් බමුණන් ගෞරවයට ලක් කිරීමේ හෝ කිසි යම් බ්‍රාහ්මණ ධර්මයක් උගැන්වීමේ හෝ පරමාර්ථයෙන් ම නිර්මාණය කළ **කථාන්තර** රාශියක් මහාභාරතයෙහි ඇත. නිදසුන් වශයෙන් සිය ගුරු වරයා ගේ වචනයට කීකරු වීමෙහි ලා අන්තයට ම යන ගෝලයන් ගැන කථා අපට අසන්නට ලැබෙයි. **උද්දාලක ආරුණි**ගේ කතා පුවත එබන්දකි; දිය කාන්දු වන වේල්ලක් පිළියම් කිරීමට ගුරුවරයා ගෙන් අණ ලත් හෙතෙම, අන් කිසි මඟක් සොයා ගත නුහුණු හෙයින් සිය සිරුර හරස් කරමින් කාන්දුව නවතයි. බ්‍රාහ්මණයකු ගේ ගව දෙනක වෙන කිසිවකුට දීමේ වරදට දඬුවම් වශයෙන් කටුස්සකු බවට පත් රජකු ගේ කථාන්තරයක් ද මෙහි දැක්වෙයි.[61] බමුණනට දක්ෂිණා වශයෙන් ගව දෙනක දීමට වඩා පිනක් නොමැති බව ස්ථිර කිරීමට වෙනත් කථා ගෙන හැර දැක්වේ. ප්‍රසිද්ධ **උපනිෂදයෙක**, බුද්ධි පිපාසාවෙන් පීඩිත **නචිකේතස්** නම් මානව කයා පර ලොව ගැන යම රජු ගෙන් අසා දැන ගැනීමට යම ලොව ඔහු ගෙවූ කාලයෙන් ප්‍රයෝජන ගනියි. මහාභාරතයෙහි **නාචිකේත** යන නම් ලත් මානවකයා ගව දෙනුන් දුන් තැනැත්තන් වෙසෙන දෙව් ලොව පෙන්වන මෙන් ඉල්ලයි. ගව දෙනුන් දක්ෂිණා කිරීමෙන් සිදු කර ගත

හැකි පින පිළිබඳ ව දීර්ඝ දේශනයක් කිරීමෙන් යම ඔහු සිත පහදයි.[53] ඡත්‍ර සහ පාවහන් දීම පුණ්‍යක්‍රියාවෙකැයි ස්ථූට කරනු පිණිස, **ජමදග්නි** ඍෂිවරයා වරක් සූර්යයා සමඟ කෝප ව සිටියෙන් ඊට ගී පහරක් විද අහසින් පොළොවට ඇද දැමීමට සැරසී සිටි බවත්, අන්තිම මොහොතෙහි දී ඔහුට ඡත්‍රයක් හා මිටිවැඩ සඟළක් ද දීමෙන් හිරු දෙවි ඔහු සැනසූ බවත් කියැවෙයි.[54] විශේෂයෙන් ම උපදේශාත්මක කාණ්ඩවල හා ග්‍රන්ථවල ද (XII සහ XIII) මෙ වැනි කථා සුලභ ය. මහාභාරතයෙහි මේ උපදේශාත්මක කොටස්වල අවසාන වශයෙන්, "ඉතිහාස" නම් ලද ප්‍රධාන කථා සැකිලි රාශියක් ද අපට හමු වෙයි. මෙහි එක ම ප්‍රයෝජනය නීතිය හෝ සදාචාරය හෝ දර්ශනය හෝ පිළිබඳ දේශන හඳුන්වා දී, ඊට යම් කිසි ආකෘතියක් ගෙන දීම පමණකි. මේ ඉතිහාසයන්හි, උපනිෂදයන්හි ද අපට හමු වූ පුද්ගලයන් හා දේශකයන් ම, උදා. **යාඥවල්ක්‍ය** සහ **ජනක**,[55] ඇතැම් විට හමු වීම වැදගත් ය. එ සේ ම, උපනිෂදයන්හි හා බෞද්ධ සූත්‍රයන්හි ද මෙන් ම මහා භාරතයේ උපදේශාත්මක ඉතිහාස යන්හි ද, උගත් ස්ත්‍රීන් මෙන් ම රජවරු හා ඍෂිහු ද හමු වෙති.

මහාභාරතයෙහි දක්වෙන උපමා කථා, දෘෂ්ටාන්ත සහ සදාචාරාත්මක කථා[1]

සංවාද ස්වරූපයක් ගන්නා දේශනා හැඳින්විය හැකි මාතෘකාවක් වන මේ **ඉතිහාස-සංවාද** වැඩි කොටසක් බ්‍රාහ්මණ පුරාවෘත්ත සාහිත්‍යයට අයත් නො වේ; වඩාත් මැනවින් ගැළැපෙන පදයක් නැති බැවින් අප විසින් **ඍෂි කාව්‍ය** යන නමින් හඳුන්වන ගණයට මේවා අයත් වේ.[2] ජනතාව අතර දැනට මත් බොහෝ දුරට අමතක ව ගිය දෙවි දේවතාවුන් පිළිබඳ පුරාවෘත්ත හා සම්බන්ධ වූ බ්‍රාහ්මණ පද්‍ය සාහිත්‍යයෙන් මේ ඍෂි පද්‍ය සාහිත්‍යය පැහැදිලි ව කැපී පෙනෙයි; එය උපමා කථා හා සුරංගනා කථා උපයෝගි කොට ගන්නා හෙයින් ද, හැකි තරම් දුරට ළං වන හෙයින් ද, උපමා කථා හා සුරංගනා කථා ඇතුළත් **ජන** සාහිත්‍යයට වඩාත් සම්බන්ධ වෙයි. බ්‍රාහ්මණ ඉතිහාස-සංවාද වැනි බ්‍රාහ්මණ පුරාවෘත්ත බමුණන්ගේ විශේෂ ඕනෑ එපාකම් සපුරා ලමින්, සීමිත පූජක සදාචාරයක් උගන්වා, යාග හෝම පැවැත්වීමෙන් හා (දෙවියනට වඩා) බමුණනට පූජා සත්කාර කිරීමෙන් ද කූටාවස්ථාවට පත් වන නමුත් ඍෂි පද්‍ය සාහිත්‍යය මිනිස් සංහතිය සඳහා පොදු සදාචාරයක් හුවා දක්වයි; සියල්ලට මත් වඩා සියලු සතුන් හට මෛත්‍රියත්, නෛෂ්ක්‍රම්‍යයත් එය උගන්වයි. මෙම සාහිත්‍යයෙහි ලක්ෂණ පළමු ව උපනිෂද්වල දක්නට ලැබෙන නමුත් පසු ව, **බෞද්ධ** සහ **ජෛන** ත්‍රිපිටකයන්හි තරමට ම මහාභාරතයෙහි හා ඇතැම් පුරාණයන්හි ද දක්නට ලැබෙයි. එ බැවින් මේ නානාප්‍රකාර සාහිත්‍ය ගණයන්හි, ඍෂීන් පිළිබඳ එක ම පුරාවෘත්ත හා නැණ නුවණ හා ආචාර ධර්ම පිළිබඳ එක ම ආප්තෝපදේශ ද, බොහෝ විට එක ම පද පිළිවෙළින් දක්නට ලැබීම පුදුමයට හේතුවක් නො විය යුතු ය.

පුරාණතම ඉන්දීය උපමා කථා ඇත්ත වශයෙන් වීර කාව්‍යයෙහි ම දක්නට ලැබෙයි; මේවා **නීති** ශාස්ත්‍ර—ඒ නම් බැවහර නුවණ මෙන් ම **ධර්මය** හෙවත් සදාචාරය ද උගැන්වීමට උපයෝගි කොට ගැනෙයි. මෙ නයින්, එක්තරා හිවලකු ව්‍යාඝ්‍රයකුත්, මීයකුත්, වෘකයකුත්, මුගටියකුත් යන මිතුරන් සිව් දෙනකු රවටා ගොදුරු සොයා ගෙන, පසු ව, උපායෙන් ඔවුන් පලවා හැර, ගොදුර තනි ව භුක්ති විඳි ආකාරයෙන් පාණ්ඩවයන් රවටා ගැනීමට අමාත්‍යයෙක් ධෘතරාෂ්ට්‍රයනට අවවාද කරයි.[3] තවත් අවස්ථාවෙක ශිශුපාල පුරාණ කුහක රණ හංසයාට භීෂ්ම සමාන කරයි; සැම විට ම සදාචාරය ගැන ම කථා කරමින් සිය මිතුරු සියොත් කැලෙහි විශ්වාසය දිනා ගෙන උන් ගේ බිත්තර රැකීමේ කාර්යය භාර ගන්නා මේ රණ හංසයා සිය බිත්තර ගිල දමන බව පක්ෂීන් දැන ගන්නේ කිසිවක් කළ නොහැකි තරම් කල් ගත වූ පසු ය. දුර්යෝධන ගේ නාමයෙන් උලූක යුධිෂ්ඨිර හට පවසන කපට බළලා පිළිබඳ උපමා කථාව ද රසවත් ය; මේ කථාව යුධිෂ්ඨිර හට ගසන ලද පහරකි. බළලා දැත් ඔසවාගෙන ගංගා නදී තීරයෙහි උග්‍ර තපස් රකී; පෙනෙන අන්දමින් ඌ කොතරම් සිල්වත් හා යහපත් තැනැත්තෙක් ද යත් පක්ෂීන් පවා ඌට වඳිනු පුදනු පමණක් නො ව මීයෝ පවා උගේ රැකවරණ සොයා යති. උන් ආරක්ෂා කිරීමට බළලා එකඟ වන නමුත් සිය තපස නිසා කොතරම් දුර්වල වී ද යත් සෙල්ලම් කිරීමට පවා නොහැකි බව පවසයි. එ ම නිසා මීයන් විසින් බළලා නදිය වෙත උසුලා ගෙන යා යුතු ය; ගං තෙර දී බළලා මීයන් මරා කා තීර්ථ වෙයි.[4] ආප්තෝපදේශ රාශියක් පැවසීමට උපයෝගි කොට ගත් නුවණැති විදුර ද උපමා කථා රාශියක් දනියි. මෙ සේ ආත්මාර්ථකාමිත්වයෙන් පාණ්ඩවයන් ලුහුබැඳ නොයන ලෙස හේ ධෘතරාෂ්ට්‍ර හට අවවාද කරයි; එ සේ කළ හොත්, සිතෙහි ලෝභය නිසා රන් වමාරන පක්ෂීන් ගේ දිවි තොර කොට පක්ෂීන් හා රන් යන දෙක ම අහිමි වූ රජතුමාට සිදු වූ දේ සිදු විය හැකි යැයි පෙන්වා දෙයි.[5] සාමයක් ඇති කරනු සඳහා වටු වැද්ද විසින් එළන ලද දැල ඔසවා ගෙන පියාසර කළ පක්ෂීන් ගැනත්, පසු ව ඔවුනොවුන් අතර දබර කර ගැනීම නිසා උන් වටු වැද්ද අතට පත් වූ විලාසය ගැනත් විස්තර කරන උපමා කථාව ද හෙතෙමේ ගෙන හැර දක්වයි.[6]

උපමා කථා වැඩි කොටසක් ද, දෘෂ්ටාන්ත හා සදාචාරාත්මක කථා සියල්ලක් ද, උපදේශාත්මක කොටස්වල හා XII හා XIII වන පර්වවල ද දක්නට ලැබේ. මින් විශාල සංඛ්‍යාවක්, උපමා කථා හා සුරංගනා කථා ඇතුළත් බෞද්ධ සංග්‍රහවල හා පශ්චාත්කාලීන සංග්‍රහවල ද නැවත දක්නට ලැබෙන අතර කිහිපයක් යුරෝපීය සංවාද සාහිත්‍යයට ද ඇතුළු වී ඇත. මෙ නයින් බළලා හා මීයා අතර කිසි ම මිත්‍ර සන්ථවයක් ඇති විය නොහැකි බව පෙන්වන කථා මාලාවක් ම ලෝක සාහිත්‍ය මුළුල්ලෙහි **ඔබන්ෆපි** විසින් සොයා ගනු ලැබ ඇත.[7]

මහාභාරතයෙහි උපදේශාත්මක කොටස්වල රමණීය දෘෂ්ටාන්ත කිහිපයක් ද දක්නට ලැබේ. මෙ සේ නිහතමානී වීම යෙහෙකැයි යන නැණ වත් සිද්ධාන්තය උගන්වනු පිණිස, "නදිය සහ සයුර ද අතර සංවාදය මුල් කොට ගත් පුරාණ ඉතිහාසය[8] ගෙන හැර දක්වේ:

"නදිය ශක්ති සම්පන්න යෝධ ගස් උගුලුවා ගෙන තමා වෙත ගෙනෙන හමුත් දුබල ඛව පඳුරු කිසි විටෙක නොගෙනෙනුයේ ඇයි දැයි සාගරය ගංගාව ගෙන් අසයි. ගංගා මෙ සේ පවසයි:

"එක ම තැනක් තරයේ බදා ගෙන ගස් නිසි අයුරු නො නැමී සිටී. සැඩ පහරට විරුද්ධ වන හෙයින් ඒවා මුල් බැස ගත් තැනින් ඉවත් විය යුතු ය. බට පඳුරු නො එ සේ ය. සැඩ පහර ළඟා වනු දුටු වහා ම ගස් මෙන් නො ව නැමී ගන්නා බට පඳුර සැඩ පහරෙහි වේගය සන්සිදුණු විට නැවත කෙළින් වෙයි."

විදුර පඬි විසින් ධෘතරාෂ්ට්‍ර රජුට ගෙන හැර දක්වනු ලබන "ස්‍ත්‍රීදෙනි වසන මිනිසා" පිළිබඳ දෘෂ්ටාන්තයට ලැබී ඇති ප්‍රසිද්ධිය හා ලොව මුළුල්ලෙහි ම වාගේ ඇති ව්‍යාප්තිය ද සුළු පටු නො වේ.[9] එහි නෛසර්ගික විශිෂ්ටත්වය කරණ කොට ගෙන මෙන් ම විශ්ව සාහිත්‍යයෙහි එහි වැද ගත්කම කරණ කොට ගෙන ද එය ලුහුඬින් හා තරමක් දුරට පරිවර්තන යක් වශයෙන් උපුටා දක්වීම ද උචිත ය:

රදුරු වන සතුන් ගහණ වනාන්තරයෙක බමුණෙක් මං මුළා වෙයි. බියෙන්කැලැලී ගිය හෙතෙමේ වනයෙන් පිට වීමට මඟක් සොයමින් ඔබ මොබ දුවයි. "මේ බිහිසුණු වනය ශාන්පස උගුල් අටවා දෙ පසින් බියකරු ස්ත්‍රියක දැනින් මැලැඳ ගෙන සිටින එ කල්හි හේ දකියි. යිරි කුළු මෙන් අහසට නැඟී සිටි බිය එළවන පස් හිඳකින් හෙබි යෝධ මකරු මේ මහා වනය වට ලා සිටිති." තව ද, මේ වනය මැද පඳුරුවලින් හා ගස්වැල්වලින් ද මැසුණු ළිඳෙක් වෙයි. ඛමුණා ළිඳට වැටී ලතා ගුම්බයෙක රැඳෙයි. "දෙල් ගසෙක විශාල දෙල් ගෙඩියක් නැටියෙන් එල්ලෙන පරිද්දෙන්, දෙ පා ඉහළටත් හිස පහළටත් සිටින සේ හේ එහි එල්ලී සිටියේය. එහෙත් මෙහි දී මීටත් වඩා බිහිසුණු අනතුරකට හෙතෙම මුහුණ පායි. ළිඳ මැද බිහිසුණු යෝධ මකරකු ද, ළිං ගැටියෙහි හෙමිහෙමින් ළඟා වන මුව සයකින් හෙබි, දෙළොස් රියන් වූ කාල-වර්ණ යෝධ ඇත් රජකු ද හෙතෙමේ දිටි. "ළිඳ වසාගෙන වැඩුණු ගසෙහි අතුපතරෙහි මී බඳිනා නානා ප්‍රකාර බියකරු මී මැස්සෝ නද දෙති. මීයෙන් වැහෙන මී බිඳු ළිඳෙහි එල්ලී සිටින මිනිසා හිජු ලෙස පානය කරයි. සුදු මියනුත්, කළු මියනුත් තමා එල්ලී සිටින ගස දතින් කපමින් සිටි නමුත් ජීවිතය ගැන නොකලකිරුණු හෙතෙම ජීවිතය පිළිබඳ අශාව අත් නො හළේ ය. කම්පා වූ රජුට විදුර විසින් මේ රූපකය තෝරා දෙන පරිදි, මේ වනය වූ කලි සංසාරයයි: බිහිසුණු වන සත්තු නම් ලෙඩ රෝගයි; බිය එළවන යෝධ ස්ත්‍රිය නම් මහලු වියයි; ළිඳ නම් සත්ත්ව සංහතියයි; ළිං පත්ලේ සිටි මකරා නම් කාලයයි; මිනිසා රැඳුණු ලතා ගුම්බය නම් ජීවිතාශාවයි; මුව සයක් සහිත, දොළොස් රියන් ඇත් රජ නම් ඍතු සයකට හා දෙළොස් මසකට බෙදුණු වර්ෂයයි; මීයෝ නම් දිවා රෑ දෙකයි; මී බිඳු නම් කාමාස්වාදයයි.

මේ දෘෂ්ටාන්තය වූ කලි ඉන්දීය සෘෂි පද්‍ය සාහිත්‍යයෙහි නිර්මාණයක් බවට අනුමානයක් නැත. එය "මුලින් බෞද්ධ" වූවකැයි[10] කියැවෙන නමුත් එය ජෛනයන් ගේ හා වෙනත් ඉන්දීය තාපස නිකායවල ජීවන දර්ශනයට වඩා බෞද්ධ ජීවන දර්ශනයට අනුකූල වන්නේ නො වේ. එතෙකුදු වුවත්, එය අපර දිගට ව්‍යාප්ත වීමට මඟ හෙළි කළේ එහි බෞද්ධ මූහුණුවර විය හැකි ය; කුමක් නිසා ද යත්, මුලින් ම ඉන්දියාවෙහි

පහළ වූ නමුත් පසු ව මුළුමනින් ම අන්තර්ජාතික බවට පත් වූ "බර්ලාම් සහ ජෝශප්" (Barlaam and Joasaph) හා "කලීලා සහ දිම්නා" (Kalilah and Dimnah) යන ජනප්‍රිය ග්‍රන්ථවල මාර්ගයෙන් අපර දිගට පැමිණි සාහිත්‍ය ප්‍රවාහය ඔස්සේ එය ප්‍රධාන වශයෙන් අපර දිග සාහිත්‍යයට ඇතුළු වූ බැවිනි. එහෙත් ජර්මනියෙහි එය බෙහෙවින් ම ජනප්‍රිය ව ඇත්තේ රූකට් ගේ "Es War ein Mann in Syrerland" නම් රමණීය කාව්‍යය නිසා ය; මීට කෙළින් ම මුල් වූ මූලාශ්‍රය වූ කලී ජෙලාලෙද්-දින්-රූමි නම් කවියා ගේ පර්සියානු කාව්‍යයෙකි.[11] 'බ්‍රාහ්මණ, ජෛන, බෞද්ධ, මහමදීය, ක්‍රිස්තියානි හා යුදෙව් යන සැම අයකු ගේ ම නැණගුණ වැඩෙන සඳහා එක සේ ප්‍රයෝජනවත් වූ, සැබවින් ම නිකායක් නොහඳුනන මේ දෘෂ්ටාන්තයෙහි ව්‍යාප්තිය" අර්නස්ට් කූන් විසින් විශ්ව සාහිත්‍යය මුළුල්ලෙහි සොයා බලනු ලැබ ඇත.[12]

මේ දෘෂ්ටාන්තය මෙන් ම, මහාභාරතයෙහි සදාචාරාත්මක කථා රාශියක් ද බෞද්ධ මූලාශ්‍රයකට දිවෙන සේ සැලකීමට පුළුවන. එ සේ වුව ද, තව දුරටත් පිරික්සූ කල්හි, බ්‍රාහ්මණයන්, බෞද්ධයන් හා වෙනත් නිකායිකයන් යන සැම අයකුට ම එක සේ ප්‍රයෝජන ගත හැකි වූ ජන කථා සාහිත්‍යයෙන් ඒවා ලබා ගැනීමට ද එ බඳු ම ඉඩක් ඇත. නිදසුන් වශයෙන් ශිබි රජු පිළිබඳ කථා බෙහෙවින් බෞද්ධ මුහුණුවරක් පළ කරනු ඇමණක් නො ව, ආත්ම-පරිත්‍යාගයෙන් යුත් රජු දැස ම උගුලුවා යාචකයකුට දන් දෙන අන්දම විස්තර කරන මේ පුරාවෘත්තය ත්‍රිපිටකයට අයත් කෘතියෙක්[13] සැබවින්ම දක්නට ද ලැබේ. මහාභාරතයෙහි මේ පුවත තුන් ආකාරයෙකින් ඉදිරිපත් වේ[14]; උකුස්සකු විසින් ලුහු බඳිනු ලැබ පරෙයියකු ගේ ජීවිතය රැක ගනු පිණිස රජ තුමා සිය ශරීර මාංශය කැබලිවලට කපා, ජීවිතය ද පරිත්‍යාග කරන අන්දම විස්තර කැරෙයි. එ සේ වුව ද, මේ ශිබි රජ, යයාති රජු පිළිබඳ පුරාණ වීර කථාවන් හි ද තැනක් ගත් පුද්ගලයෙකි. හෙතෙම යයාති රජු ගේ සිල්වත් මුනුබුරන් සිව් දෙනා ගෙන් කෙනෙකි; මේ සිව් දෙනා රජු හට දෙව් ලොව සිය තැන පිරිනමමින්, අවසානයෙහි ඔහු සමඟ දෙව් ලොව උපදිති.[15] තවත් තැනෙක ශිබි රජු ගේ අප්‍රමේය ධනස්කන්ධය හා නොමසුරු ත්‍යාග වන්ත භාවය පිළිබඳ වර්ණනය ද පැහැදිලි ව ම බ්‍රාහ්මණික ස්වරූපයක් ගනී; මිහිපිට වැටෙන වැසි බිඳු මෙන් ද, අහස් කුස දිස්වන තරු කැට මෙන් ද, ගංගා නදී පත්ලෙහි වැලි කැට මෙන් ද ගවයන් අසංඛ්‍ය ගණනක් බමුණනට ප්‍රදානය කරමින් යාග හෝම පවත්වන සැදැහැවතකුට ලෙස මෙහි ඔහුට ප්‍රශංසා කැරෙයි.[16]

දඩයක්කාරයා හා පරෙවියන් ද පිළිබඳ සිත් කම්පා කරවන කතා පුවතද සෘෂි පද්‍ය සාහිත්‍යයෙහි ඉතා ජනප්‍රිය වූ ආත්මපරිත්‍යාග කරන පුද්ගලයින් පිළිබඳ කථා මාලාවට ඇතුළත් වෙයි.[17] පඤ්චතන්ත්‍රයෙහි එක ප්‍රකරණයෙක ද මෙය දක්නට ලැබේ.[18] දඩයක්කාරයා ගේ "අමුත්තාට පිරිනැමීම සඳහා කිසි ම ආහාරයක් නොවූයෙන් පරෙවි ධෙනුව අල්ලා

හත් දඩයක්කාරයා ගැසූ ගිනි මැලයට පැන පරෙවියා දැවෙන විලාසයත්, පරෙවි ධෙනුව සිය සැමියා සමඟ ම මිය යන විලාසයත්, මේ පරෙවි යුවළ ගේ දැඩි ප්‍රේමයෙන් හා ආත්ම-පරිත්‍යාගයෙන් ද බෙහෙවින් කම්පාවට පත් දඩයක්කාරයා වන ජීවිතය අත් හැර, තවුස් ජීවිතයට බැස අවසාන යෙහි තෙමේ ද ගින්නට පැන මිය යන විලාසයත්, විස්තර කරන මේ "පූජනීය වූ පාපනාශන ඉතිහාසයෙහි" දක්නට ලැබෙන පරිදි සතුරාට ප්‍රේම කිරීමත්, ආත්ම පරිත්‍යාගයත් මීට වඩා උච්චාවස්ථාවකට පැමිණිය නොහැකි තරම් ය.[10]

දෙව් ලොව යාමට අකමැති **මුද්ගල** නම් ගුණවත් තාපසයා ගේ **කථාන්තරයෙන්** තාපස සදාචාරයෙහි තවත් පැත්තක් හෙළි වෙයි.

මුද්ගල ඉතා ප්‍රඥාවන්තයකු හා ශීලවන්තයකු ද වන බැවින් ඔහු දෙව් ලොව කැඳවා ගෙන යනු සඳහා දේව දූතයෙක් පැමිණෙයි. එහෙත් දෙව් ලොව වාසය කෙ බඳු වේ දැයි විමසා බැලීමට මුද්ගල යුහුසුළු වෙයි. දෙව් ලොව සියලු ශ්‍රී විභූතියත්, ගුණවතුනට එහි දී ආස්වාදනය කළ හැකි සියලු සැප සම්පතුත් දේව දූතයා වර්ණනය කරයි. මේ සුඛාස්වාදය සදාකාලික නොවන බව වසන් කිරීමට නම් ඔහුට නොහැකි ය. සියලු දෙනා ම තම තම ක්‍රියාවන්හි පල-විපාක විඳිය යුතු ය. කර්මය ගෙවී ගිය පසු ව නැවත වරක් දෙව් ලොවින් චුත ව නව අත් බවක් ලැබිය යුතු ය. ඒ කල්හි මුද්ගල මෙ බඳු දෙව් ලොවක් ගැන ආශාව අත් හරියි; හේ නැවත වරක් තවුස් දම් පිරීම අරඹා අවසාන යෙහි ධ්‍යානයෝගී ව හා ඉන්ද්‍රිය දමනයෙන් ද වාසය කරමින්, **නිර්වාණය** නමැති සදාකාලික ආනන්දය වූ අත්‍යුත්තම විෂ්ණු දෙවියන් පසක් කොට ගනියි.[20]

උපනිෂද්වල[21] අපට මුලින් ම විද්‍යාමාන වූ මිනිසා ගේ ඉරණම කොට ගත් **කර්ම** වාදය මහාභාරතයෙහි ගැඹුරු කථා රැසකට වස්තු වී ඇත. ඉතා ම රමණීය කථාවක් නම් **නාගයා, මරණය, ඉරණම** හා **කර්මය** පිළිබඳ කථාවයි. මෙය සැකෙවින් මෙ සේ ය:

ගෞතම් නම් සිල්වත් බමුණු මැහැලියක ගේ පුත්‍රයා දිනක් මැරී සිටියි. නාගයකු ඔහු දෂ්ට කොට ඇත. **අර්ජුනක** නම් කුරිරු දඩයක්කරු නාගයා රැහැනින් බැඳ ගෙන අවුත්, පුතා මැරූ දුෂ්ටයා කෙසේ මරා දැමිය යුතු දැයි ගෞතමිය ගෙන් ප්‍රශ්න කරයි. නාගයා මැරීමෙන් සිය පුතණුවන් ගේ ජීවිතය ආපසු නොලැබෙන බවත්, වෙන අන් කිසි යහපතක් හෝ සිදු නොවන බවත් ගෞතමී පවසයි; පණ ඇති සතකු මැරීමෙන් සිදු වනුයේ තමා පව් පුරවා ගැනීම පමණකි. ඉන්ද්‍ර දෙවියන් වෘත්‍ර ඝාතනය කළ පරිදි සතුරන් මැරීම යෙහෙකැයි දඩයක්කරු පිළිතුරු දෙයි. එහෙත් සතුරනට වධහිංසා පමුණුවමින් මරා දැමීම යෙහෙකැයි ගෞතමියට සිතිය නොහැකි ය. මේ අවස්ථාවෙහි නාගයා ද කථාවට එක් වෙයි. කුමාරයා ගේ මරණයට වරදකරු තමා නොවන බව හේ කියා සිටී. වරදකරු වූ **මෘත්‍යු** හෙවත් මරණයට අධිපති දෙවියා නාගයා ගිය මාධ්‍යය වශයෙන් පමණක් උපයෝගී කොට ගත්තේ ය. නාගයා කුඩා ළමයා ගේ මරණය සම්බන්ධයෙන් වරදකරු වේ ද, නො වේ දැයි නාගයා සහ දඩයක්කරු ද වේගවත් ලෙස තර්ක කරමින් සිටිය දී, මරණයට අධිපති **මෘත්‍යු** දේවතාවා තෙමේ ම පහළ වී, ළමයා ගේ මරණයට වරදකරු නාගයා හෝ තමා හෝ නො ව **කාල** ("කාලය") බව පවසයි: සියල්ල සිදු වන්නේ **කාල** නිසා ය; **සියල්ල** පවතින්නේ **කාල** නිසා ය. "සුළං පහරට හසු ව මලාකුළු ඔබමොබ හසාගෙන

යන අයුරු මාත්‍ය ද කාලයේ අණසකට යටත් විය යුතු ය. නාගයා මෙන් ම මෘත්‍යු ද ළමයා ගේ මරණය සම්බන්ධයෙන් වරදකරු වන බව දඩයක්කරු තරයේ ම කියා සිටින කල්හි කාල තමා ම පහළ වී, මෙ සේ පවසයි: "දඩයක්කාරය, මා හෝ මෘත්‍යු හෝ මේ නාගයා හෝ කිසි ම සත්ත්වයකු ගේ මරණය සම්බන්ධයෙන් වරදකරු නො වේ; අපි ඊට හේතු නො වෙමු. අප ඊට පෙළඹවූයේ කර්මයයි; ඔහු ගේ විනාශයට අන්‍ය හේතුවක් නොමැත. ඔහු ගේ ම කර්මය නිසා හේ මිය ගියේ ය.....කුඹලා මැටි පිඬෙකින් ඔහුට අභිමත සෑම දෙයක් ම සාදා ගන්නා පරිදි මිනිසා ගේ කර්මය නිසා සකස් කොට ගත් විපාකය ම ඔහුට අත්පත් වෙයි. ආලෝකයත්, අඳුරත් සෑම විට ම අත්‍යන්තයෙන් බැඳී පවත්නා පරිදි, ක්‍රියාවත්, එහි කර්තෘත් තෙමේ ම කරන ලද කර්මය හේතු කොට ගෙන අත්‍යන්ත යෙන් බැඳී පවතී. "එ කල්හි, සිය පුතණුවන් ගේ මරණයට හේතුව ඔහු ගේ ද, තමා ගේ ද කර්මයෙහි නොවැළැක්විය හැකි විපාකය බව සිතමින් ගෞතමිය සිත සනසා ගනියි.[23]

මිනිසා මරණය කෙරෙහි කෙසේ පැවතිය යුතු ද යනු ඉන්දිය චින්තකයන් හා කවීන් ද නානා උපදේශ වාක්‍ය මඟින් හා කිසිවකු අස්වසනු පිණිස නිර්මාණය කරන ලද නොයෙකුත් කථා මඟින් ද නැවත නැවතත් සලකා බැලූ ප්‍රශ්නයකි.[32] මෙයින් ඉතා රමණීය කථාවක් නම් ගිජු ලිහිණියා ද, හිවලා ද මියගිය ළමයා ද පිළිබඳ කථාන්තරයයි; මේ කථා වස්තුව ද සුලුඩින් විසතර කැරෙනු ඇත:

බමුණකු ගේ එක ම බිළිඳු පුත් කුමරා මිය යයි. නෑදෑයේ හඬමින්, විලාප නඟමින් කුඩා දරුවා ගේ මළ මිනිය සොහොනට ගෙන යති. සොවින් තැවෙන ඔවුනට මිය ගිය සුරතල් දරුවා දමා ඒම ඉවසිය නොහැකි වෙයි. විලාප හඬ ඔස්සේ ඒ දිශාවට පියාසර කළ ගිජු ලිහිණියෙක් මළවුන් සඳහා වැලැපීම නිරර්ථක කටයුත්තක් බව ඔවුනට විස්තර කර දෙයි. කාලයේ වසඟයට පත් වූ පසු කිසිවෙක් නැවත දිවි නො ලබයි;[24] එ හෙයින් ප්‍රමාද නො වී ඔවුන් ආපසු ගෙදර යා යුතු ය. තරමක් අස්වැසුම් ලත් නැසියේ ගෙදර බලා පිටත් වෙති. එ කල්හි හිවලෙක් ඔවුන් වෙත අවුත් ඔවුන් ගේ එක ම පුතණුවන් මෙ තරම් ඉක්මනින් තනි කර දමා යන්නේ ඔහු කෙරෙහි ප්‍රේමයක් නොමැති බැවිනැයි කියමින් ඔවුනට දෝෂාරෝපණය කරයි. ඔහු ශෝකයෙන් ආපසු සොහොනට යෙති. මෙහි දී ගිජු ලිහිණියා හමු වූ විට ඔවුන් ගේ දුර්වලත්වය ගැන තරවටු කරයි. යමකු මළවුන් සඳහා නො ව තමන් සඳහා ශෝක විය යුතු ය. මළවුන් සඳහා වැලපෙනු නො ව සියල්ලට පෙර පව් සෝදා හළ යුතු ය; මිනිසා ගේ සියලු දුකසැප කර්මය නිසා ම සිදු වෙයි. සියලු සත්ත්වයෝ සිය පුණ්‍ය ක්‍රියා හා පාප ක්‍රියාද හේතු කොට ගෙන කාලයා ගේ වසඟයට පත් වෙති. තොප වැලපීමෙන් කවර ඵලයෙක් ද? මරණයට දෙස් පවරනුයේ ඇයි? ආදි වශයෙනි. දුක් වන නෑදෑයේ නැවතත් ගෙදර බලා පිටත් වෙති; දරුවා කෙරෙහි ප්‍රේමය අත් නොහරින ලෙස සිවලා නැවතත් ඔවුනට අවවාද කරයි. ඉරණමට විරුද්ධ ව සටන් කිරීමට වැයම් කළ යුතු ය; දරුවාට කෙසේ හෝ නැවත ප්‍රාණය ලබා දීමට උත්සාහ විය හැකි ය. එ කල්හි ගිජු ලිහිණියා මෙ සේ පවසයි: "සහස් වසක් වයස් වුව ද මිය ගිය තැනැත්තකු නැවත ජීවත් වනු මම නො දිටිමි.....දෙමාපියන් ද, නෑ මිතුරන් ද ජීවත් ව සිටිය දී ඔවුන් ගැන සොයා නොබලන තැනැත්තා සදාචාරය පිටු දකින්නෙකි. දැස් නොපෙනෙන, මැරී දරදඬු ව නොසැලී සිටින කෙනකු ගැන වැලපීමෙන් කවර ඵලයෙක් ද? ගිජු ලිහිණියා නැවත නැවතත් නෑදෑයනට ගෙදර බලා යාමට අවවාද කරන අතර හිවලා ඔවුන් ආපසු සොහොනට යාමට පොළඹවයි. මෙය කිහිප වරක් ම සිදු වෙයි. ගිජු ලිහිණියාත්, හිවලාත් මේ අන්දමින් තමන්ගේ උපායට මඟ හෙළි කරගනිති; දෙ දෙනා ම බඩ සයින් පෙළෙමින්, මළ මිනිය දෙස ගිජු ඇස් හෙළති. උමා නම් සිය බිරිය විසින් උත්සුක කරවනු ලැබූ ශිව දෙවියෝ අසරණ නෑදෑ පිරිස කෙරෙහි අනුකම්පාවෙන් නැවත දරුවාට පණ ලබා දෙති.[25]

එහෙත් මහාභාරයේ සදාචාරාත්මක කථාන්තරවලින් ප්‍රකාශයට පත් වනුයේ තාපස සදාචාරය පමණකි. අඛණ්ඩ ප්‍රේමයත්, පිය—පුතු ප්‍රේමයත් මුල් කොට ගත් එදිනෙදා සදාචාරය බොහෝ දුරට උගන්වන හෙයින් මේ කථා බොහොමයක් විශේෂයෙන් අප සිත් ඇද ගනී. මේ කථා අතරින් ඉත රසවත් වස්තුවක් නම් බරපතළ පාපයෙහි බැඳුණු මව ගේ දිවි තොර කිරීමට පියා ගෙන් අණ ලත් **චිරකාරින්** හෙවත් **මැනවින් මෙනෙහි කරන මානවකයා ගේ කථාවයි.**[20] හෙතෙම ස්වභාවයෙන් ම කලබල නොවී සියල්ල දිහින් දිගට සලකා බලන බැවින්, මේ විධානය ක්‍රියාවට නැඟීමට ඉක්මන් නො වමින්, සිය පියා ගේ විධානය ඉටු කරමින් මාතෘඝාතක යකු ගේ පාපය තමා පිට පමුණුවා ගත යුතු ද, නැත හොත් පියා කෙරෙහි ඉටු විය යුතු යුතුකම පැහැර හැරිය යුතු දැයි ඒ මේ අත කල්පනා කර බලමින් අණ පිළි පැදීමට ප්‍රමාද වෙයි. ඔහු මෙතෙක් වේලා මේ කරුණු මෙනෙහි කරමින් සිටින අතර කෝපය සන්සිඳුණු පියා පැමිණ, චිරකාරින් නම් සිය නාමය අනුව ම තම පුත්‍රයා මෙ තෙක් වේලා ඒ ගැන මෙනෙහි කරමින් සිටීම ගැන බෙහෙවින් ප්‍රීතියට පත් වෙයි. එක්තරා හාස්‍ය රසයෙකින් ද හෙබි, ජනප්‍රිය සරල ශෛලියකින් ඉදිරිපත් කොට ඇති මේ කථාන්තරයෙහි මැද කොටසේ මානවකයා හුදෙකලා ව කල්පනා කරමින් සිතූ කරුණු දැක්වෙයි. පිතෘ ප්‍රේමය ගැන ද පුතුන් ගේ යුතුකම් ගැන ද ඉතා රමණීය ලෙස කථා කරන හෙතෙම මාතෘ ප්‍රේමය ගැන ඊටත් වඩා සුන්දර කියුම් ගෙන හැර දක්වයි :

"මව ජීවත් වන තාක් කල් කෙනකු මැනවින් රැක බලා ගනු ඇත: ඇය නැති වූ විට රැකවරණයක් නැති වෙයි. "අම්මා" කියමින් ගෙට ඇතුළු වන තැනැත්තාට කිසිම දුකක් නො වෙයි; ඔහු ගේ සියලු සම්පත් නැති වී ගියේ වුව ද කාලයා ගේ පීඩාවට හසු නො වෙයි. කෙනකු හට දරුමුනුබුරන් සිටිය ද, සියක් හැවිරිදි වුව ද, හෙතෙම මව කරා පැමිණි කල්හි දැවිරිදි දරුවකු මෙන් වෙයි ..... ඔහු ගේ මව නැති වූ කල්හි මිනිසෙක් සැබැවින් ම මහලු වෙයි, දුප්පත් වෙයි; එ කල්හි සියලු ලොව පාළු වෙයි. මවක බඳු සිසිල් සෙවණක් නැත; මවක බඳු සරණක් නැත; මවක බඳු ආදරවන්ත කෙනෙක් නැත.[21]"

මේ කථාන්තර සියල්ලෙහි ම ප්‍රධාන වැදගත්කම එහි චරිතයන් ගේ මුවට නැඟුණු කථාවල දක්නට ලැබෙයි. එහෙත් ඊ නියා **ඉතිහාස** රාශියක් ම ඇත්ත වශයෙන් කෙටි හැඳින්වීම් හා උපදේශාත්මක **සංවාදයනට** මුල් වූ කථා සැකිලි බවත් ඉහත සඳහන් කෙළෙමි; එහෙයින් මේවාට **ඉතිහාස සංවාද** යයි නම් කළ හැකි ය. මේ ඇතැම් සංවාද උපනිෂද් සාහිත්‍යයෙහි සහ බෞද්ධ සාහිත්‍යයෙහි ද දක්නට ලැබෙන මෙ වැනි විශිෂ්ට නිර්මාණ හා සම තත්ත්වයෙක ලා ගිණිය හැකි වෙයි. විදේහයේ **ජනක** රජු ගේ සිත නිවී ඇවෙයි.[22] **පිඬගලා** නම් වෙසඟන සිය පෙම්වතා හමු වීමට නියම කොට ගත් වැකියක් වැන්න: "මා සතු කිසිවක් නොමැති බැවින් මාගේ ධනය පමණ

කළ නොහැකි ය. මිථිලා නුවර සහමුලින් දැවී ගිය ද, මා සතු කිසිවක් නො දැවෙයි.[29] පිඞ්ගලා නම් වෙසඟන සිය පෙම්වතා හමු වීමට නියම කොට ගත් ස්ථානයෙහි දී ඔහු මිය යාම නිසා සිය ශෝකය මැඩ පවත්වා ගෙන, සැම විට ම ඉන්දීය තාපස පාණ්ඩිත්‍යයෙහි පරමාධ්‍යාශය වූ ගැඹුරු නිවන් පසක් කොට ගනී. "පිඞ්ගලා ශාන්ත ව සැතපෙන්නී ය."[120] යන ශ්ලෝකයෙන් අවසන් වන වදන් බෞද්ධ ජේතිහාථා සිහිපත් කරවයි. "ඇතැම් විට උපනිෂද්වල[30] දක්නට ලැබෙන පරිදි මහාභාරත සංවාදයන්හි ද පරම ඥානය දැන සිටින්නාහු බොහෝ විට කුලහීනයෝ සහ පහත් පන්තියේ ජනයා ද වෙති. මෙ නයින්, සිල්වත් දඩයක්කාරයකු හා මස් වෙළෙඳකු වූ ධර්මව්‍යාධ විසින් දර්ශනය හා සදාචාරය ගැනත්, විශේෂයෙන් ම තුලාධාර නම් සුළු බඩු වෙළෙඳා ද, ජාජලි නම් බ්‍රාහ්මණ තවුසා ගේ සංකල්පය ගැනත්, කෞශික නම් බමුණාට අනුශාසනා කරනු ලැබේ.[31] එසේ ම තුලාධාර නම් සුළු බඩු වෙළෙඳා ද, ජාජලි නම් බ්‍රාහ්මණ තවුසා ගේ ආචාරීන් වන සේ පෙනේ.[32] මේ ඉතිහාස-සංවාදය ඉන්දීය ආචාර ධර්ම පිළිබඳ ඉතිහාසයෙහි කොපමණ වැදගත් වේ ද යත්, එය මෙහි සැකෙවින් දැක්වීම වටනේ ය:

ජාජලි නම් බමුණා වනයෙහි වසමින් අති උග්‍ර අත්තකිලමථානුයෝගයෙහි යෙදී සිටියේය. වැරහැලි හා සම් පෙරෙව, කෑන කුණු ආදියෙන් වැසී ගත් හෙතෙම වැසි කුණාටු නො තකා වනයෙහි ඔබ මොබ සැරිසරමින්, ඉතා දුෂ්කර උපවාසයන්හි යෙදෙමින්, කාලගුණයෙහි වෙනස්වීම් කිසි සේත් නො නැකී ය. වරක් හෙතෙම වනයෙහි භාවනායෝගී ව කණුවක් මෙන් නො සැලී සිටියේය. මෙ කල්හි කුරුලු ජෝඩුවක් ඔහු වෙත පියාසර කරමින්, කුණාටුවෙන් අවුල් ව, කෑන කුණු හා වැස්ස නිසා සැඩපලු ගෙතුණු ඔහු ගේ හිස කෙස් අතර කූඩුවක් තැනුවෝ ය. යෝගියා මේ බව දැන ගත් කල්හි, සිය හිස මත සාදා ගත් කූඩුවෙහි පක්ෂි ධෙනුව බිත්තර දමා බිජු රැක පැටවුන් එළියට අවුත්, පිහාටු ඉදි පියාසර කොට පලා යන තෙක් අත් නො සොල්වා, කණුවක් මෙන් නො සැලී සිටියේය. මේ විශිෂ්ට තපස් වික්‍රමයෙන් පසු ව මානයෙන් දැපුණු ජාජලි "සියලු භක්තියෙහි සාරය මම පසක් කර ගත්තෙමැයි" වනයෙහි මහ හඬක් නඟයි. එ කල්හි අහස් තලයෙහි සිට දිව්‍යමය ස්වරයක් මෙ සේ පිළිතුරු දෙයි: ජාජලි, තෝ භක්තිනේ තුලාධාරනනට පවා සම නොවන් නෙහි ය; බරණැස වසන මේ ඉතා ප්‍රඥාවන්ත තුලාධාරයනට පවා මෙ වැනි ප්‍රකාශයක් කළ නොහැකි ය". එ කල්හි බෙහෙවින් කලකිරුණු ජාජලි, තුලාධාර මේ තරම් දුරට භක්ති මාර්ගයෙහි ගමන් කළේ කෙසේ දැයි දැන ගනු වස් බරණැස බලා යයි. එහෙත් තුලාධාර වූ කලි බරණැස සල්පිලෙක කුළුබඩු බෙහෙත් බඩු ආදිය විකුණන සුළු බඩු වෙළෙන්දෙකි. ඔහු ගේ ලොව පතළ භක්තිය කුමකින් සමන්විත වේ දැයි යන ජාජලි බමුණාගේ ප්‍රශ්නයට පිළිතුරු දෙමින්, හෙතෙම පහත සඳහන් වචනවලින් පටන් ගෙන සදාචාරය පිළිබඳ දීර්ඝ දේශනය කරයි:

"ජාජලි, සියලු රහස් සහිත සනාතන ධර්මය මම දනිමි: මෙය ඔයල්ලනට හිතකර පුරාණ ධර්මය වශයෙන්, මෛත්‍රී ධර්මය[33] වශයෙන් ලෝකයා දනිති. ඔයලු සතුන් කෙරෙහි සම්පූර්ණ අහිංසාවෙන් යුක්ත වූ නොහොත්, ඉතා සුළු හිංසාවෙන් පමණක් යුක්ත වූ දිවි පෙවෙතක් වූ කලි ශ්‍රේෂ්ඨතම භක්තියයි; ජාජලි, මම ඊට අනුකූල ව වෘසය කරමි. අන්‍යයන් විසින් කපන ලද දැවයෙන් සහ තණවලින් මම මේ පැල සාදා ගත්තෙමි. ළපටි නෙළුම් මුල්, නෙළුම් දඬු, නානාවිධ සුවඳ විලවුන්, මත්පැන් හැර නොයෙකුයි යුෂ හා පාන වර්ග වංචාවෙන් තොර ව මම මිලයට ගෙන විකුණමි. ජාජලි, සියලු සතුන් ගේ මිතුරකු ව, සිතින්, වචනයෙන් හා ක්‍රියාවෙන් ද යන තුනින් ම සියලු සතුන් ගේ සැපතෙහි දී සැම විට සතුටු වන තැනැත්තා සදාචාර ධර්මය දන්නේ ය. ප්‍රිය වූවක් හෝ අප්‍රිය වූවක්

හෝ පේ‍්‍රමයක් හෝ ද්වේෂයක් හෝ මම නො දනිමි. මම සිගල්ලන් කෙරෙහි එක සේ උපේක්ෂාවෙන් වෙසෙමි: ජාජලි, බලව, මේ මගේ ව්‍රතයයි. ජාජලි, සියලු සතුන් කෙරෙහි මගේ තුලාව සම බර වේ[11]. කෙනෙක් කිසිවකු ගැන බිය පත් නො වෙත් නම්, කිසිවෙකු ඔහු කිසා බිය නො වෙත් නම්, කිසිවකුට විශේෂ ඇල්මක් හෝ ද්වේෂයක් හෝ නොමැති නම් හෙතෙමේ බ්‍රහ්මානුයෝගී ව වාසය කරයි....."

ඉක්බිති අහිංසාව පිළිබඳ දීර්ඝ විස්තරයක් ඇතුළත් වේ. පණ ඇති සියලු සතුන් කෙරෙහි මෛත්‍රිය දැක්වීමට වඩා ශ්‍රේෂ්ඨ ධර්මයක් නවත් නැත. ඒ බැවින් සත්ත්ව හිංසාවත්, සත්ත්ව ඝාතනයත් කළ යුතු වන බැවින් පශු පාලනය නපුරු ය. දුසයත් ගෙන් මෙහෙ ගැන්වීමත්, පණ ඇති සතුන් වෙළෙඳාමත් ඒ සේ ම නපුරු ය. නඟුලින් පොළොව සෑදී, අහිංසක සතුන් රාශියක් මැරෙන හෙයින් කෘෂිකර්මය පවා පාප සහගත වෘත්තියෙකි. කෘෂිකර්මයෙන් හා පශු පාලනයෙන්ද තොර ව මිනිසුනට ජීවත් විය නොහැකි බවත්, ආහාර සොයා ගත නොහැකි බවත්, සතුන් ගේ දිවි තොර කළ නොහැකි නම් ගස්වැල් විනාශ කළ නොහැකි නම් යාගහෝම පැවැත්වීමට ද නොහැකි බවත් කියමින් ජාජලි ඊට විරුද්ධ වෙයි. ඒ කල්හි බැබ යාගය පිළිබඳ ව දීර්ඝ දේශනයක් තුලාධාර කරයි. විපාක ලැබීමේ වේතනා වෙන් තොර ව, පූජක වංශවෙන් තොර ව, පණ ඇති සතුන් නො මරා යාගය පැවැත්විය යුතු ය. අවසානයෙහි, මේ ධර්මයෙහි සත්‍යතාව ඔප්පු කරනු පිණිස සාක්ෂිකරුවන් වශයෙන් තුලාධාර ජාජලි බමුණා ගේ ජටා මඬුල්ලෙහි කුබු සෑදූ පක්ෂීන් කැඳවයි; සත්‍ය ධර්මය නම් සියලු සතුන් කෙරෙහි මෛත්‍රිය දැක්වීම බවට කුරුලු ජෝඩුව ද දෙස් දෙති.

බ්‍රාහ්මණ සදාචාරය හා ඉන්දීය තාපස සාදාචාරය ද අතර දිස් වන අති විශාල පරතරය **පියා සහ පුතා** ද අතර **සංවාදයෙහි**[12] දැක්වෙන තරම් හොඳින් වෙන කිසි ම තැනෙක පිළිබිඹු වී නොමැත; මෙහි පියා බ්‍රාහ්මණ දෘෂ්ටිකෝණය ද, පුත්‍රයා පූජක ආගම අත් හළ තාපසයා ගේ දෘෂ්ටිකෝණය ද ගෙන හැර දක්වති. පුත්‍රයා විසින් නිරූපණය කරනු ලබන ජීවන දාර්ශනික බෞද්ධ හා ජෛන සංකල්පය[30] වුව ද මේවාට ම සීමා නො වේ. මේ සංවාදය හෝ තනි ශ්ලෝක හෝ "බෞද්ධ" හෝ "බෞද්ධයන් ගෙන් ණයට ගත්" හෝ ඒවා ලෙස නිගමනය කිරීමට මෙය අවස්ථාපිත නො වේ. මේ සංවාදයෙන් කොටසක් හා එහි පරිවර්තනය ද පහත දැක්වේ:

වේද හැදෑරීමට ඉතා ප්‍රිය කළ බමුණකුට මේධාවින් නම් පුතෙක් වෙයි. මෝක්ෂය, සදාචාරය හා එදිනෙදා ජීවිතයද පිළිබඳ දැනුමින් පරතෙරට පැමිණි, ලෝකයෙහි සත්‍ය ස්වරූපය පැහැදිලි ව දුටු පුත්‍රයා වේදය හැදෑරීමට ප්‍රිය කළ පියාට මෙ සේ පැවැසී ය:

පුතා :

ධීර : කිංස්විත්තාත කුර්යාත් ප්‍රජානන්
ක්ෂිප්‍රං හ්‍යායුර් හ්‍රශ්‍යතේ මානවානාම්
පිතස්තදා චක්ෂ්ව යථාර්ථ යෝගං
මමානුපූර්ව්‍යා යේන ධර්මං චරේයම්

පියා :

වේදනධීත්‍ය බ්‍රහ්මවර්චේණ පුත්‍ර
පුත්‍රානිච්ඡේත් පාවනාර්ථං පිතෘණාම්
අග්නීනාධාය විධිවච්චේෂ්ට යඥෝ
වනං ප්‍රවිශ්‍යාථ මුනිර්[37] බුභූෂේත්

පුතා :

ඒවමහ්‍යාහතේ ලෝකේ සමන්තාත් පරිවාරිතේ
අමෝඝාසු පතන්තීෂු කිං ධීර ඉව භාෂසේ

ප්‍රියා :

කථමහ්‍යාහතෝ ලෝකඃ කේන වා පරිවාරිතඃ
අමෝඝාඃ කාඃ පතන්තීහ කිංනු හිඝයසීව මාං

පුනා :

මෘත්‍යුනා'හ්‍යාහතෝ ලෝකෝ ජරයා පරිවාරිතඃ
අහෝරාත්‍රාඃ පතන්ත්‍යෙතේ නනු කස්මාන් න බුධ්‍යසේ
අමෝඝා රාත්‍රයශ්චාපි නිත්‍යමායාන්ති යාන්ති ච
යදා'හමේතජ්ජානාමි න මෘත්‍යුෂ්තිෂ්ඨතීතිහ
සෝ'හං කථං ප්‍රතීක්ෂිෂ්‍යෙ ඝුනේනාපිහිතශ්චරන්

රාත්‍රියං රාත්‍රියං ව්‍යතීතායාමායුරල්පතරං යදා
තදෙව වන්ධ්‍යං දිවසමිති විද්‍යාද් විචක්ෂණඃ

ගාධෝදකේ මත්ස්‍ය ඉව සුඛං වින්දේත කස්තදා
අනවාප්තේෂු කාමේෂු මෘත්‍යුරභ්‍යේති මානවම්

පුෂ්පාණීව විචින්වන්තමන්‍යත්‍රගත මානසම්
වෘකීවෝරණමාසාද්‍ය මෘත්‍යුරාදාය ගච්ඡති

අද්‍යෙව කුරු යච්ඡ්‍රේයෝ මා ත්වාං කාලෝත්‍යගාදයං
අකෘතේෂ්වේව කාර්යේෂු මෘත්‍යුර් වෙ සංප්‍රකර්ෂති

ශ්වඃ කාර්යමද්‍ය කුර්වීත පූර්වාහ්ණේ චාපරාහ්ණිකම්
න හි ප්‍රතීක්ෂතෙ මෘත්‍යුඃ කෘතමස්‍ය න වා කෘතම්

කෝහි ජානාති කස්‍යාද්‍ය
මෘත්‍යුකාලෝ භවිෂ්‍යති
යුවෙව ධර්මශීලඃ ස්‍යා—

දනිත්‍යං ඛලු ජීවිතම්
කෘතේ ධර්මේ භවේත් කීර්ති—
රිහ ප්‍රේත්‍ය ච වෙ සුඛම්

මෝහෙන හි සමාවිෂ්ටඃ පුත්‍රදාරාර්ථමුද්‍යතඃ
කෘත්වා කාර්යමකාර්යං වා පුෂ්ටිමේෂාං ප්‍රයච්ඡති

ඉදං කෘතමිදං කාර්යමිදමන්‍යත් කෘතාකෘතම්
එවමීහාසුඛාසක්තං කෘතාන්තඃ කුරුතෙ වශෙ

කෘතානං ඵලමප්‍රාප්තං කර්මණාං කර්ම සංඥිතම්
ක්ෂෙත්‍රාපණගෘහාසක්තං මෘත්‍යුරාදාය ගච්ඡති

දුර්බලං බලවන්තං ච ශූරං භීරුං ජඩං කවිම්
අප්‍රාප්තං සර්වකාමාර්ථාන් මෘත්‍යුරාදාය ගච්ඡති

මෘත්‍යුර්ජරා ච ව්‍යාධිශ්ච දුඃඛං චානේකකාරණම්
අනුෂක්තං යදා දේහේ කිං ස්වස්ථ ඉව තිෂ්ඨසි
ජාතමේවාන්තකෝ'න්තාය ජරා චාන්වේති දේහිනං
අනුෂක්තා ද්වයේනෙතේ භාවාඃ ස්ථාවර ජංගමාඃ
මෘත්‍යෝර්වා මුඛමේතද්වෙ යා ග්‍රාමේ වසතෝ රතිඃ
දේවානාමේෂ වෙ ගෝෂ්ඨෝ යදරණ්‍යමිති ශ්‍රුතිඃ
නිබන්ධනී රජ්ජුරේෂා යා ග්‍රාමේ වසතෝ රතිඃ
ජිත්වෙනාං සුකෘතෝ යාංති නෙනාං ජීංදංති දුෂ්කෘතඃ

න හිංසයති යෝ ජන්තූන් මනෝවාක්කායහේතුභිඃ
ජීවිතාර්ථාපනයනෛඃ ප්‍රාණිභිර් න ස හිංස්‍යතේ

න මෘත්‍යුසේනාමායාන්තීං ජාතු කශ්චිත් ප්‍රබාධතේ
ඍතේ සත්‍යමසත්ත්‍යාජ්‍යං සත්‍යෙහ්‍යමෘතමාශ්‍රිතම්

තස්මාත් සත්‍යවිරතාචාරඃ සත්‍යයෝග පරායණඃ
සත්‍යාගමඃ සදා දාන්තඃ සත්‍යෙනෛවාන්තකං ජයේත්
අමෘතං චෛව මෘත්‍යුශ්ච ද්වයං දේහේ ප්‍රතිෂ්ඨිතම්
මෘත්‍යුරාපද්‍යතේ මෝහාත් සත්‍යෙනාපද්‍යතේ ' මෘතම්

සෝ' හං හ්‍යහිංස්‍රඃ සත්‍යාර්ථී කාමක්‍රෝධ බහිෂ්කෘතඃ
සමදුඃඛසුඛඃ ක්ෂේමී මෘත්‍යුං හාස්‍යාම්‍යමත්‍යවර්ත්

ශාන්තියඥරතෝ දාන්තෝ බ්‍රහ්ම යඥේස්ථිතෝ මුනිඃ
වාඞ්මනඃ කර්මයඥශ්ච භවිෂ්‍යාම්‍යුදගායනේ

පශු යඥෛඃ කථං හිංස්‍රෛර්මාදෘශෝ යජ්ටුමර්හති
අන්තවද්භිරිව ප්‍රාඥඃ ක්ෂේත්‍රයඥෛඃ පිශාචවත්

යස්‍ය වාඞ්මනසි සම්‍යතාං
සම්‍යක් ප්‍රණිහිතේ සදා
තපස් ත්‍යාගශ්ච සත්‍යං ච
සවෛ සර්වමවාප්නුයාත්

නාස්ති විද්‍යා සමං චක්ෂුර් නාස්ති සත්‍ය සමං තපඃ
නාස්ති රාගූ සමං දුඃඛං නාස්ති ත්‍යාග සමං සුඛං

ආත්මන්‍යෙවාත්මනා ජාත
ආත්මනිෂ්යෝ' ප්‍රජෝ' පි වා
ආත්මන්‍යෙව භවිෂ්‍යාමී
න මාං තාරයති ප්‍රජා

නෛතාදෘශං බ්‍රාහ්මණස්‍යාස්ති විත්තං
යථෛකතා සමතා සත්‍යතා ච
ශීලං ස්ථිතිර් දණ්ඩනිධානමාර්ජවං
තතස්තතශ්චෝපරමඃ ක්‍රියාභ්‍යඃ

කිංතෙ ධනෛර් බාන්ධවෛර් වා'පි කිං තෙ
කිං තෙ දාරෛර් බ්‍රාහ්මණ යෝ මරිෂ්‍යසි
ආත්මානමන්විච්ඡ ගුහාං ප්‍රවිෂ්ටං
පිතාමහස්තෙ ක්ව ගතාඃ පිතා ච

(XII-175)

පුතා

මිනිසුන් දිවි වහා කෙළවර වෙයි ඒ නිසා
වැය කළ යුතු ද නැණැතියෝ සිය කල් කෙලෙසා
ම පියේ තුරුණු වියැ සිට තෙක් මහලු දසා
කිම මඟ ගමන් කළ යුතු කම් විලසා

පියා

ඉගෙනීමට සතර—පටන් ගැනුමෙන් තොප මඟ
අරඹව සිවි වේද නැණ—කරව තා සිත එක්රැස්
අවදිය ඒ සෙඳින්—නිමවා සොයා බිරියක
සරණ ගෙන, ඇය සමඟින්—විඳුව පල ගිහි දිවියෙහි
ගිය කල මෙ ලොව හැර—පර ලොව සුව පිණිස තොප
කළ යුතු සෑම සිරිත් විදි—ඉටු කැර පියා ඉක්බිති

දල්වා හුනැස්ගිනි—කැර නිසි පුදක් සුරනට
සලස්වන පර ලොව සෙත—පුත් පරපුරක් ලැබ ගනු
ළංවත මහලු විය—නික්මී ලොව හැර පියා
චැද අරනට එහි ම තොප—කරගනු මැනැවි වාසය
නිවි තවුසකු ව එහි—කෙලෙසුන් සමඟ සුදු වැද
පහ කර තොප ලොවී මල—යන්නේ පරම නිවනට

පුතා

උපදෙස් දෙන මෙ වන්—දිවියකට ම පියේ ඔබ
පවසන අවවාද ඔය—කිව හැකි ද නැණවත් යසි
ඇලෙයි දෝ කවරෙක්—නුවණ ඇති හෝ පැන සර
විදිමත් ඉගෙනුමට හෝ—නිසරු සිරිත් වලට ලොව
මිනිසකු ගෙ වයසින්—අඩකටත් වැඩි කොටසක්
ගෙවිය යුතු වෙද මෙ ම වන්—ඇදහිලි කටයුතුවලට
කුපිත ය පීඩිත ය ලොව—සැම දා කරදරවලින්
නිහඬ සොරහු කිසි කලෙක—නො ම සිටිති එහි නිසල ව

පියා

කෙරෙනු ද කුපිත ලොව කොයි ලෙසින
කවුරු ද නිහඬ සොරු නිසල ව නො ම සිටින
බියකර අඳුරු බස තොප, අදහස දරන
පවසන කිමැයි නිසැක ව පැහැදිලි බසින

පුතා

මරණින් ජරාවෙන්—කුපිත ය පීඩිත ය ලොව
ජරාවට යයි දින දින—මිනිසුන් සැම ගෙ ම සිරුරු
දිවා රෑ දෙකෙහි ම—නොසිඳෙන සැරුම් වටයෙක
සරනා ඒ නිහඬ සොරු—කිම, නොපෙනෙනු ද ඔබ හට?
අප හැම ගෙ ම දිවි ද—ගෙන යන සොරා අවසනැ
සුහු සුහු ව පසු කර අප—යන අතර සොර ගමනින්
කරදරයෙන් පිරුණු—නිරතුරු ව මේ ලෝකය
පෙළෙනා බව මරණයෙන්—දැන සිටිනුයෙන් මැනැවින්
කෙ ලෙස ද තවත් මට—සිතිය නොහැකි එකකු සේ
ඇදහිය හැකියෙ මෙ ලොවේ—අනාගත යහපත ගැන.
ගෙවෙනා සැම රෑයක්—පාසා ලෝකයෙහි මෙ ම
මකට් වී යයි තව තවත්—මිනිස් දිවිය ද එ හෙයින්
නො දත යුතු ද නුවණැතියො—ඔවුන් ජීවිතයෙන් තව
ඉතිරි ව තිබෙන කාලය—කොතරම් හිස් දැයි කියා
පවු සීමාවලින් අපි—සිර වී සිටින දිවියෙහි
මසුන් මෙන් නොගැඹුරු දියැ—තැවී වියැළී නස්නෙමු.
මල් නෙළනවුන් මෙන්—අන් අතෙහි යොමු කර සිතු
සිටිය දී ලොව ජනයන්
වුරුකෙන් ඩැහැගත්—බැටළු පොව්වන් විලසින්
වැටෙති එහු මරු හට—හදිසියෙ ම ගොදුරක් වී
ලබනට පෙර ම ඉටු පල—දුරු සියල් උසාගෙහි
දිවරු දෙක ම වෙහෙසී.

මොහොතක් නමුත් නො හරුව වැඩකට නො
නොපමා කරව හොඳ සිතු හොඳ දේ මැ
අද වඩ කල් නො ද හෙට කරම්යි කිසි
නිමවනු අද ම නොතිර ය හෙට වෙති ද

කළ යුතු සවස් කල—වැඩ මැදහනෙම් නිමවනු

නැත කිසි දු වැඩකට—කාලය පමා වීමට
අද රෑ මරුමුවෙහි—හසු වනුයෙ කවරෙක් දැයි
හෙට පායනා හිරු—දකින්දැයි කොයි කවරහු
දන්නෝ කවරහු ද ?
ඔබ වැඩ නිමා කර—ඇද්ද නැද්දැයි ඇසුමට
නො නවතී මරු කිසි කල
සිටිමින් ම තුරුණු වියැ—වැළැකී අනුවණකමින්
වඩමින් ගුණ දහම්—සොයව සෙත සහ සාමය
එ නයින් මෙ ලොව යසස ද—අනා සැපත සතුට හා
ගෙන දේ තොපට නිසැකින—දසිවයේ අග පල ලෙස.

" එය කරලා නිමයි—නැහැ තව ම නිම කළෙ මෙය
පටන් ගත්තා විතරයි—අර වැඩය නම් තවමත් "—
ගෙවන කල් මෙ නයින්—සිතමින් සිහින ලොවෙක ම
පැටලී නන් අයුරු—යෝජනාවල මිනිසුන්
ඇවිදින් මරු ඔවුන්—බිඳ ලයි පුහු සිහින හැම
ගඟ දෙ තෙරෙහි පිහිටි—බලවත් නෙක තුමුල තුරු
නො තකා උස් මහත් බව—බිඳ හෙළා දිය පහරින්
ගසාගෙන යන පහළට—නදී දිය දහරා මෙන්
උදුරා ලයි ලොවින් මරු—මවනවුන් එ සිහින හිස්

ගෙවන කල් ඇතැමකු—වෑපාරවල ම නියුතු ව
පවුලේ කටයුතුවලැ මැ—බැඳී නිතර ම නවත් ඇතැමුන්
සොයමින් හෝ ඇවැසි දේ—පුසිනුව තම'ඹුදරුවන්
දිවියෙහි ඇති වෙනත්—කම්කටොලු සමගින් හෝ
කරන'තර මහ සටනක්—නො දැකිය හැකි අවසනක්
වඩමින් දැඩි උසා—තැළෙනා දනන් මෙ නයින්
දැරූ සෑම වෙහෙසෙහි—සිතූ සිතුවිල්ලෙහි හෝ
කළ නෙක සටන්වල—පල දක්නට ද පළමු ව
උදුරා ලයි ඔවුන් මරු

මේ කුලවතෙකි මේ—කුලහීනයෙකි බිළිදෙකි.
දුබල ය බලවතෙකි මේ—මහා ඉසියෙකි නෙද දැරූ
නො තකා මෙ කිසිවක්—ගෙන යයි සෑම ලෙවන් මරු

ඉපදුණු සැණෙ ලෙවන්—ජරාව හා සමඟ මරු
අරක් ගනී ඔවුන් මඟ— සරමින් එහි නිරතුරින්
නැති අවසනක් දුක්—කරදරවලින් ඔබ දිවි
මැඩෙමින් ඔබේ සවි බල—පිරිහෙමින් දුක් වෙයිනෙන්
වැටෙන කල වනසට—දිනෙන් දින ඔබ ගේ කය
සිටීමට නිහඬ ව—නො සිතා නො තකා එ ගැන
හැකි වෙද ඔබට කොයි ලෙස ?

මිනිසුන් නිතර ගැවසෙන තැන් ලනු අතැර
එහි වෙසි ලැගුම් මරු හට පියතම අසුර
කරගනු ඔබ නිවෙස් හුදෙකල් අරණ තුර
තුටු වනු එහි යැ සරන්ට දෙවියොත් නිතර

බැදෙමින් දැඩි ව තව තව බැම්මෙහි පරණ
වසන සෙ නැසියන් මැද ලොල් වඩති දත
බැම් ඒ පහසුයෙන් මුත් ඉසිවර සිඳින
දද දනො නොබිය හො ම වෙති ඒ සිඳින මෙන

බිලි පුද දී සුරන්-තුටු කරනු යයි ඔබ මට
දුන දැ උපදෙස්, එ සිරිත්—නිසරුයි මම ඉවත ලමි
මෙ වන් සිරිතින් කිසි කල—පිරිපුන් නිදොස් බව ලබනු—
නොහැකි වෙයි කිසිවකු හට.
රුහිරින් හා මසින්—මරාගත් සිවිපාවුන්
කෙරෙන කුරිරු බිලි පුදෙන්—කුමට ද තුස් වනු සුරන්
සබවස සමඟ සෙත—සාමය කරුණාව හා
පිරිසුදු දැමුණු දිවිය ද—බඹ කෙරෙ බැඳි ගැබුරු සිත වන්
අනෙක් පුද මම කරමි නිරතුරු.
කරනුවහු මේ පුද—මරුට වුව බිය නො ම වෙති
ලැබුමට අම සුව උනට—පැතිය හැකි වෙයි එකතින්

නැවත ද ඔබ කියති—මට මා විවා පත් වී
දරුවනුදු ලැබිය යුතු යයි—
මට උවටැනට හා—ගිය කලට මා පර ලොව
දෙමින් දන් මා වෙනුවෙන්—නිර කරනු වස් එ ලොව සුව මට
එහෙත් පර ලොව සුව—කිසි බැතිමත් පුතකු ගෙන්
රැකීමට මම නො පතමි.
සිරිතින් තමා සිදු කළ—මිය ගිය පියා ගේ තම
එ ලොව සැපත රැකිණි යයි—මා පුතකු පුරසාරම්
නොදොඩනු නියති කිසි කල.

සියලු කටයුතුවල දී හුදෙකලාව, උපේක්ෂාව, සත්‍යතාව, ධර්මිෂ්ඨ බව, ස්ථිරතාව, මෘදුතාව, සෘජුතාව හා නෛෂ්ක්‍රම්‍යය ආදී ගුණයනට වඩා අගනා ධනයක් බ්‍රාහ්මණයකුට නැත. එම්බල බ්‍රාහ්මණය, මිය යා යුතු තා හට ධනයෙන් හෝ නැසියන් ගෙන් හෝ බිරියක ගෙන් හෝ කවර ඵලයෙක් ද? තා වෙත සැඟවුණු ආත්මය සොයා ගනුව. නොප මිමුතු පරපුර කොහි ගියාහු ද? තා පියාණේ කොයි ගියාහු ද?"

මෙ සේ, පෙනෙ අන්දමට මුළුමනින් ම වාගේ බෞද්ධ සංකල්පයක් විදහා දක්වන මේ සංවාදය උපනිෂදයන්හි අප දැන හැඳින ගත් වේදාන්ත ආත්ම-වාදය කරා ගමන් කරයි. මෙය කිසි සේත් විස්මයට කරුණු නො වේ. ඉන්දියාවේ පුරාණ තාපස නිකාය අතර එකිනෙකින් කැපී පෙනෙන තදබල වෙනසක් නො වී ය; නිදසුන් වශයෙන් අද මහා බ්‍රිතාන්‍යයෙහි නානා ප්‍රොතෙස්තන්ත නිකායයන් ඇති පරිද්දෙනි. එ බැවින් මහාභාරත යෙහි අන්තර්ගත වූ උපදේශාත්මක කථා, සංවාද හා සෘෂි පද්‍ය සාහිත්‍යයට අයත් ආප්තෝපදේශයන් ද යන මෙ තෙක් දැයෙහි, බෞද්ධ සහ ජෛන පිටකයන්හි සංකල්පයන්ට මෙන් ම උපනිෂදයන්හි සංකල්පයන්ට ද අනුකූල වූ අදහස් රාශියක් දක්නට ලැබීම පුදුමයක් නො වේ.

මහාභාරතයෙහි උපදේශාත්මක කොටස්[1]

පසු ගිය පරිච්ඡේදයෙහි සාකච්ඡාවට භාජන වූ ඉතිහාස සහ ඉතිහාස-සංවාද බොහොමයක් ම මහාභාරතයෙහි සංඛ්‍යාවෙන් අල්ප නොවූ ද ප්‍රමාණයෙන් විශාල වූ ද උපදේශාත්මක කොටස්වල අන්තර්ගත වේ. ඇතැම් විට කෙටි වූ ද, ඇතැම් විට දීර්ඝ වූ ද මේ බඳු කොටස් මහාභාරතයේ පර්ව සියල්ලෙක ම වාගේ විසිරී ඇත. භාරතීයයන් විසින් "**නීති**" යන පදය යටතේ වර්ග කරනු ලබන විෂයයන් තුන ම, එ නම්, විශේෂයෙන් රජවරුන් සඳහා වූ බැවහර නුවණ, එ හෙයින් "දේශපාලනය", **ධර්මය**, හෙවත් නීති රීති මෙන් ම සාමාන්‍ය සදාචාරය හා **මෝක්ෂය** හෙවත් සියලු දර්ශනයන්හි පරමාර්ථය වූ "විමුක්තිය" ද යන මේ තුන එහි අන්තර්ගත වේ. එ සේ වුව ද, රසවත් කථාන්තර හා රමණීය කියුම්වල ස්වරූපයෙන් මේවා සැම විට ම ඉදිරිපත් නො වේ; අතිශය නීරස සාකච්ඡා අඩංගු කොටස් හා විශේෂයෙන් XII වන පර්වයෙහි දර්ශන ගැන ද, XIII වන පර්වයෙහි නීතිය ගැන ද කෙරෙන සාකච්ඡා අපට දක්නට ලැබේ.

විෂය ප්‍රමාණය පිළිබඳ ව අප විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු සංක්ෂිප්ත විස්තරයෙන් XII වන හා XIII වන පර්ව ප්‍රධාන වීර කාව්‍යය හා කොහෙත් ම සම්බන්ධ නොවන නමුත් XIV වන පර්වයෙහි ගෙන හැර දක්වෙන සිද්ධි XI වන පර්වයෙහි අවසානය හා කෙළින් ම සම්බන්ධ වන බව පෙනෙනු ඇත. අප විසින් ඉහත සලකා බලන ලද පුදුමාකාර පුරුෂත්වය හේතු කොට ගෙන මේ පෘථුල පර්ව දෙක ඒ අතරට පිවිසවීමට මඟ පෑදෙයි. මිනිය නොහැකි තරම් ඊ තල ගණනකින් පහරනු ලැබූ භීෂ්ම රණ බිම වැතිර සිටින නමුත් සිය මරණ මොහොත තීරණය කිරීමේ බලයක් ඔහුට ලැබී ඇති බැවින් තව සමසකින් මියයාමට තීරණය කරයි.[2] නීති වේදියකු ද, දේව ධර්මධරයකු හා යෝගියකු ද වන, මාරක තුවාල ලත් මේ වීරයා දර්ශනය, සදාචාරය හා නීතිය ද පිළිබඳ ව යුධිෂ්ඨිර හට අනුශාසනා කිරීමට මේ කාල සීමාව උපයෝගි කොට ගනියි. වික්‍රමාන්විත සෙන්පතියන් හා ළඟ නැසියන් රාශියක් සමූලඝාතනයට භාජන ව ඇති බැවින් ඔවුන් ගේ විනාශය ගැන ශෝක වන යුධිෂ්ඨර ගේ වදන්වලින් XII වන පරිච්ඡේදය ඇරඹෙයි. තමාට ම දොස් පවරා ගන්නා හෙතෙම සියලු බලා පොරොත්තුවලින් තොර ව ගිහි ජීවිතය අත්හැර සන්‍යාසියකු ලෙස ජීවිතය අවසන් කිරීමට තීරණය කරයි. ඔහු ගේ මේ තීරණය වෙනස් කරවීමට ඔහු ගේ සොහොයුරු පිරිස උත්සාහ කරති; වඩා උසස් චරියාව වනුයේ, ගිහි ගෙය අත හැර විවේකී ව සන්‍යාසි ජීවිතයක් ගත කිරීම ද, නැත හොත් ගිහියකු ගේ හා රජකු ගේ යුතුකම් ඉටු කිරීම ද යන්න අරබයා විස්තර සහිත දීර්ඝ සාකච්ඡාවලට මෙයින් මඟ පෑදෙයි. ව්‍යාස පඬිවරයා ද මේ අතර සිටියි; රජකු පළමු ව සිය යුතුකම් සියල්ල ඉටු කොට, ජීවිතයේ අපර භාගයෙහි පමණක් සන්‍යාසි ජීවිතයක් ගත කළ යුතු යැයි හෙතෙම පවසයි. කෙසේ වුව ද, රජකු ගේ යුතුකම් සියල්ල පිළිබඳ ව සර්වසම්පූර්ණ

අනුශාසනයක් භීෂ්ම ගෙන් යුධිෂ්ඨර හට ලැබෙනු ඇතැයි ද හේ පවසයි. එ කල්හි යුධිෂ්ඨිර රාජාභිෂේකය ලබා ගත් පසු ව, මේ තෙක් රණබිම් වැතිර සිටින භීෂ්ම වෙත සපිරිවරින් පැමිණ, පළමු ව රාජ ධර්ම ගැන ද, ඉක්බිති වෙනත් කරුණු ගැන ද අසා දැන ගනී. නීතිය, සදාචාරය හා දර්ශනය ද අරභයා භීෂ්ම ගේ දෙසුමට XII වන හා XIII වන වන පර්ව වැය වෙයි.

XII වන පර්වයෙහි (ශාන්ති පර්වය) ප්‍රථම භාගය "රජ කෙනකු ගේ සුතුකම් පිළිබඳ අනුශාසනය[3]" හා "ආපදා අනතුරුවල දී පිළිපැදිය යුතු නීතිය පිළිබඳ අනුශාසනය" යන කොටස් දෙකින් සමන්විත වෙයි. මූලික වශයෙන් රාජ ධර්ම හා රාජ ගෞරවය ද, ඇතැම් විට නීතිය පිළිබඳ අනුශාසනා ද, සාමාන්‍යයෙන් සතර වර්ණ ධර්ම හා සතර ආශ්‍රම ධර්ම ද, ගුරු—දෙගුරුන් කෙරෙහි පැවැතිය යුතු ආකාරය ද, ආපදා හා අනතුරුවල දී පැවැතිය යුතු ආකාරය ද, ආත්ම සංයමය ද, තපස හා සත්‍යකාමිත්වය ද, ජීවිතයේ පරමාර්ථ තුන[4] අතර සම්බන්ධය ද යනාදි කරුණු ගැන මෙහි විස්තර වෙයි. මේ පර්වයෙහි මෝක්ෂධර්මානුශාසනය[5] නම් දෙ වන කොටස ප්‍රධාන වශයෙන් දර්ශනාත්මක ය. එහෙත්, විශ්ව සම්භව ශාස්ත්‍රය හෝ මනෝ විද්‍යාව හෝ ආචාර ධර්ම හෝ මෝක්ෂ ධර්ම හෝ පිළිබඳ ව දීර්ඝ, නීරස, බොහෝ විට ආකූල සාකච්ඡා හැරුණු විට, ඉතා රමණීය පුරාවෘත්ත, දෘෂ්ටාන්ත, සංවාද සහ සදාචාරය පිළිබඳ ආප්ත පද ද එහි දක්නට ලැබේ. මින් ඇතැම් කථාවස්තු පසු ගිය පරිච්ඡේදයෙහි සාකච්ඡාවට භාජන විය. මේ XII වන පර්වය සමස්තයක් වශයෙන් ගත් කල රසිකයත්වයෙකින් තොර වූ අවුලක් ගෙන හැර දක්වන නමුදු මහඟු කාව්‍ය රත්න හා පඬිවදන් රාශියක් එහි අඩංගු වෙයි. ඉන්දීය දර්ශනය සඳහා මූලාශ්‍රයයක් වශයෙන් ද මෙහි අගය සුළුපටු නො වේ.

XII වන පර්වය එක් අරුතෙකින් "දර්ශන සංග්‍රහයෙකැයි" නම් කළ හැකි අතර XIII වන පර්වය (**අනුශාසනා—පර්වය**) අත්‍යවශ්‍ය අංග අනුව සලකන කල හුදෙක් ම නීති සංග්‍රහයෙකි. සැබවින් ම, ප්‍රසිද්ධ නීති—ග්‍රන්ථවලින්, නිදසුන් වශයෙන් මනු නීතිශාස්ත්‍රයෙන්, උපුටාගත් කොටස් හෝ ඊට සෑම අතින් ම සමාන කොටස් පමණක් අඩංගු පිටු විශාල ගණන් මෙහි ඇත. ඉන්දීය නීති සාහිත්‍යය ද ප්‍රධාන වශයෙන් පද්‍ය ග්‍රන්ථයන් ගෙන් සමන්විත වන බවත්, ඒවා උපදේශාත්මක සාහිත්‍යය ලෙස වර්ග කළ හැකි බවත් මතු පරිච්ඡේදයෙක දැක්වෙනු ඇත. මහාභාරතයෙහි XIII වන පර්වය හා නීති ග්‍රන්ථ (ධර්මශාස්ත්‍ර) අතර එක ම වෙනස නම් මහාභාරතයෙහි නීරස රචනයෙහි අතරින් පතර ඇත්ත වශයෙන්ම බොහෝ දුරට හිස් වූ, කිසි වැදගැම්මකට නැති පුරාවෘත්ත ගෙන හැර දැක්වීමයි[6] XII පර්වය මුල් වීර කාව්‍යයට ඇතුළත් නොවූ නමුත් සාපේක්ෂ වශයෙන් මුල් වකවනුවෙක ඇතුළත් කරන ලදැයි සිතිය හැකි ය. එහෙත් XIII වන පර්වය ගැන නම් එ වැනි කිසි ම සැකයක් පැන නො නඟී. මෙය මහාභාරතයෙහි කොටසක් බවට පත් වූයේ ඊටත් පසු වකවනුවෙක ය. පසු කාලයෙක ගළපා ලද ග්‍රන්ථයෙක සියලු ලක්ෂණ එහි විද්‍යමාන ය. එක කරුණක්

පමණක් සඳහන් කරනොත්, සමාජයේ සෑම පන්තියක් ම අභිභවනය කරමින් බ්‍රාහ්මණයින් ලබා ගන්නා ආධිපත්‍යය යුක්තියුක්ත බව දක්වනු සඳහා XIII වන පර්වයෙහි දැක්වෙන තරම් මානාධික, අතිශයෝක්තියට නැඹුණු ස්වරයක් මහාභාරතයෙහි අන් කිසි තැනෙක උපයෝගි කොට නො ගැනේ. පර්වයෙන් විශාල කොටසක් දානධර්මය සඳහා මිඩංගු වේ; ඒ තෙකුදු වුවත් දානය නම් හුදෙක් බ්‍රාහ්මණයනට දෙනු ලබන දක්ෂිණාව බව සෑම විට ම අවබෝධ කටයුතු ය.

මේ පර්ව දෙක ද, සර්ගයකට දෙකකට නොවැඩි වූ වෙනත් කෙටි ඡේද ද හැරුණු විට III, V, VI, XI සහ XIV යන පර්වයන්හි ද උපදේශාත්මක කොටස් විශාල ගණනක් අපට හමු වේ. 111 වන පර්වයෙහි (28-33) ආචාර ධර්ම පිළිබඳ ව ද්‍රෞපදී, යුධිෂ්ඨිර හා භීම ද අතර දීර්ඝ සංවාදයක් අපට දක්නට ලැබේ; මෙහි දී ද්‍රෞපදී, බලි සහ ප්‍රහ්ලාද අතර සංවාදයක් ද, "**බෘහස්පති නීති**' යක්" ද ගෙනහැර දක්වන්නී ය. මේ පර්වයෙහි ම (205-216), ස්ත්‍රී ධර්ම ගැන (205 සහ ඊළඟ) ද, **අහිංසාව** ගැන (206-208) ද, දෛවය, සන්‍යාසිභාවය සහ මෝක්ෂය යනාදියෙහි බලය ගැන ද සාඞ්ඛ්‍ය දර්ශනයෙහි (216) සහ **වේදාන්තයෙහි** (211) සිද්ධාන්ත ගැන ද, දෙගුරුන් (214 සහ ඊළඟ) සහ වෙනත් අය කෙරෙහි යුතුකම් ගැන ද යන මේ සියල්ල පිළිබඳ ව **මාර්කණ්ඩේය** ඍෂි ගේ අනුශාසනා අපට දක්නට ලැබේ. V වන පර්වයෙහි සදාචාරය හා බැවහර නුවණ (33-40) ගැන ද, සදාකාලික යෞවනයෙන් හෙබි **සනත්සුජාතයන්** ගේ දර්ශන (41-46) ගැන ද **විදුර** පඬි ගේ දීර්ඝ අනුශාසන ඇත. VI වන පර්වයෙහි (25-42) සුප්‍රසිද්ධ **භගවද්ගීතාව** අපට හමු වෙයි; XIV වන පර්වයෙහි (16-51) දැක්වෙන **අනුගීතාව** මෙහි ම වැඩි දුර රචනයක් හෙවත් ඊට අතිරේකයක් වෙයි.[8] XI වන පර්වයෙහි (2-7) විදුර පඬි ගේ අස්වැසිලි උපදවන වදන් ද නැවත වරක් ආචාර ධර්ම ක්ෂේත්‍රයෙහි ලා ගිණිය හැකි ය.

මහා භාරතයෙහි මේ උපදේශාත්මක කොටස් සියල්ල අතුරින් භගවත්ගීතාව[9] තරම් ජනප්‍රියත්වයක් හා ප්‍රසිද්ධියක් ද දිනා ගත් කෘතියක් තවත් නැත. ඉන්දියාවෙහි නම් භගවද්ගීතාව තරම් කියවනු ලබන, ඒ තරම් විශේෂ ගෞරවයෙකින් සැලකෙන තවත් ග්‍රන්ථයක් නැති තරම් ය. එය **වෛෂ්ණව** නිකායයක් වන **භාගවතයන්** ගේ ශුද්ධ ග්‍රන්ථය වන නමුත් කවර නෛකායිකයකු වුව ද සෑම හින්දු භක්තිකයකු ම මහත් සැදැහැයෙන් සලකන, නැණගුණ වගාවට හේතු වන ග්‍රන්ථයෙකි. ක්‍රි. ව. 883 දී කලුරිය කළ **අවන්තිවර්මන්** නම් **කාශ්මීර** රජකු ගැන කථාවක් **කල්හණ**[10] නම් ඉතිහාසඥයා ගෙන හැර දක්වයි. මේ රජු ගේ මරණ මොහොතෙහි භගවද්ගීතාව මුල පටන් අග දක්වා කියවනු අසා සිට විෂ්ණු දෙවියන් ගේ දෙව් ලොව ගැන මෙනෙහි කරමින් හේ මිය පරලොව

යයි. මරණ මොහොතෙහි මේ ග්‍රන්ථය නිසා අස්වැසුම් ලත් එක ම හින්දු භක්තිකයා ඔහු මතු නො වේ. සමස්ත කාව්‍යය ම කටපාඩමින් දත් උගත් හින්දු භක්තිකයන් ගණන අද පවා සුළු පටු නො වේ. විනාශශේෂ ව පවතින අත් පිටපත් ගණන ද අප්‍රමාණ ය. 1809 දී **කල්කටාවෙහි** මෙය ප්‍රථම වරට මුද්‍රණය කළ පසු ව එහි නව මුද්‍රණයක් ඉන්දියාවෙහි නිකුත් නොවන වර්ෂයක් නැති තරම් ය. නූතන ඉන්දීය භාෂාවනට කරන ලද පරිවර්තන ද අප්‍රමාණ ය.

ඉන්දියාවෙන් බැහැර ද භගවත්ගීතාව අගය කරන්නවුන් ගේ ගණන සුළුපටු නො වේ. මේ කාව්‍යය මැනැවින් දැන සිටි **අල්බිරූනි** නම් **අරාබි** දේශ සංචාරකයා එය ඉතා උසස් කොට සැලකී ය. **චාල්ස් විල්කින්සන්** යන අය ගේ ඉංග්‍රිසි පරිවර්තනය (ලන්ඩන්, 1785) මඟින් මේ කාව්‍යය ප්‍රථම වරට **යුරෝපයට** හඳුන්වා දෙනු ලැබී ය. 1823 දී **ලතින්** පරිවර්තනයක් ද සමඟ **ඕගස්ට් විල්හෙල්ම් ශ්ලීගල්** ප්‍රකාශයට පත් කළ විචාරාත්මක පාඨ-සංස්කරණය ඉතා වැදගත් විය. **විල්හෙල්ම් වොන් හම්බෝල්ට්** මේ කාව්‍යය දැන හැඳින ගත්තේ ඒ කෘතිය මඟිනි; ඒ සම්බන්ධයෙන් ඔහු දැක්වූ විශේෂ උනන්දුව ඉහත සඳහන් විය.[12] හෙතෙම භගවද්ගීතාව, **ලුක්‍රිෂියස්** (Lucretius) නම් කාව්‍යයට වඩා බෙහෙවින් උසස් ලෙස ද, **පාර්මනිඩීස්** (Parmenides) හා **එම්පෙඩොක්ලීස්** (Empedokles) යන කාව්‍යයනටත් වඩා උසස් ලෙස ද සැලකී ය. "මහාභාරතයෙහි මේ උපාඛ්‍යානය වූ කලි අප දන්නා සාහිත්‍ය සියල්ලක් ම අතුරින් සොයා ගත හැකි අති රමණීය වූ ඇත්ත වශයෙන් එක ම දාර්ශනික කාව්‍ය ද විය හැකි අද්විතීය කාව්‍යය" බව හෙතෙම ප්‍රකාශ කළේ ය. **බර්ලින් විද්‍යාපීඨයට** ඉදිරිපත් කරන ලද (1825–26) Uber die unter dem Namen Bhagavadgita bekannte Episode des Mahabharata"[13] නම් දීර්ඝ ශාස්ත්‍රීය ලිපියකින් ද ශ්ලීගල් ගේ සංස්කරණය හා පරිවර්තනය ද මුල් කොට ගත් දීර්ඝ ලිපියකින් ද **විල්හෙල්ම් වොන් හම්බෝල්ට්** මේ කාව්‍යය සවිස්තර ව සලකා බැලී ය. මෙය කිහිප වරක් ම යුරෝපීය භාෂාවලට පරිවර්තනය කරන ලදී[15].

මේ කාව්‍යය දක්නට ලැබෙනුයේ එය කොහෙත් ම බලාපොරොත්තු විය නොහැකි ස්ථානයෙක ය; එ නම්, මහා යුද්ධය පිළිබඳ වර්ණනය ආරම්භ වන VI පර්වයේ මුල ය. යුද්ධය සඳහා සියල්ල සූදානම් ය. පොරයට සූදානම් වූ දෙපසෙහි හමුදා මුහුණට මුහුණ ලා සිටිති. එ කල්හි අර්ජුන දෙ පසෙහි හමුදා අතර මැද සිය රථය නවතා, සංග්‍රාමයට සූදානම් වූ කෞරව පාණ්ඩව සේනා නරඹයි. දෙ පසෙහි ම "පියවරුන් හා මුත්තණුවන් ද, ගුරුවරුන්, මයිලණුවන් සහ සොහොයුරන් ද, පුතුන් සහ මුනුබුරන් ද, මිතුරන් මාමාවරුන් සහ හිතවතුන් ද" දක්නා ඔහු ගේ සිත මහත් දයානුකම්පාවෙන් මඬිනු ලබයි; හිතමිතුරනට විරුද්ධ ව සටන් කිරීම

ගැන සිහි වන හෙතෙම සොවින් මුසපත් වෙයි; යමකු ගේ ඝාත සුව පිණිස කෙනෙක් සාමාන්‍යයෙන් සටනට එළඹෙත් ද ඔවුන් ම ඝාතනයට සූදානම් වීම පාපයක් හා පිස්සුවෙකැයි ඔහුට හැඟෙයි. ඔහු ගේ දුර්වල මෘදු සිත ගැන කෘෂ්ණ අර්ජුන හට දොස් පවරන කල්හි තමාට කළ යුතු කිසිවක් සිතා ගත නොහැකි බවත් ජයග්‍රහණය හෝ පරාජය හෝ වඩා සුදුසු දැයි තමාට නොතේරෙන බවත් කියා සිටින හෙතෙම මේ පරස්පර විරෝධී යුතුකම් අතර මංමුළා වූ තමා කවර මාර්ගයක් ගත යුතු දැයි පැහැදිලි කරන ලෙස කෘෂ්ණ දෙවියන් ගෙන් ඉල්ලා සිටී. මේ අවස්ථාවෙහි කෘෂ්ණ විස්තරාත්මක දර්ශනික දෙසුමකින්[01] ඔහුට පිළිතුරු දෙයි; ඒ අවස්ථාවෙහි මේ දෙසුමේ පරමාර්ථය නම් විපාක ගැන නොතකා වීරයකු වශයෙන් ඔහු ගේ යුතුකම් සටන් කිරීම බව අර්ජුන හට ඒත්තු ගැන්වීමයි. හේ මෙසේ පවසයි:

අශෝච්‍යානන්වශෝචස් ත්වං ප්‍රඥාවාදාංශ්ච භාෂසේ
ගතාසූනගතාසූංශ්ච නානුශෝචන්ති පණ්ඩිතාඃ
න ත්වේවාහං ජාතු නාසං න ත්වං නෙමේ ජනාධිප
නචෙව න භවිෂ්‍යාමඃ සර්වේ වයමතඃ පරම්
දේහිනෝ'ස්මින් යථා දේහේ කෞමාරං යෞවනං ජරා
තථාදේහාන්තරප්‍රාප්තිර් ධීරස්තත්‍ර න මුහ්‍යති.
අන්තවන්ත ඉමේ දේහා නිත්‍යස්යෝක්තාඃ ශරීරිණඃ
අනාශිනෝ' ප්‍රමේයස්‍ය තස්මාද් යුද්ධ්‍යස්ව භාරත.
ය ඒනං වේත්ති හන්තාරං යශ්චෙනං මන්‍යතේ හතම්
උභෞ තෞ න විජානීතෝ නායං හන්ති න හන්‍යතේ
න ජායතේ ම්‍රියතේ වා කදාචින්—
නායං භූත්වා භවිතා වා න භූයඃ
අජෝ නිත්‍යඃ ශාස්වතෝයං පුරාණෝ
න හන්‍යතෙ හන්‍යමානේ ශරීරේ.
වාසාංසි ජීර්ණානි යථා විහාය
නවානි ගෘහ්ණාති නරෝ'පරාණි
තථා ශරීරාණි විහාය ජීර්ණා—
න්‍යන්‍යානි සංයාති නවානි දේහී
" නෙනං ඡින්දන්ති ශස්ත්‍රාණි නෙනං දහති පාවකඃ
න චෙනං ක්ලේදයන්ත්‍යාපෝ න ශෝෂයති මාරුතඃ
අව්‍යක්තෝ'යමචින්ත්‍යෝ'යමවිකාර්‍යෝ' යමුච්‍යතේ
තස්මාදේවං විදිත්වෙනං නානු ශෝචිතුමර්හසි. (vi-26)

අනුකම්පා සහගත වදන් නෙපලන නමුත් තෝ ශෝක නොවිය යුතු අය සඳහා ශෝක වන්නෙහි ය. මළවුන් හෝ නොමළවුන් හෝ සඳහා ප්‍රාඥයෝ ශෝක නොවෙති.

" මම කවර කලෙක හෝ නොවූයෙමි නොවෙමි; තෑ ද ඒ සේ ම ය; මේ රාජ කුමාරවරු ද කවර කලෙක හෝ නොවූවෝ නොවූ හ. අප සියලු දෙන ජීවත් නොවන කාලයක් ද නොපැමිණෙනු ඇත.

සිරුර නිවාස කොට ගත් නවාතැන්කරු (ආත්මය) ළමා විය, තරුණ විය හා මහලු විය මේ සිරුරෙහි වෙසෙමින් පසු කරන්නා මෙන් එය අන් සිරුරු කරා ද ගමන් ගනී; ප්‍රාඥයා මින් මුළා නොවෙයි.

මේ අසුරින් විනාශයට පත් වනුයේ ඝනාත්ත, නොනැසෙන අඥෙය වූ **ශරීරින්** වාසය කරන මේ ශරීරයි. එ බැවින් **භාරත** පුත්‍රය, සටන් කරව.

මෙය ඝාතකයකු ලෙස ද, ඝාතනයට ගොදුරු වන්නක් ලෙස ද සලකන දෙ දෙන ම එක සේ මුළා වූවාහු ය; මේ ඝාතනය නො කරයි; ඝාතනයට ගොදුරු නො ද වෙයි.

මෙය කිසි කලෙකත් නූපදින්නේ ද නොමැරෙන්නේ ද වෙයි; එ සේ ම වරක් ඇති වූ කල නැති නොවන්නේ ද වෙයි; මේ නූපන්, නිත්‍ය, ශාශ්වත පුරාණයා ශරීරය විනාශ කරනු ලබන කල නො මැරේ. .....

ඉරී ගිය පරණ ඇඳුම් ඉවත දමා අලුත් ඇඳුම් ඇඳගන්නා මිනිසකු මෙන් **ශරීරින්** ද දිරාගිය ශරීර ඉවත ලා වෙනත් අලුත් ශරීර සොයා යයි. .....

ආයුධවලින් මෙය කැපිය නොහැකිය. ගින්නෙන් පිළිස්සිය නොහැකි ය. එ සේ ම සුළඟින් මෙය වියළිය නොහැකිය.....ය.

මිට අව්‍යක්ත යැයි ද අචින්ත්‍ය යැයි ද අවිකාර්ය යැයි ද කියනු ලැබේ. මේ අසුරින් එය දැනගෙන නොප ශෝක කරනු නො වටී. .....

එ හෙයින් කෘෂ්ණ මේ සේ පවසයි: දැන් සිදු වන්නට යන ඝාතනය සම්බන්ධයෙන් ශෝක වීමට හේතුවක් නැත; කුමක් නිසා ද යත් **මිනිසා** —එ නම් ආත්මය සදාකාලීන ය; විනාශ නො වෙයි; විනාශයට පත් වනුයේ ශරීර පමණකි.[17] තව දුරටත් කථා කරන හෙතෙම ක්ෂත්‍රිය හට නියමිත ධර්මය පිළිපදිමින් ධර්ම යුද්ධයට බසින ලෙස අර්ජුනට අනුශාසනා කරයි. දෙව් ලොව දෙරටුව විවෘත කැරෙන මෙ වන් යුද්ධය කට එළඹෙන විරයා භාග්‍යසම්පන්නයෙකි. යුද්ධ නොකරන්නේ නම් මරණයට වඩා දරුණු වූ ලජ්ජාවට හෙතෙම පත් වෙයි. යුද්ධයෙන් මිය ගිය හොත් හේ නිරනුමාන ව ම දෙව් ලොවට සැපත් වෙයි; ජයග්‍රාහක වුව හොත් ඔහු ලොව පාලනය කරනු ඇත. මේ හේතුවෙන් ඔහු නොපසුබට ව සටන් කළ යුතු ය. එතෙකුදු වුවත්, කෘෂ්ණ **ඍෂිවරයා** හා තව මදක් දුරක් යන විට කෘෂ්ණ **දෙවියන්** ද පසු ව ගෙන හැර දක්වන විස්තර කෘෂ්ණ නම් **වීර භටයා** ගේ මේ කථාව සමඟ කිසි සේත් නොගැළපෙන සේ, ඊට ඉඳුරා පටහැනි වෙයි; කාව්‍යය දිග හැරෙන විට අර්ජුන හට අනුශාසනා කරනුයේ කෘෂ්ණ ඍෂි නො ව **කෘෂ්ණ දෙවියෝ ය.** භගවද්ගීතාවෙහි දක්වෙන කර්ම මාර්ගය පිළිබඳ අන් විවරණ සියල්ල, මිනිසා ජය පරාජය ගැන නො තකා, පල විපාක ගැන නො සිතා සැබවින් ම යුතුකම ඉටුකළ යුතු ය යන ධර්මයෙන් කුටප්‍රාප්ත වෙයි. සියලු ක්‍රියාවන් ගෙන් වැළකීමෙන් ද, නිෂ්ක්‍රිය වීමෙන් ද, ලෞකික ජීවිතය සම්පූර්ණයෙන් හැරයාමෙන් ද සමන්විත වූ උත්තම සදාචාර පරමාදර්ශයට තරමක් දුරට හෝ අනුරූප වනුයේ මේ බදු **ආශා වෙන්** තොර ක්‍රියා පමණකි. මෙ සේ වුව ද, ඇත්ත වශයෙන්, ගිහි ජීවිතය අත් හැර, හුදෙකලා ව ධ්‍යානයෝගී ව වසමින්, විමුක්තිය ලැබීමේ මාගීයක් වශයෙන් කේවල ඥානය සඳහා කරන ව්‍යායාමය ශමනවාදී **තාපස ධර්මය** හා යටත් පිරිසෙයින් ඉන්ද්‍රිය දාර්ශනිකයින් විසින් මැනවින් නොපිළිගැනුණු **කර්ම මාර්ගය** ද අතර නොවිසඳුණු පරස්පර විරොධතාවක් කාව්‍යය මුළුල්ලෙහි ම දිවෙයි. විමුක්තිය සඳහා ඥාන මාර්ගය හා කර්ම මාර්ගය යන

මාර්ග දෙකක් පවත්නා බව කෘෂ්ණ උගන්වන බව සැබැවි. එහෙත් ආත්මය ශරීරය හා බැඳී පවතින තාක් මිනිසකුට ක්‍රියාවෙන් තොර ව වාසය කළ හැකැයි පැවැසීම මුළාවෙකි. වස්තු වූ කලි සෑම විට ම **ගුණයෙන්**[18] (සාර වක) සමඟ, සත්ත්ව (සැහැල්ලු බව, යහපත් බව), රජස් (ශක්තිය, රාගය), තමස් (අඳුර, බරබව, අවිද්‍යාව), සම්ඟ බැඳී පවතී; මේවා අවශ්‍ය යෙන් ම ක්‍රියාවනට මඟ පාදයි. එ බැවින් මිනිසාට කළ හැකි වනුයේ බලා පොරොත්තුවෙන් හෝ ආශාවෙන් හෝ තොර ව සිය යුතුකම් ඉටු කිරීමයි. කුමක් නිසා ද යත්, "දුමින් වැසුණු ගින්නක් සේ, දූවිල්ලෙන් වැසුණු කැටපතක් සේ, උල්බයෙන් ආරක්ෂා වූ දරු ගැබක් සේ, ඥානය වූ කලි ඥාතෘ හට පරම සතුරකු වූ ආශාවෙන් වට ලාගෙන ඇත.[19]' එ හෙයින් ආශාවෙන් තොර ව ක්‍රියා කරන තැනැත්තේ ඥාන මාර්ගයෙහි දක්නට ලැබෙන පරමාදර්ශයට ඉතාමත් ළං වෙයි. විමුක්තිය ලැබීමේ මාර්ගයක් වශයෙන් **ඥානයට** භගවද් ගීතාවෙහි ලැබෙන උසස් ස්ථානය මේ ශ්ලෝක වලින් පෙනේ. (4—36 සහ ඊ ළඟ.)

අපි චේදසි පාපෙභ්‍යඃ සර්වේභ්‍යඃ පාපකෘත්තමඃ
සර්වඥාන ප්ලවේනෛව වෘජිනං සන්තරිෂ්‍යසි

යථෛධාංසි සමිද්ධෝඅග්නිර් භස්මසාත්කුරුතේඅර්ජුන
ඥානාග්නිඃ සර්ව කර්මාණි භස්මසාත් කුරුතේ තථා

(4-36, 37, භගවද්ගීතා)

"සියලු ම පව්කාර මිනිසුන් අතුරෙන් ඔබ ඉතාමත් ම පව්කාරයා වන්නෙහි නමුදු, ඔබ ඥානය නමැති ඔරුවෙන් ම සියලු වරදවලින් එතර වන්නෙහි ය. අර්ජුනයෙනි, මහා ලෙස දල්වන ලද ගින්නෙකින් ඊට යොදන ලද දර තෙල් ආදිය සියල්ල ම අළු වී යන්නේ යම් සේ ද එ සේ ම ඥානය නමැති ගින්නෙන් සියලු ම ක්‍රියාවන් අළු කෙරෙයි."

එ පමණක් නොව, භගවද්ගීතාව අනුව, සියලු ලෞකික බැඳුම් කෙරෙහි සම්පූර්ණයෙන් පිටු පා, භාවනාවෙන් පමණක් ඥානය පසක් කිරීමට යත්න දරන තැනැත්තේ, සෘෂිවරයා ගේත් මුනිවරයා ගේත් පරමාදර්ශය වූ **යෝගියා ය.** "ශීතයෙහි දී මෙන් ම උෂ්ණයෙහි දී ද, සැපතෙහි දී මෙන් ම විපතෙහි දී ද, කීර්තිය මෙන් ම අපකීර්තිය පැමිණි විට ද යෝගියා චිත්ත සමාධිය රැක ගනී. ඉඩම් කඩම් වුව ද, ගලක් වුව ද, රන් පිඩක් වුව ද ඔහුට එක සමාන වේ. සතුරන් හෝ මිතුරන් කෙරෙහි ද, අමුත්තන් හා නෑසියන් කෙරෙහි ද සුදනන් හා දුදනන් කෙරෙහි ද හෙතෙම එක සේ හැසිරෙයි. හුදෙකලා තැනෙක ධ්‍යානයෝගී ව පලක් බැඳගත් "හෙතෙම නිසල ව ඔහු ගේ නාසාග්‍රය දෙස බලා සිටියි." "සුළං නොහමන තැන නොසැලෙන පහන් සිළුව පරිද්දෙන්" සිය සිත දමනය කොට මුළුමනින් ම භාවනානුයෝගී ව වසන යෝගියා සම්බන්ධයෙන් පුරාතනයෙහි පටන් යොදන උපමාව මෙය වේ. එහෙත් උපනිෂදයන්හි ඥානය හා විමුක්තිය ලැබීම සඳහා අනුදන්නා එක ම මාර්ගය භාවනාව හා චේතනාව ද වන නමුත් භගවද්ගීතාව තවත් මාගර්යක්, එ නම්, **භක්ති** මාර්ගයක් ද අනුදනී;

මෙය දෙවියන් කෙරෙහි භක්ති ප්‍රේමයයි. සිය ආත්මය මුළුමනින් ම, එක හිතින් ම ධ්‍යානයෝගී ව පවත්වා ගත නොහැකි තැනැත්තේ විනාශ මුඛයට පත් වේ ද යන අර්ජුන ගේ ප්‍රශ්නයට පිළිතුරු දෙමින්, "පින් කළ තැනැත්තා මුළුමනින් ම විනාශ මුඛයට පත් නො වේ" යයි කෘෂ්ණ පවසයි. මේ ලොව සිය යුතුකම් ඉටු කළ තැනැත්තා කලුටිය කොට සිය පුණ්‍යකර්මය අනුව යහපත්, සිල්වත් කුලයෙක ඉපිද, මෙ සේ ජාති කිහිපයක් සසර සැරි සරා, ක්‍රමයෙන් යෝගියකු වීමට හැකියාව ලබයි. "සියලු බැතිමතුන් අතුරෙන් යමෙක් මහත් ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ තම ආත්මය මා වෙත රඳවමින් මට පූජා කරත් ද, ඔහු උතුම් බැතිමතකු ලෙස මම සලකමි." යි කෘෂ්ණ පවසයි. දේව භක්තිය හේතු කොට ගෙන දෙවියන් පිළිබඳ ඥානය හා සැබෑ විමුක්තිය ද ළඟා වෙයි. කෘෂ්ණ මේ ගැන නැවත නැවතත් අනුශාසනය කරයි:

'අපි චේත් සුදුරාචාරෝ භජතේ මාමනන්‍යභාක්
සාධුරේව ස මන්තව්‍යඃ සම්‍යග්ව්‍යවසිතෝ හි සඃ

ක්ෂිප්‍රං භවති ධර්මාත්මා ශශ්වච්ඡාන්ති නිගච්ඡති
කෞන්තේය ප්‍රතිජානීහි න මේ භක්තඃ ප්‍රණශ්‍යති

මාං හි පාර්ථ ව්‍යපාශ්‍රිත්‍ය යේ'පි ස්‍යුඃ පාපයෝනයඃ
ස්ත්‍රියෝ වෛශ්‍යාස්තථා ශූද්‍රාස්තේ'පි යාන්ති පරාං ගතිම්

කිං පුනර්බ්‍රාහ්මණාඃ පුණ්‍යා භක්තා රාජර්ෂයස්තථා
අනිත්‍යමසුඛං ලෝකමිමං ප්‍රාප්‍ය භජස්ව මාම්'

(ix-30-33, භගවද්ගීතා)

"අතිශයින් දුරාචාරශීලී වූ මිනිසකු වුව ද, වෙන කිසිවකුත් නො වැඳ මා වඳින්නේ නම්, යහපත් අධිෂ්ඨානයෙන් යුත් ඔහු ඒකාන්තයෙන් ම යහපත් කෙනෙකැයි කිව යුතු ය. ඔහු ඉක්මනින් ම ධාර්මික සිත් ඇත්තකු වී, ශාස්වත ශාන්තිය ලබාගනී. කුන්තී පුත්‍රය, මගේ බැතිමතකු කිසි කලෙකත් විනාශ නොවන බව තිර ව ම දනගනුව, ඒ සේ ම, පෘථා පුත්‍රය, ස්ත්‍රීහු, වෛශ්‍යයෝ, ශූද්‍රයෝ හා පව්කාර යෝනිවල උපන්නහු පවා, මගේ සරණ ලැබ, පරම ගතියට පත් වෙති. ඒ සේ නම් මගේ බැතිමතුන් වන පුණ්‍යවන්ත බ්‍රාහ්මණයන් හා රාජර්ෂීන් ගැන කියනු ම කවරේ ද?"

සදාචාර ක්‍රියාව මෙන් ම, යෝගියා ගේ දැහැමි ගුණ සියල්ල ද ඊශ්වර කෙරෙහි භක්තිය හේතු කොට ගෙන ය ප්‍රධාන වශයෙන් ඔප් නැංවෙනු යේ.

'අද්වේෂ්ටා සර්වභූතානාං මෛත්‍රඃ කරුණ ඒව ච
නිර්මමෝ නිරහංකාරඃ සමදුඃඛසුඛඃ ක්ෂමී

සන්තුෂ්ටඃ සතතං යෝගී යතාත්මා දෘඪනිශ්චයඃ
මය්‍යර්පිත මනෝබුද්ධිර්යෝ මද්භක්තඃ ස මේ ප්‍රියඃ

යස්මාන්නෝද්විජතේ ලෝකෝ ලෝකාන්නෝද්විජතේ ච යඃ
හර්ෂාමර්ෂභයෝද්වේගෛර්මුක්තෝ යඃ ස ච මේ ප්‍රියඃ

අනපේක්ෂඃ ශුචිර්දක්ෂ උදාසීනෝ ගතව්‍යථඃ
සර්වාරම්භ පරිත්‍යාගී යෝ මද්භක්තඃ ස මේ ප්‍රියඃ'

(xii-13-16, භගවද්ගීතා)

සියලු සතුන් කෙරෙහි අද්වේෂී ව, කරුණා මෛත්‍රී සහගත ව, **මමත්වයෙන් හා අහංකාරයෙන්** ද තොර ව, දුක සැප දෙකෙහි දී ම සමසිතින් යුතු ව හා ඉවසිලිමත් ව;

නිතර ම සතුටු සිත් ඇත්තේ, **යෝගයෙහි නියැලි ව**, දමනය කරන ලද ආත්මයත්, කෘර්යයෙහි දැඩි ව බැඳුණු නොසැලෙන සිතැති ව, මා කෙරෙහි යොදවන ලද සිතකින් හා අවබෝධයකින් යුක්ත වූයේ හා මා කෙරෙහි බැතිමත් වූයේ ද, ඔහු මට ප්‍රිය ය.

යමෙකු හමුවෙහි ලෝකය දෙම්නස් නො වේ ද, ඒ සේ ම ලෝකය හමුවෙහි යමෙක් දෙම්නසට පත් නො වේ ද, ප්‍රහර්ෂයෙන්, නොඉවසිල්ලෙන්, බියෙන් හා දෙම්නසින් තොර වූයේ ද;

ආශා රහිත ව, පිරිසිදු ව, දක්ෂ ව හා අපක්ෂපාතී ව වේදනාවලින් තොර වූයේ ද, සියලු ව්‍යාපාරයන් අත්හැර මා කෙරෙහි බැතිසිත් වූයේ ද හේ මට ප්‍රිය ය.

කෙසේ වුව ද, භගවද්ගීතාව උගන්වන ආචාර ධර්මයෙහි සාරය වූ කලි, ව්‍යාඛ්‍යානාකාරයන් විසින් උචිත ලෙස ම "පරම සාරය" අඩංගු ශ්ලෝකය" යයි කියනු ලබන ශ්ලෝකයෙන් ප්‍රකාශයට පත් වෙයි.

මත්කර්ම කෘන්මත්පරමෝ මද්භක්තඃ සංගවර්ජිතඃ
නිර්වෛරඃ සර්වභූතේෂු යඃ ස මාමේති පාණ්ඩව

(xi-55 භගවද්ගීතා)

"මගේ වැඩ කරන්නා වූ ද මා කෙරෙහි පරම භක්තියෙන් යුක්ත වූ ද ඇලීම්වලින් තොර වූ ද, කිසි ම සත්ත්වයකු කෙරෙහි වෛර නොකරන්නා වූ ද ඒ පුද්ගලයා, පාණ්ඩු පුත්‍රය, මා වෙත පැමිණෙන්නේ ය"

භගවද්ගීතාව අනුව යමෙකින් විමුක්තිය හෝ පරම සුවය හෝ ලබා දෙයි ද එය ද මින් ප්‍රකාශ කෙරෙයි: එ නම්, **බ්‍රහ්මයෝගය හෙවත් ඊශ්වර** (දෙවියන්) හා ඒකත්වයට පැමිණීමයි. මෙය වූ කලි, "ආත්මය දේවාත්මයක් බඳු තත්ත්වයකට දියුණු කර ගැනීමක්, ඊශ්වර හමුවෙහි පෞද්ගලික චිරස්ථායිත්වයක්" ලෙස අවබෝධ කටයුත්තේ ය.

මේ නයින්, මේ පරමාර්ථය පසක් කර ගැනීමෙහි ලා **මාර්ග තුනක්** ඇත: එ නම්, කර්ම මාර්ගය, ඥාන මාර්ගය හා භක්ති මාර්ගයයි. එ සේ ම සෑම විට ම සාර්ථක ප්‍රතිඵල ලබා ගත නොහැකි වුව ද, මේ තුන් වැදෑරුම් මාර්ග එකිනෙකට පටහැනි නොවන පරිදි ගළපනු පිණිස ප්‍රයත්න දරනු නම් දක්නට ලැබේ. ඇත්ත වශයෙන්ම පළමු වන මාර්ගය තුන් වැන්න හා ගැළපීමට පුළුවන. ඉක්බිති ඊශ්වර කෙරෙහි භක්තිය, ඊශ්වර පිළිබඳ ඥානය ළඟා කරවන හෙයින් දෙ වන මාර්ගය හා මෙ සේ එක් වෙයි. මේ අනුව භගවද්ගීතාව උගන්වන ආචාර ධර්මයෙහි පරස්පර විරෝධිතා තරමක් දුරට නිරාකරණය කරගත හැකි වෙයි.[23]

එ සේ වුව ද අපට එළි පිට ම ඉදුරා පෙනෙන වෙනත් පරස්පර විරෝධිතා කාව්‍යයෙහි සෑම තැනෙක ම ඇත. කෘෂ්ණ සෑම විට ම **පුද්ගල දෙවියකු ලෙස**, සනාතන, නොනැසෙන නිර්මාතෘවරයකු ලෙස, තමා ගැන ප්‍රකාශ කරන නමුත් ධර්මය පිරිහෙන කල්හි මෙ ලොව උපත ලබයි; නැත හොත් එහි පහළ වෙයි. භක්තිය ගැන විස්තර කරන ඡේදයන්හි (IV-5 සහ ඊ ළඟ) මෙය විශේෂයෙන් මෙ සේ ය. වෙනත් ශ්ලෝකයන්හි, **සියලු සතුන් තුළ තමා වසන බවත් තමා තුළ සියලු සතුන් වසන බවත්**

හෙතෙම පවසයි (VI-30 සහ ඊ ළඟ). "මේ සියල්ල හුයෙක ඇමුණූ මුතු ඇට මෙන් මා කෙරෙහි රැඳී පවතී. කුන්තී පුත්‍රය, ජලයෙහි රසය මම වෙමි; හිරු සඳු ගේ ආලෝකය මම වෙමි; වේදයන්හි ඕංකාරය මම වෙමි; වායුගෝලයෙහි නාදය මම වෙමි; මිනිසුන් ගේ වික්‍රමය මම වෙමි; ආදි වශයෙනි (VII-7 සහ ඊ ළඟ ශ්ලෝක). ඊශ්වර ලොවින් වෙන් ව පවතින අතර ම එහි අන්තරස්ථායී ව පවත්නා බව පවසන මේ ධර්මය මහත් ගුඪ ධර්මයක් ලෙස උගන්වනු ලැබේ (IX-1 සහ ඊ ළඟ ශ්ලෝක). එසේ වුව ද කෘෂ්ණ ගැන කොහෙත් ම සඳහන් නොවන තුන් වන ඡේද ගණයක් ද ඇත; මෙහි උපනිෂදයන්හි අද්වෛතවාදය මෙන් ලොව මෙහෙයවන එක ම, උත්තම මූල ධර්මය වශයෙන් හඳිසියේ බ්‍රහ්මන් (නිර්ගුණ) ගැන කියැවෙයි. එ පමණක් නෙ ව, වේද ගැන උපහාසාත්මක මුඛයෙන් වාගේ කථා කරන ශ්ලෝක හා එක් ව (II-42 සහ ඊ ළඟ) වේදයන්හි නිර්දිෂ්ට යාගහෝම අනුමත කරන ඡේද හා "සියලු මන දොළ සපුරා ලන හාස්කම් පාන ගව දෙනකට" (III, 10) සමාන කරමින් යාග හෝම විස්තර කරන ඡේද පවා අපට හමු වෙයි; බොහෝ විට ප්‍රශංසාවට භාජන කරන "ආශාවෙන් තොර ක්‍රියාව" සමඟ මේවා පැහීම උගහට ය.

ආශාවෙන් තොර ක්‍රියාව පිළිබඳ මේ ධර්මය ඇතැම් විට "**යෝග**" යන පදයෙන් විස්තර වෙයි. එහෙත් මේ පදය ම නානාවිධ අරුතින් යොදනු ලැබේ. සාමාන්‍ය අර්ථය නම් ඉන්දීය සාහිත්‍යයෙහි "යෝග" යන්නෙන් සාමාන්‍යයෙන් ගෙන දෙන අරුතයි; එ නම්, දෙවියන් හා එක්වන් ව විසීම පිළිබඳ හා ඉදුරන් මුල් කොට ගත් ලොවින් වෙන් ව සම්පූර්ණයෙන් දෙවියන් හා ඒකත්වයට පැමිණ විසීමේ ක්‍රම පිළිබඳ ධර්මයි. භගවද්ගීතාව ඇතැම් විට "**යෝගශාස්ත්‍ර**" යන නමින් හැඳින්වෙනුයේ මේ අරුතිනි. යෝගය පිළිබඳ මේ "ව්‍යාවහාරික දර්ශනයෙහි" මනෝවිද්‍යාත්මක හා ආධ්‍යාත්මික පදනම සාංඛ්‍ය දර්ශනයෙහි දක්නට ලැබේ.[24] එහෙත් සාංඛ්‍ය දර්ශනය, ආත්මය (පුරුෂ) සහ ද්‍රව්‍ය (ප්‍රකෘති) අතර වෙනසත්, ආත්ම බහුත්වයත්, ප්‍රකෘතියෙහි ස්වාධීන සනාතන ස්වභාවයත් උගන්වමින් ලොවේ නිර්මාණය මූල ප්‍රකෘතියෙන් විකසනය වීමක් ලෙස විස්තර කරයි. මේ දර්ශන සියල්ල උපනිෂද් සහ වේදාන්තය ද මඟින් උගන්වන ලද අද්වෛත වාදයට ඉඳුරා පටහැනි වෙයි. එතෙකුදු වුවත්, බ්‍රහ්මන් ගැන ලියැවුණු ඡේද ද විශ්වයේ ඒකත්වය පිළිබඳ දර්ශනය ගෙන හැර දක්වයි.

මේ සියලු පරස්පර විරෝධතා නිරාකරණය කළ හැක්කේ කෙසේ ද? මේ කරුණු සම්බන්ධයෙන් විද්වතුන් අතර, කිසි ම එකඟබවක් නොමැත. මේ පරස්පර විරෝධිතා සියල්ලට හේතුව වූ කලි භගවද්ගීතාව ක්‍රමානුකූල දාර්ශනික කෘතියක්නෙ ව ධ්‍යානයෝගි කාව්‍යයක් වීම යැයි පැවසීමෙන් ඇතැමෙක් සෑහීමට පත් වෙති; මේ මතය ඉතා ස්ථිර ලෙස නියතාකාරයෙන් ඉදිරිපත් කරන පඬුවකු වූ **ප්‍රැන්ක්ලින් එඟර්ටන්**

පවසන අන්දමට මෙය "තර්කානුකූල දාර්ශනික කෘතියකට වඩා කාව්‍යමය ධ්‍යානයෝගී, භක්තිමය කෘතියෙකි". "මේ තෙමේ නෛකායික පරිමාණයක් ලබා නියමිත ක්‍රමයක් අනුව කරුණු වර්ග කරමින්, ශූර ලෙස අදහස් හැට ලමින් තම දර්ශනයෙහි අවසාන මූල ධර්ම කරා ළඟා වන දාර්ශනිකයකු නොව තම ප්‍රඥාවෙහි හා භාවයෙහි ද පරතෙර පත් ව, ඉන් උද්දාම ව කථා කරන මුනිවරයෙකැ" යි ඩබ්. වොන් හම්බෝල්ඩ් පැවැසි ය[25]. අනෙක් අතට, ධ්‍යානයෝගී කාව්‍යයෙහි පවා යම් කිසි සීමාවක් විය යුතු බවත් ගීතාව එහි මුල් ස්වරූපයෙන් අප අතට පත් නොවූ බවත්, මහාභාරතයෙහි අන් බොහෝ කොටස් මෙන් අතරින් පතර කොටස් ඇදීමෙන් හා ප්‍රතිසංශෝධනයෙන් ද දැනට පවත්නා ආකෘතිය ලැබුණු බවත් නිගමනය කිරීමෙන් එහි පරස්පර විරෝධිතාව වඩාත් මැනැවින් විස්තර කළ හැකැයි වෙනත් පඬුවෝ ප්‍රකාශ කොට සිටිති. මුලින් සර්වේශ්වරවාදී කාව්‍යයක් වූ භගවද්ගීතාව පසු කාලයෙක විෂ්ණු භක්තිකයින් විසින් ඊශ්වරවාදී කාව්‍යයක් ලෙස සකසා ගත් බව ඇතැම් පඬුවෝ විශ්වාස කළෝ ය. මේ මතය බෙහෙවින් අවිශ්වසනීය ය; කොතෙකුත් පරස්පර විරෝධිතා ඇති වුව ද කෘතියෙහි මුළු ස්වරූපය ම ප්‍රධාන වශයෙන් ඊශ්වරවාදී එකක් වෙයි. අවශ්‍යයෙන් ම සගුණ දෙවියකු ලෙස විද්‍යමාන වන ඊශ්වරයෝ ඇදුරකු වශයෙන් ද මනු ලොව පහළ වූ අවතාරයක් වශයෙන් ද බැතිමතුන් ගේ භක්තිය අපේක්ෂා කරන්නෝ ය.

මෙය මෙ සේ ම වෙතැයි විශ්වාස කළ ආර්. ගාබ්[26] ස්වකීය අදහස අනුව අසත්‍ය යයි—එනම්, වේදාන්ත දර්ශනය හා සම්මත බමුණු සමය අනුව පසු ව එක් කරන ලදැයි සැලකිය හැකි ශ්ලෝක සියල්ල තම පරිවර්තනයෙහි කුඩා අකුරින් මුද්‍රණය කරමින් මුල් කාව්‍යය නැවත සකස් කොට ගැනීමට කෙළින් ම උත්සාහයක් දැරී ය. මම ද කලකට පෙර ගාබ් ගේ මතයට සම්පූර්ණයෙන් එකඟ වීමි[27]. ඒ සේ වුව ද, ගීතාව නැවත නැවතත් පරිශීලනය කිරීමෙන් ද, ගාබ් විසින් වෙන් කොට දැක්වුණු ඡේද ඉතා සම්පූර්ණ ලෙස විමසා බැලීමෙන් ද පසු ව, මුල් කාව්‍යය නිර්මල ඊශ්වරවාදයක් නොව, සර්වේශ්වරවාදය ද යම්තමින් ගබ් වූ ඊශ්වරවාදයෙකැයි යන නිගමනයට මට එළඹීමට සිදු විය. කෘෂ්ණ ලොව මුළුල්ලෙහි සෘෂ්ටියක් ලෙස පවතිනැයි පවසන ඡේද සියල්ල නිදසුන් වශයෙන් VII-7 සහ ඊළඟ ශ්ලෝක වැනි රමණීය ශ්ලෝක පසු ව එක් කරන ලද ශ්ලෝක ලෙස සැලකීම යුක්ති යුක්ත යයි මම දැන් විශ්වාස නොකරමි. අනෙක් අතට කෘෂ්ණ ගැන කොහෙත් ම සඳහන් නොකොට හදිසියේ (නිර්ගුණ) බ්‍රහ්මන් ගැන සඳහන් කරන ඡේද (උදා. II-72; V-6, 7, 10; VII-29 —VIII-4 ආදිය) මෙන් ම වත් පිළිවෙත් හා යාග හෝම නිර්දේශ කරන හෝ ප්‍රශංසාවට ලක් කරන හෝ ඡේද (උදා. III-9-18; IX-16-19 ආදිය) පසු ව එක් කරුණු ඒවා බව සලකන ගාබ්

ගේ මතයට මම ද එකඟ වෙමි. තව ද, මුල් භගවද්ගීතාව මීට වඩා බෙහෙවින් කෙටි වූ බවත්, අද දක්නට ලැබෙන ස්වරූපයෙන් මේ කෘතියෙහි ගාඩි පෙන්වා දෙන අතරින් පතර කරන ලද එකතු කිරීම් හා අමතර ඡේද මීට වඩා වැඩි ගණනක් ඇති බවත් මට සිතෙයි. මහාභාරතය අටලොස් පර්වයකට බෙදා ඇති පරිද්දෙන් ද, අටලොස් පුරාණයක් විද්‍යාමාන වන පරිද්දෙන් ද, භගවද්ගීතාවෙහි අඩුවැඩි නොමැති ව අටලොස් අධ්‍යායයක් ම දක්නට ලැබීම පවා සැක කටයුතු කරුණෙකි[29]. කෘෂ්ණ තම දේවාත්මභාවය අර්ජුන ඉදිරියෙහි හෙළි කර සිටින XI වන අධ්‍යායය, මුල් කොටස් රචනා කළ කවියා ගේ කෘතියක් ලෙස නොව පුරාණයක් ලෙස පැනෙයි. වීර කාව්‍යයෙහි දැක්වෙන වීරයන් දෙවියන් ගේ දත් අතර එල්ලී සිටින පරිදි මායාව මවා පාන XI 26 සහ ඊ ළඟ ශ්ලෝක බදු ශ්ලෝක ගීතාවෙහි කර්තෘ ශ්‍රේෂ්ඨ ඒවා ලෙස සැලකීමට මා පසුබට වනුයේ මුල් ගීතාවෙහි කර්තෘ ශ්‍රේෂ්ඨ කවියෙකැයි යන මගේ මේ දෘඪ විශ්වාසය නිසා ම ය. මේ මවා පෑ මායාව නිසා සතුරා මැරීම සඳහා II වන සර්ගයෙහි දැක්වුණු හේතුවලට තවත් හේතුවක් එක් වෙයි. එ නම්, "(ඊශ්වර විසින්) සතුරා දැනට මත් ඝාතනය කොට ඇති බැවින්" සතුරන් මැරීමට අර්ජුන පසුබට වීම අනවශ්‍යවීම ය[30].

භගවද්ගීතාව මුල් වීර කාව්‍යයට ඇතුළත් නොවූ බවට කිසි ම සැකයක් නැඟිය නොහැකි තරම් ය. වීර කාව්‍ය කවියකු යුද්ධ වර්ණනයක් මැද දී සිය කථා නායකයන් ශ්ලෝක 650කට කන් දීමෙන් දර්ශනික සංවාදයෙක යොදවනැයි විශ්වාස කිරීම උගහට ය. විශ්වාස කළ හැකි අන්දමින්, මුල් වීර කාව්‍යයෙහි අර්ජුන සහ (කෘෂ්ණ දෙවියන් නොව) කථා නායකයා හා රියැදුරා වූ කෘෂ්ණ ද අතර කෙටි සංවාදයක් ඇතුළත් වන්නට ඇත. මේ සංවාදය වූ කලි අප අතට පත් උපදේශාත්මක කාව්‍යය විකසනයට හේතු වූ බීජය වැන්න[30] මේ උපදේශාත්මක කාව්‍යය. මුල දී එය ස්වභාවයෙන් ම භාගවතයින් ගේ ශුද්ධ ග්‍රන්ථයක් විය. මෙහි ආශාවෙන් තොර ක්‍රියාව පිළිබඳ කර්ම මාර්ගය වූ යෝග ධර්මය හා බැඳුණු භක්ති ධර්මය, සාංඛ්‍ය දර්ශනය පදනම් කොට ගෙන උගන්වන ලදි. ක්‍රි. පූ. 2 වන ශත වර්ෂයේ ආරම්භය තරම් ඈත වකවානුවෙක පටන් ම භාගවතයන් ගේ ධර්මය අදහන්නන් ගන්ධාරයේ ග්‍රීකයන් අතර පවා වූ බැව් ස්ථූට කරන සාක්ෂි සෙල්ලිපිවලින් ලැබේ.[31] පුරාණ භගවද්ගීතාව මෙසේ එක පමණ භාගවතයන් ගේ උපනිෂදයක් ලෙස ලියැවුණු බව නිගමනය කිරීම එ තරම් සාහසික නොවිය හැකි ය[32]. එහි භාෂාව ද, ආකෘතිය මෙන් ම වෘත්ත ද එය මහාභාරතයෙහි පුරාණතම කොටසක් බවට දෙස් දෙයි. වීර කාව්‍යයෙහි පසු ව එන කොටස්වල ගීතාව ගැන සඳහන් වෙයි.[33] අනුගීතාව (XIV—61—51) වූ කලි හුදෙක් භගවද්ගීතාවෙහි පශ්චිම

කාලීන අනුකරණයක් හා එය තව දුරටත් දීර්ඝ කිරීමක් ද බව නිසැක ය. මෙහි භගවද්ගීතාවහි දක්නට ලැබෙන විවිධත්වයටත් වඩා විවිධ දර්ශන දක්නට ලැබේ.

බාණ කිවියා (ක්‍රි. ව. 7 වන වර්ෂයෙහි) මහාභාරතයෙහි කොටසක් වශයෙන් භගවද්ගීතාව ගැන දැන සිටියේ ය.[34] උපනිෂදයන් සහ වේදාන්ත සූත්‍රයන් ද සමඟ එය **ශංකරාචාර්ය්‍ය** ගේ ධර්මයට ද පදනම් විය. ගතානුගතික බමුණන් අතින් මෙහි වර්තමාන ස්වරූපය මීට ලැබුණේ ක්‍රි. යුගයේ මුල් ශත වර්ෂයන්හි විය යුතු ය; මේ ස්වරූපයෙන් හින්දූන් ගේ ජනප්‍රියතම ආගමික ග්‍රන්ථය බවට පත් වූ මෙය අද දක්වා ම ඒ තත්ත්වයෙහි පවතී. මේ කෘතියට ලැබුණු අධික ජනප්‍රියත්වයට හේතු වූයේ බෙහෙවින් පරස්පරවිරෝධී වූ දර්ශනයන් හා ආගමික අදහස් ද එහි එක තැන දක්නට ලැබීම ය. මෙ සේ සියලු නෛකායිකයනට ම එය උපයෝගි කොට ගත හැකි වෙයි. අද පවා **බ්‍රහ්ම සමාජයෙහි** අනුගාමිකයන් **ඇනී බෙසන්ට් ගේ** නායකත්වය යටතෙහි වන පරම විඥානවාදියා මෙන් ම ඉතා ම ගතානුගතික බ්‍රාහ්මණයා පවා ඉන් එක සේ උගැන්මක් ලබයි.

එ සේ වුව ද ආරම්භයෙහි පටන් ප්‍රතිවිරුද්ධතා සංකලනයෙකින් ම භගවද්ගීතාව පහළ වන්නට නොහැකි තරම් ය; මේ සංකලනය වැඩි වැඩියෙන් ම ඇති වූයේ පසු වකවානුවෙක බැවිනි. පුරාණ, සැබෑ ගීතාව ප්‍රතිභා පූර්ණ ශ්‍රේෂ්ඨ කවියකු ගේ රචනයක් බව නොඅනුමාන ය. සැම යුගයෙක ම විසූ සහෘදයන් තුළ මෙ තරම් ගැඹුරු හැඟීමක් පහළ කර වීමෙහි ලා එය සමත් වූයේ එහි කාව්‍යමය අගය, වේගවත් භාෂාව, උපමාරූපකයන්හි ඔඝචිත්‍යය හා කාව්‍යය මුළුල්ලෙහි ව්‍යාප්ත ව පවත්නා ප්‍රතිභාපූර්ණ කවිත්වය හේතු කොට ගෙන ය; පසු කාලයෙක එකතු කරන ලද කරුණු මඟින් කාව්‍යය විකෘති නොකරන ලද නම් එහි සදාචාර අගය මෙන් ම කාව්‍යමය සෞන්දර්යය ද වඩාත් හොඳින් රස විඳිය හැකි වනු ඇතැයි මම තරයේ විශ්වාස කරමි.[35]

භාගවතයන් ගේ තවත් පාඨ ග්‍රන්ථයක් නම් **නාරායණීයයි** (XII 334—351); මෙය භගවද්ගීතාවට වඩා පසු වකවානුවෙක රචිත කෘතියක් බව ඉදුරා කිව හැකි නමුත් මෙහි ද පසු ව එකතු කරන ලද අමතර කොටස් දක්නට ලැබේ.[36] සැබෑ පුරාණ ශෛලිය අනුව කරන ලද කෘතියක් වන මෙය පාරම්පරික ලබා ගත හැක්කේ භක්තියෙන් හා දේවානුග්‍රහයෙන් ද පමණක් බව උගන්වයි; මෙහි ඊශ්වර **නාරායණ** නාමයෙන් පෙනී සිටී. මෙහි ද, භාගවත ධර්මයත් සංඛ්‍ය හා යෝග දර්ශනත්, වේදාන්ත සංකල්පයන් හා මිශ්‍ර ව පවතිනු අපට දක්නට ලබෙයි. නාරායණ බැතිමතුන් ගේ ස්වර්ගය වූ **ශ්වෙතද්වීපය** හෙවත් "**සුදු දිවයින**" අතිශය අද්භූතාකාරයෙන් එහි විස්තර වෙයි:

එක ම දෙවියන් වහන්සේ වූ නාරායණයන් අදහන බැතිමතකු වූ නාරද සෘෂිවරයා එ තුමන්ගේ සියලු දේවත්වය දැක ගැනීමට අපේක්ෂා කරයි. මේ හේතුවෙන් යෝග බලය මෙහෙයවමින් තමා පොළොව තලයෙන් එසවීමට යලුහා ගන්නා හෙතෙම මේරු නම් ශුද්ධ වූ පර්වතයට සැපත් වෙයි. ඒ මත සිට වයඹ දිගට නෙත් හෙළන හෙතෙම, ක්ෂීර සාගරයෙන් උතුරු දෙස, මේරු පර්වතයෙන් යොදුන් 32,000ක් ඔබින් පිහිටි සුප්‍රසිද්ධ ශ්වේත ද්වීපය දකියි. මේ ද්වීපයෙහි "විත්දහේන්ද්‍රිය නැති, ආහාරයෙන් තොරවන්නා, ඇසිපිය නොහෙළන, මිහිරි සුගන්ධයක් නිකුත් කරන, සියලු පාපයෙන් මිදුණු, පාපී පුද්ගලයන් මෝහනය කරවන ඔරුරින් හෙබි, විදුරු මෙන් දැහි ඇටයෙන් තැනුණු ඔරුරු ඇති නින්දා, ප්‍රශංසා දෙක ගැන එක සේ උපේක්ෂාවක් දක්වන රූපශ්‍රීයෙන් සුර කුමරුන් බඳු, ප්‍රභාවත් කායබලයෙන් යුක්ත වූ, පත්‍ර බඳු ඔස් ඇති ශ්වේත වර්ණ ජනකායයක් හේ දකියි. ඔවුන් ගේ කට හඬ තද වැඩි කුණාටුවක් හමා යනු වැන්න; ඔවුනට සමාන වාඝණ සතරක් ද, පියුම් පත්‍ර බඳු පාද ද, සුදු දත් සැටක් හා දළ අවක් ද ඇත. ඔය දිවෙන් සූර්යයා බඳු තම වක්ත්‍ර පිරිමැදින ඔහු දෙවියන් කෙරෙහි භක්තියෙන් පිරී සිටියාහු ය.[37]

ශ්වේත ද්වීපය මෙන් ම, මේරු නම් දිව්‍ය පර්වතය හා ක්ෂීර සාගරය ද ඓතිහාසික භූගෝල විද්‍යා ක්ෂේත්‍රයට නොව පුරාණ දේව කථාක්ෂේත්‍රයට ඇතුළත් වන බව පැහැදිලි ය. ඒ සේ වුව ද ක්ෂීර සාගරය **ඉඹිඹික්කුල් විල** හෙවත් **බෝල්ඛෂ් විල** ලෙස ද, ශ්වේත ද්වීපය **ශුද්ධ මිනිසුන් වූ නෙස්ටෝරියානු ක්‍රිස්තු භක්තිකයන්**[38] වාසය කළ උතුරු දේශයක් ලෙස ද සැලකීමට විද්වතුන් කිහිප දෙනකු උත්සාහ කොට ඇත. මෙ නයින් නාරායණීයයෙහි **ක්‍රිස්තියානි** බලපෑමක් ඇතැයි අපට නිගමනය කිරීමට සිදු වෙයි. මගේ අදහස අනුව, ශ්වේත ද්වීපය පිළිබඳ වර්ණනය **ක්‍රිස්තුස්** වහන්සේ පුදනු පිණිස ක්‍රිස්තු භක්තික නායකයන් ගේ **සමාගමක් ගැන නොව, වෛකුණ්ඨ, ගෝලෝක, කෛලාස** වැනි දෙව් පුර හා **අමිතාභය බුදුරදුන් ගේ දෙව් ලොව වූ සුඛාවතිය** ද වැනි දෙව් ලෝ ගැන අපට සිහිපත් **කරවයි.**

මහාභාරතයෙහි දාර්ශනික කොටස් බොහොමයෙක සාංඛ්‍ය හා යෝග දර්ශනයන් ප්‍රමුඛස්ථානයක් ගන්නා නමුත් සෑම තැනෙක ම වේදාන්ත දර්ශනය උගන්වන ඡේද අමුතුවෙන් ඇඳා තිබෙනු අපට දක්නට ලැබේ. මෙහි ඇතුළත් කරනු ලැබූ **සනත්සුජාතීයය** (V—41-46) වැනි දීර්ඝතර ඡේද කිහිපයක් ද මුළුමනින් ම වේදාන්ත දර්ශනයක් උගන්වයි.[39] එ සේ වුව ද, කාව්‍යමය අගය අතින් නම් භගවද්ගීතාවට යම්තමින් හෝ සමාන කළ හැකි දාර්ශනික කොටසක් මහාභාරතයෙහි අවිද්‍යමාන ය.

විශේෂ දාර්ශනික හෝ ආගමික මත නොසලකමින් **සදාචාර** ගැටලු පිළිබඳ ව, උදා: නිරතුරු සාකච්ඡාවට භාජන වන ඉරණම හා මිනිසුන් ගේ කර්මය පිළිබඳ ව හෝ සාමාන්‍ය සදාචාර ධර්ම පිළිබඳ ව හෝ, සාකච්ඡා කරන උපදේශාත්මක කොටස්වල ඉන්දීය කාව්‍යයේ මහඟු මිණි කිහිපයක් ම දක්නට ලැබේ. මහාභාරතයෙහි මේ ශ්ලෝකයන්හි ගබ්ව පවත්නා ඉමහත් සෞන්දර්යය හා පාණ්ඩිත්‍යය ද පිළිබඳ කිසි යම් අදහසක් ලබා දීමට මතු දැක්වෙන ශ්ලෝක සමත් වනු ඇත:

ඉර්ෂතේ සායකෛර් විද්ධං වනං පරශුනා යතම්
වැච දුරුක්තං බීභත්සං න සංරෝහති වාක්ක්ෂතම්

කර්ණිනාලික නාරාචාන් නිර්හරන්ති ශරීරතඃ
වාක්ශල්‍යස්තු න නිර්හර්තුං ශක්‍යෝ හෘදිශයේ ශි සඃ

(V—34—78, 79, මහාභාරත)

නදේවා දණ්ඩමාදාය රක්ෂන්ති පශුපාලවත්
යං තු රක්ෂිතුමිච්ඡන්ති බුද්ධ්‍යා සංවිභජන්ති තම්

(V—35—40, මහාභාරත)

ආ ක්‍රුෂ්‍යමාණෝ නාක්‍රෝෂේන් නනදෙරේට තිතික්ෂතඃ
අක්‍රෝෂ්ටාරං නිර්දහති සුකෘතං චාස්‍ය වින්දති

අතිවාදං න ප්‍රවදේන් න වාදයේ ද්—
යෝනාහතඃ ප්‍රතිහනාහන් න ඝතයේත්

හන්තුං ව යෝ නේච්ඡති පාපකං වෛ
තස්මෛ දේවාඃ ස්පෘහයන්ත්‍යාගතාය

(V—36—5, 11, මහාභාරත)

අරාවප්‍යුචිතං කාර්යමාතිථ්‍යං ගෘහමාගතේ
ඡේත්තුමප්‍යාගතේ ඡායාං නෝපසංහරතේ ද්‍රුමඃ

(XII—146—5, මහාභාරත)

රාජන් සර්ෂප මාත්‍රාණි පරච්ඡිද්‍රාණි පශ්‍යසි
ආත්මනෝ බිල්ව මාත්‍රාණි පශ්‍යන්නපි න පශ්‍යසි

(1—74—82, මහාභාරත)

ස්මරන්ති සුකෘතාන්‍යෙව න වෛරාණි කෘතාන්‍යපි
සන්තඃ පරාර්ථං කුර්වාණා නාවේක්ෂන්තේ ප්‍රතික්‍රියාම්

(II—73—7, මහාභාරත)

"ඒ සැරයකින් විදීමෙන් ඇති වන තුවාලය කලෙක දී යළිත් සුව වෙයි; පොරවෙන් කපන ලද ගසක් යළිත් ඉක්මනින් ලිය ලා වැඩෙයි. එහෙත් සැඩ පරුස වචනවලින් ඇති වන තුවාල කිසි කලෙකත් සුව නො වේ."

"තුඩින් ශරීරය තුළට කා වැදුණු ඊයක් ශරීරයෙන් ගලවා ලිය හැකි ය. එහෙත් වචන නමැති හුල් එසේ ගලවා ලිය නොහැකි ය. ඒවා හදවතෙහි ඇනී තැන්පත් ව පවතී."

"ආරක්ෂා කළ යුතු වන මිනිසුන් ආරක්ෂා කිරීමට දෙවියෝ ගොපල්ලන් මෙන් දණ්ඩක් යොදා නො ගනිති. ඔවුන්ගේ ආරක්ෂා ලැබිය යුත්තනට ඔහු යහපත් බුද්ධියක් ලබා දෙති."

"ආක්‍රෝෂ කරන්නා ආක්‍රෝෂ නොකිරීමෙන් ද කෝපය කරුණාවෙන් ද ලෝභය ත්‍යාගශීලිත්වයෙන් හා බොරුව සත්‍ය වචනයෙන් ද ජය ගන්නේ ය."

"ක්‍රෝධය ඉවසීමෙන් ජයගන්නේ ය; ක්‍රෝධ කරන්නවුන් කෙරෙහි කිසි කලෙකත් ක්‍රෝධ නොකරන්නේ ය. සැඩ පරුෂ වචනවලට හැම විට ම කරුණාබර මොළොක් වදනින් පිළිතුරු දෙන්නේ ය. ගසන ලද පහරට පෙරළා පහර නොදෙන්නේ ය; පහර දුන් තැනැත්තාට ද අහිතක් නොසිතන්නේ ය. සතුරනට මේ අයුරින් සලකන පුද්ගලයා දෙවියන් ගේ පවා පැසැසුමට ලක් වෙයි."

"ගෙදරට ආ සතුරාට ද ආගන්තුක සත්කාර කළ යුතු වෙයි. ගස, එය සිදීමට ආ පුද්ගලයාට ද සෙවණ දීමට බැරි යැයි නො කියයි.

"මහ රජ, අනුන්ගේ අඹ ඇට තරම් ස්වල්ප වැරදි ද ඔබ දකිති. එහෙත් ඔබ ගේ බෙලි ගෙඩි තරම් විශාල වැරදි වුව ද ඔබේ පක්ෂග්‍රාහී ඇසට නොපෙනෙන්නේ ය."

සත්පුරුෂ තෙමේ යහපත් ක්‍රියාවන් ම ඔහු නබාගන්නේ ය; කෙනකු කරන ලද අහිත කර ක්‍රියාවන් හේ අමතක කරන්නේ ය. පර හට වැඩ කිරීමේ දී හේ ඊට ප්‍රත්‍යුපකාරයක් අපේක්ෂා නොකරන්නේ ය."

මහාභාරතයට උපග්‍රන්ථයක් වූ[1] හරිවංශය

පසු ගිය පරිච්ඡේදයන්හි සාකච්ඡා කරන ලද කරුණු මහාභාරතයේ අටළොස් පර්වයන් පිළිබඳ ව යම් අදහසක් දීමෙහි ලා ප්‍රමාණවත් විය යුතු ය. එ සේ වුව ද, සැබවින් ම පුරාණයක් වූ ද, ඇතැම් විට "**හරිවංශ—පුරාණය**" ලෙස හඳුන්වනු ලබන්නා වූ ද කෘතියක් වන **හරිවංශය** මහා භරතයෙහි ම අන්තර්ගත කොටසක් ලෙස භාරතීයයෝ සලකති. එතෙකුදු වුවත්, භාරතීයයෝ පවා මේ ග්‍රන්ථය එකුන්විසි වන "පර්වය" ලෙස නොව, **ඛිලයක්**, එ නම් මහාභාරතයට එක්වුණු උපග්‍රන්ථයක් ලෙස හඳුන්වති. මේ "උපග්‍රන්ථය" ශ්ලෝක 16,374කින් සමන්විත වූවක් බව සැබෑවකි; එ නම්, **ඉලියඩ්** හා **ඔඩිසි** යන කාව්‍ය දෙක ම එක් කළ විට පවා මෙ තරම් දීර්ඝ නො වේ. එහෙත් එහි සාහිත්‍යික අගය නම් ප්‍රමාණය හා කිසි සේත් නො සැසඳෙයි. එය "කාව්‍යයක්" නොවන බව, කිසි සේත් **එක ම කවියකු** ගේ කෘතියක් නොවන බව, ඉස්මතු ව පෙනෙන කරුණෙකි. මෙය වූ කලි, විෂ්ණු දෙවියන් හට ප්‍රශංසාමුඛයෙන් ලියැවුණු අවුල් වූ හෝ යන්තමින් බැඳී පවතින පාඨ ග්‍රන්ථ සම්භාරයෙකින්—පුරාවෘත්ත, පුරාණ දේව කථා හා ස්ත්‍රෝත්‍ර රාශියකින්—සමන්විත වූවකි. හරිවංශය **එක ම** සම්පාදකයකු ගේ කෘතියක් හෝ නො වේ. එහි අවසාන තුනෙන් කොටස ඊටත් පසු කලෙක උපග්‍රන්ථයට එකතු කරනු ලැබූ තවත් උපග්‍රන්ථ යක් බවට අනුමානයක් නැත. එ පමණක් නො ව මේ කෘතියෙහි සෙසු කොටස්වල ද නොයෙක් ඡේද නානා වකවානුවල දී ඇතුළු කරන ලද්දේ විය හැකි ය.

හරිවංශය හා මහාභාරතය ද අතර සම්බන්ධය ද හුදෙක් බාහිර සම්බන්ධයකි; සමස්ත මහාභාරතය ජනමේජයන් හට ගෙන හැර දැක්වූ **වෛශම්පායන** ඍෂිවරයා විසින් ම හරිවංශය ද ගෙන හැර දැක්වීමට පමණක් මේ සම්බන්ධය අවශ්‍යයෙන් සිදු වෙයි. මහාභාරතයෙහි ප්‍රධාන කථා සැකිල්ල හා සම්බන්ධ ව, **උග්‍රශ්‍රවස්** විසින් භාරතයින් පිළිබඳ රසවත් කථා සියල්ල ගෙන හැර දැක්වූ පසු ව, **වෘෂ්ණියන්** හා **අන්ධකයන්** පිළිබඳ ව—එ නම්, කෘෂ්ණ ගේ පරපුර පිළිබඳ ව යමක් පැවසීමට උපග්‍රන්ථය ආරම්භයෙහි දී **ශෞනක** උග්‍රශ්‍රවස් ගෙන් ඉල්ලා සිටී. එ කල්හි, මහාභාර තය ගෙන හැර දැක්වීමෙන් පසු ව ජනමේජය විසින් වෛශම්පායන ගෙන් මේ ඉල්ලීම කරන ලද බවත්, ඒ අවස්ථාවෙහි වෛශම්පායන පැවසූ පුවත් සියල්ල දැන් තමා ද පවසන්නට අදහස් කරන බවත් **උග්‍රශ්‍රවස්** ප්‍රකාශ කරයි. මෙ සේ ඊට පසු දැක්වෙන සියල්ල වෛශම්පායන

ගේ මුවට නැඟෙයි. මීට අමතර වශයෙන් ආරම්භයෙහි ශ්ලෝක කිහිපයකින් හා ඛිලය අවසානයෙහි සම්පූර්ණ දීර්ඝ ස්තෝත්‍රයෙකින් ද යන විසින් අතිශයෝක්තියෙන් හෙබි ශ්ලෝකවලින් හරිවංශය ඇතුළු මහාභාරතයෙහි ගුණ ගායනා කොට සමස්ත කාව්‍යය ම කියවීමෙන් හා ඊට සවන් දීමෙන් සිදු වන පින අවධාරණය කොට ඇත. හරිවංශය හා මහාභාරතය ද අතර සම්බන්ධය ගැන හරිවංශයෙහි ම දක්නට ලැබෙන සඳහන් මෙ තෙකින් නිම වේ. විෂයය අතින් සලකා බැලූ කල මහාභාරතයට හා පුරාණයනට ද පොදු කරුණුවලට වඩා වැඩි නො වේ. කුමක් නිසා ද යත්, මහාභාරතය ද දැක්වෙන පුරාවෘත්ත රාශියක්—විශේෂයෙන් බ්‍රාහ්මණ පුරාවෘත්ත හා පුරාණ දේවි කථා වෙනත් අන්දමින් සකස් කොට ගෙන හරිවංශයෙහි මෙන් ම පුරාණයන්හි ද දක්නට ලැබෙන හෙයිනි.

හරිවංශය පර්ව තුනකින් සමන්විත වේ; මින් පළමු වැන්න **හරිවංශ පර්වය** නමින් හැඳින්වේ. සමස්ත ඛිලයට ම දුන් නාමය වූ "හරිවංශය"[4]—එ නම්, හරි ගේ වංශය යනු ඇත්ත වශයෙන් යෙදිය හැක්කේ මේ පළමු වන පර්වය සඳහා පමණකි. ලෝකය මැවීම පිළිබඳ අවුල් සහගත විස්තරයෙකින් ද, ධ්‍රුව තාරකාව බවට පත් වූ ධ්‍රුව පිළිබඳ ව (62 සහ ඊ ළඟ) ද, දක්ෂ සහ ඔය දියණියන් පිළිබඳ ව ද, සුරාසුරයන් ගේ මව් පක්ෂයේ මුතුන්මිත්තන් පිළිබඳ ව (101 සහ ඊ ළඟ) ද, වෙනත් කථා පුවත් ද ඇතුළු නානාප්‍රකාර පුරාණ දේව කථා රැසකින් එය පුරාණයෙක ආකාරයෙන් ඇරඹෙයි. වේදයනට ද යාග හෝමවලට ද විරුද්ධ වූ **වේන** නම් යෝධයා සහ ඔහු පුත් **පෘථු** නම් මුල් ම නරවරයා ගැන ද කථාන්තරය විස්තර සහිත ව දක්වේ.[5] විශ්වාමිත්‍ර හා විශිෂ්ඨ යන අය ගේ පුරාවෘත්තය (706 සහ ඊ ළඟ) වැනි අනේක පුරාවෘත්ත, සූර්ය වංශයෙහි (545 සහ ඊ ළඟ), එ නම් සූර්ය දේවතාවා ගෙන් පැවත එනැයි විශ්වාස කෙරෙන **ඉක්ෂ්වාකු** රාජ වංශයෙහි වංශාවලිය හා ගළපා ඇත. මේ වංශාවලිය හා බැඳීමක් රහිත ව ම, පියවරුන් හා ඔවුන් වෙනුවෙන් ඉටු කළ යුතු යාග හෝම සම්බන්ධයෙන් ලියැවුණු වත්පිළිවෙත් ගැන කොටසක් අනතුරු ව ඇතුළත් වේ.[6] ඉක්බිති චන්ද්‍ර (සෝම) දේවතාවා ගේ පුත් අත්‍රි ගෙන් ඇරඹුණු චන්ද්‍ර වංශයෙහි වංශාවලිය දැක්වෙයි. (1312 සහ ඊ ළඟ). සුප්‍රසිද්ධ **පුරූරවස්** වූ කලී සෝම ගේ මුනුබුරෙකි; **උර්වශී** සමඟ මොහු ගේ ප්‍රේම සම්බන්ධය ශතපථ බ්‍රාහ්මණයෙහි ශෛලියට බෙහෙවින් ළං වූ ශෛලියකින් විස්තර වේ.[7] පුරූරවස් ගෙන් පැවතෙන්නන් අතර නහුෂ සහ යයාති ද වෙති. යයාති ගේ පුත් **යදු** ගෙන් **යාදව** පරපුර ඇරඹෙයි; මේ වංශයට අයත් **වසුදේවයින්** ගේ පුතකු ලෙස විෂ්ණු දෙවියෝ කෘෂ්ණ වේෂයෙන් ලොව පහළ වෙති. මෙ සේ මනු ලොව උපන් කෘෂ්ණයන් ගේ වංශාවලිය ගෙන හැර දැක්වූ පසු ව මූළුමනින් ම **විෂ්ණු දෙවියන්** ගැන ලියැවුණු ශ්ලෝක මාලාවක් (2134 සහ ඊ ළඟ) දක්නට ලැබෙයි; මෙ සේ කෘෂ්ණ ගේ දිව්‍යමය ඉතිහාසය තරමක් දුරට ඇතුළත් වේ.

හරිවංශයෙහි **විෂ්ණු පර්වය**' නම් දෙ වන පර්වය කෘෂ්ණ ලෙස මිනිස් වෙසින් පහළ වූ විෂ්ණු දෙවියනට ම වැගේ වෙන් වී ඇත. මේ මිනිස් දෙවියන් ගේ, බොහෝ විට මිනිස් දුබලකම් බෙහෙවින් ම දක්වන මේ ගෝපාල-දේවතාවා ගේ උපත හා ළමා විය පිළිබඳ ව ද, වික්‍රමාන්විත ක්‍රියා හා ප්‍රේම සම්බන්ධ පිළිබඳ ව ද කථාන්තර සියල්ල මෙහි දිගින් දිගට කියැවේ; ඇතැම් පුරාණයන්හි ද මේවා දිග හෝ කෙටි විස්තර සහිත ව දක්වෙන අතර **කෘෂ්ණ** නාමය සෑම හින්දු භක්තිකයකු විසින් ම මැනැවින් දනහැඳින ගැනීමට මේ කථා ඉවහල් වී ඇත. වෛෂ්ණව භක්තිකයන් අතර ශ්‍රේෂ්ඨ බුද්ධිමතුන් භගවද්ගීතාව උගන්වන ධර්මිෂ්ඨ දර්ශනය හෙළි කළ දූතයා ලෙස කෘෂ්ණ දෙවියනට පූජා කරන නමුත් අද දක්වා ඉන්දියාව මුළුල්ලෙහි ලක්ෂ සංඛ්‍යාත හින්දු ජනකාය විසින් වරෙක උදාර දෙවියකු ලෙස වඳිනු පුදනු ලබන්නේ ද වරෙක සර්ව සම්පූර්ණ මිනිසත් බවෙහි පරමාදර්ශය ලෙස ඝණ ගායනයට ලක් කෙරෙනුයේ ද, හරි වංශයෙහිත්, පුරාණයන්හිත් වර්ණනය කැරෙන පරිදි මේ පුරාවෘත්තයන්හි දක්වෙන **කෘෂ්ණ** වෙයි. මෙගැස්තිනිස් නම් ග්‍රීක ජාතිකයා විසින් "ඉන්දිය හර්කියුලිස්" ලෙස හඳුන්වනු ලැබුයේ පාණ්ඩවයන් ගේ සටකපට මිතුරා වූ මහාභාරත යෙහි කෘෂ්ණ නොව, ඉහත සඳහන් පුරාවෘත්තයන්හි දක්වෙන දෙවියෝ ය. සාහිත්‍ය ඉතිහාසය සම්බන්ධයෙන් මෙන් ම ආගමික ඉතිහාසය සම්බන්ධයෙන් ද එහා සේ වැදගත් මේ කෘෂ්ණ පුරාවෘත්තයන් ගැන යම් අදහසක් ලබා දෙනු සඳහා හරිවංශයෙහි දෙ වන පර්වය මෙහි දී සැකෙවින් විස්තර කෙරේ.

මථුරා නුවර කංස නම් දුෂ්ට රජෙක් රජ කළේ ය. වාසුදේවයන් ගේ බිරිය වූ දේවකී නම් සිය නෑනියන්ගේ අට වන දුහුණා අතින් ඔහු මරු මුවට පත් වන බව හෘදය ඍෂිවරයා ඔහුට හෙළි කරයි. එකල්හි කංස, දේවකී ගේ දරුවන් සියලු දෙන ඝාතනය කිරීමට සන්නද්ධ වෙයි. ඔහු දැඩි මුරකාවල් යොදවා දේවකිය රැකවල් කරමින් බිළිඳුන් ස දෙනෙකු ම උපන් විගස ම මරවයි. "හලායුධය දරන රාම", "බලරාම" හෙවත් "බලදේව" ලෙස පසු කාලයෙක හැඳින්වෙන කෘෂ්ණ ගේ සොහොයුරකු වූ සත් වන පුත්‍රයා ඉපදීමට පෙර **නිද්‍රා** හෙවත් නිදි දෙව් දුව විසින් දේවකිය ගේ කුසයෙන් වාසුදේවයන් ගේ තවත් බිරියක වූ **රෝහිණිය** ගේ කුසට මාරු කිරීමෙන් ගලවා ගනු ලබයි. එ සේ වුව ද අට වන පුත්‍රයා වූ කෘෂ්ණ උපන් විගස ම ඔහු කංස හෙන් රැක ගනු සඳහා වාසුදේව විසින් ම, නන්ද නම් ගෝපාලයා හා ඔහු ගේ ඇඹෑ යශෝදා හට එ දවස ම උපන් දුවකට මාරු කරනු ලබයි. මෙ සේ යශෝදා ගේ බිළිඳු දුව කංස විසින් ප්‍රපාතයකට හෙළනු ලැබෙයි; ගෝපාලයකු ගේ පුතකු ලෙස සැලකෙන කෘෂ්ණ ගෝපාලයන් අතර ඇතිදැඩි වෙයි. රාම ද වාසුදේව විසින් රැකවරණ තකා ගෝපාලයාට භාර කරන ලදු ව මේ කුමාරවරු දෙ දෙන ගොපලු ගමෙහි ඇතිදැඩි වෙති. කිරි දරුවකු ලෙස පවා කෘෂ්ණ පුදුම හාස්කම් පායි. දිනක් යශෝදා නම් ඔහු ගේ කෑතක මව (හදාගත් මව) සැතපෙන බිළිඳා ගැලක් යට තබා ආහාර දීම පමා කළෙන් කොළුවසිලිමත් වූ බිළිඳු අතපය ගසමින් දඟලීමට පටන් ගෙන අවසානයෙහි එක පයකින් ඒ සා බර පැටවූ රථය පෙරළයි. පසු අවධියෙක කෙළිලොල් බැවින් ඇලළී ගිය කෘෂ්ණ හා රාම කුමාරවරුන් දෙ දෙන කෙත්වතු හරහා, වන පෙත සෑම තැන දුව පැන කෙළිහින් ගෝපාලයා ගේ ගැමි බිරියට දෙන වෙහෙස සුළු පටු නොවේ. එක් වතාවෙක කරකියා ගත හැකි යමක් නොදුටු ඕ කෘෂ්ණ ගේ බඳ වටා රැහැනක් බැඳ, "හැකි

නම් දුවව" යි කෝපයෙන් පවසමින් ඔහු බර ඇති වංගෙඩියකට තරයේ කැද තබන්නී ය. එහෙත් බාලයා වංගෙඩිය ඇදගෙන දුවනු පමණක් නොව, දැවැන්ත වෘක්ෂ දෙකක් අතර වංගඩිය රැඳුණු කල්හි මේ වෘක්ෂ රාජයන් ද මුලිනුදුරා ගෙන දුවයි. බෙහෙවින් තැති ගත් ගෝපාලයනට හා සුළු මවට, කිසි දු තුවාලයක් නොමැති ව ගස්වල අතු අතරෙහි සිනාසෙමින් පසු වන කුමාරයා දිස් වෙයි.

මෙ සේ සත් වසක් ඇවැමෙන් කුමරුන් දෙ දෙනට ගොපලු ගම තවත් වාසය නොරිසි වෙයි. මේ නිසා කෘෂ්ණ සිය සිරුරින් වෘකයින් සියදහස් ගණන් නිකුත් කරමින් ගොපල්ලන් කොතරම් බිය පත් කළේ ද යත් ඔහු අන් තැනක් බලා යාමට තීරණය කළේ ය. ඔහු ගව රැළ සමඟ තැන තැන ඇවිදිමින් වෘන්දා වනයට ළඟා වූ හ. කුමරු දෙ දෙන මෙහි ප්‍රීතියෙන් වනයෙහි දුව පැන ඇවිදිති. දිනක්, වරෙක ක්‍රීඩා කරමින්, වරෙක භී ගයමින්, වරෙක පත්‍රයෙන් තනා ගත් නළාවක් පිඹිමින්, වරෙක වස් දඹු නළාව පිඹිමින් යමුනා නදී තීරයෙහි හුදෙකලා ව සැරි සරන කෘෂ්ණ කාලිය නම් නාග රාජයා තම පිරිවර සමඟ යමුනා නදියෙහි දිය විෂ කරමින් හාත්පස පෙදෙස් බිය පත් කරමින් වාසය කරන ගැඹුරු විල කරා පැමිණෙයි. ක්ෂණික විනිශ්චයකට එළඹෙන කෘෂ්ණ බියකරු නා රජ අබිබවනු පිණිස විලට පනියි. සැණෙකින් පඤ්ච ශීර්ෂයකින් හෙබි නා රජ ගිනි දැල් නිකුත් කරමින් එයි; දහස් ගණනක් නාගයෝ ද වීර කුමරා රෞද්‍ර ලෙස වට ලාගෙන පහර දෙමින් දෂ්ට කරති. එහෙත් කුමරා වහා නැඟි සිටිමින් නා රජු ගේ ශීර්ෂ පොළොවට තද කර ගෙන මැද පිහිටි හිසට වේගයෙන් පනියි. ඒ කල්හි නා රජ පරාජය පිළිගෙන පිරිවර සමඟ විලෙහි කිමිදෙයි.

නොබෝ කලෙකින් ම හෙතෙම, ගද්‍රභයකු ගේ වේෂයෙන් ගෝවර්ධන පර්වතය රැකවල් කරන ධෙනුක නම් රකුසා ගේ දිවි තොර කරයි. තවත් බිහිසුණු රකුසකු වූ ප්‍රලම්බ නම් යෝධයා කෘෂ්ණ හා සටනට නොඑළඹෙන නමුත් කෘෂ්ණ ගේ සොහොයුරු රාම විසින් මරනු ලබයි.

ශරත් සෘතුවෙහි ගොපලු ජනයා ගොපලු සිරිත අනුව ඉන්ද්‍ර නම් වස්ස වලාහක දෙවි සනට පූජා වශයෙන් විශාල උත්සවයක් පැවැත්වීමට සූදානම් වෙති. කෘෂ්ණ මේ ඉන්ද්‍ර පූජාවට තරයේ විරුද්ධ වෙයි. "අපි වන පෙත සිසාරා සැරිසරමින්, ගව රැළ එක ම සම්පත කොට ගත්තෝ වෙමු; අපේ දෙවියෝ නම් ගවයන් සහ කඳු ගැට සහ වන පෙතයි" (3808). මෙ බඳු වදනින් හෙතෙම ඉන්ද්‍රෝත්සවය වෙනුවට පර්වත-යාගයක් පැවත්වීමට ගොපල්ලන් පොළඹවයි. ගොපල්ලෝ ද මෙ සේ කරති. මින් අධික කෝපයට පත් ඉන්ද්‍ර චණ්ඩ කුණාටුවක් මවයි. එහෙත් කෘෂ්ණ ගෝවර්ධන පර්වතය ඔසවා ගොපල්ලන් හා ගව රංචු මුවා කරමින් එය ඡත්‍රයක් මෙන් අල්ලා සිටින බැවින් ඔහු සියලු දෙන වැස්සට නො තෙමෙති. සත් දිනක් ගෙවී ගිය තැන වැසි කුණාටු අවසන් වී පර්වතය තුබූ පරිදි කෘෂ්ණ තැබූ පසු ව ඔද බිඳුණු ඉන්ද්‍ර, ශ්‍රේෂ්ඨ විෂ්ණු දෙවියා ලෙස කෘෂ්ණ පිළිගනියි.

ඒ කල්හි ගොපල්ලන් දෙවියකු ලෙස ඔහුට වැඳුම්පිදුම් කරන නමුත් තමා ඔවුන් ගේ නායකු ලෙස සලකනු ලැබීමට කැමති බව හෙතෙම මදහස පාමින් පවසයි; සිය සත්‍ය ස්වරූපය හඳුනා ගන්නා වකවානුවක් පසු ව පැමිණෙනු ඇතැයි ද පවසයි. මෙ සේ ගොපලු ජනයා අතර ගොපලු දරුවකු ලෙස හෙතෙම යෙවුන් වියෙහි ප්‍රීතියෙන් වාසය කරයි. ඉතාමත් ශක්ති සම්පන්න ගොපල්ලන් සමඟ හෙතෙමේ ගව පොර හා තරඟ සංවිධානය කරයි. එහෙත් ශරත් සමයෙහි ප්‍රියකරු නිශා භාගයෙහි සුරුපි ගෝපින් රඟ දක්වූ ලාස ලීලාවනට[10] සහභාගි වී නැවීම ඔහුට බෙහෙවින් ප්‍රිය විය; මේ මානවකයා ගේ විලාශයෙන් වශී වූ ගෝපී යුවතියෝ, ඔහු ගේ වීර ක්‍රියා ගැන ගී බඳිමින්, විහිළු තහළු කරමින් ඔහු ගේ ලීලාවත්, නුරා බැල්මත්, ගමන් විලාසයත්, නැටුම් ගැයුමුත් අනුකරණය කරමින් සඳ පහන් රැයෙහි රඟ දෙති.

දිනෙක ගෝපින් හා විනෝදයෙන් කෘෂ්ණ පසු වන අතර වෘෂභ වේශයෙන් පෙනී සිටි අරිෂ්ට නම් රකුසෙක් පහළ වෙයි. කෘෂ්ණ උගේ අඟක් උගුලා ගෙන එයින් ම ඇත උඹ මරා දමයි.

කෘෂ්ණ ගේ වීර ක්‍රියාවන්ගි කීර්ති රාවය කංස ගේ ශවනත වැකීමෙන් හෙතෙම මහත් බියට පත් කෘෂ්ණ මරණයට පත් කරවනු පිණිස හෙතෙම වීර මානවකයන් දෙ දෙනා මථුරා නුවරට කැඳවා ගෙන, උත්සවයක දී තම මල්ලව ශූරයන් සමඟ පොර බැඳීමට කටයුතු සම්පාදනය කරවයි. එහෙත් කෘෂ්ණ නුවරට සම්ප්‍රාප්ත වූ වහා ම නොයෙක් පෙළහර හා බලවිකුම් දක්වයි. මෙ සේ හෙතෙම දෙවියනට පවා නැඟිය නොහැකි රජ තුමා ගේ ශෝධ දුන්න කොතරම් බාහු බලයකින් නහන්නේ ද යත් බිගිසුණු ගඩක් නංවමින් එය දෙ කඩ වෙයි. කංස විසින් මානවකයන් දෙ දෙනා ලුහුබඳින ලෙස එවන ලද ඇතකුගේ දළය උගුළුවා ගත් කෘෂ්ණ ඉන් ඇන ඌ මරයි. කංස විසින් ඔවුන් ඉදිරියට පමුණුවන ලද බලසම්පන්න මල්ලව ශූරයෝ දෙ දෙනා ද ඔවුන් අතින් මැරුම් කති. එ කල්හි කෝපයෙන් ඇළුණු ගොපලු මානවකයන් ඇතුළු ගොපල්ලන් සියලු දෙන තම රාජ්‍යයෙන් නෙරපිය යුතු යයි විධාන කරයි. මෙ විට සිංහයකු මෙන් කය දවත කඹා පනින කෘෂ්ණ ඔහු ගේ කෙස් වැටියෙන් ගෙන පොර පිටිය මැදට ඇද ගෙන අවුත් ඔහු ගේ දිවි තොර කරයි.

නොබෝ කලෙකින් දෙ බෑයේ උදේනී නුවර වාසය කළ සුප්‍රසිද්ධ දිසාපාමොක් ආචාරි කෙනකු ගෙන් ධනුශ්ශිල්පය උගැනුම පිණිස යති. මේ ආචාරින් ගේ පුතකු මහ සයුරෙහි විනාශයට පත් ව ඇති හෙයින් ගුරු පඬුරු වශයෙන් කෘෂ්ණ විසින් මේ පුත්‍රයා ආපසු ගෙන දිය යුතු යයි ඔහු කියා සිටිති. එ කල්හි කෘෂ්ණ යම ලොවට බැස, යම රජු ඊරාජය කොට දරුවා නැවත පියා වෙත පමුණුවයි.

කංස ගේ මරණය සම්බන්ධයෙන් පළි ගනු වස් ඔහු ගේ මසිලණු ජරාසන්ධ, මිතුරු රජ වරුන් රාශියක් කැටි ව යාදවයනට එරෙහි ව සටනට ගොස්, මථුරා නුවර වට ලන නමුත් කෘෂ්ණ විසින් නැවත නැවතත් පසුබස්වනු ලබයි. එහෙත් නැවත නැවතත් පහර දෙන ඔහුට අවසානයෙහි පලා යාමට සිදු වෙයි. ජරාසන්ධ සමඟ කරන ලද මේ සටන් කථාන්තර මාලාවකින් වර්ණනය කැරෙයි.

මේ අයුරින් රුක්මිණී පැහැර ගෙන යාම පිළිබඳ මතු දැක්වෙන කථාන්තරය ද දිගින් දිගට කියැවෙයි. විදර්භයෙහි භීෂ්මක රජු රුක්මිණී නම් සිය කුමරිය ශිශුපාල රජු හට සරණ පාවා දීමට එකඟ ව මංගල්‍යෝත්වය සිදු කිරීමට ආසන්න ය. එ කල්හි කෘෂ්ණ සිය සොහොයුරු රාම කැටි ව සංග්‍රහයට අවුත් මනාලිය පැහැර ගෙන යයි. බෙහෙවින් කෝපයට පත් රාජ කුමාරවරු ඔහු ලුහුබඳින නමුත් රාම විසින් පසුබස්වනු ලබති. සොරා ගත් කුමරිය ගේ සොහොයුරු රුක්මින්, කෘෂ්ණ ගේ දිවි තොර කොට සිය සොහොයුරිය සමඟ පෙරළා සිය රාජධානියට පැමිණිය හොත් විනා ආපසු නොපැමිණීමට දිවුරයි. අනතුරු ව ඇති වන බිගිසුණු යටනින් රුක්මින් පරදියි; එහෙත් රුක්මිණිය ගේ ආයාචනයෙන් කෘෂ්ණ ඔහුට අභය දානය කරයි. රුක්මින් සිය දිවුරුම කඩ නොකරනු වස් තමාට ම නව නගරයක් ගොඩ නඟා ගනියි. ද්වාරකා නුවර කෘෂ්ණ හා රුක්මිණී හා අතර විවාහය සිදු වෙයි. ඔහුට දා ව ඇයට පුත්තු දස දෙනෙක් උපදිති. පසු ව හෙතෙම බිසෝවරුන් සත් දෙනකු හා සොළොස් දහසක් වෙනත් කාන්තාවන් ද සරණ පාවා ගෙන දස දහසක් පුතුන් ලබයි. කෘෂ්ණ හා රුක්මිණී යන දෙ දෙනා ගේ පුතකු වූ ප්‍රද්මුන [12] පසු කල රුක්මින් ගේ දුවක සරණ පාවා ගනී; ඔවුන් ගේ අනිරුද්ධ රුක්මින් ගේ මිනිබිරියක සමඟ විවාහ වෙයි. අනිරුද්ධ ගේ විවාහෝත්සවයෙහි දී රාම සහ රුක්මින් ද අතර වූ කෙළියෙහි දී හට ගත් දබරයක් නිසා රුක්මින් රාම අතින් මැරුම් කයි. මීට සම්බන්ධ කොට රාම ගේ වීර ක්‍රියා වර්ණනයට ලක් වෙයි.[13]

මින් පසු ව නරක මැරීම පිළිබඳ කතා පුවතක් දැක්වෙයි. මේ නරක වූ කලි අදිනිය ගේ කුණ්ඩලාහරණ සොරා ගෙන, වෙනත් අන්දමින් ද සුරයනට මහත් පීඩා පැමිණවූ රාක්ෂසයෙකි. ඉන්ද්‍ර ගේ ඉල්ලීම ඉටු කරමින් ඔහුට විරුද්ධ ව සටන ළඟෙන කෘෂ්ණ ඔහු මරයි.

ඊ ළඟ කථාන්තරයෙහි[15] ඉන්ද්‍ර සමඟ සටනට බට කෘෂ්ණ අපට හමු වෙයි. වරක් නාරද ඍෂි **පාරිජාත** නම් දිව්‍ය වෘක්ෂයෙන් කෘෂ්ණ හට ගෙනවුත් දුන් පුෂ්පයක් සිය ප්‍රියදර රුක්මිණියට දෙයි. එ කල්හි **සත්‍යභාමා** නම් ඔහු ගේ තවත් බිරියක ඉමහත් ඊර්ෂ්‍යාවෙන් තැවෙන්නට වූයෙන් පාරිජාත වෘක්ෂය ම දෙව් ලොවින් ගෙනවුත් ඕ හට දීමට කෘෂ්ණ පොරොන්දු වෙයි. එහෙත් ඉන්ද්‍ර සිය කැමැත්තෙන් ම වෘක්ෂය දීමට එකඟ නොවන බැවින් කෘෂ්ණ ඔහු සටනට කැඳවයි. මේ හේතුවෙන් මේ දෙවිවරුන් දෙ දෙනා අතර හට ගත් දිගු කල් පැවැති, බිහිසුණු සටන සුරයන් ගේ මව වූ අදිති විසින් සාමකාමී අවසානය කට පත් කරනු ලැබේ.

ඉන් පසු ව මේ දිර්ඝ කොටසට එ තරම් ළඟින් සම්බන්ධ නොවූ ද, ඇත්ත වශයෙන් ම කාම ශාස්ත්‍රයට ඇතුළත් වූ ද බොහෝ දුරට පෘථුල උපදේශාත්මක කොටසක්[16] දැක්වෙයි. මෙය වූ කලි (කෘෂ්ණ ගේ භාර්යාවන් හා ශිව දෙවියන් ගේ බිරිය වූ උමාව ගුරු කොට ගත් බැවි පවසන නාරද පඬි ද හා අතර සංවාදයක් ලෙස ඉදිරිපත් කැරෙන **පුණ්‍යාහ** හා **වත්‍රක** පිළිබඳ අනුශාසනයෙකි; එ නම්, භාර්යාව විසින් සිය සිරුර සැමියා හට ප්‍රියමනාප වන පරිදි සකස් කර ගැනීමත් ඔහු ගේ අනුග්‍රහය නිසැක ව ම දිනා ගැනීමට උපකාරී වන චාරිත්‍ර විධි, උත්සව හා ව්‍රත පැවැත්වීමත් පිළිබඳ ව ය. එහෙත් මේ චාරිත්‍ර විධි ඵලදායී වනුයේ පතිවත රකින භාර්යාවන් සම්බන්ධයෙන් පමණක් හෙයින් භාර්යා ධර්ම ගැන අවවාද කිහිපයක් (7754 සහ ඊ ළඟ ශ්ලෝක) ආරම්භයෙහි ම දැක්වේ.

ඊ ළඟ අධ්‍යායය[17] නැවත වරක් කෘෂ්ණ රුක්ෂසයන් සමඟ කරන්නට යෙදුණු සටන් වර්ණනා කරයි. **ශෝණිපුර** (“සය පුරයෙහි”) අසුරයෝ ධාර්මික **බ්‍රහ්මදත්ත** රජු ගේ දියණියන් සොරා ගනිති. ඔහුට පිහිට වන කෘෂ්ණ **නිකුම්භ** නම් අසුර රාජයා මරු මුව පත් කොට බමුණාට ඔහු ගේ දියණියන් නැවත ලබා දෙයි.

අනතුරු ව කෘෂ්ණ සමඟ කිසි සම්බන්ධයක් නොමැති, මුළුමනින් ම ශෛව **භක්තික** කොටසක්[18] එයි; **අන්ධක** නම් සහස් ඝිසෙකින් හෙබි රකුසා ශිව දෙවියන් විසින් මරනු ලබන අන්දම මෙහි විස්තර වෙයි.

නැවත කෘෂ්ණ ගැන ම වර්ණනා කරන ඊ ළඟ අධ්‍යායය[19] නිකුම්භ අසුරයා මැරීම පිළිබඳ තවත් කථාන්තරයක් දක්වයි. කෘෂ්ණ හා රාම පිරිවර කොට ගත් යාදවයෝ ප්‍රීති ප්‍රමෝදයෙන් යුක්ත ව, උදැර උත්සවයක් පවත්වනු පිණිස සමුද්‍ර තීරයෙහි තීර්ථස්ථාන යකට ගමන් ගනිති. සොළොස් දහසක් බිරියන් පිරිවැරූ කෘෂ්ණ ද, **රේවතී** නම් එක ම බිරිය සමඟ රාම ද, දහස් ගණන් අබිසරු ලියන් සමඟ යාදව මානවකයෝ ද කෙළි සෙල්ලම් කරමින්, නැටුම් ගැයුම්හි යෙදෙමින්, කෑමින් බොමින්, ජලයෙහි ද, සමුද්‍ර තීර යෙහි ද නානා විනෝද ක්‍රීඩාවන්හි යෙදෙමින් ප්‍රීති වෙති.[20] මේ සැණකෙළි පවත්නා අතර තුර නිකුම්භ නම් රකුසා **භානු** නම් යාදවයා ගේ දුවක වූ **භානුමතී** පැහැර ගෙන යයි. කෘෂ්ණ ගේ පුත් ප්‍රද්‍යුම්න අසුරයා ලුහුබැඳ ගොස් පැහැර ගත් යුවතිය රැගෙන එන අතර කෘෂ්ණ නිකුම්භ මරා දමයි.

ඊ ළඟ අධ්‍යායයන්[21] කෘෂ්ණ ගේ දුවන් ප්‍රද්‍යුම්නයනට මුළුමනින් ම වාගේ කැප වී ඇත. පළමු ප්‍රද්‍යුම්න හා වජ්‍රනාභ නම් අසුරයා ගේ දූ වූ **ප්‍රභාවතී** ද අතර විවාහය විස්තර වෙයි; නල කාව්‍යයෙහි නල දමයන්ති අතර ප්‍රේමය ප්‍රකාශ කරන දූතයන් ලෙස රණ හංසයන් ක්‍රියා කරන පරිද්දෙන් මෙහි දී ද දිව්‍ය රණ හංසයෝ ප්‍රේම සම්බන්ධය ඇති කිරීමෙහි ලා පිහිට වෙති. ප්‍රභාවතිය දිනා ගනු වස් නළුවකු ලෙස වෙස් වලා පත් ප්‍රද්‍යුම්න නළු පිරිසක් සමඟ වජ්‍රනාභ ගේ රාජ සභාවට පැමිණෙයි. එහි දී දැක්වෙන නා නා කෙළිනළු අසුරයන් ගේ සිත් තදින් ඇද ගනී. එහෙත් සෞන්දර්යවත් නිශා භාගයෙහි ප්‍රද්‍යුම්න ප්‍රභාවතිය සමඟ රහසින් රමණය කරයි. අවසානයෙහි වජ්‍රනාභ හට මේ ප්‍රේම සම්බන්ධය ගැන දැන ගන්නට ලැබී මහත් කෝපයෙන් ප්‍රද්‍යුම්න සිර අඩස්සියේ තැබීමට විධාන යොදයි. එහෙත් ප්‍රද්‍යුම්න තමා වෙත දුව ගෙන එන යෝධයන් මෙන් ම අසුර රාජයා ද මරා දමයි; ඉක්බිති සිය ප්‍රියාදරිය කැටුව ද්වාරකා නුවරට යයි.

දෙ වන කථාන්තරය[23] ප්‍රද්‍යුම්න ගේ යෙවුන් වියෙහි ප්‍රේම සම්බන්ධ ගැන විස්තර කරයි. ඔහු ගේ උත්පත්තියෙන් සත් දිනකට පසු ව අසුරයන් විසින් සොයා ගනු ලැබ ශම්බර නම් රකුසා ගේ විමානයෙහි ඇති දැඩි වන අන්දමත්, ශම්බර ගේ භිරිය වූ මායාවතී රූ සපුවෙන් හෙබි මානවකයා කෙරෙහි ප්‍රේමයෙන් වෙළී ඔහු ඇගේ පුත්‍රයා නො ව, කෘෂ්ණ හා රුක්මිණී ගේ ද පුත්‍රයා බව හෙළි කරන අන්දමත්, බිහිසුණු සටනකින්[24] පසු ප්‍රද්‍යුම්න අතින් ශම්බර මැරුම් කන අන්දමත්, අවසානයෙහි මායාවතී හා මඟ සිය මව් හිමිට පැමිණ දෙ මාපියන් විසින් ප්‍රීතියෙන් පිළිගනු ලබන අන්දමත් යන සියල්ල විස්තර වෙයි.

දෙවිවරුන් ගේ නාම මාලාවෙකින් තැනුණු ස්තෝත්‍රයක් වූ දිනපතා කියනු ලබන රාම ස්තෝත්‍රය[25] කිසි ම හේතුවක් නොමැති ව මෙ තන්හි ඇතුළත් කොට ඇත.

විඩාත් සංක්ෂිප්ත රචනා—කෘෂ්ණ කෙරෙහි ප්‍රශංසාමුඛයෙන් රචිත පුරාවෘත්ත හා දෙසුම් කිහිපයකට ද පසු ව, "**බාණ යුද්ධය**[26]" පිළිබඳ කතා පුවතින් සහ ප්‍රද්‍යුම්න ගේ පුත් අනිරුද්ධ හා බාණ නම් අසුර රජු ගේ දූ ඌෂා අතර ප්‍රේම සම්බන්ධයෙන් මේ ග්‍රන්ථය අවසන් වෙයි. බාණ රජ ශිව දෙවියන් හට ප්‍රියතම වෙයි. බාණ විසින් බලවත් පීඩාවට භාජන කරනු ලැබූ අනිරුද්ධ හට ආධාර පිණිස කෘෂ්ණ පැමිණෙයි; බාණ සමඟ ඇති වුණු සටනින් ශිව සහ විෂ්ණු දෙවිවරුන් අතර බිහිසුණු යුද්ධයකට මඟ පාදී, ඉන් මුළු ලොව ම ඉතා අවදානම් තත්ත්වයකට වැටෙයි. එහෙත් ලොවට පිහිට වෙමින් පැමිණි මහා බ්‍රහ්මයා ශිව, විෂ්ණු දෙ දෙනා එක ම අයකු බව පෙන්වා දීමෙන් දෙවිවරුන් දෙ දෙනා අතර සාමය ඇති කරයි. මේ දෙවිවරුන් දෙ දෙනා එක් අයකු ලෙස සලකමින් වර්ණනා කරන ස්තෝත්‍රයක් මෙහි දී දැකගත හැකි ය.[27] **ද්වාරවතී** නුවර මහත් උත්සව ශ්‍රීයෙන් පවත්වනු ලබන අනිරුද්ධ ගේත් ඌෂා ගේත් මංගල්‍යෝත්සවයෙන් ග්‍රන්ථය අවසන් වෙයි.

මෙහි විෂ්ණු ශිව ස්තෝත්‍රය ආදිය වැනි ස්තෝත්‍ර සංකලනය වීමෙන්, හරිවංශය වීර කාව්‍යයකට වඩා කොතෙක් දුරට **ආගමික කටයුතු** සඳහා පාඨ සංග්‍රහයක් බවට පත් ව ඇති ද යනු විශේෂයෙන් පෙනෙයි.[28]

එහෙත්, යම් කිසි වකවානුවක සැබැවින් ම පවතින්නට ඇති **කෘෂ්ණ මහා** කාව්‍යයකින් ශේෂ වූ පුවත් II වන පර්වයෙහි දක්නට ලැබෙන නමුත් භවිෂ්‍යපර්වය නම් III වන පර්වය (11063 සහ ඊ ළඟ) වූ කලි වැඩි සම්බන්ධයකින් තොර පුරාණ කෘති සංග්‍රහයෙකි. භවිෂ්‍යපර්වය, එ නම් "අනාගත පර්වය" නම් මාතෘකාව, ලෝකයෙහි අනාගත කල්ප සම්බන්ධයෙන් අනාවැකි අන්තර්ගත වූ ප්‍රථම අධ්‍යායවලට පමණක් අදාළ වෙයි. මෙහි දී ජනමේජය පැවැත්වීමට අදහස් කළ අශ්වමේධයක් පිළිබඳ කථාවක් කියැවේ. එහෙත්, දෙවියන් රහිත **කලියුගය** එළඹෙන බවත්, සිල්වත්, ධාර්මික යුගයක් වූ කෘත යුගය එළඹෙනුයේ ඉන් දිගු කල් ඉකුත් වූ පසු බවත්, මේ හේතුවෙන් අශ්වමේධය සාර්ථක නොවන බවත් පවසමින් ව්‍යාස අනාවැකියක් පළ කරයි. සර්ව සම්පූර්ණ ඒකකයක් සාදන මේ කොටස්[29] ස්වාධීන කාව්‍යයක් ලෙස පවා සැලකේ. මින් පසු ව කිසි ම සම්බන්ධයක් නොමැති ව, ලොව මැවීම පිළිබඳ කථාන්තර දෙකක් දක්වේ.[30] තුන් වන අධ්‍යායයකින් විෂ්ණු ගේ ඌරු අවතාරය ගැනත් වාමන අවතාරය ගැනත් විස්තර සහිත ව සලකා බැලෙයි.[31] දෙ වන පර්වයෙහි අවසාන අධ්‍යායය මෙන් විෂ්ණු-ශිව පූජාව සංයෝග කිරීමට

තුඹු දෙන බවක් දක්වන අධ්‍යායයක් ඉන් පසු ව දැක්වෙයි. විෂ්ණු, ශිව දෙවියනට ස්තෝත්‍රයක් ද, ශිව, විෂ්ණු දෙවියනට ස්තෝත්‍රයක් ද, මාරු වෙන් මාරුවට ගායනා කරති.[32] ඊළඟ කොටස නැවත වරක් කෘෂ්ණ ගේ වීර ක්‍රියාවක් ගැන, එ නම් ඔහුට විරුද්ධ ව නැඟී සිටින පාණ්ඩු රජු මැරීම ගැන විස්තර කරයි.[33] හරිවංශයෙහි අවසාන දීර්ඝ අධ්‍යාය නම් කෘෂ්ණ-විෂ්ණු විසින් නින්දාවට පත් කරනු ලැබූ හංස හා ඩිම්බක නම් ශිව භක්තිකයන් දෙ දෙන පිළිබඳ උපාඛ්‍යානයයි.[34]

තවත් දීර්ඝ අධ්‍යායයක් ද මීට උපග්‍රන්ථයක් වශයෙන් එක් කොට ඇත. මහාභාරතය කියැවීමෙන් සිදු වන පිනත්, එය කියවන තැනැත්තා හට ලැබෙන දිව්‍ය සම්පත්තියත් විචිත්‍රාකාරයෙන් විස්තර කැරෙන මෙහි, එය කියවන්නන් හට (වාචක) පර්වයක් පර්වයක් අවසානයෙහි දිය යුතු පඬුරු ද නියම කරමින් සියලු ශාස්ත්‍ර අතුරෙන් අති ශුද්ධ, අති පූජනීය ශාස්ත්‍රය ලෙස මහාභාරතය වර්ණනය කරමින් ගැයෙන ස්තුති ගීතයක් අවසානයෙහි වෙයි.[35] එහෙත් අන් සියල්ල අභිභවනය කරමින්, මේ කෘතිය විෂ්ණු දෙවියන් ගේ තේජෝබලපරාක්‍රමය වර්ණනා කරනු වස් ලියැවුණු බව ආඩම්බරයෙන් සඳහන් කැරෙයි. "වීර භාරත පුත්‍රය, වේදයන්හි ද, රාමායණයෙහි ද, ශුද්ධ භාරතයෙහි ද, සැම පිටුවකින් ම, ආරම්භයෙහිත්, අවසානයෙහිත්, මධ්‍යයෙහිත් හරි දෙවියෝ පූජා කරනු ලබති."[36]

එහෙත් මේ සේ විෂ්ණු දෙවියන් බෙහෙවින් වර්ණනය කිරීමෙන් පසු ව, ග්‍රන්ථය ද ඇත්ත වශයෙන් සමාප්ත වූ පසු ව, ශිව දෙවියනට සිය සුපුරුදු ස්ථානය ලැබෙන තවත් අධ්‍යායයක් එයි. ශිව දෙවියෝ යක්ෂයන් ගේ තුන් විමාන (ත්‍රිපුර) විනාශ කළ අයුරු මෙහි විස්තර වෙයි. එහෙත් "මහා යෝගී" විෂ්ණු ගේ ගුණ ගායනා කරන අවසාන ශ්ලෝකයක් මෙහි ද දැක්වේ. අවසානයෙහි, හරිවංශයට විෂය වූ කරුණුවල සාරාංශයකින් හා මේ පුරාණය" කියවනු ඇසීමෙන් අත් වන පින ගැන විස්තරයෙකින් ද ග්‍රන්ථය සමාප්ත වේ.

හරිවංශය මුළුමනින් ම සැබෑ පුරාණයක් ම බව ඉතා ම වැදගත් පුරාණයන් කිහිපයක ම දක්නට ලැබෙන බොහෝ විට පද පිළිවෙළින් ද සමාන මේද රැසකින් ද පෙනෙයි. එතෙකුදු වුවත්, මේ කෘතිය මහාභාරතයට ඇතුළත් වූවකැයි ඉන්දියයන් සලකන බැවින් පමණක් නොව මේ ඛිලය හා එය වංශ කථාවට ඇඳුණු ආකාරය ද මහාභාරතයෙහි ම ඉතිහාසය අනාවරණය කිරීමෙහි ලා අපූර්වාකාරයෙන් ඉවහල් වන බැවින්, පසු අවස්ථාවක පුරාණයන් පිළිබඳ පරිච්ඡේදයෙහි පමණක් නොව මෙහි දී ද හරිවංශය ගැන සලකා බැලීම් අවශ්‍ය විය. දැන් අපි මෙහි ඉතිහාසය සලකා බලමු.

පාණ්ඩවයනට උසස් තැනක් ද, කෞරවයනට පහත් තැනක් ද ලැබෙන පරිදි කරන ලද වෙනස්කම් මේ සූතයන් අතින් සිදු කැරෙන්නට ඇත. අප අතට පත් මහාභාරතයේ, වීර කාව්‍යයෙහි කේන්ද්‍රය, එ නම්, මහා සංග්‍රාමය පිළිබඳ වර්ණනය ධෘතරාෂ්ට්‍රයන් ගේ රියැදුරු සඤ්ජය ගේ මුවට නඟනු ලබයි; එ නම් **කෞරවයන් ගේ** සූතයා ගේ මුවට නඟනු ලබයි. කෞරවයනට ඉතා ම උසස් ස්ථානයක් ලැබෙන්නේ ද මේ යුද්ධය පිළිබඳ වර්ණනයන්හි දී ම ය. අනෙක් අතට, 1 වන පර්වයෙහි සඳහන් ප්‍රධාන කථා සැකිල්ල අනුව සමස්ත මහාභාරතය ම කියවනු ලබන්නේ ජනමේජය ගේ නාග යාගයෙහි දී ව්‍යාස ගේ ශිෂ්‍ය වෛශම්පායන විසිනි. එහෙත් මේ ජනමේජය වූ කලි අර්ජුන නම් **පාණ්ඩවයා ගේ** පරපුරින් පැවතෙන්නෙකි; සමස්තයක් වශයෙන් ගත් කල මහාභාරතයෙහි කෞරවයනට වඩා උසස් තැනක් පාණ්ඩවයනට ලැබීම ද මීට අනුකූල වෙයි.[3]

කෘෂ්ණ පිළිබඳ ව ඔහු ගේ පරපුර වූ යාදව වංශය ග්‍රාම්‍ය ගතිපැවතුම් දක්වන ගොපලු වංශයක් ලෙස මහාභාරතයෙහි කිහිප තැනෙක ම විස්තර වේ; තෙමේ ද සතුරු වීරයන් විසින් නැවත නැවතත් "ගොපල්ලා", "දාසයා" ආදි වශයෙන් අවමානයට පත් කරනු ලබයි. පුරාණ වීර කාව්‍යයෙහි ඔහු හුදෙක් මේ ගොපලු ගෝත්‍රයෙහි බලසම්පන්න නායකයකු වූ බවත්, දිව්‍ය ස්වරූපයක් කොහෙත් ම නොවූ බවත් නියත ය. හරිවංශයෙහි කෘෂ්ණ පිළිබඳ පුරාවෘත්තයන් ගේ මුවාවෙන් වුව ද කෘෂ්ණ දෙවියකු නො ව, ගැමි ගොපලු ගෝත්‍රයෙක වීරයා වූ බව පළ කරන වඩා පැරණි පුරාවෘත්තවලින් තැනුණු පදනමක් වූ නිසා පෙනේ. පාණ්ඩවයන් ගේ හිතමිතුරු අනුශාසකයා වූ කෘෂ්ණ ද, භගවද්ගීතා දර්ශනය හෙළි කළ දූතයා වූ **කෘෂ්ණ** ද වීර මානවකයා හා යක්ෂ-ඝාතකයා වූ **කෘෂ්ණ** ද, ගෝපීන් ගේ ප්‍රියතම පෙම්වතා වූ **කෘෂ්ණ** ද අවසානයෙහි අතිපූජනීය විෂ්ණු දෙවියන් ගේ අවතාරය වූ **කෘෂ්ණ** ද යන මේ පුද්ගලයන් සියලු දෙන එක ම තැනැත්තා විය හැකි යයි විශ්වාස කිරීම උගහට ය. පාරම්පර්යයෙහි පැවත ආ කෘෂ්ණයන් දෙ දෙනකු හෝ වැඩි ගණනක් හෝ වූ බවත්, පසු වකවානුවෙක මේ සියලු දෙන එක දෙවියකු ලෙස සංකලනය වූ බවත් වඩාත් විශ්වසනීය ය. දේවකී ගේ පුත් කෘෂ්ණ **ඝෝර ආඞ්ගිරස** ගේ ශිෂ්‍යයකු ලෙස **ඡාන්දෝග්‍ය උපනිෂදයෙහි** (III. 17) සඳහන් වෙයි; ඔහු දේශනා කරන ධර්මය යටත් පිරිසෙයින් කරුණු කිහිපයෙකින් භගවද්ගීතාවෙහි ධර්මයට සමාන වෙයි. මේ හේතුවෙන් උපනිෂද් අවධියට අයත් මේ පුරාණ ඍෂිවරයා භගවද්ගීතාවෙහි කෘෂ්ණ ගෙන් වෙන් කළ නොහැකි තරම් ය.[4] මේ කෘෂ්ණ භාගවත භක්තියෙහි ආදි කර්තෘ වන්නට පුළුවන; ඉන්දියාවෙහි ආගම් කර්තෘවන් බොහෝ දෙනකු මෙන් මොහු ද ඔහු ගේ අනුගාමිකයන් විසින් පූජා කරන ලද දෙවියන් ගේ අවතාරයක් බවට කරන ලදැයි ද සිතිය හැකි ය.[5] එ පමණක් නො ව, මුල් වීර කාව්‍යයෙහි කෘෂ්ණ කොහෙත් ම දක්නට නොලැබුණු

පාණ්ඩවයනට උසස් තැනක් ද, කෞරවයනට පහත් තැනක් ද ලැබෙන පරිදි කරන ලද වෙනස්කම් මේ සූතයන් අතින් සිදු කැරෙන්නට ඇත. අප අතට පත් මහාභාරතයේ, වීර කාව්‍යයෙහි කේන්ද්‍රය, එ නම්, මහා සංග්‍රාමය පිළිබඳ වර්ණනය ධෘතරාෂ්ට්‍රයන් ගේ රියැදුරු සඤ්ජය ගේ මුවට නඟනු ලබයි; එ නම් කෞරවයන් ගේ සූතයා ගේ මුවට නඟනු ලබයි. කෞරවයනට ඉතා ම උසස් ස්ථානයක් ලැබෙන්නේ ද මේ යුද්ධය පිළිබඳ වර්ණනයන්හි දී ම ය. අනෙක් අතට, 1 වන පර්වයෙහි සඳහන් ප්‍රධාන කථා සැකිල්ල අනුව සමස්ත මහාභාරතය ම කියවනු ලබන්නේ ජනමේජය ගේ නාග යාගයෙහි දී ව්‍යාස ගේ ශිෂ්‍ය වෛශම්පායන විසිනි. එහෙත් මේ ජනමේජය වූ කලි අර්ජුන නම් පාණ්ඩවයා ගේ පරපුරින් පැවතෙන්නෙකි; සමස්තයක් වශයෙන් ගත් කල මහාභාරතයෙහි කෞරවයනට වඩා උසස් තැනක් පාණ්ඩවයනට ලැබීම ද මීට අනුකූල වෙයි.[3]

කෘෂ්ණ පිළිබඳ ව ඔහු ගේ පරපුර වූ යාදව වංශය ග්‍රාම්‍ය ගතිපැවතුම් දක්වන ගොපලු වංශයක් ලෙස මහාභාරතයෙහි කිහිප තැනෙක ම විස්තර වේ; තෙමේ ද සතුරු වීරයන් විසින් නැවත නැවතත් "ගොපල්ලා", "දාසයා" ආදි වශයෙන් අවමානයට පත් කරනු ලබයි. පුරාණ වීර කාව්‍යයෙහි ඔහු හුදෙක් මේ ගොපලු ගෝත්‍රයෙහි බලසම්පන්න නායකයකු වූ බවත්, දිව්‍ය ස්වරූපයක් කොහෙත් ම නොවූ බවත් නියත ය. හරිවංශයෙහි කෘෂ්ණ පිළිබඳ පුරාවෘත්තයන් ගේ මුවාවෙන් වුව ද කෘෂ්ණ දෙවියකු නොව, ගැමි ගොපලු ගෝත්‍රයෙක වීරයා වූ බව පළ කරන වඩා පැරණි පුරාවෘත්තවලින් තැනුණු පදනමක් වූ නිසා පෙනේ. පාණ්ඩවයන් ගේ හිතමිතුරු අනුශාසකයා වූ කෘෂ්ණ ද, භගවද්ගීතා දර්ශනය හෙළි කළ දූතයා වූ කෘෂ්ණ ද වීර මානවකයා හා යක්ෂ-ඝාතකයා වූ කෘෂ්ණ ද, ගෝපීන් ගේ ප්‍රියතම පෙම්වතා වූ කෘෂ්ණ ද අවසානයෙහි අතිපූජනීය විෂ්ණු දෙවියන් ගේ අවතාරය වූ කෘෂ්ණ ද යන මේ පුද්ගලයන් සියලු දෙන එක ම තැනැත්තා විය හැකි යයි විශ්වාස කිරීම උගහට ය. පාරම්පර්යයෙහි පැවත ආ කෘෂ්ණයන් දෙ දෙනකු හෝ වැඩි ගණනක් හෝ වූ බවත්, පසු වකවානුවෙක මේ සියලු දෙන එක දෙවියකු ලෙස සංකලනය වූ බවත් වඩාත් විශ්වසනීය ය. දේවකී ගේ පුත් කෘෂ්ණ ඝෝර ආඞ්ගිරස ගේ ශිෂ්‍යයකු ලෙස ඡාන්දෝග්‍ය උපනිෂදයෙහි (III. 17) සඳහන් වෙයි; ඔහු දේශනා කරන ධර්මය යටත් පිරිසෙසින් කරුණු කිහිපයෙකින් භගවද්ගීතාවෙහි ධර්මයට සමාන වෙයි. මේ හේතුවෙන් උපනිෂද් අවධියට අයත් මේ පුරාණ ඍෂිවරයා භගවද්ගීතාවෙහි කෘෂ්ණ ගෙන් වෙන් කළ නොහැකි තරම් ය.[4] මේ කෘෂ්ණ භාගවත භක්තියෙහි ආදි කර්තෘ වන්නට පුළුවන; ඉන්දියාවෙහි ආගම් කර්තෘන් බොහෝ දෙනකු මෙන් මොහු ද ඔහු ගේ අනුගාමිකයන් විසින් පූජා කරන ලද දෙවියන් ගේ අවතාරයක් බවට කරන ලදැයි ද සිතිය හැකි ය.[5] එ පමණක් නොව, මුල් වීර කාව්‍යයෙහි කෘෂ්ණ කොහෙත් ම දක්නට නොලැබුණු

අතර සදාචාර දෘෂ්ටිකෝණයෙන් බලන කල්හි වංක ගැයි කිව යුතු පාණ්ඩවයන් ගේ ක්‍රියා කෘෂ්ණ දෙවියන් ගේ පෙළඹවීමෙන් සිදු කරන ලෙස නිරූපණය කරමින්, යුක්ති සහගත බව පෙන්වා දීමේ විශේෂ අධ්‍යාශයෙන් පසු අවධියක දී ඔහු ඇතුළත් කැරෙන්නට ද ඉඩ ඒමට ඇත.[6] කෘෂ්ණ නිසා මතු වන ගැටලුව සම්බන්ධයෙන් නානා වාද ඉදිරිපත් කොට ඇති නමුත් සතුටුදායක විසඳුමක් නම් මෙ තෙක් නොලැබුණු බව පිළිගත යුතු ය.[7] කවර අතෙකින් සලකා බැලුව ද පාණ්ඩවයන් ගේ මිත්‍ර කෘෂ්ණ සහ හරිවංශයෙහි පැනෙන කෘෂ්ණත්, අත්‍යුත්තම දෙවියනුත් අතර ඇති පරතරය ඉතා පුළුල් ය.

මහාභාරතයෙහි මහා යුද්ධය ගැන ලියැවුණු ගීතිකාවල ආධිපත්‍යය කෞරවයන් ගෙන් පාණ්ඩවයන් අතට පත් වීමත්, කෘෂ්ණ හට දේවත්වාරෝපණයත් මුල් කොට රචිත ගීතිකාවල පිළිබිඹු වන දේශපාලන හා ආගමික විකසනය ද දීර්ඝ වකවනුවක් ඉක්ම ගිය බව හඟවයි; තව ද, කෘතියෙහි කේන්ද්‍රය වන මේ ගීත පමණක් වුව ද එක ම කවියකු අතින් බිහි විණැයි සිතීම ඉතා උගහට ය. ප්‍රධාන කතා පුවතෙහි **සවිස්තර** අතින් දක්නට ලැබෙන **පරස්පරවිරෝධිතා** විමසා බැලූ කල්හි මෙ බඳු නිගමනයකට බැසීම වඩාත් උගහට වෙයි. පාණ්ඩවයන් ගේ විවාහෝත්සවය පිළිබඳ කථාන්තරය (යට 12-47 සහ ඊ ළඟ පිටුව බලන්න) සහ අර්ජුන් ගේ වීර ක්‍රියා පිළිබඳ කථාන්තරය (20 පිටුව) පමණක් මම සඳහන් කරමි. IV වන පර්වයෙහි කුරුක්ෂේත්‍රයෙහි සිදු වූ මුළු යුද්ධය ම ගැන තවත් එ වැනි වර්ණනයක් දක්නට ලැබෙයි; හිඳ්ම ඇතුළු කෞරව වීරයෝ සියලු දෙන අර්ජුන විසින් නිමේෂයකින් පලා යාමට සලස් වනු ලබති; එහෙත් කතා වස්තුව තව දුරටත් විකසනය වීමෙහි දී කෞරවයන් පරාජය කළ හැකි වනුයේ අටළොස් දිනක් යුද්ධ කිරීමෙන් පසු ව ය. එ ද පාණ්ඩවයන් විසින් කූටෝපායක් උපයෝගි කොට ගැනීමෙන් පමණකි; මෙය ඉහත දැක්වූ කරුණු හා නො ගැළපෙයි. සමස්ත IV වන පර්වය (**වීරාට-පර්වය**) ම ඊ ළඟ පර්වයන්හි දැක්වෙන විශිෂ්ට යුද්ධ වර්ණනයට වඩා පශ්චාත්කාලීන රචනයක් බවට කිසිම සැකයක් නැත. එතෙකුදු වුවත් වීර කාව්‍යයෙහි පුරාණතම කොටස්වලට නොඅනුමාන ව ම ඇතුළත් වන පර්වයන්හි පවා නිරන්තරයෙන් හමු වන පරස්පර විරෝධිතා **එක** ම කවියකු ගේ "නිර්මාණාත්මක ප්‍රමාද දෝෂයනැ" යි කිසි සේත් විස්තර කිරීම උගහට ය.[8] රසයෙන් හා උත්කර්ෂයෙන් ද පරිපූර්ණ විශිෂ්ට වර්ණනා සමඟ, එක ම කරුණ කොතෙකුත් පුනපුනා පවසමින් අටළොස් දින යුද්ධය පිළිබඳ වර්ණනය නීරස අන්දමින් දිග්ගස්සන දීර්ඝ ගීත ද අපට දක්නට ලැබේ.

මෙ නයින් අප අතට පත් වූ පරිදි "සැබෑ වීර කාව්‍යය" යයි නම් කළ හැකි කෘතිය පවා එක ම කවියකු ගේ නිර්මාණයක් නොවන බවට **සැකයක්** නැත. මහාභාරතයෙහි මේ "කේන්ද්‍රය" පවා දැන් නම් පුරාණ

වීර කාව්‍යය නොවේ. එහෙත් එම වීර කාව්‍යය බෙහෙවින් සම්මිශ්‍රිත ස්වරූපයකින් එහි අන්තර්ගත වෙයි.

මේ කේන්ද්‍රය වට කොට ඇති විවිධ කාව්‍ය සම්භාරයක් රාශිභූත වී ඇති අයුරු අපි දුටුවමු; නානා පුරාවෘත්ත සමූහයන් ගෙන් ගත් වීර ගීතිකා බ්‍රාහ්මණ දේව කථා සහ පුරාවෘත්ත ද මුල් කොට ගත් කාව්‍ය, සෘෂි කාව්‍ය සහ ඉතා සරල සදාචාරමය ආප්තෝපදේශවල පටන් පෘථුල දර්ශනික කාව්‍ය දක්වා සෑම වර්ගයෙක ම උපදේශාත්මක කාව්‍ය, විධිමත් නීති ග්‍රන්ථ සහ සකලාංගයන් ගෙන් පරිපූර්ණ පුරාණ යන මේ සියල්ල මෙහි රාශිභූත වී ඇත. මහාභාරතය වූ කලි ප්‍රාග්-බෞද්ධ අවධියෙක **එක** ම කවියකු විසින් වීර කාව්‍යයක් වශයෙන් හා නීති ග්‍රන්ථයක්[10] වශයෙන් ද රචනා කරන ලද මැනවින් ගැළපුණු කෘතියෙකැයි ස්ථාපිත කිරීමට **ජේ. ඩෙල්මාන්** ශූරීන් අති විශාල පාණ්ඩිත්‍යයක් උපයෝගි කොට ගෙන ඇති නමුත් එම මතයට එකඟ වන විද්වතුන් සංඛ්‍යාව අල්ප ය. "ආකෘතිය අතින් හා නිර්මාණය ද අතින් ප්‍රධාන කරුණක් මුල් කොට ගෙන ලියැවුණු, රචනාව පුරා ඊට උරාගෙන පවත්නා මුඛ්‍ය රසයකින් ඔප් නැංවුණු සිතාමතා කරන ලද රචනාවක්" ලෙස මහාභාරතය විස්තර කිරීමට **සිල්වින් ලෙවි** ද මැනක දී වැයම් කළේ ය. මහාභාරතයෙහි **මූලසර්වාස්තිවාදී බෞද්ධයන් ගේ** විනයට සමාන කරන හෙතෙම මහාභාරතයෙහි අතිශයෝක්ති හා අතුරු කථා සියල්ල ද, විවිධාකාර අත්‍යලංකෘත විස්තර සියල්ල ද ඇතුළු සමස්ත කාව්‍ය ම හුදෙක් "භාගවතයන් විසින් අනුගමනය කරන ලද ක්ෂත්‍රිය විනය රීති පද්ධතියක්" පදනම් කොට ගත්තෙකැයි හේ කල්පනා කරයි. වීර කාව්‍යයෙහි කේන්ද්‍රය වනුයේ භගවත්ගීතාවත්, නාරායණීයයත්, හරිවංශයත් යැයි සැලකුව හොත් මෙ බඳු මතයක් හේතු සහගත වන බව නොකිව මනා ය. එහෙත්, මට සිතෙන පරිදි මහාභාරතයෙහි නියම කේන්ද්‍රය කෞරව-පාණ්ඩව යුද්ධය මාතෘකා කොට රචිත වීර කාව්‍ය යකැයි සැලකුව හොත් **ලෙවි ගේ** විවරණය **ඩෙල්මාන් ගේ** විවරණය තරමට ම පිළිගත නොහැකි වෙයි. මහාභාරතයෙහි "ක්ෂත්‍රිය වේදයක්" අන්තර්ගත වෙතැයි සලකන පඬුවෝ,[12] අද අප අතට පත් ව මහාභාරතයෙහි වීරයන් ගේ ප්‍රයෝජනය සඳහා ලියැවුණු කෘතියෙක අන්තර්ගත නොකළ හැකි නොයෙකුත් දෑ අන්තර්ගත වන බව අමතක කරති. උපදේශාත්මක අධ්‍යායයන්හි ද මේද බොහොමයෙකින් අනුශාසනා කෙරෙන අහිංසාව සහ ලෝකය හැර යාම මුල් කොට ගත් තවුස් සදාචාරය, ඉන්ද්‍ර ගේ දෙව් ලොව වීරයනට නියතයෙන් ම ලැබෙතැයි කියන කාමාස්වාදය සමඟ අනුකූල නොවන පරිද්දෙන් සැබෑ වීර කාව්‍යයෙහි දැක්වෙන මත්ස්‍ය මාංස අනුභව කිරීම හා වීරයන් සහ ඔවුන් ගේ භාර්යාවන් පවා කරනා මත් පැන් පානය සමඟ ද අනුකූල නොවෙයි. මහාභාරතයෙහි විශිෂ්ටතම කොටස් පමණක් නොව එය මුල සිට අග දක්වා සැබවින් ම කියවා බැලූ අයකු, අද දක්නට ලැබෙන කාව්‍යයෙහි

විෂයය අතින් විවිධාකාර වූ දෑ පමණක් නොව අගය අතින් විවිධාකාර වූ දෑ ද අන්තර්ගත වන බව පිළිගනු ඇත. ඇත්ත වශයෙන් සම්‍යග් දෘෂ්ටික හින්දු හක්තිකයන් හා ඉහත සඳහන් යුරෝපීය පඬුවන් ද විශ්වාස කරන පරිදි, අද දක්නට ලැබෙන අප මහාභාරතය, එක ම අයකු ගේ රචනයෙකැයි විශ්වාස කරන්නකු හට, මේ පුද්ගලයා එක විට ම ශ්‍රේෂ්ඨ කිවියකු මෙන් ම මෝඩයකු වූ බව ද, ශූර කලාකාරයකු මෙන් ම මෝඩ පණ්ඩිතමානියකු වූ බව ද නිගමනය කිරීමට සිදු වන ඇත; එ පමණක් නො ව මේ අද්භූත පුද්ගලයා එකිනෙකට බෙහෙවින් පටහැණි ආගමික මත සහ බෙහෙවින් පරස්පර විරෝධී දර්ශන දැන සිටි බවත්, ඒ වා විශ්වාස කළ බවත් නිගමනය කිරීමට සිදු වෙයි.[14]

භාෂාව, රචනා විලාසය හා වෘත්තය සම්බන්ධයෙන් ද මහාභාරතයෙහි විවිධ කොටස් කවර සමානත්වයක් හෝ නො දක්වයි. ජනප්‍රිය වීර කාව්‍ය වල භාෂාව "වීර කාව්‍ය සංස්කෘතය" යයි කිව හැක්කේ ඉතා සාමාන්‍ය අරුතකින්[15] පමණි. ඇත්ත වශයෙන් ම වීර කාව්‍යයෙහි ඇතැම් කොටස්වල භාෂාව වෙනත් කොටස්වල භාෂාවට ද වඩා **පෞරාණික** ය. එ නමුත්, වෛදික ගද්‍ය කෘතීන්හි දැක්වෙන පුරාණ ඉන්දීය භාෂාවට වඩාත් ළං වේ. **පාළි** භාෂාව සිහිපත් කරවන **ජනප්‍රිය** යයි කිව හැකි වාග් විද්‍යාත්මක ප්‍රයෝග හැරුණු විට, 'පුරාණ' රචකයන් වැනි අවියත්, අදක්ෂ කර්තෘන් අතින් බොහෝ විට සිදුවන **අපව්‍යවහාර** වැන්නැයි කීමට සිදු වන රීති විරෝධී ව්‍යවහාර ද ඇත. **රචනා** විලාසය ද "**කාව්‍ය** ශෛලියෙන්—" එ නමුත් **අලංකාර බාහුල්‍යය** ලක්ෂණ කොට ගත් පශ්චිම කාලීන මහාකාව්‍ය ශෛලියෙන් බෙහෙවින් ඈත් වෙතැයි කිව හැක්කේ සාමාන්‍ය අරුතෙකිනි. එ සේ වුව ද, අපට මේ කාව්‍ය ශෛලිය සිහි පත් කරවන ඡේද මහාභාරතයෙහි විරල නො වේ.[10] මේවා හැරුණු විට, බ්‍රාහ්මණයන්හිත්, උපනිෂදයන්හිත් ගෙන හැර දැක්වෙන පරිදි පුරාණ ඉතිහාසයන්හි අව්‍යාජ ශෛලිය රැක ගත් කොටස් ද අපට දක්නට ලැබේ. එ සේ ම, තවත් නොයෙක් කොටස්වල ඉතා නොසැලකිලිමත් '**පුරාණ**' ශෛලියක් දක්වෙයි. වෘත්තය අතින් බැලූ කල්හි[17] පුරාණ **අනුෂ්ටුභ්** වෘත්තයෙන් විකසනය වූ **ශ්ලෝකය ඉස්තරම්** ම වෘත්තය වූ බවට අනුමානයක් නැත. එහෙත් මුල් කාලයෙහි හා පසු වකවානුවෙක මේ ශ්ලෝකය වෙනස් වෙමින් ගත් ස්වරූප සියල්ල මහාභාරතයෙහි දක්නට ලැබේ. එ පමණක් නො ව, තැනින් තැන රිත්මානුකූල ගද්‍ය ස්වරූපයක් දක්වමින්, ඇතැම් විට ශ්ලෝක සමඟ මාරුවෙන් මාරුවට ලියැවුණු පුරාතන ගද්‍ය ඡේද ද අප කාව්‍යයෙහි දිස් වෙයි.[16] එ සේ ම, ශ්ලෝකය **ත්‍රිෂ්ටුභ්** වෘත්තය මෙන් විසි ගුණයක් තරම් දුරට යොදා තිබුණ ද, මහාභාරතයෙහි නිතර භාවිත වන ත්‍රිෂ්ටුභ් වෘත්තයෙහි ද වෛදික ස්වරූපයට සමාන පුරාණ වෘත්තය මෙන්ම පශ්චිමකාලීන ස්වරූප ද අපට හමු වේ. පැරැණි සංස්කෘත කාව්‍යයෙහි හමු වන විසිතුරු වෘත්ත පවා මහාභාරතයෙහි ඇතැම් කොටස් වල දැක ගත හැකි ය.

අවසාන වශයෙන්, කාව්‍යය සැම විට ම මේ වර්තමාන ආකෘතියෙන් හා ප්‍රමාණයෙන් නොපැවැති බවට මහාභාරතයෙහි ආරම්භක අධ්‍යායයන් ගෙන් ම පැහැදිලි ඉඟියක් ලැබෙන බව අමතක නො කළ යුතු ය. ප්‍රථම අධ්‍යායය දෙකෙහි අපට දක්නට ලැබෙන පවුන පමා අප පාඨ ග්‍රන්ථයට සැම විට ම අනුකූල නො වෙයි.

මෙ සේ, මහාභාරතය එක ම කතුවරයකු ගේ කෘතියක් හෝ එක ම වකවනුවෙක රචිත කෘතියක් හෝ නො ව, නානා ශතවර්ෂයන්හි ලියැවුණු ආදි කාලීන සහ පශ්චාත් කාලීන කොටස්වලින් සමන්විත කෘතියක් බවට සියලු කරුණු දෙස් දෙයි. මහාභාරතයෙහි ඇතැම් කොටස් වේද අවධිය දක්වා දිවෙන අතර වෙනත් කොටස් පුරාණ සාහිත්‍යයෙහි මැන රචනා හා සමකාලීන වන බව විෂය කරුණුවලින් මෙන් ම ආකෘතියෙන් ද තහවුරු වෙයි.

කෞරව වංශයෙහි පුරාණ වීර කාව්‍යයක් තිබුණු බවත්, මෙය "මුල් මහාභාරතය" වූ බවත්, පසු වකවනුවෙක මෙය පාණ්ඩවයන් ගේ පක්ෂ යට බර වූ, "පක්ෂග්‍රාහී සංශෝධනයකට" භාජන වූ බවත් දක්වන මතයකට විශේෂයෙන් **ඒ. හොල්ට්මාන්** එකඟ වෙයි; අනතුරු ව පිට පිට ම **කිහිප** අවස්ථාවෙක දී ම—පළමු ව බෞද්ධයන් විසින් ද දෙ වනු ව බ්‍රාහ්මණයන් විසින් ද "පක්ෂග්‍රාහී සංශෝධනයක්" කරනු ලැබූ බව ද විශ්වාස කැරෙයි. හොල්ට්මාන් සිතන අන්දමට "පුරාණයනට සමාන වන ලෙස කරන ලද දෙ වන සංශෝධනය" ක්‍රි.ව. 900-1100 අතර සිදු වන්නට ඇත; "ඉන් පසු ව ශත වර්ෂ කිහිපයක් ඉක්ම ගිය කල්හි පාඨ ග්‍රන්ථය නියතයෙන්ම ස්ථිර වී සම්පූර්ණ විය".[20]

මහාභාරතයෙහි වර්තමාන ස්වරූපය ලැබුණේ 15 වන හෝ 16 වන ශත වර්ෂයෙහි යයි සලකන මේ අවසාන උපකල්පනය මුළුමනින් ම සාවද්‍ය බව වහා ම සඳහන් කිරීම වැදගත් ය. කුමක් නිසා ද යත්? ක්‍රි. ව. 500 පමණ වන විට පවා මහාභාරතය සැබවින් ම වීර කාව්‍යයක් නො ව, ශුද්ධ ග්‍රන්ථයක් හා ආගමික දේශනයක් වූ බවත්, සමස්තයක් වශයෙන් ප්‍රමාණයෙන් හා වස්තු විෂය අතින් ද අද අප අතට පත් කෘතියෙන් අවශ්‍ය යෙන් ම වෙනස් නො වූ බවත්, සාහිත්‍යික හා ශිලා ලිපි සාක්ෂි[21] මඟින් ඔප්පු කරන ලද බැවිනි. මහාභාරතයෙහි පර්වයන් සියල්ලෙකින් ම වාගේ මේ ද ගණනාවක් උපුටා දක්වන **කුමාරිල** නම් දාර්ශනිකයා (ක්‍රි. ව. 700 පමණ) එය ව්‍යාස විසින් දේශනා කරන ලද මහා ස්මෘතියක් ලෙස සලකයි.[22] **සුබන්ධු** හා **බාණ** (ක්‍රි. ව. 600-650 පමණ) යන කිවියෝ මහාභාරතයෙහි පර්වයන් සියල්ලෙකින් ම වාගේ මහාභාරතය ප්‍රධාන වශයෙන් කාව්‍යයක් ලෙස දැන සිටියහ. ඇත්ත වශයෙන් බාණ එය සියලු කාව්‍යයන් අතර මුදුන් මල් කඩක් වූ ලෙස සලකයි.[23] **උදේනි** නුවර දේවාලයෙක පැවැති උත්සවයෙක දී මහාභාරතය කියැවූ අවස්ථාවෙහි **විලාසවතී** බිසව ද ඊට සවන් දුන් බව බාණ විසින් රචිත **"කාදම්බරී"** නම් ප්‍රබන්ධ කථාවෙහි හෙතෙම සඳහන් කරයි. මහාභාරතය **මෙ සේ**

ප්‍රසිද්ධියේ කියැවීම ඉන්දියාවේ දේවාලයන්හි උත්සව අවස්ථාවල දී අද දක්වා දක්නට ලැබේ. විනෝදය ම නැතා නො ව, නැණ ගුණ වඩාවට හා ආගමික අනුශාසනා කිරීමේ පරමාර්ථයෙන් ද මේ කියැවීම කැරුණු බව නියත ය.[24] ක්‍රි. ව. 60 තරම් ඈත වකවානුවෙක දී ම මහාභාරතය මේ සේ ප්‍රසිද්ධියේ කියැවූ බවට කාම්බෝජ සෙල් ලිපියක් දෙස් දෙයි. මේ අන්දමින් කියැවීමෙහි ලා ඇත ඉන්දියාවට අයත් මේ ඉන්දීය විජිතයෙහි උපයෝගි කොට ගනු ලැබුයේ මෙ සේ කියැවීමේ අදහසින් ම නැඟි කරන ලද අත් පිටපත් ය. අවසාන වශයෙන්, ඉඩ කඩම් ප්‍රදානය කරමින් දෙන ලද, 5 වන, 6 වන ශතවර්ෂයනට අයත් සන්නස් පත්‍ර ද අප අතට පත් ව ඇත. දානධර්ම ගැන අනුශාසනා කරන XIII වන පර්වයෙහි (ඉහත, 373 පිට බලනු) කොටස් මේ සන්නස්වල ශුද්ධ ග්‍රන්ථලෙස උපුටා දක්වෙයි. මෙ බඳු එක් සෙල් ලිපියෙක මහාභාරතය "ශ්ලෝක ලක්ෂයකින් සමන්විත සංග්‍රහයක්" ලෙස එ වක පවා සඳහන් වේ. එ සේ වුව ද, XII වන සහ XIII වන පර්වයන් සහ හරිවංශයෙහි කොටසක් ද ඇතුළු නොකළේ වී නම් ශ්ලෝක ලක්ෂයකට ළං වූ—සංඛ්‍යාවක් පවා ලබා ගත නොහැකි ය.[25] එහෙත් මහාභාරතයෙහි නවතම කොටස් බවට අනුමානයක් නැති XIII වන පර්වය හා හරිවංශය[26] බඳු කොටස් පවා 5 වන ශතවර්ෂය තරම් ඈත අවධියෙක දී ම ඊට එකතු වී නම්, එ වක පටන් ම එය ආගමික පාඨ ග්‍රන්ථයක් හා අනුශාසනයක් වී නම්, මීට ශතවර්ෂයකට පසු ව මහාභාරත අත් පිටපත් ඇත ඉන්දියාවට ද ලැබී, එහි දේවාලයන්හි කියවනු ලැබී නම්, අද එහි දක්වෙන ස්වරූපය මීට ශත වර්ෂයකට දෙකකට පමණ පෙර—එ නම් ක්‍රි. ව. 3 වන ශතවර්ෂයෙහි හෝ 4 වන ශතවර්ෂයෙහි හෝ ඊට ලැබෙන්නට ඇතැයි නිරණය කිරීම යුක්තියුක්ත ය. එ සේ වුව ද, අනෙක් අතට[27] ඊට මේ ස්වරූපය ලැබෙන්නට ඇත්තේ බුදු සමයෙහි ආරම්භයෙන් හා ව්‍යාප්තියෙන් ද පසු ව ය; බුදු සමය පිළිබඳ එහි දැක්වෙන සඳහන් ද අල්ප ය. **යවනයන්** එ නම්, **ග්‍රීකයන්** (අයෝනියන්) නිතර සඳහන් වන බැවින් ඇත්ත වශයෙන් ම මේ ස්වරූපය ලැබෙන්නට ඇත්තේ **ඇලෙක්සැන්ඩර්ගේ ඉන්දීය ආක්‍රමණයෙන් පසු ව ය. මේ අනුව ක්‍රි. පූ. 4 වන ශත වර්ෂයට පෙර හෝ ක්‍රි. ව. 4 වන ශත වර්ෂයට පසු ව හෝ මහාභාරතයට මේ වත්මන් ස්වරූපය ලැබිය නොහැකි ය.**[28]

එහෙයින් මහාභාරතය බෙහෙවින් ප්‍රතිශෝධනය කිරීමක් හෝ, පර්වයන් පමණක් එකතු කිරීමක් හෝ ක්‍රි. ව. හතර වන ශත වර්ෂයෙන් පසු ව සිදු නොවන්නට ඇත. ඇත්ත වශයෙන්, ප්‍රතිශෝධන එකක් හෝ වැඩි ගණනක් හෝ වූ බව පවසන මතය අවශ්‍ය වෙතැයි හෝ විශ්වසනීය වෙතැයි හෝ මට නො සිතෙයි.[29] පසු වකවානුවල දී පිටපත්කරුවන් තරමක් දුරට සිය හිතුමනාපය අනුව පෙළ වෙනස් කළ පරිදි, වඩා පැරණි වකවානුවල දී, මේ වීර ගීත ශතවර්ෂ ගණනාවක් තිස්සේ මුඛ පරම්පරා වෙන් රැක ගෙන ආ ප්‍රබන්ධකාරයා විසින් ඒවා සිය අභිමතය අනුව නිදහසේ ඉදිරිපත් කැරෙන්නට ඇත. සිය ශ්‍රෝත්‍රැජනයා වශී කරවූ

සිද්ධි දිග් ගැස්සූ ඔහු, එ තරම් තදින් ඔත් ඇද නොගත් සිද්ධි සැකෙවින් දැක්වූ හ. එහෙත්, පුරාණ වීර කාව්‍යය ක්‍රම ක්‍රමයෙන් සංග්‍රහයක් බවට පත් ව "අපමණ' කරුණු දක්වමින්, ඒ හේතුවෙන් ම "සෑම අයකුට ම යම් කිසිවක්" ගෙන දුන් විශාල වෙනස්වීම්, පුරාණ වීර ගායනා මුඛ පරම්පරාගත ව රැක ගැනීම මුල් ගායකයන් අතින් වෙනත් පන්ති අතට පත් වීමෙන් ද, ගීත ද වෙනත් පෙදෙස්වල මුල් බැස ගෙන, වෙනස් අවධියකට හා වෙනස් වූ ජනකායකට උචිත අන්දමින් වෙනස් වීමෙන් ද විස්තර කළ හැකි වෙයි. ඉහත අප දුටු පරිදි ඉතා පුරාණයෙහි දී ම මේ ගීත කුරු වංශයට සම්බන්ධ වූ සූතයන් අතින් පාණ්ඩව වංශයට සම්බන්ධ වූ සූතයන් අතට පත් විය. ඒවා වෛෂ්ණව භක්තිය ප්‍රචලිත වූ පෙදෙස්වල සිට ශිව දෙවියන් පරමේශ්වරස්ථානයෙහි ලා පූජා කරුණු පෙදෙස් වෙත පැතිර ගියේ ය. කෘෂ්ණ භක්තිය පසු කළ නා නා අවස්ථා ද පහත දැක්වෙන යම් යම් ලක්ෂණ ද වීර කාව්‍යයෙහි ඉතිරි විය. සෙසු ජාතීන් අතර මෙන් ම, ඉන්දීය ජාතිකයන් අතර ද, ප්‍රතිභාපූර්ණ කවිත්වය වීර කාව්‍ය මඟින් ප්‍රකාශයට පත් නො වූ අවස්ථාවෙක, මේ වීර කාව්‍යය සජීව ලක්ෂණයෙන් තොර ව, සූතයන් විසින් පුරාණ ගීත පමණක් දිගට ම ගායනා කරන්නට යෙදුණ අවස්ථාවක් පැමිණෙන්නට ඇත. වීර වික්‍රමයනුට් පෙළඹුණු පුරාණ යුගය, වීර පුරුෂයන් දැක්වූ නෙක් විකුම් ගැන යුද්ධයෙන් ජය ලබා ගත් පසු ව ඇතැම් විට යාග මහෝත්සවයෙක දී ගායනා කරනු වස් රණශූරයන් ගේ රියැදුරන් වශයෙන් සූතයන් රණ බිමට වැදුණු යුගය ද ඉක්ම ගියේ ය. මේ සූතයන් ගේ දරු මුනුබුරු පරපුර පහත් පෙළේ උගත්තු පිරිසකි. පුරාණයන් මුඛ පරම්පරාගත ව පවත්වා ගැනීමෙහි ලා යුහුසුලු වූවෝ ද මොහු ම වූ හ. මේ පන්තිය සැබෑ වීරයන් හෝ සැබෑ බ්‍රාහ්මණයන් හෝ නොවන්නට ඇත; සූතයන් වූ කලී වීර භටයන් හා බ්‍රාහ්මණ ස්ත්‍රීන් ද අතර විවාහයෙන් හෝ බ්‍රාහ්මණයන් හා ක්ෂත්‍රිය ස්ත්‍රීන් ද අතර විවාහයෙන් හෝ උපන් අවජාතකයන් ලෙස නීති ග්‍රන්ථයන්හි සඳහන් වනුයේ හේතු රහිත ව ම නො වේ. අද දක්නට ලැබෙන මහාභාරතයේ ස්වරූපයෙහි අපූර්වත්වයට හේතුව ඒ නො වේ; මෙය සැබෑ වීරකාව්‍යයක් හෝ සැබෑ ආගමික කාව්‍යයක් හෝ නො වේ; එය දැන් වීර කාව්‍යයක් නම් නොවන නමුත් සැබෑ පුරාණයක් බවට ද පත් වී නැත.

මහාභාරතයෙහි ශත වර්ෂ ගණනක් මුළුල්ලෙහි මුඛ පරම්පරාගත ව පැවැත අවුත් ප්‍රථම වරට ග්‍රන්ථාරූඪ කෘතිය තෙක් ඊට යම් කිසි පරිසමාප්ත ස්වරූපයක් නොලැබෙන්නට ඇත. මේ සංස්කරණයෙහි දීත් ග්‍රන්ථාරූඪ කිරීමෙහි දීත් පඬුවන් හා බ්‍රාහ්මණයන් හා පමණක් සහභාගි වන්නට ඇත. එතෙකුදු වුවත්, ක්‍රි.ව. 4 වන ශත වර්ෂයෙහ හෝ ඊටත් පෙර වකවනුවෙක සමස්තයෙන් ගෙන බලන කල ප්‍රමාණයෙහි හා වස්තු විෂයෙහි ද අවශ්‍ය අංග අතින් හෝ මහාභාරතය අද අපට ලැබී ඇති කෘතියෙන් වෙනස් නො වී ය යන නිගමනයට අපි එලඹෙන්නෙමු.

මේ "සමස්තයෙන්" හා "අවශ්‍ය අංග අතින්" යන පද අධික අවධාරණයෙන් දැක්විය යුතු ය. කුමක් නිසා ද යත්? අමතර කරුණු එකතු කිරීමත් ඇතැම් කරුණු වෙනස් කිරීමත්, ඇත්ත වශයෙන් නැති ශ්ලෝක පමණක් නො ව (දුර්ගා ස්තෝත්‍ර ආදි) සම්පූර්ණ ගීත එකතු කිරීමත් පසු ශතවර්ෂයන්හි දී පවා සිදු වූ හෙයිනි.[31] ඒ හෙයින් **විවේචනාත්මක ලෙස නිශ්චිත කොට ගත් පෙළ සහිත මහාභාරතයක්** පවතී.

අප මහාභාරතය ගැන කථා කරන කල සාමාන්‍යයෙන් අදහස් කෙරෙනුයේ ඉන්දීය පඬුවන් විසින් පිළියෙළ කොට ඉන්දියාවෙහි ප්‍රකාශයට පත් කළ සම්මත සංස්කරණ දෙකයි, එ නම් 1834—1839 ප්‍රකාශිත **"කල්කටා සංස්කරණය"**[32] සහ **නීලකණ්ඨ ගේ** අවුවාව සහිත **"බොම්බා සංස්කරණයත්"**[33] ය. මේ සංස්කරණ දෙක අතර වෙනස ඉතා අල්ප ය; නීලකණ්ඨ විසින් අවුවා සැපයෙන පරිදි එ මඟින් මේ ග්‍රන්ථය මැනැවින් ගෙන හැර දක්වෙන බව ද සිතිය හැකි[34] ය. එ සේ වුව ද, බෙංගාලි අත් පිටපත සහ විශේෂයෙන් **දකුණු ඉන්දිය** අත් පිටපත ද බොම්බා සංස්කරණයෙන් නොයෙක් තැන්හි වෙනස් වෙයි.[35] ඉන්දියාව මුළුල්ලෙහි සෑම පෙදෙසක ම ව්‍යවහාර වන නානා අත් පිටපත් සියල්ල මූල් කොට ගත් **විවේචනාත්මක මහාභාරත සංස්කරණයක්** ඉන්දියාව පිළිබඳ ව කරුණු හැදෑරීමෙහි ලා ඉතා අවශ්‍ය වෙයි; නුදුරු අනාගතයෙහි දී ම මේ අවශ්‍යතාව පිරිමසාලනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.[36] මෙ බඳු විවේචනාත්මක සංස්කරණයක් පළ කැරෙන තෙක් අප මහාභාරතයෙහි ඇතුළත් වන පාඨ ලෙස සැලකෙන අපමණ භේද නියතයෙන් ම හෝ යටත් පිරිසෙසින්, සිතා ගත හැකි අන්දමින් හෝ පසු ව එකතු කරන ලද භේද යයි තෝරා බේරා ගැනීමට නොහැකි වනු ඇත.[37] එ පමණක් නො ව, එ බඳු සංස්කරණයක් පළ වූ කල, අත් පිටපත් හැරුණු විට, සත්‍ය සිද්ධි කවරේ ද ව්‍යාජ සිද්ධි කවරේ දැයි තරමක් දුරට නියතාකාරයෙන් තෝරා බේරා ගැනීමට ද හැකි වනු ඇත.[38] මේ කටයුත්ත උදෙසා ද්‍රාවිඩීය භාෂාවන් ගෙන් කරන ලද පුරාණතර පරිවර්තන මෙන් ම, **ජාවා සහ පර්ෂියානු** මහාභාරත පරිවර්තන ද විමසා බැලීමට සිදු වනු ඇත.[39]

මෙ බඳු විවේචනාත්මක මහාභාරත සංස්කරණයක් ලබා ගත නො හැකි තාක් කල්, මහාභාරතයෙහි එක් එක් අධ්‍යායය ලියැවුණු වකවානුව පමණක් නො ව, එක් එක් ශ්ලෝකය ලියැවුණු වකවානුව පවා වෙන් වෙන් ව නිශ්චය කටයුතු ය; එ සේ ම නිතර කියැවෙන පරිදි, එක්තරා නාමයක් හෝ විෂයයක් හෝ මහාභාරතයෙහි **"මීට කලින්"** දක්වෙතැ'යි කීම අර්ථ විරහිත වෙයි. එ සේ ම එය යුක්ති යුක්ත ද නො වේ. නියතයෙන් ම පුරාණ කොටස්වලට පසු ව කරුණු ඇතුළු කැරුණු නිසා පමණක් නො ව, "අපරකාලීන" කොටස්වල ඉතා පෞරාණික භේද

එ තරම් ම බහුල ව දක්නට ලැබෙන බැවින් ද සමස්තයක් වශයෙන් මහා භාරතය සම්බන්ධයෙන් නියමිත වකවනුවක් සඳහන් කිරීම ද කොහෙත් ම හේතුසහගත නො වේ. මෙ නයින් මහාභාරතයෙහි පළමුවී වන මුළු පර්වය ම "පෞරාණික" නො වෙතැයි ඉඳුරා කිව හැකි නමුත් එහි දක්නට ලැබෙන පුරාණ දේව කථා, පුරුවෘත්ත හා පරම්පරා ගෙන හැර දක්වන ශ්ලෝක රාශියක් ඉතා පුරාණ අවධියකට අයත් වනු ඉත් නො වැලැක්වෙයි.[40] පසු අවධියෙක දී එක් කරන ලද බවට අනුමානයක් නැති හරිවංශයෙහි පවා ඉතා පුරාණ ශ්ලෝක හා පුරාවෘත්ත අපට හමු වෙයි. එතෙකුදු වුවත්, මහාභාරතයෙහි සමස්ත පර්වයන් සහ විශාල කොටස් සම්බන්ධයෙන් "පුරාණ" හා "පශ්චාත් කාලීන" යන පද භාවිත කිරීම පරිස්සමෙන් හා හේතු සාධක සහිත ව ද කළ යුත්තේ ය.

මේ ඉතා ම දුෂ්කර පැනයට අපි සිත් යොමු කරවමු. මහාභාරතයෙහි "**පුරාණ**" සහ "**පුරාණතම**" කොටස් යයි කීමෙන් අපි කුමක් අදහස් කරමු ද? වෙනත් වචනවලින් කියතොත්, මහාභාරතයෙහි ආරම්භය කවර වකවනුවක් දක්වා ඇතට විහිදේ ද?

මෙහි ලා අපි සත්‍ය කරුණු පමණක් සලකා බලමු. බ්‍රාහ්මණයන්හිත්, උපනිෂදයන්හිත් **ආඛ්‍යාන, ඉතිහාස, පුරාණ** සහ **ගාථා නාරාශංසී** (යට, 413 වන පිටුව බලන්න) ගැන නිතර කියැවෙන නමුත් සමස්ත වෛදික සාහිත්‍යයෙහි ම මහාභාරතයක් ගැන සඳහන් නො වේ. වංශ කථාවෙහි මුඛ්‍ය කරුණු වූ ඉතා වැදගත්, ඓතිහාසික ද විය හැකි සිද්ධිය ගැන, කුරු ක්ෂේත්‍රයෙහි වූ බිහිසුණු යුද්ධය ගැන, වේදයෙහි වචනයකින් හෝ සඳහන් නො වේ. එහෙත් බ්‍රාහ්මණයන්හි, දෙව් මිනිසුන් මහත් උත්සවාකාරයෙන් යාග හෝම පැවැත්වූ ස්ථානයක් ලෙස මේ කුරු ක්ෂේත්‍රය ම නිතර සඳහන් වන බැවින් මේ සිද්ධිය එ වක සිදු විණි නම් එය වේදයන්හි සඳහන් වන බවට අනුමානයක් නැත.[41] පරික්ෂිත් ගේ පුත්‍ර ජනමේජය සහ **දුශ්ෂ්‍යන්ත** ගේ ද **ශකුන්තලා** ගේ ද පුත්‍ර **භරත** බ්‍රාහ්මණයන්හි ද හමු වන බව සැබෑවකි; තව ද, **අර්ථවවේදයෙහි කුන්තාප** ස්තෝත්‍රයෙක පරික්ෂිත් සාමකාමී රජකු ලෙස ප්‍රශංසා ලබමින්, ඔහු ගේ රාජ්‍ය සමයයෙහි කුරු දේශය සමෘද්ධිමත් වූ බව කියැවේ. යජුර්වේදයට ඇතුළත් වන කෘතීන්හි කුරු වාසින් සහ පඤ්චාල වාසීන් හෙවත් **කුරුපඤ්චාලයන්** ගැන නිතර සඳහන් වෙයි; එ සේ ම, කුරුපඤ්චාලයන් ගේ යාගයක් සම්බන්ධයෙන්, **විචිත්‍රවීර්ය ගේ** පුත් ධෘතරාෂ්ට්‍ර සඳහා වූ **කාඨකයෙහි** (X, 6) ආඛ්‍යානයක් ගෙන හැර දක්වෙයි. අනෙක් අතට, මුළු වේදයෙහි ම කිසි ම තැනෙක පාණ්ඩු ගේ නාමය හෝ ඔහු ගේ පුත්‍ර පාණ්ඩවයන් ගේ නාමය හෝ දුර්යෝධන, දුශ්ශාසන, කර්ණ ආදි නාම හෝ දක්නට නො ලැබේ. අර්ජුන යන නාමය බ්‍රාහ්මණයෙක පැනෙන බව සැබෑ වුව ද, එ ද ඉන්ද්‍ර දෙවියන් ගේ රහස් නාමයක් වශයෙනි. කෞරවයනට බෙහෙවින් විනාශදායක වූ කුරුක්ෂේත්‍රයෙහි කරන ලද යුද්ධයක් ගැන ප්‍රථමවරට සඳහන් වනුයේ

ශාඛ්‍යායන-ශ්‍රෞතසූත්‍රයෙහි ය. XV, (10)[46] වේදය හදාරා පරතෙරට පත් කල්හි කෘප කළ මහ පැහැති සූජා කළ ඝෘතු ඇදුරන් ද, ශුද්ධ ග්‍රන්ථයන් ද දක්වන්නා වූ මාලාවක් ලෙස්වන අශ්වලායන-ගෘහ්‍යසූත්‍රයෙහි "හරත ඝෘ මහාභාරතය" සඳහන් වේ.[47] "යුධිෂ්ඨිර" "භීම" සහ 'විදුර' යන නාමයන් ගේ නිරුක්තියත් "මහාභාරත" නම් සම්‍යක් පදයෙහි උච්චාරණයත් පාණිනී[48] ඵහන්වී. එ සේ වුව ද, කෞරවයන් හා පාණ්ඩවයන් ද අතර යුද්ධයක් පිළිබඳ කතා පුවතක් ගැන ඍග්වේද ඊශයෙන් සඳහන් කරනුයේ පතඤ්ජලී ය.

කෙසේ ඵහත් මේ ගැන ලැබෙන තොරතුරු කවරේද? ත්‍රිපිටකයෙහි මහාභාරතය ගැන සඳහන් නො වේ. අනෙයා් අතට වීර කාව්‍ය කර්ණයෙහි ලා මූලික පියවරක් වශයෙන් බ්‍රාහ්මණයන්හි අප දැන සැදිනා ගත් ආඛ්‍යාන ශෛලියෙන් රචිත කාව්‍ය නම් ත්‍රිපිටකයෙහි පුරාණ නම් ග්‍රන්ථයන්හි දක්නට ලැබේ.[49] ජාතක කථා-ජාතකයන්හි පද්‍ය කොටස් (ගාථා) ත්‍රිපිටකයට අයත් වේ—කෘෂ්ණ පුරාවෘත්තය පිළිබඳ දැනුමක් අනාවරණය කරන නමුත් මහාභාරතයෙහි හරිවංශයත් මෞසලපර්වයත් නො හදුනයි.[50] ජාතක පොතෙහි දක්නට ලැබෙන පාණ්ඩව, (මහාභාරතයෙහි අර්ජුන හට දුන් තවත් නාමයක් පමණක් වූ) ධනඤ්ජය, (යුධිෂ්ඨිර යන්නෙහි පාලි රූපය වූ) යුධිට්ඨිල, (ධෘතරාෂ්ට්‍ර යන්නෙහි පාලි රූපය වූ) ධතරට්ඨ, (මහාභාරත විදුර වූ) විධුර හෙවත් විඩුර ආදි නාම සහ ස්වයංවරයක් ගැන කතා දුවත සහ ද්‍රෞපදිය ගේ පඤ්ච-පති විවාහය පිළිබඳ කතා පුවත ද මහාභාරතය සමඟ මද ඇසුරක් පමණක් හඟවයි කුමක් නිසා ද යත්? පාණ්ඩව යන්න ජාතකයෙහි දක්නට ලැබෙනුයේ අශ්වයකු ගේ නාමයක් ලෙසිනි.[51]; ධෘතරාෂ්ට්‍ර යනු නොයෙක් රජවරුන් ගේ නාම යක් ලෙසිනි;[52]; ධනඤ්ජය සහ යුධිෂ්ඨිර ගැන සඳහන් වනුයේ හුදෙක් ඉන්ද්‍රප්‍රස්ථයෙහි වාසය කළ කුරු රජවරුන් ලෙසිනි; විධුර වූ කලි ධනඤ්ජය ගේ හෝ යුධිෂ්ඨිර ගේ හෝ රාජ සභාවෙහි[40] වරෙක පුරෝහිතයකු ලෙස ද වරෙක අමාත්‍යයකු ලෙස ද දක්නට ලැබෙයි. එ සේ වුව ද, වීර කාව්‍යයෙහි විශිෂ්ට ස්ත්‍රී චරිතයන් ගෙන් කෙනකු වූ ද්‍රෞපදී ජාතක පොතෙහි දුරාචාරයෙන් කෙලෙසුණු චරිතයක් පිළිබඳ නිදසුනක් ලෙස දක්වෙයි; සිය සැමියන් පස් දෙනා ගෙන් තෘප්තියට පත් නො වූ ඕ කුදු සේවකයකු සමඟ අනාචාරයෙහි හැසිරෙයි.[50]

වේදය අවසානයකට පත් වීමට පෙර මහාභාරතය නම් වීර කාව්‍යයක්, එ නම්, කෞරව, පාණ්ඩව යුද්ධය ගැනත්, කුරු ක්ෂේත්‍රයෙහි සිදු වූ සටන ගැනත් වර්ණනය කරමින්, "භාරතය" හෙවත් "මහාභාරතය" යන නම් දැරූ වීර කාව්‍යයක් තිබෙන්නට ඉඩක් නැතැයි මේ කරුණු අනුසාරයෙන් නිගමනය කළ යුතු ය; එහෙත්, ශාඛ්‍යායන, අශ්වලායන සහ පාණිනී යන අය විසින් රචිත සූත්‍ර ක්‍රි. පූ. 4 වන සිය වසට වඩා මෑත නො විය හැකි බැවින් එ වක මෙ බඳු කාව්‍යයක් තිබෙන්නට ඇතැයි ද නිගමනය කළ යුතු ය. එතෙකුදු වුවත්, ක්‍රි. පූ. 4 වන, 3 වන ශත වර්ෂ

යන්හි ආරම්භ වූ බෞද්ධ ත්‍රිපිටකය මහාභාරතය සම්බන්ධයෙන් පෙන්වන දැනුම ඉතා අල්ප වන බැවින්, බෞද්ධ සාහිත්‍යය රචනා කිරීම ඇරඹුණු නැහෙනහිර ඉන්දියාවෙහි එය ඒ විකවනුයෙහි දී එ තරම් ව්‍යවහාර නොවූවා විය හැකි ය.

එ සේ වුව ද, අප අතට පත් මහාභාරතයෙහි ඇතැම් අංග වෛදික යුගය දක්වා ඇත කාලයකට විහිදෙන බවත්, විශේෂයෙන් ම උපදේශාත්මක කොටස්වලට පැනෙන අපමණ රචනා **පොදු සංහිත්සික වස්තු සම්භාරයෙ කින්** උපුටා ගත් බවත් අපි දුටුවෙමු. මහාභාරත රචකයන් මෙන් ම බෞද්ධයන් සහ ජෛනයන් ද (ක්‍රි. පූ. 5 වන ශත වර්ෂයෙහි පවා) මේ පොදු සාහිත්සික අසිතියෙන් ප්‍රයෝජනය ගන්නට ඇත.[51]

වීර කාව්‍යයෙහි විස්තර කැරෙන සිද්ධි පමණක් නොව, රජවරුන් ගේ ද රාජවංශයන් ගේ ද අද්‍රමාණ නාම රාශිය ද, ඉතිහාසය යන වචනයෙහි නියතාර්ථයෙන් ම, ඉන්දීය **ඉතිහාසයට** අයත් නොවන බව අවසාන වශයෙන් තව දුරටත් සඳහන් කළ යුතු ව ඇත; ඇතැම් සිද්ධි සහ නාම රාශියක් ම ඓතිහාසික බවත් දක්වන නමුදු තත්ත්වය මෙ සේ ය. යුධිෂ්ඨිර ගේ රාජ්‍ය සමයත්, මහාභාරත යුද්ධයත් කලියුගයෙහි හෙවත් **අයස්** සමයෙහි උදාවත් සමඟ—එ නම්, ක්‍රි. පූ. 3102 දී වී යයි ඉන්දියානුන් සලකන බව සැබෑවකි; එහෙත් කලියුගයෙහි ආරම්භය සඳහා මේ කාල නිර්ණයට පදනම් වූයේ ඉන්දීය තාරක ශාස්ත්‍රඥයන් ගේ කෘත්‍රිම ගණන් බැලීම් ය; එ හෙයින් මේ වකවනුව කෞරව-පාණ්ඩව අරගලයට සම්බන්ධ කිරීම හිතුමනාපයට අනුව කරන ලද බව නොකිව මනා ය. ඉන්දියාවෙහි දේශපාලන ඉතිහාසය, මගධයෙහි රජ කළ **බිම්බිසාර** හා **අජාතසත්තු** නම් **ශිශුනාග** රජවරුන් ගෙන් ඇරඹෙයි; මොහු **බුදුරදුන් ගේ** සමකාලිකයන් ලෙස අපට හමු වෙති. පුරාණයන්හි සඳහන් වන ශිශුනාග හා **නන්ද** රාජ වංශයට අයත් රජවරුන් ද ඓතිහාසික රජවරුන් වූ හයි සැලකිය හැකි ය. මෞර්ය රාජ වංශය පිහිට චන්ද්‍රගුප්ත අධිරාජයා ගේ රාජ්‍ය සමයත් (ක්‍රි. පූ. 321) සමඟ අපි ඉන්දියාවෙහි ස්ථිර ඓතිහාසික වකවනුවට එළඹෙමු. මේ ඓතිහාසික පුද්ගලයන් කිසිවකු සම්බන්ධයෙන් මහාභාරතයෙහි කිසි ම සඳහනක් නොදැක්වේ. කථාන්තරයෙහි ද කථා නායකයන් ගේ ද මේ "ප්‍රාග්-ඓතිහාසික" ස්වරූපයත්, වීර කාව්‍යයෙහි පෞරාණිකත්වයට දෙස් දෙන බව නොඅනුමාන ය.

මහාභාරතය ලියැවුණු වකවනුව සම්බන්ධයෙන් කරුණු පිඬු කොට ගත් කල මෙ සේ දැක්විය හැකි ය:

1. මහාභාරතයෙහි අන්තර්ගත යම් යම් පුරාණ දේව කථා, පුරාවෘත්ත සහ කාව්‍ය වෛදික යුගය දක්වා ඇතට විහිදෙයි.

2. "භාරතය" හෙවත් "මහාභාරතය" නමින් වීර කාව්‍යයක් වෛදික යුගයෙහි දී නොවී ය.

3. අප මහාභාරතයෙහි අන්තර්ගත සදාචාරමය කථා සහ කියුම් සෑහි කාව්‍ය ගණයට අයත් වෙයි; ක්‍රි. පූ. 6 වන ශත වර්ෂයෙහි පටන් බෞද්ධ යන් සහ ජෛනයන් විසින් ද මේ කතා වස්තු උපයෝගි කොට ගනු ලැබී ය.

4. ක්‍රි. පූ. 6 වන සහ 4 වන ශත වර්ෂ අතර මහාභාරතය නම් වීර කාව්‍යයක් ව්‍යවහාරයෙහි පැවැතිණි නම් බුද්ධ ධර්මය පහළ වූ පෙදෙස්වල එය බහුල ව ව්‍යවහාර නොවන්නට ඇත.

5. ක්‍රි. පූ. 4 වන ශත වර්ෂයට පෙර මහාභාරතය නම් වීර කාව්‍යයක් වූ බවට නියත සාක්ෂ්‍ය නැත.

6. ක්‍රි. පූ. 4 වන ශත වර්ෂයෙහි පටන් ක්‍රි. ව. 4 වන ශත වර්ෂය දක්වා කාලය ඇතුළත මහාභාරතය නම් **වීරකාව්‍යය** ක්‍රමයෙන් දැන් අප අතට පත් සංග්‍රහය බවට පරිවර්තනය වන්නට ඇත.

7. ක්‍රි. පූ. 4 වන ශත වර්ෂයෙහි මේ කෘතිය බොහෝ දුරට එහි වර්තමාන ප්‍රමාණයත්, වස්තු විෂයයත්, ස්වරූපයත් දරී ය.

8. ඒ සේ වුව ද, ඊට පසු ව සුළු වෙනස්කම් කිරීමත්, සුළු සුළු කරුණු එකතු කිරීමත් නො කඩවා සිදු විය.

9. මහාභාරතය සඳහා **එක** නියත වකවානුවක් නම් නැත; එක එක කොටස ලියැවුණු වකවානුව වෙන් වෙන් ව නිර්ණය කළ යුතු ය.

ජනකාන්ත වීර කාව්‍යයක් හා අලංකාර කාව්‍යයක් ද වූ රාමායණය

එක කරුණෙකින් පමණක් නො ව, කරුණු කිහිපයෙකින් ම **රාමායණය** මහාභාරතයෙන් මූලික විශයෙන් වෙනස් වෙයි. මීට ප්‍රධාන හේතුව නම් එය මහාභාරතයට වඩා බෙහෙවින් කෙටි, ඊට වඩා බෙහෙවින් ඒකාබද්ධ කෘතියක් වීමයි. මහාභාරතය අද දැක්වෙන ස්වරූපයෙන් සැබෑ වීර කාව්‍යයෙකැයි කිව නොහැකි තරම් වුව ද, රාමායණය වූ කලී වර්තමාන ස්වරූපයෙන් වුව ද බොහෝ දුරට ඒක බද්ධ වීර කාව්‍යයෙකි. තව ද, වේදයන් ද, පුරාණයන් ද සංග්‍රහ කළේ යැයි සැලකෙන **ව්‍යාස** නමැති කිසි සේත් ඓතිහාසික නොවූ මිථ්‍යා ඍෂිවරයා මහාභාරත කර්තෘ හෝ සංස්කාරක හෝ වෙතැයි දේශීය පාරම්පර්යය පවසන නමුත් රාමායණයෙහි කර්තෘත් විය එ මඟින් ම **වාල්මීකි** නම් කවියකු හට පැවරෙයි. මෙ නමින් කවියකු සැබෑවින් ම ජීවත් වූ බවත්, සූතයන් බොහෝ දෙනකු අතර විසිර පැවැති ගීත රාශිය මොහු ප්‍රථම වරට මැනැවින් ඒකාබද්ධ කාව්‍යයක් ලෙස ගොනු ගත් බවත් සැක කිරීමට හේතුවක් නො පෙනේ. මේ වාල්මීකි "මුල් ම කවියා හෙවත් අලංකාර කවියේ කර්තෘවරයා" (ආදිකවියා) ලෙස සලකන ඉන්දීය ජාතිකයෝ රාමායණය "මුල් ම අලංකාර කාව්‍යය" (ආදිකාව්‍යය) යැයි සැලකීමට කැමැත්තෝ ය. අලංකාර කාව්‍ය (මහාකාව්‍ය) ගණයෙහි ලා ගැණෙන වීර කාව්‍යයෙහි ආරම්භය රාමායණය දක්වා දිවෙන බව සැබෑවකි.

පසු කාලයෙක ඇති වූ ඉන්දීය කවීන් සියලු දෙනා ප්‍රශංසා මුඛයෙන් අනුගමනය කිරීමට තැත් කළ කවියා සැම විටෙක ම වාල්මිකී විය. ඉන්දීය "කාව්‍ය" සම්ප්‍රදායයෙහි අවශ්‍ය ලක්ෂණය නම් කාව්‍යයෙහි වස්තු විෂය ට වඩා ආකෘතියට වැඩි වැදගත්කමක් ලැබීමයි; උපමා රූපක, ශ්ලේෂ ආදි කාව්‍යාලංකාර, බෙහෙවින් ඇතැම් විට පමණ ඉක්මවා, උපයෝගි කොට ගැනෙයි. උපමා පිට උපමා ආරූඪ කැරෙමින්, විශේෂයෙන් සොබා දහම වැනුම් නවතම උපමා රූපක යොදමින් දිගින් දිගට ගෙන යේ. සම්භාවනීය ග්‍රන්ථ ලියැවුණු මහාකාව්‍ය සම්ප්‍රදායයෙහි පෙනෙන මෙ වැනි වෙනත් විශේෂ ලක්ෂණයන්හි ආරම්භය රාමායණයෙහි දක්නට ලැබේ. මහාභාරතයෙහි ජයප්‍රිය වීර කාව්‍යයෙහිත් පුරාණ කාව්‍යයන්හිත් සංකලනයක් අපට දක්නට ලැබුණු නමුත් රාමායණය එක් වර ම ජනප්‍රිය වීර කාව්‍යයක් හා අලංකාර කාව්‍යයක් ද වූ කෘතියක් ලෙස පෙනෙයි.

මහාභාරතය මෙන් මෙය ද සමස්ත ඉන්දීය ජාතියෙහි ම පොදු අයිතියක් බවට පත් ව, ලෝක සාහිත්‍යය මුළුල්ලෙහි දක්නට ලැබෙන අන් කවර කාව්‍යයකටත් වඩා ශතවර්ෂ ගණනක් ඇතුළත ජාතික සිතුම් පැතුම් කාව්‍යය කෙරෙහි බල පෑ බැවින් එය මහාභාරතය මෙන් ම ජනප්‍රිය වීර කාව්‍යයෙකි. මේ වීර කාව්‍යයට කරන ලද (පසු ව එකතු වුණු) හැඳින්වීමෙක, මහා බ්‍රහ්මයා පැමිණ, රාම ගේ වීර ක්‍රියා කාව්‍යයට නඟමින් වර්ණනය කරන ලෙස වාල්මිකී ගෙන් ඉල්ලා සිටි අයුරු විස්තර වෙයි. මේ දේව රාජයා ඔහුට මෙ සේ පොරොන්දු වූ බව ද කියැ වේ:

යාවත් ස්ථාස්‍යන්ති ගිරයඃ සරිතශ්ච මහීතලේ
තාවද් රාමායණ කථා ලෝකේෂු ප්‍රචරිෂ්‍යති

(1—2—36. රාමායණ)

"සතිරව පිහිටි මිහි පිට කඳු තිබෙන තු රා
නිතොරව ගලන තෙක් ගං හෝ දිය දහ රා
නොකරව සැකක් එතුවක් මුළු ලොව ම පු රා
ඇත පව තිනු මහා රාමායණය ති රා"

මේ පොරොන්දුව සැබවින් ම අනාවැකියක් වූ බව අද දක්වා ස්ථුට වී ඇත. දෙ දහස් වසක් මුළුල්ලෙහි රාම පිළිබඳ කාව්‍යය ඉන්දියාවෙහි අභාවයට නො ගොස් පවතිමින්, සැම තරාතිරෙක ම, සැම පන්තියෙක ම ජනයා අතර එක සේ ජනප්‍රිය ව ඇත. උස් පහත් භේදයක් නොමැති ව, රජ කුමරුන්, ගොවියන්, රදලයන් වෙළෙන්දන්, ශිල්පියන්, රාජ කුමාරිකාවන්, ගොපලු ලියන් යන සියලු දෙන මේ මහා වීර කාව්‍යයෙහි චරිත හා කථාන්තර මැනැවින් හඳුනති. පුරුෂ පක්ෂය රාම ගේ වික්‍රමයන් ගෙන් උද්දාම ව, ඔහු ගේ නැණවත් කියුම්වලින් උගැන්මක් ලබති; ස්ත්‍රී පක්ෂය, උත්තම ස්ත්‍රී ගුණාංගය වූ පතිවත රැකීමෙහි පරමාදර්ශයක් ලෙස ගෙන සීතාව ගේ ගුණ ගයති. බාල මහලු සියලු දෙන, අවංක හැඟීමෙන් හෙබි හනුමන් නම් වානරයා ගේ බල පරාක්‍රමය මෙන් ම මිනිමස් බුදින යෝධයන් සහ අද්භූත බලමහිමයෙන් යුත් රකුසන් ද පිළිබඳ

ඇඟ කිළි පොළවන කථාන්තර ද එක සේ රස විඳිති. ජනතාව රාමායණ කතා පුවත් ළඟින් ඇසුරු කළ බවට ඔවුනතර ප්‍රචලිත ව පවත්නා වාග් සම්ප්‍රදායයත්, ප්‍රස්තා පිරුළුත් දෙස් දෙයි. එ සේ ම, නානා ආගමික නිකා යනට අයත් පූජකවරු සහ ආචාර්යවරු ද ජනතාව අතර ආගම ධර්මය හා සදාචාර ධර්ම ද පැතිරවීමට අදහස් කරන කල්හි රාමායණය පෙරළා බලමින්, ඉන් කරුණු ගෙන හැර දක්වති; තව ද, කාලිදාස පටන් භව භූති සහ ඔවුන් ගෙන් පැවැත ආ ප්‍රතිභාගීන කවීන් දක්වා පශ්චාත්— කාලීන කවීන් සියලු දෙන ම නැවත නැවතත් රාමායණයෙන් කථා වස්තු සොයා ගෙන, ඒවා නව ස්වරූපයෙකින් ඉදිරිපත් කොට ඇත.[1] ප්‍රාදේශීය භාෂාවලින් රචිත නූතන ඉන්දීය සාහිත්‍යය පෙරළා බලන කල්හි, එකොළොස් වන ශත වර්ෂය තරම් පුරාතන අවධියෙක රචිත දෙමළ පරිවර්තන යක් අපට හමු වෙයි. නොබෝ කලෙකින් ම උතුරු ඉන්දියාවෙහි සිට දකුණු ඉන්දියාව දක්වා ප්‍රාදේශීය භාෂාවලින් රචිත අනුකරණ හා පරිවර්තන පහළ වන්නට වෙයි. පුරාණ වීර කාව්‍යය මුල් කොට ගෙන ක්‍රි. ව. 1574 දී සුප්‍ර සිද්ධ තුල්සි දස් විසින් රචිත රාම් චරිත් මානස් නම් ආගමික දර්ශනික ඛණ්ඩ කාව්‍යය ලක්ෂ සංඛ්‍යාත ඉන්දීය ජාතිකයන් සඳහා ශුද්ධ ග්‍රන්ථ යක් බඳු ව පවතී. ඉන්දියාව මුළුල්ලෙහි වසන හින්දු භක්තිකයන් පර පූරක් පරපුරක් විසින් මෙ බඳු නූතන පරිවර්තන මඟින් රාම පිළිබඳ පැරණි පුරාවෘත්තය දැන හැඳිනගෙන ඇත. ධනවතුන් ගේ ගෙවල අද පවා මේ කාව්‍යය කියවීමට විධිවිධාන සලස්වනු ලැබේ. ඉහතින් හරිවංශ යෙහි මත් සඳහන් වූ පරිදි (ඉහත පිටුවේ සටහන බලන්න) රාම කථාන් තරයෙහි නාට්‍යමය අනුවාද ද ඉන්දියාවෙහි ගම්වලත්, නගරවලත් පැවැත් වෙන ආගමික උත්සවයන්හි දී අද දක්වා රඟ දක්වනු දැකිය හැකි ය. මේ අනුව, උතුරු ඉන්දියාවෙහි, උදා: ලාහෝරයෙහි වාර්ෂික දස්සර සැණ කෙළිය "රාම—නාට්‍යය" (රාම් ලීලා) රඟ දැක්වීමෙන් උත්සවාකාර යෙන් පැවැත්වෙයි. මෙහි දී රාමායණයෙහි බොහෝ ජනප්‍රිය වූ සිද්ධි අති විශාල ජනකායක් ඉදිරියෙහි රඟ දැක්වෙයි.[2] ඉන්දියාව මුළුල්ලෙහි ව්‍යාප්ත ව පවත්නා භක්ති විශේෂයක් වූ හනුමත් නම් වානර රාජයාට ප්‍රාදේශීය දෙවියකු ලෙස ලැබෙන පූජා සත්කාර සහ සාමාන්‍යයෙන් වානර පුරාණතර වානර ලබ්ධියක් අනුව විස්තර කළ යුතු ද යනු මෙ තෙක් නිරා කරණය නොවූ පැනයෙකි. ඒ කෙසේ වුව ද, හනුමත් නම් වානර රාජයා ගේ පිළිමයක් නැති එක ද විශාල ගමක් ඉන්දියාවෙහි නැති බව නම් ඒකාන්ත ය. දේවාලය බොහොමයක් ද වඳුරන්ගෙන් පිරී ඇති අතර එන් කෙරෙහි මහත් ඉවසීමක් හා මෛත්‍රීයක් ද දැක්වෙයි. රාම වාසස්ථාන කොට ගත් පුරාණ නුවර වූ ඔඅද්ධි තත්ත්වය විශේෂයෙන් මෙ සේ ය.

රාමායණයෙහි කථා නායකයා වූ රාම, විෂ්ණු අවතාරයක් බවට පත් ව දෙවියකු ලෙස පූජාවට ලක් වූයේ පසු වකවානුවෙක විය යුතු ය. අනතුරු ව මේ දිව්‍යමය රාම ගැන ලියැවුණු වීර කාව්‍යය ශුද්ධ ග්‍රන්ථයෙක ස්වරූපය

උසුලන්නට වීම විස්මයට කරුණක් නො වේ. මේ අයුරු පළමු වන සර්ගය අවසානයෙහි මෙසේ කියනු ලැබේ.

ඉදං පවිත්‍රං පාපඝ්නං පුණ්‍යං වේදෛශ්ච සංමිතම්
යඃ පඨේද් රාමචරිතං සර්වපාපෛඃ ප්‍රමුච්‍යතේ
ඒතදාර්ෂනමායුෂ්‍යං පඨන් රාමායණං නරඃ
සපුත්‍රපෞත්‍රඃ සගණඃ ප්‍රේත්‍ය ස්වර්ගේ මහීයතේ
පඨන් ද්විජෝ වාගෘෂභත්වමීයාත් සාඅත් ක්ෂත්‍රියෝ භූමිපතිත්වමීයාත්
වණිග්ජනඃ පණ්‍යඵලත්වමීයාජ්ජනඃ ශූද්‍රෝපි මහත්ත්වමීයාත්

(1—1—98—100—රාමායණ.)

පව් නසන්නා වූ ද වේදය මෙන් පවිත්‍ර වූ ද රාම ගේ චරිත කථාව විස්තර කරන්නා වූ මේ උතුම් කාව්‍යය කියවන කවරෙක් නමුත් සියලු පව්වලින් මිදේ.

දීර්ඝායුෂ බල ලබාදෙන්නා වූ මේ රාමායණ ආඛ්‍යානය කියවන කවර පුද්ගලයෙක් නමුත් ස්වකීය සියලු ඥාතිගණයා ද සමඟ ස්වර්ගයට පත් වේ.

මෙය කියවන බ්‍රාහ්මණ තෙමේ වාග්චාතුර්යය අතින් අග තැන් පත් වෙයි; ක්ෂත්‍රියයා රාජ්‍යයට හිමිකම් ලබයි; ව්‍යාපාරිකයා වෙළෙඳාමෙන් මහත් ඵල ලබයි; ශූද්‍රයාට ද උසස් තැන් හිමි වේ.

සාපයක් නිසා නාගයකු බවට පෙරළී, මුළු රාමායණය ම එක ම දිනයක් ඇතුළත කියවා අවසන් කරනු අසා සිටිය හොත් විනා සාපයෙන් මිදෙනු නො ලද II වන දුමෝදර නම් කාශ්මීර රජු පිළිබඳ පුරාවෘත්තය ද වැදගත් ය.

මහාභාරතය සම්බන්ධයෙන් සිදු වූ පරිදි, රාමායණය ද එහි මූල් ස්වරූපයෙන් නො ව, අමුතුවෙන් එකතු වූ කරුණු හා වෙනස් කිරීම් ද නිසා ප්‍රමාණයෙන් විශාල වී, විකෘත වී අප අතට පත් වීමට හේතුව රාමායණයෙහි ජනප්‍රියත්වය ම ය. අද දක්නට ලැබෙන පරිදි මේ කෘතිය සප්ත කාණ්ඩයෙකින් හා 24,000ක් ශ්ලෝකවලින් හා සමන්විත වේ. එහෙත්, මින් පුරාණ අවධියකට හෝ පසු අවධියකට හෝ අයත් වනුයේ කවර කොටස් ද, සැබෑ හෝ ව්‍යාජ හෝ වනුයේ කවර කොටස් ද යනු තීරණය කළ හැක්කේ කාව්‍යයෙහි වස්තු විෂය සැකෙවින් සලකා බැලීමෙන් ඉක්බිති ව ය.

රාමායණයෙහි වස්තු විෂය[1]

බාලකාණ්ඩ (බාල විය පිළිබඳ කොටස) නම් ලත් 1 වන කාණ්ඩය කාව්‍යයෙහි මූල පිළිබඳ හැඳින්වීමකින් ආරම්භ වී රාම ගේ බාල විය ගෙන හැර දක්වයි. එහෙත් මහාභාරතයෙහි මෙන් මේ කෘතියෙහි ද අපමණ බ්‍රාහ්මණ දේව කථා හා පුරාවෘත්ත ඇතුළු කිරීමෙන් කථා වස්තුව විරින් වර බිඳෙයි. මෙයින් ඇතැම් පුරාවෘත්ත මහාභාරතයෙහි නා නා සැකැසුම්වල ද දක්නට ලැබෙන ඒවා ම ය. මෙසේ, මුලින් ම දැන ගත් **සෘෂ්‍යශෘඞ්ග** පුරාවෘත්තය ගෙන හැර දැක්වීමට ඔහු ගැන සඳහන්

මාත්‍රයක් ප්‍රමාණවත් වෙයි.[3] ඇත අනීතයෙහි පටන් ප්‍රසිද්ධ වශිෂ්ඨ සහ විශ්වාමිත්‍ර යන ඍෂිවරුන් පැමිණීමෙන් මොවුන් පිළිබඳ අනේක පුරා වෘත්ත ගෙන හැර දැක්වීමට මහ හෙළි වෙයි. මේ සේ, විශේෂයෙන් ම, බ්‍රාහ්මණයකු ලෙස උපදිනු වස් විශ්වාමිත්‍ර තපස් රැකි අන්දමත්, මේනකා සහ රම්භා නම් අප්සරාවන් විසින් මේ ඍෂිවරයා පොළඹවා ගැනීමට කරන ලද උත්සාහයත් පිළිබඳ කථා විස්තර සහිත ව කියැවෙයි.[4] පැරණි ශුනඃශේප පුරාවෘත්තයත් විශ්වාමිත්‍ර පුරාවෘත්ත මාලාවට ඇතුළත් වෙයි[5] සෙසු පුරාණ දේව කථා හා පුරාවෘත්ත අතුරෙන් විෂ්ණු ගේ වාමන අවතාරයත් (1.29) කුමාර හෙවත් කාර්තිකේය නම් රණ දේවතාවා ගේ උපතත් (1.35—37) 60,000 සාගර පුතුන් සහ දෙව් ලොවින් ගංගා බැසීමත් (ගංගාවරෝහණය) පිළිබඳ[6] කතා පුවත් සහ සුරාසුරයන් සයුර කැලඹීම[7] පිළිබඳ පුරාවෘත්ත ද සඳහන් කළ හැකි ය.

ශ්ලෝකය නිපදවීම පිළිබඳ රමණීය කථා වස්තුව පමණක් අපි සැදින්වීමෙන් උපුටා දක්වමු.[8]

වනාන්තරයෙහි ගංගා තීරයෙක සැරි සරමින් පසු වන වාල්මීකී මිහිරි ගී ගයමින් තණ බිස්ස මත පැන පැන සිටින කිරළ ජෝඩුවක් දකියි. හදිසියෙන් ඒ තැනට පැමිණි දුෂ්ට දඩයක්කාරයෙක් දුන්නෙන් විද පක්ෂියා මරා දමයි. පක්ෂියා ලෙයින් නැහැවී වැතිර සිටින අතර පක්ෂි ඩෙනුව සිත් කම්පා කරවන ස්වරයෙන් වැලපෙන කල්හි අනුකම්පාවෙන් පිරුණු හදින් යුත් වාල්මීකී දඩයක්කරුට සාප කරයි. එහෙත් සාප යෙහි වචන මාලාව නිරැන්සාහයෙන් ම ශ්ලෝකයක් ලෙස මුවින් පිට වෙයි. ඒ කල්හි මහා බ්‍රහ්මයා පැමිණ මේ වෘත්තයෙන් ම රාම ගේ වික්‍රම පිළිබඳ ව ගුණ ගායනය කරන ලෙස කවියා ගෙන් ඉල්ලා සිටී.

රාම ගේ බාල විය සම්බන්ධයෙන් 1 වන කාණ්ඩයෙහි පහත දැක්වෙන කරුණු කියැවෙයි:

කොසොල් (ගංගා නදියෙන් උතුරෙහි) රට අයෝධ්‍යා නුවර (වර්තමාන ඔෆ්ද්) දශරථ නම් බලපරාක්‍රමයෙන් යුත් නැණවත් රජෙක් වෙසෙයි. බොහෝ කලකට ඔහුට දරුවෙක් නො වී ය. ඒ කල්හි හෙතෙම අශ්වමේධයක් පැවැත්වීමට සනිටුහන් කළේ ය. මේ මහා යාගය පවත්වන පූජකයා වශයෙන් ඍෂ්‍යශෘඞ්ග ඍෂිවරයා ගේ සේවය ලබා ගැනෙයි. දුතුන් ලබා දීමට වන, විශේෂයෙන් බලවත් බිලි පූජාවක් ඍෂ්‍යශෘඞ්ග කරයි. මේ වකවානුවෙහි දී ම රාවණ නම් අසුරේන්ද්‍රයා ගෙන් දෙව් ලොව සුරයනට පීඩා පැමිණෙයි. මේ හේතුවෙන් විෂ්ණු දෙවියන් ගේ පිහිට අයැද සිටින ඔහු, මිනිස් ලොව ඉපිද, රාවණ ගේ දිවි නෙර කරන ලෙස ඉල්ලා සිටිති; මීට එකඟ වන විෂ්ණු දශරථ ගේ දුතුයා ලෙස මෙ ලොව ඉපදීමට තීරණය කරයි. මෙ සේ අශ්වමේධය අවසානයෙහි දශරථ රජු ගේ බිසෝවරුන් ති දෙනාට පුත්තු සිව් දෙනෙක් උපදිති: කෞශල්‍යාට (විෂ්ණු ගේම අවතාරයක් ලෙස) රාම ද, කෛකේයීට භරත ද සුමිත්‍රාට ලක්ෂ්මණ හා ශත්‍රුඝ්න ද උපදිති. මේ කුමරුන් සිව් දෙන අතුරෙන් දෙවු පුත් රාම පියාණන් හට ප්‍රියතම වෙයි. එහෙත් බාල වියෙහි පටන් ම ලක්ෂ්මණ සිය දෙවු සොහොයුරාට තද ඇල්මක් දක්වයි. ඔහු ගේ දෙ වන ආත්මයක් බඳු වූ හෙතෙම ඔහු ගේ සියලු මන දොළ වචනයෙන් ප්‍රකාශ කිරීමටත් පෙර සපුරා ලී ය.

කුමරුන් යොවුන් වියට පත් කල්හි විශ්වාමිත්‍ර නම් මහා ඍෂිවරයා දශරථ රජු ළඟ රාජ සභාවට පැමිණියේ ය. යකුන් සෙනඟ පිණිස ඔහු සඳහා ගිය රුමටත්, ලොව්තුරු ඍෂිවරයා ආනුභාවසම්පන්න ආයුධ තැබූ කලේ ය. විදේහ දේශයේහි ජනක **රජ** තුමා ගේ රාජ සභාවට ද විශ්වාමිත්‍ර තෙමේ දෙ දෙනා කැටුව යති. ජනක රජු සතු **සීතා** නම් වූ කුමරියක් වූවා ය. සාමාන්‍ය ශුභනිමිත්තක නොවූ බව තොමෝ, දිනක් රජු සොයා බැය සීසෑන කල්හි පොළොව දෙ බෑ කරගෙන උපන්නී ය; මෙ හේ 'හිඳ සිට' යන අරුතින් 'සීතා' යන නාමය ඇයට ලැබිණ. ජනක රජ ඇය දුවක ලෙස ඇති දැඩි කෙළේ ය. මේ රජුට අද්භූත දුන්නක් විය. මේ දුන්න නැගිය හැකි පුද්ගලයාට පමණක් සිටිය නම් සිය දියණියන් සරණ පාවා දෙන බව රජ තුමා පළ කර සිටියේ ය. කුමරුන් රාත්‍රියේ එ' වෙනුවෙන් ගත් උත්සාහය ව්‍යර්ථ ව තිබිණ. එ කල්හි රාම පැමිණ, සෙසු නාවමින් දුන්න දෙ කඩ කරමින් දුන්න නැඟී ය. ඉමහත් ප්‍රීතියට පත් රජ සිය දුව ඔහුට විවාහ කොට දෙයි. දශරථ හට මේ පුවත් සැළ කරනු ලැබ, කැදවා ගත් පසු ව මහත් ප්‍රීතිප්‍රමෝදයෙන් රාම සහ සීතා ද අතර විවාහෝත්සවය සිදු වෙයි. ඉන් ඉක්බිති දෙ දෙනා දිගු කලක් වාසනාවන්ත, ප්‍රීතිමත් ජීවිතයක් ගත කළෝ ය.

කථාන්තරය සැබවින් ම ඇරඹෙනුයේ, **අයෝධ්‍යා නුවර රාජ සභාවේ** සිදු වන සියල්ල වැනෙන හෙයින් **අයෝධ්‍යා කාණ්ඩය** නම් ලැබී II වන **කාණ්ඩයෙනි.**[1]

මහලු විය ළඟා වත් ම, සිය ප්‍රියතම පුත් රාම කුමරුට සිහසුන හිමි කිරීමට තීරණය කොට ගත් දශරථ රජ, වශිෂ්ඨ නම් සිය පුරෝහිතයා ලවා රාජාභිෂේකය සිදු කෙරෙන සඳහා සියල්ල සූදානම් කරවී ය. මේ සූදානම දුටු කෙකෙයී බිසව ගේ කුදු දුසිය ඇති ඥාමි දුව ගේ පුත්, භරත හට සිහසුන හිමි කරන ලෙස රජු ගෙන් අයැද සිටීමට තෙරපෙයි. බිසව ගුහුසුළු කරවයි. වරක් රජ තුමා ඕ හට වර දෙකක් ම දී තිබුණු නමුත් මේ දෑ ඇය විසින් එ' වර නොඉල්ලන ලදි. රාම කුමරු තුදුස් වසකට රටින් නෙරපීමටත්, සිය පුත් භරත හට සිහසුන හිමි කිරීමටත්, මේ අවස්ථාවෙහි ඕ රජු ගෙන් වර ඉල්ලයි. රජ බෙහෙවින් අවෙර්යවත් වන නමුත්, ප්‍රතිඥා කඩ කිරීමේ වරදට සිය පියාණන් හසු නොවනු පිණිස රාම මේ දුවත දැනගත් වහා ම රටින් පිටමං ව සිරිමට මොහොතකටවත් හෝ පසුබට නො වෙයි. ඔහු ගේ මැණියන් වූ කෞශල්‍යා ද, සොහොයුරු ලක්ෂ්මණ ද ඔහු රඳවා ගැනීමට දරන සියලු උත්සාහ ව්‍යර්ථ වෙයි. සිය පියාණන් ගේ ප්‍රතිඥාව සොබාදිවැට උපකාර වීම සිය පරම යුතුකම යැයි හෙතෙම උදක් ම පවසයි. තමා රටින් පිටුවහල් වී වනයෙහි වාසය කිරීමට තීරණය කළ බව වහා ම සීතා නම් සිය බිරියට ද හෙතෙම කැඳ කර සිටී. භරත සමඟ මිත්‍ර ව, දශරථ ගේ රාජ සභාවෙහි බඹුරන රකිමින්, දැහැමි ජීවිතයක් ගත කිරීමටත්, සිය පියාටත්, මව්වරුනටත්[2] කීකරු ව ඔවුන් ගේ ඕනෑ එපාකම් පිරිමැසීමටත් රෝ ඇයට අවවාද කරයි. එහෙත් භාර්යාවක ගේ යුතුකම් පිළිබඳ ව ඉගැන්වූ දේශනයකින් පිළිතුරු දෙන සීතා ඔහු කැවිව ඇය ද, අරණ්‍යවාසයට යාමේ කිසිම සේත් වැළැක්විය නොහැකි බව පවසයි:

ආර්ය පුත්‍ර පිතා මාතා භ්‍රාතා පුත්‍රස්තථාස්නුෂා
ස්වානි පුණ්‍යානි භුංජානාः स्वं भागमुपः सते
භර්තුර් භාග්‍යං තු නාර්යේකා ප්‍රාප්නෝති පුරුෂර්ෂභ
අතශ්චෛවාහමාදිෂ්ටා වනේ වස්තව්‍යමිත්‍යපි
න පිතා නාත්මජෝ නාත්මා න මාතා න සඛි ජනා
ඉහ ප්‍රේත්‍ය ව නාරිණාං පතිරේකෝ ගතිः සදා
යදි ත්වං ප්‍රස්ථිතෝ දුර්ගං වන මද්යෛව රාඝව

අග්‍රතස්තේ ගමිෂ්‍යාමි මෘද්ගන්තී කුශ කණ්ටකාන්
ඊර්ෂ්‍යාං රෝෂං බහිෂ්කෘත්‍ය භුක්තශේෂමිවෝදකම්
නය මාං වීර විස්‍රබ්ධඃ පාපං මයි න විද්‍යතේ
අග්‍රතස්තේ ගමිෂ්‍යාමි හෝක්ෂ්‍යේ භුක්තවතිත්වයි.
ඉච්ඡාමි පරතඃ ශෛලාන්පල්වලානි සරාංසි ච
ද්‍රෂ්ටුං සර්වත්‍ර නිර්භීතා ත්වයා නාථේන ධීමතා
හංසකාරණ්ඩවාකීර්ණාඃ පද්මිනීඃ සාධුපුෂ්පිතාඃ
ඉච්ඡේයං සුඛිනි ද්‍රෂ්ටුං ත්වයා වීරේණ සංගතා
අභිෂේකං කරිෂ්‍යාමි තාසු නිත්‍යමනුව්‍රතා
සහ ත්වයා විශාලාක්ෂ රංස්‍යේ පරම නන්දිනී
ඒවං වර්ෂසහස්‍රාණි ශතං වාපි ත්වයා සහ
ව්‍යතික්‍රමං න වේත්ස්‍යාමි ස්වර්ගෝපි හි න මේ මතඃ
ස්වර්ගේපිච විනා වාසෝ භවිතා යදි රාඝව
ත්වයා විනා නරව්‍යාඝ්‍ර නාහං තදපි රෝචයේ

(11—27 රාමායණය)

ස්වාමිනි, මාතෘපිතෘ සහෝදරාදීහු, ඔවුන් විසින් කරන ලද පින්වලට අනුව ලබන ලද භාග්‍යය ඇත්තාහු වෙති. එහෙත් භාර්යාවට මෙ ලොව දී උරුම වනුයේ ඇගේ ස්වාමියාට ලැබෙන ඉරණමෙන් කොටසෙකි. එ හෙයින් දැන්, ඔබ වනයට යවන රජ අණට මම ද යටත් වෙමි. මාපිය පුත්‍රාදීන් කෙරෙහි හෝ තමා ම වෙතෙහි වුව ද බිරියකට ආරක්ෂාවක් නො ලැබෙයි. ඔවුන් සිටිය දී මෙන් ම ඔවුන් මෙ ලොවින් තුරන් ව ගිය කල ද ඇයට ලැබෙන එක ම ආරක්ෂාව ස්වාමියා ය. එ හෙයින්, රඝු පුත්‍රය, වනදුර්ගවලින් ගහණ වූ දණ්ඩකාරණ්‍යය කරා ඔබ පා නැඟේ නම්, ඊට පෙරටු ව, එහි තිබෙන කටු ලැහැබි කුස තණ පියෙස් ආදිය මැඩගෙන මා දෙ පා මෙහෙයැවෙනු ඇත. මා ඔබ සමඟ එහි එන විට, ඊර්ෂ්‍යයා ක්‍රෝධදි කිසිදු අවගුණයක් නො ගෙනෙමි. නිර්භීත වූ ප්‍රඥාවන්ත වූ ස්වාමිනි, එහි දී ප්‍රීතියෙන් ප්‍රබෝධවත් වූ සිතින් ඔබ ළඟින් හිඳගෙන, කඳු පියෙස් දෙස බලා සිටීම ද, හංසකාරණ්ඩාදි පක්ෂීන් ගෙන් පිරී ගත් මනහර වූ පිපුණු පියුම් විල්වල සෞන්දර්යය විඳීම ද කැමැත්තෙමි. ඒ සේ ම එ බඳු ජලාශයන්හි බැස සිසිල් දියෙන් ගත සනහමින් ඔබ සමඟ ජල ක්‍රීඩා කරනු රිසියෙමි. මේ අයුරු ඔබ සමඟ එකට වෙසෙමින් කල් යවතොත්, වර්ෂ සහස්‍රයක් වුව ද, එක ම ප්‍රීතිමත් දිනයක් මෙන් ගෙවෙනු ඇත. එහෙත්, ඔබ හැර හිමියනි, මට සුර ලොව වාසයෙහි වුව ද සැපතෙක් නැත.

සීතා ගේ තිර අදිටන ක්‍රියාවෙහි යොදවනු වළකනු පිණිස රාම අරණ්‍යවාසයෙහි භයානක උවදුරු සියල්ල විස්තර කරයි. එහෙත් ස්ථිර සිතින් සිටින ඕ වියෝගයකට තරයේ විරුද්ධ වෙයි; පුරාණයෙහි සාවිත්‍රී කුමරිය සත්‍යවත් කැවුව ගිය අයුරු තමා ඔහුට යන්නට හැර නොරඳන බව ඕ පවසයි.

අවසානයෙහි රාම සීතා කැටි ව ආරණ්‍යවාසයට යාමට එකඟ වෙයි. නොවෙතස් සිතින් යුත් ලක්ෂ්මණ ද සිය සොහොයුරා සමඟ වනයට නික්මීම නො වැළැක්විය හැකි ය. රජින් නෙරපූ මේ සියලු දෙන වල්කලා පෙරෙව මහා ජනකාය ම දුක් වෙමින් සිටිය දී වනයට නික්මෙති.

එහෙත් දශරථ රජතුමාට පුත්‍ර වියෝගය වාවා ගත නොහැකි ය. රාම පිටුවාසල් ව ආරණ්‍යගත වූ නොබෝ දිනකින් රජ මැදියම් රැයෙහි නොසන්සුන් නින්දකින් අවදි වෙයි. ඒ කල්හී යොවුන් වියෙහි දී කළ පාපයක් ඔහුට සිහි වෙයි. දඩයමෙහි යෙදී සිටිය දී වරක් තමා නොදැනුවත් ව ම තවුස් මානවකයකු ගේ දිවි නොර කළ අන්දමත්, ඔහු ගේ අන්ධ පියා තමා පුත්‍ර වියෝගයෙන් මිය යනු ඇතැයි සාප කළ අන්දමත් හෙතෙම කෞශල්‍යාට කියා සිටී කරයි. මේ සාපයෙහි විපාක විඳිය යුතු ය:

කශ්ච ප්‍රාථාජ්‍යමානෝ වා නාසූයේත් පිතරං සුතඃ
චක්ෂුෂා ත්වාං න පශ්‍යාමි ස්මෘතිර්මම විලුප්‍යතේ,
දූතා වෛඝ්තයෙෂ්‍යන්තේ කෞශල්‍යේ ක්‍රියතාමිති මාම්
අනඃස්තු සෝ දුඃඛතරං යදහං ජීවිතාඃක්ෂයෙ,
න හි පශ්‍යාමි ධර්මඥං රාමං සත්‍ය පරාක්‍රමම්.
තස්‍යාදර්ශනජඃ ශෝකඃ සුතස්‍යාප්‍රතිකර්මණඃ
උච්ඡෝෂයති මේ ප්‍රාණාන්වාරිස්තෝකමිවාතපඃ

(II—65—68, රාමායණ)

මෙහේ ද ඔන්න් දැන් මට ඔබ නොපෙනෙයි. මගේ ඔඟිය ද අඛු ව යයි. කෞශල්‍යාවෙනි, මරහු ගේ දූතයෝ විත් මා වටා ඔට මගේ ගමන ඉක්මන් කරවති. ඉදින් මගේ මේ මරණ මංචකයෙහි දී මට, මා පුත්‍ර ගුණවත්, අවංක, වීර්යබලපරාක්‍රමයෙන් යුත් රාම දක්නට නොලැබුණ හොත් ඊට වඩා බලවත් කවර දුකෙක් ද? ඒ මාගේ පුත්‍රයා නොදැකීමෙන් උපන් ශෝකයෙන්, ඊට ප්‍රතිකර්මයක් නොයෙදීම නිසා දැන්, සූර්යතාපයෙන් වියැළී යන දිය බිඳක් මෙන්, මගේ ප්‍රාණය එකතින් ම වියැළී යයි.

රජ තුමා ගේ මරණයෙන් පසු ව රජගහ නුවර වාසය කරන භරත කැඳවා, කෙකේයී නම් ඔහු ගේ මව මෙන් ම ඇමැති පිරිස ද සිහසුන භාර ගන්නා ලෙස ඔහු ගෙන් ඉල්ලා සිටිති. එහෙත් ඊට කොහෙත් ම සවන් නොදෙන භරත, රාජ්‍ය ධුරය රාම සතු බවත්, තමා ඔහු කැඳවා එන බවත් තරයේ ප්‍රකාශ කරයි. විශාල ජනකායක් පිරිවරා ගත් සේ සිය සොහොයුරා කැටුව ඒමට නික්මෙයි. මේ අතරතුර චිත්‍රකූට පර්වතයෙහි වසන රාම තමා ඉදිරියෙහි දිස් වන මනස්කන්ත දර්ශනය වර්ණනා කරමින් සීතා සමඟ පසු වන මෙලෙහාතෙහි දූලි වලා නැගෙන අන්දම පෙනෙන්නට වෙයි; ළඟ එන යුද සේනාවක හඬ ද ඇසෙන්නට වෙයි. ගසකට නඟින ලක්ෂ්මණ භරත ගේ හමුදාව ළඟා වනු දකියි. මෙය සතුරු ආක්‍රමණයෙකැයි සිතන හෙතෙම මහත් කෝපයට පත් වෙයි. එහෙත්, භරත යුද හමුදාව රඳවා, හුදෙකලා ව තමන් වෙත පැමිණෙන බව ඔහුට පෙනෙයි. රාම වෙත පැමිණෙන භරත ඔහු ගේ දෙපා මුල දණින් වැටෙයි; අනතුරු ව සොහොයුරෝ ඔවුනොවුන් වැලඳ ගනිති. ඉක්බිති භරත කඳුළු සලමින්, තමනටත්, කෙකේයී නම් තම මවටත් දොස් පවරමින් සිය පියාණන් ගේ අභාවය පිළිබඳ දුවන රාමට සැළ කොට, පෙරළා රාජධානියට පමිණ රාජ්‍ය පාලනය භාරගන්නා ලෙස ඉල්ලයි. ඔහුට හෝ ඔහු ගේ මවට හෝ තමා දෝෂාරෝපනය නොකරන බව කියන රාම සිය පියා ගේ විධානය දැනුදු තමා විසින් පිළිපැදිය යුතු බවත්, තුදුස් වසක් ආරණ්‍යගත ව විසීමේ තීරණය වෙනස් නොකරන බවත් පවසයි. තම පියාණන් ගේ අභාවය ගැන නැවත සිහිපත් කරවන භරත ගේ ආයාචනයෙන් පලක් නොවේ. හඬමින්, වැලපෙමින් රාම පර ලෝ පත් අය සඳහා අවමඟුල් වාරිත්‍ර ඉටු කරන නමුත් සිය තීරණයෙහි දැඩි ව පිහිටා සිටියි. ජීවිතය ස්වභාවයෙන් ම, අවශ්‍යයෙන් ම අනියත බවත්, මරණය නියත බවත්, මේ අනුසාරයෙන් සීතා බැලූ කල ඒ ගැන වැලපීමට හේතුවක් නැති බවත් කියමින් ඉතා අගනා අවවාදාත්මක කථාවකින්, රාම දුකින් පෙළෙන සිය සොහොයුරා අස්වසයි;

" සියලු ම රාශීහු කුඩා කැබලිවලට බිඳී යාමෙන් කෙළවර වෙති;
උසට නැඟී සිටි ස්කන්ධ අවසානයේ දී ඇද වැටිය යුතු ය;
සෑම සම්ප්‍රයෝගයක් ම විප්‍රයෝගයෙන් කෙළවර වෙයි;
සියලු ම සත්ත්වයන් ගේ ජීවිතය මරණය අන්ත කොට ඇත්තේ ය;
ගස්වල පැසී පවත්නා ගෙඩි, කලින් ම පොළොවට වැටෙනු නියත ය;
මෙ ලොව මනුෂ්‍යයෝ ද ඒ නයින් වයසින් පැසුණු කල, මරණයට ගොදුරු වෙති;
ගෙවල් දරා සිටින කණු දිරාපත් වූ කල,
ඒ ගෙවල් ඇද හැලෙන්නාක් මෙන්,
වයස්ගත වීමෙන් ජීව ශක්තිය පිරිහී ගිය විට,
මිනිසුන් ගේ ශරීර ද බිඳ වැටෙයි;

සංගරය මතු පිට පාවෙමින් තිබිය දී
අහම්බෙන් එකට ගැනීමට සැලැස්වෙන
ලී කැබලි, වැඩි කල් ඒ සේ එකට නො තිබිය දී
සුළඟින් හෝ දියරැල්ල මඟින්
වෙන් කෙරෙන්නා මෙන්,
අප අපේ යයි කියමින් මහත් ආදරයෙන් තබාගත්තා වූ
භාර්යාවන්, දූ දරුවන්, ඥාතිවරුන්, හවමේගයම්පත් ආදි
කවරක් වුව ද, හෙට අප ගෙන් උදුරාගෙන යනු ඇත.
මාර්ගයෙහි සිටින මිනිසකු
සම බිම ඔස්සේ සෙමෙන් ගමන් කරන
සාර්ථවයකු දැක "මමත් ඔබ පස්සේ එන්නෙමැ" යි
කෑ ගසා කියන්නා සේ
මිනිසුන් ද, ඔවුන් ගේ ආදි මුතුන්මිත්තන්
ගමන් කළ පරණ මඟෙහි ම
යා යුතු ය.
සොබාදහම දක්වන ගමන් මඟින්
කිසිවකුටත් සොරෙන් හෝ පිට නො පැනිය හැකි හෙයින්,
ඔබ ගේ ඉරණම ගැන කුමට තැවෙන්නෙහි ද[12]?"

රාජ්‍ය පාලනය අරඹනු යයි රාම ගෙන් ඉල්ලා සිටීමට ඇමැති පිරිස ද පැමිණෙති. මවුවුන් ගෙන් කෙනකු වූ ජාබාලි නම් බෙහෙවින් මිඥදිවූ, නාස්තික මත දරන්නෙක් ඔහු ගේ සදාචාර අදහස් පලවා හැරීමට තැත් කරයි. සෑම අයකු ම තමන් සඳහා ජීවත් වන බවත්, මව්පියන් ගැන කරදර නො විය යුතු බවත්, මරණය සියල්ල අවසාන කරන බවත්, පරලොවක් පිළිබඳ කතා තුට් පූජකයන් විසින් දක්ෂිණා ලබා ගැනීමේ පරමාර්ථ යෙන් පතුරුවනු ලබන බවත්, මේ සියල්ල හේතු කොට ගෙන ඔහු බැවහර තුවණ මෙහෙයවමින් සිංහාසනාරූඪ විය යුතු බවත් හෙතෙම පවසයි. මේ නාස්තිකවාදියා ගේ ඉගැන්වීම රාම වේගවත් වදනින් හෙළා දකියි.[13] වාශිෂ්ඨ නම් දැහැමි පූජකයා ගේ වදනින් පවා ඔහු ගේ තීරණය නො සෙල්විය හැකි ය. ඒ හෙයින් අවසානයෙහි රාම වතුවෙන් රජකම් කිරීමට එකඟ වීමට හරතට සිදු වෙයි. රාම රාජ කකුධ භාණ්ඩයක්[14] ලෙස සිය මිටිවැඩි සඟල හරත හට දෙයි. හරත ඒය රැගෙන අයෝධ්‍යා නුවරට අවුත් රජ තුමා හඟවන සංකේතයක් වශයෙන් මිරිවැඩි සඟල ගෞරව කාරයෙන් ඔහසුන මත තබා, රාම ගේ නියෝජිතයකු ලෙස රට පාලනයෙහි යෙදෙනු පිණිස නන්දිග්‍රාමය වාසස්ථානයකට ගනියි.

මේ පිටුවාසල් කරනු ලබුවන් ගේ වන ජීවිතය වර්ණනය කරන බැවින් "අරණ්‍ය කාණ්ඩ" නම් ලත් III වන කාණ්ඩයෙහි ආරම්භයෙහි පටන් අප සැබෑ ලෝකයෙන් ඉවත් ව අද්භූත සුරංගනා ලෝකයකට පිවිසුණාක් මැන්න; කාව්‍යය අවසාන වන තෙක් අපි ඒ ලෝකයෙන් පිට නොවන් නෙමු. ඉන්දියාවේ රජ කුමරකු ගේ රාජ සභාවෙහි ජීවිතය විදහා දක්වන කාණ්ඩය, ඉන්දියාවෙහි වරක් දෙ වරක් නො ව කිහිප වරක් සැබවින් ම සිදු වූ රාජ්‍ය කුමන්ත්‍රණයෙකින් ඇරඹෙයි. මේ කතා පුවතෙහි එක ම අද්භූත ලක්ෂණය නම් රාම සහ හරත යන සොහොයුරන් දෙ දෙනා ගේ අසීමිත ත්‍යාගශීලී භාවයයි. එහෙත් III වන කාණ්ඩය ආරම්භ වනයේ රකුසන් බදු ආශ්චර්යවත් සත්ත්වයන් සමග රාම කළ සටන්වලින් හා ඔහු ගේ වීර ක්‍රියාවලිනි.

රජින් නෙරපනු ලැබූ මේ පිරිහ දිගු කලක් දණ්ඩකාරණ්‍යයෙහි වහන කල, එහි ඉසු තාපසයෝ රකුසන් ගෙන් තමන් බේරා ගැනීමට රාම ගේ පිහිට ඉල්ලා සිටියේ ය. මේ ආරක්ෂාව සැලැසීමට පොරොන්දු වන රාම මෙ තැන් පටන් මේ බිහිසුණු සතුන් හා නිරන්තර සටනක යෙදී සිටියි. පළඹුවෙන් ගෙතනය කැරෙතුගේ විරාධ නම් මිනීමස් බුදින යෝධයා ය.[15] රාවණ ගේ මොහොයුරිය වූ සූර්පණඛා (කුල්ලක් තරම් විශාල නිය ඇති) මුණ ගැසීම පිටුවාහල් කරනු ලැබූවනට විශාල අහංගත්‍වයක් විය. රාම පිළිබඳ සිත් ඇති කර ගන්නා මේ රාක්ෂසිය තුරා වදනින් ඔහු පොළඹවා ගැනීමට තැත් කරයි. එහෙත් ඔහු මෙතෙක් අවිවාහක සිය මොහොයුරු ලක්ෂ්මණ වෙත ඇය යවයි.[16] ලක්ෂ්මණ ඇගේ ආශාවනා සියල්ල අවඥාවෙන් බැහැර කරයි. බෙහෙවින් කුපිත වූ ඇය සීතා ගිල දැමීමට සූදානම් වන කල්හි ලක්ෂ්මණ ඇගේ කන් සහ නාසය කපා දමයි. වේදනාවෙන් මොර දෙමින් ඕ ඛර නම් සිය මොහොයුරා වෙත පලා යයි. මොහු පළමු ව රකුසන් 14 දෙනකු කැටුව ද, ඉක්බිති 14,000ක් රකුසන් කැටුව ද රාමට විරුද්ධ ව සටනට එළඹෙන නමුත් රාම මේ සියලු දෙන මරයි. ඛර ද මරු මුව පත් කල්හි, සූර්පණඛා මුහුදින් එතෙර පිහිටි අද්භූත රටක් වූ ලංකාවට[17] පලා ගොස් රාම ගෙන් පලි ගැනීමට ලංකාවට අධිපති වූ ද, දසහිස් වූ ද සිය මොහොයුරු **රාවණ** නම් රාක්ෂසයා පොළඹවා ගනියි. ඒ සමඟ ම සීතා ගේ රූප ලාවණ්‍යය ද සිත් වශී කරවන සුලු අන්දමින් වර්ණනා කරන ඕ, ඇය ලබා ගෙන රාවණ පාවා ගැනීමට ද රාවණ උත්සුක කරවයි. එ කල්හි නැඟී සිටින රාවණ දඩු මෙ.නර යන්ත්‍රයෙන් අහසින් ගමන් කරමින් මුහුදු තරණය කොට, එහි තවුස් ජීවිතයක් ගත කරන මාරීච නම් සිය මිතුරා හමු වෙයි. මාරීච ගේ සහායෙන් සීතා රැකවල් කරුවන් ගෙන් වෙන් කොට සොරා ගෙන යාමට හෙතෙම සමත් වෙයි. ඇය කැටුව හෙතෙම දඩු මොනරයා පිට අහසින් පලා යයි. සීතා පිහිට ඉල්ලා කෑ ගසයි. දශරථ ගේ පැරණි මිතුරකු වූ ජටායුෂ් නම් ගිජුලිහිණියා පියාඹා එයි; රාවණ ගේ යානය විනාශ කිරීමෙහි ලා ඔහු සමත් වන නමුත් අවසානයෙහි රාවණ ඔහු පරාජය කරයි. රාක්ෂසයා නැවැත වරක් සීතා නිය පසුරින් ඔසවා ගෙන අහසින් යයි. අහසින් උසුලාගෙන යනු ලබන ඇගේ කෙස් මැටිය අලංකාර කළ මල් ගිලිහී වැටෙයි; පාදවලින් ගිලිහුණු නූපුර බිමට වැටෙයි. මද පවනින් ලෙළ දෙන අතු ඉති සහිත ගස් "බිය නොවන්නැ" යි ඕ හට පවසනු වැන්න. සිය ප්‍රියාදර දූ තුරිය ගේ වියෝගය ඉසිලිය නොහැකි පරිද්දෙන් පියුම් මුකුලිත වෙයි; සිංහ, ව්‍යාඝ්‍ර හා වෙනත් බිහිසුණු සත්තු වියරුවෙන් මෙන් සීතා ගේ සෙවණැල්ල ලුහුබැඳ දුවත්; දිය ඇලි නැමැති කඳුළින් නැහැවුණු මුහුණින් ද, නැඟී සිටින පර්වතකූට නැමැති එසවුණු අතින් ද කඳුකරය සීතා ගැන දුක් වනු වැන්න. පැහැර ගත් සීතා දැකීමෙන් සිය රැස් හකුළුවා ගත්, සුදුමැලි වූ හිරු මඬල, රාම ගේ බිරිය වූ සීතා රාවණ විසින් පැහැර ගනු ලැබුව මහාත් ශුක්තියක්, සත්‍යයක්, ධර්මිෂ්ඨතාවක්, අහිංසක බවක් තවත් ලොව නොමැති වේ" යයි (III, 52 34—39) ශෝක වනු වැන්න, එහෙත් රාවණ, පැහැර ගත් ළඳ කැටුව මුහුදු හරහා ලංකාවට ගොස් ඇය ඔහු ගේ අන්තඃපුරයට ඇතුළු කරයි. ඔහු ඇය ඔදුන් ගස් මැලිගයෙහි මැදිරියක් මැදිරියක් පාසා ගෙන යමින්, එහි සියලු ශ්‍රී විභූතිය දක්වමින්, තම පාලනයට අයත් වූ අප්‍රමාණ ඔනෂ්කන්ධය ගැනත්, අරුම්පුදුම දේ ගැනත් වර්ණනා කරති. ඉච්චා බස් තෙපලමින් හෙතෙම ඇය සිය බිරිය වීමට කැමැති කරවා ගැනීමට තැත් කරයි. එහෙත් මහත් කෝපයෙන් පිළිතුරු දෙන සීතා රාම කෙරෙහි ඇගේ පතිභක්තිය කවදා වත් නොබිඳෙන බවත්, ඔහු ගේ ස්පර්ශය කිසි කලෙක නොඉවසන බවත් පවසයි. දොළොස් මසක් ඇතුළත ඇය ඔහුට යටත් නොවුව හොත් අරක්කැමියන් ලවා ඇය පෙති ගස්වා, පාතරාසය ලෙස කා දමන බව කියමින් තර්ජනය කරයි. ඒ කල්හි හෙතෙම ඇය ගල් ලෙනක සිර කොට රාක්ෂ ස්ත්‍රීන් ගේ දැඩි රැකවල් යටතේ තබයි.

මේ අතරතුර, ආපසු පැමිණෙන රාම හා ලක්ෂ්මණ හිස් වූ අසපුව දෙස තැති ගත් සිතින් බලති. අරණ්‍යයෙහි සීතා සෙවීම නිෂ්ඵල ව්‍යායාමයක් වෙයි. හද පිරුණු ශෝකයෙන් විලාප නගන රාම ගස කොළ, ගංගා, පර්වත සහ තිරිසන් සතුන් යන හැම ගෙන් සීතා පිළිබඳ තොරතුරු විමසන නමුත් නිසි පිළිතුරක් නො ලැබෙයි. අවසානයෙහි සීතා පැහැරගෙන යන

අතර ඇගෙන් ගිලිහී වැටුණු මල් හා අබරණ ඔවුනට දක්නට ලැබෙයි; රාවණ ගේ යන යෙහි කැබැලිත්, අතන මෙතන වැටුණු ආයුධත්, සටනක් සිදු වූ බවට වෙනත් ලකුණුත් ඉක්මනින් ම ඔවුනට දක්නට ලැබෙයි. සීතා රකුසන් විසින් නොඅනුමාන ව ම මරා දමන ලදැයි විශ්වාස කරන රාම හදවත වාවා ගත නො හැකි ව ළියරු වැටුණු අයකු පරිද්දෙන් මුළු ලොව සුණු විසුණු කරන බව කියමින් ගිගුම් දෙයි. අසීමිත අහස් කුස හීයෙන් පිරවීමටත්, සුළං හැමීමට අවහිර කිරීමටත්, ගිරු රැස් විනාශ කොට, මිහි කත ඇදුරෙහි හිල්වීමටත්, ගිරි කුළු පෙරළීමටත්, සියලු විල් ඉඳවීමටත්, මහ සයුර විනාශ කිරීමටත්, ගහ කොළ මුලිනුදුරා දැමීමටත්, එ පමණක් නො ව සීතා නැවත ලබා නුදුන හොත් දෙවියන් පවා සංහාරය කිරීමටත් හේ තර්ජනය කරයි. වියරුවෙන් දොඩන කුමරු අස්වසමින් නැවත සීතා සෙවීමට පටන් ගැනීමට ලක්ෂ්මණ ඔහු කැමැති කරවා ගන්නේ මහත් අමාරුවෙනි. එ කල්හි ලෙයින් නැහැවුණු ජටායුස් නම් ගිජුලිහිණියා ඔවුනට හමු වෙයි. පණ අදිමින් ඔහු සිදු වූ සියල්ල විස්තර කරන නමුත් කථාව අවසන් කිරීමට පෙර මිය යයි. දකුණ බලා යන සොහොයුරෝ දෙ දෙන, ගර්ජන කරමින් ඇවිදින කබන්ධ නම් හිස සුන් රකුසකු බලවත් ඍජයකින් මුදවති. ඊට කෙළෙහි ගුණ සලකන කබන්ධ, සීතා ලබා ගැනීමෙහි ලා ආධාර විය හැකි සුග්‍රීව නම් වානර රාජයා සහාය කර ගන්නා ලෙස රාමට අවවාද කරයි.

කිෂ්කින්ධා කාණ්ඩ නම් 4 වන කාණ්ඩය රාම සීතා නැවත ලබා ගනු වස් වානරයා සමඟ ඇති කර ගත් මිත්‍ර සම්බන්ධය විස්තර කරයි.

සොහොයුරන් දෙ දෙන චම්පා නම් විල් තෙරට පැමිණි කල්හි එය දැකීමෙන් රාම ගේ සිතට සෝබර සිතුවිලි ගලා එයි; මේ වසන්ත සමයෙහි සොබා දහම පුබුදුවන ආකාරය දකින ඔහුට තමා කෙරෙන් දුරු වූ පෙම්වතිය සඳහා මහත් ආශාවක් පහළ වෙයි.[18] මෙහි දී සුග්‍රීව වානර රාජයා ඔවුනට ඉක්මනින් ම හමු වෙයි. **වාලින්** නම් සිය සොහොයුරා විසින් සිය බිරියත්, රාජ්‍යයත් පැහැර ගෙන, රාජධානියෙන් ද පලවා හරිනු ලැබූ බව හෙතෙම ඔවුනට සැල කරයි. එ කල්හි රාම සහ සුග්‍රීව තිර මිතුරු බැම්මක් ඇති කර ගනිති. රාම, වාලින්ට විරුද්ධ ව සුග්‍රීවට ආධාර කිරීමට පොරොන්දු වන අතර සුග්‍රීව සීතා ලබා ගැනීමේ දී රාමට ආධාර කිරීමට පොරොන්දු වෙයි. වාලින් ගේ වාසස්ථානය වූ **කිෂ්කින්ධා**[19] ඉදිරිපිට ප්‍රතිවාදී වානර දෙ බැයන් අතර සටනක් සිදු වෙයි. සුග්‍රීව ගේ සහායට පැමිණෙන රාම වාලින් මරයි. සුග්‍රීව නම් වානරයා රජු ලෙස ද, වාලින් ගේ පුත් අංගද යුව රජු ලෙස ද අභිෂේක කරනු ලැබෙති.

සුත්‍රීව ගේ ඇමැති පිරිස අතුරෙන් වායු දේවතාවා ගේ පුත් **හනුමත්**[20] ඉතා නැණවත් ය. ඔහු කෙරෙහි අචල විශ්වාසයක් තැබූ සුග්‍රීව සීතා සොයා ගැනීමේ කර්තව්‍යය ඔහුට පවරයි. අඩිගද ගේ නායකත්වයෙන් විශාල වානර පිරිසක් පිරිවරා ගත් ශූර හනුමත් දකුණ බලා පිටත් වෙයි. නොයෙක් උවදුරුවලට මුහුණ දීමෙන් පසු ව ජටායුස් නම් ගිජුලිහිණියා ගේ සොහොයුරකු වූ සම්පති හමු වෙයි. වරෙක, සිය සොහොයුරා සමඟ තරඟයට සූර්යයා දෙත දිවූ අවස්ථාවක දී[21] සිය පියාපත් දැවී ගියෙන් දුන් අසරණ ව වින්ධ්‍ය කඳු වැටියෙහි වසන්නට සිදු ව ඇති අයුරු හෙතෙම ඔවුනට විස්තර කර දෙයි. එහෙත් රාවණ සීතා පැහැර ගෙන ලංකාවට පලා ගිය අයුරු හේ දුටුයේ ය. ඔහු විසින් ලංකාවෙහි පිහිටීම විස්තර කර දුන් ඉක්බිති වානරයෝ මුහුදට බසිති; එහෙත් වණ්ඩ රළ පෙරළෙන අනන්ත අප්‍රමාණ මහා සාගරය දුටු කල්හි එය කිසි සේත් තරණය කර ගත නො හැකි වග ඇතැසි බලාපොරොත්තු සුන් කර ගනිති. එ කල්හි, අංගද ඔවුනට අධෛර්යයට පත් නොවන ලෙස අවවාද කරමින් "කෝප වූ නාගයා ළඟයකු ගේ දිවි තොර කරන පරිදි අධෛර්යවත් වීම හේතු කොටගෙන මිනිසකු ගේ දිවි නැසෙතැ" සි පවසයි (IV—64—9). එ කල්හි ඔහු ඔවුනොවුන් අතර කතිකා කරමින්, වැඩි ම දුරක් පියනීමෙහි සමත් නැනැත්තා සොයති; හනුමත් තරම් දුර පියනීමෙහි සමතකු නවත් නැති බව මෙහි දී පෙනී යයි. අනතුරු ව හනුමත් **මහෙන්ද්‍ර** නම් පර්වතය මුදුනට නැඟී සමුදුර හරහා පැනීමට සූදානම් වෙයි.

V වන කාණ්ඩයෙහි ලංකා නම් අසිරිමත් දිවයින ගැනත්, එහි අගනුවර ගැනත්, රාවණ රජු ගේ උතුම් මාළිගය හා අන්තඃපුරය ගැනත් විස්තර කරෙයි; හනුමත් සීතා හට ඇගේ ප්‍රියාදර රාම පිළිබඳ පුවත දන්වමින්, සතුරු සේනාව පිළිබඳ තොරතුරු සොයා ගන්නා අන්දම ද මෙහි කියැවෙයි. මෙහි දක්නට ලැබෙන අනේක කාව්‍යමය වර්ණනා[22] හේතු කොට ගෙන හෝ සෙසු කාණ්ඩ සියල්ලෙහි දැක්වෙන පුදුම එළවන කථාන්තර වලටත් වඩා විස්මය ජනක කථාන්තර මෙහි දක්වීම හේතු කොට ගෙන හෝ මීට සුන්දරකාණ්ඩ යන නාමය ලැබෙන්නට ඇත. රාමයණයෙහි දෙ වන කොටස මුළුමනින් ම "අද්භූත" (Romantic) වීර කාව්‍යයක් වේ නම්, මේ පඤ්චම කාණ්ඩය අති විශේෂයෙන් අද්භූත වේ. ඉන්දීය රුචිකත්වයට අද්භූත රචනා සැම විට ම බෙහෙවින් ප්‍රිය විය.

මහෙන්ද්‍ර නම් පර්වතයෙහි පර්වත පාදය දක්වා කම්පා කරවමින්, එහි වසන සියලු සතුන් තැති ගන්වමින්, හනුමත් නම් වානරයා වාත වේගයෙන් අහසට පැන සමුද්‍ර හරහා යයි. සිව් දිනක් මුළුල්ලෙහි නොයෙක් අනතුරුවලට මුහුණ පාමින්, හාස්කම් දක්වමින් වේගයෙන් ගමන් කරන හෙතෙම අවසානයෙහි ලංකාවට ළඟා වෙයි. ගිරි මුදුනක සිට රාජධානිය දෙස විමසිල්ලෙන් බලන ඔහුට එය බිඳ හෙළිය නොහැකි තරම් වෙතැයි සිතෙයි. බළලකු තරම් කුඩා වෙසක් ගන්නා හෙතෙම[23] හිරු බැස ගිය පසු රාජධානියට වැදෙයි. මුළු රාක්ෂස පුරයත්, රාවණ ගේ ප්‍රාසාදයත්, රකුසු රජු අහසින් ගමන් කිරීමට උපයෝගී කොට ගන්නා පුෂ්පක නම් අද්භූත යානයත් හෙතෙම දැක ගනී. රාවණ ගේ අන්තඃපුරයට ද වදින හෙතෙම, රූබර කාන්තාවන් මධ්‍යයෙහි සැතපෙන රාක්ෂසයා ද දකියි[24]. බොහෝ වේලාවක් පලක් නො ලැබ සොයා බැලීමෙන් පසු ව අශෝක වනයෙහි සොවින් හැවෙන සීතා ඔහුට හමු වෙයි. රාම කුමරුන් ගේ මිතුරකු හා දූතයකු ද ලෙස ඔහු සිය වත ගොත හෙළි කරයි. රාවණ ඇය කා දැමීමට තර්ජනය කොට ඇතැයි ද, දෙ මසක් ඉක්ම යාමට පෙර රාම ඇය ගලවා නො ගත හොත් ඇය මරණයට පත් වනු ඇතැයි ද ඕ තොමෝ පවසයි. ඇය ගලවා ගැනීම පිණිස රාම ඒකාග්‍රතයෙන් මෙ පැමිණෙන බව හනුමත් ඉදුරා පවසයි.[25]

ඉන් පසු ව පෙරළා කඳු ගැටයට නඟින හනුමත්, සාගරය හරහා හඬා ගොස්, එහි තමා එන තුරු බලා සිටින වානරයනට ලංකාවෙහි දී සිදු වූ සියල්ල සැළ කරයි. ඉන් පසු ව, රාම වෙත ගොස් සීතා සොයා ගත් අයුරු විස්තර කොට ඇගේ පණිවුඩය ද දන්වයි.

රාම සහ රාවණ අතර මහා යුද්ධය විස්තර කරන බැවින් "යුද්ධ කාණ්ඩ" නම් ලත් VI වන කාණ්ඩය විශාලතම කොටස වෙයි.

දූත මෙහෙවර සාර්ථක ලෙස ඉටු කිරීම ගැන හනුමත්ට ප්‍රශංසා කරමින් රාම ඔහු මහත් ආදරයෙන් වැලඳගනී. එහෙත් සාගරය තරණය කිරීමේ බාධාව ජය ගත හැකි උපක්‍රමයක් ඔහුට නො පෙනේ. සුග්‍රීව මුහුදු හරහා ලංකාව තෙක් පාලමක් තැනීමට උපදෙස් දෙයි. රාවණ ගේ රාජධානිය ගැනත්, එහි ආරක්ෂා සංවිධාන ගැනත් නිවැරැදි විස්තරයක් ගෙන හැර දක්වන හනුමත් වානර රැළෙහි යෝධයනට එය යටත් කර ගත හැකි වෙතැයි පවසයි. එ කල්හි යුද සෙනඟ යුද්ධය පිණිස සූදානම් කරවීමට රාම විධාන කරයි; නොබෝ කලෙකින් විශාල වානර සේනාව දකුණ බලා මුහුදු තීරයට නික්මෙති.

මේ වානර සේනාව ළඟ ම ළඟ ම එන පුවත් ලංකාවට ලැබුණු කල්හි රාවණ, බල සම්පන්න රාක්ෂස නායකයන් වූ සිය අනුශාසකයන් සියලු දෙන මන්ත්‍රණයකට කැඳවයි. රාවණ ගේ නෑ මිතුරන් හා අනුශාසකයන් සියලු දෙන ද පුරසාරම් දොඩමින් ඔහු යුද්ධයට පොළඹවන නමුත් අසුබ පෙර නිමිති පෙන්වා දෙන විභීෂණ නම් රාවණ

ගේ සොහොයුරා සීතා ආපසු යැවීමට උපදෙස් දෙයි; මින් කෝප වන රාවණ ඔහු ඊර්ෂ්‍යාවෙන් හා ක්‍රෝධයෙන් පෙළෙන බව කියමින් චෝදනා කරයි; රජකු ගේ ද, වීර පුරුෂයකු ගේ ද පරම සතුරන් සෑම විට ම නැයන් වෙතැයි හේ රොසින් පවසයි. සොහොයුරා ගේ වදනින් බෙහෙවින් උරණ වන විභීෂණ, ඔහු හැර දමා තවත් රාක්ෂස යන් සිව් දෙනකු සමඟ සාගරය හරහා පලා ගොස්, රාම ගේ පක්ෂය ගනී. විභීෂණ ගේ උපදෙස් අනුව රාම සමුදුර තරණය සඳහා මහ සයුරට අධිපති දෙවියන් ගේ පිහිට ඉල්ලා සිටී. විශ්වකර්ම ගේ පුත් නල නම් වානරයා කැඳවන සමුද්‍ර දිව්‍ය රාජයා සමුදුර හරහා හෙයක් තැනීමට උපදෙස් දෙයි. රාම ගේ විධානයෙන් වානර රැළ විසින් ගස් ගල් ආදිය ගෙනෙන ලදු ව, නො බෝ දිනකින් ම සමුදුර හරහා හෙයක් තනා ගෙන මහා සේනාවෙහි සියලු දෙන සුව සේ ලංකාවට ගොඩ බසිති.

දැන් රාවණ ගේ රාජධානිය වානර සේනාව වට ලා ගෙන ඇත. රාවණ හදිසි සටනෙක යෙදීමට විධානය දෙයි. මෙහි දී යුද්ධයක් ඇති වෙයි; එ සේ ම, ප්‍රතිවාදී හමුදා දෙකෙහි යෝධයන් අතර ද්වන්ද්ව යුද්ධ ද ගණනාවක් ම සිදු වෙයි. ලක්ෂ්මණ, හනුමත්, අඩිගද හා ජාම්බවත් නම් වලහි, රාජයා රාම ගේ සටන්කරුවන් අතුරෙහි ප්‍රමුඛස්ථාන ගන්නා අතර රාවණ ගේ පක්ෂයෙහි, ඔහු පුත් ඉන්ද්‍රජිත් ප්‍රමුඛ වෙයි. සියලු යන්ත්‍ර මන්ත්‍ර විද්‍යාවන්හි පර තෙර පත් ඉන්ද්‍රජිත් කවර මොහොතෙක වුව ද අදෘශ්‍යමාන ව සිටීමට දනියි.

මෙ සේ, වරෙක හෙතෙම රාමටත්, ලක්ෂ්මණටත් භයානක තුවාල සිදු කරයි. එහෙත් ජාම්බවත් නම් වලස් රාජයා ගේ උපදෙස් පිට විශේෂයෙන් බලවත් බෙහෙත් පැළැටි හතරක් ගෙන එනු පිණිස රැයෙහි හනුමත් කෙලාස පර්වතයට යයි. මේ පැළැටි සැඟවී ඇති හෙයින් වානරයා පර්වත කූටය ඒ හැම පිටින් ම උසුලාගෙන රණ බිමට ගෙන එයි. මෙහි දී බෙහෙත් පැළැටිවල සුගන්ධයෙන් ම රාම සහ ලක්ෂ්මණ ඇතුළු තුවාල ලැබූ සියලු දෙන වහා සුව ලබති. අනතුරු ව හනුමත් පර්වතය පෙරළා තුබූ තන්හි තබයි.

තවත් අවස්ථාවෙක දී, යන්ත්‍ර මන්ත්‍ර විද්‍යා දත් ඉන්ද්‍රජිත් මායා බලයෙන් මැවූ සීතා ගේ පිළිරුවක් රියෙහි හිඳුවා ගෙන පුරයෙන් නික්ම රණබිමට පැමිණ, හනුමත්, ලක්ෂ්මණ හා වානර සේනාව ඉදිරියෙහි ඊට වධ දෙමින් හිස ගසා දමයි. කම්පාවට පත් හනුමත් සීතා මරනු ලැබූහයි රාමට සැළ කරයි; රාම විසඳ ව වැතිරෙයි. විලාප නගන්නට වන් ලක්ෂ්මණ, යහපත් ගතිගුණ කිසිවක් නොතකන දෙවියට තද පරුෂ ලෙස දොස් පවරමින් ශාප කරයි (VI-83, 4 සහ ඊ ළඟ). එහෙත් මේ සම්පූර්ණ සිද්ධිය ඉන්ද්‍රජිත් විසින් මවන ලද මායාවක් බව පවසමින් විභීෂණ ඔහුට කරුණු පහදා දෙයි. අවසානයෙහි, බිහිසුණු ද්වන්දව යුද්ධයෙකින් පසු ව ලක්ෂ්මණ විසින් ඉන්ද්‍රජිත් මරනු ලබයි.

සිය පුත්‍රයා ගේ අභාවයෙන් වියරු හුණු රාවණ තෙමේ ම රණබිමට බසියි. රාම-රාවණ දෙ දෙනා රැ දාවල් දෙක්හි නො කඩවා සිදු වන ද්වන්ද්ව යුද්ධයකට එළඹෙති. දෙවියෝ පවා රාම ගේ සහායට එති. වජ්‍රය දරමින් රියට නැඟුණු ඉන්ද්‍ර දෙවියෝ ඔහුට විශේෂ යෙන් පිහිට වන්නෝ ය. එහෙත් රාම රාවණ ගේ හිස් ගසා දැමූ වහා ම, නව හිසක් නැවතත් පහළ වෙයි. අවසානයෙහි මහා බ්‍රහ්මයා විසින් ම නිමවන ලද ආයුධයකින් රාවණ ගේ හදවත සිදුරු කිරීමෙහි ලා රාම සමත් වෙයි. වානර සේනාව විනෝද වෙමින් මහත් උත්සවශ්‍රියක් උසුලන නමුත් රාක්ෂසයෝ පලා යෙති.

අනතුරු ව සියලු ගරුසරු සහිත ව රාවණ භූමධාන කරන රාම විභීෂණ ලංකාවෙහි රජකමට පත් කරයි.

රාම සීතා කැඳවමින් සිය ජයග්‍රහණය පිළිබඳ ප්‍රීතිමත් ආරංචිය සැළ කරනුයේ මේ සියල්ලට පසු ව ය—එහෙත් වානර හා රකුස් පිරිස් සියලු දෙන ඉදිරියෙහි හෙතෙම සීතා ඉවත ලයි; (ඔයු පවසන පරිදි) තමාට විඳින්නට සිදු වූ අපකීර්තියෙහි පළිය ගත් නමුත් ඇය සමඟ හෙතෙම කිසි සමාගමයක් නො පතයි; වෙනත් පුරුෂයකු ගේ ඇකයෙහි හොවාගත්, වෙනත් පුරුෂයකු ගේ නුරා ඇසට ලක් වූ ස්ත්‍රියක රාමට භාර්යාව ලෙස පිළිගත නොහැකි ය. ඒ කල්හි රාම නිරපරාදයේ සැක කිරීම ගැන දොස් පවරමින් ශෝක

වන සීතා චිතකයක් සූදානම් කරන ලෙස ලක්ෂ්මණ ගෙන් ඉල්ලයි. දැන් ඇයට ගින්නට පිවිසෙනු විනා කළ හැකි කිසිවක් නැත. රාම මිට එකඟ වූයෙන්, චිතකය සූදානම් කොට ගිනි දැල්වූ කල්හි සීතා, ඇගේ නිර්දෝෂිත්වයට ගින්න දෙස් දෙන බව කියමින් ගිනි දැල් මැදට පනියි. ඒ කල්හි සීතා, අග්නි දේවතාවා අනතුරක් සිදු නොවූ සීතා සමඟ දැල් වෙන විකයෙහි නැඟී සිටිමින්, ඇය සැම කල්හි ම පතිවත රැකි බවත්, රාක්ෂස මාළිගයෙහි වුව ද පිරිසිදු ව නිර්දෝෂී ව හුන් බවත් ගම්භීරාකාරයෙන් පවසමින්, ඒ ගැන සහතික කරමින් ඇය රාම හට භාර කරයි. සීතා ගේ නිර්දෝෂිත්වය පිළිබඳ රාම ගේ සිතෙහි කිසි ම සැකයක් නොවූ නමුත් මහා ජනතාව ඉදිරියෙහි ඇගේ නිර්දෝෂිත්වය ඔප්පු කළ යුතු වූ බව රාම මෙ විට පවසයි.

ඉක්බිති රාම සහ ඔහු ගේ පිරිවර හනුමත් ප්‍රධාන වානර සේනාව ද සමඟ පෙරළා අයෝධ්‍යා නුවරට පැමිණි කල්හි, භරත, ශත්‍රුඝ්න හා මව්වරුන් විසින් සාදරයෙන් පිළිගනු ලැබෙති. මහ ජනයා ගේ ප්‍රීති ඝෝෂා මධ්‍යයෙහි ඔහු නුවරට පිවිසෙති. රාජාභිෂේකය ලබන රාම, යටත් වැසියන් ගේ හිත සුව පිණිස යෙහෙන් රජ කරයි.

රාම කථාන්තරය ඇත්ත වශයෙන් මෙ තෙකින් සමාප්ත වෙයි; මුල් කාව්‍යය VI වන කාණ්ඩයෙන් අවසන් වූ බවටත්, ඊ ළඟ VII වන කාණ්ඩය පසුව ඇදුණක් බවටත් කිසි ම සැකයක් නැත. "උත්තර කාණ්ඩ" හෙවත් අවසාන කොටස නම් ලත් මේ සප්තම කාණ්ඩයෙහි ද, මහාභාරතයෙහිත්, පුරාණයන්හිත් දක්නට ලැබෙන පුරාණ දේවකථාවලට සහ පුරාවෘත්තයනට සමාන කථාන්තර රැසක් ඇතුළත් වේ; මේවා රාම පුරාවෘත්තයට කොතෙත් ම අදාළ නො වේ. ප්‍රථම සර්ග රාක්ෂසයන් ගේ ප්‍රභවය ගැනත්, ඉන්ද්‍ර දෙවියන් සහ රාවණ ද අතර යුද්ධය ගැනත්" විස්තර කොට, අනතුරුව හනුමත් ගේ බාල විය ගැනා වර්ණනයක් ගෙන හැර දක්වයි (VII. 35 සහ ඊ ළඟ) රාම-සීතා කතා පුවතට කැප වන්නේ මේ කාණ්ඩයෙන් තුනෙන් කොටස් පමණකි; පහත දැක්වෙන දෑ එහි කියැවෙයි:

පැහැර ගෙන යනු ලැබූ කාලයෙහි රාවණ ගේ ඇකයෙහි හොවා ගෙන සිටි සීතා නැවත පිළිගැනීම ගැන ජනයා ප්‍රසාදයන් පසු වන බව දිනක් රාමට දැනගන්නට ලැබෙයි; ඒ රට ස්ත්‍රී ධර්ම කෙරෙහි මෙය අයහපත් බලපෑමක් වනු ඇතැයි අදහස් කැරෙයි. පරමාදර්ශී රජකු වූ රාමට මෙය ඉවසිය නොහැකි ය; තමා ජනතාවට අයහපත් ආදර්ශයක් දෙතැයි යන චෝදනාව ඉවසිය නො හී, හෙතෙම සීතා රැගෙන ගොස් මහා වනයෙහි අතරමං කරන ලෙස ලක්ෂ්මණ නම් සිය සොහොයුරා ගෙන් ඉල්ලයි. දුක් බර සිතින් ලක්ෂ්මණ ඇය රථයෙහි හිඳුවා ගෙන ගංගා නදිය කරා පැමිණ ඉන් එතෙර වී, ජනතාව ගේ සිත්හි උපන් සැකය නිසා රාම ඇය පිළිකෙව් කළ නියා අනාවරණය කරයි. සොවින් මුස පත් වුව ද දෙවයට හිස නමන සීතා රාම ගේ සැපත ම පතයි. වනයෙහි හඬමින් වැලපෙමින් පසු වන සීතා නොබෝ වේලාවකින් තවුස් මානවකයන් කිහිප දෙනකුට හමු වී, වාල්මීකී නම් තාපසයා ගේ ආශ්‍රමයට කැඳවා ගෙන යනු ලබන්නී ය. වාල්මීකී ඇය තවුසියන් ගේ භාරයට පත් කරයි. කලක් ගෙවී ගිය පසුව ඕ තොමෝ ආශ්‍රමයෙහි දී කුශ හා ලව යන නිවුන් දරුවන් බිහි කරයි.

අවුරුදු ගණනක් ගෙවී යයි. දරු දෙ දෙන වැඩි විය පත් ව, වාල්මීකී නම් තාපස සූතයා ගේ ගෝලයන් ලෙස උගනිති. ඒ සමයෙහි රාම මහා අශ්වමේධයකට සැරසෙයි. වාල්මීකී ප්‍රමුඛ ගෝල පිරිස ද මිට සහභාගි වෙයි. යාගය සඳහා රැස් වූ ජනකාය මධ්‍යයෙහි

තමා විසින් රචිත රාමායණය කියවීමට හෙතෙම ගෝලයන් දෙ දෙනකුට උගන්වයි. සියලු දෙන මේ අපූරු ගායනයට වශී වී සවන් දෙති. එහෙත් වීණා වාදනය කරමින් මෙ සේ කාව්‍යය ගායනය කරන කුශ හා ලව යන මානවකයන් දෙ දෙන සීතා ගේ පුත්‍රයන් බව රාමට ඉක්මනින් ම අනාවරණය වෙයි. ඉන් පසු ව වාල්මිකී සීතා වෙත දූතයන් යවන හෙතෙම, යාගය සඳහා රැස් වූ පිරිස මධ්‍යයෙහි සීතා ශපථ කොට පිරිසිදු කරවනු පිණිස කටයුතු සැලසීමට කියා යවයි. පසු ව දා උදැසන වාල්මිකී සීතා කැඳවා අවුත්,ඇය පිරිසිදු, නිර්දෝෂී තැනැත්තියක බවත්, ඇගේ පුත්‍ර කුශ හා ලව නම් නිවුන් සොහොයුරන් දෙ දෙන රාම ගේ ම පුතුන් බවත් ගර්වාන්විත දෙසුමකින් පළ කරයි. එ කල්හි වාල්මිකී ගේ වදනින් තමා සැහීමට පත් වූ නමුත් ශපථ කරමින් සීතා පිරිසිදු වනු බව දකිනු කැමැති බව රාම පවසයි. එ විට සියලු දෙව් පිරිස් දෙව් ලොවින් බසිති. දුර්මුඛ ව, දොහොත් බැඳ ගත් සීතා "මගේ සිතුවිලි මාත්‍රයක් හෝ රාම හැර අන් කිසිවකු ගැන නොවීමෙහි සත්‍ය බලයෙන් **මහී කාන්තාව** මා වැලඳ ගනී වා. මා සදා කල් සිතින්, කයින්, වචනයෙන් රාම කෙරෙහි ම ගරු සැලකිලි දැක්වීමේ සත්‍ය බලයෙන්, මහී කාන්තාව මා වැලඳ ගනී වා. මෙහි දී මා නො වළහා සත්‍යය ප්‍රකාශ කරමින්, රාම විනා සෙසු අයකු නොදන්නා බව සත්‍ය නම්, මහී කාන්තාව මා වලඳ ගනී ව" යි පවසමින් සත්‍යක්‍රියා කරයි. මේ සත්‍යක්‍රියාව ඇගේ මුවින් පිට වී අවසන් වන්නටත් පෙර, නාගයන් විසින් හිසින් දැරූ දිව්‍යමය සිහසුනක අසුන් ගත් මහී කාන්තාව පොළොව පළා මතු වෙමින් සීතා වැලඳගෙන, ඇය කැටිව ගිලී අතුරුදහන් වෙයි. දැන් රාම සීතාව ආපසු දෙන මෙන් මහී කාන්තාවට ආඥාවනය කරන නමුත් ඉන් පලක් නො වේ. එ නමුදු මහාබ්‍රහ්මයා පැමිණ දෙව් ලොව දී නැවත එක් වීය හැකි බව කියමින් ඔහු සනසයි. නොබෝ කලෙකින් කුශ සහ ලව නම් සිය පුතුන් දෙ දෙනාට රට පාලනය භාර කරන රාම, දිවංගත ව නැවත විෂ්ණු ආත්මය ලබයි.

VII වන කාණ්ඩයෙහි මේ ප්‍රධාන කතා පුවතෙහි සන්දර්භය නානා පුරාණ දේව කථා සහ පුරාවෘත්ත ඇතුළු කිරීම හේතු කොට ගෙන බිඳී යයි. **යයාති** සහ **නහුෂ** පිළිබඳ ව (VII. 58 සහ ඊ ළඟ) ද **ඉන්ද්‍ර විසින් වෘත්‍ර ඝාතනය** සහ මේ හේතුවෙන් ඉන්ද්‍ර බ්‍රාහ්මණ—ඝාතනයෙහි පාපය සිදු කර ගැනීම පිළිබඳව ව (VII, 84—87) ද, **මිත්‍ර** සහ **වරුණ** යන දෙවිවරුනට ප්‍රිය වූ **උර්වශී** සහ ඇයට දා ව අරුම පුදුම ලෙස උපදින **වශිෂ්ඨ** සහ **අගස්ත්‍ය** නම් ඍෂිවරුන් පිළිබඳ ව (VII, 56 සහ ඊ ළඟ) ද, **ඉලා** නම් ස්ත්‍රී වෙසින් සිට **පුරූරවස්** බිහි කරන **ඉල** නම් රජු පිළිබඳ ව (VII, 87—90) ද, මේ ආදි වශයෙන් අපට හුරු පුරුදු නැතක් පුරාවෘත්ත නැවත දක්නට ලැබෙයි. පමණ ඉක්මවූ ස්වරූපයක් දරන සැබවින් ම බ්‍රාහ්මණික පුරාවෘත්ත මහාභාරතයෙහි XII වන පර්වයෙහි දක්නට ලැබෙන එ බඳු පුරාවෘත්ත හා මැනැවින් සංසන්දනය කළ හැකි ය. ශූද්‍ර වර්ණයට අයත් **ශම්බූක** නම් තාපසයා ගේ කතා පුවත එ බන්දකි; රාම මොහු ගේ ගෙල සිඳ දැමූ කල්හි, ශූද්‍රයකු බිය සැක නැති ව තපස් රැකීමට ඉදිරිපත් නො විය යුතු බැවින් දෙවියෝ ඔහු ගේ ක්‍රියාව අනුමත කරති. එක්තරා දේවතාවකු පෙර අත්බවෙක දී තපස් රැකි නමුත් බමුණනට දක්ෂිණා නුදුන් බැවින් ඔහුට තමා ගේ ම මස් බිඳීමට සිදු වීම පිළිබඳ කථාව (VII, 73—81) හා මෙ වැනි "ගුණ වගාවට හේතු වන" පුරාවෘත්ත ද සඳහන් කළ හැකි ය. මේ කාණ්ඩය මුළුමනින් ම මහාභාරතයෙහි මෑතෙක ලියැවුණු කොටස්වල ලක්ෂණ පළ කරයි.

රාමායණයෙහි සැබෑ කොටස් සහ ව්‍යාජ කොටස්[1]

රාමායණයෙහි මුළු VII වන කාණ්ඩය ම ඊට එකතු වූයේ පසු කලෙක බවට කිසි ම යැකයක් නැත; එහෙත් සම්පූර්ණ I වන කාණ්ඩය ද වාල්මිකී ගේ මුල් කෘතියට අයත් විය නොහැකි බව කලකට පෙර සිට ම පිළිගැනිණ. මේ කාණ්ඩයෙහි අපමණ අභ්‍යන්තර පරස්පර විරෝධතා දැක්වෙදැ සමණක් නො ව භාෂාව සහ රචන විලාසය ද II සිට VI වන කාණ්ඩවලින් හෙළියට වඩා පහත් ය. එ පමණක් නො ව, කාව්‍යයෙහි සැබෑ කොටස්වල I වන කාණ්ඩයේ සිදුවීම් ගැන කිසිවක් සඳහන් නො වෙයි; ඇත්ත වශයෙන් අනික් කාණ්ඩවල කියැවෙන කරුණුවලට ඉඳුරා පටහැණි විස්තර මේ කාණ්ඩයෙහි දක්නට ලැබේ.[2]

දෙවියකු ලෙසත්, විෂ්ණු අවතාරයක් ලෙසත් රාම සැලකෙනුයේ I වන සහ VII වන කාණ්ඩයන්හි පමණි. II වන කාණ්ඩයෙහි පටන් VI වන කාණ්ඩය දක්වා, අමුතුවෙන් ඇඳුණු බව නොඅනුමාන ව කිව හැකි ඡේද කිහිපයක්[3] හැරුණු විට, හෙතෙම සැම කල්හි ම මනු ලොව වීරයෙකි; වීර කාව්‍යයෙහි සැබෑ කොටස් යයි අවිවාදයෙන් පිළිගත් කොටස්වල ඔහු විෂ්ණු අවතාරයක් ලෙස සැලකුණු බවට ලකුණු නො පෙනේ. කාව්‍ය ඇතිි සැබෑ කොටස්වල පුරාණ දේව කථා ඇතුළත් වන තන්හි පරමේශ්වරයන් ලෙස සැලකෙනුයේ විෂ්ණු නො ව, වේදයන්හි මෙන් ඉන්ද්‍ර දෙවියෝ ය.

අප ඉහත දැක්වූ පරිදි I වන හා VII වන කණ්ඩායන්හි කථා ප්‍රවාහය නිතර බිඳී යාම ද ආවේණික ලක්ෂණයකි; මහාභාරතයෙහි සහ පුරාණයන්හි ද දැක්වෙන පරිදි නා නා බ්‍රාහ්මණික පුරාණ දේව කථා සහ පුරාවෘත්ත ද මෙ නයින් ඇතුළු කැරෙයි. II සිට VI දක්වා කාණ්ඩවල මෙ බඳු විෘත්තාන්ත ඇතුළත් කැරෙනුයේ ඉතා විරල වශයෙනි (උදා: III වන කාණ්ඩයෙහි මුල) මේ කාණ්ඩවල, ඒවාට එකතු කරන ලද හා ඉසිතාරණය කරන ලද කොටස්, සැබවින් ම අනල්ප වුව ද ඒවා වෙනත් ස්වරූපයක් ගනී. සූතයන් විසින් ම ඉතා ම රසවිත්, බෙහෙවින් ජනප්‍රිය වූ කොටස් දිග්ගැස්සීමෙන් මෙවා ප්‍රධාන වශයෙන් සැදී ඇත. රාමායණය, කාලාන්තරයක් මුළුල්ලෙහි ඇතැම් විට ශත වර්ෂ ගණනාවක් මුළුල්ලෙහි—උත්තර කාණ්ඩයෙහි එන කුශ සහ ලව දෙ බෑයන් වැනි තැනින් තැන සැරිසරන සූතයන් අතර මුඛපරම්පරාගත ව පැවැතෙන්නට ඇතැයි සිතිය යුතු ය. මේ වීර කාව්‍ය ගීත තමන් සතු විස්තුවක් ලෙස සැලකූ ගායකයෝ ද සූතයෝ ද සිය කැමැත්ත පරිදි ඒවා වෙනස් කළෝ ය. සීතා ගේ හෝ දශරථ ගේ හෝ කෞශල්‍ය ගේ හෝ ළතෝනි යෙන් ශෝකා ජනයා ගේ සිත් සතන් කම්පා වුණු බව පෙනී ගිය හෙත් එ් මොහොත දිග්ගස්සනු පිණිස ඔහු තවත් ශ්ලෝක කිහිපයක් නිර්මාණය කරනු ඇත; වඩාත් රණකාමී ජනකායක් අතර යුද පිටියෙහි සිද්ධි වඩාත් අගය කරනු ලැබිණි නම්, තව තවත් වීරයන් මෙන් ම

ශුද්ධි සඳහා මූණ ගැස්වීමත්, තවත් දහස් ගණනක් හෝ දස දහස් ගණනක් වානරයන් හෝ රකුසන් හෝ ඝාතනය කරවීමත්, මුලින් ම කියැවුණු චිත්‍රමයත් හුළු හුළු වෙනස්කම් සහිත ව නැවත ඉදිරිපත් කිරීමත් ගායකයාට උගහට නො වී ය; කාව්‍යයට සමත් දුන් පිරිස හාස්‍ය ජනක දර්ශන ගැන, විශේෂයෙන් වානරයන් සම්බන්ධ දර්ශන ගැන විස්තර යෙන් විනෝද වූවාහු නමි මෙ බඳු දර්ශන දිගින් දිගට විස්තර කිරීම පමණක් නො ව ඊට සමාන අලුත් පුවත් එකතු කිරීම ද ගායකයාට ඉතා ප්‍රිය වූ කටයුත්තක් විය; තමා ඉදිරියෙහි වියත් බමුණු ශ්‍රෝතෘ පිරිසක් වෙනුවෙන් නමි උපදේශාත්මක කොටස් දිග්ගස් සමින්, අලුත් පඬි වදන් එකතු කිරීමෙන් හෝ වෙනත් තැන්වලින් ගත් ආප්ත වාක්‍ය අතුළු කිරීමෙන් ඔවුන් ගේ හෘදය දිනා ගැනීමට හෙතෙම උත්සාහ කළේ ය; විශේෂයෙන් ම, ශූර ප්‍රබන්ධකාරයන් පුරාණ සැබෑ කාව්‍යයෙහි ද ජනප්‍රිය වී තිබෙන්නට ඇති සොබා වැනුම්, අලංකාර බහුල මහාකාව්‍ය ශෛලියෙන් පැබැඳුණු රචනා මඟින් අනාවරණය කරන්නට ඇත.[4] මහාභාරතයට රාමායණයට ද බොහෝ දුරට නියත ස්වරූපයක් ලැබුණේ එය ඉන්ඵාරුළු කළ විට විය යුතු ය.[5] එහෙත් මෙය සිදු වන්නට ඇත්තේ, මේ කාව්‍යය කියැවීම හෝ ඊට සවන් දීම හෝ පුණ්‍ය ක්‍රියාවෙකැයි සැලකීමටත්, එය පිටපත් කළ තැනැත්තා දෙව් ලොව උපදින බව සැලකීමටත් තරම් එය ප්‍රසිද්ධියට පත් ව, ජනප්‍රිය වූ අවධියෙක විය යුතු ය.[6] "දීර්ඝායුෂ, නිරෝගිතාව, කීර්තියසස්, යහපත් සොහොයුරන් හා ප්‍රඥාව" ලබා දෙන[7] මෙ තරම් විශිෂ්ට මෙ තරම් වැඩදායක කාව්‍යයක් වැඩි වැඩියෙන් පිටපත් කළ අතර ම දෙව් ලොව ද නියතයෙන් ම ලැබෙනු ඇත. ඒ බැවින්, ලිඛිත කාව්‍යය පිටපත් කළ මූල් රචකයෝ ද සංස්කාරකයෝ ද, මුඛ පරම්පරා ගත ව පැමිණි රචනය විවරාක්ෂියෙන් සලකා බලා සැබෑ සහ ව්‍යාජ කොටස් වෙන් වෙන් කොට ගැනීමට නො හිතා ම, "රාමායණය" යන හිසින් ඉදිරිපත් වුණු සියලු දෑ ඉත හිතින් පිළිගත්හ.

එහෙත් අපට සලකා බැලිය හැකි වනුයේ "සැලකිය යුතු තරම් ස්ථිර වූ" රාමායණයක් ගැන පමණකි; කුමක් හෙයින් ද යත්? අප අතට පත් වීර කාව්‍යයෙහි අත් පිටපත් එකිනෙකින් බෙහෙවින් වෙනස් වන බැවිනි; එ සේ ම ඉන්දියාවෙහි නා නා පෙදෙස්වල එය මුඛ පරම්පරාගත ව පැමිණි අයුරින් එකිනෙකින් වෙනස් වූ ශුද්ධි යටත් පිරිසෙයින් තුනක් මත් ඇත. ඇතැම් ඡේද සඳහා දැක්වෙන පාඨාන්තර නිසා පමණක් නො ව, ඒ හැම එකෙක ම, අනෙකක දක්නට නො ලැබෙන ශ්ලෝක, දීර්ඝ ඡේද හා සම්පූර්ණ සර්ග පවා දක්නට ලැබීමෙන් මේ ශුද්ධි එකිනෙකින් වෙනස් වෙයි; තව ද, ලෝකයන් හි අනුපිළිවෙල ද නා නා ශුද්ධීන්හි බොහෝ විට නානා විධ වේ. (උතුරු මෙන් ම දකුණු ඉන්දියා වෙහි ද) බෙහෙවින් ප්‍රචලිත ව පවත්නා ශුද්ධිය නම්, බොම්බායෙහි දී කිහිප වරක් මුද්‍රණය කරන ලද ව, ජේකබ් විසින් "බී" ශුද්ධිය ලෙස හඳුන්වනු ලබන කෘතියයි.[8] යුරෝපයෙහි දක්නට ලැබුණු එක[9] ම සම්පූර්ණ

සංස්කරණය ජී. ගොරීසියෝ විසින් කරන ලද්දකි; එහි බෙංගාලි ශුද්ධිය ඇතුළත් වෙයි. වයඹ දිග ඉන්දියාවේ (බටහිර ඉන්දීය, කාශ්මීර) ශුද්ධියෙහි පෙළ දැනට ලාහෝරයෙහි මුද්‍රණය කැරෙයි.[10] මේ ශුද්ධීන්හි දක්නට ලැබෙන පෘථුල වෙනස්කම් විස්තර කරනු වස් දැක්විය හැකි එක ම හේතුව වීර කාව්‍යයෙහි පෙළ දිගු කලක් මුළුල්ලෙහි මුඛ පරම්පරාගත ව පැමිණීමයි. ගායකයන් ගේ ස්මෘතියෙහි ශ්ලෝකවල අනුපිළිවෙළ වෙනස් ව ගොස්, පද යෙදීම ද බොහෝ විට සැලකිය යුතු තරම් වෙනස් ව ගිය අතර නා නා පෙදෙස්වල විසූ සූතයන් විසින් නා නා අන්දමින් අමතර කරුණු එකතු කිරීමත්, විස්තාරණයත් කරන ලද බව සිතා ගැනීම උගහට නො වේ.

එතෙකුදු වුවත්, මේ ශුද්ධි සියල්ලෙක ම සප්ත කාණ්ඩය ම දක්නට ලැබීමෙන් හා සියල්ලෙක ම සැබෑ කොටස් එක්ක ම ව්‍යාජ කොටස් දක්නට ලැබීමෙන් ද ඒවා සියල්ල එකිනෙකට අනුකූල වේ. මේ හේතු වෙන් කවර ශුද්ධියෙකින් හෝ රාමායණයෙහි "මුල් කෘතිය නියෝජනය නො කැරෙයි. එහෙත්, එක්තරා ශුද්ධියෙක යම් කිසි ඡේදයක් නොමැති වීම සෑම විට ම එහි අව්‍යාජත්වය සැක කිරීමට ප්‍රමාණවත් හේතුවකි; සමස්තයක් වශයෙන් රාමායණයෙහි ව්‍යාජ හා පශ්චාත්කාලීන කොටස් හඳුනා ගැනීම මහාභාරතයෙහි එ බඳු කොටස් හඳුනා ගැනීමට වඩා පහසු බව නියත ය. "ගෞරවාදරයට පත්, අප පුරාණ දේවාලය රාශියෙක පරම්පරාවක් පරම්පරාවක් පාසා සෑම අයකු විසින් ම අලුත් යමක් එකතු කොට පුරාණ යමක් ප්‍රතිසංස්කරණය කරනු ලැබූ නමුත් අමුතු වෙන් එකතු වුණු කුඩා කුටි හා කොත් සියල්ල නො තකා මුල් නිර්මාණය නො මැකී පවතියි. එ පරිද්දෙන් ගායක පරම්පරා කිහිපයක් රාමායණය නිමැවීමෙහි යෙදී සිටියෝ ය; එහෙත්, බෙහෙවින් විශාල වෙමින් විකසනය වූ පුරාණ කේන්ද්‍රය විස්තර වශයෙන් නො වේ නම් මූලික ලක්ෂණ වශයෙන් වත් හැඳින ගැනීම ගවේෂකයා ගේ විමසුම් ඇසට එ තරම් උගහට නො වේ" යයි ජැකෝබි පවසයි. අමුතුවෙන් එකතු කරන ලද හා විස්තාරණය කරන ලද ස්ථාන රාශියක් අවිවාදයෙන් ම එ සේ වන බව ජැකෝබි "Das Rāmāyana" නම් සිය කෘතියෙහි, ඔප්පු කොට දක්වයි. රාමායණයෙහි පෙළ විවේචනාත්මක ලෙස නැවත සකස් කර ගැනීමේ ප්‍රයත්නයෙක දී, එහි මුඛ පරම්පරාගත ව පවත්නා 24,000 ක් ශ්ලෝක අතුරෙන් හතරෙන් කොටසක් පමණක් "අව්‍යාජ" ලෙස සැලකිය හැකියැයි තහවුරු වීමෙන්, මේ විවේචනයෙහි යුක්ති සහගත බවට හානියක් නො වේ.[12] බොහෝ විට ඉන්දීය වංශ කථා කියැවීමෙන් වශී ව, ඉමහත් ආස්වාදයක් ලබන අප ඒ සමඟ ම කලකිරීමට පත් වනුයේ එහි පැනෙන "ව්‍යාජ" කොටස් සම්භාරය නිසා ම ය. ඉන්දීය සහ ග්‍රීක වීර කාව්‍ය කලාත්මක ව අගය කරමින් සංසන්දනය කිරීමෙහි දී ඉන්දීය වීර

කාව්‍යයනට අහිතකර වූ නිගමනයකට අවශ්‍යයෙන් ම බැස ගැනීමට සිදු වුව ද ඊට දෙස් පැවරෙනුයේ පුරාණ ඉන්දීය කවීනට වඩා, ස්වාධීන රචනා එකතු කිරීමෙන් පුරාණ ගීත සංඛ්‍යාව වැඩි කරමින් ඒවා විකෘත කළ කුකවියනට ය. "කිසි දු ශෛලියකට අනුරූප නොවන නීරස වාග් බාහුල්‍යය" යැයි කියමින් රාමායණය හෙළා දක්නා **ෆ්‍රිඩ්රික් රුකට්** ගේ දෝෂාරෝපණයට වඩාත් ලක් විය යුත්තේ වාල්මිකී නො ව වාල්මිකී අනුකරණය කළවුන් බව නිසැක ය. එහෙත්, "රාමායණයෙහි ඔබට දකින්නට ලැබෙන්නා බදු මනඃකල්පිත විකෘති සහ කිසි දු ශෛලියකට අනුරූප නොවන නීරස වාග්බාහුල්‍යය ද පහත් කොට සැලකීමට හෝමර් නිසැක ව ම ඔබට ඉගැන්වී ය. එ සේ වුව ද, එ බඳු උදර අදහස් හා ගැඹුරු හැඟීම් ද ඉලියඩයෙහි ඔබට දක්ක නොහැකැ"[13] යි පවසමින් ඉන්දීය වීර කාව්‍යයෙහි සෞන්දර්යය ග්‍රීක වීර කාව්‍යයෙහි සෞන්දර්යයට හේතු වූ කරුණුවලට වඩා **වෙනස්** වූ **කරුණු මත රඳා පවතිනැයි** සිතීමෙහි ලා මේ ජර්මන් කවියා බොහෝ දුරට නිවැරැදි මාර්ගයක් ගනී.

රාමායණය ලියැවුණු වකවනුව[1]

රාමායණයෙහි සැබෑ සහ ව්‍යාජ කොටස් පිළිබඳ ගැටලුව හා ළඟින් සම්බන්ධ වූ ගැටලුවකි, කාව්‍යය ලියැවුණු වකවානුව. මීට හේතුව නම් මේ පැනයට පිළිතුරු සපයනු වස්, II—IV දක්වා කාණ්ඩයන්හි අඩංගු වූ මුල් කාව්‍යය තැනුණු සැබෑ කොටස් ලියැවුණු වකවනුව සහ පසු ව එකතු කරන ලද I වන හා VII වන කාණ්ඩ දෙක ලියැවුණු වකවනුව ද අතර ගෙවෙන්නට ඇති කාල සීමාව ගැන යම් අදහසක් වත් ඇති කර ගත හැකි වීම නෙ.අනුමානයෙන් ම වැදගත් කරුණක් වීමයි.

රාමායණයෙහි සැබෑ කාණ්ඩයන්හි රාම හුදෙක් පුහුදුන් වීරයකු වන බවත්, ඔහු විෂ්ණු අවතාරයක් ලෙස විද්‍යාමාන වනුයේ I සහ VII යන කාණ්ඩයන්හි සහ සෙසු කාණ්ඩයන්හි අමුතුවෙන් ඇතුළු කරන ලද ඡේද කිහිපයෙක පමණක් බවත් අපට දැක්නට ලැබිණ. රාම කුමරු ජාතික වීරයකු බවට පත් කරනු ලැබුවේ වීර කාව්‍යය මඟින් ම ය. පුහුදුන් මිනිසකු ගේ සිට අර්ධදේවත්වයෙන් සැලකුණු ජාතික වීරයකු බවට ද, සකලවර සර්වේශ්වර වූ විෂ්ණු දෙවියන් බවට ද පත් කළ මේ පරිවර්තනයට අවශ්‍යයෙන් ම දිගු කලක් ගත වන්නට ඇත. එ පමණක් නො ව, වාල්මිකී කවියා රාමායණයෙහි ප්‍රථම සහ අවසාන කාණ්ඩයන්හි සිල්වත් තවුසකු හා සාෂිවරයකු ලෙස ද, රාම නම් වීර කුමරුන් ගේ සමකාලීනයකු ලෙස ද දක්නට ලැබෙයි. මෙ සේ, පසු වකවනුවෙක ලියැවුණු මේ කාණ්ඩ රචනා කළ කවීන් ගේ සිත්හි නම් වාල්මිකී එ සමයෙහි පවා කල්පිත චරිතයෙක තත්ත්වයට පත් ව සිටියේ ය. කාව්‍යයෙහි සැබෑ සහ ව්‍යාජ කොටස් ලියැවෙන කල්හි ශත වර්ෂ ගණනාවක් ඉක්ම යන්නට ඇතැයි මේ සියල්ල අනුව සිතා ගත යුතු වෙයි.[2]

එ සේ වුව ද, රාම පුරාවෘත්තය පමණක් නො ව, වාල්මිකී ගේ රාමායණය ද, හඳුනන අප මහාභ රතයෙහි ද, රාම විෂ්ණු අවතාරයක් ලෙස සැලකෙන අතර, වාල්මිකී පුරාණ ඍෂිවරයකු ලෙස සඳහන් වන බව ද මෙහි දී ඒ සමඟ ම වැඩි දුරටත් කිව යුතු ය. මහාභාරතයෙහි **රාමෝපාඛ්‍යානය** වූ කලි හුදෙක් රාමායණයෙහි සාරාංශය ඉදිරිපත් කරන ස්වාධීන රචනයක් විය යුතු බව යට සඳහන් විය (54 පිටුව); එ ද අප වර්තමාන රාමායණයට බොහෝ දුරට ළං වූ, ඉතා පශ්චාත්—කාලීන කෘතියෙකින් ගත් සාරාංශයක් බව ද වැඩි දුරටත් කිව හැකි ය. කුමක් නිසා ද යත්? රාමෝපාඛ්‍යාන කර්තෘ හට එ වක පවා රාම මිනිසත් බව ලැබූ විෂ්ණු දෙවියෝ ය.[3] හනුමත් ලංකාව "ගිනි බත්" කළ බව හේ දනී, මෙය වූ කලි ව්‍යාජ යයි ඔප්පු කරන ලද ඡේදයකි[4]; එ සේ ම VII වන කාණ්ඩයෙහි රාවණ ගැන සඳහන් කරන කොටස ද හෙතෙම දැන සිටියේ ය.[5] ද්‍රෞපදිය පැහැර ගෙන යාම නිසා තැවෙන යුධිෂ්ඨර අස්වසනු පිණිස මහාභාරතයෙහි රාම වෘත්තාන්තය ගෙන හැර දැක්වෙයි. එහෙත් ද්‍රෞපදී පැහැර ගෙන යාම පිළිබඳ මේ මුළු උපාඛ්‍යානය ම, රාමායණයෙහි සීතා හරණයෙහි අනුකරණයක් පමණක් බව නිසැක ය. සැබවින් ම, රාමායණයෙහි සීතාහරණය වූ කලි පුරාවෘත්තයෙහි මෙන් ම කාව්‍යයෙහි ද කේන්ද්‍රය වන නමුත් මහාභ රතයෙහි ද්‍රෞපදිය සොරා ගැනීම කථා වස්තුව විකසනයෙහි ලා වැදගැම්මක් නැති තරම් ය. වීර කාව්‍ය ද්වයයෙහි වෙන් වෙන් අංගයන්හි කැපී පෙනෙන සමානත්වය, විශේෂයෙන්, අර්ජුන හා රාම යන වීරයන් දෙ දෙනා අතර සමානත්වය පෙන්වා දී ඇත. දෙලොස් වසක සිට තුදුස් වසක් දක්වා කාලයක් පිටුවාසල් ව අරණ්‍යගත ව වාසය කිරීම ද, දුන්න නැඟීම ද, දෙවියන් ගෙන් ලබාගන්නා දිව්‍ය ආයුධ වීරයනට ප්‍රදානය කිරීම[6] ද යන මේ අවස්ථා එක් වීර කාව්‍යයක් අනෙක කෙරෙහි **බලපාන්නට ඇතැයි සිතීමට තුඩු දෙන** අවස්ථා වුව ද, ඒ අවස්ථා මඟින් එ බදු බලපෑමක් ස්ථිර කොට දැක්වීමට නම් නොහැකි ය. කෙසේ වුව ද රාමායණය මහාභාරතයෙන් අදහස් ණයට ගත්තාට වඩා මහාභාරතය රාමායණයෙන් අදහස් උපුටා ගන්නට ඇත. කුමක් නිසා ද යත්? රාමායණය පාණ්ඩව පුරාවෘත්තය ගැන හෝ මහාභාරත වීරයන් ගැන හෝ කිසිත් දැනුමක් නොපෙන්වන නමුත්[7] අප දුටු පරිදි මහාභාරතය රාම පුරාවෘත්තය පමණක් නො ව රාමායණය නම් කෘතිය ද දැන සිටී. එ වක පවා රාමායණය නාට්‍යකාරයෙන් රඟ දැක්වීමක් පිළිබඳ ව හරිවංශයෙහි සඳහන් වෙයි. (යට 102 පිටුවේ සටහන බලන්න.) ඒ කෙසේ වෙතත්, අපට රාමායණයෙහි සැබවින් ම දක්නට ලැබෙන ශ්ලෝකයක් (VI, 81, 28) "වරෙක වාල්මිකී විසින් ගායනය කරනු ලැබූ ශ්ලෝකයෙකැ" යි මහාභාරතයෙහි (VII 143, 66) එ ලෙසින් ම උපුටා දැක්වීම වඩත් වැදගත් ය. මහාභාරතයෙහි කිහිප පළෙක දී ම වශිෂ්ඨ සහ වෙනත් පුරාණ ඍෂිවරුන් ද සමඟ වාල්මිකී ද "ශ්‍රේෂ්ඨ තාපසයකු" හා ගරු කටයුතු ඍෂිවරයකු ද ලෙස සඳහන් වෙයි.[8] ධාර්මික

මුනිවරුන් සමඟ කරන ලද විවාදයෙක දී තමා "බ්‍රාහ්මණඝාතකයෙකැ'යි යන චෝදනාවට ලක් වූ බවත්, මේ චෝදනාව හේතු කොට ගෙන බ්‍රාහ්මණ ඝාතනයෙහි පාපය තමා පිට පැවැරුණු බවත්, ඉන් මිදී පවිත්‍ර විය හැක්කේ ශිව දෙවියන් පූජා කිරීමෙන් පමණක් බවත් වාල්මීකී එක් අවස්ථාවෙක දී යුධිෂ්ඨර හට පවසයි.[9] "මහාභාරතයෙහි අවසාන ස්වරූපය තහවුරු වන්නට පෙර පුරාතන කෘතියක් වශයෙන් රාමායණය සාමාන්‍ය යෙන් ප්‍රචලිත ව පවතින්නට ඇත" යි පවසන ජැකෝලි ගේ මතයට (කලින් දැක්වූ තැන, 71 පිටුව) එකඟ වීම මේ කරුණු සියල්ල අනුව යුක්ති සහගත වෙයි. මෙය "දූෂණ කාර්යාවලිය" එ නම්, ව්‍යාජ කොටස් නිසා සැබෑ කොටස් වැසී යාමේ කාර්යාවලිය සහ පශ්චාත්කාලීන අංග පුරාණ කොටස්වලට ඇතුළු වීමේ කාර්යාවලිය යයි හැඳින්විය හැකි නම්, එය මහාභාරතයෙහි නම් කෘතිය මුළුල්ලෙහි ම පැතිර ඇති නමුත්, රාමායණ යෙහි මේ කාර්යාලයීය ආරම්භයෙහි දී ම මැඩ පවත්වාගෙන, I සහ VII වන කාණ්ඩයනට හා සෙසු කාණ්ඩයන්හි කොටස් කිහිපයකටත් පමණක් පැතිරීම ද ඉහත දැක්වුණු මතයට අනුකූල ය.

එහෙත්, ක්‍රි. ව. හතර වන සිය වසෙහි සමස්තයක් වශයෙන් මහා භාරතයට එහි මේ වත්මන් ස්වරූපය ලැබිණි නම් (යට 111 පිට බලන්න) යටත් පිරිසෙයින් ශත වර්ෂයකට හෝ දෙකකට හෝ පෙර රාමායණයෙහි "අවසාන" ස්වරූපය ("අවසාන" යන පදය විමසිල්ලෙන් සැලකිය යුතු ය) ඊට ලැබෙන්නට ඇත.

ඒ කෙසේ වුව ද, මේ වීර කාව්‍ය දෙකින් පුරාණතර වනුයේ කවරේ ද යන ප්‍රශ්නයට නම් මෙයින් පිළිතුරු නො සැපෙයේ. මහාභාරතයෙහි මෙන් ම රාමායණයෙහි ද ඉතිහාසය සම්බන්ධයෙන් අප විසින් ඉහත සඳහන් කිරීමට යෙදුණු සියල්ල අනුව, මේ ප්‍රශ්නය මේ ආකාරයෙන් නැඟු කල්හි අර්ථ විරහිත එකක් වන බව හා එය වෙන වෙන ප්‍රශ්න තුනක් වශයෙන් බෙදී යන බව ද ඉතා පැහැදිලි වෙයි. ඒවා නම්: 1. අද අප අතට පත් වූ ස්වරූපයෙන් වඩාත් පුරාණ වනුයේ කවර කෘතියක් ද? 2. මුල් මහාභාරත වීර කාව්‍යය, වීර කාව්‍ය හා උපදේශාත්මක කාව්‍ය අන්තර්ගත වූ යෝධ සංග්‍රහයක් බවට ක්‍රමයෙන් පත් වූ වකවානුව හා වාල්මීකි ගේ පැරණි කාව්‍යය, පුරාතන කාණ්ඩයනට අඩුවැඩි වශයෙන් කරුණු එකතු වීමෙන් ද, අවසානයෙහි I වන හා VII වන කාණ්ඩ එකතු වීමෙන් ද අප විර්තමාන රාමායණය ලෙස විස්තාරණය වූ වකවානුව ද අතර සම්බන්ධය කුමක් ද? 3. සාමාන්‍යයෙන් සලකන කල මුල දී දක්නට ලැබුණේ මහාභාරත වීර කාව්‍යය ද නැත හොත් රාමායණ වීර කාව්‍යය ද?

නිශ්චිත පිළිතුරක් දිය හැකි වනුයේ මින් පළමු පැනයට පමණෙකි; එ නම්, අප වර්තමාන රාමායණය, මහාභාරතයට වඩා පුරාණ බවයි. දෙ වන පැනය පිළිබඳ ව රාමායණය මහාභාරතයට වඩා කුඩා කෘතියක්

වූයෙන් එය වැඩීමෙහි ලා කෙටි කාල සීමාවක් ප්‍රමාණවත් වූ බව සිතාගත හැකි ය. රාමායණයෙහි ව්‍යාප්ත යයි සැලකෙන කාණ්ඩ දෙකෙහි ස්වභාවය මහාභාරතයෙහි ස්වරූපයට බෙහෙවින් සමාන වන බවත්, එක ම බ්‍රාහ්මණික පුරාණ දේව ඝට්ඨා හා පුරාවෘත්ත බොහෝ විට කෘති දෙකෙහි ම දක්නට ලැබෙන බවත් යට දැක්විණ. එතෙකුදු වුවත්, කෘති දෙකටම පොදු වෘත්තාන්ත නානා ප්‍රකාරයෙන් ඉදිරිපත් කැරෙන බැවින්, මේවා ණයට ගැනීමක් සිදු වූවාට වඩා, එක ම මූලාශ්‍රයෙකින්, ඒ නම් බමුණන් අතර මුඛ පරම්පරාවෙන් පැවැත ආ ඉතිහාස සාහිත්‍යයෙන් ගත් බව සිතීමට අපට අනිවාර්යයෙන් ම සිදු වෙයි. ඒ පමණක් නො ව, රාමායණයෙහි ද, මහාභරතයෙහි ද කාණ්ඩ සියල්ලකට ම පොදු වූ වැකි, ශ්ලෝකාර්ධ, ආප්තෝපදේශ හා සම්පූර්ණ ශ්ලෝක අපමණ සංඛ්‍යාවක් ඇත.[10] භාෂාව අතින් ද, රචනා විලාසය අතින් ද, වෘත්ත අතින් ද කෘති දෙක අතර විශාල අනුරූපතාවක් දැක්වෙයි.[11] මේ කරුණු අනුසාරයෙන්, රාමායණය වැඩුණු වකවනුව, මහාභාරතය වැඩුණු වඩා දීර්ඝ වකවනුවට ඇතුළත් වන බව අපි නිගමනය කරමු.

මුල් වීර කාව්‍ය දෙකින් වඩාත් පැරණි කවර වීර කාව්‍යය දැයි යන ඉතා ම වැදගත් තෙ වන පැනයට, උපකල්පනයෙක මාර්ගයෙන් පිළිතුරු සැපයිය හැකි ය. පරම්පරාගත විෂ්ණු අවතාර නාමමාලාව අනුව රාම අවතාරය කෘෂ්ණ අවතාරයට පෙර පහළ වූ බැවින්, රාමායණය මහාභාරතයට පෙර ලියැවුණැයි හින්දු භක්තිකයෝ ප්‍රකාශ කරති.[12] එ සේ වුව ද, අප ඉහත දුටු පරිදි, පුරාණ, සැබෑ රාමායණයෙහි විෂ්ණු අවතාරයක් ලෙස රාම නොදක්වෙන බැවින් මේ තර්කය ප්‍රබල නො වේ. එ තෙකුදු වුවත්, පාණිනි ගේ ව්‍යාකරණයෙහි පවා වාසුදේව (කෘෂ්ණ), අර්ජුන සහ යුධිෂ්ඨර යන අය ගැන සඳහන් වෙතත්, පාණිනි විසින් හෝ පතඤ්ජලී විසින් හෝ ප්‍රාක්-ක්‍රිස්තු යුගයට අයත් සෙල්ලිපි මඟින් හෝ රාම ගැන සඳහන් නො කැරේ[13] පුනර්භවය පිළිබඳ මතය කෘෂ්ණ භක්තිය මුල් කොට ගෙන පහළ වූ බවත්, රාම නම් වීරයා විෂ්ණු අවතාරයක් ලෙස ප්‍රාදුර්භූත වීම, කෘෂ්ණ අවතාරය හා සාදෘශ්‍යයෙන් පසු කාලයෙක නිමවන්නට ඇති බවත් සිතීමට ද පුළුවන.[14] මහා භාරතයෙහි සති පූජාව ගැන සඳහන් වන නමුත් රාමායණයෙහි එය නොපෙනෙන බැවින් රාමායණය වඩා පුරාණ වීර කාව්‍යය යැයි විද්වත්හු කිහිප දෙනෙක්[36] පැවැසූ හ. එ සේ වුව ද, ඇත්ත වශයෙන් පුරාණ, සැබෑ මහාභාරතයෙහි සති පූජාව සැබෑ රාමායණයෙහි තරමට ම විරල ය; එ පමණක් නො ව ඒ ගැන මහාභාරතයෙහි තරමට ද සඳහන් නොවන නමුත් රාමායණයෙහි පශ්චාත් කාලීන කොටස්වල ඒ ගැන සඳහන් නොවනුයේ ද නො වේ.[10] රාමායණය වඩා පුරාණ කාව්‍යය වෙතැයි ජැකෝබි (කලින් දැක්වූ තැන, 78 සහ ඊළඟ පිටු) කොතරම් තරයේ විශ්වාස කෙරේ ද යත්, මහාභාරතය වීර කාව්‍යයක් බවට පත් වූයේ ද වාල්මිකී ගේ කවිත්වය නිසා ලැබුණු ආභාසයෙනැයි හෙතෙමේ පිළිගනී. මේ මතය, සත්‍ය කරුණු මඟින් තහවුරු කැරෙන දෑ ඉක්මවමින් කරන ලද නිගමනයෙකැයි

මට සිතෙයි; ඇත්ත වශයෙන් එය ඇතැම් කරුණු හා පරස්පරවිරෝධී වෙයි. එක ලක්ෂණයෙකින් පමණක් නො ව ලක්ෂණ කිහිපයෙකින් ම, මහාභාරතය හා සංසන්දනය කළ කල්හි රාමායණය වීර කාව්‍ය කලාව අතින් විකසනයක් දක්වයි. නානා චරිතයන් ගේ කථාවලට මුල පුරමින් "යුධිෂ්ඨර කී ය". "කුන්ති කී ය". "දුර්යෝධන කී ය". ආදි වශයෙන් දැක්වෙන **ශබ්ද පාඨයන්හි** පුරාණ ආඛ්‍යාන ශෛලියෙන් ශේෂ වූ විශේෂ ලක්ෂණයක් මහාභාරතයෙහි අපට දක්නට ලැබෙන නමුත් රාමායණයෙහි කථකයන් සැම කල්හි ම හඳුන්වා දෙනුයේ ශ්ලෝකයෙනි.[17] රාමායණය මෙ වක පවා අලංකාර කාව්‍ය සම්ප්‍රදායයෙහි ලක්ෂණ කොතරම් බහුල වශයෙන් දක්වන්නේ ද යන වගත් ඉහත දක්වන්නට යෙදිණ.[18] ඉන් පුරාණ කොටස් කවරේද? පසු ව එකතු කරන ලද කොටස් කවරේ දැයි නිශ්චය කිරීම උගහට බව නො කිව මනා ය. එතෙකුදු වුවත්, රාමායණය මහාභාරතයෙන් සැලකිය යුතු තරම් ඈත් කරමින් එය **කාලිදාස** ගේ මහාකාව්‍යයනට වඩාත් ළං කරන මේ විශේෂත්වය, රාමායණය වඩාත් පැරණි අවධියකට අයත් වෙතැයි නිර්ණය කිරීමෙහි ලා අප පසුබට කර්විය යුතු ය.[19]

මහාභාරතය රාමායණයට වඩා පෞරාණික බවක් හඟවන දෙ වන කරුණෙක් ද ඇත. මහාභාරතය මුළුල්ලෙහි—යටත් පිරිසෙයින් පාණ්ඩව කථාන්තරය හා කුරු යුඛය ද ගැන ලියැවුණු කාව්‍යයේ ප්‍රධාන කොටසෙහි—රාමායණයෙහි පළ කැරෙන තරමට වඩා හැඩිදැඩි ගතිසිරින් හා වඩා රණකාමී ගතියක් පළ කැරෙයි. මහාභාරතයෙහි යුඛ වර්ණන රාමායණයෙහි එ බඳු වර්ණනවලින් මූලික වශයෙන් වෙනස් වෙයි. මහාභාරතයෙහි වැනුම්, කවියා හැඩි දැඩි වීර කුලයකට අයත් ව, බිහිසුණු යුද පිටිය සියැසින් දුටු බවක් හඟවන නමුත් රාමායණයෙහි වැනුම්, ආරංචි මාත්‍රයෙන් පමණක් තොරතුරු දැන ගත් යුද්ධ පිළිබඳ කථාන්තරකාරයකු ගේ කතාවක් සිහි පත් කරවයි. මහාභාරතයෙහි අර්ජුන හා කර්ණ ද අතර හෝ, භීම හා දුර්යෝධන ද අතර හෝ සිදු වූ සටන් පිළිබඳ ව කියවන කල්හි පාඨකයාට දැනෙන බද්ධ වෛරය, හා ක්‍රූර රෝෂය රාම හා රාවණ ද අතර හෝ, ලක්ෂ්මණ හා ඉන්ද්‍රජිත් ද අතර හෝ දක්නට නො ලැබේ. රාමායණයෙහි සීතා රාවණ විසින් සොරා පැහැර ගෙන යනු ලැබ, වධ හිංසා පමුණුවනු ලැබූ කල්හි හා රාම විසින් පිළිකෙව් කරනු ලැබූ කල්හි ද ඇගේ චෝදනා හා ළතැවිල්ල එක්තරා නිවුණු සන්සුන් බවක් දක්වයි; මහාභාරතයෙහි ද්‍රෞපදිය කෙරෙහි අපට නිතර දක්නට ලැබෙන ඉවක් බවක් නැති භාවාතිශය හැඟීම් ලේෂමාත්‍රයක් හෝ සීතා ගේ වචනයන්හි අවිද්‍යාමාන ය. කුන්තී හා ගාන්ධාරී හා යන දෙ දෙනා ද රණකාමී වංශයෙක සැබෑ වීර මව්වරු වෙති. එ නමුදු රාමායණයෙහි කෞශල්‍යා හා කෙකේයි සම්භාවනීය පැරණි (classical) නාට්‍යයන්හි එ ම සම්ප්‍රදායානුකූල බිසෝවරුන් සමඟ වඩාත් හොඳින් සැසඳෙති. මහාභාරතය වඩාත් ග්‍රාම්‍ය, වඩාත් රණකාමී වකවනුවකට අයත් වන බවත්, රාමායණය වඩාත් ශිෂ්ට සංස්කෘතියක් විදහා දක්වන බවත් මින් හැඟවෙන බවක් පෙනේ; වීර කාව්‍ය දෙකෙහි මේ

කැපී පෙනෙන වෙනස විස්තර කරනු වස්, මහාභාරතය බටහිර ඉන්දියාවේ වඩා ග්‍රාම්‍ය ශිෂ්ටාචාරයක් ද, රාමායණය නැගෙනහිර ඉන්දියාවේ වඩ, ශිෂ්ට සංස්කෘතියක් ද පිළිබිඹු කරන බවත්, වීරකාව්‍ය ද්වයය වෙනස් වකවානුවලම අයත් කාව්‍යය නො ව, ඉන්දියාවේ වෙනස් පෙදෙස්වලට අයත් කාව්‍යයන් නිරූපණය කරන බවත් උපකල්පනය නො කළ හොත් ඉහත දැක්වුණු නිගමනය නිවැරැදි වන බව පෙනේ. එ තෙකුදු වුවත්, මේ මතය අනුව සලකා බැලුව ද, මහාභාරතය වීර කාව්‍යයක් බවට පත් වූයේ වාල්මිකී ගේ කාව්‍ය කලාවෙහි ආභාසයෙන් පමණෙකැයි සිතා ගැනීම උගහට ය.

මහාභාරතය බටහිර ඉන්දියාවට ද, රාමායණය නැගෙනහිර ඉන්දියාවට ද අයත් වන බවට අනුමානයක් නැත. බටහිර දිග ජනයා මහාභාරතයෙහි ප්‍රධාන කොටසක් ගන්නා අතර රාමායණයෙහි මූලික සිද්ධි කෝසල දේශයෙහි සිදු වෙයි; පරම්පර්යය අනුව වාල්මිකී ජීවත් වූහ'යි සැලකෙන්නේ ද, ඔහු සැබවින් ම ජීවත් වූහ'යි සිතිය හැක්කේ ද මේ පෙදෙසෙහි ය.[23] එහෙත්, බුද්ධ ධර්මය මුලින් ම පහළ වූයේ, නැගෙනහිර ඉන්දියාවෙහි ය. එය පළමුවෙන් පැතිර ගියේ ද මගධයෙහි සහ අසල්වැසි කෝසල රටෙහි ය. රාමායණය හා බුදු සමය ද අතර සම්බන්ධය කවරේ ද? යන පැනය මේ අනුව වඩාත් වැදගත් වෙයි.

පුරාණතම බෞද්ධ සාහිත්‍යයෙහි ආඛ්‍යාන හෙවත් සැහැලි කාව්‍යය පිළිබඳ නිදසුනක් එ වක පවා දක්නට ලැබුණ බව ඉහත 115 සඳහන් විය; මෙහි වීර කාව්‍යයෙහි ආදි ස්වරූපයක් අපට හැඳින ගත හැකි විය. මේ බුද්ධ ආඛ්‍යාන පහළ වූ වකවානුවෙහි රාමායණය වීර කාව්‍යයක් ලෙස නෙතිබෙන නට ඇතැ යි ටී. ඩබ්ලිව්. රීස් ඩේවිස්[21] මේ අනුසාරයෙන් නිගමනය කළේ ය. නූතන සාහිත්‍යයන්හි ආඛ්‍යාන හා වීර කාව්‍ය එක් ව පවතින පරිදි පුරාණ ආඛ්‍යාන කාව්‍යය ද, ඉන් විකසනය වූ නව සාහිත්‍යික සම්ප්‍රදායයක් වූ වීර කාව්‍ය කලාව සමඟ එක් ව පවතින්නට අතැයි මීට විරුද්ධ මතයක් ඉදිරිපත් කළ හැකි ය. එ සේ වුව ද, පුරාණ බෞද්ධ සාහිත්‍යයෙහි බුද්ධ-ආඛ්‍යාන විනා අන් කිසිවක් දක්නට නොලැබීම විස්මය ජනක සුළු ය; බෞද්ධ වීර කාව්‍යයක් ශත වර්ෂ කිහිපයක් ඉක්මෙන තෙක් නො ලියැවිණ. තව ද, දශරථ ගේ අභාවය පිළිබඳ පුවත් රැගෙන භරත ආ කල්හි, මිය ගියවුන් සඳහා කළ යුතු වත් පිළිවෙත් පවත්වනු පිණිස ලක්ෂ්මණටත්, සීතාටත් දියට බැසීමට රාම නියෝග කරන අයුරු ගෙන හැර දක්වන දශරථ ජාතකය[22] ත්‍රිපිටක යෙහි දක්නට ලැබීම වඩත් වැදගත් ය. මේ කරුණ මුල් කොටගෙන හට ගත් සාකච්ඡාවෙහි දී, රාම ශෝක නොවනුයේ ඇයි දැයි භරත පිළිවිසි කල්හි[22] මිනිස් සංහතිය මරණය දායද කොට ගත් බැවින් මළවුන් සඳහා ළතැවීම නිරර්ථක යයි විස්තර කරමින් රාම දිග දෙසුමකින් ඔහු අස්වසා ලයි. ජාතකයෙහි පෙනෙන පුරාණ ගාථා දොළොසින් අප රාමායණයෙහි දැක්වෙනුයේ එකක්[24] පමණක් වීම, අප වීර

කාව්‍යය මේ ගාථාවන් ගේ මූලාශ්‍රය නොවූ බව ද, ජාතකය පුරාණ රාම ආඛ්‍යානයක් පදනම් කොට ගත් බව ද ස්ථිර කරවයි. මේ ජාතක පොතෙහි ම **සාම ජාතකය**[25] දක්නට ලැබේ; මෙය වූ කලි රාමායණයෙහි II, 63 සහ ඊ ළඟ **ශ්ලෝකයෙහි** දශරථ විසින් ගෙනහැර දැක්වෙන පුවත වූ දඩයමෙහි දී මිය ගිය තවුස් මානවකයා පිළිබඳ කතා පුවතෙහි පුරාණතර ස්වරූපයක් විය හැකි ය. අපට රාමායණය සිහිපත් කරවන මේ ද ඇතුළත් වන වෙනත් ජාතක කිපයක්[26] ද ඇති නමුත් පදගතාර්ථයෙන් ඒවා එකඟ වනුයේ ඉතා කරුතුරකිනි. රකුසන් සහ අද්භූත සතුන් ද ගැන නැතක් කථාන්තර ගෙන හැර දක්වන ජාතක පොතෙහි කිසි ම තැනෙක, රාවණ නම් රාක්ෂසයා ගැන හෝ හනුමත් සහ වානරයන් ගැන හෝ වචනයෙකින් වත් සඳහන් නොවීම ද විශේෂයෙන් සැලකිය යුතු කරුණකි. ත්‍රිපිටකය පහළ වූ අවධියෙහි (ක්‍රි. පූ. සිව් වන, තෙ වන ශත වර්ෂයන්හී), රාම ගැන රචිත ආඛ්‍යාන, ඇතැම් විට ආඛ්‍යාන මාලාවක්, රාම වීර කාව්‍යයක් නො වූ බව මේ සියල්ල අනුව සිතා ගත හැකි ය.[27]

තවත් ගැටලුවක් නම් බුද්ධ ධර්මයෙහි ලක්ෂණ මාත්‍රයක් හෝ රාමායණයෙහි ඇතැයි ඔප්පු කළ හැකි ද යන්නයි. මීට "කොහෙත් ම නැතැ" යි ඇතැම් විට පිළිතුරු දිය හැකිය. බුදුරදුන් ගැන සඳහන් වන එක ම තන්හි පවා (ඉහත 125 පිටුවේ, 13 වන අධෝ ලිපිය බලන්න.) එය නිශ්චිත වශයෙන් ම ව්‍යාජ වන බැවිනි. එ තෙකුදු වුවත් බුද්ධ ධර්මය සමඟ දුර සබඳකමක් නමුත් එක්තරා සම්බන්ධයක් තිබිය හැකි ය. රාමායණය "දැහැමි රාම කුමරු පිළිබඳ පැරණි බෞද්ධ පුරාවෘත්තයක්" පදනම් කොට ගත් බවත්, එ කී පුරාවෘත්තයෙන් බෞද්ධ ගුණයක් වූ උපෙක්ෂාව හුවා දැක්වෙන"[28] බවත් **වීබර්** විශ්වාස කළේ ය. තත්ත්වය මෙ සේ වීමට නම් නොහැකි ම ය. එ තෙකුදු වුවත්, රාම කෙරෙහි ප්‍රකට අසීමිත, සෞම්‍ය, මෘදු, ශාන්ත ගතිගුණ, සැහැවී පවත්නා බෞද්ධ හැඟීම් මඟින් විස්තර කිරීමේ අදහස ප්‍රතික්ෂේප නොකළ යුතු බවත් කිව හැකිය. යටත් පිරිසෙයින්, බුදුසමයෙහි බලපෑමට අධික ලෙස හසු වූ පෙදෙසක අබෞද්ධයකු විසින් වීර කාව්‍යයක් රචනා කැරුණු බවත්, එහි කථා නායකයා රාක්ෂසයන් සමඟ විශිෂ්ට ලෙස සටන් කරන නමුදු ඔහු යුද්ධ වීරයකුට වඩා බුදුරදුන් ගේ සන්සුන් පියොවින් යුතු මුනිවරයකු වූ බවත් සිතා ගත හැකි ය. ක්‍රි. පූ. සතර වන, තුන් වන ශත වර්ෂයන්හී විසූ පුරාණ බෞද්ධ ග්‍රන්ථ කර්තෘවරුන් එ සමයෙහි රාමායණය ගැන නොදත් නමුත් වාල්මීකී විසින් රාම පිළිබඳ වීර කාව්‍යය සඳහා උපයෝගි කොට ගත් ආඛ්‍යානය ගැන දැන සිටි අතර, අනෙක් අතට රාමායණය අනියම් අයුරෙකින් හෝ බුදු සමයෙහි බලපෑමට හසු වූ බව ද පෙනේ. බුදු සමය නැගෙනහිර ඉන්දියාවෙහි ව්‍යාප්ත ව, බෞද්ධ ත්‍රිපිටකය සකස් වෙමින් පවත්නා අතර රාමායණය පහළ වී යැයි මේ අනුව තර්ක කිරීමට පුළුවන් විය හැකි ය.

රාමායණයෙහි චාත්තය (ශ්ලෝකය) බෞද්ධ පාලි කාව්‍යයෙහි වාත්තයට වඩා මිහිරිභාවය වූ අවස්ථාවක් නිරූපණය කිරීමත්, එය මහාභාරතයෙහි පශ්චාත්කාලීන කොටස්වල වාත්තයට වඩා සමාන වීමත්, අමිහිරි හා ගැලපෙන්නෙහි.[20]

වාග්විද්‍යාත්මක පදනමක් මත පිහිටා විර කාව්‍යයෙහි ප්‍රභවය සඳහා ප්‍රාක්බෞද්ධ වකවානුවක් නිර්ණය කළ හැකි යැයි එච්. ජැකෝබි කල්පනා කෙළේ ය. මේ විර කාව්‍ය භාෂාව වූ කලි ව්‍යවහාර **සංස්කෘතයකි.** ක්‍රි. පූ. 260 පමණ අශෝක රජ ජනතාව වෙත නිකුත් කළ ආඥා ලියැවුණු සෙල්ලිපි සඳහා සංස්කෘතය නො ව, පාලියට සමාන ප්‍රාකෘත භාෂා යොදා ගත්තේ ය. ක්‍රි. පූ. සය වන සහ පස් වන ශත වර්ෂ තරම් ඈත වකවානුවෙක දී පවා බුදු රදහු ද සංස්කෘතයෙන් නො ව, ජනප්‍රිය භාෂාවෙන් බණ දෙසුවෝ ය. එහෙත් ඔහු ප්‍රකාශ කළ පරිදි[21] ජනප්‍රිය විර කාව්‍යය "අභාවයට" පත් භාෂාවකින් රචනය කළ නොහැකි ය; එය ජනතාව අතර භාවිත වූ බැවැර ඛසින් රචනා කළ යුත්තේ ය. මේ අනුව, අශෝක රජු දවස සහ බුදුන් දවස ද පවා සංස්කෘතය බැවහර බසක් නොවූයෙන්, ජනප්‍රිය විර කාව්‍ය (මුල් ස්වරූපයෙන්), සංස්කෘතීය ජීව භාෂාවක් ව පැවැති පුරාණතර ප්‍රාක්බෞද්ධ අවධියකට අයත් විය යුතු ය. සංස්කෘතය සෑම අවධියක ම ඉන්දියාවෙහි **සාහිත්යික භාෂාවක්** වශයෙන් ජනප්‍රිය භාෂා සමඟ එකට, "ජීවමාන ව" පැවති බවත්, එය නොවහරන විශාල ජනකායක් අතර වුව ද තේරුම් ගත හැකි ව පැවැති බවත් පවසන මිට වෙනස් මතයක් ඉදිරිපත් කළ හැකි ය. බෞද්ධ සහ ජෛන ශ්‍රමණවරුන් ප්‍රාකෘත භාෂාවලින් ග්‍රන්ථ රචනා කරමින් බණ දෙසූ අවධියෙහි ම සංස්කෘත විර කාව්‍ය ද රචනා කරනු ලැබීම හා ඊට සවන් දෙන පිරිසක් සිටීම ද පුදුමයට කරුණු නො වේ. ඉන්දියාවෙහි භාෂා දෙකක් හෝ ඊට වැඩි ගණනක් හෝ එක ම පෙදෙසෙක ව්‍යවහාර වීම අද දක්වා විරල සිද්ධියක් නො වේ. තව ද, උතුරු ඉන්දියාවෙහි විශාල කොටසෙක අද පවා බැවහර බසින් බෙහෙවින් වෙනස් වූ (සංස්කෘතය හැරුණු විට) **නූතන ඉන්දීය** සාහිත්යික භාෂාවක් ව්‍යවහාරයේ පවතී.[22] එ බැවින්, රාමායණයෙහි හෝ මහාභාරතයෙහි හෝ අපට දක්නට ලැබෙන ශ්ලෝක, පාලි, ප්‍රාකෘත වැනි භාෂාවලින් හෝ බෞද්ධ හෝ ජෛන කෘතිවල හෝ හමු වුව හොත්, සංස්කෘත ශ්ලෝක සෑම විට ම ප්‍රාකෘත භාෂාවන් ගෙන් කරන ලද පරිවර්තනයෙකැයි ගත නොහැකි ය. සමස්තයක් වශයෙන් විර කාව්‍ය මුල දී ප්‍රාකෘතවලින් රචනා කොට සංස්කෘතයට පරිවර්තනය කරනු ලැබුයේ පසු කාලයෙකැයි ප්‍රසිද්ධ විද්වතුන් කිහිප දෙනකු දරන මතය එ තරම් වත් හේතු සහගත නො වේ. මෙ බඳු පරිවර්තනයක් පිළිබඳ ව කිසි ම වාර්තාවක් කොහෙත් ම දක්නට නො ලැබෙද්දී එවැන්නක් සිදු වී යයි සිතීම උගහට ය. වෙනත් සාධක අනුව ද මේ උපකල්පනය පිළිගත නොහෙන බව **ජැකෝබි**[23] විශ්වසනීය අන්දමින් පෙන්වා දෙයි. එහෙත් ඔහු මෙහි දී "ජනප්‍රිය විර කාව්‍යය ජනතාව ගේ භාෂාවෙන් කියැවිය යුතු ය"

යන මතයට විරුද්ධ ව තර්ක කරමින් "**ඉලියඩ් සහ ඔඩිසි** නම් වීර කාව්‍යයන්හි ගීත ද **හෝමර්** ගේ භාෂාවෙන් ඉදිරිපත් කැරුණු නමුත් ශ්‍රෝතෘ ජනයා ගේ භාෂාව ඉන් බෙහෙවින් වෙනස් වන්නට ඇතැ"යි පවසන කල්හි ද, "ජාතිය" යන පදය හා අප සම්බන්ධ කරන අර්ථය එ ම සංකල්පයට ඉන්දියාවෙහි නො ලැබුණේ යයි අවධාරණය කරන කල්හි ද, සංස්කෘතය "බැවහර බසක්" ව පැවැති සමයෙක දී ම රාමායණය ලියැවුණු බවත්, ඒ හේතුවෙන් එය ප්‍රාක්-බෞද්ධ විය යුතු බවත් දක්වන ඔහු ගේ ම මතය බිඳ වැටෙයි.[33]

ක්‍රිස්තු යුගයේ මුල් ශතවර්ෂයන්හි දී බෞද්ධයන් විසින් ද සංස්කෘත භාවිත කරන ලදි. **අශ්වඝෝෂ** නම් ශ්‍රේෂ්ඨ බෞද්ධ කවියා ගේ **බුද්ධචරිතය** වූ කලි සංස්කෘතයෙන් රචිත මහා කාව්‍යයෙකි; මෙය වාල්මීකී ගේ කාව්‍යය ආදර්ශ කොට ගත් බවට අනුමානයක් නැත.[34] අනෙක් අතට රාමායණයෙහි ව්‍යාජ යයි සැලකෙන කොටසෙක, බුද්ධචරිතයෙහි සිද්ධියක අනුකරණයකැයි සිතිය යුතු ජවනිකාවක් අපට දක්නට ලැබේ. අශ්වඝෝෂ **කණිෂ්ක** ගේ සමකාලීනයකු වූයෙන් ක්‍රි. ව. දෙවන ශත වර්ෂය උදාවෙහි රාමායණය ආදර්ශවත් වීර කාව්‍යයක් ලෙස සැලකුණු නමුත් තව දුරටත් කරුණු ඇතුළු වනු වළකින තරමට පරිසමාප්ත ස්වරූපයක් එ සමයෙහි පවා ඊට නොලැබුණු බව මේ අනුව නිගමනය කළ හැකි ය. එ සේ වුව ද, රාමායණය සහ මහාභාරතය ද අතර සම්බන්ධය අරබයා ඉහත දැක්වුණු කරුණු මඟින් නිගමනය කළ හැකි පරිදි, දෙ වන ශත වර්ෂයේ අවසානයෙහි පමණ ඊට පරිසමාප්ත ස්වරූපයක් ලැබෙන්නට ඇත.

ක්‍රි. ව. දෙ වන ශත වර්ෂයේ අවසානයෙහි දී පමණ ලියැවුණැයි සිතිය හැකි **කුමාරලාට** ගේ **කල්පනාමණ්ඩිතිකා** නම් කෘතියෙහි ද රාමායණය ප්‍රසිද්ධියේ කියැවීමක් ගැන සඳහන් වෙයි. ක්‍රි. ව. දෙ වන ශත වර්ෂය තෙක් දිවෙතැයි කියැවෙන බෞද්ධ කථා වස්තුවල චීන පරිවර්තනයන්හි, රාම පුරාවෘත්තය බෞද්ධ කටයුතු සඳහා උචිතාකාරයෙන් සකස් කොට ගෙන ඉදිරිපත් කෙරේ.[35] **වසුබන්ධු** නම් බෞද්ධ දාර්ශනිකයා විසූ අවධියෙහි (ක්‍රි. ව. හතර වන ශත වර්ෂයෙහි) රාමායණය, ඉන්දියාවෙහි බෞද්ධයන් විසින් ද මනා ව දැන හැඳින ගත්, ජනප්‍රිය කාව්‍යයක් වූ බව චීන මූලාශ්‍රයන් ගෙන් ම දත හැකි ය. ක්‍රි. ව. පළමු වන ශත වර්ෂයෙහි දෙ වන භාගය තරම් ඇත අවධියෙක, **විමලසූරි** නම් ජෛන භික්ෂුව **පඋමචරිය** (**පද්ම චරිත**) නම් සිය ප්‍රාකෘත කාව්‍යයෙන් රාම පුරාවෘත්තය වෙනස් කොට, ජෛන ආගමටත්, දර්ශනයටත් අනුකූල ව ඉදිරිපත් කළේ ය.[40] එ සමයෙහි ද ප්‍රසිද්ධියක් ඉසිලූ වාල්මීකී ගේ කාව්‍යය වෙනුවට යොදා ගත හැකි කාව්‍යයක් සිය ලබ්ධිය ඇදහූවන් වෙත ඉදිරිපත් කිරීම ඔහු ගේ පරමාර්ථය වූ බව ඉතා පැහැදිලි ය. ක්‍රි. ව. 600 පමණෙහි දී කාම්බෝජය තරම් දුරු රටෙක පවා හින්දු ශුද්ධ ග්‍රන්ථයක් වශයෙන් රාමායණය ප්‍රසිද්ධියක් ඉසුලූ බව පෙනේ. **සෝමශර්මන්** නමැත්තකු "රාමායණයත්, පුරාණයත්, සම්පූර්ණ භාරතයත්" දේවාලයකට පූජා කළ බව සෙල්ලිපියෙක වාර්තා වන බැවිනි."

පුරාණ කාව්‍යය අග්‍රමහේෂ ගට ආදර්ශයක් වීමත්, ඒ හේතුවෙන් ඔහු විසූ සකවතුවට බෙහෙවින් ඇත සකවතුවෙක රචනා කිරීමත්, පැරණි සැබෑ රාමායණයෙහි ග්‍රීක බලපෑම් කොහෙත් ම දක්නට නොලැබීම හෝ ග්‍රීකයන් සමඟ ඇසුර නොපෙන්වීම හෝ යන මේ කරුණු සමඟ මැත වීක් එකඟ වේ. නුමක් නියා ද යත්, යවනයන් (අයෝනියන්, ග්‍රීක) ගැන සඳහන් වන දෙ පළක් ම ව්‍යාජ බව ඔප්පු කොට ඇති බැවිනි. වරක් වීබර් විසින් පවසන ලද පරිදි, හෝම්ර් ගේ කාව්‍ය වාල්මීකී ගේ නිර්මාණය කෙරෙහි කොහෙත් ම බල නොපෑ බව නොඅනුමාන ය. සීතා සොරා ගෙන යාම සහ හෙලන් කුමරිය පැහැර ගෙන යාම අතර හෝ, ලංකා ආක්‍රමණය සහ ට්‍රෝයි නුවර ආක්‍රමණය අතර හෝ ඉතා සුළු සමානත්වයක් වත් දක්නට නොහැකි ය; රාම විසින් ද, යුලිසිස් විසින් ද දුන්න නැඟීම් සම් බන්ධයෙන් පරමාර්ථ අතින් ඇති සමානත්වය ද ඉතා සුළු ය.[12]

වීර කාව්‍යයක් වශයෙන් රාමායණය වේදයෙන් ඉතා ඈත් වෙයි. රාම පුරාවෘත්තය පවා වෛදික සාහිත්‍යයට බැඳෙනුයේ ඉතා සිහින් හුයෙකිනි. උපනිෂද්වල නිතර සඳහන් වන විදේහයේ ජනක රජ තුමා[13] සීතා ගේ පියා ම ද යනු අවිනිශ්චිත පැනයෙකි. රාමායණය සහ යජුර්වේදය ද අතර යම් යම් සුළු සමානතා වීබර් විසින් පෙන්වා දෙන ලදි. වීර කාව්‍යයෙහි කථා නායිකාව වූ සීතා රාම පුරාවෘත්තයෙහි පුරාණතම අංගයනට අයත් විය යුතු ය. ඇගේ නාමය "හී විට" යන අරුත් දෙයි; ඕ දෙරණින් මතු වෙයි; මහීකාන්තාව ඇය නැවත පිළිගනියි. මේ තෙ වන පුවත දක්නට ලැබෙනුයේ පශ්චාත්කාලීන VII වන කාණ්ඩයෙහි වුව ද මෙය ඉතා පුරාණ සිද්ධියක් විය හැකි ය. කෘෂිකර්මාන්තයට අධිපති දේවතාවක එ නම් සීතා, පිළිබඳ සංකල්පය ඉතා පුරාතන එකකි; මහ පොළොවට ආශිර්වාද කරනු වස් සෘග්වේදයෙහි (IV, 57 6) ගායනා කෙරෙන ස්තෝත්‍රයෙක එ වක පූජාවට ලක් වන සීතා පිළිබඳ මේ සංකල්පය වෛදික යුගය දක්වා දිවෙන බව නිසැක ය. සැබැවින් ම ජීවමාන ආකාරයෙකින් -"පියුම් මුදුන් මල්කඩක් පැළඳ, පැහැපත් සිරුරින් හෙබි, නීල වර්ණ ඇස් ඇති" ආදි වශයෙන්[15]—ඇය සප්‍රාණික තැනැත්තියක ලෙස සලකන සූත්‍ර ගෘහ්‍ය සූත්‍රයන්හි ආරක්ෂා වී ඇත. එහෙත් 'හීවිට' නම් දේවතාවිය විශයෙන් සීතා සැලකෙන මේ වෛදික සංකල්පය, "රාම පුරාවෘත්තයෙහි ඇය නිරූපණය කෙරෙන ආකාරයෙන් බෙහෙවින් වෙනස් වෙතැ" යි පවසන වීබර් ගේ[16] මතය නිරවද්‍ය යයි සිතේ. රාම සහ සීතා ද පිළිබඳ ගීත වෛදික යුගයෙහි පැවති බවට කිසි ම සාක්ෂියක් ද නැත.[17] රාම සහ රාවණ අතර සටන පිළිබඳ පුරාවෘත්තයෙහි, ඉන්ද්‍ර සහ වෘත්‍ර[18] ද අතර සටන මුල් කොට ගත් පුරාණ දේව කථාවෙහි ම වෙනස් ස්වරූපයක් ගබ් ව ඇතැයි අප ජැකෝබි ගේ මතයට එකඟ වන්නට සිතුව ද, වේදය වීර කාව්‍යයෙන් බෙන් කරන "විශාල පරතරය" නම් එ ලෙස ම පවතිනු ඇත.

රාමායණය ලියැවුණු අවධිය සම්බන්ධයෙන් අප විසින් කරන්නට යෙදුණු විමර්ශනයෙහි ප්‍රතිඵල සැකෙවින් දක්වතොත්, මෙසේ කිව හැකි ය:—

1. රාමායණයෙහි පශ්චාත්කාලීන කොටස්, විශේෂයෙන් I වන සහ VII වන කාණ්ඩ, මුල් රාමායණය වූ II සිට VI දක්වා කාණ්ඩයන් ගෙන් දීර්ඝ කාල සීමාවෙකින් වෙන් වෙයි.

2. මහාභාරතයෙහි වර්තමාන ස්වරූපය ඊට ලැබෙන්නට පෙර පශ්චාත් කාලීන කොටස් ද ඇතුළු සමස්ත රාමායණය ම පැරණි, ප්‍රසිද්ධ කෘතියක් විය.

3. ක්‍රි. ව. දෙ වන ශත වර්ෂයෙහි අවසානය තරම් ඈත වකවානුවෙක දී පවා රාමායණය ප්‍රමාණයෙන් හා විෂය ද අතින් එහි වර්තමාන ස්වරූපය දරන්නට ඇත.

4. එ සේ වුව ද, මහාභාරතයෙහි පුරාණතර කේන්ද්‍රය පුරාණ රාමායණයට වඩා පැරණි විය හැකි ය.

5. රාම වීර කාව්‍යය පිළිබඳ ලේඛමාත්‍ර සටහනක් හෝ වේදයන්හි දක්නට නොලැබෙන අතර රාම පුරාවෘත්තය පිළිබඳ ව ද නොපැහැදිලි සටහන් මාත්‍රයක් පමණක් දැක්වේ.

6. බෞද්ධ ත්‍රිපිටකයට අයත් පැරණි කෘති රාමායණය ගැන දැනුමක් නොපෙන්වන නමුත් රාම පුරාවෘත්තය ගීතයට නඟා ගායනා කරනු ලැබූ ආඛ්‍යාන පිළිබඳ යම් දැනුමක් හඟවයි.

7. රාමායණය බුද්ධ ධර්මය පිළිබඳ පැහැදිලි ලකුණක් නොපෙන්වත් නමුත් රාම චරිතය නිරූපණය කරන ලද ආකාරය දුබල බෞද්ධ ආභාසයක් දක්වතැයි කිව හැකි වනු ඇත.

8. රාමායණය ග්‍රීක ආභාසයක් නොදක්වන බව නිරනුමාන ය; සැබෑ රාමායණය ග්‍රීකයන් සමඟ කිසි ම ඇසුරක් හෙළි නො කරයි.

9. වාල්මීකී විසින් පුරාණ ආඛ්‍යාන පදනම් කොට ගෙන ක්‍රි. පූ. තුන් වන ශතවර්ෂයෙහි මුල් රාමායණය පබඳින ලදුවා විය හැකි ය.

පුරාණ සහ ඉන්දීය සාහිත්‍යයෙහි ඒවාට හිමි තැන[1]

වස්තු විෂය අතින් ද, ලියැවුණු වකවානුව අතින් ද, ඉන්දීය සාහිත්‍ය ඉතිහාසයෙහි පුරාණයනට අයත් වන නිවැරැදි තැන තීරණය කිරීම උගහට ය. ඇත්ත වශයෙන් මේවා ආගමික සාහිත්‍යයට අයත් වෙයි. පුරාණතම ආගමෙහි හෝ බ්‍රාහ්මණ ආගමෙහි හෝ වේදයනට ලැබෙන තැනට, තරමක් සමාන තැනක් ශිව, හා විෂ්ණු භක්තියෙන් කුට ප්‍රාප්ත වන, හින්දු ධර්මය ලෙස සාමාන්‍යයෙන් හැඳින්වෙන පශ්චාත්කාලීන ඉන්දීය ආගමෙහි මේ